323 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 323 - இல. 10
Volume 323 - No. 10

2025 නොවැම්බර් 26වන බදාදා
2025 நவம்பர் 26, புதன்கிழமை
Wednesday, 26th November, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

පෞද්ගලික මන්ත්‍රී යෝජනා විවාද සඳහා ඉදිරිපත් කිරීී නව ක්‍රමවේදය [තීරුව 1943]

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නවීකරණය කරන ලද වෙබ් අඩවිය නිල වශයෙන් දියත් කිරීම [තීරුව 1944]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1945-1958]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

කොළඹ-මන්නාරම දුම්රිය සේවාවේ ගැටලු [තීරුව 1959]

**විරැකියාව අවම කිරීම:**

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය [තීරුව 1962]

**ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී [තීරුව 1969]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 - [දහසයවන වෙන් කළ දිනය]:**

[ශීර්ෂ 151, 290 (ධීවර, ජලජ හා සාගර සම්පත්); ශීර්ෂය 196 (විද්‍යා සහ තාක්ෂණ); ශීර්ෂ 186, 227 (ඩිජිටල් ආර්ථික)] - කාරක සභාවේදී සලකා බලන ලදී [තීරු 1969-2138]

**කල් තැබීමේ යෝජනාව:**

රජයේ ඉඩම් භුක්ති විඳින ජනතාවට සින්නක්කර ඔප්පු ලබා දීම [තීරු 2139-2149]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 2150-2164]


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

தனி நபர் பிரேரணைகளை விவாதத்திற்காகச் சமர்ப்பிக்கும் புதிய நடைமுறை [ப: 1943]

இலங்கை பாராளுமன்றத்தின் நவீனமயப்படுத்தப்பட்ட இணையத்தளத்தை உத்தியோகபூர்வமாக அங்குரார்ப்பணம் செய்தல் [ப: 1944]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1945-1958]

**தனி அறிவித்தல் மூல வினா:**

கொழும்பு - மன்னார் ரயில் சேவையிலுள்ள பிரச்சினைகள் [ப: 1959]

**வேலையின்மையைக் குறைத்தல்:**

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று [ப: 1962]

**நுண்நிதி மற்றும் கடன் ஒழுங்குபடுத்தும் அதிகாரசபை சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1969]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட பதினாறாம் நாள்]:**

[தலைப்புக்கள் 151, 290 (கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள்); தலைப்பு 196 (விஞ்ஞான மற்றும் தொழில்நுட்பம்); தலைப்புக்கள் 186, 227 (டிஜிட்டல் பொருளாதாரம்)] – குழுவில் ஆராயப்பட்டது [ப: 1969-2138]

**ஒத்திவைப்புப் பிரேரணை:**

அரசாங்கக் காணிகளில் இருப்பாட்சி கொண்டுள்ள மக்களுக்கு அறுதியுறுதி வழங்கல் [ப: 2139-2149]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 2150-2164]


---

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

New Methodology on Placing Private Members' Motions for Debate [Col. 1943]

Official Launch of Revamped Website of Parliament of Sri Lanka [Col. 1944]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1945-1958]

QUESTION BY PRIVATE NOTICE:

Issues in Colombo-Mannar Train Service [Cols. 1959]

MINIMIZATION OF UNEMPLOYMENT:

Statement by Prime Minister and Minister of Education, Higher Education and Vocational Education [Cols. 1962]

MICROFINANCE AND CREDIT REGULATORY AUTHORITY BILL:

Read the First Time [Col. 1969]

APPROPRIATION BILL, 2026 – [Sixteenth Allotted Day]:

Considered in Committee – [Heads 151 and 290 (Fisheries, Aquatic and Ocean Resources); Head 196 (Science and Technology); Heads 186 and 227 (Digital Economy)] [Cols. 1969-2138]

ADJOURNMENT MOTION:

Grant of Freehold Deeds to Occupants of State Lands [Cols. 2139-2149]

WRITTEN ANSWERS [Cols. 2150-2164]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 නොවැම්බර් 26වන බදාදා***
*2025 நவம்பர் 26, புதன்கிழமை*
*Wednesday, 26th November, 2025*

**පූ.භා. 9.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.00 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පෞද්ගලික මන්ත්‍රී යෝජනා විවාද සඳහා ඉදිරිපත් කිරීමේ නව ක්‍රමවේදය
### தனி நபர் பிரேரணைகளை விவாதத்திற்காகச் சமர்ப்பிக்கும் புதிய நடைமுறை
### NEW METHODOLOGY ON PLACING PRIVATE MEMBERS' MOTIONS FOR DEBATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ යෝජනා විවාදයට ගැනීමට අවස්ථාව ලබා දීමේදී එකී යෝජනා භාරදී ඇති සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට එක හා සමාන අවස්ථාවන් ලැබෙන බවට සහතික කිරීම පිණිස දැනට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේදී පදනම් කර ගනු ලබන ක්‍රමවේදයම, පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ යෝජනා විවාදයට ගැනීමට අවස්ථාව ලබා දීමේදී ද යොදා ගන්නා ලෙසට ගරු මන්ත්‍රීවරයන් විසින් කරනු ලැබූ ඉල්ලීම අනුව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ අනුමැතිය මත සකස් කරන ලද නව ක්‍රමවේදය 2025.11.18 දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී දීර්ඝ වශයෙන් සලකා බැලීමෙන් අනතුරුව, එකී නව ක්‍රමවේදය 2026 ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට කාරක සභාව තීරණය කරන ලද බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව, මීළඟට පෞද්ගලික මන්ත්‍රී යෝජනා විවාදයට ගැනීමට නියමිත 2026 ජනවාරි මස සිට නව ක්‍රමවේදය අනුව පෞද්ගලික මන්ත්‍රී යෝජනා විවාදයට ගැනීමට අවස්ථාව සලසන බවත්, යෝජිත නව ක්‍රමවේදය අනුව, පළමු දිනය සඳහා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරනු ලබන යෝජනා සංඛ්‍යාව ඒ වන විට න්‍යාය පුස්තකයේ/න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකයේ කාලානුක්‍රමික අනුපිළිවෙළ මත යෝජනා ඇතුළත් මන්ත්‍රීවරයන්ගේ පිළිවෙළ මත තෝරා ගනු ලබන අතර, ඊළඟ මාසයේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා විවාදයට ගනු ලබන දිනය සඳහා ඒ යෝජනා තෝරා ගැනීමේ දී, කාලානුක්‍රමිකව ඊළඟට යෝජනා ඉදිරිපත් කර ඇති මන්ත්‍රීවරයන්ට අවස්ථාව ලැබෙන පරිදි යෝජනා විවාදය සඳහා තෝරා ගනු ලැබේ. එහි දී අදාළ මන්ත්‍රීවරයන් විසින් තම නමින් පළ කර ඇති යෝජනා අතරින් පළමුවෙන්ම විවාදයට ගැනීමට අපේක්ෂා කරනු ලබන හෝ ප්‍රමුඛතාව ලබා දිය යුතු යෝජනාව සඳහන් කරන්නේ නම්, ඒ සම්බන්ධව ද සැලකිල්ලට ගනු ලබන බවත් වැඩිදුරටත් සඳහන් කිරීමට කැමැත්තෙමි.

ඒ අනුව, පෞද්ගලික මන්ත්‍රී යෝජනා ඉදිරිපත් කර ඇති සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්හට සමාන අවස්ථාව ලබා දීමේ අරමුණින් ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම නව ක්‍රමවේදය සාර්ථක කර ගැනීම සඳහා සියලු ගරු මන්ත්‍රීවරයන්ගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කරමි.

## II

### ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නවීකරණය කරන ලද වෙබ් අඩවිය නිල වශයෙන් දියත් කිරීම
### இலங்கை பாராளுமன்றத்தின் நவீனமயப்படுத்தப்பட்ட இணையத்தளத்தை உத்தியோகபூர்வமாக அங்குரார்ப்பணம் செய்தல்
### OFFICIAL LAUNCH OF REVAMPED WEBSITE OF PARLIAMENT OF SRI LANKA

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නවීකරණය කරන ලද වෙබ් අඩවිය හෙට දින, එනම් 2025 නොවැම්බර් 27 බ්‍රහස්පතින්දා දින මවිසින් නිල වශයෙන් දියත් කරනු ලබන බව මෙම ගරු සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the -

(i) Order made by the Minister of Finance, Planning and Economic Development under Sections 2 and 5 of the Special Commodity Levy Act, No. 48 of 2007 relating to the Special Commodity Levy and published in Gazette Extraordinary No. 2457/05 of 09th October, 2025; and

(ii) Resolution under Section 10 of the Customs Ordinance (Chapter 235) relating to Import Duties (Gazette Extraordinary No. 2457/06 of 09th October, 2025).

I move that the Order and the Resolution be referred to the Committee on Public Finance.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, බණ්ඩාරවෙල, වැවතැන්න, රෝහල පාර, අංක 48/19 යන ලිපිනයෙහි පදිංචි කේ.එම්. මානවසිංහ බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petition ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -21/2024- (1), ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

### මහ බැංකු බැඳුම්කර වංචාව: ආර්ථිකයට සිදුවූ බලපෑම
### மத்திய வங்கி பிணைமுறி மோசடி: பொருளாதாரத்துக்கு ஏற்பட்ட தாக்கம்
### CENTRAL BANK BOND SCAM: IMPACT ON ECONOMY

116/2024

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) පසුගිය යහ පාලන රජය සමයේ සිදු වූ මහ බැංකු බැඳුම්කර වංචාවක් සම්බන්ධයෙන් සමාජයේ විශාල කතිකාවක් ඇති වූ බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභා වාර්තාව මඟින් චෝදනා එල්ල කරන ලද පුද්ගලයන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම බැඳුම්කර වංචාව හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදු වූ බලපෑම කවරේද;

(iv) එම බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

( அ) (i) கடந்த 'நல்லாட்சி' அரசாங்க காலத்தில் இடம்பெற்ற மத்திய வங்கி பிணைமுறி மோசடி தொடர்பான சம்பவம் சமூகத்தில் பெரும் பேசுபொருளாக இருந்தமையை அறிவாரா என்பதையும்;

(ii) அவ்விடயம் தொடர்பாக விசாரணை செய்வதற்காக நியமிக்கப்பட்ட சனாதிபதி ஆணைக்குழு அறிக்கைமூலம் குற்றம் சுமத்தப்பட்டுள்ள நபர்களின் பெயர்கள் மற்றும் பதவிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி பிணைமுறி மோசடி காரணமாக இலங்கையின் பொருளாதாரத்துக்கு ஏற்பட்ட தாக்கம் யாது என்பதையும்;

(iv) மேற்குறிப்பிட்ட பிணைமுறி மோசடி தொடர்பாக மேற்கொள்ளப்படும் எதிர்கால நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she is aware that there was an extensive discussion in the society regarding a Central Bank Bond scam that occurred during the previous "Good-Governance" regime;

(ii) the names and the positions of the individuals against whom allegations were levelled in the Report of the Presidential Commission appointed to investigate the aforesaid matter;

(iii) the impact that aforesaid Bond scam created on the economy of Sri Lanka; and

(iv) the future actions that will be taken regarding the aforesaid Bond scam?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභා වාර්තාව මඟින් කරන ලද නිර්දේශයන් ප්‍රකාරව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර විමර්ශන සිදු කිරීමෙන් අනතුරුව, පහත සඳහන් ආයතන සහ පුද්ගලයන්ට එරෙහිව නීතිපතිවරයා විසින් අධිචෝදනා ගොනු කර ඇත.

1. පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ්
2. සන්දේශ් රවීන්ද්‍ර කරුණානායක - හිටපු මුදල් අමාත්‍ය
3. ලක්ෂ්මන් අර්ජුන මහේන්ද්‍රන් - හිටපු අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව
4. පත්තිනිගේ සමරසිරි - හිටපු නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව
5. අර්ජුන් ජෝශප් ඇලෝෂියස්
6. පළිසේන අප්පුහාමිලාගේ දොන් කසුන් ඕෂධී පළිසේන

7. ජෙෆ්රි ජෝශප් ඇලෝෂියස්
8. චිත්ත රන්ජන් හුළුගල්ල
9. මුත්තුරාජා සුරේන්ද්‍රන්
10. අජාන් ගාර්දියේ පුංචිහේවා
11. බදුගොඩ හේවා ඉන්දික සමන් කුමාර - ප්‍රධාන අළෙවිකරු, ඉදිරි කාර්යාලය, සේවක අර්ථසාධක අරමුදල
12. සංගරපිල්ලේ පද්මනාපන් - ජ්‍යෙෂ්ඨ කළමනාකරු, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව

(iii) ආර්ථිකයට සිදු වූ බලපෑම තවමත් විමර්ශනය කරමින් පවතී. අවුරුදු 10ක් ගත වුවද, මේ පිළිබඳව විමර්ශනයක් සිදු කර නොමැත. මේ පිළිබඳ පූර්ණ තක්සේරුවක් අදාළ විමර්ශනයෙන් පසුව හෙළිදරව් වනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම බැඳුම්කර වංචාව හේතුවෙන් ආර්ථිකයට සිදු වූ බලපෑම විශේෂිතව ගණනය කර නොමැත. එසේ වුවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිවෙළින් මහ බැංකු අරමුදල් විෂයෙහි රු.78,109,050.69ක් සහ සේවක අර්ථසාධක අරමුදල විෂයෙහි රු.6,989,277,943.63ක් ද වශයෙන් පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් විසින් සිදු කරනු ලැබූ අලාභය අය කර ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේදී DMR 1547/2018 සහ DMR 1764/2018 යන නඩු පවරා ඇත.

(iv) නීතිපතිවරයාගේ අංක CF/31/2016 හා 2025.09.11 දිනැති ලිපිය අනුව 2015.02.27 වන දින සිදු වූ මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් අංක PTB/01/05/2019 දරන අධිචෝදනා පත්‍රයෙන් චූදිතයන් 10දෙනෙකුට විරුද්ධව ද, 2016.03.29 දින සිදු වූ බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් අංක HC TAB 2445/21 දරන අධිචෝදනා පත්‍රයෙන් චූදිතයන් 11දෙනෙකුට විරුද්ධව ද, 2016.03.31 වන දින සිදු වූ මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් අංක HC TAB/2446/21 දරන අධිචෝදනා පත්‍රයෙන් චූදිතයන් 10දෙනෙකුට විරුද්ධව ද ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ නඩු පවරා ඇත.

ඉහත අධිචෝදනාවන්හි ඇතුළත් පොදු දේපළ යටතේ වන චෝදනාවන් සම්බන්ධයෙන් චූදිතයන්ගේ මූලික විරෝධතා සලකා එම චෝදනාවලින් චූදිතයන් නිදහස් කරන ලෙසට ත්‍රිපුද්ගල මහාධිකරණය විසින් ලබා දුන් නියෝග ප්‍රතිශෝධනය කරවා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් අංක CA/CPA/34/22, CA/CPA/135/21 හා CA/CPA/154/22 දරන ප්‍රතිශෝධන අයදුම්පත් අභියාචනාධිකරණයේ ගොනු කර ඇති අතර, එම අධිකරණය විසින් එම අයදුම්පත් නිෂ්ප්‍රභ කිරීම හේතුවෙන් ඊට එරෙහිව නීතිපති දෙපාර්තමේන්තුව විසින් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ SC SPL/LA/135/22, SC APP/161/23 දරන ඉල්ලුම් පත්‍ර ගොනු කර ඇති අතර, එකී ඉල්ලුම් පත්‍ර ඉදිරියට ගෙන යෑම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය අවසර දී ඇත.

ඉහත සඳහන් අභියාචනාධිකරණ හා ශ්‍රේෂ්ඨාධිකරණ නීති කෘත්‍යයන් හේතුවෙන් 2019 වර්ෂයේ ගොනු කරන ලද අධිචෝදනා පත්‍ර සම්බන්ධයෙන් ත්‍රිපුද්ගල මහාධිකරණයන්හි පවතින නඩු කටයුතු මේ වන විට බහා තබා ඇත.

ඊට අමතරව අංක HC TAB/2445/21 සහ HC TAB/2446/21 දරන නඩු දෙකෙහි චූදිතයෙකු වන සංදේශ් රවීන්ද්‍ර කරුණානායක විසින් ඔහු චූදිතයෙකු ලෙස නම් කිරීම සම්බන්ධයෙන් අංක CA Writ/441/21 හා Writ/442/21 යන රිට් අයදුම්පත් අධිකරණයේ ගොනු කිරීමෙන් පසු පෙත්සම්කරු චූදිතයෙකු වශයෙන් නම් කිරීමට ගත් තීරණය රිට් ආඥාවක් මඟින් අහෝසි කරන ලද අතර, ඊට එරෙහිව නීතිපති දෙපාර්තමේන්තුව විසින් අංක SC SPL LA 102/23 හා SC APP/103/24 යන නීති කෘත්‍යය ආරම්භ කර ඇත. එහිදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉහත අභියාචනාධිකරණ නියෝග නිශ්ප්‍රභ කර ඇත. ඒ අනුව මහාධිකරණ නඩුව යළි ආරම්භ කිරීමට නියමිතයි.

තවද, ත්‍රිපුද්ගල මහාධිකරණයන් ඉදිරියේ ගොනු කර ඇති අධිචෝදනා පත්‍රයන්හි චූදිතයෙකු වන මුත්තයියා සුරේන්ද්‍රන් යන අය විසින් CA Writ/582/2022, CA Writ/583/2022 හා CA Writ/584/2022 යන නඩු ගොනු කර ඇති අතර, එම නඩු අභියාචනාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

එසේම, ඉහත බැඳුම්කර නිකුතුවල සිදු වී ඇති වංචාවල ප්‍රතිඵලයක් වශයෙන් උපයන ලද ලාභවලට අදාළව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශන සිදු කරමින් පවතී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොළඹ දිසා අධිකරණයේ දී DMR 1547/2018 සහ DMR 1764/2018 යන නඩු පවරා ඇත. ඉහත නඩුකර ද්විත්වයට අමතරව පහත සඳහන් ආයතන විසින් ද පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් ආයතනයට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ දී මුදල් අය කර ගැනීමේ නඩු පවරා ඇති අතර, එම නඩුකර ද මේ වන විට විභාග වෙමින් පවතී.

- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
- මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
- ජාතික ඉතිරිකිරීමේ බැංකුව
- සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය අහන්න කලින් මට සාධාරණයක් ඉටු කර දෙන්න, තමුන්නාන්සේ. මගේ මේ ප්‍රශ්නයට තුන්වැනි වතාවට තමයි උත්තර දෙන්නේ. ඒක හොඳයි. ඒක හරි. එහෙම වෙන්න පුළුවන්. නමුත් ගරු කථානායකතුමනි, අද න්‍යාය පත්‍රයේ එන්නේ කල් ගත්ත මගේ ප්‍රශ්නයක්. මම යොමු කරපු ප්‍රශ්න ගණනාවක් තව තිබෙනවා. ඔබතුමා කියනවා සාධාරණ වෙන්න ඕනෑ කියලා. ඒක හරි; හොඳයි. ගරු කථානායකතුමනි, එතකොට තිබෙන ප්‍රශ්නය තමයි විපක්ෂයට ප්‍රශ්න අහන්න තිබෙන වාර ගණන අඩු වෙන එක. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් ප්‍රශ්න අහන්න ඕනෑ. නමුත්, එතුමන්ලාට ඒ ප්‍රශ්න අමාත්‍යාංශයට ගිහින් අහලා විසඳා ගන්නත් පුළුවන්. එහෙම කියලා බැහැ, ඒවාත් අහන්න ඕනෑ. නමුත් විපක්ෂයට සාධාරණයක් ඉෂ්ට කරන්න. දැන් මේ ප්‍රශ්න ඔක්කොම ගත්තොත්, අද තිබෙන්නේ න්‍යාය පත්‍රයට පළමු

[ගරු චමින්ද විජේසිරි මහතා]

වතාවට එන ප්‍රශ්න. මගේ පළමු වතාවට එන ප්‍රශ්නයක් මෙතැන නැහැ, ගරු කථානායකතුමනි. මම මේ ගැන ලේකම් මණ්ඩලයටත් කිව්වා. ඒක හිතා මතා කල් මරනවා. ඒකට පොඩි අවස්ථාවක් හදලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ගරු අගමැතිතුමියනි, අපට පෙනෙනවා ඔබතුමියලාගේ ආණ්ඩුව තවම මේ කාරණයට සම්බන්ධ පසුගිය කාරණා ටික තමයි කියවන්නේ කියලා. හැබැයි, මීට වඩා සාධනීය පිළිතුරක් අපි බලාපොරොත්තු වෙනවා. හැබැයි, මට පරස්පර ප්‍රශ්න දෙකක් තිබෙනවා, ගරු අගමැතිතුමියනි. 2025.08.06වැනි බදාදා අගමැතිතුමියගෙන් අහන ප්‍රශ්නවලදී, "වංචාව හා දූෂණය පිළිබඳව මෙන්ම ඒ තුළින් මහජන මුදල් අපතේ යෑම හා අවභාවිත වීම පිළිබඳව සමාජයේ විශාල කතිකාවක් ඇති වී ඇත. ඒ අතර සීනි බදු වංචාව, සුදු ලූනු වංචාව, පොල්තෙල් ආනයනයේදී සිදු වූ වංචාව මෙන්ම මහ බැංකු බැඳුම්කර වංචාව කැපී පෙනේ..." ආදී වශයෙන් කියලා මම ප්‍රශ්නයක් ඇහුවා, ගරු කථානායකතුමනි. ගරු අගමැතිතුමියනි, ඔබතුමියගෙන් මම ඒ හා සමානව ඇහුවා, මහ බැංකු වංචාව, සුදු ලූනු වංචාව, සීනි බදු වංචාව හා පොල්තෙල් ආනයනයේදී සිදු වූ වංචාවල ප්‍රමාණයෙන් අහිමි වූ මුදල කොපමණ ද කියලා.

ඔබතුමිය ඊට ලබා දීපු උත්තරය තමයි, ඒක ගණනය කරලා නැහැ කියන එක. ඒක ඔබතුමිය අද තහවුරු කළා. මම අහනවා, ගරු කථානායකතුමනි, එම බැඳුම්කර වංචාවේ දී ශ්‍රී ලංකා ආර්ථිකයට සිදු වූ බලපෑම සහ මුදල කොපමණද කියලා. අගමැතිතුමිය ඒ සඳහා උත්තරය දුන්නේ, මේ වෙනකොට අලාභයක් වෙලා ද, පාඩු වෙලා ද මුදල කොපමණ ද කියලා ගණනය කරලා නැහැ කියලායි. ඔබතුමියගේ පිළිතුරේ ඒක තිබුණා. 2025.08.06වෙනි දාත් ඒක කියනවා. අලාභයක් වෙලා නැහැ, පාඩුවක් වෙලා නැහැ කියන කාරණය තහවුරු කර ගන්න බැරිව තිබිය දී ඒක වංචාවක්, දූෂණයක්, රටට පාඩුවක් කියන කාරණය මේ සමාජයට කිව්වේ බලය ලබා ගැනීම වෙනුවෙන්ද, එහෙම නැත්නම් වෙනත් කාරණයක් නිසාද? ඇත්තවශයෙන්ම ඔබට මේ ගැන උනන්දුවක් තිබෙන බව අපට පෙනෙන්නේ නැහැ, ගරු අගමැතිතුමියනි. මොකද, පසුගිය කාලයේ දාපු නඩු ටික නේ ඔය කියා ගෙන ගියේ. එවකට තිබුණු ආණ්ඩු මේවා යට ගැහුවා කියන කාරණයත් කිව්වා. හැබැයි, ඔබතුමියලා විසින් මේ මහ බැංකු බැඳුම්කර වංචාව ඇතුළු සියලු දේ වෙනුවෙන් ගත්ත ක්‍රියාමාර්ග මේ පාර්ලිමේන්තුවට කියන්න පුළුවන්. අලුතින් ගත්ත ක්‍රියාමාර්ග කියන්න පුළුවන්. පරණ නඩු ටික යට ගහ ගත්ත කියන එක සාධාරණයි. මොකද, ඒ කාලයේ ඒ ආණ්ඩු නේ තිබුණේ. මම කියන්නේ ඔබතුමියලා මේ සඳහා ගත්ත අලුත් ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මේ ගරු සභාවට දන්වන්න කියලායි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, කියපු විධියටම මේකේ පාඩුවක් වෙලා ද, වංචාවක් වෙලා ද කියන එක තහවුරු කර ගන්න විතරක් නොවෙයි, ඒකේ නිශ්චිත ප්‍රමාණය තහවුරු කර ගන්න ඒ කටයුතු සිද්ධ වෙමින් යනවා. මෙතැන පාඩුවක් වෙලාද, වංචාවක් වෙලා ද නැද්ද කියන එක ගැන කිසිම සැකයක් නැහැ.

ඒ නිසා නේ, අධිකරණ ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්නේ. අනෙක් එක ගරු කථානායකතුමනි, අධිකරණ ක්‍රියාවලියක් යන විධියක් තිබෙනවා. ඒකේ මැදට පැනලා ඕනෑ ඕනෑ විධියට හරවන්න බලයක් ආණ්ඩුවකට නැහැ. අධිකරණ ක්‍රියාවලිය තුළ තමයි කරන්න පුළුවන් දේ සිද්ධ වෙන්නේ. ඒ අධිකරණ ක්‍රියාවලිය ස්වාධීනව ක්‍රියාත්මක වීමේදී ඒකට බාධා නොකිරීම තමයි අපේ ආණ්ඩුව තුළින් සිද්ධ වෙන්නේ. ඒ නිසා ස්වාධීනව ඒ අධිකරණ ක්‍රියාවලිය සිදු වෙමින් පවතිනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඒ කියන්නේ, පසුගිය කාලයේ සිදු වෙච්ච දේ එහෙමම යන්න දෙනවා. ඒ ආණ්ඩු කාලයේ එයාලාගේ හිතවතුන් එක්ක සිද්ධ වෙච්ච ගනුදෙනු තිබියදෙන්, ඒකට සාධාරණයක් වුණත් නැතත් අපි ඇඟිලි ගහන්නේ නැහැ කියන එක නේ කියන්නේ. ඒක හොඳයි. ඒක රටට දැන ගන්න කියන එක හොඳයි. හැබැයි, සමගි ජන බලවේගය ගොඩ නැඟීමට ප්‍රධාන හේතුවක් වුණු කාරණයක් තමයි ඒක. ඔබතුමියලා ඇතුළු බොහෝදෙනා එවකට නඟපු චෝදනාවක් මේක. ඒකේ චූදිතයන් හැටියට හිටපු අපට ඒක නිවැරදි කර ගැනීමේ අයිතිය තිබෙනවා. එවකට තිබුණු ආණ්ඩුවේ චූදිතයන් හැටියට අපි හිටියා. හැබැයි, ඒක නිවැරදි කිරීමට සාධාරණයක් වර්තමාන ආණ්ඩුව නොකරනවාය කියන තහවුරුව කිරීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්.

ගරු අගමැතිතුමියනි, ඒ සඳහා ඔබතුමිය එදා දීපු පිළිතුර මට පොඩ්ඩක් කියවන්න වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, විනාඩි දෙකක් ඇතුළත ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඒක සභාගත කරන්න බැහැ. ඒක කියන්න වෙනවා, ගරු කථානායකතුමනි. 2025 අගෝස්තු 06වැනි දා මම ඔබතුමියගෙන් ප්‍රශ්නයක් ඇහුවා, ගරු අගමැතිතුමියනි. එම ප්‍රශ්නයේ අංක 05 යටතේ, "ඉදිරියේදී අත්අඩංගුවට ගැනීමට හා ප්‍රශ්න කිරීමට නියමිත පුද්ගලයන් කවරේද?" යන්නත්, අංක 04 යටතේ, "එම සිදුවීම් සම්බන්ධව මෙතෙක් ප්‍රශ්න කොට ඇති හා අත්අඩංගුවට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව හා ඔවුන්ගේ නම් කවරේද?" යන්නත් අසා තිබෙනවා. ඔබතුමිය ඊට පිළිතුරක් ලබා දී තිබෙනවා.

ඒ අනුව, 03වන පිළිතුරෙහි මෙසේ සඳහන් වනවා:

> "ඉහත සඳහන් කළ විගණන වාර්තාවේ අඩංගු කරුණු සම්බන්ධයෙන් 2022 ජූනි මස 21වන දින පාර්ලිමේන්තුවේදී පැවැති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂණයක් කිරීමට මුදල් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට නියෝග කර ඇත. ඒ අනුව, මේ පිළිබඳ විමර්ශනයක් කිරීම සඳහා 2022 ජූලි මස 12වන දින මුදල් අමාත්‍යාංශය පොලිස්පතිවරයා මඟින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. ඒ පිළිබඳ පරීක්ෂා කර බලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2025 ජනවාරි 02 දිනැතිව නැවතත් මේ පිළිබඳ ව්‍යවහාරික විගණනයක් කිරීමට විගණකාධිපති මඟින් කටයුතු කර දෙන ලෙස ද ඉල්ලා ඇත. එම ලිපිය ඇමුණුම 01 ලෙස දක්වා ඇත. මුදල් අමාත්‍යාංශය විසින් ඒ බව විගණකාධිපති වෙත 2025 ජනවාරි 21 දිනැතිව යොමු කර ඇත."

මම ඔබතුමියගේ පිළිතුර මේ කියන්නේ. එහි වැඩිදුරටත් මෙසේ තිබෙනවා:

> "එයට පිළිතුරු ලෙස 2025 මාර්තු 07 දින විගණකාධිපති විසින් මේ පිළිබඳ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි තවදුරටත් පුළුල් පරීක්ෂණයක් සිදු කිරීමට නම්, මෙම කරුණට අදාළ පාර්ශ්වකරුවන්ගේ තොරතුරු හා සාක්ෂි ලබා ගැනීමට හැකියාවක් නොමැති බව දැනුම් දී ඇත."

ඒ කියන්නේ, මේ කිසිම කාරණයක් පිළිබඳව නැවත පරීක්ෂණයක් කරන්න ඒ සාක්ෂිකරුවන්ගෙන් තොරතුරු ලබා ගන්න බැහැයි කියන එක ඔබතුමිය අගෝස්තු මාසයේ 06වැනි දා පිළිතුරෙන් කියලා තිබෙනවා. මේ උත්තර දෙක පරස්පරයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය කෙටි කරන්න. දැනටත් විනාඩි තුනක් ගත වෙලා තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, අසාධාරණ වෙන්න එපා. ඔබතුමාට එන පීඩනය ගැන අපි දන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විනාඩි තුනක් අරගෙන තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔබතුමා මෙතැනින් ගියාට පසුව ඔබතුමාට එන පීඩනය ගැන අපි දන්නවා. ඔබතුමා මේ පාර්ලිමේන්තුව තුළ ඉතා මනා ලෙස අවබෝධාත්මකව කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්නය සඳහා විනාඩි තුනක් ගත්තා. අතුරු ප්‍රශ්නය කෙටි කරන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඔබතුමා මේ අය වැය විවාදයට පසුව බලන්න, ඔබතුමා ආණ්ඩු පක්ෂයට සලකන විධියයි, විපක්ෂයට සලකන විධියයි ගැන. ඔබතුමාටම දුක හිතෙයි. එය මාධ්‍ය තුළින් විකාශය වෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න සඳහා දැනට විනාඩි තුනක් අරගෙන තිබෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මම මේක කියවන්න එපා යැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුරු කියවන්න අවශ්‍ය නැහැ. ඔබතුමාට දෙන ලද උත්තරයෙන් පැන නඟින ප්‍රශ්නයක් පමණක් අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ප්‍රශ්නය ගොනු කර ගැනීම සඳහා, අගමැතිතුමිය කලින් දීපු උත්තරය වැරැදියි කියලා තහවුරු කරන්න මේක කියවන්න එපා යැ, ගරු කථානායකතුමනි.

ගරු අගමැතිතුමියනි, ඒක නිසා මම ඔබතුමියට යෝජනා කරනවා, ඔබතුමියටත් සිදු වන යම් බලපෑමක් මත වංචා, සියලු දේවල් වසන් කරන්න කටයුතු කරනවා කියලා. නමුත් NPP නායිකාව හැටියට, JVP එකේ බලපෑම්වලින් තොරව මේ සියල්ල අල්ලන්න පුළුවන් කශේරුවක් සහිතව කටයුතු කරනවාද කියන කාරණය පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කරන්න.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එතුමාට මගේ පිළිතුරු එතුමාගේ කෝණයෙන් අර්ථකථනය කිරීමට අයිතියත් ඇත, විවිධ ප්‍රකාශ කිරීමටත් අයිතියක් ඇත. එතුමා කියන කිසි දෙයක් එතැනින් කිසිසේත්ම තහවුරු වෙන්නේ නැහැ. ඒක එතුමාගේ අර්ථකථනයක්, එතුමාගේ ආකල්පයක්, එතුමාගේ ප්‍රකාශයක්. ඒවා මෙතැන කිව්වා කියලා කිසිසේත්ම තහවුරු වීමක් වෙන්නේ නැහැ. මම කරුණු ඇතුවයි ප්‍රශ්නවලට උත්තර දුන්නේ. මූලික ප්‍රශ්නයට අදාළව කිසිම අතුරු ප්‍රශ්නයක් මෙතැන මතු කරලාත් නැහැ. ගරු කථානායකතුමනි, එම නිසා මට නැවත වතාවක් කරන්න තිබෙන්නේ, මගේ ළඟ තිබෙන තොරතුරු ඉදිරිපත් කිරීමත්, තහවුරු කිරීමත් විතරයි. අපේ ආණ්ඩුව විසින් සියලුම නඩු කටයුතු කිසිම බාධාවක් නැතුව කරගෙන යනවා. යට ගිය විධි ගැන අපි මෙතැන නැවත නැවතත් කථා කරන්න අවශ්‍ය නැහැ. මේ රටේ ජනතාව වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට කරන්න අපේ ආණ්ඩුවෙන් ගතයුතු සියලු ක්‍රියාමාර්ග ගන්නවා. ඒ වාගේම එම නඩු කටයුතු ඉතාම හොඳින් කරගෙන යනවාය කියන එක තමයි මට කියන්න තිබෙන්නේ. එතුමාගේ අර්ථකථනය ගැන මට කියන්න දෙයක් නැහැ.
බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -347/2024- (1), ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -563/2025- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ජාතික පාසල් සහ පළාත් පාසල්: කම්කරු පුරප්පාඩු
தேசிய பாடசாலைகள் மற்றும் மாகாண பாடசாலைகள்: பணியாளர்களுக்கான வெற்றிடங்கள்
NATIONAL SCHOOLS AND PROVINCIAL SCHOOLS: VACANCIES FOR LABOURERS

625/2025

**5. ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ජාතික පාසල්වල සහ පළාත් සභා පාසල්වල මේ වනවිට සේවය කරනු ලබන කම්කරුවන් සංඛ්‍යාව, එම පාසල් සඳහා අනුමත කම්කරුවන් සංඛ්‍යාව සහ එම පාසල්වල මේ වනවිට පවතින කම්කරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික පාසල්වල කම්කරුවන් අතිරික්තයක් පවතින විට පළාත් සභා පාසල්වල කම්කරු පුරප්පාඩු පැවතීමට හේතු කවරේද;

(iii) රජයේ පාසල් පද්ධතිය තුළ කම්කරුවන් නිසි පරිදි ස්ථානගත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු කිංස් නෙල්සන් මහතා]

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய பாடசாலைகள் மற்றும் மாகாண சபை பாடசாலைகளில் இன்றளவில் கடமையாற்றும் பணியாளர்களின் எண்ணிக்கை, அந்தப் பாடசாலைகளுக்காக அங்கீகரிக்கப்பட்டுள்ள பணியாளர்களின் எண்ணிக்கை மற்றும் அப்பாடசாலைகளில் இன்றளவில் காணப்படுகின்ற பணியாளர்களுக்கான வெற்றிடங்களின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(ii) தேசிய பாடசாலைகளில் பணியாளர்கள் மிகையாகக் காணப்படுகையில், மாகாண சபை பாடசாலைகளில் பணியாளர்களுக்கான வெற்றிடங்கள் நிலவுவதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) அரசாங்கப் பாடசாலைக் கட்டமைப்பினுள் பணியாளர்களை உரிய இடங்களில் பணியமர்த்த மேற்கொள்ளப்படவிருக்கும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of labourers currently employed at National Schools and provincial council schools, the approved cadre of labourers and the number of vacancies prevailing for labourers at those schools, separately;

(ii) the reasons for the prevalence of vacancies for labourers at provincial council schools while there is a surplus of them at National Schools; and

(iii) the measures taken to properly place labourers in the government school system?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ජාතික පාසල්වල (වැටුප් කාණ්ඩ PL 1 හා PL 2)

| අනුමත කම්කරු සංඛ්‍යාව | සිටින කම්කරු සංඛ්‍යාව | කම්කරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 7,956 | 6,653 | 1,303 |

පළාත් සභා පාසල්වල

| පළාත | අනුමත කම්කරු සංඛ්‍යාව | සිටින කම්කරු සංඛ්‍යාව | කම්කරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර | 3,530 | 3,146 | 384 |
| දකුණ | 4,002 | 3,827 | 175 |
| මධ්‍යම | 2,264 | 1,788 | 476 |
| වයඹ | 2,573 | 2,451 | 122 |
| ඌව | 2,478 | 2,471 | 7 |
| උතුරු මැද | 1,399 | 1,339 | 60 |
| සබරගමුව | 1,498 | 1,430 | 68 |
| උතුර | 1,131 | 759 | 372 |
| නැගෙනහිර | 1,197 | 941 | 256 |
| එකතුව | 20,072 | 18,152 | 1,920 |

(ii) ජාතික පාසල්වල කනිෂ්ඨ කාර්ය මණ්ඩල අතිරික්තයක් නොමැති අතර, කම්කරුවන්ගේ සේවය හැරයාම්, ශ්‍රේණි උසස්වීම්, විශ්‍රාම යාම් වැනි හේතූන් මත පළාත් පාසල්වල හා ජාතික පාසල්වල කම්කරු පුරප්පාඩු පවතී.

(iii) දැනට ජාතික පාසල්වල හා පළාත් පාසල්වල පුරප්පාඩු පවතින අතර, නව බඳවා ගැනීම් සිදුකළ පසු ඌනතා ඇති පාසල් සඳහා ස්ථානගත කිරීම සිදු කරනු ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අගමැතිතුමියනි, මුරකරුවෙකු පමණක් සිටින පාසල් තිබෙනවා. ඒ වාගේම මුරකරුවන් දෙදෙනෙකු සිටින පාසල් තිබෙනවා. මුරකරුවෙකුගේ සේවා කාලය දිනකට පැය 9යි. මුරකරුවන් දෙදෙනෙක් හිටියත් පැය 6ක් පාසල අනාරක්ෂිතයි. ඒ නිසා සමහර පාසල්වල විශාල ගැටලු මතුවෙලා තිබෙනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අරලගංවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විලයාය ජාතික පාසලේ දරුවන්ට බොන්න වතුර ගන්න තිබුණු මෝටරේ ගලවාගෙන ගිහිල්ලා තිබුණා. ඒකට හේතුව, එම පාසලේ ඉන්නේ මුරකරුවෝ දෙන්නයි. ඒක ජාතික පාසලක්. ඔබතුමියගේ අමාත්‍යාංශය මේ සම්බන්ධව සොයා බලා, යම් පියවරක් ගන්නවාද? ඊයේ ඔබතුමියගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය නේ, තිබුණේ. ඔබතුමන්ලා කියන විධියට විශාල මුදලකුත් වෙන් කරගෙන තිබෙනවා. මේ මුරකරුවන් පිළිබඳව තිබෙන ප්‍රශ්නය විසඳන්න කටයුතු කරනවාද, ගරු අගමැතිතුමියනි?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මතු කළේ වැදගත් ප්‍රශ්නයක්. පාසල් ගණනාවක මේ ප්‍රශ්නය තිබෙනවා. අපි ඒ ගැන සොයා බලා පවතින පුරප්පාඩු පුරවන්න මේ වනවිටත් ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එවැනි නිශ්චිත ප්‍රශ්න තිබෙන පාසල් ගැන දැනුවත් නම්, අපව ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන්න. අපි ඒ වෙනුවෙන් විශේෂ අවධානයක් යොමු කරන්නම්. ඒක අපි විසඳමින් යන ගැටලුවක්. ඔබතුමා කියන එක හරි. පාසල් ගණනාවක එවැනි ප්‍රශ්න තිබෙනවා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු විපක්ෂ නායකතුමා අහනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු අග්‍රාමාත්‍යතුමියනි, අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන මුදල පිළිබඳව ඔබතුමිය පැහැදිලි කිරීමක් කළා, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කළ යුතුයි කියන ස්ථාවරයක ඔබතුමිය හිටියේ නැහැ කියලා. හැබැයි අපි දන්නවා, ඔබතුමිය විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමයේ සාමාජිකාවක් හැටියට අධ්‍යාපනය වෙනුවෙන් සියයට 6ක ප්‍රතිශතයක් වෙන් කිරීම වෙනුවෙන් පෙනී සිටි බව. ඔබතුමිය, ඒ වෙනුවෙන් කරපු උද්ඝෝෂණවලටත් සහභාගි වුණා. අපි පිළිගන්නවා, අධ්‍යාපනය වෙනුවෙන් එක පාරටම එවැනි ප්‍රතිශතයක් වෙන් කිරීම අපහසු බව. නමුත්, අඩුම තරමේ සෑහෙන මුදලක් - දැනට තිබෙන ප්‍රතිශතයට වැඩි ඉහළ මුදලක් වෙන් කිරීම - වැදගත් නේද, ඔබතුමිය දරපු ස්ථාවරය අනුව? මොකද, ඔබතුමිය අධ්‍යාපනයට

සියයට 6ක් වෙන් කළ යුතුයි කියන ඒ සටන් පාඨය, ඒ slogan එක තිබෙන ටී-ෂර්ට් එකක් පවා ඇඳගෙන ඒ වෙනුවෙන් සටන් කළා. ඒ වෙනුවෙන් අපිත් සටන් කළා. අපි දන්නවා, මේ ඉලක්කය එක පාරටම සම්පූර්ණ කර ගැනීම අපහසුයි කියලා. නමුත්, ඒ සඳහා සාධනීය පියවරක් ගත යුතුයි නේද? මේ වැඩි වෙලා තිබෙන්නේ ඉතාම පොඩි ප්‍රමාණයක්, පසුගිය වසරට සාපේක්ෂව. ඒ සඳහා සාධනීය වැඩි කිරීමකට ඔබතුමිය යොමු නොවන්නේ ඇයි කියන එක පොඩ්ඩක් විග්‍රහ කළා නම් බොහොම වැදගත්. මොකද, ඔබතුමියට කියන්න බැහැ, සියයට 6ක් වෙන් කිරීම වෙනුවෙන් ඔබතුමිය පෙනී සිටියේ නැහැ කියලා. ඔබතුමිය ඒ සටන් පාඨය - slogan එක - තිබෙන ටී-ෂර්ට් එකක් පවා ඇඳගෙන ඒ උද්ඝෝෂණවලට සහභාගි වෙලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා ඇතුළු සියලුදෙනා මම 2011-2012 කාලයේ ඇඳපු ටී-ෂර්ට් එක ගැනත් කථා කරන එක පිළිබඳව, එච්චර අපි ගැන අවධානයක් තිබීම පිළිබඳව ඇත්තටම මම එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කිරීමේ අරගලය වෙනුවෙන් මම එදාත් පෙනී සිටියා, අදත් පෙනී සිටිනවා. සියයට 6 කියන්නේ ජාත්‍යන්තර නිර්ණායකයක්; UNESCO එක විසින් දීලා තිබෙන නිර්ණායකයක්. රජයක් විසින් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කළ යුතු අවම මුදල කියන එක ජාත්‍යන්තර නිර්ණායකයක්. මම හිතන විධියට, ඒක අපි විතරක් නොවෙයි, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනය විතරක් නොවෙයි, සමස්ත රටම සහ ජාත්‍යන්තරයම පෙනී ඉන්න නිර්ණායකයක්. ඒක වෙනුවෙන් අපේ රටේ විතරක් නොවෙයි, ජාත්‍යන්තර අරගළයකුත් තිබෙනවා, ගරු කථානායකතුමනි.

අපි ඒ අරගළය ආරම්භ කළේ 2011දී. 2011 සිට 2024 දක්වා රට පාලනය කළේත්, අධ්‍යාපනයට මුදල් වෙන් කළේත් අපේ ආණ්ඩුව නොවෙයි. දැන් මේකට එකඟයි කියන අය පාලනය කරපු යුග තමයි ඒ කාලවල තිබුණේ. ඒ යුගවලදී ඔය සියයට 6ක් වෙන් කිරීමේ අරගළය ගැන ඒ අයට මැදිහත් වෙන්න තිබුණා නේ. නමුත්, මැදිහත් වුණේ නැහැ නේ. අපි ආණ්ඩුව භාර ගන්නකොට අධ්‍යාපනයට වෙන් කිරීම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.04ක වාගේ අගයක තිබුණේ. අපේ පළමුවැනි අය වැයෙනුත් අපි ඒ ප්‍රමාණය වැඩි කළා. දෙවැනි අය වැයෙනුත් ඒ ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා. ඒ අනුව අපි පෙන්නුම් කරලා තිබෙනවා, මේ දිශානතියට - සියයට 6 කියන target එකට - යන්න අපි වැඩ කරමින් ඉන්නේ කියලා. අවුරුදු ගණනාවක්, ඒ කියන්නේ 2011 සිට 2024 දක්වා මේ රට පාලනය කරපු අය, එතැනට යන දිශානතියේ නොවෙයි, පහතට යන දිශානතියක ඉඳලා, දැන් අපි වැඩ කරන දිශානතියට ආචාම අපෙන් අහනවා, ඇයි සියයට හය නොදෙන්නේ කියලා. ගරු කථානායකතුමනි, මට මේකේ තර්කයක් - logic එකක් - පෙනෙන්නේ නැහැ. ඒ නිසා අපි ඉන්න ස්ථාවරය ඉතාම පැහැදිලියි. අපි වචනවලින් නොවෙයි, ක්‍රියාවෙන් පෙන්නුම් කරලා තිබෙනවා, අපි අධ්‍යාපනයට ලබා දෙන අවධානය සහ ඒ සඳහා ක්‍රමිකව මුදල් වෙන් කරනවා කියන එක. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මෙතුමන්ලා කට පාඩමින් කියන්න දන්නා නිසා මම නැවත කියන්නේ, ඒක හොඳට බලන්න කියලායි. ඒකේ තිබෙනවා, අධ්‍යාපනයට මුදල් වෙන් කිරීම සියයට 6 දක්වා ක්‍රමිකව ගෙන යන්න අපි සැලසුම් කරගෙන තිබෙනවා කියලා. ඒක තමයි අපි මේ කරන්නේ.

ගරු කථානායකතුමනි, මම එතුමාටත් ස්තුතිවන්ත වෙනවා, මේ සියයට හයේ කථාව live තියාගන්න එක ගැන. මම හිතන විධියට, ඒක අපි හැමෝටම හොඳයි. හැබැයි, කිසිම විධියක හයකින් ඉන්න එපා කියලා අපි එතුමාට කියනවා. අපි ඒ දිශානතියට යොමු වෙලා තිබෙනවාය කියන එක ක්‍රියාවෙන් ඔප්පු කරලා තිබෙන නිසා අපට ඒ ගැන විශ්වාසයි. අපි ගණනය කරලාත් තිබෙනවා, ලබන අවුරුද්දටත්, ඊළඟ අවුරුද්දටත් මේක ක්‍රමිකව වැඩි වෙන්නේ කොහොමද කියන එක ගැන. ඉතින් ඒ දිශානතිය, ඒක වැඩි වෙන්නේ කොහොමද කියන එක ගැන අපේ ආණ්ඩුව ඍජු ස්ථාවරයක ඉන්නවාය කියන එක අපි ඔප්පු කරලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 1 -21/2024- (1), ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වන්දාරුමූලෙයි දුම්රිය ස්ථානය: ශීඝ්‍රගාමී දුම්රිය නැවැත්වීම
## வந்தாறுமூலை புகையிரத நிலையம்: கடுகதிப் புகையிரதங்களை நிறுத்துதல்
## VANTHARUMOOLAI RAILWAY STATION: STOPPING OF EXPRESS TRAINS

347/2024

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වන්දාරුමූලෙයි දුම්රිය ස්ථානය පිහිටා ඇති බවත්;

(ii) සාමාන්‍ය දුම්රිය පමණක් එම දුම්රිය ස්ථානයේ නවත්වන අතර ශීඝ්‍රගාමී දුම්රිය නොනවත්වන බවත්;

(iii) ඉහත දුම්රිය ස්ථානයේ ශීඝ්‍රගාමී දුම්රිය නැවැත්වීමට කටයුතු කරන්නේ නම්, නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුන්ට මෙන්ම වන්දාරුමූලෙයි, පලාච්චෝලෙයි, කොම්මා න්තුරෙයි, ඔරුමුළච්චෝලෙයි, කළුවන්කේනි, මාවඩිවෙම්බු, සිත්තාණ්ඩි සහ චෙංගලඩි යන ගම්මානවල පදිංචි ජනතාවටද ප්‍රතිලාභ ලැබෙන බවත්; එතුමා දන්නේද?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ආ) එසේ නම්, එම දුම්රිය ස්ථානයේ ශීඝ්‍රගාමී දුම්රිය නැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தின் ஏறாவூர்பற்று பிரதேச செயலாளர் பிரிவில் வந்தாறுமூலை புகையிரத நிலையம் அமைந்துள்ளது என்பதையும்;

(ii) சாதாரண புகையிரதங்கள் மாத்திரம் இந்தப் புகையிரத நிலையத்தில் நிறுத்தப்படுவதோடு, கடுகதிப் புகையிரதங்கள் நிறுத்தப்படுவதில்லை என்பதையும்;

(iii) மேற்படி புகையிரத நிலையத்தில் கடு கதிப் புகையிரதங்களை நிறுத்துவதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமாயின், கிழக்குப் பல்கலைக்கழக மாணவர்களும் வந்தாறுமூலை, பலாச்சோலை, கொம்மாந்துறை, ஒருமுழச்சோலை, களுவங்கேணி, மாவடிவேம்பு, சித்தாண்டி, செங்கலடி ஆகிய கிராமங்களில் வதியும் மக்களும் பயனடைவார்கள் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், அந்தப் புகையிரத நிலையத்தில் கடுகதிப் புகையிரதங்களை நிறுத்துவதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Is he aware that -

(i) the Vantharumoolai railway station is located in the Eravur Pattu Divisional Secretary's Division of the Batticaloa District;

(ii) only the slow trains stop at that railway station while no express train does; and

(iii) if steps are taken to schedule express trains to stop there, not only students studying at the Eastern University, but also residents of the villages of Vantharumoolai, Palachcholai, Kommanthurai, Orumulachcholai, Kaluwankeni, Mavadivembu, Sittandy, and Chenkaladi would benefit from that?

(b) If so, will he inform this House whether steps will be taken to schedule express trains to make a stop at the said railway station?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වන්දාරුමූලෙයිහි පිහිටා ඇත්තේ දුම්රිය ස්ථානයක් නොව දුම්රිය නැවතුම්පළකි.

ඒ අනුව දුම්රියෙන් පැමිණෙන මගීන්ට එහිදී බැසීමට හැකියාව ඇති අතර, දුම්රියට පිවිසෙන්නේ නම් ආසන්න දුම්රිය ස්ථානයෙන් ප්‍රවේශ පත්‍ර මිලදී ගත යුතුය.

(ii) මෙම දුම්රිය නැවතුම්පළෙහි සාමාන්‍ය දුම්රියන් හා කොළඹ කොටුව-මඩකලපුව ශීඝ්‍රගාමී දුම්රියන් නවත්වනු ලැබේ.

එහි නොනවත්වා ධාවනය කරනු ලබන්නේ නගරාන්තර දුම්රිය හා රාත්‍රී තැපැල් දුම්රිය පමණි.

(iii) මේ වනවිට මෙම දුම්රිය ස්ථානයේ කොළඹ කොටුව-මඩකලපුව ශීඝ්‍රගාමී දුම්රිය නවත්වන අතර 2025.11.01 දින සිට මඩකලපුව-කොළඹ කොටුව ශීඝ්‍රගාමී දුම්රිය නවත්වනු ලැබේ.

(ආ) මගී ජනතාවගේ අවශ්‍යතාවන් පිළිබඳව සලකා බලා, රාත්‍රී තැපැල් දුම්රිය හා නගරාන්තර දුම්රිය හැර සෙසු දුම්රියන් එම ප්‍රදේශයේ නැවැත්වීමට කටයුතු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 - 563/2025 - (1), ගරු රෝහණ බණ්ඩාර මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු අමීර්තනාදන් අඩෛක්කලනාදන් මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### කොළඹ-මන්නාරම දුම්රිය සේවාවේ ගැටලු
### கொழும்பு - மன்னார் ரயில் சேவையிலுள்ள பிரச்சினைகள்
### ISSUES IN COLOMBO-MANNAR TRAIN SERVICE

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே!

பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன்கீழ், கொழும்பு - மன்னார் ரயில் போக்குவரத்துச் சேவை தொடர்பான முக்கியமான ஒரு பிரச்சினையைப் போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரினதும் இந்த மன்றினதும் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, கொழும்பு - மன்னார் ரயில் போக்குவரத்துச் சேவை அடிக்கடி தாமதமாக இயக்கப்படுவதனால், பொதுமக்களுக்கும் அரச ஊழியர்களுக்கும் மிகுந்த அசௌகரியம் ஏற்படுகின்றது. இந்தத் தாமதங்கள் அரச அதிகாரிகள் நேரத்துக்குப் பணிபுரிய வருவதிலும், அத்தியாவசிய சேவைகளின் செயற்பாட்டிலும் தடங்கலை ஏற்படுத்துகின்றது. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் உடனடியாக நடவடிக்கை எடுத்து, கொழும்பு - மன்னார் ரயில் போக்குவரத்துச் சேவையைக் காலதாமதமின்றிச் செயற்படுத்துவதற்கான வழிமுறையைச் செய்யுமாறு கேட்டுக் கொள்கின்றேன்.

மேலும், மன்னார் நகரிலிருந்து ரயில் நிலையத்துக்குச் செல்வதற்கு உரிய முறையில் அமைக்கப்பட்ட சரியான அணுகுமுறைச் சாலைகூட இன்மையால், பயணிகள் ரயில் நிலையத்தைச் சென்றடைவதே மிகவும் கடினமாக இருக்கின்றது. எனவே, மன்னார் நகரத்திலிருந்து மன்னார் ரயில் நிலையத்துக்குச் செல்வதற்குச் சரியான சாலையை அமைக்க உடனடி நடவடிக்கை எடுக்குமாறு கௌரவ அமைச்சரிடம் கேட்டு நிற்கின்றேன்.

மற்றுமொரு கவலைக்குரிய விடயம் என்னவென்றால், மன்னார் நகரத்துக்கும் ரயில் நிலையத்துக்கும் இடையிலான இணைப்புப் பேருந்துச் சேவை இல்லாமையினால், பயணிகள் மூன்றுசக்கர வாடகை வாகனங்களைப் பயன்படுத்த வேண்டியிருப்பதுடன், ஒரு பயணத்துக்காக 1,500 ரூபாய் வரை செலுத்த வேண்டியிருப்பதாகும். இது பலருக்கும் மிகுந்த சுமையாக உள்ளது. ஆகவே, பொதுமக்களின் நலனுக்காக இந்தப் பாதையில் ஒரு குறைந்த கட்டண மற்றும் நம்பகமான பேருந்துச் சேவையை வழங்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, மன்னார் ரயில் நிலையத்தில் இன்னும் onlineமூல பயணச்சீட்டு முன்பதிவு வசதி இல்லாமையும் மனவருத்தம் தருகின்ற விடயமாக இருக்கின்றது. அரசு digital தொழில்நுட்பத்தை ஊக்குவித்து வருகின்ற இந்த நேரத்தில், இவ்வாறான அடிப்படைச் சேவை வசதிகூட அங்கு இல்லாதது ஏற்றுக்கொள்ள முடியாத ஒன்றாகும். எனவே, மன்னார் ரயில் நிலையத்துக்கு விரைவில் online ஆசன முன்பதிவு வசதியை ஏற்படுத்துவதற்கு நடவடிக்கை எடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, இந்தப் பிரச்சினைகள் மன்னார் மக்களின் தினசரி வாழ்க்கையையும் அரச சேவை ஊழியர்களின் பயணத்தையும் நேரடியாகப் பாதிக்கின்றன. ஆகையால், அமைச்சர் அவர்கள் விரைவாக, பயனுள்ள நடவடிக்கைகளை எடுக்க வேண்டுமென எமது மக்கள் சார்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

කොළඹ කොටුව සිට තලෙයිමන්නාරම දක්වා සහ තලෙයිමන්නාරම සිට කොළඹ කොටුව දක්වා ධාවනය වන දුම්රිය කොළඹ කොටුවට පැමිණෙන සහ කොළඹ කොටුවෙන් පිටත් වන මගීන්හට කාර්යාල දුම්රියක් ලෙස ධාවනය නොවන අතර, කොළඹ කොටුවෙන් පස් වරු 3.45ට පිටත් වන කොළඹ කොටුව - තලෙයිමන්නාරම දුම්රිය පොල්ගහවෙලට පස් වරු 5.05ට, කුරුණෑගලට පස් වරු 5.29ට, මහව හන්දියට පස් වරු 6.28ට, අනුරාධපුරයට පස් වරු 7.50ට, මැදවච්චියට පස් වරු 8.20ට ළඟා වෙමින් තලෙයිමන්නාරම්තොට දුම්රිය ස්ථානයට පස් වරු 10.13ට ළඟා වෙයි. ඒ අනුව මෙම දුම්රිය ගම්පහ, වෙයන්ගොඩ, පොල්ගහවෙල සහ කුරුණෑගල ආදී ප්‍රදේශවලදී කාර්යාල මගීන් භාවිත කිරීම සිදු කරයි. එසේම නැවත තලෙයිමන්නාරම දුම්රිය ස්ථානයෙන් පෙර වරු 4.10ට පිටත්ව මැදවච්චිය, අනුරාධපුරය, මහව, කුරුණෑගල, පොල්ගහවෙල සහ කොළඹ කොටුවට පෙර වරු 10.19ට ළඟා වන ලෙස ධාවනය කරනු ලබයි. ඒ අනුව මැදවච්චියේ සිට කුරුණෑගල දක්වා ප්‍රදේශවල මගීන් කාර්යාල දුම්රියක් ලෙස මෙය භාවිත කිරීම සිදු කරයි.

මෙම දුම්රිය එන්ජිමක් සහිත නව ඉන්දියානු දුම්රිය මැදිරි කට්ටලයක් මඟින් ධාවනය කරනු ලබන අතර, මේ සඳහා භාවිත කිරීමට පවතින දුම්රිය එන්ජින් ප්‍රමාණය සීමිත සංඛ්‍යාවක් වන බැවින් ද, එකී එන්ජින් දීර්ඝ කාලයක් භාවිත කළ ඒවා වන බැවින්ද, සමහර අවස්ථාවල කාර්මික දෝෂයන්ට ලක්වීම, වනඅලි සඳහා පනවා ඇති වේග සීමා සහ මහව සහ අනුරාධපුරය අතර සංඥා නිසි ලෙස ස්ථාපනය කර නොමැති බැවින් දුම්රිය මාරු වීමේදී දුම්රිය ප්‍රමාදයට ලක් වී ඇත. එසේම මෙම දුම්රිය ප්‍රමාද අවම කර ගැනීමට, එන්ජින් අලුත්වැඩියා කිරීම සහ මහව සහ අනුරාධපුරය අතර සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය සිදු වන බැවින් ඉදිරියේදී දුම්රිය ප්‍රමාදය අවම කර ගැනීමට කටයුතු කරමින් පවතී.

මන්නාරම නගරයේ සිට දුම්රිය ස්ථානය දක්වා වන මාර්ගය - approach road to public buildings - මාර්ග සංවර්ධන අධිකාරියට අයත් B. 030 මාර්ගයකි. එය ගල් අතුරා තාර දමා ඇති දිග කිලෝමීටර 2.4ක හා පළල මීටර් 4.0ක මාර්ගයකි. 2019 වසරේදී මෙම මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් පිරිනැමුවද රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් එහි වැඩකටයුතු සිදු නොවීය. මාර්ග නඩත්තු කටයුතු හා වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ - RDA එක යටතේ තිබෙන- මෙම මාර්ගයේ පළමු කිලෝමීටරයක දුරක් මීටර් 5.0ක් දක්වා පුළුල්කොට කාපට් අතුරා වැඩිදියුණු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ උතුරු පළාත් අධ්‍යක්ෂ විසින් ටෙන්ඩර් කැඳවා තිබේ. එම මිල ගණන් 2025 නොවැම්බර් 20 දින විවෘත කිරීමට නියමිතය. ඇස්තමේන්තුගත මුදල මිලියන 47.68කි. මෙහි ඉදිකිරීම් කටයුතු 2025 දෙසැම්බර් 20වන දින ආරම්භ කිරීමටත්, 2026 මාර්තු 15වන දින වන විට නිම කිරීමටත් අපේක්ෂිතය.

[ගරු බිමල් රත්නායක මහතා]

මන්නාරම් දුම්රිය ස්ථානයේ සිට බස් නැවතුම්පොළ දක්වා පාසල් දරුවන් ප්‍රවාහනයට පෙරවරුවේ හා පස්වරුවේ ශ්‍රීලංගම බස් රථයක් යොදවා ඇත. මන්නාරම බස් නැවතුම්පොළේ සිට මන්නාරම දුම්රිය ස්ථානය දක්වා සාමාන්‍ය මගී බස් සේවාව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ඉල්ලුම් කළ පරිදි 2025 මැයි මස ආරම්භ කරන ලදී. මෙය සති දෙකක් පමණ ක්‍රියාත්මක කර මගී රථාවක් නොමැති වීම හේතුවෙන් අත්හිටුවා ඇත. එහි විස්තර තව තිබෙනවා.

(මන්නාරම් දුම්රිය ස්ථානයට ළඟා වන්නේ දිනපතා ප්‍රධාන දුම්රිය දෙකක් පමණි. එනම්, උදෑසන 04.15ට තලෛයිමන්නාරමෙන් පිටත්වන කොළඹ දුම්රිය සහ කොළඹින් ප.ව. 16.20ට පිටත්වන තලෛයිමන්නාරම් දුම්රිය)

දුම්රිය ස්ථානයට ළඟා වන මගීන් පේසාලෙයි දක්වා කිලෝමීටර 12ක් ඇතුල් මාර්ග ඔස්සේ ගමන් කිරීම නිසා ඒ මගීන් මන්නාරම බස් ගාලේ සිට පිටත්වන පේසාලෙයි බස් රථවලට නොපැමිණේ. අත්හිටවූ බස් සේවාව 2025 නොවැම්බර් 03 දින සිට නැවත ඇරඹුවද, ප්‍රමාණවත් මගී රථාවක් නොමැතිකම හා මේ දිනවල මන්නාරම් ප්‍රදේශයේ පවතින අධික වර්ෂාව හේතුවෙන් මගීන් බස් රථවලට වඩා ත්‍රිරෝද රථ උපයෝගී කරගෙන ප්‍රවාහන පහසුකම් සපයා ගැනීම සිදුවන බව නිරීක්ෂණය වේ.

ගරු මන්ත්‍රීතුමා, හරි ප්‍රවාහන සේවයක් නැති වුණාම මිනිස්සු වෙන විකල්පවලට යනවා. මේ උත්තරය හොඳම උත්තරයක් නොවෙයි. නමුත් අපි පටන් අරගෙන අසාර්ථක වෙලා තිබෙනවා, ජනතාව අඩු නිසා. ඒ නිසා මේක dual issue එකක්. බස් නැති නිසා මිනිස්සු එන්නේ නැහැ; මිනිස්සු එන්නේ නැති නිසා බස් එන්නේ නැහැ. ඔහොම එකක් තිබෙන්නේ. අපි දෙපාරක් උත්සාහ කරලා අසාර්ථක වෙලා තිබෙනවා.

මන්නාරම දුම්රිය ස්ථානය සඳහා අන්තර්ජාල ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම ආරම්භ කළ මුල් කාලසීමාවේදී එම පහසුකම් සලසා ඇත. මහව - අනුරාධපුර මාර්ග අලුත්වැඩියා කාල සීමාවේ දුම්රිය ධාවනය නොවූ අතර, එම කාල සීමාවේ දුම්රිය ස්ථානය වසා තිබූ බැවින් අන්තර්ජාල පහසුකම් ඉවත් කර තිබූ අතර, දුම්රිය ධාවනය යළි ආරම්භ වූ විට නැවත ස්ථාපනය කරන ලදී. Now, it is working, Hon. Member. පසුගිය මස අන්තර්ජාල පහසුකම් හරහා තලෛයිමන්නාරම - කොළඹ කොටුව දුම්රිය සඳහා ආසන වෙන් කිරීම් 2,836ක් සිදු කර ඇති අතර, මන්නාරම දුම්රිය ස්ථානයෙන් එයින් 486ක් සිදු කර ඇත. එසේම අන්තර්ජාල Sri Lanka Railways Reservation App එක සහ Sri Lanka Railways website එක හරහා ආසන වෙන්කර ගැනීමට සහ pravesha.lk හරහා සාමාන්‍ය ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමේ පහසුකම් සලසා ඇත.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, அமைச்சர் அவர்களே!

உண்மையிலேயே இந்த முயற்சிகள் பயனளிக்க வேண்டுமென்று நான் விரும்புகின்றேன். நான் சொல்ல வருவது என்னவென்றால், சரியான நேரத்திற்கு train வராதமையால்தான் அந்த பஸ் வண்டிச் சேவையில் மக்கள் குறைவாகப் பயணிக்கின்ற சூழ்நிலை இருக்கின்றது. ரயில் போக்குவரத்துச் சேவை சரியான நேரத்துக்கு இடம்பெறும் நிலையை உருவாக்கும் பட்சத்தில் அதிகளவான மக்கள் அதில் பயணத்தை மேற்கொள்ள முடியும். இருந்தாலும், நான் கோரியபடி அந்த பஸ் வண்டிச் சேவையைத் தொடர்ந்தும் செயற்படுத்துவதற்கான முயற்சியை மேற்கொள்ளுங்கள்! ரயில் சரியான நேரத்துக்கு வருமாகவிருந்தால், நிச்சயமாக அந்த பஸ் வண்டிச் சேவையானது மக்கள் நிறைந்த பயணமாக இருக்கும் என்பது என்னுடைய கருத்து. எனினும், உங்களுடைய முயற்சிக்கு நான் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ දුම්රිය ප්‍රවේශ මාර්ගය කිලෝමීටර 2ක් එහාට සම්පූර්ණ කරන්න කියලා අපි දැනුම් දුන්නා. ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ආකාරයට දුම්රිය වේලාවට ගෙනියනවා කියන එක විශාල අභියෝගයක්. අපි ඒකට මහන්සි වෙනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාගෙන් තව විනාඩියක් ඉල්ලා සිටිනවා, දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කරන ලද හොඳ කරුණු 2ක් ගැන ඉතාම ඉක්මනින් අගය කිරීමක් කරන්න. එකක් තමයි, උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවෙක් නියමිත වෙලාවට විභාගයට යැවීම සඳහා කොළඹ-මඩකලපුව දුම්රියේ ගමන් කළ නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන් ගත් උත්සාහය. ඔබතුමාත් ඒ සිදුවීම දකින්න ඇති. අපි ඒක අගය කරනවා. ජනතාව ගැන හිතන එවැනි නිලධාරීන් සිටීම ගැන අපි සතුටු වෙනවා.

ඒ වාගේම ගරු කථානායකතුමනි, ඊයේ කුරුණෑගල-මුත්තෙට්ටුගල අතරේ දුම්රිය හරස් පාර හරහා ලොරියක් හිර වෙලා තිබුණා. එතැනදී ප්‍රදේශවාසියෙක් බුද්ධිමත්ව, කැපවීමෙන් කටයුතු කරපු නිසා සිදුවෙන්න ගිය විශාල අනතුරක් වළක්වා ගෙන තිබෙනවා. ඒ කාරණයත් අපි මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නවලින් 2කට දැනටමත් උත්තර තිබෙනවා. පාර හදනවා, online පහසුකම් තිබෙනවා. නමුත් trains වෙලාවට ගෙනයනවා කියන එක අභියෝගයක්. අපි ඒකට මහන්සි වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන. අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය.

## විරැකියාව අවම කිරීම: අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය
## வேலையின்மையைக் குறைத்தல்: பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று
## MINIMIZATION OF UNEMPLOYMENT: STATEMENT BY PRIME MINISTER AND MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් 2025.09.23වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. වර්තමානයේ ශ්‍රී ලංකාවේ රැකියා විරහිතභාවය 365,951යි.

2024 වර්ෂයේ විරැකියා අනුපාතය සියයට 4.4ක් වූ අතර, 2024දී සියයට 4.5ක් වූ පළමු කාර්තුවේ විරැකියා අනුපාතය 2025දී සියයට 3.8ක් දක්වා අඩු වී ඇත. එමෙන්ම, 2024දී සියයට 4.7ක් වූ දෙවන කාර්තුවේ විරැකියා අනුපාතය 2025දී සියයට 3.8ක් දක්වා පහත වැටී ඇත.

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණ වාර්ෂික වාර්තාව 2024 සහ ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණයේ පළමු හා දෙවන කාර්තුමය වාර්තා 2025, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

02.

| අධ්‍යාපන සුදුසුකම | විරැකියාවෙන් පෙළෙන පුද්ගල සංඛ්‍යාව |
|---|---|
| අ.පො.ස.(සා.පෙ)ට පහළ | 103,308 |
| | 91,405 |
| අ.පො.ස.(උ.පෙ) සමත් | 128,984 |
| උපාධිය සහ ඊට ඉහළ | 42,254 |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණ වාර්තාව 2024, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

03. ඉහළ රැකියා විරහිත අනුපාතයක් ඇති විට රටක ව්‍යසනකාරී තත්ත්වයක් නිර්මාණය විය හැක. ඒ වුණාට ඉහළ ආර්ථිකයක් පවතින රටවල පවා විරැකියාව සහ සමාජ ගැටලු පවතින අතර, සාමාන්‍යයෙන් සියයට 4.5ක්, සියයට 5ක් හෝ ඊට අඩු විරැකියා තත්ත්වයක් සහිත ආර්ථිකයක් තුළ රැකියා විරහිතභාවය සමාජය සඳහා ව්‍යසනකාරී තත්ත්වයක් නිර්මාණය කරනවාය කියලා කියන්න අපහසුයි. විරැකියාව ඉතාම ඉහළ අනුපාතයක් තිබෙන රටවල සමාජය තුළ ඒක ව්‍යසනකාරී තත්ත්වයක් වෙන්න පුළුවන්.

04. රැකියා විරහිතභාවය අවම කිරීම සඳහා රජය විසින් කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දීර්ඝකාලීන පියවර ගණනාවක් අරගෙන තිබෙනවා. එම පියවර ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරනවා.

05. ඉදිරි වසර කිහිපය තුළ රජය බලාපොරොත්තු වන රැකියා විරහිතභාවය අවම කිරීමේ ප්‍රතිශතාත්මක ඉලක්ක මෙසේයි.

2025 - 4.4%යි.

2026 - 4.2%යි.

2027 - 4.2%යි.

(මූලාශ්‍රය - රාජ්‍ය ආයෝජන වැඩසටහන 2026-2030)

6. වර්තමාන රජය විසින් උපාධිධාරීන් 35,000ක්-40,000ක් පමණ ප්‍රමාණයකට රැකියා ලබා දීමට ඉදිරි සැලැස්මක් සකස්කොට ඒ අනුව රාජ්‍ය සේවයේ පුරප්පාඩු වන තනතුරු සඳහා රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ සහ කාර්ය මණ්ඩල කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව විධිමත් ක්‍රමවේදයක් හරහා බඳවා ගැනීම් සිදු කරනු ලබයි. දැනට මේ කමිටුව මඟින් 12,309ක් බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇති අතර එම බඳවා ගැනීම්, බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව අමාත්‍යාංශ මට්ටමෙන් සිදු කරගෙන යනු ලබයි. මේ අතර ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් 25,000ක පමණ ප්‍රමාණයක් බඳවා ගැනීම සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ පැවැති නඩුවේ අවසන් තීන්දුව නිල වශයෙන් ලබා දුන් වහාම එම බඳවා ගැනීම් කටයුතු සිදු කිරීමට පියවර ගනු ඇත. ඒ සඳහා සියලු කටයුතු සූදානම් කර ඇත. ඒ අනුව උපාධිධාරීන් 37,000කට පමණ රැකියා ලබා දීම සඳහා වන රජයේ සැලැස්ම ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ඇත.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

<u>කෙටිකාලීන - short-term - පියවර</u>

රාජ්‍ය සේවය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය ආයතනවලට අත්‍යවශ්‍ය බඳවාගැනීම් සිදු කිරීම සඳහා පත් කරන ලද රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණ කමිටුව විසින් මේ වන විට රාජ්‍ය සේවයේ පුරප්පාඩු 76,988ක් සම්පූර්ණ කිරීමට අදාළ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර, ඒ සඳහා අවශ්‍ය බඳවාගැනීම් සිදු කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.

2025 වර්ෂයේ රාජ්‍ය සේවයේ යම් යම් අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇත. රජයේ රැකියා සඳහා තෝරා ගැනීමේ ක්‍රියාවලිය සහ තරග විභාග යාවත්කාලීන කිරීම. රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාම සඳහා නව බඳවාගැනීම් දේශපාලන මැදිහත්වීම්වලින් තොරව, නියමිත විභාග සහ සේවා රෙගුලාසිවලට අනුකූලව සිදු කරගෙන යනු ලබයි.

රැකියා විරහිත තරුණ තරුණියන්, අවිධිමත් අංශයේ සේවකයන්, ආබාධ සහිත පුද්ගලයන්, කාන්තාවන්, විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් ක්‍රියාකාරී ශ්‍රම වෙළෙඳ පොළ සමඟ සම්බන්ධ වීමට පෙලඹවීම, දැනුවත් කිරීම සහ විවිධ පුහුණු වැඩසටහන් කම්කරු අමාත්‍යාංශය විසින් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබයි.

විශේෂ කුසලතා සහිත රැකියා විරහිත තරුණ තරුණියන්ට ව්‍යවසායකත්ව අවස්ථා ආරම්භ කිරීමට මූලික ප්‍රාග්ධනය සහ සුදුසු වෙළෙඳ පොළ සොයා ගැනීම සඳහා පහසුකම් ලබා දී ඇත.

<u>2026 අය වැය හරහා කෙටිකාලීනව රැකියා ප්‍රවර්ධනය සඳහා හේතුවන යෝජිත පියවර.</u>

රාජ්‍ය සේවයේ තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ සහනදායී පදනම මත බඳවා ගත් සේවකයන් 9,800ක් පමණ ස්ථිර කිරීමට මුදල් වෙන් කිරීම.

විශේෂ අවශ්‍යතා සහිත හෝ ආබාධිත තරුණ තරුණියන් පෞද්ගලික අංශයේ රැකියාවල නියුක්ත කරවීම දිරි ගැන්වීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීම.

රැකියා සඳහා කාන්තා සහභාගිත්වය වැඩි කිරීමේ අරමුණින් දිවයින පුරා කාන්තා ව්‍යවසායකයන් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් සිදු කරනු ලබන ස්වයං රැකියා, ගෘහ කර්මාන්ත ආදිය නඟාසිටුවීම සඳහා මෙම අය වැයෙන් රුපියල් මිලියන 240ක් වෙන් කිරීම.

අලි වැට අධීක්ෂණය සහ අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා සිවිල් ආරක්ෂක සේවා නිලධාරීන් 5,000කට විශේෂ පුහුණුවක් ලබාදී ඔවුන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ස්ථිරවම අනුයුක්ත කිරීම.

***පිළිතුර අවසානයේ පළ කර ඇත.***
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

තරුණ ව්‍යවසායකත්ව ණය යෝජනා ක්‍රම, ක්ෂුද්‍ර මූල්‍ය ණය සහ කාන්තා ව්‍යවසායකත්ව සවිබල ගැන්වීමේ ණය යෝජනා ක්‍රම ඇතුළු සියලුම සහනදායී ණය යෝජනා සඳහා රුපියල් මිලියන 80,000ක ණය පහසුකම් ලබා දී ඇත.

<u>මධ්‍යකාලීන - medium-term - පියවර</u>

රාජ්‍ය ආයතන හරහා සේවා සැපයීම ඩිජිටල්කරණය කිරීම වත්මන් රජයේ ප්‍රධානතම ප්‍රතිපත්තිමය කරුණක් බැවින්, රාජ්‍ය ආයතනයන්හි කාර්ය මණ්ඩල සමාලෝචනය හා රාජ්‍ය සේවය ප්‍රශස්තකරණය එකී ප්‍රතිපත්තීන්ට අනුගත වන අයුරින් සිදු කිරීම.

2030 වන විට සංචාරක හා ආගන්තුක අංශයට අවශ්‍ය වන නිපුණතා සහිත පුද්ගලයන් 800,000ක් පුහුණු කිරීම සඳහා බහුකාර්ය වැඩසටහනක් හඳුන්වා දී ඇත.

(ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් දිවයින පුරා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු ආයතන හරහා කෙටි කාලීන වෘත්තීය පුහුණු වැඩසටහනක් වන ආගන්තුක සත්කාර බහුකාර්ය වැඩසටහනක් හඳුන්වා දී තිබේ. මෙහි ආරම්භය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් දරිද්‍රතාව පිටුදැකීමේ බලගැන්වීමේ ව්‍යාපෘතියක් ලෙස දැනට ක්‍රියාත්මක වේ.)

තොරතුරු තාක්ෂණ ශ්‍රම බලකාය 200,000කින් වැඩි කිරීම සඳහා පෞද්ගලික අංශය, අධ්‍යාපන හා රාජ්‍ය අංශය එක්ව කටයුතු කිරීම. අවශ්‍ය මූලික පියවර ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය යටතේ සිදු කරමින් පවතී.

තරුණ නිර්මාණශීලීන්ගේ නව අදහස් සහ සංකල්ප අලෙවි කළ හැකි නිෂ්පාදන බවට පරිවර්තනය කිරීමට "පුනරුදය සඳහා අපි (We for Renaissance - V4R)" ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීම.

රැකියා උත්පාදනය අරමුණු කර ගනිමින් ව්‍යාපෘති අනුමැතියන් කඩිනම් කිරීම සහ වේගවත් ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ආයෝජන මණ්ඩලයේ "තනි කවුළුව" ඩිජිටල් යන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම.

නව කර්මාන්ත සහ රැකියා අවස්ථා නිර්මාණය කිරීම සඳහා උපායමාර්ගික අංශවල විදේශ සෘජු ආයෝජන (FDI) ප්‍රවර්ධනය කිරීම.

රැකියා අවස්ථා උත්පාදනය වේගවත් කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ඉලක්කගත මූල්‍යාධාර සහ ණය පහසුකම් ලබා දීම. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් රාජ්‍ය හා පෞද්ගලික බැංකු මඟින් සිදු කිරීම.

අධ්‍යාපන පද්ධතියෙන් ඉවත් වන සහ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වූ තරුණ තරුණියන් වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපන ක්ෂේත්‍රයට ආකර්ෂණය කර ගැනීමට වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු (TVET - Technical and Vocational Education and Training) ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම.

නැඟී එන දේශීය හා විදේශීය ශ්‍රම වෙළෙඳ පොළ අවශ්‍යතා සමඟ කුසලතා පෙළගැස්වීම කෙරෙහි අවධානය යොමු කරමින්, වෘත්තීය පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් පුළුල් කිරීම.

කුසලතා ඇති තරුණ තරුණියන් ශ්‍රම වෙළෙඳ පොළට අවශෝෂණය කර ගැනීම සඳහා තාක්ෂණය සහ නවෝත්පාදනය මත පදනම් වූ අංශ පුළුල් කිරීම.

රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට අවස්ථාව නොලැබූ සිසුන්ට පෞද්ගලික විශ්වවිද්‍යාලවලින් උපාධිය හැදෑරීම සඳහා ණය පහසුකම් ලබා දීම.

<u>2026 අය වැය හරහා මධ්‍යකාලීනව රැකියා ප්‍රවර්ධනය සඳහා හේතුවන යෝජිත පියවර.</u>

අපනයනය සහ රැකියා ආකර්ෂණය කර ගැනීම සඳහා ආයෝජන මණ්ඩලය (BoI) යටතේ "අතථ්‍ය විශේෂ ආර්ථික කලාප -Virtual Special Economic Zones-" පිහිටුවීම.

අපනයන කේන්ද්‍රීය නිෂ්පාදන හරහා රැකියා ඉහළ නැංවීම සඳහා ජාතික අපනයන සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ නව නිදහස් වෙළෙඳ ගිවිසුම් (FTAs) සඳහා පහසුකම් සැලසීම.

තොරතුරු තාක්ෂණ අංශයේ රැකියා සහ තරුණ රැකියා ප්‍රවර්ධනය කිරීම සඳහා කුරුණෑගල සහ ගාල්ල තාක්ෂණ උද්‍යාන පුනර්ජීවනය කිරීම සහ දිගන සහ නුවරඑළිය යන ප්‍රදේශවල නව උද්‍යාන පිහිටුවීම.

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන හරහා දරිද්‍රතාව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය යටතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රජා මට්ටමේ රැකියා අවස්ථා නිර්මාණය කිරීම.

ඵලදායී හා තිරසර ග්‍රාමීය රැකියා උත්පාදනය කිරීම සඳහා ජාතික කිරි නිෂ්පාදන, කෘෂිකාර්මික වටිනාකම්දාමය සහ ධීවර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ග්‍රාමීය ප්‍රජාවන් සඳහා ප්‍රවේශය පුළුල් කර වෙළෙඳාම සහ දේශීය රැකියා උත්පාදනය වැඩි දියුණු කිරීම සඳහා ග්‍රාමීය මාර්ග ඉදිකිරීම සඳහා රුපියල් බිලියන 24ක් සහ ග්‍රාමීය පාලම් සඳහා රුපියල් බිලියන 2.5ක් වෙන් කිරීම.

ඉදිකිරීම්, තාක්ෂණික සහ මෙහෙයුම් රැකියා උත්පාදනය කරන මූල්‍ය හා බලශක්ති දිරිගැන්වීම් සහිත කලාපීය දත්ත මධ්‍යස්ථාන මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම.

<u>දිගුකාලීන - long-term - පියවර</u>

ශ්‍රම වෙළෙඳ පොළ අවශ්‍යතා සහ තාක්ෂණික වෙනස්කම් සමඟ වඩා හොඳින් පෙළගැස්වීම සඳහා අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම.

රැකියා නිර්මාණය සඳහා පදනමක් ලෙස තිරසර, අපනයනය ප්‍රමුඛ ආර්ථික වර්ධනයක් සහතික කිරීම.

නීල හරිත ආර්ථිකය (Blue and Green Economy) තුළ නව රැකියා උත්පාදන ප්‍රවණතාවක් පවතින අතර, ඒ සඳහා මූලික පියවර ගනිමින් පවතී.

රැකියා වෙළෙඳ පොළට ඇතුළු වීමට දුෂ්කරතාවන්ට මුහුණ දෙන හෝ උනන්දුවක් නොමැති කාන්තාවන්ට සහ ආබාධ සහිත පුද්ගලයන්ට ඔවුන්ගේ මනාපයන් අනුව වැඩ කිරීමට අවස්ථාව ලබා දීම.

රැකියා සුරක්ෂිතභාවය පවත්වා ගනිමින් සේවකයන් ආරක්ෂා කිරීම සඳහා පුළුල් සමාජ ආරක්ෂණ පද්ධති ශක්තිමත් කිරීම.

කාර්මික හා තාක්ෂණික පාඨමාලා, උපාධි සහ පශ්චාත් උපාධි මට්ටම දක්වා සංශෝධනය කිරීම.

2030 වන විට සම්පූර්ණයෙන්ම ක්‍රියාකාරී මධ්‍යගත ඩිජිටල්කරණය කරන ලද ශ්‍රම වෙළෙඳ පොළ තොරතුරු පද්ධතියක් (LMIS) ස්ථාපිත කිරීම.

ක්‍රීඩා සංස්කෘතියක් හරහා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා වෘත්තිකයන් බිහි කිරීම හා ප්‍රජාවට ක්‍රීඩා ක්ෂේත්‍රය ආශ්‍රිත අර්ධකාලීන හා පූර්ණකාලීන රැකියා අවස්ථා බිහි කිරීම.

<u>2026 අය වැය හරහා දිගුකාලීන රැකියා ප්‍රවර්ධනය සඳහා හේතුවන යෝජිත පියවර.</u>

මධ්‍යම අධිවේගී මාර්ගය, රුවන්පුර අධිවේගී මාර්ගය සහ කුරුණෑගල - දඹුල්ල අධිවේගී මාර්ගය වැනි ප්‍රධාන ව්‍යාපෘති ඇතුළුව මාර්ග සංවර්ධනය සඳහා රුපියල් බිලියන 342ක් වෙන් කිරීම තුළින්ද ඉදිකිරීම් සහ ඉංජිනේරු ක්ෂේත්‍රයේ දිගු කාලීන රැකියා උත්පාදනය කිරීම.

දිගුකාලීන, ඵලදායී රැකියා නියුක්තියක ප්‍රධාන ධාවකයක් වන යටිතල පහසුකම් සහ සේවා ව්‍යාපෘති සඳහා පෞද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා විනිවිදභාවය සහිත නව රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව පනතක් (PPP Act) බලාත්මක කිරීම.

දිගුකාලීන, උසස් තත්ත්වයේ රැකියා උත්පාදනය සඳහා ප්‍රධාන මූලාශ්‍රයක් වන තිරසර විදේශ සෘජු ආයෝජන (FDIs) ආකර්ෂණය කර ගැනීමට ආයෝජකයන්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

විශ්වවිද්‍යාල යටිතල පහසුකම් සහ අනාගත වෙළෙඳ පොළ අවශ්‍යතා සමඟ කුසලතා පෙළගැස්වීම සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 50ක් වැඩි දියුණු කිරීම සහ විශිෂ්ටතා මධ්‍යස්ථාන 09ක් ස්ථාපනය කිරීම හරහා මානව ප්‍රාග්ධන සංවර්ධනය කිරීම.

**තාක්ෂණය හා නවෝත්පාදන ක්ෂේත්‍රයේ ඉහළ කුසලතා සහිත රැකියා උත්පාදනය කරමින් AI, Cloud, පරිගණකකරණය, දත්ත මධ්‍යස්ථාන සහ 5G යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම සඳහා රුපියල් බිලියන 25.5ක් ආයෝජනය කිරීම.**

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, කරුණු පැහැදිලි කර ගැනීම.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු අගමැතිතුමියනි, අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් වෙන් කරන බව කියූ සියයට 6 ගැන, එම ඉලක්කය ගැන කථා කරන කොට ඔබතුමිය මුලින්ම කිව්වා, එය වැඩි කිරීමේ දිශානතියකට යනවා කියලා. ඒක බොහොම හොඳ දෙයක්. හැබැයි, මම ඔබතුමියට කියන්න කැමැතියි, 2025දී වෙන් කරපු සියයට 1.8 ප්‍රමාණය 2026දී සියයට 2 බවටයි පත් වෙලා තිබෙන්නේ කියලා. ඒ වැඩි වීමේ දිශානතියට ගිහිල්ලා තිබෙන්නේ දශම දෙකයි. මම හිතනවා, ඒක වර්ධනය විය යුතුයි කියලා.

ඒ වාගේම, මම ඔබතුමියගේ අවධානය යොමු කරවන්න කැමැතියි, ඔබතුමියලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 72වන පිටුවේ උපාධිධාරීන් 35,000ක් බඳවා ගැනීම පිළිබඳව ඇති විග්‍රහය කෙරෙහි. ගුරු වෘත්තියට 20,000ක්, STEM උපාධිධාරීන් 3,000ක්, STEM නොවන උපාධිධාරීන් 9,000ක් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, රේගු දෙපාර්තමේන්තුවට, විදේශ සේවාවට සහ සංචාරක කර්මාන්තයට තවත් උපාධිධාරීන් 3,000ක් යනාදි වශයෙන් උපාධිධාරීන් 35,000ක් බඳවා ගන්නා ආකාරය එහි විග්‍රහ කර තිබෙනවා. අපි අනුමාන කරනවා, මේ වන විට උපාධිධාරීන් 35,000-40,000 අතර සංඛ්‍යාවක් විරැකියාවෙන් පෙළෙනවා කියලා. අපි ඔබතුමියට විශේෂයෙන්ම යෝජනා කරනවා, ඒ අයට වසරක අභ්‍යාසලාභී පුහුණුවක් ලබා දීලා, ඒ අභ්‍යාසලාභී පුහුණු කාල වකවානුව තුළ දීමනාවකුත් ලබා දීලා, ඒ අය බඳවා ගැනීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා.

ඒ වාගේම, විරැකියාව කියන ප්‍රශ්නයට අදාළව ඔබතුමිය සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළා. එම ප්‍රශ්නයට එක විසඳුමක් හැටියට මම ඔබතුමියට යෝජනාවක් කරන්න කැමැතියි. අපි විරැකියා ප්‍රශ්නයට විසඳුම් සොයන්න ඕනෑ, දේශීයව සහ විදේශීයව. දැන් අපට විදේශීයව හොඳම අවස්ථාවක් ඇවිත් තිබෙනවා. අපේ රට 2004දී කොරියාවත් එක්ක ගිවිසුමක් අත්සන් කළා. ඒ ගිවිසුම හරහා නිෂ්පාදන සහ සේවා ක්ෂේත්‍රවල රැකියාවලට අපේ තරුණ තරුණියන් යන්නේ EPS-TOPIK පරීක්ෂණය, භාෂා පරීක්ෂණය සහ කුසලතා පරීක්ෂණය සමත් වෙලා. ඒ යන්නේ කුසලතාව මතයි. ගරු අගමැතිතුමියනි, ඇත්තවශයෙන්ම එතැන ගැටලුවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමියට මැදිහත් වෙන්න පුළුවන් නම් ඉතාම වැදගත් වෙනවා. අවුරුද්දේ කාර්තු 4 ගත්තොත්, සාමාන්‍යයෙන් එක කාර්තුවකට නිෂ්පාදන ක්ෂේත්‍රයටත්, සේවා ක්ෂේත්‍රයටත් සම්බන්ධ රැකියා 1,500ක්, 2,000ක් විතර ප්‍රමාණයක් කොරියාවෙන් අපට ලැබිලා තිබෙනවා. හැබැයි, 2023 ඉඳලා කාර්තුවකට ලැබුණු රැකියා 1,500ත්, 2,000ත් අතර ප්‍රමාණය අද 200ට බැහැලා තිබෙනවා. මම ඔබතුමියගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, මේ ප්‍රශ්නය තුළ දැන් 5,000ක් විතර හිර වෙලා ඉන්නවා. එතැන තිබෙන ගැටලුව මොකක්ද දන්නවාද? ඒ පරීක්ෂණ ඔක්කෝම පාස් වෙලා ඉන්න ඒ අයට තිබෙන්නේ අවුරුදු දෙකයි. ඒ අවුරුදු දෙකක කාල වකවානුව තුළ ඒ අය එරට රැකියා අවස්ථා සඳහා පිටත් වෙලා යන්න ඕනෑ. එහෙම නැත්නම්, ලක්ෂ ගණනක් වියදම් කරලා ඒගොල්ලන් පුහුණු වුණු අවස්ථාව ඒගොල්ලන්ට අහිමි වෙලා ආපහු යන්න වෙනවා, මුල තත්ත්වයට. එම නිසා මම ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර දකුණු කොරියාවත් එක්ක රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීමක් ඇති කරගෙන ඒ අගතියට පත් වුණු අයට විසඳුමක් ලබා දෙන්න කියලා. ඇත්තටම අගතියට පත් වුණු 5,000ක් විතර ඉන්නවා. මේ අවුරුද්ද අවසාන වනකොට ඒ අය අර කියපු අවුරුදු දෙකේ සීමාවෙන් ඉවත් වෙනවා. එතකොට ඒ 5,000ක පිරිසට ඒ රැකියා අවස්ථා අහිමි වෙනවා. මම මේ ඔබතුමියට යෝජනාවක් කරන්නේ, ඉල්ලීමක් කරන්නේ. දකුණු කොරියානු රජය - South Korean Government - එක්ක කථා කරලා රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවක් ඇති කරගෙන, අගතියට පත් වුණු ඒ 5,000කට වැඩි පිරිසට රැකියා ලබා දෙන්න, ඒ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම තවත් පුංචි කාලයක් -විනාඩියක් පමණ- ගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැනටමත් විනාඩි 4කට වඩා අරගෙන තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු අගමැතිතුමියනි, මා ඉහතින් කී පරිදි ඔබතුමියලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන ආකාරයටම උපාධිධාරීන් 35,000ක්, 40,000ක් රැකියා සඳහා බඳවා ගන්න. ඔබතුමියගේම කැබිනට් පත්‍රිකා සටහනක සඳහන් වෙලා තිබෙනවා, ඇබෑර්තු 52,000ක් තිබෙනවා කියලා. ඉන් පසුව ඔබතුමිය වෙනත් අවස්ථාවකදී කියා තිබෙනවා, ඇබෑර්තු 72,000ක් තිබෙනවා කියලා. කරුණාකර අර කියපු උපාධිධාරීන් බඳවා ගන්න කියා සහ කොරියාවේ රැකියා ප්‍රශ්නයට මුහුණ දී සිටින අයට විසඳුමක් ලබා දෙන්න කියා මම ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ඒ යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මම ගරු විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි ඒවා අදාළ තැන්වලට යොමු කරන්නම්; කරන්න පුළුවන් මැදිහත් වීමත් කරන්නම්. මා හිතන විධියට, මගේ පිළිතුර පැහැදිලියි. ඒ පිළිතුර තුළත් සඳහන් වුණා, අපි දැනටමත් උපාධිධාරීන් 12,000කට එහා පිරිසකට රැකියා දීලා තිබෙනවා කියලා. ගුරු පත්වීම් සම්බන්ධයෙන් තිබුණු නඩු දැන් අවසන් වෙලායි තිබෙන්නේ. අභියාචනාධිකරණයෙන් අපට නිල වශයෙන් එය දැනුම් දුන් වහාම ඒ බඳවා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ වෙනවා. ගරු කථානායකතුමනි, එතකොට එතුමා කියන ඔය සංඛ්‍යාව බඳවා ගන්න අපට හැකියාව ලැබෙනවා. උපාධිධාරීන් පිළිබඳව අපි ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියා තිබෙන දේ ඒ අනුවම සිද්ධ වන බව මම මතක් කරනවා. ගරු විපක්ෂ නායකතුමනි, යෝජනා ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත
### நுண்நிதி மற்றும் கடன் ஒழுங்குபடுத்தும் அதிகாரசபை சட்டமூலம்
### MICROFINANCE AND CREDIT REGULATORY AUTHORITY BILL

"ශ්‍රී ලංකා ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; මුදල් ණයට දීමේ ව්‍යාපාරය සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය නියාමනය කිරීම සඳහා ද; මුදල් ණයට දීමේ ව්‍යාපාරයේ සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරයේ ගනුදෙනුකරුවන්ට ආරක්ෂාව සැපයීම සඳහා ද; 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත ඉවත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය විසිනි.***

***2025 දෙසැම්බර් 10වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2025 டிசம்பர் 10, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளை யிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education; to be read a Second time upon Wednesday, 10th December, 2025 and to be printed; and to be referred to the Committee on Public Finance.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2026 - කාරක සභා අවස්ථාව, දහසයවන වෙන් කළ දිනය.

## විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

*කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: නොවැම්බර් 25]*
*[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]*
*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: நவம்பர் 25 ]*
*[கௌரவ சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered further in Committee.- [Progress:25th November]*
*[HON. SPEAKER in the Chair.]*

**151 වන ශීර්ෂය.- ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 460,800,000

**தலைப்பு 151.- கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 460,800,000

HEAD 151. - MINISTER OF FISHERIES, AQUATIC AND OCEAN RESOURCES
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 460,800,000

**196 වන ශීර්ෂය.- විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 218,000,000

**தலைப்பு 196.- விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 218,000,000

HEAD 196.- MINISTER OF SCIENCE AND TECHNOLOGY
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 218,000,000

**186 වන ශීර්ෂය.- ඩිජිටල් ආර්ථික අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 241,500,000

**தலைப்பு 186.- டிஜிட்டல் பொருளாதார அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 241,500,000

HEAD 186.- MINISTER OF DIGITAL ECONOMY
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 241,500,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 151 සහ 290; විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය - වැය ශීර්ෂය අංක 196; ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 186 සහ 227.

සලකා බැලීම පූර්ව භාග 10.30 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 9.54]

**ගරු දිලිප් වෙදආරච්-චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
සුබ උදෑසනක්!

ගරු සභාපතිතුමනි, "2026 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.11.26 බදාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 151, 290, 196, 186 සහ 227 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්වල සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, ධීවර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ කාරක සභා අවස්ථාවේ දී මම විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා, මේ රටේ ධීවර කර්මාන්තය කරන

බහුදින යාත්‍රා හිමියන්ගේ ඉන්ධන ප්‍රශ්නය ගැන. ඒ වාගේම outboard මෝටර් බෝට්ටු හිමියන්ගේ ලාම්පුතෙල් ප්‍රශ්නය ගැන. ඒ වාගේම මාදැල් කර්මාන්තය තහනම් කිරීම නිසා ධීවරයන් අද මහ පාරට බැහැලා ඉන්න ප්‍රශ්නය ගැන. ඒ වාගේම අම්බලන්ගොඩ ප්‍රදේශයේ light-coarse කර්මාන්තකරුවන් මහ පාරට බැහැලා ඒගොල්ලන්ගේ අයිතිය ලබා ගැනීමට උද්ඝෝෂණය කරන ප්‍රශ්නය ගැන. ඒ වාගේම කරවල, උම්බලකඩ, සැමන් ආදී කර්මාන්ත කඩා වැටීම නිසා ඒ අයට තිබෙන ප්‍රශ්න ගැන. ධීවර කර්මාන්තයේ යෙදෙන ජනතාව අද වනවිට සියයට 50කට, සියයට 60කට වැඩි පිරිසක් මහපාරට බැහැලා ඔවුන්ගේ අයිතීන් රැක ගන්න ජනාධිපති ලේකම් කාර්යාලය අසල, ධීවර අමාත්‍යාංශය අසලට පැමිණිලා උද්ඝෝෂණය කරනවා. අපේ සමස්ත ධීවර ජනතාවගේ ඒ උද්ඝෝෂණයට සහයෝගයක් දක්වන්න, ඒ ජනතාවගේ අයිතීන් රැක ගන්න, ඒ ජනතාව මුහුණ දී සිටින ගැටලුවලට විසඳුම් නොදීම නිසා මේ රජයට සහ ජනාධිපතිවරයාට විරෝධය පාන්න මම අද කළු වස්ත්‍රයක් ඇඳ ගෙන පැමිණි බව ඒ ධීවර ජනතාව වෙනුවෙන් ප්‍රකාශ කරනවා.

මම බොහොම සන්තෝෂ වෙනවා, මගේ මේ විරෝධය පෑමට සහයෝගයක් දක්වන්න අපේ ගරු අග්‍රාමාත්‍යතුමියත් අද කළු පාටින් ඇඳලා පැමිණීම ගැන. ඒ ගැන NPP නායිකාවක වන ඔබතුමියට මම ස්තුතිවන්ත වෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
අපි ඔක්කෝම කළු පාට ඇඳගෙන ඉන්නේ. ගරු බිමල් රත්නායක ඇමතිතුමාත් කළු පාට ඇඳගෙන ඉන්නේ.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
අපි ඔක්කෝම කළු පාට ඇඳගෙන ඉන්නේ.

ගරු සභාපතිතුමනි, බහු දින යාත්‍රා හිමියන් 7,000ක් විතර ධීවර කර්මාන්තයේ නියැළෙනවා. අපේ අතිගරු ජනාධිපතිතුමා මේ රටේ ධීවර ජනතාවට, බහුදින ධීවර යාත්‍රා හිමියන්ට වේදිකාවක්, වේදිකාවක් ගණනේ ගිහිල්ලා පොරොන්දු දුන්නා. රුපියල් 150ට ඩීසල් ලීටරය ලබා දෙනවා කිව්වා. වරායෙන් ගොඩබානකොට ගහන රුපියල් 50ක බද්ද ඉවත් කරනවා කිව්වා. භාණ්ඩාගාරයට අය කර ගන්න රුපියල් 50 බද්ද ඉවත් කර ගන්නවා කිව්වා. කංචනගේ සාක්කුවට යන රුපියල් 50 බද්දත් ඉවත් කරලා ඩීසල් ලීටරයකට රුපියල් 150ට සහනාධාරයක් ලබා දෙනවා කිව්වා. එහෙම කිව්වේ නැද්ද, ගරු ඇමතිතුමා? එහෙම කිව්වා. ඉතින් අද වනතුරුත් ඒ සහනාධාරය නැහැ. අද බහුදින යාත්‍රා හිමියන් බොහෝ අසරණ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ අයගේ කර්මාන්තය කරගන්න විධියක් නැහැ. ඒ වාගේම outboard මෝටර් බෝට්ටු හිමියන්ගේ ලාම්පුතෙල් සහනධාරය අද කපා හැරලා තිබෙනවා. ඒ නිසා අද ඒ අයට කර්මාන්තය කර ගන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඩීසල්, ලාම්පුතෙල්වලට විතරක් නොවෙයි, දැල් වර්ගවලට, තංගූස් වර්ගවලට, බහුදින යාත්‍රා මසුන් ඇල්ලීමේදී භාවිත කරන ඇම වර්ග, ෆයිබර් බෝට්ටු රෙපෙයාර් කරන්න අවශ්‍ය කරන ෆයිබර් බඩු, outboard මෝටර් බෝට්ටුවල එන්ජින්, මහ බෝට්ටුවල එන්ජින් ආදී මේ සෑම දෙයකටම ලොකු බද්දක් ගහනවා. ඒ බද්ද ඉවත් කරනවා කියලා ජනාධිපතිතුමා මහ උජාරුවෙන් වේදිකාවල ප්‍රකාශ කළා. එහෙම ප්‍රකාශ කරලා ධීවර ජනතාව රවට්ටලා, මුළා කරලා, ධීවර ජනතාව අන්දවලා තමයි ඡන්දය ලබා ගත්තේ. අපේ නියෝජ්‍ය ඇමතිතුමාත් සෑම තොටුපළකම, සෑම වේදිකාවකම, සෑම ඔරුවක් උඩටම නැඟලා, ඒ වාගේම වෙරළවල්වල, බෝට්ටුවල ගිනි පන්දම් අල්ලාගෙන මිනිස්සු මහ පාරට බස්සලා යුද්ධයට යනවා වාගේ උද්ඝෝෂණය කරලා තමයි මේ බලය ලබා ගන්න කටයුතු කළේ. එහෙම නේද ඇමතිතුමා? ඕවා ඔහොම තමයි. අපිත් ඔහොම තමයි. ඒ වුණාට මේ දේශීය කර්මාන්තය දියුණු කරන්න නම් ධීවරයාට ඒ සහන ලබා දෙන්න ඕනෑ. කෘෂි කර්මාන්තය දියුණු කරන්න ගොවි ජනතාවට පොහොර සහනාධාරය ලබා දෙනවා නම් ධීවරයාටත් ඒ සහනය ලබා දෙන්න ඕනෑ කියන මතයේ තමයි රටේ ජනතාවත්, ධීවරයාත්, අපිත් ඉන්නේ.

මේ වර්ෂයේ මහා භාණ්ඩාගාරයේ මුදල් පිරී ඉතිරී යනවා. නේද, බිමල් රත්නායක ඇමතිතුමා? ධීවර වරාය 22න් බෝට්ටු 7,000ට ලබා දෙන තෙල් - ඩීසල් - ලීටරයක් රුපියල් 150ට දෙන්න පුළුවන්. අන්න ඒ ක්‍රමය ආරම්භ කරන්න. ගිය අවුරුද්දේත් මම ඒක යෝජනා කළා. මම කියන්නේ ඒ වරාය 22න් තෙල් ලබා දෙනකොට මේ අවුරුද්දේත් ලීටරයක් රුපියල් 150කට කිසි ප්‍රශ්නයක් නැතිව දීමට හැකියාවක් තිබෙනවා කියලායි.

ඊළඟට මම කියන්න ඕනෑ, මාදැල් කර්මාන්තය ගැන. මාදැල් කර්මාන්තය තමයි, ලංකාවේ ධීවර කර්මාන්තයේ ආරම්භක කර්මාන්තය. අද මාදැල් කර්මාන්තය අභාවයට යනවා. ඒ කියන්නේ, ඒකට ශ්‍රම දායකත්වය නැහැ. තරුණ කොටස් ඒකෙන් ගිලිහී යනවා. වයසක කණ්ඩායම් තමයි අද මාදැල් කර්මාන්තය කරන්න ඉන්නේ. දකුණු පළාතේ නම් පැයක් පැය එකහමාරක් යනකොට මාදැලක් ගොඩ අදින්න පුළුවන්. එතකොට වැඩි මහන්සියක් අමාරුවක් වෙන්නේ නැහැ. පුත්තලම දිස්ත්‍රික්කයේ, ඒ වාගේම නැගෙනහිර පළාත්වල, උතුරු පළාත්වල මාදැල් කර්මාන්තය කරනකොට විශාල ප්‍රමාණයක් වට කරනවා. ඒ නිසා ඒ දැලක් අදින්න පැය 3ක්, 4ක්, 5ක් යනවා.

මාදැල අදින්න දැන් ඒ ප්‍රදේශවල මිනිස් ශ්‍රමය නැහැ. වයසක මිනිස්සු ඉන්නේ; "මැන්ටල්ලා" ඉන්නේ. තරුණ අය ධීවර කර්මාන්තය දාලා යනවා. ඒ නිසා අද වෙනකොට ධීවර කර්මාන්තය කරගන්න කෙනෙක් නැහැ. නව තාක්ෂණය අනුව "වින්ච්" යන්ත්‍රයක් ට්‍රැක්ටරයේ සවිකරලා මාදැල් කර්මාන්තය කරනවා. මේක අද ඊයේ පටන් ගත්තු එකක් නොවෙයි. ඒක පටන් අරගෙන අවුරුදු 13ක් වෙනවා. මම රාජ්‍ය ඇමතිවරයා හැටියට ඉන්න කාලයේ ඒක පටන් ගත්තේ. මම බැලුවා. වැඩේ හොඳයි. මම කිව්වා, වැඩේ කරගෙන යන්න කියලා. දැනටත් ඒක කරගෙන යනවා.

පසුගිය දවස්වල මේකටත් තහනම් නියෝගයක් ගෙනැල්ලා තිබුණා. ජීවීන් මැරෙනවා ලු. වෙරළේ කොහේද ඉන්නේ, ජීවීන්? වෙරළේ ජීවීන් නැහැ. වෙරළ තීරයේ, වැල්ල තීරයේ ජීවීන් නැහැ. වැලි තිබෙන්නේ. ඒ වැල්ල කන්න ජීවීන් එන්නේ නැහැ. කරිජ්ජ තිබෙන්නේ. නමුත් මධ්‍යම පරිසර අධිකාරිය මේක තහනම් කරනවා. මධ්‍යම පරිසර අධිකාරියට ඕනෑ විධියට අපේ කර්මාන්ත නතර කරන්න බැහැ. ජීවීන්ට වැඩිය අපේ මිනිස්සු ජීවත් කරවන්න ඕනෑ. ලංකාව වටේම මාදැල් තොටුපොළවල් 900 ගණනක් තිබෙනවා. ඒ කර්මාන්තයෙන් යැපෙන දරු පවුල් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ සියල්ල ගැන අධ්‍යයනය කරලා, හිතලා මතලා, හොයලා බලලා මාදැල් කර්මාන්තය කඩා වැටෙන්න නොදී මේ "වින්ච්" යන්ත්‍රයෙන් ඒ කටයුතු කරන්න ඉඩ ලබා දෙන්න. ඔබතුමන්ලා ජනවාරි 1වැනි දාට මේ "වින්ච්" එක තහනම් කරන්න ගැසට් එක ගහනවා ලු. කරුණාකරලා ඒ ගැසට් එක ගහන එක නතර කරන්න. නැත්නම් ලොකු විනාශයක් සිද්ධ වෙනවා. ධීවරයෝ මහ පාරට බැස්සොත් අනෙක් මිනිස්සු වාගේ නොවෙයි, බේරා ගන්න හම්බ වෙන්නේ නැහැ. ඒක නිසා කරුණාකරලා ඒක නතර කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, නියෝජ්‍ය ඇමතිතුමනි, හොඳට කල්පනා කරන්න. ඔබතුමන්ලාගේ පළාතේ, නැඟෙනහිර පළාතේ මඩලපුව, පොතුවිල් වාගේ ප්‍රදේශවල මෑදැල් කර්මාන්තය නතර

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

කරන්න වෙනවා. මිනිස්සුත් නැහැ. මාදැල් කර්මාන්තය විනාශ වෙන එක නතර කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඊළඟට, අම්බලන්ගොඩ light course කර්මාන්තය ගැනත් කියන්න ඕනෑ. අම්බලන්ගොඩ ප්‍රදේශයේ light-coarse කර්මාන්තය ආරම්භ කළේ මීට අවුරුදු 40කට උඩදී. ධීවර අමාත්‍යාංශය තමයි පුහුණුකරුවන් පිට රටින් ගෙන්වලා ඒ කර්මාන්තය ආරම්භ කළේ. ඒ කර්මාන්තය ක්‍රමක්‍රමයෙන් උඩට ආවේ. ඒ කර්මාන්තය කළේ ජෙනරේටර් එකෙන්. ඒ ජෙනරේටර් එක නැතුව ළඟකදී ඉඳලා බැටරියෙන් විදුලිය ලබාගෙන ඒ කර්මාන්තය කරන්න උපදෙස් දීලා තිබෙනවා. දැන් ඒවාත් තහනම් කරලා. අම්බලන්ගොඩ ප්‍රදේශයේ රත්ගම, බේරුවල අතරේ ධීවරයෝ ඊයේ පෙරේදා ලොකු උද්ඝෝෂණයක් කළා. මගේ record එකත් කැඩුවා; අමුවෙන් මාළු කෑවා. ඔබතුමන්ලා දකින්න ඇති, TV එකේ. ඔහුත් ධීවර කර්මාන්තය කරන ධීවරයෙක්. ඒකෙන් කියන්නේ ඒ මිනිසුන්ගේ වේදනාව. හුරුල්ලා, දැල්ලා, බෝල්ලා කියන මාළු සංක්‍රමණික මාළු. ඒ මත්ස්‍යයන් සුළු මාස ගණනයි ජීවත් වෙන්නේ, මැරිලා යනවා. ඊට ඉස්සෙල්ලා අල්ලගන්න ඕනෑ. දැන් ඒ පැතිවල මාදැල් කර්මාන්තය ක්‍රියාත්මක වෙන්නේ නැහැ, නතර වෙලා. රත්ගම සහ බේරුවල අතර තමයි දැන් එම කර්මාන්තය කරන්නේ. එම කර්මාන්තය තහනම් කරන්න එපා. එම නිසා ඒ ධීවරයෝ ඔක්කෝම කියන්නේ, මේ පාර්ශ්ව දෙක අතර සාකච්ඡාවක් පවත්වා තීරණයක් අරගෙන කටයුතු කරන්න කියලායි. මෙම කර්මාන්තය රත්ගම සහ බේරුවල අතර මුහුදේ විතරක් කරන්න අවසර ලබා දෙන්න. ඔවුන් ඒ මුහුදු තීරයෙන් එළියට යන්නේ නැහැ. එතැන සුළු ප්‍රදේශයයි තිබෙන්නේ. හුරුල්ලා කියන මත්ස්‍යා මාදැල්වලට අහුවෙන්නේ නැහැ. ඒ වාගේම දැල්ලා කියන මත්ස්‍යයාත් මාදැල්වලට අහුවෙන්නේ නැහැ. එම නිසා මේක හොඳට ඔළුවට අරගෙන, ධීවර නිලධාරින් සමඟත් සාකච්ඡා කරලා, අම්බලන්ගොඩ මිනිසුන්ට ඒ අවස්ථාව ලබා දෙන්න. නීති විරෝධී වැඩ නොකර, කොහොම හරි මාළු අල්ලන්නයි ඕනෑ. එම නිසා ඒ සඳහා කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම ජාඩි කර්මාන්තය නඟා සිටුවන්න, කරවල කර්මාන්තය, උම්බලකඩ කර්මාන්තය නඟා සිටුවන්න ගරු රාජ්‍ය ඇමතිතුමා පළාත් සභා හරහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරන බව කියනවා. බොහොම හොඳයි. අපි අපේ කාලයේ පළාත් සභා හරහා දකුණු පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවරයින්ට අවශ්‍ය ආම්පන්න ලබා දීලා මේ කර්මාන්තය ප්‍රවර්ධනය කළා; දියුණු කළා. නමුත්, අද මේ කර්මාන්තය කඩා වැටෙමින් පවතිනවා. ඒ සඳහා විශාල ප්‍රශ්නයක් බලපානවා. ඒ තමයි, ලුණු ප්‍රශ්නය. ලුණුවල මිල අධික වීම නිසා කරවල සහ උම්බලකඩ කර්මාන්තය කරන්න බැහැ. පුත්තලම දිස්ත්‍රික්කයේ පවුල් පිටින් එම කර්මාන්තයේ නියැළෙනවා. ඒ වාගේම දකුණු පළාතේත් පවුල් පිටින් නියැළෙනවා. එම නිසා උම්බලකඩ සහ කරවල කර්මාන්තය කඩා වැටෙන්න දෙන්න එපා. කරවල කර්මාන්තය කරන කට්ටිය පුත්තලම ලුණු ලේවායේ සහ හම්බන්තොට ලුණු ලේවායේ ලියාපදිංචි කරලා ඔවුන්ට සහන ක්‍රමයකට ලුණු ලබා දීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න. ඒ මිනිසුන්ට ලුණු සොයාගන්න නැති අවස්ථා තිබෙනවා. මාළු අල්ලලා ජාඩි ආලා ලුණු නැතුව ඔවුන් කඩයක්, කඩයක් ගාණේ දුවනවා. ඒ නිසා එම කර්මාන්තය නඟා සිටුවන්න ඕනෑ නම් ලුණු ප්‍රශ්නය විසඳිය යුතුයි. පුත්තලම ලුණු ලේවායේ, හම්බන්තොට ලුණු ලේවායේ ලියාපදිංචි වුණු ව්‍යාපාරිකයන්ට බලපත්‍රයක් දෙන්න. එතකොට, ඒ අයට භය නැතුව වාහනවලින් ගිහිල්ලා බඩු ටික ගෙනැල්ලා තමන්ගේ කර්මාන්තය කරගෙන යන්න පුළුවන්. අන්න ඒ ක්‍රමයට තමයි මෙම කර්මාන්තය නඟා සිටුවන්න ඕනෑ. එම නිසා ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරන්න කැමැතියි. අපට තේරෙන නිසායි අපි මේ අඩුපාඩු කියලා දෙන්නේ. අපි මහ පොළොවේ පය ගහලා ඉන්න මිනිස්සු. මේ කර්මාන්තය පිළිබඳව හොඳ දැනුමක්, බුද්ධියක් තිබෙනවා. ඒකයි මම කියන්නේ, ධීවරයින් නඟා සිටුවුවොත් තමයි අපි මාළු කන්නේ. අපේ මාළු අස්වැන්න වැඩි වෙනකොට තමයි විදේශ විනිමය අපේ රටට ලැබෙන්නේ. ඉතින්, මේ කර්මාන්තය කරගෙන යන්න ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඊළඟට, මිරිදිය කර්මාන්තය ගැනත් මම කථා කරන්න ඕනෑ. මිරිදිය කර්මාන්තය තමයි රට තුළින් ආර්ථිකය නඟා සිටුවිය හැකි හොඳම කර්මාන්තය. අපේ යහ පාලන ආණ්ඩුව කාලයේ ආහාර ප්‍රවර්ධන වැඩසටහන යටතේ මිරිදිය කර්මාන්තය දියුණු කිරීම සඳහා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අපට ඇති තරම් සල්ලි දුන්නා. එතකොට මහින්ද අමරවීර කැබිනට් ඇමතිවරයා ලෙස කටයුතු කළා, මම රාජ්‍ය ඇමතිවරයා. අපි සෙවනපිටිය, කල්ලරාව, උඩවලවේ, බංගදෙණිය, ඉරණමඩු, මන්නාරම කියන ප්‍රදේශවල විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන හැදුවා. ඒ වාගේම ඉස්සන් අභිජනන මධ්‍යස්ථානත් හදලා තිබෙනවා. ඔබතුමන්ලාට ඒවා ක්‍රියාත්මක කරන්න විතරයි තිබෙන්නේ. අපි ඒවා ඔක්කෝම හදලා තිබෙන්නේ. හැබැයි, ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න අද නිලධාරින් නැහැ. මම ඒ ගැන හොයලා බැලුවා. ප්‍රධාන කාර්ය මණ්ඩල නිලධාරින් නැහැ, සිවිල් ඉංජිනේරුවරු නැහැ. කවු චිකිත්සකවරු නැහැ. දීප ව්‍යාප්ත සේවා නිලධාරින් නැහැ. කළමනාකරණ සහකාරවරු නැහැ. ක්‍රම සම්පාදන සේවයේ නිලධාරින් නැහැ, නීති නිලධාරින් නැහැ. ඒ නිලධාරි මණ්ඩලය තමයි මිරිදිය මත්ස්‍ය ව්‍යාපාරය ඉදිරියට ගෙන යෑම සඳහා කටයුතු කරන්නේ. ඒ නිසා හොඳ සභාපතිවරයෙක් සහ අවශ්‍ය නිලධාරි මණ්ඩලයක් පත් කරලා මිරිදිය කර්මාන්තය දියුණු කරන්න අවශ්‍ය කටයුතු කරන්න. ඔබතුමන්ලාට අවශ්‍ය නම්, ඒ සඳහා ඕනෑම උපදෙසක් ලබා දෙන්න අපි සූදානම් කියන එකත් මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ඊළඟ කාරණය තමයි, ධීවරයින්ගේ ආරක්ෂාව. අද, බහුදින ධීවර යාත්‍රා 7,000ක් මහ මුහුදේ තිබෙනවා. ඒ වාගේම outboard motor boats 50,000ක් මහ මුහුදේ තිබෙනවා. බහුදින ධීවර යාත්‍රාවක 6 දෙනෙක් යනවා. එතකොට බහුදින ධීවර යාත්‍රා 7,000ම ධීවරයින් 42,000ක් ඉන්නවා. පොඩි බෝට්ටුවක දෙන්නෙක් යනවා. එතකොට 50,000 ගත්තොත්, ඒ ඔක්කෝගේම ලක්ෂයක් ඉන්නවා. එතකොට ධීවරයින් 142,000ක් අපේ රට වටා තිබෙන, කිලෝමීටර 200 ඇතුළේ මුහුදේ ධීවර කර්මාන්තයේ නියැළෙනවා. ධීවරයකුට හදිසි අසනීපයක් හැදුණොත්, heart attack එකක් හැදුණොත් ඒ අයව ගොඩට ගෙනෙන්න ක්‍රමයක් නැහැ. කනපින්දම් කියලා, නාවික සැතපුම් 200 තුළ තිබෙන නාවික හමුදාවේ බෝට්ටුවක් තමයි ඉතින් යවන්න වෙන්නේ. මම ගිය අවුරුද්දේත් යෝජනා කළා, අධිවේගී ගිලන් රථ බෝට්ටුවක් ගේන්න කියලා. ජනාධිපතිතුමාත් එක එක රටවලට යනවා නේ. ජපානයේ ගියාම කොහොම හරි මේ වාගේ දෙයක් කරගන්න පුළුවන් නම් හොඳයි. අපේ නායකතුමා හිටියා නම්, මේ වෙනකොට අපි ඒක ගෙනැල්ලා ඉවරයි. අපේ රටේ ධීවරයන් වෙනුවෙන් වැඳලා හරි අධිවේගී බෝට්ටුවක්, දෙකක් දෙන්න කියලා ඉල්ලා ගන්න. එහෙම තමයි කරන්න තියෙන්නේ. අධිවේගී ගිලන් රථ බෝට්ටු සේවාවක් අවශ්‍යයි.

ඊළඟට, ආපදාවට හසුවෙන බෝට්ටු තිබෙනවා. මුහුදේ ගියාට පස්සේ බෝට්ටුවක් කැඩුණොත් ඒ බෝට්ටුව පා වෙනවා. නාවික හමුදාවට කිව්වාට ඒක ගේන්න යන්නේ නැහැ. මොකද, තෙල් ගහන්න ඕනෑ. සමහර වෙලාවට තෙල් නැහැ. ඒකට ඇමතිවරයාගේ පස්සෙන් යන්න ඕනෑ. ඊළඟට නාවික හමුදාව පස්සෙන් යන්න ඕනෑ. ජනාධිපතිතුමාගේ පස්සෙන් යන්න ඕනෑ.

අර කැඩුණු බෝට්ටුව පා වෙවී තිබෙනවා. රුපියල් කෝටි 3ක්, 4ක් වියදම් කරලා බහුදින යාත්‍රාවක් ගත්ත ධීවරයා අසරණ තත්ත්වයට පත් වෙනවා. කැඩිච්ච බෝට්ටුවක් ගොඩට ගේන්න, අනෙක් බෝට්ටුකාරයෝ රුපියල් ලක්ෂ 10ක්, 15ක් ඉල්ලනවා. ඒ නිසා ආපදා ගිලන් රථ බෝට්ටුවකුත් ධීවර කර්මාන්තයට අවශ්‍යයි. මේ බෝට්ටු දෙක ලබාගෙන නාවික හමුදාවට භාර දෙන්න. එතකොට අසනීපයක් වුණොත්, බෝට්ටුවක් කැඩුණොත්, ක්ෂණිකව අධි වේගයෙන් අදාළ තැනට යවන්න පුළුවන්. ඒවා තමයි ධීවර ජනතාවට දෙන්න ඕනෑ සහන, පහසුකම්. ඒවා තමයි මේ කර්මාන්තය ගොඩ ගැනීම සඳහා ධීවර ජනතාව වෙනුවෙන් කළ යුතු සේවාවන්. මේවා දේශීය කර්මාන්ත. මුහුදේ නිකම් තිබෙන මාළු ටික අල්ලා ගෙන එන්න අවශ්‍ය කරන පහසුකම් ටික දෙන්න බැරි ආණ්ඩුවක්, මේක. බෝට්ටුවක් කැඩුණාම බෝට්ටුව ගොඩට ගෙන්වා ගන්න බැරි ආණ්ඩුවක්. මේවා නොකර මේ කර්මාන්තය ගොඩ ගන්න බැහැ. රටේ තිබෙන්නේ කර්මාන්ත දෙකයි. ඒ තමයි කෘෂි කර්මාන්තය සහ ධීවර කර්මාන්තය. මේවා රටට ආදායම් උත්පාදනය කළ හැකි දේශීය කර්මාන්ත. රටේ මිනිස්සුන්ට ආහාරය සඳහා අවශ්‍යම කරන මත්ස්‍ය සම්පත ලබා දෙන කර්මාන්තය තමයි ධීවර කර්මාන්තය. ඒ වාගේම විදේශ විනිමය ලබා දෙන දේශීය කර්මාන්ත. මේවා කරන්නේ නැතිව අමාත්‍යාංශයේ කටයුතු විතරක් කරලා හරියන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. හොඳ, දක්ෂ, හැකියාව තිබෙන නිලධාරින් ටිකක් මේකට පත් කරන්න. අපේ නියෝජ්‍ය ඇමතිතුමාට මේවා තේරෙනවා. නිලධාරින්ට අවශ්‍ය විධියට වැඩ කරන්න එපා. ධීවර ජනතාවගේ අවශ්‍යතා අනුව, ඔවුන්ට අවශ්‍ය සේවය ලබා දෙන්න වැඩ කරන්න ලැහැස්ති වෙන්න. එහෙම කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

ඊළඟට, "නිල් ආර්ථික" වැඩ පිළිවෙළ ගත්තොත්, මේ "නිල් ආර්ථික" වැඩ පිළිවෙළට ජනාධිපතිතුමා රුපියල් මිලියන 100ක් වෙන් කරලා තිබෙනවා. මම කියන්න කැමැතියි, මේ කාරණයත්. 2017දී මම රාජ්‍ය ඇමතිවරයා හැටියට ඉන්නකොට මගේ උපදේශකවරයා හැටියට හිටියේ අයේෂ් රණවක කියලා නාවික හමුදාවේ captain කෙනෙක්. ඔහු හොඳ ගවේෂකයෙක්. ඔහු හොඳින් ගවේෂණය කරලා "නිල් ආර්ථික" වැඩ පිළිවෙළ සකස් කළා. මා ළඟ ඒ පොත තවම තිබෙනවා. එම "නිල් ආර්ථික" වැඩ පිළිවෙළ මේ අවස්ථාවේ මා **සභාගත*** කරනවා.

එම වැඩ පිළිවෙළ තුළින් මුළු රටේම තිබෙන සාගර සම්පත ප්‍රයෝජනට ගන්න පුළුවන් ව්‍යාපෘතියක් සකස් කළා. එහිදී අපි බුද්ධි මණ්ඩලයක් පත් කළා. බුද්ධි මණ්ඩලය පත් කරලා, "නිල් ආර්ථික" වැඩ පිළිවෙළ හරහා අපි හදපු project එක ඇතුළේ ජීවී සම්පත්, අජීවී සම්පත්, ඉන්ධන, ගෑස්, බලශක්ති, ඛනිජ සම්පත්, සමුද්‍රීය ආරක්ෂාව, සමුද්‍රීය සංචාරක කර්මාන්තය, ඒ වාගේම බහුකාර්මික ධීවර වරායන් කියන මේ සියල්ලක්ම තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have two more minutes.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට තව විනාඩි තුන හතරක් දෙන්න, ගරු සභාපතිතුමනි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, එතුමාට අමතර විනාඩි තුනක් දෙන්න.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඒ ඔක්කෝම මේ project එකේ තිබෙනවා. ඉතින්, මේ වැඩ පිළිවෙළ අපි හැදුවේ 2018දී. මම අපේ අයේෂ් රණවකට කිව්වා, මේක ජනාධිපතිතුමාට යවන්න කියලා. ජනාධිපතිතුමාට එතුමා මේක යවලා තිබෙනවා. යැව්වාම, ජනාධිපතිතුමා ඒක පිළිගෙන තිබෙනවා. ඒක පිළිගෙන තමයි ජනාධිපතිතුමා සාගර සම්පත් ගවේෂණය කරන්න රුපියල් මිලියන 100ක් වෙන් කරලා තිබෙන්නේ. මේක බොහොම හොඳ වැඩක්. මේක තමයි රට ගොඩ දමන්න පුළුවන්, එකම ගවේෂණය. රට වටේ ඇති මහ මුහුදේ තිබෙන සම්පත් ලබාගෙන මේ රටට ආදායම් උත්පාදනය කරන්න පුළුවන්. ඒක හොඳ වැඩක්. මේ වැඩේ කිරීමට involve වීම ගැන මම ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙමින්, මම තව කාරණයක් කියන්න ඕනෑ. ඊයේ පෙරේදා උත්සවයක් තිබුණා මම දැක්කා. ඔබතුමන්ලා අපිට ඒකට ආරාධනා කළේවත් නැහැ නේ, දවස් තුනක් තිස්සේ තිබුණා. අපිත් මේ ක්ෂේත්‍රයේ ඉන්නවා, අපිත් ඕවා කළා. අපි ආවා නම් අපිට අඩුපාඩු පෙන්වා දෙන්න තිබුණා. *[බාධා කිරීමක්]* අපිට ආරාධනා කළේ නැහැ, බොරු කියන්න එපා. ඔබතුමන්ලා බහුදින යාත්‍රා හිමියන් ඇගැයීමේ පියවරක් අරගෙන තිබුණා. බහුදින යාත්‍රා හිමියන් ඇගැයීම හොඳයි. බහුදින යාත්‍රා හිමියන් 7,000ක් ඉන්නවා. අද ඒගොල්ලෝ තනිකර බියට පත් වෙලා ඉන්නේ, අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නේ. ඒකට හේතු කාරණා රාශියක් තිබෙනවා. රුපියල් ලක්ෂ 40ක්, 50ක් වැය කරලා තමන්ගේ බෝට්ටුව මුහුදු යවලා රැකියාව කර ගන්න බැරි වුණොත්, තෙල් පොල්ල කන්න වෙනවා. ඒ කියන්නේ ලක්ෂ 30ක්, 40ක් ආයෙත් අතින් දමන්න වෙනවා. ගෙදර මනුස්සයාගේ තිබෙන රත්තරන් බඩු ටික උකස් තියන්න වෙනවා. ඒවා උකස් තියලා හරි බෝට්ටුව යවන්න ඕනෑ.

දෙවැනි කාරණය මේකයි. මේ ඇගැයීමට ඇතුළත් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මම නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරනවා, ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරනවා. මේ ධීවර කර්මාන්තය කරන ධීවරයා, බහුදින යාත්‍රා හිමියා රුපියල් කෝටි 3ක්, 4ක් වැය කරලා තමයි, මේ බෝට්ටුවක් මහ මුහුදට දමන්නේ. මහ මුහුදට දැම්මාට පස්සේ, ඒක රැකියාවේ යවන කොට ලක්ෂ 40ක්, 50ක් වැය වෙනවා. ඒක යවන කොට වරායෙන් පිට වුණාට පස්සේ ඒකේ skipper සහ ඒ යන පස්දෙනා හෝ හයදෙනා තමයි බෝට්ටුවේ අයිතිකරුවෝ, වග කිව යුත්තෝ වෙන්නේ. බෝට්ටුවේ අයිතිකාරයා ඉන්නේ, ගෙදර. ගරු සභාපතිතුමනි, ඒ බෝට්ටු මුහුදු ගිහිල්ලා කුඩු ගේනවා; මත්ද්‍රව්‍ය ගේනවා. ඒ skipperට ලක්ෂ 50ක්, 60ක්, 100ක් දුන්නාම ඒ කණ්ඩායම ඒක බෙදා ගෙන හොරට ගේනවා. සියයට 99ක්ම මේ දේ කරන්නේ නැහැ. ඒ බෝට්ටු 7,000න්, සියයට 99ක් ඒ දේ කරන්නේ නැහැ. බහුදින යාත්‍රා හිමියන් එක්ක ඒ skipperslා හරි සම්බන්ධයි. ඒගොල්ලන්ගේ අවශ්‍යතා ඉෂ්ට කර දීලා තිබෙනවා, ගෙවල් දොරවල් හදා ගන්න, හැම දෙයකටම උදවු කරනවා. එතකොට ඒගොල්ලන් ගැන විශ්වාසයක් තිබෙනවා. ඒ බහුදින යාත්‍රා හිමියන් සමඟ තිබෙන විශ්වාසය skipperslා පලුදු කර ගන්නේ නැහැ. සියයට 1ක වාගේ ප්‍රමාණයක් මුදලට වහල් වෙලා මේ හොර ජාවාරම, කුඩු ජාවාරම කරනවා. ඒක කළාට පස්සේ බෝට්ටුවක් හසු වුණා කියලා පොලීසියෙන් අත්අඩංගුවට ගන්න

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

කොට, මුහුදේ ඉඳලා බෝට්ටුව ගොඩට එනකොට පොලීසියෙන් බෝට්ටු අයිතිකාරයාගේ ගෙදර යනවා. ගෙදර ගිහිල්ලා පරීක්ෂා කරනවා, බෝට්ටු අයිතිකාරයා කුඩුවලට සම්බන්ධයි කියලා. අන්න, ඒ මනුෂ්‍යයාගේ රෙදි ඔක්කොම ගලවනවා. බෝට්ටුවේ කුඩු ගේනවා. බෝට්ටුවේ අයිතිකාරයාගේ ගෙදරට පොලීසියෙන් ගියාම, බෝට්ටුවේ අයිතිකාරයා ඒ මොකුත් දන්නේ නැහැ, skippersලා තමයි සල්ලි අරගෙන කුඩු ගේන්නේ. ඉතින්, බෝට්ටුවේ අයිතිකාරයා මේ කිසි දෙයක් දන්නේ නැහැ. මම ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරනවා, මුහුදේදී බෝට්ටුවක තිබිලා කුඩු හරි වෙනත් යම් කිසි ද්‍රව්‍යයක් අහු වුණාම ඒ බෝට්ටුව ගොඩබිමට ගෙනැල්ලා skipper ඇතුළු ඒ බෝට්ටුවේ යන හයදෙනාම රඳවාගෙන ප්‍රශ්න කරලා, බෝට්ටුකාරයා වැරදිකාරයා නම් බෝට්ටුව අත්අඩංගුවට ගන්න කියලා. එතකල් බෝට්ටුකාරයාට මොකුත් කරන්න එපා. බෝට්ටුකාරයා පැනලා යන්නේ නැහැ නේ, ඉන්නවා නේ. මුහුදේදී බෝට්ටුවේ තිබිලා බඩු අහු වුණාය කියලා බෝට්ටුවේ අයිතිකාරයාව අල්ලා ගන්න එපා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

**ගරු දිලිප් වෙදආරච්-චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට තව විනාඩියක් දෙන්න, ගරු සභාපතිතුමනි.

කිරින්දට ආපු බෝට්ටුවේ යන මිනිස්සු කිව්වා, මේ ගැන බෝට්ටුකාරයා දන්නේ නැහැ කියලා. අද ඒ බෝට්ටුව ගැටගහලා තිබෙනවා. ඒ බෝට්ටු අයිතිකාරයා උසාවි ගෙනිහිල්ලා, ඔහුට සල්ලි වියදම් වෙලා, බෝට්ටුවට හානි වෙලා, මාස ගණනාවකට පස්සේ තමයි ඒ මනුස්සයාට බෝට්ටුව ගන්නත් වෙන්නේ. ඉතින් මිනිස්සු මේකට හරි බයයි. ඒ මිනිස්සුන්ට නින්ද යන්නේ නැහැ. ඒ මිනිසුන්ට හරි අසාධාරණයක් මේක. නීතිය හරියට ක්‍රියාත්මක කරන්න. කුඩු මර්දනය කරන්න ඕනෑ; නැති කරන්න ඕනෑ. අපි කුඩුවලට විරුද්ධයි. බහුදින යාත්‍රා හිමියන් ගොඩක් දෙනෙක් මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කියලා මට කිව්වා. "අපි ගෙවල්වල ඉන්නේ හරි බයෙන්, බෝට්ටුවේ යන අය මොකක් හරි කළොත් අපි අහුවෙනවා, අපි අත්අඩංගුවට ගන්නවා, අපට හිරබත් කන්න වෙනවා" කියලා ඔවුන් කිව්වා. ඉතින් මේ ප්‍රශ්නයට නිසියාකාර විසඳුමක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ඔබතුමන්ලාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා. මේක සාධාරණ ප්‍රශ්නයක්.

දැන් මිනිස්සු බයට බෝට්ටු මුහුදට යවන්නේ නැහැ. අපටත් බෝට්ටු තිබෙනවා. මම බෝට්ටුවක් විකිණුවා, මට විශ්වාස නැති නිසා. දැන් මට බෝට්ටු දෙකයි තිබෙන්නේ. මගේ ළඟම ඉන්න විශ්වාසවන්ත දෙදෙනෙක් තමයි දැන් ඒ බෝට්ටු අරගෙන යන්නේ. කරගන්න බැරි නම් අපි බෝට්ටු ගැට ගහලා තියනවා. අපේ ආත්ම ගරුත්වය රැක ගන්න ඕනෑ. බෝට්ටු අයිතිකාරයෙක් අහුවුණොත්, රෙදි ගැලවෙනවා, ඊට පස්සේ ඔවුන්ට ගෙවල්වලට යන්න විධියක් නැහැ නේ. පස්සේ නිර්දෝෂ වනවා තමයි. TV එකේ යන්නේ, අන්න බඩු අහු වුණාය කියලා නේ. හරියාකාරව හොයලා බෝට්ටු හිමියන් අත්අඩංගුවට ගන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මේක කාරුණික ඉල්ලීමක්. මට තව ගොඩක් දේවල් කියන්න තිබෙනවා, නමුත් මට නියමිත කාලය අවසන් නිසා ඒ සියල්ල කියන්න අවස්ථාවක් නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
What is your point of Order?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Chairman, the Votes of the Ministry of Finance, Planning and Economic Development are to be taken up on the 03rd of December. There are four Questions raised under Standing Order No. 27(2) which have not been answered. And, you wanted to cut down the time allotted for asking those Questions and giving Answers.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
It is not my decision; it is the decision of the Committee on Parliamentary Business.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Yes. But, we still have not got Answers for those Questions for the last one month and those are related to the Ministry of Finance. So, if we do not get the Answers, the necessary gen, raising those at the Committee Stage would be difficult. So, I would make an intervention here to request you to ensure that the relevant Ministers respond before the 03rd of December.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Ramalingam Chandrasekar. You have 15 minutes.

[පූ.භා. 10.19]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
ගරු සභාපතිතුමනි, දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාගේ කථාව තෙල් සහනාධාරයෙන් පටන් ගෙන කුඩු ගෙනෙන එක, නැත්නම් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරන එකෙන් අවසන් කළා. කෙසේ වෙතත්, තෙල් සහනාධාරයෙන් පටන් ගෙන මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරන එකෙන් අවසන් කරන්න වීම තමයි අද අපේ ධීවර අමාත්‍යාංශයට වෙලා තිබෙන වින්නැහිය කියන එක මම පළමුවෙන්ම කියන්න කැමැතියි.

கௌரவ தவிசாளர் அவர்களே, மிகவும் முக்கியமான ஓர் அமைச்சுத் தொடர்பாக எனக்கு முதலில் பேசிய ஐக்கிய மக்கள் சக்தியைச் சேர்ந்த திலிப் வெதஆரச்சி அவர்கள் பல்வேறு விடயங்களைக் கூறியிருந்தார். அவர் பேசிய விடயங்களில் ஒரு விடயத்தை நான் முதலில் இந்த இடத்தில் சுட்டிக்காட்டிவிட்டுச் செல்வது நல்லதென்று நினைக்கின்றேன்.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා තෙල් සහනාධාරය ගැන සඳහන් කළා. තෙල් සහනාධාරය දෙන්න අපට හේතුවක් වුණු කාරණය ඔබතුමන්ලා කවුරුත් දන්නවා. ඔබතුමා ධීවර ඇමතිවරයා හැටියටත් හිටියා නේ. අන්න ඒ කාලයේදී ධීවර රැකියාවට යා යුතු බෝට්ටු සියල්ලම වැල්ලේ ගැටගහලා තමයි තිබුණේ. ඒ ගැටගහලා තිබුණු බෝට්ටු ටික මුහුදට යැවිය යුතුයි. එතකොට තමයි අපට ආදායමක් ලැබෙන එකත්, අනෙක් පැත්තෙන් ඔවුන්ට ආදායමක් ලැබෙන එකත් සිදු වන්නේ. අන්න ඒ සඳහා අපි පසුගිය කාලයේදී මාස 6ක කාල සීමාවක් ඉලක්ක කරගෙන තෙල් සහනාධාරයක් ලබා දුන්නා. ගරු මන්ත්‍රීතුමනි, ඒක ඔබතුමා හොඳටම දන්නවාත් ඇති, ඔබතුමාගේ බෝට්ටුවලටත් ඒවායින් ඵල ප්‍රයෝජන ගත්තා. අන්න ඒ සඳහා රුපියල් බිලියන 2.3ක් - Rs. 2.3 billion - වෙන් කළා. අපේ අය වැයට කලින් අපි ඒ සහනාධාරය ලබා දුන්නාය කියන එක මම මතක් කරනවා. ධීවරයින්ට දිගටම සහනාධාර අවශ්‍යද, නැද්ද කියන එක ගැන අපි කල්පනා කරන්න ඕනෑ. මොකද, අපේ ධීවරයින් හැම දාම සහනාධාර මතම යැපෙන්න ඕනෑ නැහැ. මම පෞද්ගලිකව විශ්වාස කරනවා වාගේම ධීවර ජනතාව හම්බ වෙන හැම තැනකදීම මම කියන්නේ, ධීවර ජනතාව නිකම් වෙනත් සහනාධාරවලින් ජීවත් විය යුතු පිරිසක් නොවෙයි, ඔවුන් රටේ ජනතාව විධියට විතරක් නොවෙයි, අනෙක් අයටත් උදවු කළ හැකි පිරිසක් බවට පරිවර්තනය විය යුතුය කියලායි. අන්න ඒ සඳහා අපි වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. අන්න ඒකයි මෙතැනට වැදගත් වන්නේ.

கௌரவ தவிசாளர் அவர்களே, எங்களுடைய அரசாங்கத்தின் கொள்கைப் பிரகடனத்திலே இந்த நாடு பொருளாதார ரீதியாக முன்னேற்றம் அடைவதற்கு நாட்டில் விசேடமான முக்கிய துறையாகக் காணப்படும் மீன்பிடித் துறையை எப்படிக் கட்டியெழுப்புவது என்பது மிகவும் தெளிவாகக் குறிப்பிடப்பட்டிருக்கின்றது. இலங்கையின் கடல் வலயம் 517,000 சதுர கிலோமீற்றர் புறநீங்கலாக, 2,500 சதுர கிலோமீற்றர் உள்நாட்டு நீர்ப்பரப்பையும், 1,580 சதுர கிலோமீற்றர் நீரேரிகளையும் ஆற்று முகத்துவாரங்களையும், 5,200 சதுர கிலோமீற்றர் நீர்த்தேக்கங்களையும் உள்ளடக்கி இருக்கின்ற ஒரு பெரிய பரப்பளவு பொருளாதார வலயமாக அமைகின்றது. அது மாத்திரமல்ல, நன்னீர் மீன் வளர்ப்புக்கு நாடு தழுவிய ரீதியாகச் சகல குளங்களையும்கூட பாவிக்கக்கூடிய நிலைமை இருக்கின்றது. ஆனால், அவற்றைச் சரிவரப் பயன்படுத்தி இருக்கின்றோமா என்று பார்க்கின்ற பொழுது, கடற்றொழில் அமைச்சு அல்லது மீன்பிடித் துறை என்பது இன்னமும் பழைய காலத்துப் புராணங்களை மாத்திரம் பாடுகின்றதாகப் பின்தங்கிய நிலையில் இருக்கின்றது என்பதை எல்லோரும் உணரக்கூடியதாக இருக்கின்றது.

இன்றைக்கு எமது மீன்பிடித் துறையில் 50,000க்கு அதிகமான படகுகள் இருக்கின்றன; 7,000க்கும் அதிகமான பலநாட் படகுகள் இருக்கின்றன. ஆனால், அவை குறைந்தது 10-20 வருடத்திற்கும் மேல் பழைமை வாய்ந்தவையாக இருக்கின்றன. அந்த வகையில், எங்களுடைய மீனவர்களுடைய படகுகளும் பழைமையானதாக இருக்கிறது; அவர்களது மனநிலையும் இன்னும் ஆழ்கடலில் மீன் பிடிப்பதா அல்லது இந்தத் துறையிலிருந்து வேறொரு துறைக்கு மாறுவதா என்ற நிலையில் இருக்கிறது என்பது எல்லோருக்கும் தெரியும்.

இன்று aquaculture பெரிய ஒரு கலாசாரமாக மாறியிருக்கின்றது. Marine culture மாறி இன்றைக்கு fish catching system இலிருந்து aquacultureஐ நோக்கிச் செல்ல வேண்டிய தேவையிருக்கின்றது. அந்தத் தேவையை நோக்கிச் செல்வதற்குத் தடையாக, பழைய படகுகள்தான் இன்னமும் பயன்படுத்தப்படுவதும், அவற்றுக்கு எந்த விதமான தொழில்நுட்ப உபகரணங்களைச் சேர்க்காமையும், இன்னமும் கரையை அண்மித்திருக்கின்ற கடற்பகுதியை மாத்திரம் நம்பி மீன் பிடிக்கின்ற நிலைமை காணப்படுவதும், ஆழ்கடலை நோக்கிச் செல்வதற்கான மீனவர்களின் விருப்பம் குறைந்திருப்பதும், ஆழ்கடலுக்குச் செல்வதற்கு ஏதுவான நவீன கலங்கள் மற்றும் நவீன இயந்திரங்கள் அடங்கிய படகுகள் இல்லாமையும் காரணங்களாக அமைந்திருக்கின்றது. இதனால் எங்களுடைய மீன்பிடித் துறை நாளுக்குநாள் வலுவிழந்து வருகின்ற நிலைமையைக் காணக்கூடியதாக இருக்கின்றது.

எங்களுடைய அரசாங்கம் இந்த நிலைமைகளிலிருந்து எங்களுடைய நாட்டையும் எங்களுடைய மீனவர்களையும் மீட்க வேண்டும் என்பதில் கவனமெடுத்திருக்கின்றது. அதனை மேற்கொள்வதற்கு எந்தவித சட்டச் சிக்கலும் கிடையாது. அந்த வகையிலே, கௌரவ தவிசாளர் அவர்களே, கடந்த 2025க்கான வரவு செலவுத்திட்டத்தில் மீண்டுவரும் செலவாக 6.2 பில்லியன் ரூபாயும் மூலதனச் செலவாக 5.2 பில்லியன் ரூபாயுமாக 11.4 பில்லியன் ரூபாய் எங்களுடைய அமைச்சுக்கு ஒதுக்கீடு செய்யப்பட்டிருந்தது. 2026ஆம் ஆண்டுக்கு 10.6 பில்லியன் ரூபாய் - அதில் 4.1 பில்லியன் மீண்டுவரும் செலவாகவும், 6.5 பில்லியன் ரூபாய் மூலதனச் செலவாகவும் - ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. அதாவது, 2025இல் மூலதனச் செலவாக ஒதுக்கீடு செய்யப்பட்டிருந்தது 5.2 பில்லியன் ரூபாய்! 2026ஆம் ஆண்டுக்கு 6.5 பில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது.

மாண்புமிகு சனாதிபதி அவர்கள் தனது உரையிலே, மீன்பிடித் துறைமுகங்களின் அபிவிருத்திக்காக மேலும் 1,000 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டு இருப்பதாக மிகத் தெளிவாகக் குறிப்பிட்டு இருக்கின்றார். அது மாத்திரமல்ல, life -saving உபகரணங்களுக்காக 100 மில்லியன் ரூபாயும், அறுவடைக்குப் பிந்திய இழப்பைக் குறைப்பதற்காக 500 மில்லியன் ரூபாயும் ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. அதேபோன்று, satellite முறைமையில் புதிய தொடர்பாடல் தொழில்நுட்பத்தைக் கையாள்வதற்காக 100 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது.

அடுத்து, நன்னீர் மீன்பிடியை எடுத்துக்கொண்டால், NAQDAக்கு 1,300 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது; இது கடந்த வருடத்தைவிட பல மடங்கு அதிகமாகும். அந்த வகையில், விசேடமாக இந்தத் துறைக்குக் கூடுதலான நிதி ஒதுக்கீடுகளைச் செய்திருக்கின்றோம். நாங்கள் கடந்த ஒரு வருடமாக மீனவர்கள் முகங்கொடுக்கின்ற பிரச்சினைகளை இனங்கண்டு கொண்டிருக்கின்றோம். அந்தப் பிரச்சினைகளைப் படிப்படியாகத் தீர்ப்பதற்கு ஏதுவான செயற்றிட்டங்களை முன்னெடுத்து வருகின்றோம். அதற்கான நிதி ஒதுக்கீடுகளையும் செய்திருக்கின்றோம். கடந்த வருடம் இதற்கு 3,000 மில்லியன் ரூபாய்க்கும் அதிகமான நிதி ஒதுக்கீடு செய்யப்பட்டது; அதில் கந்தரை மீன்பிடித் துறைமுக நிர்மாணத்துக்காக மாத்திரம் 1,300 மில்லியன் ரூபாய்க்கும் அதிகமாக ஒதுக்கீடு செய்யப்பட்டது.

யாழ்ப்பாணத்தை எடுத்துக்கொண்டால், மயிலிட்டி மீன்பிடித் துறைமுக அபிவிருத்திக்காக கடந்த வருடம் 200 மில்லியன் ரூபாயும் இந்த வருடம் 220 மில்லியன் ரூபாயும் ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. அத்தோடு, அங்கிருக்கின்ற ஏனைய சிறிய மீன்பிடித் துறைமுகங்களை, இறங்குதுறைகளை அபிவிருத்தி செய்வதற்காக 140 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது.

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

அதுபோல், கடலரிப்பால் பாதிக்கப்படுகின்ற கடற்கரை களையும் மக்களையும் பாதுகாக்க வேண்டிய தேவை இருக்கின்றது. கரையோரங்களில் இருக்கின்ற மீனவர் களுடைய வீடுகளைப் பாதுகாக்க வேண்டி இருக்கின்றது. அதற்காகவும் நாங்கள் நிதி ஒதுக்கீடு செய்திருக்கின்றோம்.

இந்தத் தொழிற்றுறையில் கடந்த காலம் முழுவதுமே 'டின்மீன்' வெளிநாடுகளிலிருந்து கூடுதலாக இறக்குமதி செய்யப்பட்டதைத் தவிர, அதனை ஏற்றுமதி செய்கின்ற நாடாக எங்களுடைய நாட்டை மாற்றவில்லை. இலங்கையைச் சூழ கடல் இருக்கின்றது; கடலில் எல்லா வளங்களும் நிறைந்திருக்கின்றன. ஆனால், இந்த நாட்டுக்கு வெளிநாட்டிலிருந்து 'ஸெமன் டின்மீன்' இறக்குமதி செய்யப்பட்டது. கௌரவ தவிசாளர் அவர்களே, கடந்த வருடம் நாங்கள் இதற்கு முற்றுப்புள்ளி வைத்திருக்கின்றோம். அதாவது, இப்பொழுது இலங்கையில் பயன்படுத்துகின்ற 'ஸெமன் டின்மீன்', எமது மீனவர்களால் எமது கடலில் பிடிக்கப்பட்ட மீன்கள்மூலம் உற்பத்தி செய்யப்படுகின்றது; அந்த 'டின்மீன் ' உற்பத்தி என்பது, நாம் எமது கையை ஊன்றிக் கரணமடிக்கின்ற நிலைமைக்கு மாற்றமடைந்திருக்கின்றது. அந்த வகையில், இன்றைக்கு அந்தத் துறையை நாங்கள் முன்னேற்றியிருக்கிறோம் என்பது எங்கள் எல்லோருக்குமே தெரியும்!

அதேபோன்று, இன்றைக்கு கருவாடு உற்பத்தியை எடுத்துக்கொண்டாலும் சரி, மாசி உற்பத்தியை எடுத்துக்கொண்டாலும் சரி, உண்மையிலே அந்த உற்பத்திகளை நாம் மேம்படுத்தி, பாரிய தொழில் துறையாக அதனை மாற்றமடையச் செய்ய வேண்டும். அதற்கு அந்தத் தொழில் துறையில் ஈடுபடுகின்றவர்களுக்குப் போதுமான வசதி வாய்ப்புக்களைச் செய்து கொடுக்க வேண்டும்; நவீன தொழில்நுட்பத்தைப் பெற்றுக் கொடுக்க வேண்டும். அதற்கு அரசாங்கம் கூடுதலாக உதவி செய்யத் தயாராக இருக்கின்றது. கௌரவ திலிப் வெதஆரச்சி அவர்கள் குறிப்பிட்டதுபோன்று, கடந்த காலங்களில் இந்த உற்பத்தியாளர்களுக்கு உப்பு பிரச்சினை ஏற்பட்டது உண்மைதான். ஆனால், இப்போது அந்தப் பிரச்சினை முற்றாகத் தீர்க்கப்பட்டிருக்கின்றது. இப்போது, இந்த நிமிடத்தில் புத்தளம், பருத்தித்துறை மற்றும் யாழ்ப்பாணம் போன்ற பிரதேசங்களில் அவ்வாறான உப்புத் தட்டுப்பாடு இருக்கின்றதா என்று தேடிப் பாருங்கள்! அவ்வாறு தட்டுப்பாடு இருக்குமாக இருந்தால், நீங்கள் உடனடியாக எங்களுக்குச் சுட்டிக்காட்டுங்கள்! அதற்கு நாங்கள் உடனடியான நடவடிக்கை எடுக்கத் தயார். ஏனென்றால், இன்றைக்கு எங்களுடைய ஆனையிறவு உப்பளம் செயற்படுகின்றது; மாந்தை உப்பளம் செயற்படுகின்றது; அம்பாந்தோட்டை உப்பளம் செயற்படுகின்றது. இவற்றின் உற்பத்தி அதிகரித்திருக்கின்றது. அதனால் எதிர்வரும் காலத்தில் முற்றாகவே மக்களுடைய உப்புத் தேவையைத் தீர்ப்பது மாத்திரமல்லாமல், உப்பை ஏற்றுமதி செய்வதற்குக்கூட முடியுமான நிலைமைகள் எங்களுக்கு ஏற்படும் என்பதை இந்த இடத்தில் நாங்கள் சுட்டிக்காட்ட வேண்டும்.

அதேபோல, எங்கள் எல்லோருக்கும் தெரியும், கடந்த 21, 22, 23ஆம் திகதிகளில் இலங்கையில் எங்களுடைய கடற்றொழில் அமைச்சின்கீழ் பிரமாண்டமான ஒரு கண்காட்சியை நாம் நடாத்தினோம் என்பது. கௌரவ தவிசாளர் அவர்களே, எங்களுடைய நாடு ஒரு சிறிய நாடு என்பது உண்மை; ஒரு சிறிய தீவு என்பது உண்மை. ஆனால், இந்த அழகிய சிறிய தீவு அழகான கடற்கரைகளைக் கொண்டிருக்கின்றது. அந்தக் கடலில் அழகிய மீன்களும் இருக்கின்றன. அதேபோன்று, எங்களுடைய நாடு முழுவதும் இருக்கின்ற குளங்கள், ஏரிகள் அனைத்தையும் நாங்கள் பார்க்கின்றபொழுது, அழகிய மீன்களால் அவை நிறைந்து காணப்படுகின்றன. ஆனால், இந்த வளங்களை நாங்கள் இதுநாள்வரைக்கும் சரிவரப் பயன்படுத்தி இருக்கின்றோமா? என்ற கேள்வி எழுகின்றது. அந்தக் கேள்வியின் அடிப்படையில்தான் நாங்கள் முடிவெடுத்தோம், முதலாவதாக நாம் எங்களுடைய நாட்டினுடைய மகத்துவத்தைப் பற்றி எங்களுடைய நாட்டு மக்களும் சர்வதேசமும் மீண்டும் திரும்பிப் பார்ப்பதற்கு ஏதுவான நடவடிக்கைகளை எடுக்க வேண்டும் என்று. அதுவே எங்களுடைய அந்தக் கண்காட்சியின் எதிர்பார்ப்பாக இருந்தது.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, your time is over.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
මට විනාඩියක් දෙන්න, ගරු සභාපතිතුමනි.

அந்தவகையில், விசேடமாக எங்களுடைய அமைச்சின்கீழ் முன்னெடுக்கப்பட்ட இந்தக் கண்காட்சி என்பது மிகவும் முக்கியமானதாகவும் ஒரு மாற்றத்தை ஏற்படுத்தக் கூடியதாகவும் இருந்திருக்கின்றது. நாங்கள் இலங்கையில் இருக்கின்ற மீனவர்களுடைய பிரச்சினைகளைச் சிறந்த முறையில் இனங்கண்டிருக்கின்றோம்.

ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු මාදැල් පාඩු පිළිබඳ ප්‍රශ්නයත් හරි. ඒ සියලුම ප්‍රශ්නවලට අපි මැදිහත් වෙනවා; අපි ඒ ගැන කථා කරනවා. විශේෂයෙන්ම Negomboවල ඉන්න ආගමික නායකයින් ඇතුළු සියලුදෙනාම එක්ක අපි මේ පිළිබඳව සාකච්ඡා කළා. ඒ විතරක් නොවෙයි, ඔවුන්ගේ ධීවර ගම්මානයටම ගිහිල්ලා ඒ ප්‍රශ්න ගැන සොයා බලලා ඒවා විසඳීමේ දිසාවකට අද වනකොට අපි යොමු වෙලා තිබෙනවා. නමුත්, අභියෝග ගණනාවක් තිබෙනවා. ඒ අභියෝගවල ඉතිහාසය ගැන කියන්න මට අවශ්‍ය නැහැ, ගරු සභාපතිතුමනි. ඒ කියන්නේ, bitter past එකක් තමයි තිබෙන්නේ. ඔවුන්ට හොඳ අනාගතයකට යෑම සඳහා අපි වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ ඔස්සේ අපේ ධීවර ජනතාවගේ ප්‍රශ්න විසඳීමේ දිසාවට ඔවුන් රැගෙන යන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Kathiravelu Shanmugam Kugathasan. You have 10 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[மு.ப. 10.37]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ தவிசாளர் அவர்களே, 2026ஆம் ஆண்டுக்கான பாதீட்டு விவாதத்தில் எண்மியப் பொருளாதார அமைச்சுத் தொடர்பாக எனது கருத்துகளை இந்த அவையில் எடுத்துரைக்க விழைகின்றேன்.

எண்மியப் பொருளாதாரம் - digital economy - என்பது இணையம்மூலம் நடுநிலை செய்யப்பட்டு, உலகளாவிய அடிப்படையில் மேற்கொள்ளப்படும் வணிகம், தொழில்முறை மற்றும் பொருளாதார நடவடிக்கைகளின் பாரிய வலைப்பின்னலாகும். இது இணையப் பொருளாதாரம், வலைப் பொருளாதாரம், புதிய பொருளாதாரம் எனப் பலவாறு அறியப்படுகின்றது. எண்மியப் பொருளாதாரமானது, உலகளவில் ரில்லியன் கணக்கான டொலர் மதிப்புடையதாகக் காணப்படுகின்றது. இதன் சந்தை 2033ஆம் ஆண்டுக்குள் ஐந்து ரில்லியன் டொலர்களை எட்டுமென வர்த்தகம் மற்றும் அபிவிருத்திக்கான ஐக்கிய நாடுகள் சபையின் மாநாடு - UNCTAD - கூறுகின்றது. எண்மியப் பொருளாதாரம் என்பது ஒரு தனிமைப்படுத்தப்பட்ட துறை அல்ல. மாறாக, மரபுவழியான பொருளாதாரத்தைத் தொடர்ச்சியாக மாற்றியமைக்கும் மற்றும் விரிவுபடுத்தும் ஓர் ஒருங்கிணைந்த முறையாகும். இந்த ஒருங்கிணைப்பு என்பது எண்மியப் பொருளாதார அமைச்சகத்துடன் மட்டும் மட்டுப்படுத்தப்பட்டதல்ல; அனைத்து அரச துறைகளிலும் அது ஊடுருவி உள்ளது. அனைத்து அரச முதலீடுகளும் தேசிய தொழில்நுட்ப ஒத்திசைவுக்கு வழிவகுக்கும் என்பதை இது உறுதிப்படுத்துகின்றது.

இந்த அரசால் முன்வைக்கப்பட்டுள்ள 2026ஆம் ஆண்டுக்கான பாதீட்டில், எண்மியப் பொருளாதார அமைச்சுக்கு மீண்டெழும் செலவுக்காக 5.9 பில்லியன் ரூபாயும் மூலதனச் செலவுக்காக 10.1 பில்லியன் ரூபாயுமாக மொத்தம் 16 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இது மொத்தப் பாதீட்டில் 0.4 சதவீதமாகும். நாட்டின் பொருளாதாரத்தை எண்மியப் பொருளாதாரமாக மாற்றி, அபிவிருத்தியடைய நினைக்கும் இலங்கை போன்ற நாட்டுக்கு இந்த ஒதுக்கம் சிறிதும் போதுமானதல்ல. குடியரசுத் தலைவர் தனது உரையில், இலங்கையின் எண்மியப் பொருளாதார வருமானத்தை 15 பில்லியன் அமெரிக்க டொலர்வரை அதிகரிக்கக்கூடிய சாத்தியம் காணப்படுவதாகக் குறிப்பிட்டுள்ளார். இந்தச் சூழலில் இந்த அமைச்சுக்கான ஒதுக்கீடானது கடந்த ஆண்டோடு ஒப்பிடும்பொழுது, 623 மில்லியனாகக் குறைக்கப்பட்டுள்ளமையானது மகிழ்ச்சியளிக்கும் விடயம் அல்ல. எண்மிய உட்கட்டமைப்பு முதலீடு என்பது வெறுமனே ஒரு விருப்பச் செலவு அல்ல. அதுவே எண்மியப் பொருளாதாரத்துக்கு அடிப்படையான அத்திவாரம் ஆகும். நவீனமயமாக்கல் இல்லாமல் அரசு சேவை வழங்கலை திறம்படச் செய்யவோ, வெளிப்படைத் தன்மையை உறுதிப்படுத்தவோ அல்லது நீண்டகால நிதி நலனுக்கு அடிப்படையான வரித் தளத்தை வெற்றியாக விரிவுபடுத்தவோ முடியாது.

எண்மியப் பொருளாதார முதலீடானது, இலங்கையில் திறமையான பணியாளர்களை மேம்படுத்துவதோடு, தெற்காசியாவுக்குள் ஓர் ஆற்றல்மிக்க, நடுத்தர அடுக்கு எண்மிய சேவை மையமாக நாட்டை நிலைநிறுத்துமென எதிர்பார்க்கப்படுகின்றது. இந்த வழிமுறையானது, உறுதியான பொருளாதார வளர்ச்சியை சமூகச் சமநிலையுடன் இணைக்கின்றது. குறிப்பாக, விளிம்பு நிலைப் பகுதியினரை உயர்த்துவதை நோக்கமாகக் கொண்டது. மேலும், நகரத்து தொழில்முனைவோர் முதல் கிராமப்புற விவசாயிகள் வரை அனைத்துக் குடிமக்களும் எண்மியப் பாய்ச்சலால் பயனடைவதை உறுதி செய்கிறது. இலங்கையின் முதலீடுகள் உலகளவில் நிரூபிக்கப்பட்ட சிறந்த நடைமுறைகளை ஏற்றுக்கொள்கின்றன என்பதை உறுதிப்படுத்த, இலங்கையின் மூலோபாயம் உலகின் முன்னணி எண்மியப் பொருளாதார நாடுகளுடன் தொடர்ந்து ஒப்பிடப்பட வேண்டும்.

தென்கொரியா தொடர்ந்து எண்மிய பொருளாதாரத்தில் முன்னணியில் உள்ளது. பொருளாதாரக் கூட்டுறவு மற்றும் அபிவிருத்தி அமைப்பின் தரவரிசையில் இது 0.935 மதிப்பெண்ணுடன் முதலிடம் பிடித்துள்ளது. தென்கொரியாவின் வெற்றியானது நிறுவனமயமாக்கல், ஆளுகை மனிதத் திறமை மற்றும் வலுவான எண்மிய உட்கட்டமைப்புக்கு முன்னுரிமையளிப்பதில் இருந்து உருவாகிறது. இந்த வெற்றிக்குப் பின்னாலுள்ள முதன்மையான பொறிமுறையானது, 'வடிவமைப்பால் எண்மியம்' மற்றும் 'ஒரு தளமாக அரசாங்கம்' உள்ளிட்ட ஆறு பரிமாணங்களைச் சுற்றிக் கட்டமைக்கப்பட்ட ஒரு மூலோபாய அணுகுமுறையாகும். இயங்குதன்மை மற்றும் ஒருங்கிணைப்பு முறைகளை இலங்கை தென்கொரியாவிடமிருந்து கற்றுக்கொள்ள வேண்டும். துண்டுதுண்டான எண்மியத் திட்டங்கள், தனித்தனியாக அரசாங்கத் துறைகளில் செயற்படுத்தப்பட்டால், இலத்திரனியல் ஆளுகையில் 30 பில்லியன் ரூபாய் முதலீட்டால் எந்தப் பயனும் விளையாது. "GovPay" மற்றும் "e-Grama Niladhari" போன்ற தளங்களில் எமது முதலீடானது, தென்கொரியா ஏற்றுக்கொண்ட முழுமையான ஆளுகை மாதிரியைப் பின்பற்றி, அனைத்து அமைச்சகங்கள் மற்றும் நிறுவனங்களிலும் தடையற்ற, பாதுகாப்பான தரவுப் பகிர்வுத் திறன்களுக்கு உறுதியளிக்க வேண்டும்.

இந்தியாவானது, ஆதார் மற்றும் ஒருங்கிணைந்த கட்டண இடைமுகம் போன்ற அதன் எண்மியப் பொது உட்கட்டமைப்புமூலம் பாரியளவிலான வளர்ச்சி மற்றும் நிதி அணுகலுக்கான தொழில்நுட்பத்தைப் பயன்படுத்துவதில் உலகளவில் ஒரு முன்மாதிரியாக உருவெடுத்துள்ளது. இந்தியாவின் மொத்த உள்நாட்டு உற்பத்தியில் எண்மியப் பொருளாதாரத்தின் பங்களிப்பு 2026ஆம் ஆண்டில் 13.42 சதவீதமாக உயருமெனக் கணிக்கப்பட்டுள்ளது. இந்தியாவின் முதன்மையான அரசாங்க உத்தியாக எண்மிய அதிகாரம் அளித்தலோடு அதன் உற்பத்தியில் கவனம் செலுத்துகிறது. இந்தியப் பட்டறிவில் இருந்து வடிவமைப்பால் பாதுகாப்பு - security by design - என்ற கொள்கையை இலங்கை கற்றுக்கொள்ள வேண்டும். ஒரு பயனர் தேசிய அமைப்புகளில் இணைக்கப்படுவதற்கு முன்பே, UPIஇன் பரிவர்த்தனைக் கட்டமைப்புகள் மற்றும் ஆதாரின் biometric நெறிமுறைகளைப் போலவே, எண்மியத்தின் நோக்கங்களும் பயனர்களுக்குத் தெளிவுபடுத்தப்பட வேண்டும். இந்த அடிப்படை அணுகுமுறை, விரைவான தத்தெடுப்புக்குத் தேவையான பயனர் நம்பிக்கையை உருவாக்குவதற்குப் பயன்படுகின்றது என்பதை உறுதி செய்கிறது.

இலங்கை SLUDIஐ அறிமுகப்படுத்தும்பொழுது, நாட்டின் எண்மிய முதுகெலும்பான இந்த அமைப்பின் நம்பகத்தன்மையை உறுதிப்படுத்தவும் பொதுத் தரவைப் பாதுகாக்கவும் இந்த 'வடிவமைப்பால் பாதுகாப்பு' தத்துவத்தை ஏற்றுக்கொள்வது உடனடியான முன்னுரிமையாக இருக்க வேண்டும். இந்தியாவில் ஆதார், ஐரோப்பிய ஒன்றியத்தின் GDPR, கனடாவின் SIN, ஐக்கிய அமெரிக்காவின் SSN ஆகிய தரவுத்தளங்களைப்போல இலங்கையின் SLUDIஉம் அமைய

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

வேண்டும். எண்மிய முகவர் நிறுவனங்களை உருவாக்குவதே எண்மிய மாற்றத்துக்கான யப்பானின் அணுகுமுறையாகும். எண்மிய முகவர் நிறுவனங்கள் பொது மற்றும் தனியார் துறைகளில் எண்மிய மாற்ற முயற்சிகளை ஊக்குவிக்க ஒரு சக்திவாய்ந்த கட்டுப்பாட்டுக் கோபுரமாகச் செயற்படுகின்றன. யப்பானின் பார்வை 'மனிதர்களுக்கு உகந்த எண்மியமாக்கலை' மையமாகக் கொண்டுள்ளது. மேலும், 'யாரும் பின்தங்கி விடக்கூடாது' என்பதை உறுதிப்படுத்தும் ஒரு வலுவான நோக்குடனும் உள்ளது. யப்பானின் பட்டறிவு இலங்கைக்கு ஒரு முதன்மையான பாடத்தை வழங்குகிறது. எண்மிய பொருளாதார அமைச்சகம் மத்திய மூலோபாய அமைப்பாக அதன் அதிகாரத்தைப் பயன்படுத்த வேண்டும். வளங்களை ஒருங்கிணைத்து அதிகாரத்துவத் தடைகளைத் தடுக்க வேண்டும்.

எண்மிய மயமாக்கலின் நன்மைகள் கிராமப்புறச் சமூகங்களைச் சென்றடைவதையும் நாடு முழுவதும் எண்மிய ஏற்றத்தாழ்வை விரைவாகத் தீர்ப்பதையும் உறுதிப்படுத்த இந்த மையப்படுத்தப்பட்ட அணுகுமுறை தேவையாகும். அபிவிருத்தி அடைந்த நாடான அமெரிக்காகூட, தனது உட்கட்டமைப்பு சட்டம்மூலம் பில்லியன் கணக்கான டொலர்களை எண்மிய அபிவிருத்திக்கு முதலீடு செய்கிறது. எண்மிய சமத்துவச் சட்டம்மூலம் 2.75 பில்லியன் டொலர்களை மானியமாக அளிப்பதோடு, 'பிரேட்பேண்ட்' சமபங்கு, அணுகல் மற்றும் வரிசைப்படுத்தல் திட்டம்மூலம் 42 பில்லியன் டொலர்களை முதலீடும் செய்கின்றது. அபிவிருத்தி அடைந்த பொருளாதாரங்களுக்குக்கூட, எண்மிய கல்வியறிவு மற்றும் திறன் மேம்பாட்டுத் திட்டங்களை இலக்காகக்கொண்ட நிலையான பொது முதலீடு தேவை என்பதை இது காட்டுகிறது. எனவே, இலங்கையானது அதன் 30 பில்லியன் ரூபாய் முதலீட்டின் ஒரு கணிசமான பகுதியை வினைத்திறன் இடைவெளியை நிரப்ப முதலிட வேண்டும். சீனா அதன் ஐந்தாண்டுத் திட்டங்கள்மூலம், நீண்ட கால கொள்கை வரைபடங்களை பொருளாதாரம் மற்றும் தொழில்நுட்ப வளர்ச்சியை வழிநடத்த பயன்படுத்துவதன் மூலம் நிலைத்தன்மைக்கு ஓர் எடுத்துக்காட்டாக விளங்குகிறது. கொள்கை உறுதிப்பாடு மற்றும் நிலைத்தன்மை ஆகியன நிலையான, நீண்ட கால முதலீட்டாளர்களை ஈர்ப்பதற்கு இன்றியமையாதது. எனவே, இலங்கையும் அரசியல் மாற்றங்களைப் பொருட்படுத்தாமல், தனது எண்மியப் பொருளாதார மூலோபாயம் 2030ஐப் பராமரிக்க வேண்டும் என்பதை இது எடுத்துக் காட்டுகின்றது.

தேசிய எண்மிய மாற்றத்தை விரைவுபடுத்தவும், 30 பில்லியன் ரூபாய் முதலீடு அதன் முழுமையான பயனை வழங்குவதை உறுதிப்படுத்தவும், பின்வரும் நான்கு தூண் வரைபடம் முன்மொழியப்படுகிறது. முதலாவது, இணையச் சட்ட ஆணைச் செயலாக்கம் மற்றும் பொறுப்புக்கூறல் சட்டம் வழியாக நம்பிக்கையை உருவாக்குதல். இரண்டாவது, பயனருக்கான அறிவூட்டல் மற்றும் ஒத்துழைப்பு, அடிப்படை உள்ளடக்கலுக்கான முயற்சி, இலக்கு வைக்கப்பட்ட சமத்துவத் திட்டங்கள் வழியாகத் திறன் இடைவெளியை நிரப்புதல். மூன்றாவது, கட்டாயத் தளத் தத்தெடுப்பு, அணுகலுக்கான பரவலாக்கம் ஆகியவற்றின்மூலம் ஒருங்கிணைந்த சேவை வழங்கல். நான்காவது, விரைவுபடுத்தப்பட்ட உட்கட்டமைப்பு, FinTech ஒழுங்குமுறைத் தெளிவு, உலகளாவிய நிபுணத்துவத்தைப் பயன்படுத்துதல் வழியாகப் பொருளாதார முடுக்கம் மற்றும் FinTech ஒழுங்குமுறையைச் செயற்படுத்துதல்.

இந்த அரசின் 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் முன்மொழியப்பட்ட 30 பில்லியன் ரூபாய் என்பது வெறுமனே ஒரு செலவு அல்ல. இது ஓர் அடிப்படை முதலீடு மற்றும் பொருளாதார எதிர்காலத்துக்கான முற்பணமாகும். எண்மிய பொருளாதாரத்தின் வெற்றியானது, தொழில்நுட்பம் அல்லது நிதியை மட்டும் சார்ந்தது அல்ல. மாறாக, நம்பிக்கை, திறன், ஒத்துழைப்பு ஆகிய மூன்று முதன்மையான கூறுகளைச் சார்ந்துள்ளது. எண்மிய இணைப்பு மற்றும் செயற்பாட்டுக் கல்வியறிவு ஆகியவை சலுகைகளாக அல்ல, அடிப்படை உரிமைகளாகக் கருதப்படுவதை அரசு உறுதி செய்ய வேண்டும். இந்த எண்மிய அமைச்சகமானது நாடாளுமன்றம், தனியார் துறை மற்றும் உள்ளூர் சமூகங்களின் முயற்சிகளை ஒருங்கிணைப்பதன்மூலம் அடையாளம் காணப்பட்ட கட்டமைப்பு அபாயங்களான, பயன்பாட்டு இடைவெளி மற்றும் இணையப் பாதுகாப்பு அச்சுறுத்தல் ஆகியவற்றை வினைத்திறன் மிக்க வகையில் தடுக்க முடியும். இதன்மூலம் 2030ஆம் ஆண்டுக்குள் அரசின் இலக்கான 15 பில்லியன் அமெரிக்க டொலர் பொருளாதார இலக்கை முழுமையாக உணர்ந்து, அனைத்து குடிமக்களுக்கும் ஒரு மீள்தன்மைகொண்ட மற்றும் சமமான செழிப்பை உறுதி செய்யலாம். இலங்கை எண்மிய முறையில் அதிகாரம் பெற்ற நாடாக, புதுமை, உள்ளடக்கம் மற்றும் நிலையான வளர்ச்சியை அடையப் போகின்றதா அல்லது முழுமையடையாத செயற்படுத்தலோடு போராடப் போகின்றதா? என்பதை அடுத்த 5 ஆண்டுகள் முடிவு செய்யும்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Kugathasan, your time is up.

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
Okay, Sir.

இத்துறையில் உள்ள வாய்ப்பு உண்மையானது; அறைகூவல்கள் கணிசமானவை. சாத்தியமான வெகுமதிகள் முயற்சியை விருப்பத்துக்கு உரியதாக அல்லாமல், அவசியமாக்குகின்றன எனக்கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Eranga Weeraratne, you have 20 minutes.

[පූ.භා. 10.47]

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)

ගරු සභාපතිතුමනි, අමාත්‍යාංශ තුනක වැය ශීර්ෂ විවාදයට ගන්නා අද දවසේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ කර්තව්‍ය පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු ජනාධිපතිතුමාගේ 2026 අය වැය කථාවේ 6 වන පරිච්ඡේදය සම්පූර්ණයෙන්ම වෙන් වන්නේ "නවීකරණය හා ඩිජිටල්කරණය" වෙනුවෙන්. එහිදී ඩිජිටල්කරණය සඳහා වෙන්

කළ සමස්ත රාජ්‍ය ආයෝජනය සෘජු හා වක්‍ර වශයෙන් රුපියල් බිලියන 25.5ක් ඉක්මවනවා. විශේෂයෙන්ම නවෝත්පාදන හිතකාමී සහ ආයෝජන හිතකාමී තත්ත්වය ප්‍රවර්ධනය කර ඩිජිටල් ආර්ථිකයේ සමස්ත දායකත්වය දැනට තිබෙන සියයට 5ට අඩු ප්‍රමාණයේ සිට කලාපයේ තිබෙන සෙසු රටවල් හා තරගකාරීව සියයට 15කට වඩා ඉහළට ගෙන යෑමට අප රජය දැන් ක්‍රියා කරමින් තිබෙනවා. මේ රටේ ඩිජිටල්කරණය සමහර තැන්වල - සමහර රාජ්‍ය ආයතනවල- වෙන වෙනම සිද්ධ වෙලා තිබෙනවා. නමුත් සමස්ත රට විධියට හිතලා හදපු -Government as a whole- ඩිජිටල්කරණ සැලැස්මක් තිබුණේ නැහැ. අපේ රජය බලයට පත් වෙලා මුලින්ම කළ කර්තව්‍ය තමයි ඒ සඳහා ඩිජිටල් ආර්ථික සැලැස්මක් -Digital Economy Blueprint- එකක් ඉදිරිපත් කිරීම. ඒ සඳහා අපට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබිලා තිබෙනවා. ඒ අනුව කටයුතු කරන්න අපට පුළුවන්. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයත් සමඟ නිසි සම්බන්ධීකරණයක් ඇතිව ඩිජිටල්කරණය සඳහා වන උපාය මාර්ගික ආයෝජන සඳහා පියවර ගන්නා ලෙස, අනෙකුත් අමාත්‍යාංශ, පළාත් සභා සහ අනෙකුත් රාජ්‍ය ආයතනය ඒකාබද්ධ කරලා එක සැලැස්මක් අනුව වැඩ කටයුතු කරන ලෙස අමාත්‍ය මණ්ඩලයෙන් උපදෙස් දීලා තිබෙනවා. ඒ හරහා අපට පුළුවන් වෙයි රාජ්‍යකරණය සහ රාජ්‍ය සේවා කාර්යක්ෂම කරන්න, ඒ වාගේම ඒවා විනිවිදභාවය ඇති කරන සේවා බවට පත් කරන්න සහ ජනතාවට ඉතාම පහසුවෙන් එම සේවා ලබා ගන්න හැකියාව ඇති කරන්න. අපි දැන් ඒ කටයුතු කරමින් සිටිනවා.

වර්ෂයක් පමණ වන අපගේ පසුගිය පාලන කාලයේ හොඳ ස්ථාවර ඩිජිටල් ආර්ථික අඩිතාලමක් අපි මේ රටේ ඇති කරලා තිබෙනවා. ඒ හරහා අපි දැනට ඩිජිටල් යටිතල පහසුකම් විශාල ප්‍රමාණයක් - ගණනාවක්ම - සපුරාලන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ඉදිරියේදී ඩිජිටල් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කරන වැඩ කටයුතු විශාල ප්‍රමාණයක් ආරම්භ කර තිබෙනවා. ඒකේ එක ප්‍රධාන ඩිජිටල් යටිතල පහසුකමක් තමයි ඩිජිටල් ගෙවීම - digital payments - කියන එක. ඒ සඳහා ආරම්භ කළ එක ව්‍යාපෘතියක් තමයි GovPay සේවාව නවීකරණය කරලා, ඒක තවත් ව්‍යාප්ත කරලා මේ රජයට කරන ගෙවීම් ඒ හරහා වැඩි වැඩියෙන් කරන්න අවස්ථාව නිර්මාණය කිරීම. මම සතුටුයි කියන්න, මේ වන කොට රාජ්‍ය ආයතන 209ක් මේ සේවාව සඳහා සම්බන්ධ කර තිබෙනවා. රාජ්‍ය සේවා 3,162කට වැඩි ප්‍රමාණයකට මුදල් ගෙවන්න මේ හරහා පුළුවන්. මේ වනකොට ජනතාව මේ සේවාව හරහා රුපියල් මිලියන 1,560ක් ඉක්ම වූ ගෙවීම් රජයට කර තිබෙනවා. ඒකෙන් අපට පෙනෙන්නේ අප මේ වාගේ සේවාවක් නිර්මාණය කරලා ජනතාවට ලබා දුන්නොත් ජනතාව ඒක නොපැකිළව පාවිච්චි කරන්න උනන්දු වෙනවා කියන එකයි. අපි මේ සේවාව, - GovPay සේවාව - ඩිජිටල් ගෙවීම්වලට පමණක් සීමා නොකර රථ වාහන නීති උල්ලංඝනයේදී ස්ථානීය දඩ ගෙවන මට්ටමටම ව්‍යාප්ත කර තිබෙනවා. ඒ හරහා මේ වනකොට බස්නාහිර, දකුණ, උතුර, උතුරු මැද සහ වයඹ යන පළාත් සහ highwaysවල සිදු වන රථ වාහන නීති උල්ලංඝනයට අදාළව ඒ ස්ථානයේදීම ස්ථානීය දඩ ගෙවන්න හැකියාව ඇති කර තිබෙනවා. මේ සේවාව හරහා අපේ රියැදුරන්ට පුළුවන්, ආපහු දවසක් රස්තියාදු නොවී ඒ ගෙවීම් කටයුත්ත කර ගන්න. පැවැති ක්‍රමයට අනුව සති අන්තයක හරි, නිවාඩු දවසක හරි එහෙම නැත්නම් රාජකාරි වෙලාවෙන් පිටතදී හරි රථ වාහන නීතියක් උල්ලංඝනය කළොත් ඔවුන්ට සිදු වෙනවා post office එකකට ගිහින් ඒ ගෙවීම් කරන්න. නමුත් දැන් එහෙම අවශ්‍ය නැහැ. ඕනෑම වෙලාවක, ඕනෑම තැනක ඉඳගෙන phone එකක් මාර්ගයෙන් ඒ ගෙවීම් ඉතාම ඉක්මනින් කිරීමේ හැකියාව අපි ඇති කරලා තිබෙනවා. ඒ අනුව මේ මාස 4ක් වගේ කාලය ඇතුළත GovPay සේවාව හරහා 38,697ක් දඩ ගෙවලා තිබෙනවා. ඒ හරහා රුපියල් මිලියන 50කට අධික දඩ ප්‍රමාණයක් එකතු කර ගන්න අපේ පොලීසියට, අපේ මහා භාණ්ඩාගාරයට හැකියාව ලැබිලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ලබන මාසයේ මැද වන කොට මේ සේවාව අනෙක් සියලුම පළාත් ආවරණය වන විධියට ව්‍යාප්ත කරන්න. මේ සේවාවෙන් අපි සමස්ත ලංකාවම - මුළු දිවයිනම- ආවරණය කරනවා, ලබන මාසයේ මැද වනකොට.

GovPay කියන්නේ, ඩිජිටල් ගෙවීමේ ආරම්භයක් පමණයි. ඉස්සර කාඩ් හරහා කරන ගෙවීම්වලට අය කර තිබුණා commission එකක්. අපි මෙවර අය වැයෙන් යෝජනා කර තිබෙනවා, 2026 ජනවාරි 01වැනි දා සිට electronic ගෙවීම් වෙනුවෙන් රජයේ ආයතනවලට කරන සියලුම සේවා ගාස්තු අහෝසි කරන්න. ඒකෙන් අපට පුළුවන් වෙයි මේ ඩිජිටල් ගෙවීම් පද්ධතියට වැඩි වැඩියෙන් සම්බන්ධ වීමට, ඩිජිටල් මාධ්‍යයෙන් ගෙවීමට ජනතාව තවතවත් උනන්දු කරවන්න. මොකද, අපේ රටේ රුපියල් ට්‍රිලියන 1.3ක ප්‍රමාණයක් ජනතාව අතරේ මුදල් විධියට සැරිසරනවා. අපට අවශ්‍යයි, ඒ මුදල් මුදල් විධියට නැතුව ඩිජිටල් මාධ්‍යයට ගෙන එන්න. එතකොට සියලුම දේවල් කාර්යක්ෂම වෙනවා. ඒකෙන් ජනතාව සහ රජය කරන කර්තව්‍යයන් ඉතාම පහසු වෙනවා.

අපේ LankaQR payment එක නැවත වරක් හරියට ස්ථාපිත කරලා, relaunch එකකට යන්න plan කරලා තිබෙනවා. ඒකෙන් බලාපොරොත්තු වෙනවා, රුපියල් 5,000ට වඩා අඩු වටිනාකමකින් යුතු ගෙවීම් LankaQR හරහා ගෙවනවා නම්, ඒවා කිසිම පිරිවැයක් නැතුව, අමතර පිරිවැයක් නැතුව ගෙවීමේ හැකියාව ජනතාවට ඇති කරන්නට. ඒකෙන් ජනතාවටත් කිසිම වැඩි පිරිවැයක් නැහැ. ඒ වාගේම ඒක ලබා ගන්න ආයතනවලටත්, කඩේකටවත් ඒකෙන් කිසිම වැඩිපුර මුදලක් වියදම් වෙන්නේ නැහැ. ඒ අය කිරීම සියයට බිංදුවක් කරනවා. ඒ සියයට බිංදුව කිරීම සඳහා දැනටමත් බැංකු සියල්ලම වාගේ කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා. මාස 6කට ඒක බිංදුව කරන්න. ඒ වාගේම රජය මෙවර අය වැයෙන් මුදල් යොදවලා තිබෙනවා, ඒක බිංදුව කරන එක ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා.

ඒ වාගේම ඩිජිටල්කරණයට එනකොට ඩිජිටල් ගෙවීම් කරන්නට වැඩි වැඩියෙන් උනන්දුව ඇති කරන්න නම්, අලුත් විධියට මේක කෙරෙන්න ඕනෑ. අපි බලන්නේ මුදල් පාවිච්චිය වෙනුවට මේ කටයුතු ඩිජිටල් මාධ්‍යයට ගේන්නයි. ඒක කරන්න නම්, අනිවාර්යයෙන් මේකට ක්‍රීඩා ස්වරූපයක් ඇති කරන්න අවශ්‍යයි. ක්‍රීඩා ස්වරූපයක් විධියට ඇති කළාම, යම්කිසි අමතර වාසියක් ජනතාවට තිබෙන්න ඕනෑ සහ ඒක ලබා දෙන ඒ කඩ හිමියාටත් තිබෙන්න ඕනෑ, මේ ඩිජිටල් මාධ්‍යයෙන් මුදල් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම්. ඒ නිසා ඒකට අවශ්‍ය ක්‍රම, gamification වාගේ දේවල් ගෙනැල්ලා තමයි මේක relaunch කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ වාගේම ඒ සේවාව ලබාදීම සඳහා අවශ්‍ය උපාංග සහන මුදලකට ලබා දෙන්න ඕනෑ නම්, ඒකටත් අපි ක්‍රියාමාර්ග ඉදිරියේදී ගේනවා. ඒ වාගේම ඩිජිටල් මාධ්‍යයෙන් කරන ගෙවීම්වල record එක පාවිච්චි කරලා, ජනතාවට finance credit scoring එකක් ඇති කිරීමට බලාපොරොත්තු වනවා. ඒ කියන්නේ මූල්‍ය ණය ලැබීමට සුදුසුකමක් විධියට ඒ ඩිජිටල් පද්ධතියේ තිබෙන historical data පාවිච්චි කිරීමේ හැකියාව අපි ඇති කරනවා.

අනික් එක තමයි 2018දී හදපු Cloud පද්ධතිය තමයි අපේ රජය පත් වෙනකොටත් මේ රටේ තිබුණේ. ඒ පද්ධතිය ඉතාම අබලන් මට්ටමක තිබුණේ. අපට ඒකේ ඉඩ තිබුණේ නැහැ. ඒ වාගේම ඒ system එක තිබුණේ, single point of failure එකකට ලක් වෙන්න පුළුවන් ආකාරයට. අපි ඒ පද්ධතිය වෙනස් කරලා, අලුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකට ගියා. ඒ අනුව අපි පෞද්ගලික

[ගරු එරංග වීරරත්න මහතා]

අංශයත් සහභාගි කරගෙන ඒ අපේ Lanka Government Cloud පද්ධතිය දැන් නවීකරණය කරලා තිබෙනවා. ඒකට ඉතාම නවීන තාක්ෂණය පාවිච්චි කරලා, ඒ වාගේම එක තැනකින් ඒක අදාළ නොවන විධියට අවශ්‍ය redundancy ඒ පද්ධතියේ ඇති කරලා තිබෙනවා. ඒ වාගේම ඒකට අවශ්‍ය උපරිම cyber security තත්ත්ව පාලනය යටතේ ඇති කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, තව කරපු project එකක් තමයි උප්පැන්න විවාහ සහ මරණ සහතික ලබා ගැනීම ඩිජිටල්කරණය. මොකද, වෙන දා පිටරට ඉන්න කාට හරි ඒ වාගේ සහතිකයක් ලබා ගන්න ඕනෑ නම්, ඔවුන් ලංකාවේ සිටින ඔවුන්ගේ නෑදෑයෙකුට කියලා හෝ මේ කාර්යාලවලට ගිහිල්ලා හෝ සෑහෙන කාලයක් ඒ සඳහා මිඩංගු කරලා තමයි ඒ සහතික පත් ලබා ගැනීමේ හැකියාව තිබුණේ. නමුත් අපි දැන් ඒ කටයුත්ත ඩිජිටල්කරණය කරලා තිබෙනවා. විදේශ රටවල තිබෙන ලංකාවේ තානාපති කාර්යාලයක් හරහා ඕනෑම වේලාවක ඔවුන්ට ඒ සහතික පත් කිසිම කරදරයකින් තොරව දැන් ලබා ගන්න පුළුවන්. මේ සේවාව හරහා මාසයකට සහතික පත් 1,000 - 1,500ක් අතර ප්‍රමාණයක් පිටරට සිටින අපේ ශ්‍රී ලාංකිකයන්ට දැන් නිකුත් කරනවා. මේ සහතික පත් නිකුත් කිරීම හරහා ඇමෙරිකානු ඩොලර් 15,000ක වාගේ ප්‍රමාණයක් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව දැනට උපයා ගන්නවා.

ඒ වාගේම තමයි ජනාධිපති අරමුදලත් අපි ඩිජිටල්කරණය කරලා තිබෙනවා. ඒ හරහා අපේ ජනතාවට, විශේෂයෙන්ම දුෂ්කර පළාත්වල ඉන්න ජනතාවට කොළඹට එන්නේ නැතුව ඔවුන්ට ආසන්නයේම තිබෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ඔවුන්ගේ අයදුම් පත් ලබාදීමටත්, ඒවායේ තත්ත්වය පරීක්ෂා කිරීමටත් අපි හැකියාව ඇති කරලා තිබෙනවා. ඒකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ, අපේ ජනතාවට පහසුවෙන් මේ රජයෙන් ලබා දෙන සේවාව ලබා ගැනීමේ හැකියාව ඇති කරන්නයි. ඒ වාගේම කාලය, මුදල් නාස්ති කරන්නේ නැතුව ඒ සේවාවලට ඔවුන්ට ප්‍රවිෂ්ට වීමේ හැකියාව ඇති කිරීමයි.

අපි දන්නවා, ශ්‍රී ලංකාවේ රූපවාහිනී විකාශය ආරම්භ වුණේ 1979 බව. දැනට අවුරුදු 46කට ඉස්සෙල්ලා තමයි මේ සේවාව ආරම්භ වුණේ. නමුත් මේ වෙනකම්ම ඒ සේවාව එදා පටන් ගත්ත ඒ තාක්ෂණයෙන් ඉදිරියට ගිහිල්ලා තිබුණේ නැහැ. ඔය වෙන වෙන satellite මාර්ගයෙන් එන විකාශන ක්‍රියා commercial විධියට ඇවිල්ලා තිබුණත්, අපේ ජාතික රූපවාහිනී විකාශය ගත්තොත්, යල් පැනගිය PAL කියන තාක්ෂණයයෙන් යුක්ත analogue broadcasting තමයි අදත් තිබෙන්නේ. මීට ඉස්සෙල්ලා මේක ඩිජිටල්කරණය කරන්න projects ගණනාවක් ඇවිල්ලා තිබෙනවා. නමුත් එක එක දේශපාලන හේතු නිසා, එක එක දේශපාලන කාලවල එකිනෙකට පරස්පර විවිධ තීරණ ගැනීම නිසා මේ කටයුත්ත 2014 සිට එහාට මෙහාට තල්ලු වෙලා කිසිම විධියකින් ඉස්සරට ගියේ නැති තත්ත්වයක් තමයි අපි බලයට එනකොට තිබුණේ. අපි බලයට පැමිණියාට පසු මේ අවුරුද්ද ඇතුළත මේ සේවාව ඩිජිටල්කරණය කිරීම සඳහා ජපානයේ JICA එක සමඟ ඉස්සරහට යන digital TV programme එක ආරම්භ කළා. ඒ හරහා අපි බලාපොරොත්තු වෙනවා, තව අවුරුදු 3ක් වාගේ කාලයක් ඇතුළත ලංකාවේ TV සේවාව සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය කරන්න. එතකොට අපේ ජනතාවට antenna එක එහාට මෙහාට කරකවමින් තිත් ගොඩක් එක්ක නරඹනවා වෙනුවට, High Definition - HD quality එකෙන් රූපවාහිනිය නැරඹීමේ අවස්ථාව ලැබෙනවා. ඒ හරහා අපේ ජනතාවට හොඳ රූපවාහිනී සේවාවක් ලබා දෙන්න අපට පුළුවන් වෙනවා.

අපේ රටේ තිබෙන මේ spectrum space එක ගොඩක් නාස්ති වෙලා තිබෙනවා, රූපවාහිනී නාළිකා මේ spectrum space එක analogue විධියට පාවිච්චි කිරීම හරහා. නමුත් digital TV programme එකට ගියාට පසුව 700 megahertz කියන spectrum space එකේ විශාල spectrum space එකක් නිදහස් කර ගන්න අපට පුළුවන් වෙනවා. ඒ අනුව ඒ spectrum space එක භාවිතයෙන් 5G, 6G වාගේ තාක්ෂණයට ගිහිල්ලා විදුලි සංදේශ යටිතල පහසුකම් නවීකරණය කරන්න පුළුවන් වෙනවා. ඒක නිසා තමයි මේ project එක ලංකාවට අත්‍යවශ්‍ය වන්නේ. දැනටමත් පරක්කු වෙලා තිබෙන්නේ. නමුත් මෙය කඩිනමින් පටන් ගත යුතු කාර්යයක්. අපි ඒ කටයුතු ආරම්භ කරලා තිබෙනවා.

ලංකාවේ මිලියන 29.3ක් වාගේ ප්‍රමාණයක් ජංගම දුරකථන සම්බන්ධතා තිබෙනවා. ඒ කියන්නේ අපේ ජනගහනයෙන් සියයට 127කට ජංගම දුරකථන සම්බන්ධතා තිබෙනවා. අපේ රටේ ජනගහනයෙන් මිලියන 12.4කට පමණ අන්තර්ජාල පහසුකම් තිබෙනවා. ඒ කියන්නේ අපේ රටේ ජනතාවගෙන් සියයට 53.6ක ප්‍රමාණයකට අන්තර්ජාල පහසුකම් තිබෙනවා. නමුත් අපට පෙනෙන විධියට මෙතැන තවම gap එකක් තිබෙනවා. මොකද, අන්තර්ජාල පහසුකම් ලබා දිය යුතු, ජංගම දුරකථන සම්බන්ධතා ලබා දිය යුතු තවත් ජනතාවක් අපේ රටේ ඉන්නවා. ඒ සඳහා තමයි අපි "ගමට සන්නිවේදනය" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ. ඒ තුළින් අපි බලාපොරොත්තු වෙනවා, දුෂ්කර පළාත්වලට, ඒ කියන්නේ ඒ සන්නිවේදන කුලුනු ආවරණය අඩු හෝ නැති කලාපවලට කඩිනමින් නව කුලුනු සම්බන්ධ කර ඒ සන්නිවේදන පහසුකම ඇති කරන්න. අපි ඒ සඳහා වාර්ෂිකව කුලුනු 100ක් හදන්න කටයුතු කර තිබෙනවා. දැන් වෙනකොට අපි නව කුලුනු 74ක් සම්බන්ධ කර තිබෙනවා. තවත් කුලුනු 18ක් ඉදි කිරීමට නියමිතව තිබෙනවා. මේ කටයුත්ත ඒ විධියට කරන ගමන්, අපි ADB වාගේ ආයෝජන ආයතන වලටත් කථා කරනවා. අපේ රටේ ජනතාවට සන්නිවේදන පහසුකම් සලසා දීම සඳහා කුලුනු 800ක් වාගේ ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. වාර්ෂිකව කුලුනු 100 බැගින් හදන්නේ නැතුව එකවරම ඒ කුලුනු 800ම ලංකාවට ලබා ගැනීම සඳහා අපි ආයෝජන සමාගම්වලට කථා කරනවා. ඒ හරහා ඉතා නුදුරු අනාගතයේම මුළු ලංකාව තුළම සන්නිවේදන පහසුකම් ඇති කරලා, ඩිජිටල් යටිතල පහසුකම් ලබා දීමටත් අපට හැකියාව ලැබෙයි. ඒ වාගේම ගම්බද පළාත්වල සිටින දූවා දරුවන්ට පවා නව තාක්ෂණයට ප්‍රවිෂ්ට වෙන්න අවශ්‍ය අවකාශය ඇති කර ගන්නත් අපට පුළුවන් වෙයි.

ඒ වාගේම තමයි, "ගමට සන්නිවේදනය" ව්‍යාපෘතිය වෙනුවෙන් හදන නව කුලුනු සඳහා වන බද්ද වසර 5කට අහෝසි කර තිබෙනවා. ඒ හරහා අපි දිරිමත් කරනවා, ඒ කුලුනු සඳහා ආයෝජනය කරන අපේ දුරකථන සමාගම්. මොකද, ආයෝජනය කරන්න ඒ අවකාශයත් අවශ්‍යයි. ඒ වාගේම ඒකට අවශ්‍ය පහසුකම් සැලසීම මඟින් සහ පිරිවැය අඩු කිරීම හරහා අපට ඒ ආයෝජන අවස්ථා ලබා ගන්නත් පුළුවන් වෙයි.

අනෙක් කාරණාව තමයි මේ කුලුනු ගම්බද පළාත්වල ඇති කරන්න ගියාම, ආයතන විශාල ගණනකින් අවසර ගන්න ඕනෑ. එසේ අවසර ගැනීමටත් මේ සමාගම්වලට මාස 6ක්-8ක් වාගේ සෑහෙන කාලයක් වැය කරන්න වෙනවා. ඒකත් සෑහෙන ප්‍රශ්නයක්. ඒ නිසා අපි මේ සියලු ආයතන ඒකාබද්ධ කරලා single window එකක් ක්‍රියාත්මක කරන්න කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ හරහා අපට පුළුවන් වෙයි, මාස 3ක්-4ක් වාගේ කාලයක් ඇතුළත අවශ්‍ය සියලු අනුමැතිය ලබා ගන්න. ඒ තුළින් මේ කුලුනු ඉතා ඉක්මනින් ස්ථාපිත කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නත් අපට හැකියාව ලැබෙයි.

ඒ වාගේම අපි අන්තර්ජාල පහසුකම් නැති පාසල් 687කට වැඩි ප්‍රමාණයකට සයිබර් සම්බන්ධතා ඇති කර තිබෙනවා.

ඒ හරහා පාසල් මට්ටමේ සිදුවන ඩිජිටල්කරණ වෙනසත් එක්ක අධ්‍යාපනයට ඩිජිටල්කරණය ළඟා කර දෙන්න, ඩිජිටල්කරණය හරහා දුරස්ථ අධ්‍යාපනය සඳහා අවස්ථාව ලබා දෙන්න, smart boards ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සම්බන්ධතාව ලබා දෙන්න අපි අපේ අමාත්‍යාංශයෙන් අවශ්‍ය යටිතල පහසුකම් ලබා දෙන්න කටයුතු කරනවා. ඒ වාගේම ඒ කුලුනු සාදන්න private අංශයට බලපත්‍ර දෙකක් ලබා දීලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ කුලුනු ඉක්මනින්ම හදන්න අවශ්‍ය සහයෝගය ලබා දෙන්න.

තවත් කාරණයක් තමයි අඩු ආදායම්ලාභී පවුල්වල සිසු සිසුවියන්ට broadband තාක්ෂණය හරහා අධ්‍යාපනය ලබන්න අවශ්‍ය internet පහසුකම් ලබා දෙන්න, broadband vouchers ලබා දෙන්න මෙවර අය වැයෙන් අපි යෝජනා කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Eranga Weeraratne, you have two more minutes.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weerarathna)
ඒ මඟින් අපි බලාපොරොත්තු වෙන්නේ, කොළඹට පමණක් සීමා නොකර ගමේ දුප්පත් පවුල්වල සිසු සිසුවියන්ටත් ඒ නව තාක්ෂණය ඔස්සේ අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සලසා දීමටයි.

ඒ වාගේම දැන් අපි 5G සම්බන්ධතා ලබා දෙන්න 5G auction එක කරනවා. ලබන දෙසැම්බර් 23 වැනි දා වෙනකොට අපි බලාපොරොත්තු වෙනවා, මේ රටේ ඉතිහාසයේ විශාලම වෙන්දේසිය සිද්ධ කරන්න. ඒ කියන්නේ රජයට රුපියල් බිලියන 9කට අධික ආදායමක් ගෙනෙන වෙන්දේසියක් කරලා, 5G spectrum space එක auction කරලා, ටෙලිකොම් සමාගම්වලට 5G සේවාව ආරම්භ කරන්න අවස්ථාව ලබා දෙන්න අපි කටයුතු කරනවා. එහිදී අපි විශේෂයෙන්ම අවධානය යොමු කරනවා, අපේ තිබෙන කුඩා ටෙලිකොම් සමාගම් පවා ආරක්ෂා වන විධියට ඒ යටිතල පහසුකම් එක එක operatorsලා අතර හුවමාරු කර ගන්න අවස්ථාව ඇති කරන්න. ඒ හරහා දැනට තිබෙන ටෙලිකොම් සමාගම් තුනම ආරක්ෂා කරන ගමන්, ඒ සමාගම් තුන හරහා අපේ පාරිභෝගිකයන්ට 5G තාක්ෂණය ඔස්සේ නව සේවාවන් ලබාදීමට අපට පුළුවන් වෙයි. ඒ හරහා ඉතා කාර්යක්ෂම ටෙලිකොම් සේවාවක් ලබා ගන්න අපට පුළුවන් වෙයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Eranga Weeraratne, you have additional two minutes.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
Thank you, Hon. Chairman.

අනෙක් එක තමයි, පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ එක් දින සේවාවක් අපි කුරුණෑගල දිස්ත්‍රික්කයේ පටන් ගෙන තිබෙනවා. ඒ හරහා වයඹ පළාතේ සහ උතුරු මැද පළාතේ සිටින අපේ ජනතාවට කොළඹට එන්නේ නැතිව ඒ සේවාව ලබා ගන්න අවකාශය ලබාදී තිබෙනවා. මේක, ජාතික හැඳුනුම්පත ඩිජිටල්කරණය කරන්න යන වැඩ පිළිවෙළේ අතරමැද සන්ධිස්ථානයක්. මොකද, මේ තිබෙන සියලු හැඳුනුම්පත් කාඩ් වෙනුවට ඩිජිටල් හැඳුනුම්පතක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. එම project එක දැන් ක්‍රියාත්මක වෙනවා. ලබන අවුරුද්දේ තුන්වැනි කාර්තුව වන විට පළමුවැනි digital ID එක නිකුත් කරන තත්ත්වය උදාකර ගන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ ඩිජිටල් හැඳුනුම්පත එනවාට විරුද්ධව සමහර පටු දේශපාලන මත තිබෙනවා. සමහර පිරිස් එක එක අංවි අදින තත්ත්වයක් තිබෙනවා. උදාහරණයක් විධියට විමල් වීරවංශ මහතා මීට මාස 2කට ඉස්සෙල්ලා මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළා. කිසිම පදනමක් නැතිව තමයි ඒක ගොනු කර තිබෙන්නේ. එම පෙත්සම කිසිම විභාගයකට ගන්නේ නැතිව නිෂ්ප්‍රභ කිරීම සම්බන්ධයෙන් මම ශ්‍රේෂ්ඨාධිකරණයට ගොඩක් ස්තුතිවන්ත වෙනවා. මොකද, මේක ලංකාවට අත්‍යවශ්‍ය යටිතල පහසුකමක්. ඒ හරහා අපේ තිබෙන හැඳුනුම්පත් සියයට 100ක් නිවැරදිව හඳුනා ගන්න පුළුවන්. ඒ වාගේම, අපේ ජනතාවට රාජ්‍ය සහ පෞද්ගලික අංශය ලබාදෙන ඒ සේවාවන්ට කඩිනමින් ප්‍රවිෂ්ට වෙලා තමුන්ට ඕනෑම තැනක සිට එම සේවාවන් ලබා ගන්න මේ digital ID එක උපකාරී වෙනවා. ඒ සඳහා මේ සේවාවන් තිබිය යුතුයි.

අනෙක් කාරණාව තමයි, ඩිජිටල්කරණය එක්ක ඇති වෙන ඩිජිටල් සේවාවන් ජනතාවට ඉතා ඉක්මනින් හඳුනා ගන්න, ඔවුන්ට ඒවාට ප්‍රවිෂ්ට වෙන්න අපි පිවිසුමක් ඇති කරන්න අවශ්‍යයි. ඒ සඳහා Super App එක අපේ රජයෙන් ආරම්භ කරලා තිබෙනවා. මේකේ ප්‍රසම්පාදන කටයුතු මේ දවස්වල සිද්ධ වෙනවා. ඒ හරහා රජයේ එක එක තැන්වල තිබෙන ඩිජිටල්කරණ වැඩසටහන් ටික එක තැනකට ගෙනැල්ලා, ජනතාවට එක app එකක්, එකම portal එකක් හරහා මේ සේවාවන් ලබා ගැනීමේ පහසුකම් ඇති කරන්න අපට පුළුවන්. මේ හරහා රජයට කරන ගෙවීම් වාගේම තමන්ගේ තිබෙන සහතික පත්, - අපි මොකක් හෝ සේවාවක් ලබා ගන්න ගියාම සහතික පත් මිටියක් අරගෙන යනවා. සමහර සේවාවන් ලබා ගැනීමේදී අපිට ID එකේ සහතික කළ පිටපතක්, උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් ඇතුළු විශාල සහතික පත් ප්‍රමාණයක් අරගෙන යන්න සිදු වෙනවා. දැන් එහෙම කරන්න අවශ්‍ය නැහැ. Super App එක ආවාට පසුව එම සහතික පත් ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් මේ app එකේ ගබඩා වෙලා තිබෙනවා. පුද්ගලයාගේ අවශ්‍යතාව අනුව ඒ සහතික පත් ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන්ම තමන් සේවාව ලබා ගැනීමට යන කාර්යාලයට ලබා දෙන්න ඔහුට පුළුවන්. මේ ක්‍රමවේදය හරහා කාර්යාල කිහිපයකට ගිහිල්ලා තමන්ගේ කාලය නාස්ති කර ගැනීමට අවශ්‍යතාවක් නැහැ. මොකද, මේක ඩිජිටල් ක්‍රමවේදයෙන්ම තමයි ලබා දෙන්නේ. මේක රජය මඟින් ලබා දෙන සහතික පතක්. එම නිසා මේ Super App එක හරහා අපේ රාජ්‍ය සේවාවන් ඉතාමත් කාර්යක්ෂම කරන්න පුළුවන්.

අනෙක් එක තමයි, මේ ඩිජිටල්කරණ සේවාවන් කඩිනම් කිරීමට අපි GovTech ආයතනය ස්ථාපිත කර තිබෙනවා. මේ ආයතනයට අපේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් දැනටමත් රුපියල් මිලියන 300ක් ලබාදීලා තිබෙනවා. ඒ වාගේම, මේ වසර අවසාන වන විට තවත් රුපියල් මිලියන 1,700ක් මේ ආයතනයට ලබා දීලා, මේ ඩිජිටල්කරණ කටයුතු කාර්යක්ෂම කරන්නත් අපි කටයුතු කරගෙන යනවා.

අනෙක් කාරණය තමයි, අපි ප්‍රසම්පාදනය කියන එක ලංකාවේ නවීකරණය කරන්න ඕනෑ. මොකද, ඩිජිටල්කරණයට යනකොට මේ ඩිජිටල් පද්ධති ගන්නට නම් ඒකට ඔබින ප්‍රසම්පාදන මාර්ගෝපදේශ තිබිය යුතුයි. දැනට තිබෙන මාර්ගෝපදේශ අපේ construction වාගේ පැත්තකට ගැළපෙනවා වුණාට, මේ ඩිජිටල්කරණ ප්‍රසම්පාදන කිරීමට යෝග්‍ය වෙන්නේ නැහැ. ඒ නිසා අපි ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව එක්ක සාකච්ඡා වට

[ගරු එරංග වීරරත්න මහතා]

විශාල ප්‍රමාණයක් තිබ්බා. ඒ හරහා අපි නව ඩිජිටල්කරණ ප්‍රසම්පාදනයටම නිශ්චිත වූ අලුත් මාර්ගෝපදේශ සංග්‍රහයක් ගෙනෙන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, ඩිජිටල්කරණ ප්‍රසම්පාදනය සඳහා අතරමැදි ස්තරයක් හදන්න මේ රජයට අවශ්‍යයි. ඒක හරහා අපට පුළුවන්, ඉක්මනින් ව්‍යාපෘති ආරම්භ කරන්න. දැන් වාගේ ව්‍යාපෘතිවලට මාස ගණනාවක් බලාගෙන ඉන්නවා වෙනුවට ඉතා ඉක්මනින් කරන ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ඔස්සේ කඩිනම් ව්‍යාපෘතිවලට අපට යන්න පුළුවන්.

අපි සැප්තැම්බර් මාසය ඩිජිටල් ආර්ථික මාසය ලෙස නම් කළා. ඒ හරහා අපේ startupsවලට, නවෝත්පාදනයට සහ ව්‍යාපාර ආරම්භයට අවශ්‍ය, දිරිගන්වන ecosystem එක ඇති කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒකෙදී විදේශීය ආයතන මේ රටට ඇවිල්ලා අරමුදල් ස්ථාපිත කරන වැඩ පිළිවෙළකට යන්න අපි එක්ක කථා කරගෙන තිබෙනවා. ඒකට අවශ්‍ය නීති සහ රෙගුලාසි සැදීමත්, ඒ ස්ථාපිත කරන අරමුදල්වලට ලංකා රජය මැදිහත් වෙලා ආරම්භ කරන අරමුදලක් - fund of funds එකක් - create කරන්න අපි යෝජනා කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Eranga Weeraratne, you have exhausted your additional time too.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
Hon. Chairman, please give me 30 seconds. I will finish up my speech.

ඒ සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1,500ක් වෙන් කරලා තිබෙනවා. ඒ තුළින් නවෝත්පාදනය සඳහා මේ රටේ ව්‍යවසායකයන් දිරිමත් කරන්න අපට පුළුවන් වෙයි. ඒ වාගේම අපේ ව්‍යවසායකයන් පිට රටවලට නොයා මේ රටේම ඉඳගෙන ආයෝජන අවස්ථා ඇති කිරීම හරහා අපේ රටේ නිෂ්පාදනය වන අලුත් products and services ලංකාවේම තියා ගන්නත්, එය ලංකාවේ ආර්ථිකය වැදගත් තැනකට ගෙන යෑම සඳහා උපයෝගී කර ගන්නත් අපට පුළුවන් වෙනවා. එවැනි ඩිජිටල් වැඩසටහන් දැවැන්ත ප්‍රමාණයක් අපි ආරම්භ කර තිබෙනවා. අපි ඒ වෙනුවෙන් පසුගිය අවුරුද්ද ඇතුළත හොඳ ස්ථාවර අඩිතාලමක් දමා තිබෙනවා. එතැන් සිට මෙම වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යමින්, 2026 වසර සඳහා වූ අය වැයෙන් අපට වෙන් කර දී තිබෙන මුදල් උපරිම වශයෙන් යොදාගෙන අපේ රට බලාපොරොත්තු වන ඩිජිටල් ආර්ථික වර්ධනය කරා යනවා. 2030 වනකොට බිලියන 15ක ඩිජිටල් ආර්ථිකයක් කරා ගමන් කරන්න තමයි අපේ බලාපොරොත්තුව. එය ළඟා කර ගන්න අවශ්‍ය සියලු කර්තව්‍ය කරන්න අපේ රජයත්, මගේ අමාත්‍යාංශයත් සූදානමින් ඉන්නවා. ඒකට සියලුදෙනාගේ සහාය ලබා දෙන්න කියා ඉල්ලමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Rohitha Abeygunawardhana. You have 18 minutes.

[පූ.භා. 11.14]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු සභාපතිතුමනි, අද දවසේ විවාද කරන වැය ශීර්ෂ අතරින් ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන මම කථා කරන්න ගන්න කලින් වත්මන් ජනාධිපතිතුමා ජනාධිපතිවරණයට පෙර, ජනාධිපති අපේක්ෂකයකු හැටියට ධීවර ජනතාව වෙනුවෙන් කළ කථාවක කොටසක් මම දැන් ගරු සභාවට ඉදිරිපත් කරනවා.

එදා එතුමා මෙහෙමයි කිව්වේ. "මම එක ධීවරයෙකුගෙන් ඇහුවා, ඔබ වසරකට බහුදින යාත්‍රාවේ කී දවසකට මුහුදේ යනවාද කියලා. ඔවුන් කිව්වා, අවස්ථා 10ක යනවා. ඒ කියන්නේ, මාස 10ක් මුහුදේ. මාස දෙකයි ගෙදර ඉන්නේ. බිරිඳ කිව්වා, ඉතින් ඉතුරු දෙකත් මුහුදට වෙලා හිටියා නම් ඉවරයි නේ කියලා".

ඊළඟට එතුමා කියනවා, "සාමාන්‍යයෙන් මුහුදු ගිහින් කරන දේ තමයි, කොට කැබැල්ලක් හොය හොයා යනවා. මුහුදේ අපද්‍රව්‍යවලට ආපු ඒ කොට කැබැල්ලේ දිය සෙවෙල බැඳෙනවා. ඒවා කන්න කුඩා මාළු එනවා. ඒ කුඩා මාළු කන්න විශාල මාළු එනවා. ඒ මාළු කන්න තව මාළු එනවා. ඒ කොට කැබැල්ල සම්බන්ධ කරගෙන මාළු ජනපදයක් හැදෙනවා. ධීවරයා මොකද කරන්නේ? ඉමක් කොනක් නැති මේ මහ මුහුදේ කොට කැබලි හොය හොයා ගිහින් මාළු අල්ලන්න උත්සාහ කරනවා. ලජ්ජා වෙන්න ඕනෑ පාලකයෝ. ලජ්ජා වෙන්න ඕනෑ පාලකයෝ මේ අපේ රටේ."

ඒ ජනාධිපතිතුමා කියපු කථාව. අපි කියපු කථාවක් නොවෙයි. ඊළඟට එතුමා කියනවා, "ඉන්දියාවේ සෑම ධීවර වරායකම පාන්දර 4 වෙනකොට තිරයක් දිස් වෙනවා. ඒකේ වැටෙනවා, මාළු ගැවසෙන කලාපය කොහේද, එහි මුහුදේ උෂ්ණත්වය කුමක්ද, රටවල තත්ත්වය කුමක්ද, හුළං හමන දිශාව කවරේද කියලා. ධීවරයෝ ඒක බලලා තමයි මුහුදු යන්නේ. ඒක බලාගෙන මුහුදු යනවා. එතකොට මුහුදේ මාළු ඉන්න තව ස්ථාන දැනුම් දෙනවා. අපි මොකක්ද කරන්නේ බලයට ආවාම? අපි බලයට ආවාට පස්සේ මුහුදේ මාළු ඉන්න තැන ධීවරයාගේ දුරකථනයට SMS එකකින් එවන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා" කිව්වා.

ගරු සභාපතිතුමනි, මේක කිව්වේ වත්මන් ජනාධිපතිතුමා ජනාධිපති අපේක්ෂක හැටියට ඉන්න වෙලාවේ. මේ, ධීවර ජනතාවට දීපු පොරොන්දුව. අද ඔබතුමා පාර්ලිමේන්තුවේ ඉන්න වෙලාවේ ධීවර ජනතාව වෙනුවෙන් අපට මේවා මතක් කරන්න වෙනවා, ගරු ධීවර ඇමතිතුමනි. දැන් මේක වෙනවාද? දැන් ධීවරයාගේ phone එකට මේ SMS පණිවුඩය යනවාද? යනවා නම් අන්න අපට කියන්න, මෙන්න මේ අහවල් ධීවරයින්ට මේ පණිවුඩය ගියා; අහවල් වරායේ බහුදින යාත්‍රාව තිබෙන අයට මේ SMS පණිවුඩය යැව්වා කියලා. මාළු ඉන්න තැන කියනවා කිව්වා, මුහුදේ රළුභාවය කියනවා කිව්වා. දැන් මේවා කියනවාද කියලා අපට කියන්න. එහෙම SMS පණිවුඩ ධීවරයින්ට යන්නේ නැහැ. මේවා අමූලික බොරු. මෙහෙම දෙයක් වෙන්නේ නැහැ. මේවා කියලා තමයි මිනිස්සු ඇන්දුවේ. අපි හිතුවා, ගොවියා විතරයි ඇන්දුවේ කියලා. නැහැ, ගොවියා විතරක් නොවෙයි නේ, දැන් ධීවරයාවත් අන්දලානේ. ධීවරයා ඇන්දා. ගරු සභාපතිතුමනි, ලංකාවේ ධීවර ක්ෂේත්‍රයේ ඉන්න අයගෙන් සියයට 90ක් ඡන්දය දුන්නේ මාලිමාවට. මේවා බලලා ඡන්දය දුන්නා. මේවායෙන් යුතුකම ඉටු කරගන්න පුළුවන්, අපට පසුගිය ආණ්ඩු කාලයේ වෙච්ච නැති දේවල් කරගන්න පුළුවන් කියලා ඔවුන් හිතුවා. ධීවරයා, ගොවියා, කම්කරුවා, රාජ්‍ය සේවකයා කියන ඔක්කෝම දැන් ඇන්දිලා ඉවරයි.

මම මේ ආණ්ඩුවට යෝජනාවක් ඉදිරිපත් කරනවා. ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුවේ අපි එක්කත් කාලයක් හිටියා නේ. අපි එකට හිටියේ, මතකයි නේ. කරට අත දාගෙන ඇවිල්ලා, 2004දී ආණ්ඩුවක් හදලා, තමුන්නාන්සේලා අපි එකට හිටියේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා බහුදින ධීවර යාත්‍රා හිමියන් ගැන මම කියන මෙන්න මේ කාරණා ගැන බලන්න. මේ කියපු දේ දැන් වෙන්නේ නැහැ නේ. මේක බොරුවක් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඩීසල් ලීටර් 6,000ක් ගහන බහුදින යාත්‍රා තිබෙනවා. බහුදින යාත්‍රාවකට සාමාන්‍යයෙන් ඩීසල් ලීටර් 6,000ත් 10,000ත් අතර ගහන්න ඕනෑ. බහුදින ධීවර යාත්‍රාවකට ඩීසල් ලීටර් 6,000ක් ගහනවා කියලා හිතමු. ඩීසල් ලීටරයක් රුපියල් 277යි. එතකොට ඩීසල් ලීටර් 6,000ක් ගහන්න රුපියල් 1,662,000ක් යනවා, මුළු වියදම. කෑම වියදම යනවා, රුපියල් ලක්ෂ 3ක්. අයිස්වලට යනවා, - අයිස් කියන්නේ, අර මත් වෙන්න ගහන අයිස් නොවෙයි, අයිස් කැට - රුපියල් ලක්ෂ 2ක්. අමතර වියදම්වලට රුපියල් ලක්ෂයක් වෙන් කළාම රුපියල් ලක්ෂ 22ක්, 23ක් යනවා, බහුදින ධීවර යාත්‍රාවක් මුහුදු යවන්න. ඒගොල්ලන්ගේ භාෂාවෙන් කියනවා නම්, රස්සාවේ යවන්න රුපියල් ලක්ෂ 22ක්, ලක්ෂ 23ක් යනවා. මෙහෙම මුහුදු යන ධීවරයින් මුලින්ම මොකක්ද කරන්න ඕනෑ? ගරු සභාපතිතුමනි, මුලින්ම කරන්න ඕනෑ, මේ ලක්ෂ 22, 23 හම්බ කරන එක. මුලින්ම මාළු අල්ලා මේ වියදම - ඩීසල් වියදම, අයිස්වලට යන වියදම, කෑම වියදම - පැත්තකින් අයින් කරන්න ඕනෑ. එතකොට රුපියල් ලක්ෂ 25ක් අයින් කරන්න ඕනෑ. රුපියල් ලක්ෂ 25 අයින් කරලා තමයි ලාභයක් ගේන්න තිබෙන්නේ, ඒ යාත්‍රාවේ යන මිනිස්සුන්ට. ඕනෑ නම් ඒ යාත්‍රාවේ උපරිම හයදෙනෙක් යාවි. ඒ හයදෙනාටයි, යාත්‍රාව අයිති මුදලාලිටයි මුදල් වෙන් කරන්න වෙන්නේ ඊට පස්සේ.

ගරු ඇමතිතුමනි, දැන් අර ඔබතුමන්ලා කියපු මාළු ඉන්න තැන හොයාගන්න යවනවාය කියපු SMS පණිවුඩයත් එන්නේ නැති නිසා, රුපියල් ලක්ෂ 22ක් වියදම් කරලා, අර ජනාධිපතිතුමා කියපු විධියට ඔවුන් යන්නේ අයාලෙ. ඔවුන් කොට හොය හොයා යනවා. කොට හොය හොයා ගිහින් කොටයක් හමු වුණේ නැහැයි කියමුකෝ. කොටයක් හමු වුණේ නැති වුණාම මොකද කරන්නේ? කොටයක් හමු වුණේ නැති වුණාම ආපහු එනවා, මාළු නැතුව. බහුදින යාත්‍රා හිමියා රුපියල් ලක්ෂ 25ක් ණයයි. තුන් වතාවක් තෙල් පොල්ල කැවොත් රුපියල් ලක්ෂ 75යි, ධීවර යාත්‍රාව ගැට ගහලා තියන්න ඕනෑ වරායේ. මම ඔබතුමාට යෝජනා කරනවා, ඔබතුමා ධීවර ඇමති හැටියට මේක ඉල්ලන්න කියලා. මොකක්ද ඉල්ලන්න තිබෙන්නේ? ඔබතුමන්ලාම කිව්වා නේ, ඩීසල් ලීටරයකින් හිටපු ඇමති කංචන විජේසේකර රුපියල් 150ක් ගැහුවා කියලා. දැන් අවුරුද්දකුත් ඉවරයි නේ. දැන් ගහන්න බැහැ නේ. අර කංචන විජේසේකර ගහපු රුපියල් 150 දැන් නවත්වා තිබෙනවා, කරුණාකර ඒ රුපියල් 150 ධීවරයින්ට දෙන්න කියලා දැන් මම යෝජනා කරනවා. අන්න එතකොට ධීවරයාට ප්‍රමාණවත් සහනාධාරයක් ලැබෙනවා. අවසානයේදී මේ රටේ මාළු කන මිනිස්සුන්ටත් මේ සහනය ලැබේවි. ඒ, එක යෝජනාවක්.

ගරු ඇමතිතුමනි, බහුදින ධීවර යාත්‍රාවල යන මිනිස්සුන්ගේ කෑම වියදම අඩු කර ගන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් හදන්න - පොළොවේ පැළ වෙන විධියේ වැඩ පිළිවෙළක්. එක පාරටම ඉර ගෙනැත් දෙනවා, හඳ ගෙනැත් දෙනවා කියලා අවසානයේදී ඒවා නොලැබුණාම මොකද කරන්නේ? ධීවරයා කියන කෙනා එක්ක සෙල්ලම් කරන්න බැහැ. හරි අමාරුයි, බේරාගන්න. මුහුදත් එක්ක ඉඳලා ඉඳලා ඇහෙනවාත් අඩුයි. මල පනිනවා, ඒගොල්ලන්ට. සද්දෙත් වැඩියි. ඒ, මල පනින හින්දා. ඒ නිසා මම තමුන්නාන්සේට යෝජනා කරනවා, මෙන්න මේ වියදම් ටික අඩු කරන්න උදව් වෙන්න කියලා. ගරු ඇමතිතුමනි, තවත් තිබෙනවා, වියදම අඩු කළ හැකි දේවල්. ගරු ඇමතිතුමනි, ධීවර ආම්පන්නවල මිල අද වන විට සියයට සියයකින් වැඩි වෙලා. බිලී කටුවල මිල වැඩි වෙලා, දැල්වල මිල වැඩි වෙලා. ඒ වාගේම ඔවුන්ට ගෙවන්න තිබෙන ණයත් වැඩි වෙලා. මේ හැම දෙයක්ම වැඩි වෙලා. ඒක තමුන්නාන්සේගේ වරදක් නොවෙයි. හැබැයි, තමුන්නාන්සේට කරන්න යමක් තිබෙනවා.

ගරු ඇමතිතුමනි, අපේ ආණ්ඩුව තිබුණු කාලයේ ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා VMS එක දුන්නේ නොමිලේ. එදා නොමිලේ දුන් VMS එකක් අද කීයද? රුපියල් ලක්ෂ 10ක් වෙනවා, ගරු සභාපතිතුමනි. උතුරු-නැගෙනහිර ධීවර ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේ ඉන්නවා. ඒ ජනතාව රුපියල් ලක්ෂ 10ක් VMS එකකට වියදම් කරන්නේ කොහොමද? වියදම් කරන්න අමාරුයි. මේ, කලින් නොමිලේ දීපුවා. මේ එක පැත්තක්. අනෙක් පැත්තෙන් වෙන්නේ මොකක්ද, ගරු ඇමතිතුමනි. Icom රේඩියෝ යන්ත්‍රය එදා තිබුණේ රුපියල් ලක්ෂ දෙකට. දැන් රුපියල් ලක්ෂ හතහමාරයි. මම ඇමතිතුමාගෙන් අහනවා, ඇයි මේක ආනයනය කරන්න එක මහත්තයෙකුට, මහත්වරුන් දෙන්නෙකුට දෙන්නේ කියලා.

ගරු ඇමතිතුමනි, මේක දෙන්න ධීවරයාට. ධීවරයින් කියන්නේ හැම දාම වැල්ලේම ඉන්න ඕනෑ මිනිස්සු නොවෙයි. ධීවරයා කියන්නේ මේ රටට විශාල ආදායමක් සපයන, මේ රටේ මිනිස්සුන්ට බතට මාළු කෑල්ලක් දෙන මනුස්සයා. ඒ, හොඳ උගත්, බුද්ධිමත් අය. ඔවුන්ගේ දරුවනුත් හොඳට ඉගෙන ගන්නවා. ඒ දරුවන්ට පුළුවන්, මේ කියන යන්ත්‍ර ටික ආනයනය කරන වැඩ පිළිවෙළ හදන්න. ඔවුන්ට ඒ වැඩ පිළිවෙළ හදන්න පුළුවන් නම්, කරුණාකරලා ඒක ආනයනය කිරීමේ අවස්ථාව ඒ ධීවරයින්ට දෙන්න. ඇයි මේක මහත්තයෙකුට දෙන්නේ? ඇයි මේක මුදලාලි කෙනෙකුට දෙන්නේ? තමුන්නාන්සේලා ආවේ එහෙම කටයුතු කරන්න නොවෙයි නේ? අපි ආණ්ඩු කරන කාලයේ අපේ නෑ හිතමිතුරන්ට තමයි කොන්ත්‍රාත් එක දුන්නේ, අරක දුන්නේ, මේක දුන්නේ කියලා ඔබතුමන්ලා කිව්වානේ. තමුන්නාන්සේලා එහෙම කියලායි බලයට ආවේ. තමුන්නාන්සේලා විශ්වාස කරලා ජනතාව බලය දුන්නා. කරුණාකරලා ධීවරයාගේ ආම්පන්න මේ රටට ආනයන කර ගන්න ඔවුන්ට අවසරය දෙන්න. මාළු ඉන්න තැන හොයා ගන්න වුවමනා කරන ටැබ්ලට් එක දෙන්න බැරි වුණත්, අඩුම ගණනේ මේක හරි ඔවුන්ට ලබා දේවිනේ. ඒ ගැජට් එක ලබා දෙන්න බැරි වුණත්, මේ අවස්ථාව හරි ඔවුන්ට දෙන්න කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, මම අද උදේ බේරුවල ධීවර වරාය බලන්න ගියා. වැල්ලේ කෙළවල්ලා කිලෝව රුපියල් 1,100යි. බලයා කිලෝව රුපියල් 900යි. ලින්නා කිලෝව රුපියල් 550යි. බෝල්ලෝ කිලෝව රුපියල් 450යි. මේ, මේ රටේ ජනතාව වැඩිපුර කන මාළු. රාජ්‍ය නිලධාරින් රැඳී සිටින කුටියේ සිටින ධීවර අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරුනුත් වැඩියෙන්ම කන මාළුන්ගේ ගණන් මිනුම් ගැනයි මම කිව්වේ. ගරු ඇමතිතුමනි, මතක තියා ගන්න, මේ වැල්ලේ තිබෙන ගණන් කියන එක. වැල්ලෙන් ගන්න මිලට වෙළෙඳ පොළේ මාළු විකුණන්නේ නැහැනේ. කෙළවල්ලා කිලෝව රුපියල් 1,100ට වැල්ලෙන් අරගෙන ඇවිල්ලා ඒ ගණනටම එළියේ විකුණන්නේ නැහැ නේ. මාළු විකුණන මනුස්සයා වැල්ලෙන් මාළු අරගෙන ඇවිල්ලා විකුණන්නේ කිලෝවක් රුපියල් 1500යි, 1,600යි. ග්‍රෑම් 500ක් කපන්නේ රුපියල් 800ට. ඇත්තනේ? බොරු නොවෙයිනේ? දැන් මාළු මිල ඇහුවාම මොකද වෙන්නේ? සෝමාවතී අක්කා මාළු වෙළෙන්දන් නවත්වලා අහනවා, කෙළවල්ලා ග්‍රෑම් 500ක් කීයද කියලා. රුපියල් 800යි කියනවා. ඒක ඇහුවාට පස්සේ සෝමා අක්කාගේ ඇඟේ මාළු නටනවා. මොකද, ඉතින් මාළුවල මිල ඇහුවාම ඇඟේ මාළු නටනවානේ, දෙවි හාමුදුරුවනේ! අද මාළු ග්‍රෑම් 500ක්වත් ගන්න බැහැ. මේකයි ඇත්ත තත්ත්වය. මොකද, මෙහෙම

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

වෙන්නේ? ඇයි මාළු මිල එච්චර ඉහළ මිලකට යන්නේ? ගරු ඇමතිතුමනි, මම මුලින්ම කියපු ඔවුන්ගේ වියදම වන මේ රුපියල් ලක්ෂ 25, රුපියල් ලක්ෂ 30 ඔවුන්ට හොයා ගන්න බැරිවන නිසා ඔවුන් මාළු මිල වැඩි කරනවා. ඒකට අපට කියන්න දෙයක් නැහැ. ඒ නිසා උතුරෙන් බිහි වෙච්ච ධීවර ඇමතිවරයා හැටියට මේ ජනතාව ගැන හිතන්න කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ, ධීවර රස්සාව කියන්නේ ගතානුගතිකව පරම්පරාවලින් එන එකක් බව. ධීවර ක්ෂේත්‍රයේ ඉන්න මේ ධීවර ජන කොට්ඨාසය මේ රට වෙනුවෙන් ලොකු කැප කිරීමක් කරන ජන කොට්ඨාසයක්. ධීවර කර්මාන්තය ආශ්‍රිතව තිබෙනවා, අපේ පාරම්පරික දේවල් ටිකකුත්. ඒ අතරින් එකක්, මාදැල. ගරු සභාපතිතුමනි, මම වැල්ල අයිනේ ඉපදුණු මිනිහෙක්. මගේ තාත්තාත් මාදැලක් හිමි මනුස්සයෙක්. අපි දන්නවා, මේ රස්සාව ගැන. අපි මාළු අස්වැන්න ගන්නකොට ඉතා ගුණාත්මකම මාළු ටික ලැබෙන්නේ මාදැලෙන්. පණ පිටින් මාළු ටික අල්ලා ගන්නේ. ඒක අපේ ධීවර ඇමතිතුමා හොඳට දන්නවා නේ. පණ පිටින් මාළු ටික අල්ලා ගන්නේ. ඊයේ - පෙරේදාත් අපි දැක්කා නේ, බේරුවල ධීවරයින්ට සාවාලයෝ මඩි 6ක් විතර අහු වුණු බව. නැඟෙනහිර, උතුර, බස්නාහිර කියන මේ හැම තැනින්ම පරව් අහු වෙනවා. ලංකාව වටේම තිබෙන මුහුදේ මාස කීයක්ද මේ මාදැල් රස්සාව කරන්නේ?

ගරු සභාපතිතුමනි, ඔබතුමාත් මේවා දැන ගන්න ඕනෑ. ඔබතුමාත් හොඳට මාළු කන මනුස්සයෙක්. ඔබතුමා හොඳට කන බොන මනුස්සයෙක් නේ. මාළු කැල්ලක් කනකොට කන්න ඕනෑ ගුණාත්මකභාවය තිබෙන මාළු. මාදැල් රස්සාව කරන්නේ මාස 4, 5යි. ඒ කියන්නේ, දේශගුණයත් එක්ක මාදැල් රස්සාව මාස 12ම කරන්න බැහැ. ඒකෙනුත් ඕනෑ නම් මාස තුනහමාරක්, හතරක් මාදැල් රස්සාව කරයි. ඉස්සර මාදැලක් අදිනකොට එක ඇලයකට අපි කියන්නේ ඇල දෙකයි කියලා, ගරු සභාපතිතුමනි. කඹ දෙකක් දමනවා. එක ඇලයකට දෙසීයක් විතර මාදැලේ එල්ලිලා, "හේ හයි", "හේ හයි" කිය කියා අදිනවා. දැන් ඒ මිනිස්සු ඉන්නවාද? දැන් ඒ මිනිස්සු නැහැ නේ, ගරු සභාපතිතුමනි. දැන් මාදැල් අදින්න මිනිස්සු නැහැ. මිනිස්සු වෙන රස්සාවල් හොයාගෙන ගිහිල්ලා. පරම්පරාගත, ගතානුගතික මිනිස්සු ටික විතරක් දැලේ එල්ලිලා ඉන්නවා. ඒත් දැල ඇද ගන්න බැහැ. ඇයි, ඒ? කසිප්පු ගහලා, බීඩියක් ගහලා, ගංජා පොඩ්ඩක් ගහලා ඔය දැලේ එල්ලි එල්ලී ඉන්නවා. ඒ අය ටික විතරයි ඉන්නේ.

දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මාදැල් හිමියන් කල්පනා කළා, මේකට ක්‍රමවේදයක්. ඒ ක්‍රමවේදය තමයි, "වින්ච්" එක භාවිත කිරීම. පසුගිය කාලයේ මේ වින්ච් එකට අවසර පත්‍ර දුන් ඒවා තිබෙනවා. කවුරු හරි නැහැ කියනවා නම් ඒක කියන්න. වින්ච් එක භාවිත කරනවා. එහෙනම් දෙවියනේ, වී ගොවිතැන කරනකොට ඉස්සර හරක් දාලා නේ කුඹුරු මැඩෙව්වේ. තවමත් හරක් දාලා මඩවනවාද? සමහර ගම්වල තවමත් එහෙම තිබෙනවා ඇති. හැබැයි, දැන් ට්‍රැක්ටර් දාලා නවීන තාක්ෂණය තමයි උපයෝගී කරගෙන ඒ කටයුතු කරන්නේ. දැන් කරන්නේ වින්ච් උපකරණ සවි කළ ට්‍රැක්ටර් යොදාගෙන ඉන්න සේවකයින් පොඩි ප්‍රමාණයක් එකතු කරගෙන දැල හෙමිහිට අද්දවා ගන්න එකයි. ඒකෙන් වැරදි දෙයක් වෙනවා නම් වහාම ඒක නවත්වන්න. ඒ වින්ච් එක දාලා, ට්‍රැක්ටර්වලින් අරගෙන අනුන්ගේ ඉඩම්වලට පැනලා, වින්ච් එකෙන් ලෝන් එක ලොකුවට අදිනවා නම් ඒක නවත්වන්න. ඒකට තමයි අමාත්‍යාංශ තිබෙන්නේ. ඒකට තමයි ලංකා ධීවර සංස්ථාව ආදී මේ ඔක්කොම තිබෙන්නේ. වැරදි දෙයක් වෙනවා නම් ඒවා සම්බන්ධයෙන් නීති පනවන්න.

ඇමතිතුමාත් එක්ක ඒ කාරණය ගැන සාකච්ඡා කළා. ඒ මිනිස්සු උද්සෝෂණයකුත් කළා. මේ මාදැල් රස්සාව කරලා පවුල් කීයක් රැකෙනවාද? මාදැල් 1,000ක් විතර තිබෙනවා. මේ මාදැල් රස්සාව කරලා ජීවත් වන පවුල් දහස් ගණනක් ඉන්නවා. එතකොට මේ මිනිස්සුන්ගේ බඩට ගැහුවොත් ඒක හරි යයිද? හරි යන්නේ නැහැ. ඒ නිසා මේ ගැන අවධානය යොමු කරන්න. වැරැදි තැනක් තිබෙනවා නම් නිවැරදි කර ගන්න. දැන් ඒ සඳහා අවශ්‍ය ශ්‍රම බලකාය නැහැ. යම් යම් වෙලාවල්වලදී සමහර හොඳ නිලධාරින් ඉන්නවා; අපි ඒ අය අගය කරනවා. ප්‍රායෝගික දැනුම තිබෙන නිලධාරින් ඉන්නවා; අපි ඒ අයත් අගය කරනවා. හැබැයි, සමහරුන්ට පොතේ දැනුම විතරයි තිබෙන්නේ. පොතේ දැනුමෙන් විතරක් මේවා ගැන හිත හිතා ඉන්නවා. ඒ අය මේවා දැකලාත් නැහැ. මම කියන්නේ මේකට විරුද්ධ වෙන සමහර නිලධාරින් ඉන්නවාය කියන එකයි. ඔවුන් මුහුදේ වතුර ලුණු රසයි කියලාවත් දන්නේ නැහැ. හැබැයි, මාදැල් වට කිරීම සඳහා වින්ච් උපකරණ සවි කළ ට්‍රැක්ටර් යොදා ගන්නවාට ඩෝං ගාලා විරුද්ධ වෙනවා. එතකොට ඒ මිනිහා කන්නේ මොනවාද? ඒ මිනිස්සුන්ට බත් ටිකක් කන්න සල්ලි තිබෙනවාද? නැහැ. ඒ නිසා මේ මාදැල් රස්සාව අපි ආරක්ෂා කර ගන්න ඕනෑ.

විශේෂයෙන්ම මම ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. මේකේ වැරදි කරන තැන් තිබෙනවා නම් ඒවා ඉවත් කරන්න. හැබැයි, මාදැල් රස්සාව නම් මේ රටේ මිනිස්සුන්ගෙන් තුරන් කරන්න එපා. ඔබතුමා ඇහුම්කන් දෙන ඇමතිවරයෙක්. ඒ වෙනුවෙන් අපි ඔබතුමාට ගරු කරනවා. එහෙම ඇහුම්කන් දෙන ඇමතිවරු ඉන්නවා නේ. අපි ඒ අයට ගරු කරනවා. ඒ වාගේම අපිත් එක්ක හිටපු තමුන්නාන්සේ ඇමතිවරයෙකු වීම පිළිබඳව අපි සතුටු වනවා. ඒ නිසා කරුණාකරලා මාදැල් රස්සාව කරන මිනිස්සුන්ට අත තියන්න එපා. වැරැද්දක් කරනවා නම් ඒ වැරැද්ද නිවැරදි කරලා නැවත එය යථා තත්ත්වයට ගන්න කියලා මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

හොඳයි, ගරු සභාපතිතුමනි. ඔබතුමා මාළු කන නිසා මම හිතනවා, ඔබතුමා මට තව විනාඩියක් විතර දෙයි කියලා. මොකද, මේක මාළු සම්බන්ධ ප්‍රශ්නයක් නේ. ගරු සභාපතිතුමනි, අපි මේවා කියන්නේ ඇයි? තමුන්නාන්සේලාට මේවා කිව්වාම කේන්ති යනවා. ඔබතුමාට නොවෙයි. සමහර අයට කේන්ති යනවා. ඉතින්, කේන්ති ගිහිල්ලා හරියනවාද?

මොකක්ද විපක්ෂයේ කාර්ය භාරය? විපක්ෂයේ කාර්ය භාරය තමයි, අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂය දවසේදී ඒ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් හොඳ දෙයක් තිබෙනවා නම් ඒකට හොඳයි කියන එක. මේ ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුද්දයි මාස දෙක තුනක් වුණා. නමුත්, අපි හැම දාම තමුන්නාන්සේලා විවේචනය කළේ නැහැ. ඇයි, අපි එහෙම තමුන්නාන්සේලා විවේචනය කළේ නැත්තේ? අපි තමුන්නාන්සේලාට ගමනක් යන්න දුන්නා. හැබැයි, ගමන ඇද නම්, තමුන්නාන්සේලා ෆේල් නම්, ආණ්ඩුව ෆේල් නම් අපි ෆේල් කියලා කියනවා. ආණ්ඩුවට යන්න බැරි නම් අපට පෙනෙනවා, යන්න බැහැ කියලා.

එක්කෝ තමුන්නාන්සේලා වරද හදා ගනියි. නැත්නම් තමුන්නාන්සේලා ඒ වැරැද්දම කරමින් අපට වැරදුණා වාගේ වරද්දා ගනියි. ඔය දෙකෙන් එකක් නේ වෙන්නේ. මොකද, අපි වරද්දා ගත්ත හින්දා අපට ඒක හොඳට දැනෙනවා. අපි වරද්දා ගත්ත අය; අපි හොඳට වරද්දා ගත්ත අය. ඒක නිසා අපට හොඳට ඒ ගැන දැනෙනවා.

ගරු සභාපතිතුමනි, මම මේ කාරණයත් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ධීවර ඇමතිවරයා හැටියට කටයුතු කළා. ඒ විතරක් නොවෙයි, ජනාධිපති හැටියට දෙවරක් පත් වුණු එතුමා යුග පුරුෂයෙක් හැටියට මේ රටේ ධීවර ක්ෂේත්‍රය වෙනුවෙන්, ධීවර ජනතාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළා. එතුමා "දියවර ගම්මාන" හැදුවා, ගරු සභාපතිතුමනි.

පාර්ලිමේන්තුවේදී දවසක් කෙනෙක් එතුමාගෙන් ඇහුවා, "ධීවරයින් නැති ප්‍රදේශවල දියවර ගම්මාන හදන්නේ ඇයි?" කියලා. මොකක්ද මහින්ද මහත්තයා ඒකට දීපු උත්තරය? මහින්ද මහත්තයා කිව්වා, "මාළු කන හැම කෙනෙක්ම ධීවරයෙක්" කියලා. එහෙමයි මිනිසුන්ට යමක් කරන්න දියවර ගම්මාන හැදුවේ. ඒක නිසා අපි මේ ආණ්ඩුවේ අයට බොහොම පැහැදිලිව මේ කාරණය කියනවා. අපි පරිණත මිනිස්සු හැටියට මේ අවවාද දෙන්නේ. ඒවා ඉගෙන ගන්න.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේලා දැන් ආණ්ඩුව හොඳට කරගෙන යනවා අපි දකිනවා. සමහර වෙලාවට ප්‍රශ්නත් එනවා. සාමාන්‍යයෙන් card pack එකක් ගත්තාම - ගම්වල කියන්නේ බූරු ගහනවා කියලා - ඒ card pack එකටම ජෝකර්ලා දෙකයි තිබෙන්නේ. සමහර වෙලාවට ආණ්ඩුව හොඳට කටයුතු කළත් දැන් ජෝකර්ලා වැඩියි. දවස ගණනේ මොකක් හරි ජෝකර් වැඩක් කරනවා, ගරු ඇමතිතුමනි. තමුන්නාන්සේ නොවෙයි. දවස ගණනේ මොකක් හරි ජෝකර් වැඩක් කරලා අපිව හිනස්සනවා. අපිත් ඒවාට හිනා වෙවී ඉන්නවා. ජෝකර් වැඩ කරන්න නොවෙයි නේ ආණ්ඩුවක් ගත්තේ.

විශේෂයෙන්ම මේ ධීවර ක්ෂේත්‍රය වෙනුවෙන් අපි කියපු කාරණා ඇමතිතුමා සටහන් කර ගන්නවා මම දැක්කා. ඒවා සටහන් කර ගත් විධියට මොන විධියෙන් හරි තමුන්නාන්සේ ධීවර ජනතාව වෙනුවෙන් දුන් පොරොන්දු ඉෂ්ට කරන්න. අපි ඉල්ලන්නේ නැහැ, අලුතින් දේවල්. "අපේ ආණ්ඩුවට කරන්න බැහැ. ඔබට කරන්න පුළුවන්" කියලා භාර ගත් වගකීම් ටික ඉටු කරන්න. ජනාධිපතිතුමා කරපු කථාවේ කොටසක් මම කිව්වා. ඒකත් ඉටු කරන්න කියලා මම ධීවර ඇමතිතුමාගෙන් ඉල්ලනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Thurairasa Ravikaran. You have 15 minutes.

[மு.ப. 11.34]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

வணக்கம், கௌரவ தவிசாளர் அவர்களே!

2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில், போசணையிலும் வேலைவாய்ப்பிலும் உணவுப் பாதுகாப் பிலும் அந்நியச் செலாவணியிலும் அரச வருவாயிலும் குறிப்பிடத்தக்க பங்களிப்பை ஆற்றுகின்ற கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள் அமைச்சுக்கான ஒதுக்கீடுகள் தொடர்பான இன்றைய குழுநிலை விவாதத்தில், வன்னி மாவட்டத்தில் இன்னமும் சீர்செய்யப்பட வேண்டியுள்ள விடயங்கள் தொடர்பாகத் தெரிவிக்க விரும்புகின்றேன்.

ஒவ்வோர் ஆண்டும் மொத்தத் தேசிய உற்பத்தியில் கிட்டத்தட்ட ஒரு சதவீத பங்களிப்பைக் கடற்றொழில் துறை வழங்குகின்றது. இந்த ஆண்டின் தேசிய ஏற்றுமதி வருவாயில், 2.4% பங்களிப்பைக் கடற்றொழில் துறை வழங்கியுள்ளது. இலங்கை வாழ் மக்களின் விலங்குப் புரத உட்கொள்ளலில் 50%க்கும் அதிகமான பங்களிப்பை கடல்சார் உணவுகள் வழங்குகின்றன. இது உலகளாவிய சராசரியில் மூன்று மடங்கு உயர்வாகும். அதைவிட, ஒரு மில்லியனுக்கும் அதிகமான இலங்கையர்கள் நேரடியாகவோ மறைமுகமாகவோ இந்த மீன் வளத்தை வாழ்வாதார மூலமாக நம்பியுள்ளனர். கடலோர மற்றும் ஆழ்கடல் மீன்பிடி, நன்னீர் மீன்பிடி மற்றும் மீன் வளர்ப்பு அனைத்தும் கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள் துறைக்கு முக்கியமான பங்கையாற்றுகின்றன. இருப்பினும், கடற்றொழில் நீரியல் வளங்கள் துறையின் வலிமை சீரற்றது. குறிப்பாக, வடக்கின் கடற்றொழில் கடற்பரப்பில் மிகவும் சீரற்ற அணுகல் காணப்படுகின்றது.

இலங்கையில் கடந்த ஆண்டின் மொத்த மீன் விளைச்சலில் 16% பங்களிப்பை வடகடல் வழங்கியுள்ளதாக, கடற்றொழில் நீரியல் வளத் திணைக்களத்தின் 2024ஆம் ஆண்டின் அறிக்கை சுட்டிக்காட்டுகின்றது. ஆனால், வடகடலின் பங்களிப்பு, அதன் வளநிலையுடன் ஒப்பிடும்போது மிகக் குறைவாகவே உள்ளது. உள்ளூரில் தொடரும் சட்டவிரோத மீன்பிடி முறைகள், எல்லை தாண்டிய இந்திய இழுவைப் படகுகளின் அத்துமீறிய மீன்வளச் சுரண்டல் என்பன வடகடலின் மீன் விளைச்சலுக்குச் சவாலாகும் முக்கிய காரணிகளாகின்றன. சட்டத்துக்குப் புறம்பான, ஒழுங்குபடுத்தப்படாத, அறிக்கை யிடப்படாத மீன்பிடியால் - IUU - வருடாந்தம் உலகளாவிய ரீதியில் 26-50 பில்லியன் அமெரிக்க டொலர் பெறுமதியான பொருளாதார இழப்பு ஏற்படுவதாக கடற்றொழில் நீரியல் வளத் திணைக்களத்தின் 2020ஆம் ஆண்டுக்கான அறிக்கை சுட்டிக் காட்டுகின்றது.

2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் துறைமுக அபிவிருத்திப் பணிகள், படகுத் தள மறுசீரமைப்பு, மீன்பிடித் தொழிலுக்கான துணை உபகரணங்களை வழங்கல், நன்னீர் மீன்பிடி ஊக்குவிப்பு, விழிப்புணர்வுத் திட்டங்கள், ஆராய்ச்சி முன்னெடுப்புகள் உள்ளிட்ட வற்றுக்கான முன்மொழிவுகளை வரவேற்பதோடு, மீனவர் களுக்கும் நிலைபேறான மீன்வளச் சூழமைவுக்கும் பெரும் அச்சுறுத்தலாகும் காரணிகளை இழிவளவாக்குவதற்கான முயற்சிகளிலும் கூடுதல் கரிசனை கொள்ளுமாறு கௌரவ கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

வட மாகாணத்தில் உள்ள மீனவர்கள் எதிர்நோக்கும் சவால்கள் தொடர்பில் பலமுறை இந்த அவையிலே விவாதிக்கப்பட்டன. ஏனைய துறைகளில் கொள்ளும் கரிசனையை இத்துறைமீதும் இதுவரை அரசு காட்டாதிருப்பது சற்று ஏமாற்றமாக இருக்கிறது. இதுவரை காத்திரமான முடிவுகள் எட்டப்படாது நீடித்திருக்கும் இப்பிரச்சினைகளால் கடலை நம்பி வாழும் ஓரிலட்சத்திற்கும் மேற்பட்ட குடும்பங்கள் பாதிக்கப்பட்டுள்ளன. இழுவைமடிப் படகுகள், வெளிச்சம் பாய்ச்சி மீன்பிடித்தல், வெடி வைத்து மீன்பிடித்தல், சுருக்குவலைகளில் மீன்பிடித்தல் உள்ளிட்டவை இலங்கையின் சட்டத்தின் பிரகாரம் தடைசெய்யப்பட்ட தொழில் முறைகள்.

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

இத்தொழில் முறைகளால் இலங்கையின் கடல் வளம், அதிலும் குறிப்பாக வட, கிழக்கின் கடல் வளம் தற்போது வெகுவாகச் சீர்குலைந்து வருகின்றது.

சட்டங்கள் இயற்றப்பட்டாலும் அவை இதுவரை சரியாக நடைமுறைப்படுத்தப்படாதிருப்பது அரசின் தவறு என்றுதான் சொல்ல வேண்டும். சட்டத்திற்குப் புறம்பாக இயங்குபவர் களைக் கட்டுப்படுத்த வேண்டிய சூழ்நிலையில், தற்போது சட்டத்தை மதித்து இயங்குபவர்களே தண்டிக்கப்படுகிறார்கள். அத்துடன், அவர்களின் நாளாந்த வாழ்வாதாரமும் முடக்கப்படுகின்றது. தடைசெய்யப்பட்ட தொழில்முறைகளைக் கட்டுப்படுத்தாதிருக்கும்போது நாளுக்கு நாள் அவ்வாறான தொழில் முறைகளைப் பயன்படுத்தும் மீனவர்களின் எண்ணிக்கை வட கடற்பரப்பில் அதிகரித்துச் செல்கிறது. தடைசெய்யப்பட்ட தொழில் முறைகளால் நூற்றுக்கணக்கான கிலோகிராம் மீன்களைப் பிடித்து இவர்கள் இலாபம் உழைக்கும் அதே கடற்பரப்பில், தமது எரிபொருள் செலவுக்குக்கூட வருவாய் ஈட்ட முடியாத நிலையில் 5-10 கிலோ அளவில் மீன்களைப் பிடிக்கும் பாரம்பரிய மீனவர்கள் பாதிக்கப்படுகின்றனர்.

முல்லைத்தீவில் கடந்த 2024ஆம் ஆண்டு 12,335 மெற்றிக்தொன் அளவிலான மீன்வளம் கடற்றொழில் ஊடாகப் பெறப்பட்டதாகத் தங்கள் அறிக்கை சுட்டிக் காட்டுகின்றது. இவ்வளவு தொகை மீன்களில் வெளிச்சம் பாய்ச்சியும் வெடிவைத்தும் இரவு வேளைகளில் சுருக்குவலைகளைப் பயன்படுத்தியும் பிடித்த மீன்கள் எத்தனை மெற்றிக்தொன் என்ற புள்ளிவிபரம் ஏதேனும் தங்களிடம் உள்ளதா? ஏனெனில், பெரும்பாலான நேரங்களில் தாம் பயன்படுத்தும் எரிபொருள் செலவுக்கே வருவாய் ஈட்டாத அளவு மீன்களுடனேயே பாரம்பரிய மீனவர்கள் கரை திரும்புகின்றனர். எனவே, இந்த அரசு யாரைக் காக்கின்றது, யாரை வஞ்சிக்கிறது? என்று தெரியவில்லை. கடற்றொழிலில் இந்த அரசு ஊழலுக்குத் துணைபோகிறது என்பதையே நடக்கும் நிகழ்வுகள் சான்றாக்குகின்றன. இத்தகைய மீன்பிடி முறைகள் இந்த ஆண்டோடு, அதாவது 2025ஆம் ஆண்டோடு முற்றாக இலங்கைக்குள் தடைசெய்யப்படும் என மீன்பிடித் துறைக்குப் பொறுப்பான அமைச்சர் இவ்வாண்டு உறுதியளித்திருந்தார். கௌரவ அமைச்சர் அவர்களே, உங்கள் வாக்குறுதியை நீங்கள் நிறைவேற்றுவீர்களா? அறத்தை மதித்து, கடலை மதித்து மீன்பிடிக்கும் மீனவர்கள் உங்கள் காலத்தில் பட்டினியால் மாண்டார்கள் என்பதை நிகழ்வாக்க வேண்டாம் எனத் தயவுடன் இந்த அரசைக் கேட்டுக் கொள்கின்றேன்.

இலங்கைக் கடற்பரப்பினுள் தொடர்ச்சியாக அத்துமீறும் இந்திய இழுவைப் படகுகளைக் கட்டுப்படுத்த வேண்டியதும் இந்த அரசின் கடப்பாடாகும். இத்தகைய தொடர்ச்சியான அத்துமீறல் நாட்டின் இறையாண்மையைக் கேள்விக் குள்ளாக்குகின்றது. கௌரவ கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் அவர்களே, எல்லோரும் பயன்படுத்திச் செல்வதற்கு வடக்கு கடல் ஓர் ஒழுங்கு படுத்தப்படாத திறந்தவெளி அணுகல் வலயம் அல்ல. மாறாக, இது வட மாகாணத்தைச் சார்ந்த மீனவர்களின் வாழ்வாதாரத் திடல்! அவர்களின் உரித்து! இந்தக் கடல் இந்தத் தலைமுறைக்கு மட்டுமல்ல, இனிவரும் சந்ததிகளுக்குமானது. இனிவரும் காலத்திற்குமாக இக்கடல் வளத்தை முறையாகப் பேணவேண்டியது எம் எல்லோரினதும் பொறுப்பு.

1996ஆம் ஆண்டின் 2ஆம் இலக்க கடற்றொழில் நீர் வாழ் உயிரின வளங்கள் சட்டத்தின் 27ஆம் பகுதியின் முதல் கூற்று, இலங்கை நீர்நிலைகளில் மீன் அல்லது பிற நீர் வாழ் வளங்களை நஞ்சாக்குதல், கொல்லுதல், அதிர்ச்சி ஊட்டுதல் அல்லது முடக்குதல் போன்ற நோக்கங்களுக்காக ஏதேனும் நஞ்சு, வெடிப்பு அல்லது மயக்கத்தை ஏற்படுத்தும் பொருள் - டைனமிக் உட்பட - அல்லது பிற தீங்கு விளைவிக்கும் பொருளைப் பயன்படுத்தல் அல்லது பயன்படுத்த முயற்சித்தலைத் தடைசெய்கின்றது. முல்லைத்தீவுக் கடற்பரப்பில் இத்தகைய தடைசெய்யப்பட்ட தொழில் முறைகள் இன்றளவும் நடைபெறுகின்றது; அது வட மாகாணக் கடற்பரப்பும்கூட!

குறித்த சட்டத்தின் இரண்டாம் கூற்று, அவ்வாறே பொருட்களைத் தரைக்குக் கொண்டுவருதல், விற்றல், வாங்குதல், வைத்திருத்தல், கொண்டுசெல்லல் போன்ற வற்றையும் தடை செய்கிறது. ஆனால், உண்மையில் அத்தகைய பொருட்கள் தரைக்குக் கொண்டுவரப்படுகின்றன, விற்கப்படுகின்றன, வாங்கப்படுகின்றன, கொண்டுசெல்லப் படுகின்றன. குறித்த சட்டத்தின் 28ஆம் பகுதி, தடை செய்யப்பட்ட மீன்பிடி உபகரணங்கள் அல்லது தடைசெய்யப்பட்ட மீன்பிடி முறைகளைச் சாதாரண உள்ளூர் மீன்பிடிப் படகுகளில் வைத்திருப்பதையோ, பயன்படுத்து வதையோ தடை செய்கிறது. ஆனால், அத்தகைய தடைசெய்யப்பட்ட மீன்பிடி உபகரணங்கள் மீன்பிடிப் படகுகளில் வைத்துப் பயன்படுத்தப்படுகின்றன. இலங்கைக் கடற்படை, கடலோரப் பாதுகாப்புத் திணைக்களம், கடற்றொழில் திணைக்களம், தேசிய நீரியல் வள ஆராய்ச்சி மற்றும் அபிவிருத்தி நிறுவனம், பாதுகாப்பு அமைச்சு, இராணுவம் என அனைத்துத் துறையினரும் இணைந்துகூட இலங்கை மீனவர்களின் தடை செய்யப்பட்ட தொழில்முறை களையும் எல்லை தாண்டிவரும் இந்திய மீனவர்களையும் கட்டுப்படுத்த முடியவில்லை. முல்லைத்தீவின் கடற்பரப்பில் மேற்கொள்ளப்படும் சட்டவிரோதத் தொழில் முறைகள் தொடர்பில் முல்லைத்தீவு மாவட்டக் கடற்றொழில் மற்றும் நீரியல் வளத் திணைக்களத்தின் உதவிப் பணிப்பாளரிடம் முறையிடச் செல்லும்போது, தன்னிடம் போதியளவு ஆளணி இல்லையெனப் பதிலளிப்பதாகவே மீனவர்கள் எம்மிடம் முறையிடுகின்றனர். கௌரவ அமைச்சர் அவர்களே, இது முன்னரும் கூறப்பட்டதுதான்!

இலங்கையின் அத்தனை பாதுகாப்புக் கட்டமைப்புகள் இணைந்துகூட கட்டுப்படுத்த இயலாதிருப்பின், தன்னிடம் போதியளவு ஆளணி இல்லையென முல்லைத்தீவு மாவட்ட உதவிப் பணிப்பாளர் கூறுவது உண்மை எனில், போதியளவு ஆளணியைக் குறித்த திணைக்களங்களுக்கு வழங்கி, இவற்றைக் கட்டுப்படுத்த ஆவன செய்யுங்கள்! அவ்வாறு போதியளவு ஆளணி உங்களிடம் இல்லையேல், இன்றுவரை சட்டத்துக்கு இசைவாக மீன்பிடிக்கும் எங்களின் நூற்றுக்கணக்கான மீனவர்களுடன் உங்கள் திணைக்களத்திற்கு நாங்கள் எல்லோரும் வருகிறோம்; சட்ட விரோதச் செயற்பாடுகளைக் கட்டுப்படுத்துங்கள்! ஒவ்வொரு முறைகேடும் இங்கு நடைபெறும்போது, விடுதலைப் புலிகளின் நிழல் நிருவாகத்தையே நாம் உங்களுக்கு எடுத்துக்காட்ட வேண்டியுள்ளது. விடுதலைப் புலிகளின் காலத்தில் இங்கு இந்திய மீனவர்கள் எல்லைதாண்டி வரவில்லை; இலங்கை மீனவர்களும் தடைசெய்யப்பட்ட தொழில் முறைகளை இங்கு பயன்படுத்த முனையவில்லை. அவர்களால் இயல்பாகக் கொண்டுவர முடிந்ததை ஓர் அரசாக இருந்துகூட ஏன் உங்களால் இதுவரை இயலவில்லை?

கரையோரங்களில் கனிய மணல் அகழ்வுக்கான முயற்சிகள் பல இடங்களிலும் நடைபெற்று வருகின்றது. கொக்கிளாய் முகத்துவாரத்தில் இருந்து கரையோரமாகச் சுமார் 44 ஏக்கர் - 32 குடும்பங்களின் கரைவலைப்பாடுகள், காலபோக நெற்செய்கைக்கான விளைநிலங்கள், மானாவாரிக் காணிகள்

அடங்கிய பகுதிகள் - கனிய மணல் அகழ்வுக்கெனக் கையகப் படுத்தப்பட்டு வேலியிடப்பட்டுள்ளன. முல்லைத்தீவின் கொக்கிளாய்ப் பகுதியில் மேற்கொள்ளப்பட்ட கனிய மணல் அகழ்வின் பின்னர், அப்பகுதி முறையாக மீள்நிரப்பப் படாததால், கடல்நீர் ஊருக்குள் புகுந்து மக்களின் வாழ்வியலைச் சீர்குலைத்திருந்தது. அதற்கான மண் நிரப்பல் உள்ளிட்ட பரிகாரச் செயற்பாடுகள் இதுவரை மேற்கொள்ளப் படவில்லை. கனிய மணல் அகழ்வுக்கென அபகரிக்கப்பட்ட 44 ஏக்கருக்கு மேலதிகமாக, அதற்கு முன்னர் பூர்வீகத் தமிழ் மக்கள் வாழ்ந்து, தொழில் புரிந்த 20 ஏக்கர் வரையான உறுதிக் காணிகளில் போருக்குப் பின்னர் சிங்கள மக்கள் குடியமர்த்தப்பட்டுள்ளனர். கொக்கிளாய் கனிய மணல் அகழ்வுக்கு ஒப்பான முயற்சிகளை மீண்டும் முல்லைத்தீவின் கரையோரப் பகுதிகளில், குறிப்பாக செம்மலை கிழக்கு, செம்மலை, அளம்பில், உடுப்புக் குளம் உள்ளிட்ட பகுதிகளில் மேற்கொள்வதற்கு கனிய மணல் ஆய்வுக்கென உரிய தரப்பினர் வருகை தந்தபோது அதனை மக்கள் எதிர்த்திருந்தனர்.

கடந்த 2024.07.31ஆம் திகதி இவ்வாறானதொரு கனிய மணல் அகழ்வுக்காக கனிய மணல் கூட்டுத்தாபனம், கடலோரப் பாதுகாப்புத் திணைக்களம், வனசீவராசிகள் திணைக்களம், சுற்றுச்சூழல் திணைக்களம், நீர் வழங்கல் முகாமைத்துவப் பிரிவு, புவிச்சரிதவியல் திணைக்களம் என்பவற்றின் அதிகாரிகளோடு கரைதுறைப்பற்று பிரதேச செயலக காணி உத்தியோகத்தர், கிராம உத்தியோகத்தர் அடங்கலான ஓர் அணி அளம்பில் குருசடி எனும் பகுதிக்கு வருகைதந்தபோது, மக்களின் கடுமையான எதிர்ப்பினால் திருப்பி அனுப்பப்பட்டனர். அளம்பில் குருசடி தொடக்கம் தீர்த்தக்கரை வரையான சுமார் 10 கிலோமீற்றர் நீளத்துக்கு கரையோரத்தில் இருந்து 300 மீற்றர் தூரமான மேல் பகுதிவரை அளவீடுசெய்து, கையகப்படுத்தி, கனிய மணல் அகழ்வதற்கான தொடக்க முயற்சியே அன்று மக்களின் எதிர்ப்பால் தடுக்கப்பட்டது.

கௌரவ தவிசாளர் அவர்களே, முல்லைத்தீவு மாவட்டத்தின் கரையோரமானது கொக்கிளாய் தொடக்கம் சுண்டிக்குளம் வரையான சுமார் 75 கிலோமீற்றர் நீளமானது. முல்லைத்தீவுக் கரையோரம் முழுவதும் இவ்வாறு பல்வேறு தேவைக்கும் கையகப்படுத்தப்பட்டால் அப்பகுதிகளின் மீனவர்கள் எங்கு தொழில் செய்வது? அம்மீனவர்களின் வாழ்வாதாரத்துக்கு அரசின் பதில் என்ன? மன்னாரில் பேசாலையிலும் இத்தகைய கனிய மணல் அகழ்வுக்கான தொடக்க ஆய்வு முயற்சிகள் மக்கள் எதிர்ப்பால் தடுக்கப்பட்டன.

இந்த நேரம் ஒரு பாடலை இங்கு குறிப்பிட விரும்புகிறேன்; இந்தப் பாடல் கௌரவ அமைச்சர் அவர்களுக்கும் தெரியும்.

> " ஆழக் கடல் எங்கும், சோழ மகராஜன் ஆட்சிபுரிந்தானே அன்று
>
> தமிழீழக் கடலெங்கும் எங்கள் கரிகாலன் ஏறி நடக்கின்றான் இன்று
>
> காலை விடிந்ததென்று பாடு!
>
> சங்க காலம் திரும்பியது ஆடு!"

தமிழ் இனத்தின் தேசியத் தலைவனது ஆட்சியை வடக்கு, கிழக்குத் தமிழர் தாயகப் பரப்பில் வாழ்ந்த தமிழ் மக்கள் இவ்வாறாகத்தான் கொண்டாடினார்கள். மேதகுவின் ஆட்சியில் கடலிலே இந்திய இழுவைப் படகுகளின் அத்துமீறல்களும் அடாவடிகளும் இருக்கவில்லை; சட்டவிரோத கடற்றொழில் செயற்பாடுகள் இருக்கவில்லை; மீனவர்கள் மகிழ்ச்சியாகக் கடற்றொழிலில் ஈடுபட்டனர். காணி அபகரிப்புக்களும் இல்லை. தமிழர் தாயகம் விவசாயத்திலும் செழித்திருந்தது. போதைப் பொருட்கள் அறவே இல்லை. நள்ளிரவிலும் பெண்கள் சுதந்திரமாக உலவக்கூடிய நிலை இருந்தது. தாயகப் பரப்பில் மக்கள் தன்னிறைவு பெற்றுப் பாதுகாப்பாக வாழ்ந்தனர்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Thurairasa Ravikaran, your time is up.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
எனக்கு இன்னும் 30 செக்கன் தாருங்கள்!

எனவேதான் தமிழ் மக்கள் மேதகு அவர்களை இறைவனாகவும் அவரது ஆட்சிக் காலத்தைச் சங்க காலமாகவும் போற்றுகின்றனர். அந்த தமிழ் இனத்தின் இறைவனுக்கு இன்று பிறந்தநாள்! இந்த உயரிய சபையிலே மேதகு வே. பிரபாகரன் அவர்களுக்கு எனது பிறந்தநாள் வாழ்த்துக்களைத் தெரிவித்து, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Minister Ramalingam Chandrasekar?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ உறுப்பினர் ரவிகரன் அவர்கள் குறிப்பிட்ட இரண்டு விடயங்கள் பற்றி சொல்லவேண்டியிருக்கின்றது. முதலாவது விடயம், வட கடலில் கடற்றொழிலில் ஈடுபடுகின்ற வர்கள் இழுவைமடிப் படகு, இந்திய - தமிழ்நாட்டு மீனவர்களது ஆக்கிரமிப்பு போன்ற பிரச்சினைகளால்தான் அதிகமாகப் பாதிக்கப்படுகின்றார்கள். இது தொடர்பாக, தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்கள் குரல் கொடுப்பது போதாது. இரண்டாவதாக, அங்கு சட்ட விரோதமான முறைகள் பயன்படுத்தப்பட்டு மீன்கள் பிடிக்கப்படுவது பற்றி குறிப்பிட்டீர்கள். கௌரவ உறுப்பினர் ரவிகரன் அவர்களே, அந்தச் சட்ட விரோதமான மீன்பிடி முறைகளுக்குக் காரணகர்த்தாக்கள் யாரென்பது - அந்த அழிவுகரமான வேலைகளில் ஈடுபடுகின்றவர்கள் யாரென்பது - உங்களுக்கு நன்றாகத் தெரியும். சட்ட விரோதமான மீன்பிடி முறைகளைப் பயன்படுத்தி கடற்றொழிலில் ஈடுபடுவதன்மூலமாக எங்களுடைய வட கடலின் மீன்வளமே இல்லாமல் போகின்றது. நான் அவர்களுடைய பெயர்களைக் குறிப்பிட விரும்பவில்லை; குறிப்பிடுவது உங்களுக்கு நல்லதல்ல என நான் நினைக்கின்றேன். இருந்தபோதும் நீங்கள் நினைத்தால் அவர்களை ஓரளவுக்குக் கட்டுப்படுத்துவதற்கு நாங்கள் எடுக்கின்ற நடவடிக்கைக்கு உதவி செய்ய முடியும் என்பதைக் கூற விரும்புகின்றேன்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Thanura Dissanayake. You have ten minutes.

[පූ.භා. 11.50]

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

ගරු සභාපතිතුමනි, අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව විසින් මේ රටේ බොහෝ ක්ෂේත්‍ර පරිවර්තනය කරමින් යන මොහොතක, විශේෂයෙන්ම ලෝකයේ විශාල පරිවර්තනයකට දායක වෙලා තිබෙන ක්ෂේත්‍ර කිහිපයක් භාර අමාත්‍යාංශ කිහිපයකට අදාළ වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡා කරන මේ අවස්ථාවේ, ඒ වෙනුවෙන් අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

විශේෂයෙන් අපි මේ ක්ෂේත්‍ර පිළිබඳව ටිකක් කථා කළොත්, අපේ රට බොහෝ තාක්ෂණික පරිවර්තන සහ ලෝකයේ සිදු වුණු වෙනස්කම් මඟ හැර ගත්තු රටක්. පසුගිය දශක ගණනාව ගත්තත්, පසුගිය ශත වර්ෂය ගත්තත් ලෝකය වේගයෙන් වෙනස්කම්වලට ගියා. උපායමාර්ගික ලෙස ඒ වෙනස්කම් එක්ක සමපාත වෙලා, ලෝකයත් එක්ක සම්බන්ධ වෙලා අපේ රටේ ආර්ථිකයට යන්න තිබුණු අවස්ථා විශාල ප්‍රමාණයක් අපට මඟ හැරී තිබෙනවා. එම නිසා අපට දැන් තිබෙන අභියෝගය තමයි, රටක් විධියට අපේ රටත් වර්තමාන ලෝකය ගමන් කරන දිශාවට සූදානම් කරගෙන යන එක. එහෙම යනකොට අපි මූලිකව ප්‍රතිපත්තිමය වශයෙන් හොඳ රාමුවක් - framework එකක් - හදා ගන්න ඕනෑ; ඒ වාගේම අපේ මානව සම්පත ඒ අනුව දියුණු කර ගන්න ඕනෑ; රාජ්‍ය යන්ත්‍රණයත් ඒ වෙනුවෙන් පරිවර්තනය කරන්න ඕනෑ. හැබැයි, මේ හැම එකකින්ම ප්‍රතිලාභ ලැබෙන්නේ, අපේ ආර්ථිකය කොයි තරම් දුරකට නවීන ලෝකයත් එක්ක යන්න පුළුවන් විධියට වෙනස් කර ගන්නවාද කියන කාරණය මතයි.

අද වනකොට අපේ මානව ක්‍රියාකාරකම් බොහොමයක් ඩිජිටල්කරණය වෙලායි තිබෙන්නේ. එක යුගයක අපි digital ක්‍රමයට නැතුව analogue ක්‍රමයටයි කටයුතු කළේ. එහෙම නැත්නම්, භෞතිකව පරිහරණය කරමින් හිටපු ඒවා විවිධ අනුපාතවලින් සම්මිශ්‍රණය වෙලා තිබෙනවා. අපි තවමත් පොත් පත්, පත්තර ආදියත් පාවිච්චි කරනවා; ඩිජිටල් දේවල් ද පාවිච්චි කරනවා. හැබැයි, මානව සන්නිවේදනයේ ඉඳලා භාණ්ඩ මිල දී ගැනීම වැනි විවිධ ක්‍රියාකාරකම් ගත්තොත්, ඒ හැම එකම ප්‍රායෝගිකව අත් දකින අය තමයි බහුතරයක් ඉන්නේ. ඒ නිසා ඒ ගැන ලොකුවට කියන්න දෙයක් නැහැ. කොහොම කළත්, අපේ මානව හැසිරීම් සමාජයක් විධියට, රටක් විධියට ඩිජිටල්කරණයෙන් මිදිලා යන්න බැරි තැනට ඇවිත් තිබෙනවා.

පසුගිය දශක ගණනාව තුළ අපේ රටේ සංවර්ධනය ගත්තොත්, පැවැති පාලන තන්ත්‍රයන් විසින් බොහෝ දුරට සංවර්ධනය කියලා උලුප්පා දැක්වූයේ භෞතික සංවර්ධනය විතරයි. අපට සංවර්ධනය පිළිබඳව නැවත පොඩි කථා බහක්, එහෙම නැත්නම් සාකච්ඡාවක් අවශ්‍ය වෙනවා. මොකද, ප්‍රතිපත්තිමය වශයෙන් සහ උපාය මාර්ගික වශයෙන් සැලසුම්කරණය පැත්තෙන් සිදු කර ගත් වෙනස්කම් සංවර්ධනය විධියට අර්ථ දැක්වෙනවා සහ අර්ථ දක්වනවා අඩුයි. ගොඩක් වෙලාවට අපට පෙනෙනවා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් අපෙන් අහනවා, මොනවාද ජේන්න කරලා තිබෙන්නේ කියලා. අපි වෙනස්කම් විශාල ප්‍රමාණයක් කර තිබෙනවා. හැබැයි, ඒගොල්ලෝ සාම්ප්‍රදායික විධියටම අහනවා, භෞතිකව මොනවාද පෙනෙන්න තිබෙන්නේ, ඇහට දැනෙන්න මොනවාද කරලා තිබෙන්නේ කියලා. අපි භෞතික සහ ඇහට දැනෙන දේවලුත් විශාල ප්‍රමාණයක් වෙනස් කරගෙන යන ගමන්, අපේ රට ඉදිරි දශක ගණනාව සඳහා සූදානම් කිරීම වෙනුවෙන් විශාල කාර්යභාරයක් කරමින් සිටිනවා. 2025 අය වැයෙන් වෙන් කළ මුදල්වලිනුත්, 2026 වසරට අදාළව වෙන් කරන්න බලාපොරොත්තු වන මුදල්වලිනුත් විශාල කාර්යභාරයක් කරන්න අපි තීරණය කර තිබෙනවා. ඒ අනුව ඩිජිටල් රාජ්‍යයකට යෑමේ සහ ඩිජිටල් පරිවර්තනයකට යෑමේ - ඩිජිටල් රාජ්‍යකරණය සඳහා සහ ඩිජිටල් පරිවර්තනය සඳහා යෑමේ - අරමුණින් මේ අමාත්‍යාංශයට සහ අනෙකුත් ක්ෂේත්‍රවලට අඩු වැඩි වශයෙන් වෙන් වුණු මුදල් සියල්ල එකතු වුණාම, අපේ මේ සංවර්ධන අය වැයෙන් - ජාතික අය වැයෙන් - අපි 2026 වර්ෂය සඳහා රුපියල් බිලියන 30ක මුදලක් වෙන් කර තිබෙනවා. අපි මේ මඟින් ක්‍රමවේදයක් හඳුන්වා දී තිබෙනවා, විශේෂයෙන්ම රජයේ ආයතනවලට අදාළව ඩිජිටල් යටිතල පහසුකම් - infrastructure - ටික develop කර ගන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන්.

දත්ත සහ තොරතුරු කළමනාකරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. ඩිජිටල් ක්‍රියාකාරකම් සිද්ධ වෙන්න නම් හොඳ platform එකක් ඕනෑ. ඒ platforms නැත්නම් මේවා හරියට වැඩ කරන්නේ නැහැ. GovPay කියන්නේ එහෙම develop කරපු platform එකක්. අද බැංකු සහ FinTech ආයතන විශාල ප්‍රමාණයක් ඒකත් එක්ක සම්බන්ධ වෙලා ඉන්නවා. ඒ වාගේම ඩිජිටල් වේදිකා සහ යෙදවුම් දියුණු කර ගන්න එක කරන්න ඕනෑ. ඊළඟට connectivity නැත්නම් අපට digital transformation එකකට යන්න හම්බ වෙන්නේ නැහැ. ඒක නිසා තමයි අපේ ගරු ඇමතිතුමාත් කිව්වේ, අපේ රට, digital divide එක යම්කිසි ආකාරයක සැලකිය යුතු ලෙස වැඩි රටක් කියලා. අනෙකුත් සංවර්ධනය වාගේම සන්නිවේදන පහසුකම් අපේ රටේ භූවිෂමතාව අනුවත්, අපි ඒවාට වියදම් කරලා තිබෙන ප්‍රමාණය strategic plan එකක් නැතුව කරලා තිබෙන නිසා රට සංවර්ධනය කරනවා වෙනුවට ඒවා business develop කරන පැත්තට විතරයි යන්න ඉඩ ඇරලා තිබුණේ. නමුත් ඒ ආයතනත් එක්ක කථා කරලා ඉදිරියේදී මේක හදා ගන්න ඕනෑ. ඒ සඳහා තමයි ග්‍රාමීය ප්‍රදේශවල සන්නිවේදන පහසුකම් සඳහා වසරකට කුලුනු 100ක් අලුතින් හදන්න අපි සැලසුම් කරලා තිබෙන්නේ. ඒවා සඳහා අවුරුදු පහකට බදු නිදහස් කරලා තිබෙනවා. ඒවා ප්‍රවර්ධනය කරලා සන්නිවේදනය සහ සන්නිවේදන පහසුකම් වැඩි කරන්න සැලසුම් කරලා සහ මේ වෙනකොට කරලාත් තිබෙනවා.

ඒ වාගේම තමයි ආරක්ෂාව සහ පෞද්ගලිකත්වය. අපි පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සහ දත්ත නියාමන අධිකාරිය පනත සංශෝධනය කළා. ඒ අනුව දත්ත නියාමන අධිකාරිය පිහිටුවලා තිබෙනවා. මේ වාගේ background එකක් හදා ගන්න ඕනෑ, මේ field එකේ development එකක් අපි බලාපොරොත්තු වෙනවා නම්. ඒ වාගේම පාලනය සහ සුදුසු ප්‍රතිපත්තිත් ඉස්සරහට එන්න ඕනෑ. මේ කටයුතු ප්‍රවර්ධනය කරන්න නම් ජනතාවට අපි මොනවාද කරන්නේ කියලා සහ අපේ line එක මොකක්ද කියලා පෙන්වා ගන්න අවශ්‍යතාවක් තිබෙනවා. ඒ සඳහා 2025 සැප්තැම්බර් මාසය ඩිජිටල් ආර්ථික මාසය ලෙස අපි නම් කළා.

මේ ඩිජිටල් ආර්ථික මාසයේ අපේ තේමාව වුණේ, ශ්‍රී ලංකාව ඩිජිටල් ලෙස බලගැන්වූ ජාතියක් බවට පත් කිරීමේ ගමන වේගවත් කිරීමේ, මුල පිරීමේ, ආරම්භයක්. අපි ඩිජිටල් අභිලාෂ ඉදිරිපත් කරලා තිබෙනවා. 2030 වෙනකොට ඩිජිටල් ආර්ථිකය, ඇමෙරිකානු ඩොලර් බිලියන 15ක් දක්වා පුළුල් කිරීම ඉතාම අභියෝගාත්මක ඉලක්කයක්. ඒක, අසීරු වෙන්න පුළුවන්.

නමුත්, අපි අභියෝගාත්මක ඉලක්කයක් අරගෙන තිබෙනවා. ඒ විධියට වැඩ කළොත්, අපට දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 12කට වඩා වැඩි ප්‍රමාණයක් අත්පත් කර ගන්න පුළුවන්. ඒ වාගේම අපි ජාතික වශයෙන් ඩිජිටල් මෙවලම් භාවිත කිරීමට පහසුකම් ලබා දීලා තිබෙනවා. ඒවා භාවිත කළාම ජනතාවට ලැබෙන ප්‍රතිලාභ ප්‍රවර්ධනය කිරීමත් අවශ්‍ය වෙනවා. ඒ වෙනුවෙනුත් අපි කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම අපි කරගෙන ආපු, නවීකරණය කරන ලද සහ අලුතින් හඳුන්වා දීපු ඩිජිටල් ව්‍යාපෘති ඉතා වේගවත් කිරීමත් අපි ආරම්භ කරලා තිබෙනවා.

අද, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳවත් විවාද කරනවා. මේ හැමදේම කරන්න නම් බලශක්තිය අවශ්‍යයි. මේවා, energize වෙන්නේ බලශක්තියෙන්. අපි බලශක්ති ක්ෂේත්‍රය පරිවර්තනයකට ගෙන යමින් තිබෙනවා, බලශක්තියට වැය වන මුදල අඩු කරන්නත්, බලශක්තියේ ගුණාත්මකභාවය ඉහළ දමන්නත්. අද වන විට ලෝකය, AI පැත්තට නැත්නම් කෘත්‍රිම බුද්ධිය පැත්තට නැඹුරු වෙලා තිබෙනවා. ඒ වාගේම කාලයක් තිස්සේ data centres develop වෙලා තිබෙනවා. ඒක ව්‍යාපාරයක්, business එකක්. එතකොට අපි අපේ රටට data centres ගෙන්වා ගැනීමේ පදනම හදන්න ඕනෑ. අපි බලශක්තියත් නවීකරණය කරගෙන තිබෙනවා, green energy පැත්තට සහ මිල අඩු කිරීමට. ඒ හරහා, data centresවලට අවශ්‍ය පහසුකම් අපේ රටේ හදා ගන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම "Disrupt Asia 2025" - අංකුර ව්‍යවසායකයන් සහ නවෝත්පාදන පරිසර පද්ධති පිළිබඳ ප්‍රදර්ශනය - සැප්තැම්බර් 17වැනි දා ඉඳලා 20වැනි දා දක්වා පැවැත්වුවා. ඒ වාගේම ඩිජිටල් මූල්‍ය අනුවර්තන ප්‍රවර්ධනය කිරීම සහ නව විසඳුම් පිළිබඳ සාකච්ඡාව සඳහා Sri Lanka Fintech Summit එක පැවැත්වුවා. ඒ වාගේම National AI Expo - ජාතික කෘත්‍රිම බුද්ධිය පිළිබඳ ජාතික ප්‍රදර්ශනය - පැවැත්වුවා. අපි මේ ක්‍රියාකාරකම් ඒ මාසයෙන් නොනැවති, දින 100ක් දක්වා ඉදිරියට ගෙනයමින් තිබෙනවා. අපි මේ හැම එකක් පිළිබඳවම සාකච්ඡාවක් පැවැත්වුවා, digital transformation එක පැත්තෙන් ඊළඟ පියවර මොකක්ද, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය හැටියට මොකක්ද කරන්නේ කියන කරුණු සම්බන්ධව. ලෝකය එක්කත්, මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ආයතනත් එක්කත්, ජනතාව එක්කත් අපට ඒ සාකච්ඡාව ආරම්භ කරන්න පුළුවන් වුණා. මේ ඩිජිටල් මාසයේ, මේ සැප්තැම්බර් මාසයේ ඉඳලා තවත් දවස් 100කට අපි මේ සැලසුම් හදලා තිබෙනවා.

2026 වසර මුලදී ශ්‍රී ලංකාවේ ඒකීය ඩිජිටල් අනන්‍යතාව - SLUDI - පිළිබඳ දැනුවත් කිරීම ආරම්භ කරනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, 2026 වසරේ තුන්වැනි කාර්තුවේදී ඩිජිටල් හැඳුනුම්පතක් හඳුන්වා දෙන්න. මේ සියල්ලෙන්ම අපි බලාපොරොත්තු වෙනවා, ආර්ථිකය ප්‍රවර්ධනය කර ගන්න සහ ඩිජිටල් ක්ෂේත්‍රයෙන් අපේ ආර්ථිකයට අත්පත් කරගත යුතු සහ අත්පත් කරගත හැකි ප්‍රතිලාභ සියල්ලම ලබා ගැනීම සහ ජනතාවගේ ජීවිතය පහසු කරන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Thanura Dissanayake, your time is up now.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
I will wind up, Sir. Please give me a few more seconds.

අපි හඳුන්වා දී තිබෙනවා, ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා digital payment ක්‍රමයක්, card system එකක්. මම තවත් කාරණයක් කියන්න කැමැතියි. මට ඒ සම්බන්ධව පෞද්ගලික අත්දැකීමක් තිබෙනවා. මීට කලින් ජනාධිපති අරමුදලින් මූල්‍යාධාර ලබා ගන්න නම්, කොළඹ එන්න ඕනෑ, පෝලිමේ ඉන්න ඕනෑ. ඒ වාගේම ඒකට කාලයකුත් ගත වෙනවා. පසුගිය අවුරුද්ද තුළ 3,000කට ආසන්න ප්‍රමාණයක් තමයි ජනාධිපති අරමුදලින් ප්‍රතිලාභ ලබාගෙන තිබෙන්නේ. අපි ඒක decentralize කළා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට online system එකකින්. ඒ නිසා දැන් කලින් වාගේ මිනිස්සුන්ට රස්තියාදු වෙන්න ඕනෑ නැහැ. ඒ අය තොරතුරු submit කළාට පස්සේ සති දෙකක වාගේ කාලයක් ඇතුළත ප්‍රතිලාභ ලබා ගන්න පුළුවන්, සුදුසුකම් තිබෙනවා නම්. දැන් අපට 6,000ක් පමණ requests ලැබිලා තිබෙනවා. අපේ මහජන දිනයේදී ආපු ජනතාවත් අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට යැව්වා. එදාම ඒගොල්ලෝ තොරතුරු submit කරලා, බොහොම කෙටි කාලයක් තුළ ප්‍රතිලාභ ලබා දීලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, please wind up now.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ප්‍රායෝගිකව ජනතාවගේ ජීවිතය දියුණු කරමින්, රාජ්‍ය අංශයත් ඩිජිටල්කරණය කරමින් ඩිජිටල් ආර්ථිකයක් සඳහා ගමන් කිරීමට තමයි මේ අවුරුද්දේ අය වැය සකස් කරලා තිබෙන්නේ. ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ග විශාල ප්‍රමාණයක් ගන්න තිබෙනවා. අපි ආණ්ඩුවක් හැටියට ඒ වෙනුවෙන් ගත හැකි උපරිම ක්‍රියාමර්ග ගනිමින් ඩිජිටල් රටක් නිර්මාණය කිරීම වෙනුවෙන් අවශ්‍ය උපරිම දායකත්වය ලබා දෙනවා.

ඉතාම ස්තුතියි, ලබා දුන් අමතර කාලයට, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Chathura Galappaththi. You have 16 minutes.

[අ.භා. 12.01]

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන්.

විශේෂයෙන්ම අද ප්‍රධාන අමාත්‍යාංශ තුනක වැය ශීර්ෂ පිළිබඳව කථා කරන මොහොතේ, දෙවිනුවර ආසනය නියෝජනය කරන කෙනෙකු විධියට මට ධීවර අමාත්‍යාංශය ගැන කියන්න බොහෝ දේ තිබුණත්, ඒ කාරණා අපේ දිලිප් වෙදආරච්චි මැතිතුමාගේ අතින් කියැවුණු නිසා Digital Economy Ministry එකට අදාළ කාරණා ටිකක් කියන්න මා බලාපොරොත්තු වෙනවා.

ඇත්තටම digitization and digitalization සම්බන්ධව පොඩි මතවාදයක් තිබෙනවා. මොකද කාරක සභාවලට යනකොට අපි දැක්කා, අනෙක් අමාත්‍යාංශවල ඉන්න අමාත්‍යවරු ඒ වාගේම ඒ නිලධාරින් හිතන පතන විධියේ පොඩි වෙනසක් තිබෙන බව. මම

[ගරු චතුර ගලප්පත්ති මහතා]

මේ කථා කරන්නේ ජනාධිපතිතුමා ගැන හෝ Digital Economy විෂය භාර නියෝජ්‍ය අමාත්‍යතුමා ගැනවත් නොවෙයි. Digitization and digitalization අතර වෙනස හරියට හඳුනා ගන්න ඕනෑ. Digitization කියන්නේ සාමාන්‍යයෙන් analogue data, ඒ කියන්නේ පොත්පත්වල තිබෙන තොරතුරු ඒ වාගේම විවිධ මාධ්‍යවල තිබෙන තොරතුරු, system එකකට ඇතුළත් කිරීම. අපි උදාහරණයකට National Identity Card එකේ තොරතුරු system එකකට ඇතුළත් කිරීම ගත්තොත්, අන්න ඒක digitization. එතකොට digitalization කියන්නේ government sector එක වෙන්න පුළුවන්, private sector එක වෙන්න පුළුවන්, ඒ services අපි digital process එකක් හරහා convert කරනවා නම් අන්න ඒකට digitalization කියන්න පුළුවන්. ඒකට උදාහරණයක් දෙන්න පුළුවන්. අපි National Identity Card එකක් ගන්න process එක ගත්තොත්, form එකක් fill කරලා, ඒක ග්‍රාම නිලධාරියාට දීලා, ඒක දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට දීලා තමයි අපට NIC එකක් ගන්න වෙන්නේ. නමුත්, අපට පුළුවන් නම් ඒක digitalize කරන්න? අපට කරන්න තිබෙන්නේ online platform එකට ගිහිල්ලා data enter කරලා, අවශ්‍ය supporting documents ටික දෙන එක. ඊට පස්සේ අපට National Identity Card එක තැපෑලෙන් එනවා නම් ඒක ඩිජිටල්කරණය වෙලා තිබෙනවා. මෙන්න මේ කාරණා දෙක අතර ඇති පරස්පරතාව හරියාකාරව අවබෝධ කර ගත්තේ නැති රාජ්‍ය යන්ත්‍රණයක් තිබෙනවා. මම හිතන විධියට, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය කියන්නේ අත්‍යවශ්‍ය අමාත්‍යාංශයක්; රටේ ඊළඟ වෙනස ඇති කරන්න පුළුවන් ප්‍රධානම අමාත්‍යාංශය තමයි ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය. හැබැයි, ඒකට ජනාධිපතිතුමා, එහෙම නැත්නම් Digital Economy Ministry එක විතරක් සූදානම් වෙලා බැහැ. මේ සියලු අමාත්‍යාංශ ඒකට පෙළ ගැහෙන්න ඕනෑ.

දැන් අවුරුද්දක් වෙනවා මේ ආණ්ඩුව පත් වෙලා. අපේ නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කථාවේදී මේ රජය විසින් කරපු දේවල් ටික කිව්වා. උදාහරණයක් විධියට රාජ්‍ය ගෙවීම් සඳහා GovPay යෙදුම ස්ථාපනය කරලා තිබෙනවා, ආයතන කීපයකට ඒ service එක දෙන්න කටයුතු කරලා තිබෙනවා, Cloud පද්ධතිය නවීකරණය කරලා තිබෙනවා. උප්පැන්න, මරණ සහතික ලබා දීම වාගේම ජනාධිපති අරමුදලේ සේවා online කරලා තිබෙනවා, රූපවාහිනිය ඩිජිටල් කිරීම ගැන, කුලුනු සවි කරලා සන්නිවේදනය පුළුල් කිරීම ගැන, පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය ගැන, Super App එකක් ගැන කථා කළා. ඔන්න ඔය කාරණා ටික මේ වර්ෂය තුළ කරපු දේවල් විධියට එතුමා හුවා දැක්වුවා. හැබැයි මම විශ්වාස කරන්නේ, මීට එහා දෙයක්. අපි US Dollar 15 billion digital economy එකක් ගැන හිතනවා නම් ඊට එහා ගිය දේවල් ටිකක් ගැන අපට හිතන්න වෙනවා.

මම අපේ නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, එතුමාගේ කථාවේ අන්තිමට කථා කරපු වැදගත්ම දේ නිසා. ඒ තමයි procurement system එක digitalize කිරීම. පසුගිය අවුරුද්දක කාලය තුළ කථා වුණා සහල්, ලුණු, ලූනු, අර්තාපල්, සීනි විතරක් නොවෙයි කැබ් රථ ටෙන්ඩර් එක, ගල් අඟුරු ටෙන්ඩර් එක ගැන. මේ රටේ ජනතාව තුළ තිබෙන ආකල්පය තමයි, "ටෙන්ඩර් එකක් දැම්මා" කියපු ගමන්ම කෙළින්ම එතැනින් හොරකමක් වෙනවා කියන එක. මේ රජය බලයට පැමිණීමේ ප්‍රධාන පරමාර්ථය තමයි හොරකම, දූෂණය, වංචාව නවත්වනවා කියන කාරණාව. ඒ නිසා ඒ ආකල්පය නැති කරන්න විසඳුමක් විධියට දෙන්න පුළුවන් හොඳම solution එක තමයි, procurement system එක digitalize කිරීම. ඒක තමයි වැදගත්ම කාරණාව. ඒ සඳහා අවශ්‍ය මූලික පියවර ගත්තා කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවෙන් කියැවුණා. මම ආණ්ඩුවට අභියෝග කරනවා, පුළුවන් නම් එන අවුරුද්ද ඇතුළත මේ කටයුත්ත ස්ථාපනය කරන්න කියලා. එහෙම කළොත් ඔබතුමන්ලාගේ ආණ්ඩුවට විතරක් නොවෙයි, ඉස්සරහට එන ආණ්ඩුවලට පවා ඒ තුළින් විශාල වටිනාකමක් එකතු වෙනවා. ඒක මේ රටේ ලොකු වෙනසක් ඇති කරන්න හේතුවක් වෙනවා කියන කාරණාව මම මේ වෙලාවේ පැහැදිලිව කියන්න ඕනෑ.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාටත් මේ ගැන මේ වාගේම උනන්දුවක් තිබුණා. ඒ සඳහා එතුමාටත් හොඳ කණ්ඩායමක් හිටියා. නමුත් අපට මතකයි, මාස 6ක් යනකොට එතුමාගේ ඒ කණ්ඩායමේ හිටපු දක්ෂයෝ ඉවත් වෙන්න ගත්තා.

Dr. Sanjiva Weerawarana වාගේ අය ඉවත් වෙන්න ගත්තා. ඇත්තටම IT field එකේ ඉන්න අය එදා රජයෙන් ඈත් වෙන්න ගත්තා. වර්තමාන රජයත්, වර්තමාන ජනාධිපතිතුමාත්, Digital Economy Ministry එකත් ඉතා උනන්දුවෙන් මේ කටයුත්තට අත ගහලා තිබෙනවා කියලා පෙනෙනවා. ඒකට හොඳ කණ්ඩායමකුත් පත් වුණා. පසුගිය දවස්වල එම කණ්ඩායමෙන් එක්කෙනා දෙන්නා ඉවත් වෙනවා කියලා, ඒගොල්ලන්ගේ ට්විටර් ගිණුම්වල පණිවුඩ තිබෙනවා අපි දැක්කා. හැබැයි, හේතු කාරණා කියලා නැහැ. නමුත්, ඒ සිටින කණ්ඩායමෙන් එක්කෙනා දෙන්නා ඉවත් වෙනවා දැක්කා. ඒක එච්චර හොඳ දෙයක් නොවෙයි කියන එක මම මේ වෙලාවේ කියන්න ඕනෑ. මොකද, එහෙම මතයක් ගියොත්, ඔබතුමන්ලා ගැන තිබෙන විශ්වාසවන්තභාවය නැති වෙන්න ඉඩ තිබෙනවා. ජනාධිපතිතුමාත්, Digital Economy Ministry එකේ අයත් මේකට උනන්දුවක් දැක්වීම විතරක් ප්‍රමාණවත් නැහැ කියන එක මම නැවත වතාවක් කියනවා. අනෙක් සියලුදෙනා මේකට උනන්දු වෙන්න ඕනෑ. මම එහෙම කියන්න හේතුව තමයි, මේ individual ministriesවල මේකට කොච්චර සූදානමක් තිබෙනවාද කියලා බැලුවොත්, ඇත්තටම එහෙම තත්ත්වයක් පෙනෙන්න නැහැ.

මම උදාහරණ දෙකක් කියන්නම්. අපේ ගරු අධිකරණ ඇමතිතුමා සභාවේ ඉන්නවා. Ministry of Justice and National Integration භාර ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමා හමු වෙන්න මීට මාස කිහිපයකට කලින් AI Pazz කියන AI-related legal solution එකක් අරගෙන කණ්ඩායමක් ආවා; SME කෙනෙක් ආවා. ඔබතුමා ඇත්තටම ඒ වෙලාවේම කථා කරලා ලේකම්තුමාට කිව්වා, මේක අපේ Ministry එකත් එක්ක යන්න පුළුවන් system එකක්, ඒ නිසා කරුණාකරලා මේගොල්ලෝ එක්ක සාකච්ඡා කරන්න කියලා. එතුමා ඒ වෙලාවේම call කළා. එතුමාට ඒ උනන්දුව තිබෙනවා. හැබැයි, දැන් මාස හතරක් වෙනවා, මේ මොහොත වනතුරු ඒ අය එක්ක කිසිම සම්බන්ධතාවක් නැහැ. ඒකයි මම කියන්න ගියේ. ඒ කියන්නේ ඔබතුමාට ඒ උනන්දුව තිබෙනවා. නමුත්, එතැනින් පහළ අයට ඒ උනන්දුව නැහැ. ඒ solution එකම අපි Colombo University එකේ Law Faculty එකට, එහෙම නැත්නම් Peradeniya University එකට ගත්තොත්, ඒ අයට අවශ්‍යතාව තිබෙනවා, හැබැයි, budget නැහැ. ඔබතුමන්ලාට budget එක තිබෙනවා, උනන්දුව නැහැ. හැබැයි, ඒගොල්ලන්ට උනන්දුව තිබෙනවා, budget එක නැති ප්‍රශ්නයක් තිබෙනවා.

තවත් උදාහරණයක් තමයි, මම ඊයේ පෙරේදා කථා කරපු "rdmns.lk" system එක. එතැනදීත් වෙලා තිබෙන්නේ මොකක්ද? දුම්රියේ ගමන් කරන තරුණ කණ්ඩායමක් විසින්ම ඒ යන ජනතාව වෙනුවෙන් mobile app එකක් හදලා තිබෙනවා. ගිය ආණ්ඩුවත් එක්ක තමයි agreement එක ගැහුවේ. හැබැයි, මේ වනතෙක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. නමුත් ඇමතිතුමා හමු වෙන්න ගියාම, ඇමතිතුමා ඒ ගැන උනන්දුයි. දුම්රිය සාමාන්‍යාධිකාරීට ඇමතිතුමා උපදෙස් දෙනවා, මේක ක්‍රියාත්මක

කරන්න කියලා. හැබැයි, මේ වනතෙක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා, ජනාධිපතිතුමා මේකට උනන්දු වෙනවා. හැබැයි, මේකට මුළු රාජ්‍ය යන්ත්‍රණයම සූදානම් කරන්න ඕනෑ. ඒ mentality එක හදන්න ඕනෑ. ඒ නිසා මම පළමුව කියන්න කැමැතියි, ඩිජිටල් රාජ්‍යයකට යන්න නම්, අපි හැමෝම එක තැනකට එන්න ඕනෑ බව. විපක්ෂයේ අපිත් ඒ mentality එක ගන්න ඕනෑ. ඒ වාගේම ආණ්ඩු කරන ඔබතුමන්ලාත් ඒ mentality එක ගන්න ඕනෑ.

ඒ වාගේම කියන්න ඕනෑ තව දෙයක් තිබෙනවා. මෙතැනදී එන අනෙක් ප්‍රශ්නය තමයි, capacity building කියන එක. මොකද, මේ එක් එක් අමාත්‍යාංශවල capacity එක build කරන්නේ නැතුව අපට මේ ගමන යන්න හැකියාවක් නැහැ. මොකද, ඒවායේ ඒකාකාරීව කටයුතු කරපු රාජ්‍ය සේවකයෝ ගණනාවක් ඉන්නවා. ඒ කියන්නේ ඉහළ තලයේ සිටින රාජ්‍ය සේවකයන් වාගේම පහළ මට්ටමේ සිටින රාජ්‍ය සේවකයන් ගත්තොත්, ඒකාකාරී ක්‍රමවේදයක් ඔස්සේ කටයුතු කරපු අය තමයි ඉන්නේ. එතකොට එකවරම ඔවුන් වෙනස් කරනවා කියන එක අමාරු දෙයක්. ඒ වාගේම තමයි, හැම අමාත්‍යාංශයකම IT units තිබෙනවා. ඇමතිතුමා කිව්වා වාගේ වෙන වෙනම වැඩ කරලා තමයි ඒ ගොල්ලන්ට පුරුද්ද තිබෙන්නේ. ඒ ගොල්ලන්ට Digital Economy Ministry එකත් එක්ක සම්බන්ධ වෙලා කටයුතු කරලා අත් දැකීමක් නැහැ. ඒක මට හොඳටම තේරුණු තැන තමයි, කාරක සභාවලට යනකොට ඒ ඒ අමාත්‍යාංශවල IT unitsවල ඉන්න අය වෙන වෙනම කථා කරන්නේ. ඒ ගොල්ලෝ මේ රජයේ තිබෙන ලොකු picture එක දිහා බලලා නොවෙයි කථා කරන්නේ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. ඒ සියලුදෙනා එක තැනකට එන්න ඕනෑ, එහෙම නැත්නම් අපි මේ බලාපොරොත්තු වන දේ ඉෂ්ට වෙන්නේ නැහැ.

ඒ වාගේම රජය නිතරම කියන දෙයක් තමයි, startup ecosystem එකක් හදන්න ඕනෑ කියන එක. එතකොට ගොඩක් වෙලාවට අමතක වෙච්ච දෙයක් තිබෙනවා. ඒ කියන්නේ startup ecosystem එකක් හදන්න ඕනෑ, නමුත් අමතක වෙච්ච තැනක් තිබෙනවා. ඒ තමයි අපේ ප්‍රධාන කණ්ඩායමක් වන SME sector එකේ middle layer එක. ඒ SME sector එකේ middle layer එක අමතකවීම තුළ මේ IT field එකට ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට මම මේ කථා කරන්නේ WSO2, Virtusa වැනි top-notch companies ගැන නොවෙයි. ඒ වාගේම පහළ මට්ටමෙන් පටන් ගත්ත, investorsලා හොයා ගෙන යන ඊයේ පෙරේදා ආරම්භ කරපු startups ගැන නොවෙයි. මම මේ කථා කරන්නේ බිස්නස් හොයා ගෙන, cash flow එකක් හදාගෙන, ඒ වාගේම projects delivery කරන්න පුළුවන්, clientsලා කණ්ඩායමක් ඉන්න, employeesලා 100ක්, 150ක් ඉන්න middle layer එක ගැනයි. මොකද, ඔවුන්ට ලොකු capacity එකක් තිබෙනවා. ඔවුන්ට වැඩක් කරන්න පුළුවන් කණ්ඩායමක් ඉන්නවා. ඒගොල්ලන්ව මේ field එකේ ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් කිසිම වැඩ පිළිවෙළක් නැහැ කියන එකයි මගේ අදහස.

උදාහරණයක් විධියට, procurement system එක digitalize කරන්න ඕනෑ කියලා කිව්වා. හැබැයි, procurement system එක තුළ middle layer එකේ කණ්ඩායමට, SMEsලාට bid කරන්න පුළුවන් වාතාවරණයක් හදන්න ඕනෑ. දැන් මේ මොහොත වනවිට bid කරද්දී middle layer එකේ ඉන්න SMEsලාට ඒ criteria ගැළපෙන්නේ නැහැ. උදාහරණයක් විධියට මේකේ 10-year experience ඉල්ලනවා. එහෙම නැත්නම් government projects කරලා අත්දැකීම් තිබෙන්න ඕනෑ කියනවා. එහෙම නැත්නම් turnover එක ගැන හිතනවා. ඔය කාරණා බැලුවාම ඇත්තටම freshersලාට, එහෙමත් නැත්නම් ඒ ගැන capability එකක් තිබෙන SMEsලාට ඒකේ අවස්ථාවක් නැහැ.

අනෙක් කාරණාව මේකයි. අපි startups පටන් ගත්තාට විතරක් හරියන්නේ නැහැ. එතැනදී වැදගත්ම දේ තමයි, ඒක පවත්වාගෙන ගිහිල්ලා next-level product එකක් හදන තැනකට ගෙනයන්න අපි guidance එකක් ලබා දීම. ඒ කියන්නේ, commercialize කරන්න පුළුවන් වෙන විධියට. උදාහරණයක් විධියට marketing පැත්ත වෙන්න පුළුවන්, planning වෙන්න පුළුවන්, investment වෙන්න පුළුවන්, funding වෙන්න පුළුවන්, branding වෙන්න පුළුවන්. මේ කාරණා සම්බන්ධයෙන් විශේෂයෙන්ම government body එකක් ලෙසින් ඔවුන්ව ආරක්ෂා කර ගන්න ඕනෑ. මොකද, startups එනවා. හැබැයි, ඒවා අතරමඟ දාලා යන තත්ත්වයක් තමයි අපට දකින්න තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම startup ecosystem එකක් ඇති කිරීමට නම් ලංකාවේ මුදල් විතරක්,- ඒ කියන්නේ ලංකාව ඇතුළේ ආයෝජනය කරලා වැඩක් නැහැ. පිටින් ගෙනැල්ලා තමයි ආයෝජනය කරන්න ඕනෑ. එහෙම නැතුව අපට මේක ගොඩ දමන්න බැහැ. ලංකාව ඇතුළේම එහෙම ගොඩ ගිය අවස්ථා තිබෙන්නේ බොහොම අල්පයයි. උදාහරණයක් විධියට PickMe ආයතනය ගන්න පුළුවන්. ඒක ලංකාව ඇතුළේම ආයෝජනය කරලා ගොඩ ගිය තැනක්. විශේෂයෙන්, අනෙක් මෘදුකාංග - software - ඉංජිනේරු ආයතන ගත්තොත්, ඒවා අතිබහුතරයක් පිටින් ඇවිත් ආයෝජනය කරලා තමයි ලංකාවේ දැනට පවත්වාගෙන යන්නේ. ඒ නිසා මම ආණ්ඩුවෙන් අහන ප්‍රධානම කාරණය මේකයි. Startup ecosystem එකක් හදන්න නම්, ලංකාව investorsලා ගැවසෙන තැනක් බවට පත් කරන්න ඕනෑ. Investorsලා ගැවසෙන තැනක් කරන්න නම් venture capitalistsලා ගෙන්වන්න ඕනෑ; investorsලා ගෙනෙන්න ඕනෑ. ඒකට තිබෙන plans මොනවාද, ඒකට තිබෙන road map එක මොකක්ද, ඒකට තිබෙන allocations මොනවාද කියලා මම ආණ්ඩුවෙන් අහන්න කැමැතියි. මොකද, US Dollars 15 billion digital economy එකකට යනවා නම්, ඒ සඳහා තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියන එකයි අපි බලන්න ඕනෑ. මම ඒවාට පොඩි දේවල් කියලා කියන්න සූදානම් නැහැ. මොකද, ඒවා සාපේක්ෂව හොඳ දේවල්. නමුත් US Dollars 15 billion digital economy එකකට අපි යනවා නම් ඊට වඩා වෙනම level එකකින් අපි හිතන්න ඕනෑ. ඒ වාගේම අපි target කරන්න ඕනෑ. අපි conferences තියලා වැඩක් නැහැ. Conferences තියලා ඒවාට investorsලා ආවාට ඒගොල්ලන් ආයෝජනය කරන්නේ නැහැ. එතකොට අපි investorsලා ගෙන්වන්න ඕනෑ. විශේෂයෙන්ම Australian, US, European or Singaporean investorsලා ගෙනෙන්න අපට කටයුතු කරන්න පුළුවන්. ඒකට අපට තිබෙන එක වාසියක් තමයි cheap labour. අනෙක් එක තමයි cost එක අඩු වීම. ඒ රටවලට සාපේක්ෂව ගත්තොත් අපේ රටේ cost එක අඩු නිසා අපට යම් වාසියක් තිබෙනවා.

හැබැයි, අපි එදා ECTA ගිවිසුම අත්සන් කළා නම්, මේ වෙනකොට ඉන්දියාව ලබන ජයග්‍රහණයෙන් කොටසක් අද අපටත් ලැබෙනවා. එදා ඒක කකුලෙන් ඇදීම ගැන මම නැවත වතාවක් සිහිපත් කරන්න යන්නේ නැහැ. ඒවා තමයි මේ රටට සිදුවෙච්ච කාලකණ්ණි දේවල්. එදා අපි ECTA ගිවිසුමත් එක්ක ගියා නම්, අද ඉන්දියාව යම් ජයග්‍රහණයක් ලබනවා නම්, අපටත් ඒ පස්සෙන්ම එල්ලිලා යන්න තිබුණු අවස්ථාව තමයි මඟ හැරුණේ. කමක් නැහැ.

මම හිතන විධියට මේ මොහොත වනවිට ඒක සාකච්ඡාවට ලක් වෙනවා. මේ අවස්ථාවේ මම කියන්න ඕනෑ එක දෙයක් තිබෙනවා. ඒ කියන්නේ, බැලූ බැල්මට මේ තිබෙන තත්ත්වයත් එක්ක මේ IT sector එක සම්බන්ධව ඉන්දියාවට තමයි වැඩි දෙනෙකුගේ අවධානය යන්නේ. නමුත් ලංකාවට අනන්‍ය වෙච්ච unique capabilities ටිකක් තිබෙනවා. අපේ product quality එක,

[ගරු චතුර ගලප්පත්ති මහතා]

අපේ communication හොඳයි. ඒ වාගේම ethics හොඳයි. මෙන්න මේ කාරණා නිසා තමයි අදටත් මේ field එක survive වෙලා තිබෙන්නේ. ඒ නිසා, මේ රටේ startup ecosystem එකක් හදන්න, SMEsලා grow කරන්න fund කරන venture capitalistsලා, investorsලා මේ රටට ගෙනෙන්න මේ ආණ්ඩුවට තිබෙන සැලසුම් සහ road map එක මොකක්ද කියලා මම නැවත වතාවක් අහන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, investorsලා ගෙනෙද්දී වැදගත්ම කාරණාවක් තමයි tax benefits කියන්නේ. Tax benefits නැතුව ආයෝජකයන් එන්නේ නැහැ. අපි ඒ දේ කථා නොකර හිටියොත්, ලොකු අසාධාරණයක් කරනවා. දැන් තිබෙන companiesවලට අපි තවදුරටත් දිගින් දිගටම tax ගහන්න ගත්තොත් මේ තිබෙන ආයතන වුණත් ඒ, ඒ රටවලට යන්න පුළුවන්. උදාහරණයක් විධියට, සිංගප්පූරුවේ මොකක් හරි software එකක් අපි මේ රටේ හදනවා නම්, දැන් කරන්නේ මොකක්ද? ඒගොල්ලන් ලංකාවේ මේ ආයතන ස්ථාපනය කරන්නේ නැහැ. ඒගොල්ලන් සිංගප්පූරුවේම mother company එකක් එක්ක join වෙනවා. එහෙම කරලා ලංකාවේ operations විතරක් යනවා. Software developersලා ටික විතරක් ඉන්නවා. උදාහරණයක් විධියට අපි හිතමු, 50දෙනෙක් ඉන්න company එකක් කියලා . ඒගොල්ලන්ට දෙන්නේ ඩොලර් 2,000යි නම්, ඩොලර් ලක්ෂයක් එවනවා. ඒක investment එකක් නොවෙයි.

අන්න ඒ නිසායි අපි කියන්නේ, මීට වඩා tax benefits ගැන හිතලා US Dollars 15 billion digital economy එකකට යනවා නම් අපට පොඩ්ඩක් අඩිය පස්සට තියලා ආයෝජකයින්ට රටට එන්න අවස්ථාව දෙන්න වෙනවා කියලා.

අනෙක් කාරණය මෙයයි. මේ ආණ්ඩුව බලයට එද්දී කිව්වේ අපේ Personal Income Tax එක රුපියල් 200,000 සීමාවේ තබනවා කියලා. නමුත් ඒක රුපියල් 150,000ට තමයි අඩු කළේ. මම හිතනවා, IT field එකේ ඉන්න අයගේ salary එක පටන් ගන්නේම මේ මට්ටමෙන් කියලා. IT companies ගත්තොත්, ඒගොල්ලන් middle layer එකේ ඉන්නේ නැහැ. ඒගොල්ලන් යම් අත්දැකීමක් ලබා ගත් ගමන් පිටරටකට යනවා. එතකොට IT companiesවල ඉන්නේ අත්දැකීම් අඩු කණ්ඩායම් සහ අලුත්ම කණ්ඩායම්. අද IT companies පවත්වාගෙන යන්න බැරි වෙලා තිබෙනවා, විශේෂයෙන්ම මේ Personal Income Tax rate එකත් එක්ක. ඒ වාගේම රටේ ආර්ථික ස්ථායීතාව, registration process එක, land issues, labour issues වැනි කාරණා ගොඩක් venture capitalistsලා ගෙන්වන්න අපට බලපාන කාරණා විධියට මම දක්වන්න කැමැතියි.

ඒ වාගේම මට තවත් කාරණයක් කියන්න තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, would you please wind up?

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

මේ සියලු දේ - startups - කරන්න නිකම් බැහැ. Startups කරන්න අපට තිබෙන හොඳම දේ මෙයයි. විශේෂයෙන්ම අපේ education system එකට entrepreneurship mentality එකක් හදන වැඩ පිළිවෙළකුත් තිබෙන්න ඕනෑ. ඒක අපේ පාසල් පද්ධතියේත් නැහැ, university පද්ධතියේත් නැහැ. ඒ නිසා මම රජයෙන් ඉල්ලීමක් කරනවා, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පාසල් පද්ධතියට entrepreneurship mentality එකක් හදන්න අවශ්‍ය විෂයයන් ඇතුළත් කරන්න කියලා. හැබැයි, පෞද්ගලික විශ්වවිද්‍යාල තුළ දැන් අපි දකින දෙයක් තිබෙනවා. Private universities දැන් ඔවුන්ගේ syllabus එක update කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඔවුන් AI subjects සහ projects කරනවා. ඒ වාගේම ඒගොල්ලන්ගේ වෙනම competitions තිබෙනවා. හැබැයි government universitiesවල ඒ තත්ත්වයන් අඩුවීම තුළ අපට ගැටලුවක් මතුව තිබෙනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ IT field එකේ දැනට තිබෙන ලොකුම ගැටලුව පිළිබඳව ඔබතුමාත් දන්නවා. මේ ක්ෂේත්‍රයේ graduatesලා වෙන්න එන අයට අවශ්‍ය internship එක දැන් කරගන්න විධියක් නැතුව තිබෙන්නේ. උදාහරණයක් විධියට ගත්තොත්, Colombo University එකේ නම් degree එක ගන්න අවශ්‍ය වූ internship එක දැන් කෙළින්ම අයින් කරලා තිබෙනවා. මොකද, internship දෙන්න අද ආයතන නැහැ. ඒ කියන්නේ, IT sector එක grow වුණේ නැහැ. විශේෂයෙන්ම කොරෝනා වසංගත කාලයෙන් පස්සේ හැමෝම IT field එකට ගිය නිසා අද වෙලා තිබෙන්නේ මොකක්ද? අද IT field එකෙන් ගොඩක් අය එළියට එනවා. මොකද, ඔවුන්ට රැකියා ලබා ගැනීමේ අවස්ථාව අද නොලැබී යනවා. ඒකට ඉක්මන් solution එකක් දෙන්න ඕනෑ. මම ඒකට ආණ්ඩුවට යෝජනා කරනවා, - මම දන්නේ නැහැ, මේක ටිකක් complex scenario එකක් වෙන්න පුළුවන් - පුළුවන්කමක් තිබෙනවා නම් internships ලබා දෙන්න කියලා. මොකද, internships ලබා දීම IT field එකේ වැදගත් කොටසක් වනවා. එතැනදී යම් කණ්ඩායමක්, යම් ආයතනයක් ඒ ආයතන ටිකට internships ලබා දෙනවා නම්, ඒකට tax benefit එකක් දෙන්න පුළුවන් ක්‍රමවේදයක් හදනවා නම් ඒක හොඳ දෙයක් වෙයි කියලා මම විශ්වාස කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, I may have to call upon the next speaker because we have to suspend for lunch. There is one more speaker before lunch.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
Give me one more minute, Sir.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have exceeded your time by three minutes. Okay, just one minute.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
මගේ කථාව අවසන් කරන්න කලින් මේ කාරණයත් කියන්න ඕනෑ, ගරු සභාපතිතුමනි. විශේෂයෙන්ම අපේ තනුර දිසානායක සහෝදරයා මතක් කළා, data centres ගැන. මම හිතන විධියට, data centres සඳහා Rs. 500 million තමයි මේ Budget එකෙන් වෙන් කරලා තිබෙන්නේ. එතැනදී කියන්න ඕනෑ ප්‍රධානම කාරණාවක් තිබෙනවා.

මාතර ටෙලිකොම් එකෙන් දැන් data centre එකක් හදාගෙන යනවා. ඒකට විතරක් වැය වෙලා තිබෙනවා, Rs. 600 million. මාතර ටෙලිකොම් එකෙන් හදන ඒ data centre එකට Rs. 600 million වැය වෙලා තිබෙනවා නම්, රජය ඒවාට වෙන් කරලා තිබෙන්නේ Rs. 500 million නම් මම හිතන විධියට ඒක විහිළුවට ලක් වන කාරණාවක්. එතැනදි වුණත් මම කියන්නේ data centresවලට හොඳ ආයෝජකයෝ ගේන්න කියලායි. විශේෂයෙන්ම පුළුවන් නම් Microsoft, Amazon, Google, Tata, Oracle, IBM කියන investorsලා ගෙනැල්ලා ඒගොල්ලන්ට ආයෝජනය කරන්න පුළුවන් පරිසරයක් හදලා දෙන එක තමයි අපි කළ යුත්තේ.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. අනාගතයේ අපට මුහුණ දෙන්න තිබෙන ලොකුම ගැටලුව තමයි, AI තාක්ෂණය. අපි AI තාක්ෂණයට මුහුණ දිය යුතුයි. මම දන්නවා, නියෝජ්‍ය ඇමතිතුමා ඒ සඳහා හොඳ කණ්ඩායමක් පත් කරලා තිබෙනවා කියලා. අපි හිතනවා, ඒ කණ්ඩායමත් එක්ක එකතු වෙලා රටේ අනාගතයට ගැළපෙන තරුණ පරපුරක් බිහි කිරීම වෙනුවෙන්, AI තාක්ෂණයට මුහුණ දෙන්න පුළුවන් සමාජයක් බිහි කර ගැනීම වෙනුවෙන් ඔබතුමා ඒ කටයුතු කරයි කියලා. අපි වැඩිම අවධානයක් යොමු කරන්නත් ඕනෑ ඒ කටයුත්තටයි කියන කාරණාව මතක් කරමින්, තව බොහෝ දේවල් කියන්න තිබුණත් කාලය නැති නිසා මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, what is your point of Order? We are constrained for time. Please, -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I am raising this under Standing Order No. 92(2). ස්ථාවර නියෝග 29(1) යටතේ මම urgent Privilege Question එකක් submit කළා, මට threaten කළා කියලා. හැබැයි අද වෙනකම් ඒක approve වෙලා නැහැ. මට විතරක් එහෙම වෙන්නේ ඇයිද දන්නේ නැහැ. என்னுடைய இந்தக் கேள்விக்குரிய பதிலைச் சொல்ல முடியுமா? තව කාරණයක් මට කියන්න ඕනෑ. இன்று எங்களுடைய வேலுப்பிள்ளை பிரபாகரன் அவர்களுடைய பிறந்தநாள். அவருக்கு பிறந்தநாள் வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Speaker will be notified about this.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. (Dr.) Harsha de Silva. You have 10 minutes and your time starts now.

[අ.භා. 12.22]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු සභාපතිතුමනි, අද අතිශයින්ම වැදගත් අමාත්‍යාංශයක් ගැන විනාඩි 10ක් හරි කථා කරන්න ලැබීම ගැන සන්තෝෂයි. කාරණා කෙටියෙන් තමයි සඳහන් කරන්න වෙන්නේ.

මම ඉස්සෙල්ලාම පෙන්වන්න කැමැතියි, "Sri Lanka: State of the Economy 2025, Technology for Change, Driving the Digital Economy" කියන IPS එකෙන් ලියපු report එක. මේ රටේ ආර්ථිකය ගොඩ ගැනීම සඳහා සහ ඩිජිටල් ආර්ථික වර්ධන වේගය ලබා ගැනීමට අපට යටිතල පහසුකම් අවශ්‍ය වන්නේ කොහොමද කියලා තමයි එහි සඳහන් වන්නේ. මම හිතනවා, මේක අතිශයින්ම වැදගත් වාර්තාවක් කියලා. මේ වාර්තාව base කරගෙන ඔබතුමන්ලාගේ බොහෝ programmes හදන්න පුළුවන්. Digital economy එක හැදීම පිළිබඳව අපි සම්පූර්ණයෙන්ම - සියයට 100ක් - එකඟයි. මේක කවුරු ආණ්ඩුවේ හිටියත් කළ යුතු වැඩක්. අපේ Economic Blueprint එකේත් මුලින්ම තිබෙන්නේ, digital public infrastructure එක සැදිය යුතුයි කියලා. එතැන කිසිම අවුලක් නැහැ. හැබැයි මේක කරනකොට අපි technology පැත්ත විතරක් නොවෙයි, ප්‍රජාතන්ත්‍රවාදය සහ අපේ මානව හිමිකම් ගැනත් අවධානය යොමු කරන්න ඕනෑ. ඒ සම්බන්ධව තමයි මම අද මෙතැන කථා කරන්න යන්නේ. මොකද, අපි මේකට සියයට 100ක් එකඟයි. නමුත්, මේ වැඩේ අවුල් කරගන්න එපා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන හිතන්නේ නැතුව ආර්ථිකය digitize කරන්න ගිහිල්ලා සමහර රටවල් සම්පූර්ණයෙන්ම අගතියට පත් වෙලා තිබෙනවා.

මේ ළඟදි තිබුණා, "Common Edge" කියලා event එකක්. එහිදී කථා කළා, Saritha Irugalbandara, Dr. Sanjana Hattotuwa, Dr. Saranee Gunathilaka සහ Benislos Thushan කියන නීතිඥවරයා. එහිදී ඉදිරිපත් කළේ මෙහි අනෙක් පැත්ත. මම කැමැතියි, ඒ ලේඛනය ඉදිරිපත් කරන්න. මම ඒ ලේඛනය **සභාගත*** කරනවා.

Dr. Sanjana Hattotuwa විසින් ඉදිරිපත් කරලා තිබෙනවා, මේ coin එකේ අනෙක් පැත්ත. මේක වැදගත් document එකක්. ඒ document එකත් මම **සභාගත*** කරනවා.

ඔහු කියනවා, concerns 5ක් තිබෙනවා කියලා. මම ඔහුත් එක්ක එකඟ වනවා, බොහෝ දේ සම්බන්ධයෙන්. පළමු කාරණය, lack of contextual understanding. එතකොට දැන් අපි මේ digitalize කරන්න යන මේ රටේ තිබෙන සන්දර්භය මොකක්ද? දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය, ඊට පස්සේ වගවීම සහ විනිවිදභාවය. මේ digitalization එකට කලින් පෞද්ගලික අංශයේ හැසිරීම තිබුණේ කොහොමද? ඔහු කියන විධියට මේක මනඃකල්පිත ශ්‍රී ලංකාවක ස්ථාපනය කරන්න යන digital ශ්‍රී ලංකාවක්ද කියන ප්‍රශ්නය පැන නඟිනවා. එතකොට අපි හිතන්න ඕනෑ, අපේ දේශපාලන රාමුව ගැන. මේ රටේ යුද්ධයක් තිබුණා. අපි සාමය ඇති කරන්න මහා ලොකු වැයමක් - උත්සාහයක් - දැරුවා. එතකොට උතුරු නැඟෙනහිර කොටස් සම්බන්ධ කරගන්නේ කොහොමද, ඔවුන්ගේ ප්‍රශ්න හඳුනා ගෙන තිබෙනවාද? ඔවුන් ඩිජිටල් ආර්ථිකයත් සමඟ සටන් කරපු එක, පොර බදපු එක සම්බන්ධයෙන්, ඔවුන්ගේ දුරකථනවලට තිබිච්ච restrictions සම්බන්ධයෙන් අපි සාකච්ඡා කරලා තිබෙනවාද? ඒ නිසා සන්දර්භය ගැන අපේ අවධානය යොමු කරන්න ඕනෑ. ඒක තමයි, contextual understanding.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

දෙවැනි කාරණය, absence of public dialogue. ඔහු කියනවා, “There is virtually no public or media discussion regarding this critical project” කියලා. ඒක ඇත්ත. මොකද, ඩිජිටල් ශ්‍රී ලංකාව නිර්මාණය කිරීමේදී unique ID එකක් ගැනීම සම්බන්ධයෙන් මහජනතාව සමඟ ඇත්තවශයෙන්ම වෙලා තිබෙන කතිකාව මොකක්ද? අපි එහෙම එකක් දැකලා නැහැ. අඩුම ගාණේ විපක්ෂය සමඟ හෝ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළාද? එක දවසක් මන්ත්‍රීවරුන්ට කථා කරලා ආචාර්ය හාන්ස් විජේසූරිය මැතිතුමා එක්ක සාකච්ඡාවක් කළා. ඒ හැරෙන්න කිසිම දෙයක් නැහැ. ඇත්තවශයෙන්ම මම විශ්වාස කරනවා, මේ සම්බන්ධව Parliamentary Select Committee එකක් පත් කරන්න ඕනෑ කියලා. මම කලිනුත් කිව්වා, මෙවැනි විශාල change එකක් කරනකොට සියලුදෙනාගේම අදහස් ඒ සඳහා ගන්න ඕනෑය කියලා.

අපට lecture කරලා විතරක් වැඩක් නැහැ. අපිත් මේ සම්බන්ධයෙන් උනන්දුවෙන් කටයුතු කරනවා. මේ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරන්න platform එකක් අපි හදන්න ඕනෑ. ඒ සඳහා මහ ජනතාවගේ, විපක්ෂයේ සහ සිවිල් සමාජයේ අදහස් ලබා ගන්න ඕනෑ. ඔබතුමන්ලා සිවිල් සමාජය සමඟ human rights සම්බන්ධයෙන්, ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් එන ගැටලු ගැන සාකච්ඡා කළාද, උතුරු නැඟෙනහිර ජනතාව සමඟ සාකච්ඡා කළාද කියන ප්‍රශ්නය අපට අහන්න සිද්ධ වෙනවා.

පුරවැසිභාවයට - citizenship එකට - නොයෙකුත් බලපෑම් ඇති වෙනවා. පුරවැසිභාවය අතිශයින් වැදගත් දෙයක්. ඒ සම්බන්ධයෙන් අපි මීට වඩා අවධානය යොමු කරන්න වෙනවා. මොකද, එක පැත්තකින් digital economy එක ගෙනෙන ගමන්, අනෙක් පැත්තෙන් Online Safety Act - OSA - එක තිබෙනවා. ඒකට එහා පැත්තෙන් තිබෙනවා, ඔබතුමන්ලාගේ Personal Data Protection Act එක. මෙතැන ගැටුමක් තිබෙනවා. එක පැත්තකින් OSA එකෙන් කරන්න යන දේ නොවෙයි, Data Protection Act එකෙන් කරන්න හදන්නේ. එතකොට, ඒක digitalization structure එක ඇතුළට ගෙනෙන්නේ කොහොමද?

ඔහු ඉදිරිපත් කරන තුන්වන කාරණාව පෞද්ගලික කාරණයක් වුණත් මම ඒ ගැන සඳහන් කරනවා, මේ ලේඛනය සභාගත කරන්න බලාපොරොත්තු වන නිසා. "The Hans Wijayasuriya Case Study". මෙතැනදී ඔහු ඉදිරිපත් කරන්නේ පෞද්ගලික ආයතනයක ප්‍රධානියෙක් හැටියට එවකට ඒ ආයතනයේ නිලධාරින්ගේ හැසිරීම, දුරකථන විසන්ධි කිරීම සහ ඒකේ වගවීම කවුද ගන්නේ කියන එක ගැනයි. හැබැයි, මම මේ සම්බන්ධයෙන් කාරණයක් කියන්න ඕනෑ. අපි ගරු කරනවා, ආචාර්ය හාන්ස් විජේසූරිය වැනි පුද්ගලයෙක් අරගෙන මේ වැඩේ කරන එක සම්බන්ධයෙන්. අපට ඒ ගැන කිසි අවුලක් නැහැ; ඒක හොඳ දෙයක්. නමුත්, සිවිල් සමාජය අහන ප්‍රශ්නවලටත් අපට යම් විසඳුම් අවශ්‍ය වෙනවා. මොකද, අපට අවශ්‍ය වෙන්නේ කාගේ හරි lecture එකකට වඩා discourse එකක්, සාකච්ඡාවක්. මොකද, මේක එක කණ්ඩායමකට විතරක් භාර දෙන්න පුළුවන් කාරණයක් නොවෙයි.

ඔහු මතු කරන හතරවන සහ අවසාන කාරණය තමයි, vapourware and infrastructure, "Because there are no publicly available policy documents in Sinhala or Tamil..." ඔහු කියන කාරණය පිළිබඳව මම හොයා බැලුවා. "ඩිජිටල් ශ්‍රී ලංකා" කියන විශාල ව්‍යාපෘතිය පිළිබඳව සිංහලෙන් හෝ දෙමළෙන් කිසිම තැනක, කිසිම දෙයක් සඳහන් වෙන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. ඔබතුමන්ලාගේ website එකට ගිහින් මම ඒ ගැන හොයා බැලුවා. නමුත්, ඒකේත් නැහැ; ICTA එකේත් නැහැ; "1919"ත් නැහැ; කොහේවත් නැහැ. Dr. Sanjana Hattotuwa කියන්නේ, ලෝකයේ කිසිම රටක තමන් පාවිච්චි කරන භාෂාවලින් මේක සමාජගත කරලා, සාකච්ඡා නොකර කිසිම දවසක මේ වාගේ විශාල පරිවර්තනයක් කළේ නැහැ කියායි.

ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයේ website එකේ ඔබතුමාගේ පින්තූරය ලොකුවට තිබෙනවා; ජනාධිපතිතුමාගේ පින්තූරය ලොකුවට තිබෙනවා; කරපු conference පිළිබඳ විස්තර ලොකුවට තිබෙනවා. ගරු සභාපතිතුමනි, හැබැයි මේ කරන්න යන ඩිජිටල් පරිවර්තනය ගැන සිංහලෙන් හෝ දෙමළෙන් ඒකේ කිසිම දෙයක් සඳහන් වෙන්නේ නැහැ. ඕනෑම website එකක් භාෂා තුනෙන්ම තිබෙන්න ඕනෑ කියලා නීතියක් තිබෙනවා. අපි ඒක පිළිගන්න ඕනෑ. දෙමළ ජනතාවට, මුස්ලිම් ජනතාවට, පශ්චාත් යුද ප්‍රශ්න තිබෙන ජනතාවට තමන් කරන්නේ මොකක්ද කියන එක දෙමළ භාෂාවෙන්, නැත්නම් සිංහල භාෂාවෙන් දැන ගන්න තිබෙන්න ඕනෑ. නැත්නම් මේ පරිවර්තනයට මේ සමාජයේ සියලුදෙනාගේම සහයෝගය ලබා ගන්නේ කොහොමද? ඒ නිසා මේක භාෂා තුනෙන්ම පළ කළ යුතුමයි. නමුත්, ඒ කටයුතු කරන අවස්ථාවේදී අමතක කරන්න එපා, අපේ රටේ සන්දර්භය, දේශපාලන ව්‍යුහය සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව තිබෙන ප්‍රශ්න සම්බන්ධයෙන්. ඔබතුමන්ලා, අපි එකතු වෙලා උද්ඝෝෂණය කළේ, සටන් කළේ ඒකාධිපතිවාදයට විරුද්ධවයි. සමහර digital phone blocking වෙන්න පුළුවන්, එහෙම නැත්නම් tapping වෙන්න පුළුවන්, එහෙමත් නැත්නම් phones විසන්ධි කරලා දමන ඒවා වෙන්න පුළුවන්. අපි දැක්කා, පොලීසියේ මාධ්‍ය ප්‍රකාශකවරයෙකුත් මේ ගැන කථා කරනවා. එම නිසා ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා අවධානය යොමු කරන්න.

ඒ වාගේම, ඔබතුමා මම මේ කියන්න යන කාරණය ගැන සඳහන් කළේ නැහැ. නමුත්, ඊයේ තමයි bid එක close කරලා තිබෙන්නේ 15,000,000 preprinted polycarbonate cardsවලට. මේ 15,000,000 cardsවලට පෙරේදා ටෙන්ඩර් එක close කළා නම්, අඩු ගාණේ ඔබතුමාගේ කථාවේදී ඒ ගැන කියන්න තිබුණා. අපට ලොකු විවාදයක් තිබෙනවා, මේ 15,000,000 polycarbonate cards අවශ්‍යද, නැද්ද කියන එක සම්බන්ධයෙන්. මොකද, අපි යන්නේ digital system එකකට නම්, අපට ආපසු cards මොනවාටද? අපි මේ ගැන සාකච්ඡා කළා; ඔබතුමායි, මමයි මේ සභාවේදී ඒ ගැන විවාද කළා. අපි SOC එකේදී මේ ගැන අහනකොට ඔබතුමන්ලාගේ ප්‍රධානියා වන Dr. Hans Wijayasuriya කිව්වේ මොකක්ද?

"මේක අත්‍යවශ්‍ය දෙයක් නොවෙයි, හැබැයි අපට පුරුද්දක් තිබෙනවා, කාඩ් එකක් අපේ සාක්කුවේ තියාගෙන ගිහිල්ලා, ඒ නිසා අපට ටික දවසකට තව කාඩ් එකක් ගන්න පුළුවන් වෙයි" කියලා තමයි ඔහු කිව්වේ. කාඩ් එකක් ගත්තාට අවුලක් නැහැ. මම එහෙම කරන්න එපා කියන්නේ නැහැ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. නමුත්, මේ polycarbonate cards අවශ්‍යද? ලෝකයේ සමහර රටවල hybrid system එකක් කරලා තිබෙනවා. ඒක අපි පිළිගන්නවා. හැබැයි, අපි ඉන්දියාවේ Aadhaar වාගේ එකක් එක්ක නම් කරන්නේ, ඒගොල්ලන් අලුතින් කාඩ් අච්චු ගහන්නේ නැහැ. *[බාධා කිරීමක්]* මම කථා කරලා ඉවර වුණාම ඔබතුමා කථා කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, please.

මම කැමැතියි, ඔබතුමාට මේ ගැනත් කියන්න. කීය ගණනේද, මේ කාඩ් එකක් ගන්න යන්නේ? කාඩ් මිලියන 15ක් අවශ්‍යද? මොකද, අපි කලින් කථා කරනකොට කිව්වා, කෙටි කාලීනව පොඩි කාඩ් ප්‍රමාණයක් හරි ගන්න පුළුවන් කියලා. මොකද, සමහර වෙලාවට කාඩ් වැදගත් වෙනවා. සමහරු include වෙන්නේ නැති වෙයි, හැමෝටම smart phones නැති නිසා. අපි

DigiWallet එකක් පාවිච්චි කරනවා නම්, super app එකක් හදනවා කියලා එතුමා කථා කළා. ඒ super app එකේ අපට authentication එක, අපේ certificate එක, අපේ Unique twelve-digit ID එක තියා ගන්න පුළුවන් නම් හොඳයි. නමුත්, මෙකේ අවශ්‍යතාව මොකක්ද? ඒ නිසා මම කියන්නේ අපි මේ සාකච්ඡාව තව ඉදිරියට අරගෙන යන්න ඕනෑය කියන එකයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. (Dr.) Harsha de Silva, you have exceeded your time.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

අපි කිසිම විධියකට මේකට විරුද්ධ නැහැ. ඒ සඳහා අපේ සහයෝගය තිබෙනවා. නමුත් මෙවැනි වියදම් කරනකොට ඒකේ අවශ්‍යතාව පිළිබඳව මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියටත්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති හැටියටත් ඔබගෙන් මේ ප්‍රශ්නය අහනවා. මේ පිළිබඳව අපි තවදුරටත් සාකච්ඡා කරන්න ඕනෑ. මේ සම්බන්ධව මීට වඩා බොහෝ දේ කථා කරන්න තිබුණත්, කාලය නොමැති නිසා මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Eranga Weeraratne, you are on your feet. You may clarify, but we are not going into a debate on that.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා කථා කරද්දි කියපු පොඩි කාරණයක් සම්බන්ධයෙන් මම නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. කාඩ් මිලියන 15ක් සඳහා tender කළාට මිලියන 5ක් තමයි අවශ්‍යතාව හැටියට තිබෙන්නේ. අපේ සමස්ත පද්ධතිය ගත්තාම ඒකේ ඩිජිටල් මාධ්‍යයෙන් digital ID එකක් accept කරන්න පුළුවන් තත්ත්වයක් නැහැ. ඒක හින්දා මොකක් හරි හේතුවක් මත පොලීසියෙන් කවුරු හරි නැවැත්තුවාම ඒ ස්ථානයේදී තමන්ගේ අනන්‍යතාව ඔප්පු කරන්න අවශ්‍යයි. ඒකට කාඩ් එකක් අවශ්‍යයි. ඒකට අවශ්‍ය අවම ප්‍රමාණය වන මිලියන 5ක් පමණයි ගන්න යන්නේ. ඔය tender එක close කරලා නැහැ. එය දෙසැම්බර් මැද වෙනකම් කල් දැම්මක් කරලා තිබෙනවා. මොකද, ඒ මිලියන 5ක් කියන එක නිවැරදි කරන්න amendment එකක් එනවා. ඒක හින්දා අපි ඕක නිවැරදි කරන්න කටයුතු කරලා තිබෙනවා. මිලියන 15කට යන්නේ නැහැ කියන එක මම වගකීමෙන් කියනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Please give me 15 seconds, Sir.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Okay. Hon. (Dr.) Harsha de Silva, we are not going into a debate. We are close to suspending for lunch. I will give you 15 seconds. You can clarify and that is it.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ඔබතුමා කෙසේ කිව්වත් මගේ මේ කථාව කරන්න විනාඩි දෙකකට කලින් තමයි, මම මේ කාරණා ඔබතුමාගේ අමාත්‍යාංශයේ website එකෙන් download කළේ. මෙහි තිබෙන්නේ මිලියන 15ක් කියලා. මෙහි දිනයක් දාලා තිබෙනවා. Procurement එක transparent වෙන්න ඕනෑ; විනිවිදභාවයක් තිබෙන්න ඕනෑ. මිලියන 15ක් tender කරලා, මිලියන 5ක් ගන්නේ කොහොමද? එහෙම නම් සම්පූර්ණයෙන් procurement එකේ විශාල අවුලක් තිබෙනවා. එහෙම නම්, මේ procurement එක ගැන අපට හොයන්න වෙනවා; විමර්ශනය කරන්න වෙනවා. එහෙම කරන්න බැහැ. තමන්ට ඕනෑ, ඕනෑ වෙලාවට ටෙන්ඩර් වෙනස් කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. (Dr.) Harsha de Silva, we will suspend now.

Order, please! The ongoing Proceedings of the Committee of the whole Parliament shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය]සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද මගේ කථාවේ විෂය පථය කරගන්නේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයයි. රජයක් විධියට අපි බලයට පත් වී පළමුවැනි අවුරුද්ද තුළ විශේෂයෙන්ම ආර්ථික ස්ථායීකරණය ඇති කර ගනිමින්, 2025 අය වැය තුළින් ඉදිරිපත් කළ සියලු ඉලක්ක ළඟා කර ගනිමින් රට ඉදිරියට ගන්න කටයුතු කරගෙන යාමේදී අපිට දැන් කරන්න තිබෙන ප්‍රධානම කාර්යයක් තමයි නිෂ්පාදන ආර්ථිකයක් ඇති කර ගැනීම. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල ප්‍රබෝධයක් ඇති කරන්න නම්, රට ඉස්සරහට ගන්න නම්, අපේ ආර්ථිකය සවිමත් කරගන්න නම්, ප්‍රධාන වශයෙන්ම කළ යුත්තේ රට තුළ නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීමයි.

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මෙහිදී මම research and development - R&D - කියන ක්ෂේත්‍රය ගැන කථා කරන්න කැමැතියි. ඉතිහාසය දිහා බැලුවාම අපට පෙනී යනවා, විශේෂයෙන්ම ලංකාව විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට වැය කර තිබෙන්නේ දළ දේශීය නිෂ්පාදිතයෙන් ඉතාම අඩු ප්‍රතිශතයක් බව. සියයට 0.12ක් වාගේ තමයි අතීතයේ එම ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් කර තිබෙන්නේ. එම කාල වකවානුවල අපේ කලාපය තුළ හු දේශපාලනික වශයෙන් අප හා සම තත්ත්වයකින් පැවැති රටවල් ගත්තාම, ජපානය සියයට 3.6ක් විද්‍යා හා තාක්ෂණ විෂයයට වෙන් කර තිබුණා. ඒ වාගේම දකුණු කොරියාව සියයට 4.6ක්, මැලේසියාව සියයට 1ක්, චීනය සියයට 3ක් යනාදී වශයෙන් වෙන් කර තිබුණා. ඒ අනුව අපිට පෙනී යනවා, එම කාල වකවානුව තුළ විද්‍යාත්මක පර්යේෂණ ක්ෂේත්‍රය අපේ රට තුළ නොසලකා හැර තිබුණාය කියන කාරණය.

ඉන්දියාව වාගේ රටක් ගත්තොත්, ඒ රටේ ස්වාභාවික සම්පත් බහුලව තිබෙනවා. ඒ වාගේම විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය තුළ උගතුන් ඉන්නවා. දකුණු කොරියාව වාගේ රටක් ගත්තාම, ස්වාභාවික සම්පත් හිඟයක් තිබෙන රටක්. ඒ වුණාට එම රට විද්‍යා හා තාක්ෂණයෙන් පෝෂණය වුණු මිනිසුන් රාශියක් සිටින රටක්. ශ්‍රී ලංකාව ගත්තාම, ස්වාභාවික සම්පත් තිබෙන රටක්; හැබැයි, ලොකුවට එහෙම තිබෙන රටකුත් නොවෙයි. නමුත් අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ, අපේ රට තුළ ඛනිජ සම්පත්; මුතු, මැණික් තිබෙන බව. ඒ වාගේම රට වටේම මුහුද තිබෙනවා. වැවිලි ක්ෂේත්‍රය ගත්තත්, තේ, පොල්, රබර්, කුළුබඩු ආදී කෘෂි නිෂ්පාදනය ඉතාම වැදගත් වෙනවා. මේ ක්ෂේත්‍ර ඉදිරියට ගන්න නම් අපිට සිද්ධ වෙනවා, අලුත් තාක්ෂණය යොදා ගෙන ඒවාට අදාළ පර්යේෂණ සිදු කරන්න. ඒ සඳහා රජය විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ඒ කියන්නේ, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය ගැන හිතන, ඒ ඔස්සේ රට ඉස්සරහට ගන්න ඕනෑය කියා හිතන, ඒ හරහා නිෂ්පාදන ආර්ථිකය ඇති කරන්න ඕනෑය කියන මතයේ තමයි රජය ඉන්නේ.

විශේෂයෙන්ම මෙහිදී කියන්න ඕනෑ, මේ සඳහා කොච්චර මුදලක් වෙන් කර තිබෙනවාද කියන කාරණය. අපි ගණනය කර බැලුවොත්, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වෙනුවෙන් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා, බිලියන 21ක්. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට බිලියන 6ක් වෙන් කර තිබෙනවා. නමුත් කෘෂිකාර්මික ක්ෂේත්‍රය ඇතුළු සෑම ක්ෂේත්‍රයකම පර්යේෂණ සහ සංවර්ධනය කියන අංශය වෙනුවෙන් වෙන් කර තිබෙන මුදල එකතු කර බැලුවාම ඒ සඳහා බිලියන 21ක් වෙන් කර තිබෙනවා.

මේ තුළ ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම අල ගොවීන්ගේ ප්‍රශ්නය ගැන මේ දවස්වල ගොඩක් කථා වෙනවා. ඒ ප්‍රශ්නය ගැන සොයා බැලුවාම පෙනී යන කාරණය තමයි අල ගොවීන්ට යන නිෂ්පාදන පිරිවැය වැඩියි කියන එක. ඔවුන්ගේ නිෂ්පාදන පිරිවැයෙන් සියයට 40ක්ම යන්නේ බීජ සඳහා. මොකද, බීජ පිටරටින් ගෙන්වනවා. ඒකටත් විදේශ විනිමය වැය වෙනවා. අපේ රටේ බීජ නිෂ්පාදනය කියන එක සම්පූර්ණයෙන්ම අධෛර්යවත් කරලා තිබෙන්නේ. ඒ වාගේම තමයි පොහොර හා අනෙකුත් කෘෂි යෙදවුම්. ඒවා අපේ රටට ගැළපෙන, පසට ගැළපෙන, මේ දේශගුණයට ගැළපෙන ඒවා නොවෙයි. ඒ නිසා තමයි ගොඩක් වෙලාවට අපේ දේශීය අල ගොවියාට මේ තරගකාරිත්වයට මුහුණ දෙන්න බැරි වෙන්නේ.

සාමාන්‍යයෙන් අපේ රටේ අල පරිභෝජනය වාර්ෂිකව මෙට්‍රික් ටොන් 225,000ක් පමණ වෙනවා. ඒ, සාමාන්‍ය අගය. නමුත් මේ රටේ නිෂ්පාදනය වන්නේ මෙට්‍රික් ටොන් 70,000ක්, 80,000ක් වාගේ ප්‍රමාණයක්. එතකොට රට තුළ පවතින තත්ත්වයත් එක්ක අපට පිටරටින් අල ගෙනෙන්න වෙනවා. එසේ ගෙන්වන එක අඩු කිරීමට නම් අපේ රටේ නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ. නිෂ්පාදනය වැඩි කරනවා වාගේම, අපි නිෂ්පාදන පිරිවැය අඩු කරගන්නත් ඕනෑ. ඒ අනුව කඩිනම් බීජ ගොවිපොළ සංවර්ධන වැඩසහනට බිලියන 0.5ක් වෙන් කර තිබෙනවා. නව තාක්ෂණය යොදා ගැනීමට සහ දේශගුණික විපර්යාසවලින් සිදුවන බලපෑම් අවම කිරීමට බිලියන 0.4ක් වෙන් කර තිබෙනවා. බීජ නිෂ්පාදන සහ මිලදී ගැනීමේ ජාතික වැඩසටහනට බිලියන 1.2ක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම බලශක්ති ක්ෂේත්‍රය ගත්තොත්, ගොඩක් ආයෝජනවලට විවෘත කරලා තිබෙනවා. ඒ අතර green hydrogen ගැන කථා කරලා තිබෙනවා. අනාගතයේදී green hydrogen වාගේ ඉන්ධනවලට යන එක වැදගත් වෙනවා. මොකද, අතුරු ඵලයක් විධියට ලැබෙන green ammonia පොහොර නිෂ්පාදනයට යොදා ගන්න පුළුවන්. අන්න ඒ වාගේ පර්යේෂණ හරහා ඉස්සහරට යන්න ඕනෑ.

ඊළඟට, බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කථා කරනකොට rooftop solar ගැන ගොඩක් කථා කළා. නමුත්, පවත්නා තත්ත්වය එක්ක ගත්තාම, rooftop solarවලින් කොච්චර විදුලිය ජනනය වෙනවාද කියලා පෙනෙන්නේ නැහැ. දැන් ඒ සම්බන්ධයෙන් පර්යේෂණ කරලා, මෙරට ඉංජිනේරුවන්, පර්යේෂකයන් විසින් ඒ සඳහා inverter controllers හඳුන්වා දීලා තිබෙනවා. මුල් අදියරේදී plan කරලා තිබෙන්නේ units 2,000ක්, කිලෝවොට් 100ට වැඩි. ඒ units 2,000 නියමු ව්‍යාපෘතිය අවසන් වුණාම - මෙගාවොට් 650යි පාලනය කරන්න පුළුවන්. එතකොට තමයි control room එකේ ඉඳන් control කරන්න පුළුවන් වෙන්නේ, සූර්ය බලයෙන් කොච්චර විදුලිය ජනනය වෙනවාද කියලා - දෙවැනි අදියරේදී කිලෝවොට් 5ට ඉහළ units 42,000ක් plan කරලා තිබෙනවා. එතැනින් පුළුවන්, මෙගාවොට් 1,500ක් ලබා ගන්න. දැනට 2,100ක්, 2,200ක් වාගේ නේ සූර්ය බලයෙන් ලැබෙන්නේ. අන්න ඒ වාගේ තමයි පිළිවෙළට, ක්‍රමයට යන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, දැන් පර්යේෂණ සිද්ධ වෙනවා. ඒ වාගේම ගොඩක් වෙලාවට නව සොයාගැනීම් කරනවා. නමුත් ප්‍රමුඛතාව අනුව ඒවා වාණිජකරණය වීම සිද්ධ වෙලා නැහැ. ඒ නිසා ඒ වෙනුවෙන් රුපියල් මිලියන 1,200ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. එතැනදී විශේෂයෙන්ම කියන්න ඕනෑ, ජනාධිපතිතුමාගේ කථාවේදීත් කිව්වා, රාජ්‍ය පර්යේෂණ හා සංවර්ධන ප්‍රතිපත්ති කෙටුම්පත මේ වෙනකොටත් සකස් කරලා තිබෙන බව. ඒ අනුව ප්‍රමුඛතා හඳුනා ගන්නවා. ඒ වාගේම පර්යේෂණ වාණිජකරණය දක්වා ගෙන යනවා. එතකොට ඒ සමස්ත ක්‍රියාවලිය අධීක්ෂණය කරන්න ඕනෑ. ඒ සඳහා මධ්‍යගත වෙච්ච පරිපාලන ආයතනයක් විධියට ජාතික පර්යේෂණ සංවර්ධන හා වාණිජකරණ ආයතනය එක පැත්තකින්, අනෙක් පැත්තෙන් පර්යේෂණ සහ සංවර්ධනය පිළිබඳ ජාතික සභාව යන ආයතන දෙක ස්ථාපනය කිරීම සඳහා 2026දී පනතක් ගෙන එනවා. ඒ සියලු කාරණා එක්ක අපේ රටට අවශ්‍ය විධියට මේ වැඩ පිළිවෙළ ඉස්සරහට යන්න ඕනෑ.

ඊළඟට, අධ්‍යාපනය සඳහා සියයට 6ක් වෙන් කළාද කියලා ප්‍රශ්න කළා. නමුත් 2026 අවුරුද්ද අධ්‍යාපනය වෙනුවෙන් ඉතිහාසයේ වැඩිම මුදල් ප්‍රමාණය වෙන් කර තිබෙන අවුරුද්ද බවට පත් වුණා. ඒ වාගේම විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය සඳහාත් ඉහළම වෙන් කිරීම කර තිබෙනවා. ඒ අනුව ක්‍රමානුකූලව ඉස්සරහට ගිහිල්ලා අනෙක් රටවල මට්ටමට යන එක තමයි සිද්ධ වෙන්නේ.

ඒ වාගේම අද තවත් කථාවකදී කියැවුණා, data centres ගැන. ඒ සඳහා වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 500යි, ඒක ප්‍රමාණවත් නැහැ කියලා කිව්වා. ඉතින් කියවා බැලුවාම ඉතා පැහැදිලිව තේරෙනවා, ඒ තිබෙන්නේ අවශ්‍ය පහසුකම් සැලසීමට බව. විදෙස් ආයෝජන හරහා ළඟා කරන්න පුළුවන් ඉලක්ක ගැන පැහැදිලිව කථා කර තිබෙනවා මේ අය වැයෙන්. ඒකේ එක ප්‍රධාන දෙයක් තමයි data centres කියන්නේ. ඒ කියන්නේ ලෝකයේ ප්‍රධාන ආයෝජකයන් ගෙන්වා ගන්න. දැන් මේ අවුරුද්දේ පසුගිය කාල සීමාව තුළ මිලියන 827ක විදේශ ආයෝජන ලැබිලා තිබෙනවා. ඒ වාගේම සමස්තයක් විධියට මේ අවුරුද්ද අවසන් වන විට බිලියනයක විදේශ ආයෝජන ලැබෙනවා. එතකොට ඊළඟ අදියර වශයෙන් තමයි මම කිව්වේ, green hydrogen වාගේ ඒවාට යන්න ඕනෑ කියලා. මොකද, ඉන්දියාවේ තිබෙනවා; ජපානයේ වර්ධනය කර තිබෙනවා. ඒ නිසා අපේ රටේත් පරිසර දූෂණයක් සිදු නොවන ඉන්ධනයක් ලෙස green hydrogen හදලා, ඒක අපනයන මට්ටමට ගෙන යන්න, ඒ වාගේම වාහන ධාවනයට භාවිත කරන්න, ඒකේ අතුරු ඵලය ගන්න, අන්න ඒවාට තමයි ආයෝජකයන් කැඳවන්නේ. ඒ වාගේම තමයි transport electrification කියන එක. ඔන්න ඔය ක්ෂේත්‍රවලට තමයි එන්නේ. ඒ සියල්ල ඔස්සේ තමයි ඔය කියන පර්යේෂණ සිද්ධ වෙන්නේ.

මේ කියන පර්යේෂණත් එක්ක හැම තැනකදීම වැදගත් වනවා අපේ මිනිස් සම්පත. අපේ රටේ ගොඩක් අමතක කරපු දෙයක් තමයි මිනිස් සම්පත. ඛනිජ සම්පත්, අර සම්පත්, මේ සම්පත් ඔක්කෝම වාගේම මිනිස් සම්පත යොදාගෙන හැම දෙයක්ම ඒ විධියට develop කරන්න, ඒ තිබෙන ආයතනවලට නිවැරදි ව්‍යුහය හැදුවොත්, ඒ වාගේම අපේ රටේ විශ්වවිද්‍යාලවලට, ඒ පර්යේෂණ ආයතනවලට මුදල් වෙන් කළොත්, ඒ වාගේම ඒවාට ඇගැයීම් හම්බ වුණොත්, ඒ වාගේම ඒ සියලු දේවල් අපේ රටේ ප්‍රමුඛතාව අනුව වාණිජකරණය කළොත්, ඒ ක්ෂේත්‍රය දියුණු වනවා. ඒ කියන්නේ, අපේ රටේ ඉහළට ගන්න ඕනෑ මොනවාද කියන එක මත වාණිජකරණය වෙන්න ඕනෑ. ඒක තමයි මම කිව්වේ, බලශක්ති ක්ෂේත්‍රයේදී එක පැත්තකින් green hydrogen තිබෙනවා; අනෙක් පැත්තෙන් සූර්ය බලය තිබෙනවා. එහෙම නැතුව සම්ප්‍රදායික විධියට විපක්ෂය හැමදාම කියනවා වාගේ සූර්ය විදුලියට අපි එච්චර support එකක් දෙන්නේ නැහැ වාගේ බොරු කතන්දර කියලා හරියන්නේ නැහැ. එදාත් කිව්වා, මේ අවුරුද්දේ සූර්ය විදුලියෙන් මෙගාවොට් 702ක් එකතු කරලා තිබෙනවා. හැබැයි ඒක දැන් තමයි නිවැරදි ක්‍රමවේදයට ගන්නේ. ඒකට තමයි grid එක smart වෙන්නේ.

ඒකට විද්‍යාත්මක පර්යේෂණ කරලා, අපේ රටෙන් එළියට යන විදේශ විනිමයත් රඳවා ගෙන, අපේ රටේ තිබෙන සම්පත්ම යොදාගෙන, අපේ රටේ මානව සම්පත යොදාගෙන පර්යේෂණ කරමින් ඉස්සරහට යන්න ඕනෑ. ඒක තමයි මා කියන්නේ අපි දැන් ආර්ථික ස්ථායීකරණයකට ඇවිත් තිබෙනවා කියලා. 2028 වර්ෂයෙන් පසුව ණය ගෙවා ගන්න බැරි වෙයි වාගේ දේවල් විපක්ෂයෙන් කිව්වාට ඒ සියලු ඉලක්කවලට යන මාර්ග පෙන්වා ඉන් ඉස්සරහට තමයි දැන් අප යන්නේ. නිෂ්පාදන ආර්ථිකයක් ඇති කරන්න, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට, ව්‍යවසායකයන්ට අවශ්‍ය විධියට ඒ පහසුකම් දෙන්න තමයි විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ නවෝදයක් ඇති කරන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.11]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමාත් විශේෂයෙන්ම ඩිජිටල්කරණය සඳහා මුදල් වෙන් කිරීම ගැන කථා කළා. මුදල් නම් වෙන් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. හැබැයි ඉතින්, ඒ මුදල්වලින් වැඩ කරනවාද කියන එක තමයි ප්‍රශ්නයකට තිබෙන්නේ. මුදල් වෙන් වෙනවා. ගරු ජනාධිපතිතුමාත් ඒ බව මෙතැනදී කියනවා. හැබැයි, එය ප්‍රායෝගිකව බිම් මට්ටමේ කොතරම් දුරට සාර්ථක වෙලාද, නැද්ද කියන ප්‍රශ්නය අහන්න වෙනවා. විද්‍යා හා තාක්ෂණ විෂය භාර අමාත්‍යවරයා මේ වෙලාවේ ගරු සභාවේ නැහැ. අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ටෙන්ඩරයක් ගැන කථා කළා විතරයි, ටෙන්ඩරය කොහොමද වෙනස් කළේ කියලා ඇහුවා විතරයි එතුමා ගියා. හැබැයි, පසුගිය අය වැයෙන් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයට වෙන් කරපු මුදල්වලින් කොච්චර වියදම් කළාද කියන ප්‍රශ්නය අපට තමුන්නාන්සේලාගෙන් අහන්න වෙනවා. පසුගිය අය වැයෙන් වෙන් කරපු මුදල්වලින් කෙතරම් ප්‍රමාණයක් මේ රටේ ඩිජිටල් ආර්ථිකයට, රාජ්‍ය සේවය digitalize කරන්න, ජනතා සේවාවන් - citizen services - digitalize කරන්න ආයෝජනය කළාද කියන ප්‍රශ්නයත් අපට ඔබතුමන්ලාගෙන් අහන්න සිද්ධ වෙනවා. වැඩ පිළිවෙළ ගැන ප්‍රශ්නයක් නැහැ. මොකද, ඔය වැඩ පිළිවෙළම තමයි අපිත් පටන් ගත්තේ. ආණ්ඩුව වෙනස් වනවාත් එක්කම ඒක නතර වුණා. නතර කරපු තැනින් පටන් අරගෙන දැන් ආයෙත් එය කරගෙන යනවා. හැබැයි, මේක ප්‍රායෝගිකව බිමේ ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඔබතුමන්ලා වගකීම බාර ගත යුතුයි. මොකද, මේක අලුත් දෙයක් නොවෙයි. ඒ හින්දා ඒ වැඩ පිළිවෙළ ගැන මම කථා කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, හැබැයි ඉතින් ජනාධිපතිතුමාම පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා, සන්නිවේදන කුලුනු 100ක් - අපේ ගම්වල කියන විධියට ටෙලිෆෝන් කනු - හදන්න මුදල් වෙන් කළාම, කුලුනු 30යි හදා ගන්න පුළුවන් වුණේ කියලා. තමුන්නාන්සේලාට ටෙලිෆෝන් කුලුනක්වත් ගහගන්න බැරි නම්, එතැනින් එහාට මේ ආණ්ඩුවේ ක්‍රියාවලිය පිළිබඳව, වැඩ පිළිවෙළ පිළිබඳව, ඩිජිටල්කරණය පිළිබඳව අපි අමුතුවෙන් කථා කරලා වැඩක් නැහැ. ඒ හින්දා ඔබතුමන්ලා මේක අවංකව කරනවාද, නැද්ද කියන එක අපි බලාගෙන ඉන්නවා.

ධීවර කර්මාන්තය පිළිබඳවත් මම කථා කරන්න ඕනෑ. ජනාධිපතිතුමා මැතිවරණ කාලයේදී කිව්වා, "රට වටේටම මුහුද තිබෙනවා. මම මුහුදෙන් ආර්ථිකය ගොඩ දානවා, IMF එක ඕනෑ නැහැ" කියලා. "අපි මේ මුහුදෙන් ආර්ථිකය ගොඩ දානවා; අපිට IMF එක ඕනෑ නැහැ" කියලා තමයි ජනාධිපතිතුමා පසුගිය මැතිවරණ කාලවලදී කිව්වේ. එහෙම කියලා ඔබතුමන්ලා බලයට ආවා. එහෙම කියලා බලයට ඇවිල්ලා දැන් IMF එකත් එක්ක ඉන්නවා. ඒක හරි. හැබැයි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව, ගිය අවුරුද්දේ මිරිදිය ධීවර කර්මාන්තය සියයට 34කින් කඩාගෙන වැටිලා. ඒ වාගේම, කරදිය ධීවර කර්මාන්තය සියයට 5කින් කඩාගෙන වැටිලා. අද වනකොට තමුන්නාන්සේලා වැව්වලට මාළු පැටව් දමන්නේ නැහැ. නමුත්, "වැව් ආරක්ෂා කරන්න කටයුතු කරනවා" කියලා කෘෂිකර්ම ඇමතිවරයා කියනවා. ඒ ධීවර සමිති එක්ක කොහොම ගනුදෙනුවක් තිබෙනවාද කියන්න අපි දන්නේ නැහැ. හැබැයි, මිරිදිය ධීවර කර්මාන්තය සම්පූර්ණයෙන් කඩාගෙන වැටෙන තැනට අද පත් වෙමින් තිබෙනවා.

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

තමුන්නාන්සේලා තාක්ෂණය ගැන කථා කරනවා. ලෝකයම aquacultureවලට මාරු වෙනවා. ලෝකයම aquacultureවලට, fish farmingවලට මාරු වෙනවා. එය අපේ මිරිදිය මත්ස්‍ය වගාව හා සමානව තාක්ෂණයත් එක්ක බද්ධ වෙච්ච කාරණයක්. 1990 ගණන්වල aquaculture සියයට 20ක් ලෙසයි ලෝක ආර්ථිකයේ තිබුණේ. අද එය සියයට 50ක ආර්ථිකයක් බවට පත් වෙමින් යනවා. නමුත්, අප තවමත් එතැන සියයට 5කටත් අඩුවෙන් ඉන්නේ. හැබැයි, තමුන්නාන්සේලා මුදල් වෙන් කරනවා. මම දැක්කා, පසුගිය අය වැයෙනුත් ඉස්සත් වගාවට තමුන්නාන්සේලා රුපියල් මිලියන 200ක් වෙන් කළ ආකාරය. හැබැයි, ඒ රුපියල් මිලියන 200න් කොච්චර ප්‍රමාණයක් ආයෝජනය කළාද කියන ප්‍රශ්නය අපට තමුන්නාන්සේලාගෙන් අහන්න වෙනවා. අපට දැන ගන්න තිබෙන විධියට ඒ රුපියල් මිලියන 200 ඒ විධියටම තිබෙනවා, අල්ලලාවත් නැහැ. නමුත්, දැන් තමුන්නාන්සේලා ජාතික ආර්ථිකයේ වර්ධනයට ධීවර කර්මාන්තය උපයෝගී කර ගන්නා ආකාරය ගැන කථා කරනවා. මොකද, ගරු ජනාධිපතිතුමා මුළු රටම ගොඩ දාන්න ගියේ මුහුදෙන්. ඔන්න මහ මුහුදෙන් රටම ගොඩ දාලා, IMF එකත් යවලා ආර්ථිකය හදනවා කියලා ජනාධිපතිතුමා බලයට ආවාට පසුව ලංකාවට කරවල ගෙන්වීම මෙට්‍රික්ටොන් 461කින් වැඩි වෙලා තිබෙනවා. කරවල කර්මාන්තය කියන්නේ ගම්වල කුඩා industry එකක් විධියට කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන් නියැළෙන කර්මාන්තයක්. ලංකාවට කරවල ගෙන්වන ප්‍රමාණයත් එක්ක ගත්තාම ආනයනය මෙට්‍රික්ටොන් 461කින් වැඩි වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රටට උම්බලකඩ ආනයනය කිරීම මෙට්‍රික්ටොන් 383කින් වැඩි වෙලා තිබෙනවා. අපේ මහ මුහුදෙන් රට ගොඩ දානවා කියලා බලයට ඇවිල්ලා, දැන් කරවලත් වෙනදාට වඩා වැඩිපුර පිට රටින් ඊළඟට, අපි අපනයනය ගැන කථා කරමු. මොකද, එය අපේ ආර්ථිකයට ඩොලර් උපයන ක්‍රමවේදයක් නේ.

තමුන්නාන්සේලා බලයට ආවේ, මහ මුහුදෙන් රට ගොඩ දාන්න පුළුවන්; අපට වෙන කවුරුත් ඕනෑ නැහැ කියලා නේ. ඉස්සත් වගාව ගන්න. ඉස්සත් export income එක අඩුයි. ඉස්සත් export කළ ප්‍රමාණය ගත්තොත්, පසුගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ මෙට්‍රික්ටොන් 427ක් අඩුයි. ඒ වාගේම තමයි කකුළුවන් අපනයනය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාවට අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව කකුළුවන් අපනයනය කළ ප්‍රමාණය මෙට්‍රික්ටොන් 1,133ක් අඩු වෙලා තිබෙනවා. ඊළඟට, ටූනා මාළු අපනයනය ගන්න. ටූනා මාළු 2021 මෙට්‍රික්ටොන් 9,936ක් ලංකාවෙන් පිටතට යවා තිබෙනවා. හැබැයි, 2025දී කීයද? මෙට්‍රික්ටොන් 4,700යි; අඩු වෙලා. මහ මුහුදෙන් ලැබුණු ආදායම කෝටි 800ක් අඩු වෙලා තිබෙනවා. හැබැයි, මහ මුහුදෙන් රට ගොඩ දාන්න ආපු අයයි ඔබතුමන්ලා. මහ මුහුදෙන් රට ගොඩ දාලා සමස්ත ආර්ථිකයම ගොඩ නගන්න පුළුවන් කියලා තමුන්නාන්සේලා ඒ කාලයේ කිව්වා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ රටේ ජනගහනයෙන් සියයට 18ක් ධීවර කර්මාන්තයෙන් තමයි යැපෙන්නේ. ඒ අයගෙන් සියයට 85ක් මුහුදුකරයේ ජීවත් වෙන්නේ. සියයට 18ක් ධීවර කර්මාන්තයේ නියැළෙනවා. පවුල් අනුව ගත්තත් එහෙමයි. සංඛ්‍යාවක් විධියට ගත්තත්, පුද්ගලයන් ලක්ෂ 20කට වැඩි ප්‍රමාණයක් ධීවර ක්ෂේත්‍රයෙන් යැපෙනවා. එදා අපි ධීවර නිවාස යෝජනා ක්‍රම පටන් ගත්තා; වරායවල් ටික හැදුවා; ඉලක්ක දුන්නා; ධීවරයාට අවශ්‍ය සහන ටික දුන්නා; තෙල් සහනය වෙලාවට දුන්නා. ධීවරයාගේ ජීවන තත්ත්වය උසස් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කළා. ඒ මඟින් එක පැත්තකින් ධීවරයාගේ දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න සාගර විශ්වවිද්‍යාලය හැදුවා. තවත් පැත්තකින්, ධීවරයන්ගේ නිවාස යෝජනා ක්‍රම ටික ක්‍රියාත්මක කරන්න කටයුතු කළා. අද ඒ සියල්ල නොකෙරෙන අතරේත් ධීවර ක්ෂේත්‍රය පිළිබඳවත් විශාල ගැටලුවකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. ධීවර කර්මාන්තය දිනෙන් දින කඩාගෙන වැටෙනවා. ජනාධිපතිතුමා මෑතකදීත් කියනවා මම දැක්කා, සැටලයිට්වලින් හොයලා මාළු අල්ලන ක්‍රමයක් හඳුන්වා දෙනවා කියලා. කලිනුත් කිව්වා, සැටලයිට්වලින් හොයලා මාළු අල්ලා ගන්න පුළුවන් ක්‍රමයක් හදලා දෙනවා කියලා. එහෙම නේද, ගරු ඇමතිතුමා? හැබැයි, තවම එවැන්නක් නැහැ. අපට දැන ගන්න ලැබී තිබෙනවා, ඒ සඳහා සමාගම් කිහිපයක් ඉදිරිපත් වෙලා තිබෙන බව. හැබැයි, ඔබතුමන්ලා ඒවා භාර අරගෙන නැහැ. මම දන්නේ නැහැ හේතුව මොකක්ද කියලා. ඒක ඔබතුමන්ලා තමයි දන්නේ. ඔබතුමන්ලා ඒවා භාර අරගෙනත් නැහැ. ලෝකයේ අනෙක් රටවල මේ තාක්ෂණය පාවිච්චි වෙනවා. එය අලුත් දෙයක් නොවෙයි. තමුන්නාන්සේලා ධීවර කර්මාන්තය ආරක්ෂා කරනවා වාගේම, ඊළඟ පරම්පරාවට ඒ දැනුම දීලා ලෝකයත් එක්ක බද්ධ වෙච්ච අලුත් පරම්පරාවේ ධීවර තරුණයෙකු හදන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද? නැහැ. මොකද, මේ රටේ නොයෙක් ක්ෂේත්‍ර ආරක්ෂා කරන්න පැහැදිලිවම ඔබට වුවමනාවක් නැහැ. ලංකාවේ කර්මාන්තකරුවා ආරක්ෂා කරනවාට වඩා ඔබේ මානසිකත්වය තමයි, පිටින් ගෙනැල්ලා කන්න දෙන එක ලාභයි කියන එක. සුළු ධීවර කර්මාන්තයේ නියැළෙන අය ගැන හිතන්නේත් එහෙමයි.

අද බහුදින ධීවර යාත්‍රාවල වාගේම සුළු ධීවර කර්මාන්තයේ නියැළෙන අයටත් අසීමිත ගැටලුවලට මුහුණ පාන්න සිදු වෙලා තිබෙනවා. ඔබ ඒවාට ඇහුම්කන් දෙනවාද? හැබැයි අපි දකිනවා, ධීවර සමිති දේශපාලනීකරණය කරන්න ඔබ කටයුතු කරන ආකාරයක්. ඔබ විශ්වාස කරනවා, නිලධාරීන් භය කරගෙන, ඔබේ නිලධාරීන් පත් කරගෙන ඔබේ දේශපාලන න්‍යාය පත්‍රය ධීවර කමිටු ඇතුළේ ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියලා. ඔබේ දේශපාලන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම ඔබේ දේශපාලන කාරණයක්. ඒක නොවෙයි ප්‍රශ්නය. ඔබේ දේශපාලන න්‍යාය පත්‍රය ඒක ඇතුළේ ක්‍රියාත්මක වනකොට ධීවරයාට මොකක්ද වෙන්නේ කියන එකයි ප්‍රශ්නය. ධීවරයාගේ ජීවන තත්ත්වය උසස් කරන්න ඔබ කටයුතු කරනවා නම්, ඒකෙන් හරි අපට හිත හදා ගන්න පුළුවන්. අඩු ගණනේ ආදායම වැඩි කරන්න ඔබතමුන්නාන්සේලා කටයුතු කරනවා නම්, ඒ ගැන සිතලාත් අපට හිත හදා ගන්න පුළුවන්. හැබැයි, මේ දෙකම වෙන්නේ නැති කොට කර්මාන්තය දිනෙන් දින කඩාගෙන වැටෙනවා නම්, කඩා වැටෙන්න නොදී ඒ කර්මාන්තය රැක ගන්න ඔබට වුවමනාවක් නැත්නම්, ඔබ පත් කළ ඇමතිවරයාට වුවමනාවක් නැත්නම්, ආණ්ඩුවට වුවමනාවක් නැත්නම් ඒ තුළ මොකද වෙන්නේ? එම කාරණය මේ රටේ ලක්ෂ 20කට වැඩි පුරවැසියන් සංඛ්‍යාවකට සෘජුව හා වක්‍රව බලපානවා.

අද නොරොච්චෝලේ ධීවරයන්ට ගැටලුවක් තිබෙනවා. මම දන්නේ නැහැ, ඔබතුමන්ලාගේ අමාත්‍යතුමා ගිහිල්ලා ඒ ගැන සාකච්ඡා කළාද කියලා. මාදැල් ධීවරයන්ට ගැටලුවක් තිබෙනවා. අපි දන්නේ නැහැ, තමුන්නාන්සේලා ඒ ගැන සාකච්ඡා කළාද කියලා. අපි ඒ අය මුණ ගැහුණාම, සුළුපන්න ධීවර කර්මාන්තයේ නියැළෙන අයගේ ගැටලුවක් තිබෙන බව දැන ගත්තා. ඒවා පිළිබඳව තමුන්නාන්සේලා සාකච්ඡා කරනවාද කියලා අපි දන්නේ නැහැ. මොකද, අප දකින දේ සහ අප එම ජනතාව මුණ ගැහුණාම අපට දැන ගන්න ලැබෙන දේ තමයි, ආණ්ඩුවක් විධියට ඔබ ඒ අයට ඇහුම්කන් දීමක් කරන්නේ නැහැ කියන එක; ඔබ ඒ අය වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ කියන එක. ඒ අයගේ ප්‍රශ්න තේරුම් ගන්න ඔබට වුවමනාවකුත් නැහැ. ඒවාට විසඳුම් දෙන්න ඔබට කොහෙත්ම වුවමනාවක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
හොඳයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

අය වැයෙන් වෙන් වන මුදල් ආයෝජනය වෙන්නේත් නැහැ. පසුගිය කාලයේ ගරු ඇමතිතුමා කිව්වා, "හිටපු ඇමතිවරයා VMS එකෙන් රුපියල් 500ක් පගාව ගන්නවා" කියලා. ඒ, රුපියල් 5,500ට තිබුණු කාලයේ. දැන් රුපියල් 6,000 කරලා.

ඒ ඇමතිවරයා රුපියල් 5,500ට තිබුණු කාලයේ රුපියල් 500ක් පගාව ගත්තා නම්, ඒක රුපියල් 6,000ක් වුණාම දැන් රුපියල් 1,000ක් ගන්න ඕනෑ, කවුරුහරි. තෙල්වලින් රුපියල් 150ක් ගහනවා කිව්වා. හැබැයි, දැන් ඒ රුපියල් 150 අඩු කරලා ධීවරයාට තෙල් දෙනවාද, තමුන්නාන්සේලා? අඩු ගණනේ ඔබතුමන්ලා කථා කරනවාද ධීවරයාට මේ රුපියල් 150 සහනය දෙන්න කියලා? නැහැ. අද තිබෙන තෙල් වියදමත් එක්ක, ධීවර ක්ෂේත්‍රයේ තිබෙන වියදමත් එක්ක, ධීවරයාට ප්‍රායෝගිකව යම් ලාභයක් උත්පාදනය කරන්න පුළුවන් තැනකට මේ කර්මාන්තය පරිවර්තනය වෙලා නැහැ. ඒකට අවශ්‍ය තාක්ෂණය බද්ධ කිරීම, ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙලා නැහැ. අපි හැම දාම කියනවා වාගේ මේ පාර්ලිමේන්තුව ඇතුළේ කරීකයෝ 159ක් ඉන්නවා. හැබැයි, වැඩකාරයෝ 159ක් ඉන්නවාද, නැද්ද කියන ප්‍රශ්නය නේ තිබෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අද ඒක පැහැදිලිව ඔප්පු කර තිබෙනවා මේ රටට, පසුගිය අය වැයෙන් සහ ඔබතුමන්ලාගේ ක්‍රියාකලාපයෙන්. ඔබතුමන්ලා හැසිරිච්ච විධියට, ඔබතුමන්ලාට වෙන් වෙච්ච මුදල් ගමේ ගිහින් වියදම් කළ ආකාරය බැලුවාම, ඔබතුමන්ලාට දීපු වගකීම් ගම තුළ කොච්චර ඉටු කළාද නැද්ද කියලා බැලුවාම, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අධ්‍යයනය කර බැලුවාම පැහැදිලිව පෙනෙනවා තමුන්නාන්සේලා පසුගිය වසරේ අය වැය ලේඛනයෙන් ප්‍රායෝගිකව මේ රටේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න තිබුණු කාරණා ක්‍රියාත්මක කර නැති බව. ඒ නිසා ඔබතුමන්ලා කොච්චර බලාපොරොත්තු දෙන්න උත්සාහ කළත්, ජනාධිපතිතුමාගේ පැය හතරහමාරේ මෙවර අය වැයත් ඒ විධියටම තමයි නතර වෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.21]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද විශේෂයෙන් ධීවර අමාත්‍යාංශය පිළිබඳ යම් කාරණයක් කියන්න තමයි තිබෙන්නේ.

கௌரவ அமைச்சர் அவர்கள் இங்கு இருப்பது எனக்குச் சந்தோஷம்! எங்களுடைய கிழக்கு மாகாணத்தில் மீன்பிடித் தொழிலில் ஈடுபடுகின்ற மக்கள் தொடர்ச்சியாக எதிர்நோக்குகின்ற பிரச்சினைகள் சம்பந்தமாக கௌரவ அமைச்சரிடம் யார் எங்கு வைத்துச் சொன்னாலும், உடனடியாக அது சம்பந்தமாக அவர் தன்னுடைய கவனத்தைச் செலுத்தக் கூடியவர் என்பதை நாங்கள் ஏற்றுக்கொள்ளத்தான் வேண்டும். அதை அவர் எந்தளவுக்கு successஆக முடித்தார் என்பது வேறு விடயம். At least, he listened to us.

கௌரவ அமைச்சர் அவர்களே, உங்களுக்குத் தெரியுமோ, தெரியாது! திருகோணமலை மாவட்டத்தில் ஏறத்தாழ 1,845 மீனவக் குடும்பங்களின் தொழில் இல்லாமல் போகக்கூடிய வகையில், Global Ceylon Seafoods (Pvt.) Limited என்ற கம்பனி agreement ஒன்றைச் செய்திருக்கிறது. அதாவது, cage fishing எனப்படுகின்ற கூடுகளில் போட்டு மீன்களை வளர்ப்பது சம்பந்தமானது. இது நல்ல விஷயம்! இதன்மூலம் வெளிநாட்டில் இருந்து காசு கிடைக்கின்றது; இல்லையென்று சொல்லவில்லை. எனினும், இதன் காரணமாக மீன்பிடித் தொழிலை இழக்கக்கூடிய நிலையில் 1,845 மீனவக் குடும்பங்கள் இருக்கின்றன. குறிப்பாக, தக்வா நகரில் 550 குடும்பங்களும், மூதூர் கிழக்கில் 250 குடும்பங்களும், கடற்கரைச்சேனையில் 150 குடும்பங்களும், சாம்பூரில் 200 குடும்பங்களும், நெய்தல் நகரில் 120 குடும்பங்களும், தாஹா நகரில் 75 குடும்பங்களும், பழநகரில் 50 குடும்பங்களும், அணைச்சேனையில் 100 குடும்பங்களும், நடுத்தீவில் 200 குடும்பங்களும் தொழிலை இழக்கக்கூடிய நிலையில் இருக்கின்றன. எனவே, நான் உங்களிடம் தயவாகக் கேட்டுக்கொள்வது என்னவெனில், அந்த மீன்பிடித் தொழிலாளர்களைச் சந்தித்துக் கலந்துரையாடுங்கள் என்றுதான். நீங்கள் அவர்களுக்கு இரண்டு வகையில் உதவி செய்யலாம். ஒன்று, அவர்களுக்கு மாற்று வழிமூலம் மீன்பிடிப்பதற்கான சந்தர்ப்பத்தை வழங்குவது. அடுத்தது, இந்தக் கம்பனிக்கு மாற்று இடமொன்றைக் கொடுப்பது. இந்த மீனவர்களுக்குக் காசு கொடுப்பதில் எந்தப் பிரயோசனமும் இல்லை. ஏனெனில், அவர்களுடைய ஜீவனோபாயம் - livelihood - மீன்பிடியில்தான் தங்கியிருக்கிறது. எனவே, நான் இந்த விடயத்தை உங்களுடைய கவனத்துக்குக் கொண்டுவருகின்றேன்.

அடுத்து, என்னுடைய ஊரான கல்முனையில் அடைமழை காரணமாக மீனவர்களுடைய தொழில் மிகக் கடுமையாகப் பாதிக்கப்பட்டு இருக்கின்றது. வழமையாக டிசம்பர் மாதத்தில் பெய்யக்கூடிய மாரி மழை இப்பொழுதே தொடங்கி விட்டது. சென்ற வருடம் வெள்ள அனர்த்தம் ஏற்பட்டபொழுது, மத்ரஸா மாணவர்கள் உட்பட பத்துப் பேரைக் காவுகொண்ட இடம்தான் காரைதீவு - மாவடிப்பள்ளி junction.

அந்த இடத்தின் இன்றைய நிலைமையைப் பாருங்கள்! யாரும் நினைக்கலாம், இது நீர் ஓடுகின்ற இடம் என்று. அவ்வாறு இல்லை. இது ஒரு வீதி! இன்று நீர் ஓடுகின்ற இடமாக மாறிவிட்டது. கடந்த வருடம் இந்த இடத்தில் tractor ஒன்று புரண்டு மத்ரஸா மாணவர்கள் உட்பட ஏறத்தாழ 10 பேர் காலஞ்சென்றார்கள். இந்த இடத்தில் road railings அடிப்பதற்காக நீங்கள் சென்ற முறை நிதி ஒதுக்கியிருந்தீர்கள். எனினும், அங்கு அந்த வேலி - railing - சரியாக அடிக்கப்படவில்லை. அந்த இடத்தில் bridge ஒன்றைக் கட்டுவதாக மாண்புமிகு சனாதிபதி அவர்கள் சொல்லியிருந்தார். எனினும், உங்களுடைய Budgetஇல் அதற்கான allocation சரியாகக் கிடையாது. இவ்விடயம் தொடர்பில் அங்குள்ள உத்தியோகத்தர்களிடம் கேட்டால், "நாங்கள் soil test செய்திருக்கின்றோம். அதைப் பற்றி பிறகு பார்ப்போம்" என்று சொல்கிறார்கள். எனவே, நான் இந்த விடயத்தை உங்களுடைய கவனத்துக்குக் கொண்டுவருகின்றேன்.

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

அடுத்து, மாரி கால கடும் மழையால் பாதிக்கப்பட்டு இருக்கின்ற மீன்பிடித் தொழிலாளர்களுக்கு உலர் உணவு உட்பட நிவாரணங்களை கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சானது Department of Social Services உடன் சேர்ந்து வழங்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඊළඟට ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය ගැන මම කථා කරන්න කැමතියි. මම පළමුවෙන්ම සතුටු වෙන්න ඕනෑ විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ මේ පිළිබඳව සෑහෙන හොඳ සංවාදයක් තිබීම ගැන. ඒ කමිටුවේ සාමාජිකයකු හැටියට මමත් ඒවාට සහභාගි වුණා. ඒ කමිටුවේ සභාපති ඇතුළුව මන්ත්‍රීවරු සම්පූර්ණ සහයෝගය දෙමින් ඒ පිළිබඳ කථා කළා. අපි ඒ පිළිබඳ කාරණා කිහිපයක් ඊයේ කථා කළා. නමුත්, සමහර කරුණු ගැන මහජන මන්ත්‍රීවරයකු හැටියට මේ පාර්ලිමේන්තුවේ දී කථා කරන්න මට සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, උදාහරණයක් හැටියට කියනවා නම්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, ඩිජිටල්කරණයේ කාර්යක්ෂමභාවය පිළිබඳ. අපි දන්නා මනුස්සයෙක් හදිසියේ ලන්ඩන් ඉඳන් ලංකාවට ආවා, එයාගේ පවුලේ පුද්ගලයෙකුගේ අසනීප තත්ත්වයක් මත. එයා හදිසියේ online visa එකක් apply කළා. මම හිතන විධියට, ඒ සඳහා පවුම් ගණනක් ගෙව්වා. ලංකාවේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ counter එකට ගිහිල්ලා ඒක ඉදිරිපත් කළාම කියලා තිබෙනවා, "This is a fake online visa" කියලා. ඒ නිසා එතැන ප්‍රශ්නයක් වුණා. එයා ආපහු මුදල් ගෙවලා එතැන ලොකු වෙලාවක් ඉන්න වුණා. ලාංකික පුරවැසියෙක් නිසා එයාට ඒක තේරුණා. නමුත්, ඒක හරි වැරදියි. ඒ නිසා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ඩිජිටල්කරණය පිළිබඳ යම් කිසි ප්‍රශ්නයක් තිබෙනවා.

තවත් ප්‍රශ්නයක් මම ඉදිරිපත් කරන්නම්. විදේශගත වීමට විරුද්ධව අධිකරණයෙන් බාධාවක් තමුන්ට තිබෙනවාද, නැද්ද කියලා ගොඩක් අය දන්නේ නැහැ. අවුරුදු ගණනකට ඉස්සෙල්ලා යම් කිසි පුද්ගලයෙකුට විරුද්ධව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් දාලා ඒ පුද්ගලයාගේ විදේශ ගමන් නවත්වා තිබෙනවා. නමුත් ඒ පිළිබඳව එයා දැනුවත් නැහැ. මාස ගණනකට පස්සේ, අවුරුදු ගණනකට පස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, එහෙමත් නැත්නම් අදාළ පොලීසිය කියා තිබෙනවා අපි ඒ නඩුව දිගටම ගෙනියන්නේ නැහැ කියලා. නමුත්, මේ පුද්ගලයාට විරුද්ධව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තිබෙන විදේශගත වීමට තිබෙන බාධාව ඉවත් කරලා නැහැ. එතකොට ඒ මනුස්සයා පවුලේ අයත් එක්ක විදේශ ගමනක් යන්න airport එකට ගිහිල්ලා counter එකට යනතෙක් දන්නේ නැහැ, එයාට විදේශගත වෙන්න බැහැ කියලා. පොඩ්ඩක් හිතලා බලන්න, ඒ මනුස්සයාට ඇති වෙන මානුෂීය ප්‍රශ්නය; මානුෂීය වේදනාව. මොකද, පවුල් පිටින් විදේශ ගමනක යනකොට ලොකු ආශාවකින්, බලාපොරොත්තුවකින් තමයි පිටත් වෙන්නේ. නමුත් එතැනට ගියාම මෙයාට විදේශගත වෙන්න බැහැ. පවුලේ අනෙක් අයට යන්න පුළුවන්. ඒ මොකද කියලා බැලුවාම, අවුරුදු ගණනකට කලින් තිබුණු අධිකරණ බාධාවක් තමයි හේතුව. ඒ පුද්ගලයාට බැහැ, තමාගේ විදේශ ගමන් බලපත්‍රයේ එවැනි බාධාවක් තිබෙනවාද කියලා online check කර ගන්න. ඒකට ක්‍රමයක් නැහැ. අපේ ID card එක පිළිබඳ යම් කිසි පරීක්ෂාවක් කරන්න පුළුවන්. මෙතැනදී තවත් ප්‍රශ්නයක් මතු වෙනවා, පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම සම්බන්ධයෙන්. ඒකට කමක් නැහැ. ඒ දත්ත ටික ආරක්ෂා කර ගන්න ක්‍රම ගොඩක් තිබෙනවා. නමුත්, මට පුළුවන් වෙන්න ඕනෑ, QR හෝ වෙනත් මොනවා හෝ යම් කිසි ක්‍රමයක් මඟින් online හරහා මගේ passport ඒකේ තිබෙන බාධා පිළිබඳ දැන ගන්න. හැම phone එකකම දැන් fingerprint තිබෙනවා. එහෙම නැත්නම් OTP එකක් දීලා තහවුරු කර ගැනීමෙන් පසුව දත්ත ලබා දෙන්න පුළුවන්. දැන් වුණත් online බැංකු ගනුදෙනු කරනකොට අපි මේවා පාවිච්චි කරනවා. ඒක තමයි අපේ අනාගතය. ඒක නිසා මේ වාගේ දත්ත පුරවැසියන්ට කෙළින්ම බලා ගන්න පුළුවන් විධියේ ක්‍රමයක් අපි හදා ගන්න ඕනෑ.

මම ඊයේ පෙරේදා අහගෙන හිටියා ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියන දේවල්. විද්‍යුත් වාහන ආරෝපණය කිරීමේ කාරණාවක් ගැන මම ප්‍රශ්නයක් මතු කළා. යම්කිසි අවස්ථාවක ඒ වාහන charge කරන්න ඕනෑ වෙනවා. යම් කිසි app එකක තමයි, කොතැනද විද්‍යුත් ආරෝපණය කළ හැකි stations තිබෙන්නේ කියලා හොයා ගන්න පුළුවන් ක්‍රමය තිබෙන්නේ. ඒවා යම් කිසි පද්ධතියක් ඇතුළට එකතු වෙන්න ඕනෑ. එතකොට අපට දැන ගන්න පුළුවන්කම තිබෙනවා DC fast chargers ද, නැත්නම් level 2 AC chargers ද එතැන තිබෙන්නේ කියලා. ඒ විතරක් නොවෙයි, ඒ charging slot එක දැන් free ද, available ද, එතැන වෙන වාහනයක් තිබෙනවාද කියලා දැනගන්නත් පුළුවන්. ලංකාවේ ඩිජිටල්කරණයේ තවත් වැදගත් දෙයක් තිබෙනවා. විශේෂයෙන් Gen Z කියන පරම්පරාව විදුලි වාහන භාවිත කිරීමේ දී ඊළඟ අවුරුද්දේ ඉඳලා ඒ අයට ලොකු ප්‍රශ්නයක් මතු වෙනවා. ඒක අවම කිරීම ඔබතුමන්ලාගේ වගකීම. 2025දී තමයි විදුලි වාහන වැඩියෙන් ඇවිල්ලා තිබෙන්නේ. හැම පිරවුම්හළකම විදුලි ආරෝපණය කිරීම සඳහා ස්ථානයක් ඇති කිරීම පමණක් නොවෙයි, ඊට අදාළ software ටිකත් ජාත්‍යන්තරව තිබෙන software එක්ක එකතු කර ගන්න ඕනෑ.

අනික් ප්‍රශ්නය මෙයයි. Online හරහා බඩු මිලදී ගැනීමේදී Google Pay වැනි ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයක් මත මුදල් ගෙවීමේ ප්‍රශ්නයක් ලංකාවේ තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි කථා කළාම අපට කිව්වා, මෙතැන foreign exchange, එහෙම නැත්නම් exchange control ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඒ සම්බන්ධ නීති පද්ධතිය අනාගතයේ ඩිජිටල්කරණය සඳහා බාධාවක් නොවන විධියට සකස් කළ යුතුයි. අපේ මුදල් ව්‍යාජ ලෙස, එහෙම නැත්නම් අපේ මුදල් පිළිබඳ ලැබිය යුතු බද්දෙන් නිදහස් නොවී ලංකාවට ලැබිය යුතු බදු මුදල අය කිරීමේ සිද්ධාන්තය ඇතුළුව ඒවා යාවජීව කළ යුතුයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Madam, I will finish.

මම ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයට සුබ පතන ගමන්, තවදුරටත් මේ පිළිබඳව විශේෂ අවධානය යොමුකොට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු රත්න ගමගේ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.32]

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)

(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ කාරක සභා අවස්ථාවේ විවාදයේදී එම අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් කරුණු ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. මෙවර අය වැය ලේඛනයට අදාළව 2026 වර්ෂය වෙනුවෙන් අපේ අමාත්‍යාංශය සඳහා අපේ රජයෙන් සැලකිය යුතු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු අය වැය ලේඛනය අනුවත්, ඒ වාගේම අය වැය ලේඛනයට අමතරව අතිරේකව ලබා දීපු මුදල් ප්‍රමාණයත්, ඊට අමතරව අපේ අමාත්‍යාංශයේ අර්බුදයට ගිය කොටස් ප්‍රතිසංවිධානය කරන්න, ප්‍රතිව්‍යුහගත කරන්න අපේ රජයෙන් ලබා දීපු මූල්‍ය ප්‍රතිපාදනත්, ඒ වාගේම පළාත් සභා වෙනුවෙන් අපේ අමාත්‍යාංශය සඳහා වෙන් කරපු මුදලත් ගත්තාට පසුව අපට සැලකිය යුතු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් මෙවර 2026 මුදල් වර්ෂය සඳහා අපේ අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කර තිබෙනවා. ඒ පිළිබඳව මුලින්ම ගරු ජනාධිපතිතුමාටත්, ඒ වාගේම මුදල් අමාත්‍යාංශයටත් අපේ ප්‍රණාමය පුද කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ධීවර අමාත්‍යාංශය කියන්නේ මේ රටේ නිෂ්පාදන ආර්ථිකය ගොඩනඟන්න ශක්තිය සපයන ප්‍රධාන කුලුනු තුනෙන් එකක් සේ අපි සලකනවා. ධීවර කර්මාන්තය නඟා සිටුවීම, විශේෂයෙන්ම ධීවර අමාත්‍යාංශය යටතේ තිබෙන ධීවර කර්මාන්තය ගොඩනැඟීම අපේ රජය සතු වගකීමක්. අපට ඒක අභියෝගයක් බවට පත් වෙලා තිබෙනවා.

අපේ ධීවර කර්මාන්තය ගත්තාම, යුග ගණනක් ඈත ඉතිහාසයකට යන්න පුළුවන්. ධීවර අමාත්‍යාංශයෙන් මෙය කර්මාන්තයක් වශයෙන් කරගෙන ගිහිල්ලා නැහැ. එදිනෙදා - දෛනික - වැඩ කොටස් ටිකක් කරගෙන යෑමක් සිද්ධ වෙලා තිබෙනවා. නොකළාය කියන්නේ නැහැ, කරලා තිබෙනවා. නමුත් මෙය කර්මාන්තයක් වශයෙන් නැවත ස්ථාපිත කිරීමේ වගකීම අපට තිබෙනවා. විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශය යටතේ නිෂ්පාදන ආර්ථිකයට දායකත්වයක් ලබා දෙනවා. විශාල හයියක්, ශක්තියක් ලබා දෙන්න පුළුවන් අමාත්‍යාංශයක්, මේක. මේ රටේ නිෂ්පාදන ආර්ථිකයේ කොටස්කරුවෙක් බවට පත් වෙලා ජාතික නිෂ්පාදනට දායකත්වය ලබා දීම, ඒ වාගේම සෑම පුරවැසියෙකුටම තමන්ගේ ආහාර වේල සඳහා ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරාලීම ධීවර කර්මාන්තයේ එක වගකීමක්. අනෙක් පැත්තෙන්, අපේ රටට විදේශ විනිමය උපයා දීමේ ප්‍රධාන මාර්ගයක් තමයි ධීවර කර්මාන්තය. අපි මේ කර්මාන්තය සම්බන්ධයෙන් කළ යුතු දෙයක් තිබෙනවා. එකක්, ඉතිහාසය පුරාවට ධීවර කර්මාන්තයේ යෙදුණු සම්ප්‍රදායික දැනුම භාවිත කරපු අපේ ධීවර කාර්මිකයන් නවීන තාක්ෂණයත් එක්ක ඉදිරියට ගෙන යෑමේ අභියෝගය අපට තිබෙනවා. අපි ඒකට සූදානම් වෙලා ඉන්නවා. ඊළඟට, ඔවුන්ගේ ජන ජීවිතවල සුරක්ෂිතභාවය රැකීමේ අභියෝගය අපට තිබෙනවා. අපි ඒකට දැන් සූදානම් වෙලා තිබෙනවා. ඒ වාගේම වැඩි මත්ස්‍ය අස්වැන්නක් නෙළා ගන්න අපි කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා අපේ අමාත්‍යාංශය කටයුතු කර තිබෙනවා. මත්ස්‍ය අස්වැන්න නෙළා ගැනීම වැඩි කිරීමටත්, පසු අස්වනු හානිය අවම කරන වැඩ පිළිවෙළකුත් සකස් කර තිබෙනවා. අපි ඒකට සූදානම් වෙලා තිබෙනවා. ඒ වාගේම බෙදා හැරීමේ ක්‍රියාවලියක් තිබෙනවා. එම බෙදා හැරීමේ ක්‍රියාවලියට අදාළ වැඩ පිළිවෙළක් අපේ අමාත්‍යාංශය හරහා මේ වනකොට අපි ගොඩ නඟාගෙන තිබෙනවා. 2026 වර්ෂය තුළ මේ රටේ ධීවර කර්මාන්තයටත්, ධීවර කාර්මිකයන්ටත් හොඳ කල දසාවක් උදා කරන්න අපට හැකියාවක් ලැබෙයි කියලා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඔබතුමියත් දන්නවා මෙවර අය වැයෙන් අපේ අමාත්‍යාංශයට රුපියල් බිලියන 10.6ක් - රුපියල් මිලියන 10,600ක් - වෙන් කර තිබෙන බව. මෙච්චර වෙලා කථා කළ ඔය මහත්වරු පුළුවන් නම් කියන්න, ඉලක්කම් දෙකකට වැඩි බිලියන ගණනක මුදලක් මීට කලින් වෙන් කර තිබෙනවාද කියලා? කිසිදාක වෙන් කර නැහැ. 2025 අපේ රජයේ අනුර දිසානායක ජනාධිපතිතුමා යටතේ තමයි පළමුවැනි වතාවට ඉලක්කම් දෙකක බිලියන ප්‍රමාණයක් අපේ අමාත්‍යාංශයට වෙන් කළේ. මේ වතාවේ රුපියල් බිලියන 10.6ක් වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඉතිහාසයේ මේගොල්ලන් කරපු ඒවායේ ප්‍රතිඵල තමයි අද භුක්ති විඳින්න සිද්ධ වෙලා තිබෙන්නේ. ලංකා ධීවර සංස්ථාවට රුපියල් මිලියන 1,600ක පොල්ලක් තියලා මේගොල්ලන් ගිහිල්ලා තිබෙන්නේ. දැන් මහා ලොකුවට කථා කරනවා. හැබැයි, රුපියල් මිලියන 1,600ක පොල්ලක් තියලා ගිහින් තිබෙන්නේ. North Sea Limited ආයතනය පාඩු ලබන ආයතනයක් බවට පත් කරලා, ඒක වහලා දමන මට්ටමට පත් කරලා තිබෙනවා. නමුත්, අපේ රජයෙන් මේ වතාවේ මේ ආයතන දෙක ඇතුළු ආයතන 10ක් ගොඩ නැඟීම සඳහා රුපියල් මිලියන 5,000ක මුදලක් ජනාධිපතිතුමා මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. අපි විශ්වාස කරනවා, ඒ රුපියල් මිලියන 5,000න් රුපියල් මිලියන 1,000ක් -බිලියනයක්- ලැබෙයි කියලා. එතකොට රුපියල් බිලියන 11.6යි. ඊට අමතරව ජනාධිපතිතුමා තමන්ගේ අය වැය කථාවේදී තවත් අතිරේකව රුපියල් බිලියන 2ක් - මිලියන 2,000ක් - වෙන් කර තිබෙනවා. එතකොට රුපියල් බිලියන 13.6යි. පළාත් සභාවේ ධීවර අමාත්‍යාංශය වෙනුවෙන් රුපියල් මිලියන 748ක් - බිලියන 0.748ක්- වෙන් කර තිබෙනවා. ඒ අනුව රුපියල් බිලියන 15කට ආසන්න ප්‍රමාණයක් ධීවර අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කර තිබෙනවා. ඉතිහාසයේ කවදාවත් වෙන් නොකළ මුදල් ප්‍රමාණයක් 2026 වර්ෂය සඳහා ගරු ජනාධිපතිතුමා ධීවර අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කර තිබෙනවා. මේ නිසා ධීවර අමාත්‍යාංශයට හොඳ කල දසාවක් උදාවෙයි කියලා අපි හිතනවා.

පසුගිය කාලයේ අපට අර්බුද ගණනාවකට මුහුණ දීමට සිදු වුණා. ධීවර වරායේ ආශ්‍රිත ගැටලු රාශියක් ඇවිල්ලා තිබෙනවා. දැන් මේ මහත්වරු කථා කරලා ගියා නේ. මේතුමන්ලාගේ කාලයේ තමන්ගේ පරම්පරාවේ කට්ටිය පාලනය කළාය, හැදුවාය කියනවා. හදලා තිබෙනවා, අර තිබෙන්නේ ප්‍රශ්න ගොඩක් එක්ක. කිරින්ද ධීවර වරාය ප්‍රශ්න ගොඩයි. කිරින්ද, අම්බලන්ගොඩ, හික්කඩුව, පානදුර හදපු ඒවායේ වැලිකඳු ගොඩ ගැහිලා තිබෙනවා. මේ පැත්තෙන් ඔලුවිල් ධීවර වරාය ක්‍රීඩා පිට්ටනියක් වෙලා. ඕනෑ නම් දැන් එහි ගිහිල්ලා cricket match එකක් ගහන්න පුළුවන්. මේ සියල්ලේම ප්‍රශ්න ඇති කරලා තමයි ගියේ. කිසිදු ශක්‍යතා අධ්‍යයන වාර්තාවකින් තොරව මේවා ඉදි කරලා තිබෙන්නේ කියලා අපි දන්නවා. මෙතැන තිබෙන්නේ හම්බ කර ගැනීමේ චේතනාවෙන් හදපු ධීවර වරායන්. අපට ඒවාට කර ගහන්න සිද්ධ වුණා. අපි ඒවාට කර ගහනවා. ඒක අපේ වගකීමක්. අපට වාර්ෂිකව මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරන්න සිද්ධ වෙලා තිබෙනවා, මේ වැලි ඉවත් කරන්න.

අර්බුද රැසක් හදලා තිබෙනවා. නමුත්, අපි ඒ අභියෝගය භාරගෙන කටයුතු කරනවා. මේ රටේ ධීවර කර්මාන්තය නඟාසිටුවීම සඳහා ධීවර වරාය සංවර්ධනයට අපේ රජය මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1,000කට අමතරව, නම් කරපු වරායන් හතරක් සඳහා රුපියල් මිලියන 300කුත්, ඊට අමතරව නැඟෙනහිර පළාතේ වාලච්චේනයි ධීවර වරාය සංවර්ධනයටත් එක්ක රුපියල් මිලියන 1,950ක් වෙන් කරලා තිබෙනවා, ධීවර වරාය සංවර්ධනය වෙනුවෙන් 2026 වර්ෂය සඳහා. ඒ අනුව ධීවර කර්මාන්තය වෙනුවෙන් මෙවර අපි සැලකිය යුතු මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි.

[ගරු රත්න ගමගේ මහතා]

උතුරු පළාතේ ධීවර තොටුපොළවල වැඩ කළේ වැලි කොට්ට ගහගෙන. මේ මහත්වරු මහ ලොකුවට කෑ ගැහුවා නේ, ඒ තොටුපොළවල් හැදුවා කියලා. ගිහිල්ලා බලන්න, සිලාවතුර, වංකාලේ, කිලිනොච්චිය, පූනකරි, මුලතිව්, යාපනය, කරෙයිනගර් කියන ධීවර තොටුපොළවල සංවර්ධනයක් කරලා නැහැ. ඒ ධීවර කාර්මිකයින් අල්ලාගෙන එන මත්ස්‍ය අස්වැන්න කල් තබා ගැනීමේ වැඩ පිළිවෙළක් ඇත්තේ නැහැ. එම නිසා මේ වතාවේ ලංකාවේ තිබෙන තෝරාගත් ධීවර තොටුපොළවල් සංවර්ධනය කරන්න රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කරලා තිබෙනවා. මීට ඉස්සෙල්ලා එවැනි කටයුත්තකට එහෙම මුදලක් වෙන් කරලා තිබුණේ නැහැ. ඒ අනුව මෙවර අය වැයෙන් ධීවර කර්මාන්තය නඟාසිටුවන්න සැලකිය යුතු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා.

අපි දැක්කා පසුගිය වෙලාවේ කථා කළා, රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ පක්ෂයෙන් ආපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමෙක්. "තෙල් මිල වැඩියි, මගෙ අම්මෝ මේක දරාගන්න බැහැ" කිව්වා. අඬලා වැලපුණා. කළු ගලේ ඔළුව ගහ ගත්තා, මෙතැනදී. රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ පක්ෂයෙන් කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන්නේ මේ මන්ත්‍රීතුමා. එතුමාගේ අධ්‍යාත්මික නායකයා මේ ආණ්ඩුව අත්ඇරලා යනකොට භූමිතෙල් ලීටරය රුපියල් 202යි; දැන් රුපියල් 180යි. එදා ඩීසල් ලීටරය රුපියල් 307යි; දැන් රුපියල් 277යි. එතුමා වයර් මාරුවෙලා කථා කළාද කොහේදෝ. එතුමා ස්වයං විවේචනයක් වාගේ දෙයක් කළා කියලායි මට හිතෙන්නේ. රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ගෑස් සිලින්ඩරය ලකුණ තිබෙන පක්ෂයෙන් කළුතර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීතුමා කළු ගලේ ඔළුව ගහ ගත්තා නම් ඊට වඩා හොඳයි.

අපේ රජය බලයට පත් වෙච්ච දවසේ ඉඳලා ඉන්ධන මිල අඩු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපේ ජනාධිපතිතුමා එම ධුරයේ දිවුරුම් දුන් විගස රුපියල් බිලියන 2.3ක් -රුපියල් මිලියන 2,300ක්- දුන්නා. ඒගොල්ලන්ගේ ආණ්ඩුව කාලයේ ඔරු, බෝට්ටු ගැටගහලා තිබුණේ. ධීවර කාර්මිකයින් සඳහා අපි මාස හයක් ඉන්ධන සහනාධාරය දුන්නා. අපි ඉන්ධන සහනාධාරය ලබා දීම හින්දා වහලා තිබුණු, ගැට ගහලා තිබුණු, මකුණු දැල් කාලා තිබුණු ඔරු, බෝට්ටු නැවත වතාවක් ධීවරයින් මුහුදට දැම්මා. තව මන්ත්‍රීතුමෙක් කථා කළා, ඒ මන්ත්‍රීතුමාගේ අප්පච්චිගේ කාලයේ තමයි වෙඩි තියලා ධීවරයින් මැරුවේ. ඒ කාලයේ ඉන්ධන මිලත් වැඩි කළා. ඉතිහාසයේ වැඩිම ඉන්ධන මිල තිබුණේ ඒ කාලයේ. දැන් ඒවා මතක නැහැ. ඒ කාලයේ හදපු වරායන්වල පව් දැන් ගෙවන්න වෙලා තිබෙන්නේ ධීවරයින්ට. ධීවර වරායන් ඉදිකරනවා කියලා රුපියල් කෝටි ගණන් ගසාගෙන කාලා, දැන් අපට ඒවායේ වැලි ඉවත් කරන්න සිදු වෙලා තිබෙනවා. කමක් නැහැ. අපි ඒක භාර ගත්තා. අපේ රජය ඒක කරනවා. අපි ඒවා අනාගතයේදී නිශ්චිත වරායන් බවට පත් කරනවා. මෙහෙම වැඩ සැලසුමක් ඇතිවයි අපි සූදානම් වෙලා ඉන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි අය වැය ඉදිරිපත් කළා. අපි විපක්ෂයේ විවේචන භාර ගත්තා. ඒ යෝජනාත් අපි ගන්නවා. මේ රට කොතැනටද ගෙන යන්න ඕනෑ කියන එක සම්බන්ධයෙන් අපට ඉලක්කයක් තිබෙනවා. මේ අවුරුදු පහ අවසන් වන විට අපේ රටේ ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරාලීම සඳහා අපි ධීවර කර්මාන්තය ප්‍රශස්ත මට්ටමට ගෙන එනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ලෝක සෞඛ්‍ය සංවිධානය කියලා තිබෙනවා, ඒක පුද්ගල දෛනික මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 64යි කියලා. අපි තවම දෛනිකව ග්‍රෑම් 34ක පරිභෝජන මට්ටමක ඉන්නේ. අපේ මත්ස්‍ය පරිභෝජනය මෙට්‍රික් ටොන් 534,000ක්. නමුත් පසුඅස්වනු හානිය සියයට 40ක් වාගේ ප්‍රමාණයක් වනවා. පසුඅස්වනු හානිය වළක්වා ගෙන මත්ස්‍ය අස්වැන්න කල් තබා ගන්න අපි සාර්ථක වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 500ක් අපි මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. එපමණක් නොවෙයි, මෙන්න මේ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනයට එහා ගිහිල්ලා, අපි ඊළඟට ලෝක වෙළෙඳ පොළට -ජාත්‍යන්තරයට- මත්ස්‍ය අපනයනය සඳහා යන්න ඕනෑ. මත්ස්‍ය අපනයනයේදී අපි ගැටලු රැසකට මුහුණ පාලා තිබෙනවා. අපි ඒකට වැඩ පිළිවෙළක් හදනවා. එම නිසා නෙළා ගන්නා මත්ස්‍ය අස්වැන්නට අගය එකතු කරපු වැඩ පිළිවෙළකට යන්න අපි දැන් සැලසුම් සකස් කරලා තිබෙනවා.

ඔබතුමන්ලා දකින්න ඇති, පසුගිය 21, 22, 23 දිනවල Lotus Towerහි පැවැත්වූවා, "Aqua Planet - Sri Lanka, International Expo 2025". ඒ සඳහා විදේශිකයින් විශාල පිරිසක් සහ ආයතන ගණනාවකින් සහභාගි වුණා. මත්ස්‍ය නිෂ්පාදන, මත්ස්‍ය ආශ්‍රිත නිෂ්පාදන, ජලජීවී අංශය, ornamental fish - විසිතුරු මත්ස්‍ය - කර්මාන්තය, කරවල කර්මාන්තය, ජාඩි කර්මාන්තය, උම්බලකඩ කර්මාන්තය ආශ්‍රිතව බොහෝ දේවල් ඒ ප්‍රදර්ශනයේදී දැකගන්න තිබුණා. මේ රටේ මත්ස්‍ය අස්වැන්න ආශ්‍රිත නිෂ්පාදන තුළින් අලුත් ආහාර සංස්කෘතියක් සහිත සමාජයක් ගොඩනැඟීම සඳහා වූ වැඩ පිළිවෙළකට අපි යනවා. මේ වන විටත් අපි ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් ගොඩනඟලා තිබෙන්නේ.

ඒකට අදාළ සැලසුමක් හදලා, ඒ වෙනුවෙන් අපි මැදිහත් වෙලා තිබෙන්නේ. මේ ප්‍රදර්ශනය නරඹන්න අතිවිශාල පිරිසක් ආවා. දැන් අපේ සැලැස්ම තිබෙන්නේ කෙසේද? කරදිය ධීවර කර්මාන්තය ගැන නේ හැමෝම කථා කරන්නේ. මේ රටේ ධීවර කර්මාන්තයේ ප්‍රධාන ක්ෂේත්‍රය සේ සලකා තිබෙන්නේ කරදිය ධීවර කර්මාන්තය. අපි ඉන් එහාට ගිහිල්ලා මිරිදිය ධීවර කර්මාන්තය වෙනුවෙනුත් විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ඒ වෙනුවෙනුත් අපේ රජය රුපියල් මිලියන 1,285ක මුදලක් වෙන් කර තිබෙනවා. එය පසුගිය වර වෙන් කළ මුදල මෙන් සියයට 80ක වර්ධනයක්. ඒ අනුව අපි ඒ සඳහා සැලකිය යුතු මුදලක් වෙන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රට වටා තිබෙන සාගර ආර්ථිකයටත්, ඒ වාගේම රටේ අභ්‍යන්තර ජලාශවලටත් විශේෂයෙන්ම මේ මැදිහත් වීම අපි කරනවා. පළාත් සභාවයි, මධ්‍යම රජයයි මෙච්චර කාලයක් කටයුතු කරගෙන ගියේ දෙපැත්තට ඇදගෙන. අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාගෙනුත්, ඒ වාගේම පළාත් සභා ධීවර අමාත්‍යාංශවල ලේකම්වරුන්ගෙනුත් සැදුම්ලත් කමිටුවක් වසරකට 4 වතාවක් එකතු වෙලා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරනවා. අපේ මේ සම්බන්ධීකරණ කටයුත්තත් එක්ක පළාත් සභාවලට ලැබුණු මුදල් රේඛීය අමාත්‍යාංශයේ මුදල් සමඟ ඒකාබද්ධ කරන වැඩ පිළිවෙළකට යොමු වනවා. එම නිසා මේ වර්ෂයේ ඒ වෙනුවෙන් රුපියල් මිලියන 748ක් පළාත් 9ට වෙන් කරලා තිබෙනවා. මේ විධියට මුදල් ප්‍රතිපාදන වෙන් කළත්, මධ්‍යම රජයේ අපේ අමාත්‍යාංශයේ ඒකාබද්ධ නිලධාරි යන්ත්‍රණය ඒ මූල්‍ය ප්‍රතිපාදනයි, මධ්‍යම රජයේ සම්පත් දායකත්වයයි දෙකම ඒකරාශි කරලා ඒකාබද්ධ වැඩ පිළිවෙළකට යනවා. එම නිසා 2026 වර්ෂය ශ්‍රී ලංකා ජාතික ජල ජීවී සංවර්ධන අධිකාරිය - NAQDA - හරහා අපට සැලකිය යුතු මිරිදිය මත්ස්‍ය අස්වැන්නක් නෙළා ගැනීමේ හැකියාවක් ඇති වර්ෂයක් බවට පත්වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ඒ විතරක් නොවෙයි. ප්‍රාදේශීය ධීවර ගැටලු විසඳීම සඳහා අපි දිස්ත්‍රික්ක 25න් 20ක ධීවර සම්බන්ධීකරණ කමිටු කැඳවනවා. එතකොට ප්‍රාදේශීය ප්‍රශ්නත් විසඳනවා. ඒ වෙනුවෙනුත් අපි මැදිහත් වනවා. ඒ අනුව ප්‍රාදේශීය ගැටලුවලට සැබෑ විසඳුමක් ලබා දෙන වැඩ පිළිවෙළකට අපි යනවා.

අද උදේ මෙතැනදී මාදැල් සම්බන්ධ ප්‍රශ්නයක් ගැන කිව්වා. අපි දන්නවා, මාදැල් අදිනකොට ට්‍රැක්ටර් භාවිත කරන බව. ඒ සඳහා ලයිසන් එක දුන්නේ කවුද කියලා ඔබතුමන්ලා දන්නවා නේද? එතුමා කිව්වා නේද, "ප්‍රශ්නයක් නැහැ, වැල්ලේ ජීවීන් නැහැ" කියලා. මතක තියාගන්න, පරිසර පද්ධතිය කියන්නේ මහේක්ෂීය හා අන්වීක්ෂීය ජීවීන්ගෙන් සමන්විත පද්ධතියක්. එම ජීවීන් වැල්ලේත් ඉන්නවා, මුහුදේත් ඉන්නවා, වෙරළාසන්නයේත් ඉන්නවා. මාදැල් කර්මාන්තයේ නියුතු අයට ට්‍රැක්ටර් යොදාගෙන මත්ස්‍ය සම්පත නෙළා ගැනීම නතර කරන්න කිව්වේ අපි නොවෙයි. ඒකට අදාළව අපි නැවත වතාවක් ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් කැඳවා තිබෙනවා. ඒක කරන්න එපා කියලා එතුමන්ලාගේ ආණ්ඩුව කාලයේම වාර්තාවක් නිකුත් කරලා තිබෙනවා. ඒක මගේ ළඟ තිබෙනවා. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් එතුමන්ලාට ඒ සම්බන්ධව වාර්තා ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒවා නොතකා තමයි එතුමන්ලා කටයුතු කළේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2026 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ අය වැය මේ රටේ ධීවර කර්මාන්තය ඉහළට ඔසවා තබන අය වැයක් බවට පත් වනවාය කියා අපි විශ්වාස කරන අතර, මේ අය වැය අපේ රටේ ධීවරයින්ට යහපත් අනාගතයක පෙරනිමිති පහළ කරන අය වැයක් කියන එකත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.47]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රටට අනන්‍ය වර්ග කිලෝමීටර 517,000ක විශේෂ ආර්ථික කලාපයක් තිබෙනවා. වර්ග කිලෝමීටර 215,000ක දේශීය ජල තීරයක් තිබෙනවා. ඒ වාගේම මහාද්වීප තටකයකුත් අපේ රටට අයිතියි. වර්ග කිලෝමීටර 1,580ක කළපු සහ ගංමෝය ප්‍රමාණයකුත් තිබෙනවා. වර්ග කිලෝමීටර 2,600ක ජලාශ තිබෙනවා. හැබැයි, 2024 වර්ෂයේ ධීවර ක්ෂේත්‍රයෙන් දළ දේශීය නිෂ්පාදනයට වූ දායකත්වය සියයට 0.9යි. ඒකෙන් සියයට 0.8ක් කරදිය, සියයට 0.1ක් මිරිදිය. 2024 වර්ෂයේ සංඛ්‍යාලේඛන අනුව මේ වන විට 320,470ක් ධීවර කර්මාන්තයේ යෙදී ඉන්නවා.

අපි තරයේ විශ්වාස කරනවා, අලුත් දැක්මක් තුළින් මේ රටේ ධීවර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය යුතුයි කියලා. දිගු කාලීන සාගර සෞඛ්‍ය, ආර්ථික සමෘද්ධිය, සියලුම වෙරළබඩ ප්‍රජාවගේ සහ අභ්‍යන්තර කර්මාන්තයේ නියැළෙන ප්‍රජාවගේ ආරක්ෂිත ජීවනෝපායයන් සහතික කරමින්, තිරසර තාක්ෂණයෙන් යුත්, ගෝලීය වශයෙන් තරගකාරී ධීවර කර්මාන්තයක් සහිත රටක් බවට ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම මේ නව ප්‍රතිපත්තියේ අරමුණ විය යුතුයි.

මෙහි ප්‍රධාන අරමුණු කිහිපයක් තිබෙනවා.

සාගර සහ අභ්‍යන්තර මත්ස්‍ය සංචිත ආශ්‍රිතව තිරසර කළමනාකරණයක් සහතික කිරීම, ජාතික මත්ස්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, තාක්ෂණය, දත්ත සහ නවෝත්පාදනය තුළින් ධීවර අංශය නවීකරණය කිරීම, ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය ආරක්ෂා කිරීම සහ සමාජ ආරක්ෂණය වැඩිදියුණු කිරීම, සමුද්‍ර ආරක්ෂාව ශක්තිමත් කිරීම තුළින් නීති විරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ - illegal, unreported and unregulated - ක්‍රමවේද අනුව මසුන් ඇල්ලීම තුරන් කිරීම, අපනයන අගය එකතු කිරීම සහ නීල ආර්ථික වර්ධනය පුළුල් කිරීම, සාගර පරිසර පද්ධති, ගල්පර, කඩොලාන සහ වෙරළබඩ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම කියන මෙන්න මේ ප්‍රධාන ප්‍රතිපත්ති කේන්ද්‍ර කරගත් නව ධීවර වැඩ පිළිවෙළක් අපේ රටට අත්‍යවශ්‍යව තිබෙනවා. තිරසර ධීවර කළමනාකරණය සඳහා විද්‍යාත්මක පදනම මත සංචිත තක්සේරුවක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. මසුන් ඇල්ලීමේ උත්සාහය යම් නියාමනයකට, තිරසරභාවයකට ලක්කොට අස්වැන්න ප්‍රවර්ධනය කරමින්, තිරසරභාවයත් ආරක්ෂා කරමින් මේ ගමන ක්‍රියාත්මක කරන්නට ඕනෑ. විශේෂයෙන්ම ටූනා, ඉස්සන්, පොකිරිස්සන් සඳහා අදාළ අභිජනන කාල ආරක්ෂා කිරීමට අපි කටයුතු කරන්නට ඕනෑ. විශේෂයෙන්ම bottom trawling කියන ප්‍රශ්නය තුළ උද්ගත වී තිබෙන විශේෂිත අර්බුදවලට තිරසර විසඳුම් ලබා දෙන ප්‍රතිපත්ති රාමුවක් නිර්මාණය වෙන්නට ඕනෑ. බහුදින බෝට්ටු සඳහා සියයට සියයක් යාත්‍රා අධීක්ෂණ පද්ධති - VMS - වාගේම සියලුම යාත්‍රා ස්වයංක්‍රීයව හඳුනා ගැනීමේ පද්ධති - AIS - වැනි ගවේෂණ උපකරණවල අවශ්‍යතාවක් තිබෙනවා. ඒ වාගේම නීති විරෝධී, වාර්තා නොකළ, නියාමනය නොකළ ක්‍රියාදාම වළක්වන්නට නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ධීවර යාත්‍රා නවීකරණය කරන්න ඕනෑ. ඉන්ධන කාර්යක්ෂම යාත්‍රා ශීතකරණ ක්‍රමවේද ව්‍යූහයන් තුළ සූර්ය සහායක විදුලි බලයත් උපයෝගී කරගෙන ඒ අලුත් ක්‍රමවේද මත ධීවර ක්ෂේත්‍රය අපි දියුණු කරන්නට ඕනෑ. විශේෂයෙන්ම ජාතික ධීවර දත්ත වේදිකාව තුළින් ඒකාබද්ධකරණය, චන්ද්‍රිකා දත්ත, දෛනික මත්ස්‍ය අල්ලා ගැනීමේ වාර්තා, යාත්‍රා පිහිටි ස්ථාන, කාලගුණ සහ පූර්ව අනතුරු ඇඟවීම්, ඩිජිටල් සේවා ක්‍රියාත්මක කිරීම, තථ්‍ය කාලීන මාළු ඒකරාශිවීම් පිළිබඳ අනාවැකි, වෙළෙඳ පොළ මිල යාවත්කාලීන කිරීම, ආරක්ෂණ ක්‍රමවේද, බලපත්‍ර අලුත් කිරීම යනාදී වශයෙන් අලුත් ක්‍රමවේද රැසකට මුල පුරන්නට අපි කටයුතු කරන්නට ඕනෑ.

ඒ වාගේම රට අභ්‍යන්තරය තුළ ජලජීවී වගාව ශක්තිමත් කරන්නට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. එමෙන්ම නියාමන රාමුව ශක්තිමත් කරන්නට ඕනෑ. ධීවර ප්‍රජාවගේ සමාජ ආරක්ෂණය, රක්ෂණ ක්‍රමවේද හරහා සහ විශ්‍රාම වැටුප් ක්‍රමවේද හරහා තිරසර භාවිතය තුළ වැඩිදියුණු කරන්න ඕනෑ. ධීවර ප්‍රජාවගේ කුසලතා පුහුණුව ඉහළ නංවන්න ඕනෑ. ධීවර නිවාස සහ යටිතල පහසුකම්, අයිස් කර්මාන්තශාලා, ශීත ගබඩා, සනීපාරක්ෂක, වෙන්දේසි ශාලා, සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන විදුලි ආලෝකය යනාදී ක්‍රමවේදවලට ධීවර ක්ෂේත්‍රය යොමු කරන්න ඕනෑ. ඒ වාගේම ශ්‍රී ලංකා මුහුදු ආහාර සන්නාමකරණය ශක්තිමත් කරන්නට ඕනෑ. ඒ සඳහා නවීන පහසුකම් ලබා දෙන්නට ඕනෑ. ඒ වාගේම ගුණාත්මකභාවය වැඩි කිරීමට, අගය එකතු කිරීමට සහ අපනයන වර්ධනයට අපි යොමු වෙන්නට ඕනෑ. දේශීය වෙළෙඳ පොළ නවීකරණය කරනවා සේම සාගර පරිසර පද්ධතිය ආරක්ෂා කරන්නත් අපි කැප වෙන්න ඕනෑ.

ඒ වාගේම සාගර සංරක්ෂණය, දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීම, දේශගුණික අනුවර්තනය, පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති, දේශගුණිකව ආරක්ෂිත යටිතල පහසුකම්, ආපදාවෙන් පසු ප්‍රතිසාධනය සඳහා අවශ්‍ය සහාය කියන මේ සියලු ගුණාංගවලින් සමන්විත වූ නව ධීවර ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. ඒ වාගේම ධීවර සමුපකාර ක්ෂේත්‍රයේ සිදු විය යුතු නවීකරණ, ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. නීල ආර්ථිකයකට මුල පුරන ගමන තුළ සාගර ජෛව තාක්ෂණය, සාගර ඖෂධ, ගැඹුරු මුහුදේ ඛනිජ පර්යේෂණ, පාරිසරික

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සංචාරක කර්මාන්තය, කඩොලානවලින් කාබන් ණය ආදායම් ලබා ගැනීම, අරමුදල් සහ මූල්‍ය රාමුව, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වය තුළින් ක්‍රියාත්මක කරන්නට අලුත් වැඩ පිළිවෙළක් අපි සකස් කරන්නට ඕනෑ. සාගර සංරක්ෂණය සඳහා නීල බැඳුම්කර ක්‍රියාත්මක කිරීම, ගෝලීය අරමුදල්වලින් දේශගුණික මූල්‍යකරණය, අපනයන ආදායම නැවත ආයෝජනය කිරීම යනාදී ගුණාංගවලින් සමන්විත වූ ශක්තිමත් ධීවර ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. විශේෂයෙන්ම කුඩා බෝට්ටු පන්නය, බහුදින යාත්‍රා පන්නය, මාදැල් පන්නය යනාදී විවිධ පන්න ක්‍රම ක්‍රියාත්මක කරන මේ රටේ ධීවර ජනතාව අද වනකොට අසහන රැසකට මුහුණ දෙනවා. විශේෂයෙන්ම ඒ අය බලාපොරොත්තු වුණු ඉන්ධන සහනාධාරය ලබා දෙන්නට වර්තමාන රජය අපොහොසත් වෙලා තිබෙනවා. පොරොන්දු ඒ ආකාරයටම ඉෂ්ට කිරීම රජයේ වගකීමයි. සාර්ථක ජාතික ධීවර ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමට අපේ උපරිම සහයෝගය ලබා දෙන්නට අපි බලාපොරොත්තු වෙනවා.

At this juncture, Hon. Deputy Chairperson, I would like to express a few words and sentiments with regard to the digital economic development that we all hope for. With successful public-private partnerships, Sri Lanka could build a 25 billion to 30 billion US Dollar value digital economy by 2030, creating hundreds of thousands of high-paying jobs, improving governance, eradicating corruption and enhancing competitiveness.

I would like to propose three primary thematic areas in which Sri Lanka should move forward. We need to build world-class digital infrastructure by upgrading 4G to expand into 5G across all districts, incentivize telcos to invest in fibre-to-the-home facilities, utilize universal service funds to subsidize rural connectivity, establish data centres and Cloud infrastructure, including regional Tier 3, Tier 4 data centres around major metropolises, promote Cloud-first government adoption, partner with global Cloud providers such as AWS, Azure and Google Cloud in order to enhance our digital infrastructure, make Sri Lanka a regional technology hub, build an AI tech talent base and introduce a national AI and data science curriculum from grade 6 onwards, which is imperative for our educational structure.

One hundred thousand IT graduates must be produced annually through universities and vocational institutes in order to make our digital dream a reality. Also, we must have continuous re-skilling of the existing workforce, establish IT investment zones throughout the country, hopefully in all of the 25 administrative districts of our motherland, provide tax concessions for export-oriented information technology and BPM companies, fast-track tech visas for global experts, establish digital government, establish a single-digital national identity programme, rolling out a secure digital ID for all citizens, enable digital signatures, online verification and mobile-based services and ensure that online public services, whether it be revenue licences, driving licences, land registry matters, court filings, permits and so on and so forth - achieve a target of 100 per cent success through digitized mechanisms reducing face-to-face interactions, which would, in turn, reduce both costs and corruption.

It is also important to encourage inter-agency data sharing, government data exchange platforms and GD access so that agencies could communicate digitally. Real -time analytics for policy decisions would also enable efficient government in our motherland. Also, we must promote digital payments and encourage FinTech to ensure that we make cashless economy a reality.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Let me take two or three minutes more, Madam.

Ensure that the interoperable LankaQR is available in all businesses, buses, trains and markets and that digital payment adoption is used as incentives for small merchants. We must also promote FinTech Sandbox, including a Central Bank Sandbox for eKYC, digital banking and blockchain payments and allow responsible crypto-asset experimentation under strict regulations.

Ensure mobile wallet ecosystem. This expansion of digital wallet access to rural areas with microcredit and insurance would ensure that the local economic multiplier in the digital sector would flourish. We need to support startups and innovations. Establish a National Startup Fund. We need State-backed venture capital with private sector co-investment and provision of seed funding for artificial intelligence, Fintech, Agri-tech, HealthTech.

Then, startup visa programmes. Attract foreign founders to base operations in Sri Lanka and ensure that there are simplified company registrations and results-driven tax holidays so that those tax holidays would accrue benefits and advantages to our country. Also, ensure that university innovation systems are initiated and enhanced. Incubators within universities for research and development and product development must be encouraged.

Industry-university research grants must be enhanced. We need to develop digital trade and exports. We also need to expand the IT-BPM sector and grow exports from US Dollars 1.8 billion to US Dollars 10 billion by 2030. Focus on high-value niches, artificial intelligence engineering, cybersecurity, Cloud services, software product development, KPUs and legal medical engineering. Ensure that digital trade agreements are established. We need to include e-commerce, data flows and IP protection in trade agreements to make sure that those agreements are viable and genuine.

We need to enable digitally-powered traditional sectors. In agriculture, small irrigation projects, drone mapping and IoT sensors for yield optimization and digital market places connecting farmers to buyers must be introduced . In the tourism sector, digital tourism platforms, online bookings, cultural experiences through artificial reality and virtual reality, smart signage and automated visitor management in national parks must be introduced.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Give me just one more minute.

Even in the fisheries sector, GPS tracking, digital catchlogs, online auctions and weather alerts must be utilized. We also need to enhance cybersecurity and the trust framework. A National Cybersecurity Authority is a must in order to monitor real-time threats and to ensure public-private cybersecurity and defense. We need to implement the Personal Data Protection Act and GDPR style standards. We also need to ensure that cyber skills training packages are promoted so that cybersecurity degrees and certifications would be made at large scale.

Lastly, digital literacy for all citizens. Create community digital centres in every DS division and have free online courses on digital skills, coding, basic cyber safety. We also need to encourage women in technology with special initiatives for women entrepreneurs, freelancers, safe digital workplaces and introduce flexible remote work laws. We need, most importantly, to establish a legal and policy framework. We also need to update obsolete laws, modernize the ICT Act, the Electronic Transactions Act, IP laws and ensure that there are clear laws for digital signatures, digital contacts, Cloud data residency and online dispute resolution.

Madam, I would like to present all these as proposals forwarded on behalf of the SJB and the SJB Alliance. We firmly believe in promoting the digital economy and it is time to walk the talk.

Thank you.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.05]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
நன்றி, கௌரவ பிரதித் தவிசாளர் அவர்களே!

இன்றைய தினம் ஈழத் தமிழ்த் தேசத்தின் தேசியத் தலைவர் மட்டுமல்லாமல், உலகத் தமிழர்களுடைய தலைவராகவும் இருக்கக்கூடிய தலைவர் பிரபாகரன் அவர்களுடைய 71ஆவது பிறந்த தினம். இந்தத் தேசியத் தலைவருடைய போராட்டத்தை, 2009ஆம் ஆண்டுக்கு முன்னரும் அதற்குப் பின்னரும் மிகவும் மோசமாக விமர்சித்து, கேவலப்படுத்திய தரப்பினரில் இன்று ஆட்சியில் அமர்ந்திருக்கக்கூடிய ஜே.வி.பீ. பிரதான இடத்தைப் பெறுகின்றது. மஹிந்த ராஜபக்ஷ தரப்பு இனவாதம் பேசியபொழுது, தமிழ் இனத்துக்காகத் தேசியத் தலைவருடைய தலைமைத்துவத்திலே நடைபெற்றுக் கொண்டிருந்த விடுதலைப் போராட்டத்தை அழிப்பதற்கு, ஓர் இன அழிப்புக்குத் தத்துவார்த்த ரீதியாகத் தத்துவாசிரியர் களாக இருந்தவர்கள்தான் ஜே.வி.பீ.யினர். அப்படியிருக்க, இன்று இவர்கள் வட, கிழக்கிலே அந்தத் தேசியத் தலைவருடைய தலைமைத்துவத்துக்குக்கீழே இயங்கி, மரணித்த போராளிகளுக்கு அஞ்சலி செலுத்துவதற்கும் அங்கிருக்கின்ற மாவீரர்கள் துயிலும் இல்லங்களை விடுவிப்பதற்கும் தாங்கள் நடவடிக்கை எடுக்கப்போவதாக அங்குள்ள தமிழ் மக்களுக்குக் காட்டுவதும், தெற்கிலே அதற்கு நேர்மாறான கருத்துகளைத் தெரிவிக்கின்றதுமான ஒரு சூழலைக் காணக்கூடியதாக இருக்கின்றது. இந்த விடயத்தில் பிரதானமானவராகச் செயற்படுபவர்களில், எங்களுடைய கௌரவ கடற்றொழில் அமைச்சரும் முக்கியமானதொரு நபர். ஏனென்றால், 'தியாக தீபம்' திலீபன் அவர்களுடைய நினைவுநாள் நிகழ்வுக்கு அவர் நேரடியாகச் சென்றவர்.

இந்த விடயம் எதனைக் காட்டுகின்றதென்றால் கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, ஜே.வி.பீ. போன்ற தமிழ் தேச விரோதக் கொள்கைகளைக் கொண்ட நபர்கள், இன்று அந்தத் தேசியத் தலைவருடைய போராட்டம் மௌனிக்கப்பட்டதுக்குப் பிறகு, அதே தேசியத் தலைவரையும் மாவீரர்களையும் அந்த இயக்கத்தையும் பற்றி ஏதோவொரு வகையில் கதைக்காமல், அவர்களை தூக்கிப்பிடிக்காமல் வட, கிழக்கில் நுழைய முடியாது என்பதைத்தான். அந்த வகையில், எந்தளவு தூரத்துக்கு தமிழ் தேச விரோத தத்துவங்களைக் கொண்ட தரப்புகள் தோல்வியடைந்து இருக்கின்றார்கள் என்பதைத்தான் நான் இங்கு சுட்டிக்காட்ட வேண்டியிருக்கின்றது.

இன்றைய தினம் நாங்கள் கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள் அமைச்சு பற்றி பேசுகின்றோம். வட, கிழக்கைப் பொறுத்தவரையில் அவை இலங்கைத் தீவுடைய மொத்தக் கடற்பரப்பின் கிட்டத்தட்ட மூன்றிலிரண்டு பகுதியைக் கொண்ட பிரதேசங்கள். அந்தக் கடற்பரப்பு போர் நடைபெற்ற காலம் முழுவதும் - போர் நிறுத்தம் மேற்கொள்ளப்பட்ட குறிப்பிட்ட ஒரு சில வருடங்கள் தவிர - 30 வருடங்களுக்கும் மேலாக மீன் பிடிப்பதற்கு முழுமையாகத் தடைவிதிக்கப்பட்ட பிரதேசமாகவே இருந்தது. கௌரவ அமைச்சர் அவர்கள், இன்று அவருடைய அமைச்சுத் தொடர்பான ஆரம்பப் பேச்சின்போது, இலங்கையில் ஒட்டுமொத்தமாக மீன்பிடித் துறை மிகவும் பின்தங்கிய ஒரு நிலையில் காணப்படுவதாகவும், குறிப்பாக ஆதிகால மீன்பிடிக் கலாசாரத்தைக் கடைப்பிடிக்கின்ற ஒரு நாடாக, ஒரு தீவாக எமது நாடு இருப்பதாகவும் ஒரு கருத்தைச் சொல்லியிருந்தார். அதில் உண்மையிருக்கலாம். அப்படியிருந்தாலும், வடக்கு, கிழக்கைப் பொறுத்தவரையில் அது திட்டமிட்டு உருவாக்கப்பட்ட ஒரு நிலைமையாகும். அதாவது, போர் காலச் சூழலில் 30-35 வருடங்கள் அந்தத் தொழில் திட்டமிட்ட வகையில் முழுமையாகத் தடைசெய்யப்பட்டு, அந்தச் சூழல் திட்டமிட்டு உருவாக்கப்பட்டதாகும்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, எனது கேள்வி என்னவென்றால், 2009ஆம் ஆண்டுக்குப் பிறகு அந்தத் தொழில் மீண்டும் தலைதூக்குகின்ற வகையில், போர் முடிவடைந்து இன்றுவரையான 16 வருடங்களுக்குள் வடக்கு, கிழக்கில் கடற்றொழிலை ஊக்குவிப்பதற்கு என்ன நடவடிக்கைகள் எடுக்கப்பட்டிருக்கின்றன? என்பதுதான். எதுவுமே இல்லை! மயிலிட்டி மீன்பிடித் துறைமுகம் அபிவிருத்தி செய்யப்பட்டதாகச் சொல்லப்படுகின்றது. அங்கு அபிவிருத்தி வேலைத்திட்டங்கள் நடைபெற்றது உண்மை.

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

ஆனால், இந்தத் தொழிலில் நாட்டினுடைய மீனவர்களே பின்தங்கிய நிலைமையில்தான் இருக்கின்றார்கள் என்றால், multi-day boat பற்றி கற்பனை பண்ணவே முடியாத வடக்கு, கிழக்கிலே இருக்கின்ற மீனவர்கள் சிறியளவு மீன்பிடித் தொழிலில்தான் ஈடுபட்டுக்கொண்டு இருக்கின்றார்கள்.

அப்படிப்பட்ட நிலையில், பாரிய அபிவிருத்தித் திட்டமென்று மயிலிட்டி மீன்பிடித் துறைமுகத்தை அபிவிருத்தி செய்த பிறகுகூட, அந்தத் துறைமுகத்தை முற்றுமுழுதாக அங்கே இருக்கின்ற மக்களுடைய நலன்களுக்காகப் பயன்படுத்தக்கூடிய ஒரு நிலை இல்லை. அதை கௌரவ அமைச்சர் அவர்களே ஏற்றுக்கொள்வார். மாறாக, கடந்த 16 வருடங்களில் நடைபெற்ற இந்த அபிவிருத்தி வேலைத்திட்டங்கள் அனைத்தும் வடக்கு, கிழக்கு மீனவர்களைத் தொடர்ந்தும் பின்தங்கிய நிலையிலே வைத்திருப்பதற்கும், தெற்கிலுள்ள வெளி மாவட்ட மீனவர்கள் - அவர்களுடைய பொருளாதார நிலைமை வடக்கு, கிழக்கு மீனவர்களைவிடப் பலமான நிலையில் இருந்தும் - அந்தக் கடற்பரப்புக்கு வந்து போட்டிபோடுவதற்குமான ஒரு சூழலை ஏற்படுத்தவே உதவியது. இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்து ஒரு வருடமாகியும் அந்த நிலைமையை மாற்றுவதற்கு எந்தவிதமான நடவடிக்கையும் இதுவரை எடுக்கப்படவில்லை.

கடந்த இரண்டு மாதங்களுக்கு முன்னர் வலிகாமம் வடக்குப் பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் நான் அது தொடர்பில் பிரச்சினையை எழுப்பியதால், அந்தக் குழுவின் தலைவர் வைத்தியர் ஸ்ரீ பவானந்தராஜா அவர்களின் தலையீட்டுடன், அந்தத் துறைமுகத்துக்குச் சென்று அங்குள்ள பரிதாபமான நிலைமை வெளிக்காட்டப்பட்டது. அங்கே இருக்கக்கூடிய மீன்பிடியாளர்கள் அந்த மீன்பிடித் துறை முகத்திலே ஓர் ஓரத்திலே ஒதுக்கப்பட்ட நிலைமையில் இருக்கிறார்கள். இந்திய மீன்பிடியாளர்களின் பாவிக்கப்படாத 'ரோலர்'கள்தான் பெரும்பாலும் அங்கே அடுக்கப்பட்டுள்ளதால் எங்களுடைய மீன்பிடியாளர்கள் அந்தத் துறைமுகத்தைப் பாவிக்கமுடியாத நிலையில் இருக்கிறார்கள். ஒரு வருஷமாக இந்த நிலைமை இருக்கிறது. இப்படிப்பட்ட ஒரு நிலைமை மயிலிட்டியில் இருக்கும்போது -

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

கௌரவ அமைச்சர் அவர்களே, நான் எனது உரையை முடித்தபிறகு நீங்கள் பேசுங்கள்!

இப்படிப்பட்ட ஒரு நிலைமை மயிலிட்டியில் இருக்கும் போது, வேறு வேறு மீன்பிடித் துறைமுகங்களை அபிவிருத்தி செய்வதென்பது, அந்த மக்களுக்கு எவ்வளவு ஆபத்தான நிலைமையாகக் கருதப்பட வேண்டும் என்பதைப் பற்றி அமைச்சர் அவர்கள் நன்கு யோசிக்க வேண்டும். அமைச்சரவர்களுடைய தலைமையில் வடக்கு, கிழக்கில் இருக்கக்கூடிய மீன்பிடித் துறைமுகங்களை அபிவிருத்தி செய்வதில் எங்களுக்கு ஆட்சேபனை இல்லை. ஆனால், அவ்வகையான அபிவிருத்தி வேலைத்திட்டங்கள் அனைத்துமே அங்கிருக்கக்கூடிய மக்களுக்குத்தான் முதலாவது உதவியாக இருக்க வேண்டும். அவை அந்த மக்களுடைய வாழ்க்கையிலே ஓர் அபிவிருத்தியையும் முன்னேற்றத்தையும் ஏற்படுத்துகின்ற நிலையில், அதற்கு மேலதிகமாக வேறு வேறு மக்களுக்கு அந்த வாய்ப்பைக் கொடுப்பதென்றால் அதனை ஒருவகையில் சகித்துக் கொள்ளலாம். ஆனால், அங்கிருக்கக் கூடிய மக்கள் கடைசி நிலையில் இருக்கத்தக்கதாக, வெளியில் இருப்பவர்களுக்குத்தான் முதல் நிலை என்ற நிலைப்பாட்டுக்கு நாங்கள் ஒருபோதும் உடந்தையாக இருக்க முடியாது. மீன்பிடித் துறை அமைச்சர் அவர்கள் இதிலே கவனம் செலுத்துவார் என்று நான் நம்புகின்றேன்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இந்தியா வினுடைய bottom trawling பிரச்சினையில் கணிசமானளவு முன்னேற்றம் இருக்கிறதென்று கௌரவ அமைச்சர் அவர்கள் சொன்னார். அப்படியில்லை! உண்மையிலே பார்த்தால் ஆயிரக்கணக்கில் 'ரோலர்'கள் வருகின்றபோது, அதில் கொஞ்சத்தைக் கைப்பற்று வதால் எந்தவிதமான முன்னேற்றமும் வரப்போவதில்லை. அரசாங்கம் இதை இராஜதந்திரம் என்ற கோணத்தில் பார்க்கக் கூடாது. உண்மையில் இதில் எந்தவோர் இராஜதந்திரமும் இல்லை. அமைச்சர் அவர்களே, இந்த விடயத்தில் உங்களுடைய தலையீட்டில், நீங்கள் அழுத்தத்தைக் கொடுத்து, உண்மையை இந்தியாவுடன் கதைக்க வேண்டும். இந்த விஷயத்திலே உண்மையில் பாதிக்கப்படுபவர்கள் எங்களுடைய மீனவர்கள்; அதிலும் விசேஷசமாகத் தமிழர்கள். ஏனென்றால், இலங்கைத் தீவில் மீன்பிடித் துறை என்பது கூடுதலாகத் தமிழருக்குத்தான் பொருத்தமானது. நாட்டின் கடற்பரப்பில் 2/3 பங்கு வடக்கு, கிழக்கைச் சார்ந்தது. அப்படிப்பட்ட நிலையில், தமிழர்கள் மிக மோசமாகப் பாதிக்கப்படுகிறார்கள். ஏற்கனவே 30-35 வருஷப் போரினால் பின்னிலையில் நிற்கக்கூடிய ஓர் இனம் இதனைத் தொடர்ந்தும் அனுமதிக்க முடியாது என்ற விஷயத்தை அமைச்சர் அவர்கள் மனம் திறந்து சொல்ல வேண்டும். இதை இராஜதந்திரம் என்று சொல்லிக்கொண்டு ஒளிந்துகொண்டு இருப்பதில் பயனில்லை. இராஜதந்திரம் என்ற பெயரில், இந்தியாவுக்கும் தமிழர் களுக்கும் ஓர் இடைவெளியை ஏற்படுத்துகின்ற கோணத்தில் இதற்கு முன்பு இருந்த அரசாங்கங்களைப்போல்தான் நீங்களும் செயற்படுகின்றீர்கள். அப்படியென்றால் சொல்லுங்கள், நாங்கள் நேரடியாக வந்து இந்தியாவுடன் கதைக்கிறோம். ஓர் அரசாங்கமாக இருந்துகொண்டு இப்படியான நொண்டிச் சாட்டுக் கதைகளை எங்களுக்குச் சொல்லக் கூடாது.

வடக்கு, கிழக்கு மீன்பிடித் துறையைப் பொறுத்தமட்டில் உங்களுக்கு முதல் இருந்த கடற்றொழில் அமைச்சர் ஊழலில் ஊறிப் போயிருந்தவர். அவர் தனக்குத் தெரிந்தவர்களுக்கும் அவருக்கு இலஞ்சம் கொடுப்பவர்களுக்கும் கடலட்டை வியாபாரத்தை ஒதுக்கிக் கொடுத்தார். அதற்காக, மீன்பிடிக்கும் கடற்றொழிலுக்கும் எந்தவிதமான சம்பந்தமும் இல்லாதவர் களுக்குக் கணிசமான இடங்கள் ஒதுக்கப்பட்டது. பாரம்பரிய கடற்றொழில் செய்கின்றவர்களுக்கு கடும் இடைஞ்சலை ஏற்படுத்துகின்ற வகையில் அவை ஒதுக்கப்பட்டிருந்தது. ஆனால், உங்களுடைய அரசாங்கம் ஆட்சிக்கு வந்து ஒரு வருஷத்தின் பின்பும் அந்த நிலையில் எந்த மாற்றமும் இல்லை. உண்மையிலே இவ்வகையான கடலட்டை வியாபாரத்தை அனுமதிப்பதாக இருந்தாலும் முதற்கட்டமாக அங்கிருக்கின்ற மக்களுக்குத்தான் அது வழங்கப்பட வேண்டும். ஆனால், இது முழுக்க முழுக்க வியாபாரக் கோணத்திலும் ஊழல் அடிப்படை யிலும்தான் நடைபெற்றது.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Madam, I have three minutes more. It has only been 10 minutes since I started.

Hon. Deputy Chairperson, I wish to say a few words with regard to the digital economy. If you take the North and the East, we have a very strong diaspora, a diaspora that has actually invested in IT. They have, in the last 10 years or so, created strong links with the Tamil youth in the North and the East in order to develop IT-related technology. The Governments in the past gave some incentives, particularly with regard to taxation on those IT -related initiatives, but, unfortunately, those have been removed now. My understanding is that after this Government came - even during the previous Budget Debate I mentioned this - those have been removed.

The University of Jaffna has an IT Department which produces IT graduates in large numbers. It is an ideal place to make IT a specific focus. It has lower operational costs for companies compared to Colombo with lower office rents, lower living expenses, less congestion and more available land. So, it helps create a cost-efficient environment to attract IT companies, startups and tech parks with the strong global diaspora support, as I mentioned. Also, it is a strategic location with cross border digital links. The North's proximity to South India opens doors. Cross border tech partnerships, joint innovative programmes, talent exchanges, BPO/ KPO services targeting Indian and global markets give us a unique strategic advantage in the region.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Madam, I am finishing up.

Since the North and the East have still not been rebuilt, post-war rebuilding gives us an opportunity to properly plan a development programme with the tech industry at its heart. But that will not happen, as I mentioned in my speech at the Second Reading of the Budget, unless we have a holistic approach for the war-affected area. It is an area that has already been destroyed. So, you have to rebuild it. It has not been rebuilt fully. So, if you have a holistic approach, that could become the perfect, ideal example for the rest of the country also to peruse. I urge the Hon. Minister of Fisheries, Aquatic and Ocean Resources to take it to heart. My criticisms are there, but I am saying it in the best interest of our people. I am sure he would agree. I would ask the Minister of Digital Economy also to consider my suggestions. There are enough people in Jaffna and in the entire Northern Province who are willing to engage with you all in a very serious way in order to incorporate such a holistic approach for the North and the East because it is a war-affected area and it must be looked upon separately. And, if you are prepared to accept that, you will have our fullest cooperation.

Thank you.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. IMRAN MAHAROOF took the Chair.*

[අ.භා. 2.19]

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි Ministry of Digital Economy සහ Ministry of Fisheries, Aquatic and Ocean Resources ගැන කාරක සභා අවස්ථාවේ විවාදය කරන වෙලාවේ එම විෂයයන්ට අදාළව යම් කරුණු කාරණා කිහිපයක් මතු කරන්න මම කැමතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට අමාත්‍යවරයා විධියට visionary leader කෙනෙක් ඉන්නවා. ඒ තමයි ජනාධිපතිවරයා. ඒ වාගේම අපට ඉන්නවා, know-how තිබෙන නියෝජ්‍ය අමාත්‍යවරයෙක්. ඒ අපේ එරංග වීරරත්න මැතිතුමා. ඒ නිසා අපට පුළුවන්කමක් ලැබී තිබෙනවා, ඉදිරි දැක්මක් සහිතව මාලිමාව විධියට බලය ගනිද්දී මේ රටේ ජනතාවට ඉදිරිපත් කළ පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් හදලා දෙන ප්‍රතිපත්ති ප්‍රකාශය යථාර්ථයක් බවට පත් කරන ක්‍රියාවලිය ආරම්භ කරන්න. අපි ඒක ඇතුළේ ප්‍රධාන වශයෙන් මූලධර්ම කීපයක් රටේ ජනතාවට කිව්වා.

නවෝත්පාදනය මත පදනම් වූ අඛණ්ඩ වර්ධනය, ඩිජිටල් රාජ්‍යකරණය, ඩිජිටල් ආර්ථිකයේ ප්‍රතිලාභ, උසස් තාක්ෂණය, හොඳම භාවිතය සහ නව වෙළෙඳ පොළ වෙත ප්‍රවේශ වීම සඳහා ජාත්‍යන්තර හවුල්කාරිත්වය, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල යටිතල පහසුකම් කියන මූලධර්ම මත පදනම් වෙලා මේ ක්‍රියාවලිය ආරම්භ කරන්න තමයි අපි ජනතාවගෙන් බලය ගත්තේ. ඒ අනුව පදනම් වෙලා 2025 අවුරුද්දේ මේ සඳහා රුපියල් බිලියන 21ක මුදලක් අපි වෙන් කළා. මේ අවුරුද්දේ අපි රුපියල් බිලියන 25.5ක මුදලක් මේ වෙනුවෙන් වෙන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස්වල නිතර ඇහෙන කථාවක් තමයි, "ආ, ඔයගොල්ලන් සල්ලි වෙන් කළා නේ. හැබැයි, කරපුවා පෙන්වන්න. කරපුවා පෙන්වන්න" කියන එක. ඒක තමයි, ප්‍රධාන කථාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන්

[ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා]

රජයේ ඩිජිටල් ගෙවීම් වේදිකාවේ, නැත්නම් GovPay එකේ 2025 මූල්‍ය ප්‍රගතිය ගත්තොත්, 2025 සැප්තැම්බර් මාසයේ 30වැනි දා වෙනකොට රුපියල් මිලියන 200ක් වෙන් කරලා තිබෙනවා. හැබැයි රුපියල් මිලියන 0.84යි වියදම් කරලා තිබෙන්නේ. දැන් ඔන්න මර ළතෝනි දෙන්න පුළුවන්, "ආ, සල්ලි වෙන් කළාට වැඩක් නැහැ, වියදම් කරලා නැහැ, වියදම් කරලා නැහැ, ඔයගොල්ලන්ට වැඩ කරන්න තේරෙන්නේ නැහැ" කියලා. ඒක නේ, දැන් මේ ටිකකට කලිනුත් ඇහුණේ. හැබැයි භෞතික ප්‍රගතිය සියයට 100යි; භෞතික ප්‍රගතිය සියයට 100ක්. සමහර මහත්වරු මේකේ ඇත්ත කථාව කියන්නේ නැහැ. බොරුවට මූල්‍ය ප්‍රගතිය ගැන කථා කරනවා. මූල්‍ය ප්‍රගතිය බලන්නේ අවුරුද්දේ අන්තිමට. සමහර මහත්වරු ටීවී එකට ඇවිල්ලා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා, "මූල්‍ය ප්‍රගතිය මෙහෙම, භෞතික ප්‍රගතිය මෙහෙම" කියලා අතින් ප්‍රස්ථාර ඇඳලා පෙන්වනවා. බොරු කියලා නාලා ඉන්නේ. ඒ, එක ව්‍යාපෘතියක මූල්‍ය ප්‍රගතිය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, Lanka Government Network 2.0. නමුත් භෞතික ප්‍රගතිය සියයට 100යි. Lanka Government Cloud, මූල්‍ය ප්‍රගතිය 2.0; භෞතික ප්‍රගතිය සියයට 100යි. රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය - GIC, AI-driven භෞතික ප්‍රගතිය සියයට 100යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ ආණ්ඩුව නිශ්චිත බලයක් අරගෙන, නිශ්චිත සැලැස්මක් මත, නිශ්චිතව මුදල් වෙන් කරලා, නිශ්චිත ඉලක්ක කරා ගමන් කරමින් ඉන්නවා. හැබැයි, ඒක පිළිගන්න සූදානම් නැහැ. ඒ වාගේම තමයි අනාගතය ගැන හිතලා අර මූලධර්මවල එන වෙළෙඳ පොළ ප්‍රවේශය, ජාත්‍යන්තර හවුල්කාරිත්වය, good practices ගැන අපි රටට ලබා දෙන්න බලාපොරොත්තු වෙච්ච ඉලක්ක අත්පත් කර ගන්න අපි පසුගිය අවුරුද්දක කාලයේ මොනවාද කළේ?

Disrupt Asia 2025, Sri Lanka FinTech Summit, National AI Expo යන සමුළු තුනම පවත්වන්න අපට පුළුවන්කම ලැබුණා විතරක් නොවෙයි, ඒවාට අදාළව දැන් ආයෝජන එන්න පටන් අරගෙන තිබෙනවා. ජාත්‍යන්තර වෙළඳ පොළ විවෘත වෙන්න පටන් අරගෙන තිබෙනවා. 2025 - 2029 ජාතික සයිබර් ආරක්ෂණ උපාය මාර්ගය හදලා තිබෙනවා. ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය පිහිටුවලා තිබෙනවා, ජනාධිපතිවරයා විසින්. ඒ වාගේම National Data Exchange - NDE, G2G - Government-to-Government, G2B - Government-to-Business, G2C - Government-to-Citizen අදාළව ආයතන අතර එකිනෙක සම්බන්ධතා සහිතව, අමාත්‍යාංශ අතර සම්බන්ධතා සහිතව කටයුතු කරන්න පුළුවන් වෙන විධියේ පද්ධතියක්, platform එකක් අපි හදමින් ඉන්නවා. ඇයි ඒ? දැන් අමාත්‍යාංශ එකින් එක වෙනස්. තැන් තැන්වල data තිබෙන්නේ. Silos වෙන වෙනම තිබෙන්නේ. ඒවා පාවිච්චියට ගන්න පුළුවන්කමක් නැහැ, තීන්දු තීරණ ගනිද්දි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. මුළු රටක තීන්දු ගන්න වැඩේ එක මිටකට අරගෙන ලස්සනට තීන්දු ගන්න පුළුවන් වෙන විධියට අවශ්‍ය දත්ත ටික මෙහෙයවමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හර්ෂ ද සිල්වා මැතිතුමා ඉතාම හොඳ අදහස් ප්‍රමාණයක් මතු කළා. එතුමා මතු කළා, මේ ආණ්ඩුවට digital transformation එක ගැන contextual understanding එකක් තිබෙනවාද කියන කාරණය. ඒ වාගේම public discourse එකක් හදලා තිබෙනවාද කියන කාරණය එතුමා මතක් කළා. We have already done that . We have received the mandate, the people's mandate for that. We have mentioned this in our policy document also. So, we have received the mandate, but if you are telling us that you want more discussions, this is the place to discuss it. That is why we are debating it here. අපි මේවා එළියේදීත් කථා කරමු; ජනතාවට තවත් දැන ගැනීමට එළියේදීත් කථා කරමු. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. ඒක හොඳයි. හැබැයි, අපට මහජන මතය අනුව අවශ්‍ය බලය හම්බ වෙලා තිබෙන්නේ.

ඊළඟට එතුමා තව කාරණයක් මතු කළා. ඒ තමයි, the case study on Hans. ඒක interesting topic එකක්. හාන්ස් විජේසූරිය මහත්මයාගේ ක්‍රියාවලිය, හැසිරීම කොහොමද තීරණය වෙන්නේ කියන කාරණය ගැන කථා කළා. ඇත්ත, එහෙම එක එක්කෙනාගේ හැසිරීම පිළිබඳව ගැටලුවක් මතු වෙන්නේ නැහැ. ඇයි? අපි ආණ්ඩුවක්. අපි තීරණ ගන්නේ ආණ්ඩුවක් විධියට. අපට තිබෙනවා, collective consciousness එකක්. අපට සාමූහික හෘදය සාක්ෂියක් තිබෙනවා, අවබෝධයක් තිබෙනවා. අපට democratic values මත පදනම් වෙච්ච ක්‍රියාවලියක් තිබෙනවා, තීන්දු තීරණ ගන්න. ඒ නිසා තනි තනි පුද්ගලයන්ගේ හැසිරීම මේකට අදාළ නැහැ. පාලකයන් එක්ක ඉතිහාසයේ එකට වැඩ කරලා වැරැදි කරපු අයටත් නිවැරදි වෙන්න ඕනෑ තරම් අවස්ථාව සහිතව ලංකාවේ මේ වැඩ කරනවා.

එහෙම කරන්න ඕනෑ. හාන්ස් විජේසූරිය මහත්මයා ගැන එහෙම ගැටලුවක් මතු වෙලා නැහැ. ඒ නිසා ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු කණ්ඩායම කරන ක්‍රියාවලිය, හාන්ස් විජේසූරිය මැතිතුමා ඇතුළු කණ්ඩායම කරන ක්‍රියාවලිය වට්ටනවා වෙනුවට, ඒකට වටිනාකම දෙන්න ඕනෑ.

එතුමා තවත් කාරණයක් මතු කළා, citizenship සම්බන්ධයෙන්. එතුමා පුරවැසිභාවය සම්බන්ධ concept එකක් මතු කළා, ගැටලුවක් මතු වෙනවා නේද කියලා. ස්විට්සර්ලන්ත ආණ්ඩුව පසුගිය සැප්තැම්බර් මාසයේ 28වැනි දා digital ID එකක් ගේනවාද කියන කාරණය සම්බන්ධයෙන් ඒ රටේ ක්‍රියාත්මක වන ක්‍රමය අනුව මහජන මත විමසුමක් කළා. අවුරුදු ගණනක් debate කරලා සියයට 50ක් අරගෙන ඒ Bill එක pass වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට එහෙම ක්‍රමයක් නැහැ. අපට ස්විට්සර්ලන්තයේ වාගේ bottom-up approach එකක් නැහැ. අපට තිබෙන්නේ ජනතාවගේ mandate එක අරගෙන, මෙතැන කථා කරන එක. හැබැයි, තවදුරටත් සංවාද ඕනෑ කියලා විපක්ෂය කියනවා නම්, මේක ඉතාම වැදගත් දෙයක් නිසා, ගරු ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු අපේ ආණ්ඩුව තවදුරටත් මේ ගැන සාකච්ඡා කරන්න සූදානම්.

ඒ වාගේම විද්‍යාව හා තාක්ෂණය පැත්තෙන් ගත්තොත්, අපේ ගරු ක්‍රිෂාන්ත අබේසේන ඇමතිතුමා ඇතුළු කණ්ඩායම අද වන විට විද්‍යා හා තාක්ෂණ ජාතික ප්‍රතිපත්තිය හදමින් ඉන්නවා. දැන් ඒකට රුපියල් මිලියන 15ක් වෙන් කරලා තිබෙනවා. අන්න ඒකටත් කියන්න පුළුවන් එතුමන්ලා වැඩ කරලා මදි කියලා. සියයට 75ක් ඒ වැඩ අවසන් කරලා තිබෙනවා. හැබැයි වියදම් කරලා තිබෙන්නේ බොහොම පොඩ්ඩයි. ඕනෑ නම් ඒ ගැනත් කියවන්න පුළුවන්. හැබැයි, ඒක වෙන්න හේතුව මේකයි. ජනාධිපතිතුමාගේ ජාතික විද්‍යා උපදේශක සහ ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ එකට වැඩ කරපු නිසා, ඒකේ වියදම අවම වෙලා තිබෙනවා. හැබැයි, විපක්ෂයේ ඇතැම් කණ්ඩායම් බොරුවට කියනවා, ප්‍රගතිය නැහැ, ප්‍රගතිය නැහැ කියලා.

ඒ වාගේම තව වැදගත්ම දෙයක් තිබෙනවා. ඒ, National Initiative for Research and Development Commercialization. අපි කොච්චර විද්‍යාත්මක කරුණු සොයා ගත්තත්, අලුත් සොයා ගැනීම් කළත්, අපේ දරුවෝ ඒවා සොයා ගත්තත්, පාසල්, විශ්වවිද්‍යාල ඒවාට මහන්සි වුණත් වැඩක් නැහැ, ඒක රටේ ආර්ථිකයට දායකත්වය දෙන්න පුළුවන් නිෂ්පාදනයක් කරා ගෙන යන්න පුළුවන්කම ලැබුණේ නැත්නම්. ඉතිහාසය පුරා එහෙම වුණා. ඒ නිසා අපට ඕනෑ කරලා තිබෙනවා, නිශ්චිතව ඒක වෙනස් කර ගන්න. ඒ නිසා අපි දැන් ඒ වෙනුවෙන් වැඩ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම ධීවරයන් ගැනත් කියන්න ඕනෑ. ධීවරයන් ගැන සමහර මන්ත්‍රීවරු කථා කළා. ඒගොල්ලෝ කියනවා, භූමිතෙල්වල මිල අඩු කරලා නැහැ ලු. දැන් භූමිතෙල්වලට යනවා ලු, රුපියල් 1,662,000ක්. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, මතකද දන්නේ නැහැ, ඒගොල්ලෝ පාලනය කරන කාලයේ රුපියල් 1,842,000ක් ගියා. ඒ කාලයේ ඩීසල් ලීටරය රුපියල් 307යි. අද රුපියල් 277යි. අද අඩු කරලා තිබෙන්නේ. රුපියල් 180,000කින් අඩු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපි දැන් ඒ අය වෙනුවෙන් තවත් වැඩ කරගෙන යනවා. දියඹට යන යාත්‍රා එක්ක සන්නිවේදන කටයුත්ත කරන්න අවශ්‍ය වන තාක්ෂණික සහාය ගන්න ඩිජිටල් අමාත්‍යාංශය මැදිහත් වෙමින් ඉන්නවා. පුසෝ, මීයෝ අල්ලනවා වාගේ ඉව ඔස්සේ ගිහින් මාළු අල්ලන්න බැහැ. ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාවලිය ඩිජිටල් අමාත්‍යාංශය ආරම්භ කරලා තිබෙනවා, fishing fields තිබෙන්නේ කොහේද කියලා ධීවරයන්ට දැනුම් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි ඒ වෙනුවෙන් වැඩ කරමින් ඉන්නවා. ඒගොල්ලන්ට අවුරුදු 76ක් තිස්සේ කරන්න බැරි වෙච්ච දේවල් අපි අවුරුද්දෙන් කරන්න ඕනෑ කියලා තමයි මෙතැනට ඇවිල්ලා කථා කරන්නේ. අපි සූදානම් ජනතාව වෙනුවෙන් මේ කටයුතු කරලා ඉවර කරන්න. හැබැයි, ඒ ගොල්ලෝ කරපු වැරැදිත් ඔක්කොම හදාගෙනයි අපට යන්න වෙන්නේ. මගේ බේරුවල ආසනය ගත්තොත්, ධීවරයෝ වෙනුවෙන්, මහ බෝට්ටු හිමියෝ වෙනුවෙන්, කුඩා බෝට්ටු හිමියෝ වෙනුවෙන් රුපියල් ලක්ෂ 750ක් වියදම් කරලා කර්මාන්ත අමාත්‍යාංශය හා ධීවර අමාත්‍යාංශය මැදිහත් වෙලා දියත් මඟක් -slipway එකක් - හදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා. ඒක අවශ්‍ය වෙන්නේ, රටට ඩොලර් ගේන්නයි. මහ බෝට්ටු හිමියන්ට මේක අවශ්‍ය වෙනවා. හැබැයි ඒක හදන්න ගියාම, fibre dust එක සම්බන්ධ පරිසර ප්‍රශ්නයක් ආවා.

ඒ fibre dust එක සම්බන්ධයෙන් ආපු ප්‍රශ්නය අපි විසඳුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මහජනතාව කිව්වේ මොකක්ද? "ඔබතුමන්ලා වාගේ නොවෙයි ඒ කාලයේ රත්තරන් මහත්වරු 'උඹලා ඉන්නවා නම් ඉඳපල්ලා, නැත්නම් පලයල්ලා' කියලායි අපිට කිව්වේ" යනුවෙන් ඔවුන් කිව්වා. එහෙම තමයි රත්තරන් මහත්වරු කියලා තිබෙන්නේ. දැන් අපිට එනවා, මේ ගැන දුක කියන්න.

අවසාන වශයෙන් මම මේ කාරණාවත් කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් මේ ඇවිල්ලා කියන්නේ මොකක්ද? මාළු, ඇඟිල්ලෝ දාන්නේ නැහැ ලු. එතුමාට මාළු ඒක කිව්වාද දන්නේ නැහැ. ඒ බොරු. පට්ටපල් බොරු, පච කියන්නේ. පච කියලා කියලා මලෙන් උපන් කුමාරයා වාගේ ඇවිල්ලා මෙතැන රඟපාලා යනවා. මේ තමයි කයි පොයියෝ. මේ තමයි කයි පොයියෝ. විපක්ෂයේ ඇතැම් කණ්ඩායම් ඉන්නවා. ඔවුන් අමු අමුවෙන්ම කයි පොයියෝ. මේ ආණ්ඩුව නිශ්චිතවම ජනතාවගේ ජයග්‍රහණය වෙනුවෙන් වැඩ කරලා ජනතාව දිනවලා තමයි නතර වෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.32]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට මා මිත්‍ර චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ වේගවත් කථාවට පසුව කථා කරන්න අවස්ථාවක් ලැබීමට තරම් මම භාග්‍යවන්ත වෙලා තිබෙනවා. අපේ තවත් මිත්‍රයෙක් තමයි මේ අවස්ථාවේ මූලාසනයේ වාඩි වෙලා සිටින්නේ. මම හිතන විධියට, එතුමා මගේ ඉස්කෝලයටත් ගිය කෙනෙක්.

අද කථා කරන්න ලැබිලා තිබෙන මාතෘකා තුන තමයි ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය; මම ඇමතිව හිටපු විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය - Ministry of Science and Technology - සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල වැය ශීර්ෂයන්. ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ ඉන්නවා ඇති කියලා මම හිතනවා. මේවා රටේ ආර්ථිකයට, සෞභාග්‍යයට බලපාන ප්‍රධාන අංශ තුනක්. මෙහිදී අපේ ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් ධීවර කර්මාන්තය ගැන හොඳට දන්න, ධීවර කර්මාන්තයේ යෙදෙන මා මිත්‍ර දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා අදහස් දැක්වූවා. ඒ නිසා, ඒ සම්බන්ධයෙන් වැඩි යමක් කියන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. එක කාරණයක් පමණක් අපේ චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාට මතක් කරලා දෙන්න මම කැමැතියි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියපු ආකාරයට තාක්ෂණය භාවිත කරලා අපේ ධීවරයන්ට ඒ මාළු ඉන්න තැන් කොහේද කියලා බලන්න ඒ අවස්ථාව ලබා දෙනවා කියලා අපේ ජනාධිපතිතුමා කියා තිබෙනවා. නමුත් ධීවරයන්ට තවම එහෙම සහයෝගයක් ලැබිලා නැහැ. මම හිතන විධියට, ධීවරයන්ට ඒ සහයෝගය, ඒ තාක්ෂණය තවම හම්බ වෙලා නැහැ. දියුණු තාක්ෂණයත් එක්ක ඒ අවස්ථාව ලබා දෙනවා නම් ඒක හොඳයි කියලා මම හිතනවා.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ මම පොඩි කාලයක් තමයි හිටියේ. ඒ මාස ගණනක කාලය සම්බන්ධයෙන් මම අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නම්. ඒ වාගේම, අධ්‍යාපනය ගැන අද උදේ අගමැතිතුමිය කළ ප්‍රකාශය සම්බන්ධයෙනුත් යම් අදහසක් ප්‍රකාශ කරන්නම්. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට අදාළව ඉතා වැදගත් ආයතන කිහිපයක් තිබෙනවා. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව, ජාතික විද්‍යා පදනම, ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව, කාර්මික තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා පරමාණු බලශක්ති මණ්ඩලය, ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය ආදී වශයෙන් ඉතාම වැදගත් ආයතන කීපයක් මේකට ඇතුළත් වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙය ඔබතුමාගේ අමාත්‍යාංශය නොවුණත්, මේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් මම ලොකු උනන්දුවක් දක්වූවා. මේ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා වශයෙන් පත් වුණාට මට මේ සම්බන්ධයෙන් ලොකු දැනුමක් තිබුණේ නැහැ. හැබැයි මාස දෙකක් වාගේ කාලයක් මම මේක හොඳට අධ්‍යයනය කළා. අධ්‍යයනය කරලා මේ ආයතනවලට සභාපතිවරු පත් කරනකොට ඒ ගැන හොයලා බැලුවා. සමහර වෙලාවට අපේ මහාචාර්යවරුන්ගෙන් අහනවා. මහාචාර්යවරුත් තමන්ගේ යාලුවන්ගේ නම් තමයි ගොඩක් වෙලාවට දෙන්නේ. සමහර විට ඉගෙන ගත්ත මහාචාර්යවරු අනිවාර්යයෙන්ම රට ගැන හිතලා ඒ සම්බන්ධයෙන්ම අදහසක් දෙයි කියලා අපි හිතනවා. සමහර විට එහෙම වෙන්නේ නැහැ. තමන්ට හිතවත් කට්ටියගේ නම් තමයි දෙන්නේ. මම කොහොම හරි විශාල පරිශ්‍රමයක් යොදලා ඉතාම දක්ෂ සභාපතිවරු පිරිසක් මේකට පත් කරගත්තා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ අයව පත් කරගෙන

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

මාස කීපයක් ඇතුළත මම තේරුම් ගත්තා, මෙම ආයතන බොහොමයක එක කාරණය තමයි සිදුවෙන්නේ කියලා. මම ඔබතුමාට උදාහරණයක් සහිතව කියන්නම්. ඒ තමයි, ග්‍රැෆයිට්වලින් නැනෝ බැටරි හදන එක. මේකෙදි ජනාධිපතිතුමා කිව්වා, මිනිරන් ග්‍රැෆීන් කරනවා කියලා. ඇත්තටම, ග්‍රැෆයිට් තමයි ග්‍රැෆීන් කෙරෙන්නේ. මම හිතන විධියට ආයතන කිහිපයක්ම අවුරුදු 7ක, 8ක, 9ක වාගේ කාලයක් තිස්සේ ඉඳන් මේ බැටරිය හදනවා. ගරු ඇමතිතුමනි, තාක්ෂණය කියන එක පැය ගණනින් ගණනට ලෝකයේ අලුත් වෙනවා. මම දැක්ක දෙයක් තමයි, මේ ආයතනවල -ගොඩක් තැන්වල- අවුරුදු 7, 8 එකම දේ කෙරෙන්නේ. මට නවෝත්පාදන අංශයේ සහෝදරයෙක් මුණ ගැහුණා. එතුමා නියරවල වල් කපන යන්ත්‍රයක් නිෂ්පාදනය කර තිබුණා. අවුරුදු 10කට ඒක නිෂ්පාදනය කර තිබුණේ. තවම ඒ යන්ත්‍රයෙන්මයි එතුමා වැඩ කටයුතු කරන්නේ. එතකොට චීනය, සිංගප්පූරුව, මලයාසියාව වාගේ රටවල් මේක පසු කර ගිහිල්ලා වෙනම තාක්ෂණයකින් ඒ කටයුත්ත කරන්න යොමු වෙනවා. ඉතින්, මේ ආයතනවල කාර්යක්ෂමතාව වැඩි කරගන්න නම් පෞද්ගලික අංශය මීට වඩා මේකට ඇතුළත් කරගන්න ඕනෑ. එහෙම නැතිව රජයේ අංශවලින්ම, රජයේ ආයතනවලින්ම, රජයේ නිලධාරින්ම මේක කරන්න ගියොත්, ඒකෙන් අපි බලාපොරොත්තු වන සංවර්ධනය, තාක්ෂණය, දියුණුව ලැබෙන්නේ නැහැ. මම බැලුවා, මේකට පෞද්ගලික අංශය සම්බන්ධ කරගන්නේ කොහොමද කියලා. හැම වෙලාවේම පෞද්ගලික අංශය සම්බන්ධ කරගත්තාම, - ඒගොල්ලන් ලාභය මත තමයි කටයුතු කරන්නේ. ඒ නිසා ලෝකයේ දියුණු තාක්ෂණය මේකට ඇතුළු කරගෙන මේ ආයතනවලින් ලාභයක් ගන්න ඒගොල්ලන් උනන්දු වෙනවා. මේ ආයතන මුදල් වෙන් කරනවා. අපි මේ කාගෙන් හරි අහලා බැලුවොත්, මේ ආයතනයට කවුද සම්බන්ධ කියලා, එක්කෙනෙක්වත් නැහැ. අපේ ව්‍යාපාරිකයන් ඉන්නවා. අපේ නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා, කෘෂිකර්මය පැත්තෙන්. අපි මේ ආයතනවලට ගිහිල්ලා නැහැ. මේ ආයතන ජනතාවත් එක්ක සම්බන්ධ වෙන්න නම් මොකක්ද කරන්න ඕනෑ?

ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමනි, අනෙක් කාරණය මේකයි. ඉංග්‍රීසියෙන් තමයි ගොඩක් මේ කටයුතු සිද්ධ වෙන්නේ. අපේ ලංකාවේ ගොඩක් අයට ඉංග්‍රීසි භාෂාව කථා කරන්න බැහැ. ඉංග්‍රීසියෙන් මේක අධ්‍යයනය කරලා ජනතාවට මේ දැනුම ලබා දෙන්නේ කොහොමද? ඊට පස්සේ මම කල්පනා කළා, මේ දැනුම ලබා දෙන්න පුළුවන් හොඳම විධිය තමයි මේවායේ exhibitions පැවැත්වීම කියලා. එහෙම කල්පනා කරලා මම "ශිල්ප සේනා" කියන වැඩසටහන පටන් ගත්තා. ආයතනවලින්ම පුළුවන් තරම් අපි එකතු කරගෙන ඉතාම අඩු මුදලකින් - මම හිතන්නේ මිලියන 35ක 40ක වගේ මුදලකින් - පටන් ගත්තා. ඉස්කෝලෙන් ඉස්කෝලෙට මේ ශිල්ප සේනා වැඩසටහන අරගෙන යන්න පටන් ගත්තා. සහරාන්ගේ බෝම්බ සිද්ධියෙන් පසුව අපට ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා. අපි ඒකත් නිරාකරණය කරගෙන BMICH එකේ එම වැඩසටහන පැවැත්වුවා. ලක්ෂ 5කට අධික ප්‍රමාණයක් - ලංකාවේ දරුවන්, ඒ වාගේම ව්‍යාපාරිකයන්, තාක්ෂණයට උනන්දු කට්ටිය - ඇවිල්ලා තිබුණා. ඒ අයට ඒකෙන් ඉගෙන ගන්න අවස්ථාව ලැබුණා. මම ත්‍රිවිධ හමුදාවත් ගෙන්නුවා. ඒ කට්ටියටත් - පොලීසියට, හමුදාවට නාවික හමුදාවට, ගුවන් හමුදාවට - මම අවස්ථාවක් ලබා දුන්නා, එතැනදීම තරුණයන් බඳවා ගන්න. ඒ වාගේම ඒගොල්ලන්ගේ තාක්ෂණයත් ලබා දෙන්න, ඒගොල්ලන්ටත් අර තාක්ෂණය ලබා ගන්න අවස්ථාව ලබා දුන්නා. නැත්නම් මේ ආයතන අතර combination එකක් නැහැ. ඒ වාගේ එකක් පටන් ගන්න පුළුවන් නම් හොඳයි කියලා මේ ආණ්ඩුවට මම යෝජනා කරනවා. ඒ මිලියන තිස් ගණනින් ඔක්කොම බඩු ටික හදාගත්තා. අපි පටන් ගත්තේ BMICH එකේ, කොළඹම එකතු කරගෙන. ඊට පස්සේ පොළොන්නරුව ඉස්කෝලෙකට අපි ගියා. අපි බලාපොරොත්තු වුණා, මාස තුනෙන් තුනට ඉස්කෝලෙන් ඉස්කෝලෙට යන්න. එහෙම නැත්නම් වෙනත් ස්ථානයක තිබෙනවා නම් එච්චර මුදලක් වියදම් නොකර ඒ ස්ථානවල යන්න. එතකොට මේ දැනුම අපේ ගමේ තරුණ තරුණියන්ට, අපේ නංගිලා මල්ලිලාට ලබා දෙන්න පුළුවන්. එහෙම නැත්නම්, ගමේ ඉන්න දුප්පත් දරුවන්ට මේ ආයතනයට ඇවිල්ලා මේ සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්න පුළුවන් වෙන්නේ කොහොමද, නියෝජ්‍ය ඇමතිතුමනි? අපි මෙහේ ඉඳගෙන කථා කරනවා. අපි මෙහේ ඉඳගෙන ඔක්කොම සම්පාදනය කරනවා. මේ ආයතනවලට මුදල් වෙන් කරනවා. හැබැයි මේ ආයතන ලබා ගන්නා දැනුම රටට පොවන්නේ කොහොමද? ඒ සඳහා හොඳම ක්‍රමවේදය තමයි මේක. මට මතකයි, ප්‍රේමදාස මහත්මයාගේ කාලයේ මේ වාගේ දේවල් සිද්ධ වුණා. ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ කාලයේ මෙවැනි exhibitions ගොඩක් සිදු වුණා. මට මතකයි, "දැයට කිරුළ" ප්‍රදර්ශනයට ඒ කාලයේ මිලියන 600ක්, 700ක් වියදම් කළා. අපේ ඊට වඩා සෙනඟ ප්‍රමාණයක් ආවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කෘෂිකර්මයටත් ඒක පටන් ගන්න පුළුවන් නම් හොඳයි. ගම්වල ඉන්න අපේ තරුණ තරුණියන් දියුණු තාක්ෂණය ගැන එච්චරම දන්නේ නැහැ නේ. මේ exhibitionsවලට ආවා නම් ඒගොල්ලන්ට අදහසක් ලැබෙනවා. ගමට ගිහිල්ලා ඒගොල්ලන් ඒ ගැන විශාල උනන්දුවක් දක්වාවි. අද මේ ගැලරියේ ඉන්නවා, දරුවන් 40ක් 50ක්. මේ ආයතනයට ආපු දරුවෙක් මෙතැන නැතුව ඇති.

අනෙක් කාරණය මේකයි. ගොඩක් අධ්‍යයන සිදු වෙන්නේ ඉංග්‍රීසියෙන්. ඔබතුමා දන්නවා නේ, විද්‍යාව - science - කියන එක අපි ඔක්කොටම හොල්මන් කියලා; ඒක ඉංග්‍රීසියෙන් කිව්වාම ඩබල් හොල්මන්. එතකොට IQ සම්බන්ධයෙන් අපේ ජනතාවට තිබෙන දැනුමත් එක්ක මීට වඩා හොඳ ක්‍රමයකට මේ දැනුම ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. ඒ සඳහා හොඳම ක්‍රමවේදය තමයි ඉස්කෝලෙන් ඉස්කෝලෙට හොඳ exhibition එකක් පටන් ගැනීම. ඒ ආයතන ටික ඔක්කොම ගියා. ඔක්කොම ආයතන ඇවිල්ලා ඒගොල්ලන්ගේ ප්‍රදර්ශනය ලස්සනට කළාම ළමයි ඇවිල්ලා අහනවා, "මේක නිෂ්පාදනය කරන්නේ කොහොමද, මේක කෘෂිකර්මයට අදාළ කරගන්නේ කොහොමද, මේකට දියුණු තාක්ෂණය අදාළ කරගන්නේ කොහොමද, ඒ රටවල් විශාල ඵලදාවක් ලබා ගන්නේ කොහොමද, ආදායමක් ලබා ගන්නේ කොහොමද?" කියලා. ගරු ඇමතිතුමා, මේ දැනුම අපට දෙන්න පුළුවන් එකම ක්‍රමවේදය තමයි මේවා දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට අරගෙන යන එක. අපට මේවා දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට අරගෙන යන්න පුළුවන් නම් ඉතා හොඳයි. මේ ආයතන කොළඹ තිබුණාට වැඩක් නැහැ. මේ ආයතන ප්‍රධාන වශයෙන් අරමුණු දෙකක් යටතේ ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

Sir, if you could give me one more minute, I will finish up my speech.

ගරු ඇමතිතුමනි, අපි මේ සම්බන්ධව කථා කළාට වැඩක් නැහැ නේ. අපේ රට අද තිබෙන තත්ත්වය අපි දන්නවා නේ. අපේ ජනගහනයෙන් සියයට 30කටත් වඩා දුප්පත්. ආණ්ඩු එනවා,

යනවා, කථා කරනවා, වැඩ වෙන්නේ නැහැ. මේ රටේ වැඩ ටිකක් වුණා නම් වුණේ, මහවැලිය, ගම් උදාව, ඇඟලුම් කර්මාන්තය වාගේ ඒවා සම්බන්ධයෙන් තමයි. ඊට පස්සේ ලොකුවට වැඩක් වෙලා නැහැ. අපට පොඩි පොඩි දේවල් කියන්න පුළුවන්. එහෙම නොවෙයි, ඒ වාගේ වැඩ කරන්න ඕනෑ නම් අනිවාර්යයෙන්ම පෙට්ටියෙන් එළියේ හිතන්න ඕනෑ; you have to think outside the box. පෞද්ගලික අංශයේ ආයෝජකයින් කොහෙන් හරි ගෙනැල්ලා මේ ක්ෂේත්‍රයට එකතු කරන්න ඕනෑ. එතකොට මේ යන්ත්‍රණය මුවහත් වෙනවා.

ගරු අගමැතිතුමිය උදේ කළ කථාවට මම යමක් එකතු කරන්නම්, අධ්‍යාපනය සම්බන්ධයෙන්. එතුමිය එදා කිව්වා, අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කළ යුතුයි කියලා. එතුමිය කියනවා, එහෙම කිව්වේ නැහැයි කියලා. එතුමිය එදා හිටියේ ටී-ෂර්ට් එකක් සහ ජීන්ස් එකක් ඇඳගෙන, ටී-ෂර්ට් එකේ සියයට 6 කියලා ගහගෙන. එතුමිය අද මේ සභාවේදී කිව්වා, ඔවුන් අධ්‍යාපනයට වෙන් කරන මුදල ටිකෙන් ටික වැඩි කරනවා කියලා. එහෙම කිසිම වැඩි කිරීමක් නම් පෙනෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම සඳහන් කරන්නම්, එතුමිය ඊයේ කිව්ව ගණන් කිහිපයක් පිළිබඳව. යම් මුදල් ප්‍රමාණයක් වැඩි වෙලා තිබෙනවා නම්, ඒ වැඩි වෙලා තිබෙන්නේ පඩිවලට. ප්‍රාග්ධන වියදම්වලට නොවෙයි. මම එකින් එක සඳහන් කරන්නම්. 2025දී අධ්‍යාපනයට රුපියල් බිලියන 99.3ක් වුණු ප්‍රාග්ධන වියදම 2026දී රුපියල් බිලියන 98.8යි. එය රුපියල් මිලියන 500කින් - රුපියල් කෝටි 50කින් - කපලා. එතකොට විශ්වවිද්‍යාලවලට වෙන් කළ රුපියල් බිලියන 153.3ක මුදල රුපියල් බිලියන 133.9 දක්වා මේ වසරේ රුපියල් බිලියන 1.4කින් - රුපියල් කෝටි 140කින් - අඩු කරලා. ප්‍රාථමික පාසල් 3,577කට පහසුකම් වැඩිදියුණු කරන්න කියලා රුපියල් ලක්ෂ 60ක් වෙන් කරලා තිබෙනවා. එතකොට එක පාසලකට වෙන් වන්නේ රුපියල් 1,700යි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රුපියල් 1,700කින් පාසලකට දෙන්න පුළුවන් මොනවාද? ද්විතීයික පාසල් 1,000ක පහසුකම් වැඩිදියුණු කරන්න පසුගිය අවුරුද්දට වෙන් කළා, රුපියල් මිලියන 1,010ක්. වියදම් නොකිරීම නිසා ඒ මුදලින් සියයට 75ක් කපලා. ගරු ඇමතිතුමනි, ඒ වාගේම ගිය සැරේ වෙන් කළ මුදලින් සියයට 60යි මේ සැරේ අධ්‍යාපනයට වෙන් කරලා තිබෙන්නේ. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට එකක්වත් මේ සැරේ වෙන් කරලා නැහැ, අධ්‍යාපනයට. ඒ මුදල් ප්‍රමාණය, ඒ යන්ත්‍රණය ආණ්ඩුවේ නැහැ. ඒ වාගේම මෑත වසරවල ව්‍යාපෘතිවලට ඇතුළත් නොවූ පාසල් 1,360ක පහසුකම් දියුණු කරන්න අවුරුද්දකට වෙන් කරන මුදල රුපියල් මිලියන 520 සිට 443කට අඩු කරලා. ඒ නිසා දුප්පත්, ගම්බද දරුවන්ගේ පාසල් ටිකට මේකෙන් විශාල අවාසියක් සිදු වනවා. පෙළ පොත් මුද්‍රණය සඳහා වෙන් කළ මුදල - 2025 සිට 2026 දක්වා - රුපියල් මිලියන 500කින් කපා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Please give me one more minute, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
I have already given you time, Hon. Member.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
1 වසර සිට 6 වසර දක්වා දරුවන්ට අලුත් විෂය නිර්දේශයේ printouts තමයි ගන්න වෙන්නේ. ඒ වාගේම 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට ශිෂ්‍යාධාර දීමට වෙන් කළ මුදලින් රුපියල් ලක්ෂ 450ක් අඩු කර තිබෙනවා. ඒ වාගේම ක්‍රීඩා පාසල් සිසුන්ට පෝෂ්‍යදායී ආහාර දෙන්න තිබුණු මුදලින් ලක්ෂ 800ක් කප්පාදු කර තිබෙනවා. මේ ඔක්කෝම කප්පාදු කරලා බින්දුවටම බස්සලා එතුමිය කොහොමද මේ සභාවට ඇවිල්ලා එහෙම කථා කරන්නේ? අනෙක් මන්ත්‍රීවරුන් නම් මේ පිළිබඳව කථා කළේත් නැහැ. ඒ කාලයේ අධ්‍යාපනයට සියයට 6ක් කියලා ගහගෙන හිටියේ වෙනම හරිනි කෙනෙක්, දැන් ඉන්නේ වෙනම හරිනි කෙනෙක්. දැන් ඒවා මතකත් නැහැ වාගේයි, අගමැතිකම හම්බ වුණාට පස්සේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ජනතා නායකයින්ගෙන් බලාපොරොත්තු වෙන්නේ වචනය අනුව, තමන්ගේ ප්‍රතිපත්ති අනුව ක්‍රියාත්මක වීම. සුජීව සේනසිංහ වචනයක් කිව්වා නම් ඒ දේ කරන්න පුළුවන් වෙන්න ඕනෑ. හරිනි වචනයක් කිව්වා නම් ඒ දේ කරන්න පුළුවන් වෙන්න ඕනෑ. මේ ආණ්ඩුව සම්බන්ධයෙන් අපට තිබෙන ප්‍රශ්නය ඒක. ඒ නිසා අපි ඉතා අවධාරණයෙන් එතුමියට කියනවා, පොරොන්දුවක් දුන්නා නම් අඩුම ගාණේ ඒ පොරොන්දුව තකා යන්න පුළුවන් උත්සාහයක හෝ යෙදෙන්න කියලා. එහෙම නැත්නම් අපට බැරි වුණා කියන දේ හරි කියන්න කියලා එතුමියගෙන් ඉල්ලා සිටිනවා. එහෙම නැත්නම් විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රයෙන් පමණක් නොවෙයි, අධ්‍යාපනයෙන් පමණක් නොවෙයි, රට ඉදිරියට යාමත් නවතිනවා. ඉන්දියාව වාගේ රටවල් විශාල සංවර්ධනයක් ලබනකොට අපේ රට දුප්පත් රටක් බවට පත් වන එකත් වළක්වා ගන්න බැරි වෙනවා.

මට කාලය ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்ததாக, கௌரவ உறுப்பினர் எம்.ஏ.எம். தாஹிர் அவர்கள், உங்களுக்கு 10 நிமிடங்கள் இருக்கின்றன.

[பி.ப. 2.45]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சு, விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு, டிஜிட்டல் பொருளாதார அமைச்சு ஆகியவற்றின் வரவு செலவுத்திட்ட நிதியொதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் உரையாற்றச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு மகிழ்வுறுகின்றேன். எமது இலங்கைத் திருநாடு நான்கு பக்கமும் கடலினால் சூழப்பட்டிருக்கின்ற வளம் பொருந்திய ஒரு நாடாக இருக்கின்றது. இருந்தபோதிலும், நாங்கள் எங்களுக்குத் தேவையான மீன்களை, உணவுகளை வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்கின்ற ஒரு துர்ப்பாக்கிய நிலைமைக்குத் தள்ளப்பட்டிருக்கின்றோம். இந்த நிலைமையிலிருந்து நாட்டை மீட்பதற்கான ஒரு புத்துணர்வை நாட்டு மக்களிடத்தில்

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

ஏற்படுத்தி, ஒரு புதிய அரசாங்கம் ஆட்சியைக் கையேற்று ஒரு வருடம் பூர்த்தியாகியிருக்கின்ற இந்தச் சூழலிலே நாங்கள் இந்த அரசாங்கத்தின் இரண்டாவது வரவு செலவுத்திட்டத்திலே எங்களுடைய கருத்துகளை முன்வைக்கின்றோம்.

கடந்த வருடத்தில், இன்றைய திகதியில் - 26.12.2024இல் - அம்பாறை மாவட்டத்தில், நிந்தவூர் காஷிபுல் உலூம் அரபுக் கல்லூரியிலிருந்து சம்மாந்துறை நோக்கிச் சென்ற 6 மாணவர்கள் மாவடிப்பள்ளி ஆற்றிலே நிகழ்ந்த அனர்த்தத்தில் பரிதாபமாக உயிரிழந்த நிகழ்வை இந்தச் சந்தர்ப்பத்திலே நினைவுகூர்ந்து, அவர்களுக்காகப் பிரார்த்தித்துக் கொள்வதுடன், அவர்களுடைய குடும்பங்களுக்கும் எனது ஆழ்ந்த அனுதாபங்களையும் தெரிவித்துக் கொள்கின்றேன்.

குறிப்பாக, ஒலுவில் துறைமுகம் சம்பந்தமாக நாங்கள் இவ்வாறான விவாதங்களின்போதும் ஏனைய சந்தர்ப்பங்களிலும் நீண்டகாலமாகப் பல தடவை பேசியிருக்கின்றோம். கௌரவ அமைச்சர் அவர்கள் இதுவரைக்கும் இருந்தார்; சற்றுமுன் எழுந்து சென்று விட்டார். ஆனால், இந்த அரசு இதுசம்பந்தமாக எந்தவொரு முடிவையோ, தீர்மானத்தையோ எடுத்ததாக எங்களுக்குப் பதிலளிக்கவில்லையென்கின்ற கவலையான விடயத்தை இச்சந்தர்ப்பத்திலே தெரிவித்துக் கொள்கின்றேன். நாங்கள் ஏன் தொடர்ச்சியாக ஒலுவில் துறைமுகம் பற்றி பேசுகிறோம் என்றால், மீன்பிடியையும் விவசாயத்தையும் நம்பி வாழ்கின்ற எங்களுடைய பிரதேச மக்கள் அதனூடாகக் கிடைக்கின்ற பொருளாதாரத்தின்மூலம்தான் - வாழ்வாதாரத்தின் மூலமாகத்தான் - அவர்களுடைய சந்ததிகளின் கல்வி மற்றும் ஏனைய நடவடிக்கைகளை முன்னெடுத்துச் செல்வதற்குரிய சந்தர்ப்பம் காணப்படுவதனால்தான்.

அதைவிட, ஒலுவில் துறைமுகம் என்பது இரண்டு விடயங்கள் சார்ந்து முக்கியத்துவம் பெறுகின்றது. ஒன்று, வர்த்தகம்; மற்றையது மீன்பிடி. நாங்கள் மீன்பிடி சம்பந்தமாக அதனை அபிவிருத்தி செய்து தரும்படி கேட்பதற்குக் காரணம், சாய்ந்தமருது, கல்முனையைச் சேர்ந்த ஆழ்கடல் படகுகளை வைத்திருக்கின்ற சுமார் 750க்கும் மேற்பட்ட மீன்பிடியாளர்கள் - முதலாளிமார் - நவம்பர், டிசம்பர் போன்ற காலப்பகுதியிலே தங்களுடைய படகுகளை வாழைச்சேனைக்கு அல்லது திருகோணமலைக்குக் கொண்டுசென்று பாதுகாக்க வேண்டிய சூழல் இருக்கின்றது. ஒலுவில் துறைமுகம் உரியமுறையில் புனரமைக்கப்பட்டால், அதனை அண்மித்த 10-15 கிலோமீற்றருக்கு உட்பட்ட அந்தக் கடற்பரப்பிலே அதற்கான பாதுகாப்பு நடவடிக்கையைச் செய்ய முடியும் என்பதற்காகத்தான் அந்தத் துறைமுகத்தைச் செய்து தாருங்கள் என்று நாங்கள் கேட்கின்றோம். பிடிக்கப்படுகின்ற மீன்களைப் பாதுகாப்பதற்கான குளிரூட்டி வசதிகள்கூட அந்த ஒலுவில் துறைமுகத்திலே காணப்படுகின்றது. எனவே, இதை நீங்கள் செய்து தருகின்றபோது, அந்தப் பிராந்தியத்திலே இருக்கின்ற 25,000க்கும் மேற்பட்ட மக்கள் நன்மை பெறுவார்கள்; பொருளாதார ரீதியாக அவர்களுக்கு வாழ்வு கிடைக்கும் என்ற விடயத்தை நாங்கள் தொடர்ச்சியாகப் பேசுகின்றோம். எனவே, இந்த அமைச்சுக்கு ஒதுக்கப்பட்ட நிதியின்மூலம் இதையாவது செய்து தாருங்கள் என்று கேட்டுக் கொள்கின்றோம்.

அடுத்ததாக, கடந்த 2024ஆம் ஆண்டு காலப்பகுதியிலே ஏற்பட்ட வெள்ள அனர்த்தம் மற்றும் கூடுலான கடல் கொந்தளிப்பின்போது பாதிக்கப்பட்ட மீனவர்கள் தொடர்பாகக் கணக்கெடுக்கப்பட்டிருந்தாலும், ஒரு வருடமாகியும் இதுவரைக்கும் அவர்களுக்குத் தொழில் பாதிப்பு சம்பந்தமான எந்தவித அடிப்படை வசதிகளும் செய்து கொடுக்கப்படவில்லை என்பதுடன், நிவாரண உதவிகள் எதுவும் கிடைக்கவில்லை என்ற கவலையான விடயத்தையும் நாங்கள் இச்சந்தர்ப்பத்திலே தெரிவித்துக் கொள்கின்றோம்.

மீனவர்களுக்காகச் சாய்ந்தமருதிலே இருந்த தொலைத்தொடர்புக் கோபுரம் மிக நீண்ட காலமாகத் தொடர்பு துண்டிக்கப்பட்ட நிலையில் இருக்கின்றது. நாங்கள் அம்பாறை DCC meetingஇல் மிகக் கூடுதலான சந்தர்ப்பங்களில் இதைப் பற்றி பேசியிருந்தபோது, அதைச் செய்து தருவதாக வாக்குறுதிகள் வழங்கப்பட்டும் இதுவரைக்கும் அது செயற்படாத ஒரு சூழல் காணப்படுகிறது. ஆழ்கடல் மீன்பிடிக்காகக் கடலுக்குச் செல்கின்றவர்களில் எத்தனையோ உயிர்களை நாங்கள் பரிதாபமாக இழந்திருக்கின்றோம் என்பது உங்களுக்குத் தெரியும்! அவர்களைத் தேடுவதற்காக எமது கடற் படையையும் விமானப் படையையும் பயன்படுத்துவதன்மூலம் இந்த நாட்டினுடைய மிகக் கூடுதலான நிதியை நாங்கள் செலவு செய்திருக்கின்றோம். இவ்வாறான நிலையில், நீங்கள் இதுவரைக்கும் ஏன் அந்த வசதியைச் செய்து கொடுக்கவில்லை? எனக் கேட்பதுடன், நாங்கள் இன்றைக்கு digital பொருளாதாரம், digital மயப்படுத்தல் பற்றி பேசிக்கொண்டிருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில், Starlink என்று சொல்லப்படுகின்ற satellite மூலமான தொலைத்தொடர்புகளை ஏற்படுத்தக்கூடிய வசதிகள் காணப்படுகின்ற இன்றைய நிலையில், satellite மூலமான தொலைத்தொடர்பு வசதியை அவர்களுக்கு ஏற்படுத்திக் கொடுப்பதுபற்றி கௌரவ அமைச்சர் அவர்கள் கவனத்திற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். மீனவர்கள் மற்றும் அவர்களின் படகுகள் தொலைந்துபோகின்ற சந்தர்ப்பத்திலே அவர்களைத் தேடுவதற்காக அரசாங்கம் பாதுகாப்புப் படைக்குச் செலவு செய்கின்ற நிதியைவிடக் குறைந்தளவு நிதிதான் அதற்குத் தேவைப்படும் என்று நான் நினைக்கின்றேன்.

சாதாரண மீனவர்கள், சிறிய மீன்களைப் பிடித்துக்கொண்டு இரவு நேரங்களில் தங்கள் வள்ளங்கள், படகுகளுடன் கரையேறும்போது, அவர்களிடம் உள்ள மீன்களைப் பாதுகாக்கக்கூடிய வசதிகள் இல்லாமலிருக்கின்றது. இதனால் குறைந்த விலைக்கு இரவு நேரங்களிலே அந்த மீன்களை விற்பனை செய்துவிட்டு, பின்னர் அவர்களே தமது மதிய உணவுக்காக, காலை உணவுக்காக அல்லது இரவு உணவுக்காக திரும்பச் சென்று அந்த மீன்களை இரட்டிப்பு அல்லது மும்மடங்கு விலைகளைக் கொடுத்து வாங்க வேண்டிய ஒரு துர்ப்பாக்கிய சூழல் ஏற்படுகின்றது. எனவே, இதற்கான வசதிகளை எமது கிழக்குப் பிராந்திய இறங்குதுறைகளில் நீங்கள் செய்து கொடுக்க வேண்டும்.

கௌரவ அமைச்சர் அவர்களே, சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களும் தன்னுடைய மாவட்டம் சார்பான சில விடயங்களைப் பேசுமாறு எங்களிடம் கேட்டிருக்கின்றார். குறிப்பாக, அங்கே சிறு கடற்றொழில் செய்கின்றவர்களின் வாழ்வாதாரம் ஒக்ரோபர், நவம்பர், டிசம்பர் மாத காலப்பகுதிகளில் ஏற்படுகின்ற கடல் அனர்த்தங்கள் காரணமாகப் பாதிக்கப்படுகின்றது; அவர்கள் தொழிலுக்குச் செல்ல முடியாத சூழல் காணப்படுகின்றது. இவ்வாறு அவர்களுடைய தொழில் பாதிக்கப்படுகின்றபோது, அரசாங்கம் அவர்களுக்கு ஏதாவது நிவாரணத்தை வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். குறிப்பாக, கிண்ணியா போன்ற பிரதேசங்களில் இறங்குதுறையை அமைத்துத் தருவதாக மிக நீண்டகாலமாக - பல தசாப்தகாலமாக - தொடர்ச்சியாக வாக்குறுதிகளை வழங்கி ஏமாற்றிய கடந்தகால அரசாங்கங்களைப் போன்றல்லாமல்,

நீங்கள் அவர்களுக்கு அந்த வசதியைச் செய்து கொடுக்க வேண்டும் என்பதையும் இச்சந்தர்ப்பத்திலே நான் உங்களிடம் விநயமாகக் கேட்டுக் கொள்கின்றேன்.

அத்துடன், அங்கு சிறுகடல் தொழில் செய்கின்றவர்களுக்கு கடலில் செல்லக்கூடிய எல்லைகள், தூரம் எவ்வளவு என்று கட்டுப்படுத்தப்பட்டிருக்கின்றது. ஆனால், பாதுகாப்புத் தரப்பினரால் அவர்கள் கைது செய்யப்படுகின்றபோது, அது சில காலங்களில் 7கிலோ மீற்றர் என்றும் 5 கிலோ மீற்றர் என்றும் சந்தர்ப்பத்திற்கு ஏற்ற வகையில் மாற்றமடைகின்றது. எனவே, குறிப்பிட்ட ஒரு பிரதேசத்தை வழங்கி, தொழில் வாய்ப்பையும் வாழ்வாதாரத்திற்கான சந்தர்ப்பத்தையும் அவர்களுக்கு ஏற்படுத்திக் கொடுக்க வேண்டுமென்றும் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அத்துடன், நாங்கள் தொடர்ச்சியாகக் கடலைப் பற்றி பேசினாலும்கூட, எங்களுடைய பிரதேசத்திலே நன்னீர் மீன்பிடிக்கான வசதிகளும் இருக்கின்றன. இறக்காமம் - குடுவில், அறுகம்பை, பொத்துவில், நிந்தவூர், அட்டாளைச்சேனை போன்ற பிரதேசங்களிலே நன்னீர் மீன்களை அல்லது ஏற்றுமதி செய்யக்கூடிய மீன் வகைகள், நண்டுகள் போன்றவற்றை வளர்ப்பதற்கான களப்புகள் காணப்படுகின்றன. இதற்கான வசதி வாய்ப்புக்களையும் ஊக்குவிப்புக்களையும் மானியங்களையும் வழங்குகின்ற சந்தர்ப்பத்தில் அந்தப் பிரதேசங்களில் உள்ள மக்கள் அந்தத் தொழில்முயற்சிகளைச் செய்வதற்கான சந்தர்ப்பம் இருக்கின்றது. இறக்காமத்தில் இருக்கின்ற வில்லுக்குளம் என்பது, இந்தப் பிரதேசத்தில் இருக்கின்ற மக்களுக்கான நன்னீர் மீன்களை உற்பத்தி செய்கின்ற இடமாகக் காணப்படுகின்றது. அங்கு ஒரு காலத்தில் மீன் குஞ்சுகள் வழங்கப்பட்டிருந்தன. சென்ற வருடமும் வழங்கப்பட்டிருந்தாலும் அவை போதுமானதாக இல்லை. எனவே, அதற்கான மேலதிக வசதி வாய்ப்புக்களைச் செய்து தருமாறு கேட்டுக் கொள்கின்றேன்.

Digital மயப்படுத்தல் என்ற விடயம் சம்பந்தமாக அதிகமானவர்கள் பேசியிருந்தாலும்கூட, நாங்கள் அதனை எந்த இடத்திலிருந்து ஆரம்பிக்க வேண்டுமென்ற ஒரு விடயம் முக்கியமானது. பாடசாலைகளில் நாங்கள் smart classrooms ஆரம்பித்திருக்கின்றோம். ஆனால், இலங்கையில் உள்ள எத்தனை பாடசாலைகளில் உள்ள மாணவர்களை இது சென்றடைந்திருக்கின்றது என்பதை நாங்கள் சற்றுச் சிந்திக்க வேண்டியவர்களாக இருக்கின்றோம். எனவே, ஆரம்பிக்கப்பட வேண்டிய இடத்திலே இன்னும் அதனை ஆரம்பிக்காமல் இருந்துவிட்டு, digital, digital என்று சொல்வதில் அர்த்தமில்லை. எனவே, பாடசாலைகளில் உள்ள அத்தனை மாணவர்களையும் சென்றடையக்கூடிய வகையில் அந்தத் திட்டங்கள் எடுத்துச் செல்லப்பட வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

உள்ளூராட்சி மன்றங்களைப் பொறுத்தவரையிலே, அந்தப் பிரதேசத்தில் இருந்து அறவிடப்படுகின்ற tax - சோலைவரி, Stamp Duty, சில நீதிமன்ற அறவீடுகள் போன்றவை அவற்றின் வருமானமாகக் காணப்படுகின்றன. இந்த விடயங்கள்கூட இதுவரைக்கும் digital மயப்படுத்தவில்லை. அவை பிரதேச சபைகளாக, நகர சபைகளாக அல்லது மாநகர சபைகளாக இருக்கலாம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
ஒரு நிமிடம் தாருங்கள்!

இவ்வாறு அடிப்படை வசதிகளை வழங்குகின்ற நிறுவனங்களில்கூட இதைச் செய்ய முடியாமல் இருக்கின்றோம். கடந்த வருடம் நான் நினைக்கின்றேன், 3,000 மில்லியன் ரூபாய் இந்த டிஜிட்டல் மயமாக்கலுக்காக ஒதுக்கப்பட்டிருந்தது என்று. இந்த நிதி எந்தத் திட்டத்தின்கீழ் யார், யார் பயன்படுத்தக்கூடிய வகையில் எங்கு சென்றடைந்தது என்பது தெரியாது. ஆகவே, பாடசாலைகள், உள்ளூராட்சி மன்றங்கள், பிரதேச செயலகங்களுக்கூடாக இந்த வசதிகளை வழங்கி, மக்களுக்குத் தெளிவூட்டுகின்ற, அறிவூட்டுகின்ற விடயங்களைச் செய்ய வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, முடித்துக் கொள்ளுங்கள்!

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
முடிக்கிறேன்.

இன்றுவரைக்கும் உள்ளூராட்சி மன்றங்கள் துறைசார்ந்த தனியார் நிறுவனங்களில் hire பண்ணி, இலட்சக்கணக்கான பணத்தைக் கொடுத்து digital systemsஐ விலைக்கு வாங்குகின்ற துர்ப்பாக்கிய நிலைமையை வைத்துக்கொண்டு, நாங்கள் டிஜிட்டல் மயமாக்கலைப் பற்றி பேசுவது மிகவும் வருந்தத்தக்க விடயமெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.56]

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාව වර්ග කිලෝමීටර 517,000කට ආසන්න ප්‍රමාණයක් වනවා. හැබැයි, ධීවර කර්මාන්තය කරන අය මේ වෙරළ කලාපය තුළ සියයට 70ක් පමණ තමයි ඉන්නේ. අනික් අය ඉන්නේ රට මැද. අපේ රටේ ජනතාවගෙන් විශාල ප්‍රමාණයක් ධීවර කර්මාන්තයේ යෙදෙනවා. ඒ කියන්නේ, අපේ රටේ ජනතාවගෙන් සියයට 12ක පමණ ප්‍රමාණයක් ධීවර කර්මාන්තයේ යෙදෙනවා. ඒ අනුව ධීවර කර්මාන්තයට අපේ රට තුළ විශේෂ තැනක් හිමි වෙනවා. ධීවර අමාත්‍යාංශය යටතට කරදිය, මිරිදිය සහ විසිතුරු මත්ස්‍ය කර්මාන්තය අයත් වනවා. මේ හැම එකක්ම ධීවර කර්මාන්තයට අනුබද්ධව තමයි මේ වෙද්දී සිද්ධ වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිරිදිය ධීවර කර්මාන්තයට අදාළව අපි මේ වෙද්දී වැඩ පිළිවෙළ රාශියක් ක්‍රියාත්මක කරමින් තිබෙනවා. ඒවා මොනවාද? මත්ස්‍ය පැටව් බෝ කර වැව්වල තැන්පත් කිරීම, ඇළ දොළවල් සුද්ද කරලා ඒවායේ කුඩු ආශ්‍රිත

[ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා]

මත්ස්‍ය වගාව කිරීම සහ විදේශ වෙළෙඳ පොළ සඳහා මේ මත්ස්‍ය අස්වැන්න යොදා ගැනීම ඒ අතර වෙනවා. ඇත්තටම මේවා ලොකු වැඩසටහන්. අපි මේ වෙද්දී දිවයින පුරාම තිබෙන වැව්වලට මත්ස්‍ය පැටව් මිලියන 60ක් මුදා හැර තිබෙනවා. ඒක ලොකු වැඩසටහනක්. අපි සෑම සතියක් පාසාම මේ ගැන නිරීක්ෂණය කරනවා; ඇත්තටම මේක පරීක්ෂණ මට්ටමින් යන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, මේ දෙසැම්බර් මාසය වෙද්දී මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 80ක් පමණ වැව්වලට මුදා හැරීමට. ඇත්තටම ඒ අපේ ජනතාවට ලොකු ප්‍රෝටීන් ප්‍රමාණයක් ලබා ගැනීමේ මූලික අවශ්‍යතාව ඇතුවයි. ඒ වාගේම විදේශ වෙළෙඳ පොළටත් මේ මිරිදිය මත්ස්‍ය අස්වැන්න යොදා ගැනීමට අපට හැකියාවක් ලැබෙනවා. මේ සඳහා අපි විශේෂයෙන්ම NAQDA එක හරහා වැඩසටහන් ටිකක් කරගෙන ගියා. ඒ කර්මාන්තයේ යෙදෙන්නන් පුහුණු කිරීම, පොකුණුවලට මත්ස්‍ය පැටව් මුදා හැරීම, මත්ස්‍යයින් බෝ කිරීම, මත්ස්‍ය කෑම සෑදීම ආදී හැම දෙයක්ම අපි මේ වැඩසටහන් හරහා කරගෙන ගියා. ඒක තමයි අපේ මූලික අභිප්‍රාය වුණේ. මේක ඇත්තටම ධීවර කර්මාන්තය ඉතාම ක්‍රමානුකූලව සිද්ධ කිරීමක්. මොකද, මෙච්චර කාලයක් කවදාවත් එහෙම දෙයක් සිද්ධ වුණේ නැහැ. මේ මත්ස්‍ය පැටව් ඕනෑ ඕනෑ කෙනා, එක එක තැන්වලට තමන්ට අවශ්‍ය විධියට අරගෙන ගිහිල්ලා මුදා හැරියා. එහෙම තමයි මෙච්චර කල් මිරිදිය කර්මාන්තය සිද්ධ කළේ. නමුත් අපි මේ වතාවේ සංඛ්‍යාලේඛන පවත්වා ගනිමින් ඒ වැඩසටහන ක්‍රමානුකූලව සිදු කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒක තමයි, අපි අනුගමනය කරන විශේෂ ක්‍රමය.

වැව් ආශ්‍රිතව වාගේම කළපු ආශ්‍රිතවත් මේ වෙද්දී අපි වැඩසටහන් සිදු කරන්න පටන් අරගෙන තිබෙනවා. කලින් තිබුණේ, මොදා මත්ස්‍ය කර්මාන්තය. ඒ කියන්නේ, මොදා පැටව් ලොකු කරලා කුඩු ආශ්‍රිතව වගා කිරීම. දැන් අපි ඊට එහාට ගිහිල්ලා, කොස්සන් වාගේම ඉස්සන් වගාව පටන් ගන්න අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඇත්තටම අපි මේවා ඉස්සරහට අරගෙන යන්න ඕනෑ. අපි දන්නවා, මේ වෙද්දී කළපු විශාල ප්‍රමාණයක් ගොඩ වෙලා තිබෙන්නේ කියන එක. ඒ නිසා අපි මේ කළපු සුද්ද පවිත්‍ර කරන්න ඕනෑ. ඒවා කරන්න අවශ්‍ය කරන මැෂින් මේ වෙද්දී ආනයනය කරන්න අපි පටන් අරගෙන තිබෙනවා. ඒ මැෂින් ගත්තාට පසුව අපට පුළුවන්, කළපු සහ මුහුද ආශ්‍රිතව විශේෂ වැඩසටහන් දිගටම කරගෙන යන්න. මේවා තමයි අපේ ඉදිරි වැඩ පිළිවෙළ හැටියට අපි කරගෙන යන්නේ. මොකද, මෙතෙක් කාලයක් කළපු වාගේම ඇළවල් ආශ්‍රිතව කිසිදු ධීවර කර්මාන්තයක් දියුණු කරන්න හිතුවේ නැහැ. කිසිම වැඩ පිළිවෙළක් නැතුව මේවා ඔහේ පවත්වාගෙන ගිය ආණ්ඩු තමයි මෙච්චර කල් තිබුණේ. නමුත්, ක්‍රමානුකූලව මේ කටයුතු ඉදිරියට අරගෙන යන්න අපි මේ වනකොට කටයුතු ලැහැස්ති කරලා තිබෙන්නේ. මේ වෙද්දී ඔබ දන්නවා ඇති, කුඩු ආශ්‍රිතව මත්ස්‍ය කර්මාන්තය කරන්න අමාත්‍යාංශය හරහා වාගේම වෙනත් අමාත්‍යාංශවලිනුත් ප්‍රතිපාදන අරගෙන අපි ඒ වැඩ පටන් අරගෙන තිබෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසිතුරු මත්ස්‍ය කර්මාන්තය කියන්නේ ඇත්තටම ලංකාවට ඉතාම හොඳ විදේශ විනිමය අරගෙන එන කර්මාන්තයක්. හැබැයි, අපි ඒ ගැන රජයන් හැටියට කිසිම සොයා බැලීමක් කරලා නැහැ. අපි මේ මාසයේ 21, 22 සහ 23 කියන දිනවල ප්‍රදර්ශනයක් පැවැත්වූවා. එය දැවැන්ත ප්‍රදර්ශනයක්. ඒ ප්‍රදර්ශනයේදී අපට තේරුණා, ඒ කර්මාන්තයේ අඩුපාඩු කොච්චර තිබෙනවාද කියලා. මොකද, ඔවුන් එක්ක දීර්ඝ සාකච්ඡාවක් පවත්වා අපේ ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිතුමා වාගේම අමාත්‍යාංශ නිලධාරින් ලොකු කැප කිරීමක් කරලා මේ ප්‍රදර්ශනය පැවැත්වූයේ ඔවුන්ට තිබෙන ඒ අඩුපාඩුකම් හොයලා ඒ අයට අවශ්‍ය කරන ඒ පහසුකම් ටික ආණ්ඩුවක් වශයෙන් ලබා දෙන්නයි. විසිතුරු මසුන් නිෂ්පාදනය කරන අය මුහුණ පාන ප්‍රශ්න මොනවාද කියලා අපි එතැනදී හඳුනා ගත්තා. ඒ අයට අවශ්‍ය කරන පහසුකම් ටික අපි දෙන්න ඕනෑ. මොකද, ඔවුන්ට අඩුපාඩුකම් ගොඩක් තිබුණා. ඒ අඩුපාඩුකම් හඳුනාගෙන ඔවුන් එක්ක අත්වැල් බැඳගෙන අපි මේ වනකොට කටයුතු කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔවුන්ට මේ කර්මාන්තය කරගෙන යෑම සඳහා ඉඩම් අවශ්‍ය කරලා තිබුණා. ඒ කියන්නේ, ඔවුන්ට වගා නොකරන, පුරන් වෙච්ච කුඹුරු අවශ්‍යයි කිව්වා, ඒ පොකුණු හදා ඒවායේ මසුන් බෝ කර විදේශ රටවලට යැවීමට. අපි ඒ සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශය එක්ක වාගේම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වැනි අවශ්‍ය කරන වෙනත් ආයතන එක්ක කථා කරලා ඔවුන්ට ඒ පහසුකම් ලබා දීම සඳහා මේ වනවිට කටයුතු ලැහැස්ති කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් විදේශ වෙළෙඳ පොළට අවශ්‍ය කර තිබෙන්නේ සීතල ජලය තුළ ජීවත් වන විසිතුරු මසුන්. අපි මේ වනවිට අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ සහ එම නිලධාරින්ගේ මහ පෙන්වීම යටතේ ඒ සඳහා වන වැඩ පිළිවෙළ නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ ආරම්භ කර තිබෙනවා. ඒ අනුව සීතල ජලයේ ජීවත් වන මසුන් බෝ කිරීමට අවශ්‍ය තැන් හදන්න අපි මේ වනවිට පියවර ගෙන තිබෙනවා. අපි මේ හැම දෙයක්ම කරන්නේ ජනතාවාදී ලෙසයි. ඒ අනුව ජනතාවත් එක්ක කථා කරලා ඒ අවශ්‍ය කරන රාජ්‍ය ආයතන ටික ළං කරගෙන එම කටයුතු ක්‍රියාත්මක කරන්න දේශපාලනඥයන් වන අපට පුළුවන් වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 2ක් තිබෙනවා.

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
ඒ වාගේම තමයි ධීවර ජනතාව සඳහා ජීවිත රක්ෂණ ක්‍රමයක් ඇති කරන්නත්, විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කරන්නත් මේ වනවිට කටයුතු සකස් කර තිබෙනවා. අපි දැන් දිස්ත්‍රික්ක මට්ටමින් එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා. ඒක අපේ ආණ්ඩුවෙන් සිදු කරන තවත් කටයුත්තක්. ඒ වාගේම තමයි උතුරු, නැගෙනහිර ප්‍රදේශවල මුහුදු කුඩැල්ලන් ඇති කිරීමේ hatcheries ඇති කරන්නත්, ඒ වාගේම ඕස්ට්‍රේලියානු ආයතනයක් සඳහා අවශ්‍ය මුහුදු ශාක සෑදීම සඳහාත් අපි NAQDA එක හරහා ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. මේ ආකාරයට අපි ජනතාවත් සමඟ එකතු වෙලා අත්වැල් බැඳ ගෙන මේ කර්මාන්තය ඉදිරියට අරගෙන යන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් සඳහන් කළා, මත්කුඩු ජාවාරම්වලට හසුවන බහුදින යාත්‍රාවල අයිතිකරුවන්ට යම් සහනයක් දෙන්නය කියලා. ඇත්තටම අපි බහුදින ධීවර යාත්‍රා හිමියන්ට VMS යන්ත්‍ර ලබා දෙන්න කටයුතු ලැහැස්ති කර තිබෙනවා. 21 සහ 22 යන දිනවල තිබුණු ප්‍රදර්ශනයේදී අපි VMS යන්ත්‍ර ගෙන්වන ආයතන සමඟ සාකච්ඡා කළා. ඔවුන් කිව්වා, බහුදින ධීවර යාත්‍රා සඳහා CCTV සවි කරන්න පුළුවන් කියලා. ඔබ හිතන්න, ඒ විධියට ධීවර කර්මාන්තයට දියුණු තාක්ෂණය භාවිත කළාට පසුව බහුදින යාත්‍රා හිමියාට, බෝට්ටු අයිතිකරුවාට පුළුවන් තමන්ගේ බෝට්ටුව තුළ සිදුවන සෑම දෙයක්ම නිරීක්ෂණය කරන්න. එතකොට බෝට්ටුවේ කුඩු ගෙනෙනවාද, වෙන මොනවා හරි ගෙනෙනවාද කියා බලාගන්න ඔහුට පුළුවන්. කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ බහුදින ධීවර යාත්‍රාවල යන හැම

ධීවරයෙක් එක්කම සම්බන්ධතාව පවත්වා ගන්නත් යාත්‍රා හිමියාට ඒ තුළින් හැකියාව ලැබෙනවා. ඒ අනුව අපි ධීවර කර්මාන්තයත් ඩිජිටල්කරණය කිරීම සඳහා තමයි මේ හැම කටයුත්තක්ම ලැහැස්ති කර තිබෙන්නේ.

ඒ වාගේම අපි NARA එක හරහා ලොකු වැඩසටහනක් කරගෙන යනවා. කලින් කථා කළ මන්ත්‍රීවරයෙක් කිව්වා, ධීවර අමාත්‍යාංශයෙන් මත්ස්‍යයින් බහුලව සිටින තැන් හරියට දැනුම් දෙන්නේ නැහැ කියලා. නමුත් අපි ඩයලොග් ආයතනය හරහා ඒ වැඩසටහන් කරගෙන යනවා. එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කරමින්, අපට පුළුවන් උපරිම සහයෝගය ලබා දෙමින් රටක් හැටියට ධීවර කර්මාන්තය ලබන වර්ෂය තුළ ඉතාම ඉහළ තැනකට ගෙන ඒමට අපි කටයුතු කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. IMRAN MAHAROOF left the Chair, and THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA took the Chair.*

[අ.භා. 3.06]

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ අමාත්‍යාංශය භාර අරගෙන අද වනවිට අවුරුද්දක කාලයක් ගතවී තිබෙනවා. ඔබ හැමෝම දන්නවා, අපේ අමාත්‍යාංශය යටතේ ආයතන 14ක් තිබෙන බව. අපේ පරීක්ෂණ සහ සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්තිය අපි පක්ෂයක් හැටියට එළි දැක්වූවා. අපි ඒ සංවර්ධන ප්‍රතිපත්තිය අපේ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව මඟින් තවදුරටත් වර්ධනය කරලා, කැබිනට් මණ්ඩලය වෙත යොමු කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අපි දන්නවා, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය වෙනුවෙන් මෙවර අය වැයෙන් රුපියල් බිලියන 21ක් වෙන් කර තිබෙන බව. ඒ අපේ අමාත්‍යාංශයට විතරක් නොවෙයි, අනෙකුත් අමාත්‍යාංශ යටතේත් තිබෙන පර්යේෂණ ආයතන සඳහා. ඒක ලොකු මුදලක්, සංඛ්‍යාවක් හැටියට ගත්තාම. ඒ වාගේම පර්යේෂණ හා සංවර්ධන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී අපේ අමාත්‍යාංශයට ලොකු කාර්යභාරයක් පැවරී තිබෙනවා. මොකද, අපේ අමාත්‍යාංශයේ යටතේ තමයි ඒකට අදාළව වැඩකටයුතු කරන බොහෝ ආයතන තිබෙන්නේ. ඒ නිසා මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී අනිවාර්යයෙන්ම ඒ සියලු ආයතනත් එක්ක වැඩ කරන්න වෙනවා. එහෙම නැති වුණොත්, ඒක හරියට implement කරන්න බැරි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හැම තිස්සේම කියපු කථාවක් තමයි අපේ රටේ සංවර්ධනයට, ආර්ථිකයට, එහෙම නැත්නම් සේවා ස්ථානවලට අදාළ වන පර්යේෂණ තමයි සිදු කළ යුතු වෙන්නේ කියන එක. අන්න ඒ නිසා තමයි අපි පළමුවෙන්ම අපේ රටට අවශ්‍ය වන ප්‍රමුඛ පර්යේෂණ මොනවාද කියලා හඳුනා ගත්තේ. අපි දැන් හැම ක්ෂේත්‍රයකම ප්‍රමුඛතා හඳුනාගෙන තිබෙනවා. හැබැයි ඒක තවදුරටත් වර්ධනය කරන්න ඕනෑ කියලා අපි හිතනවා. අපි ඒ සම්බන්ධයෙන් දැනුත් ක්‍රියාත්මක වෙමින් ඉන්නවා. ඒ වාගේම අපි දැනටමත් අපේ අමාත්‍යාංශය යටතේ විශේෂඥ කමිටු පත් කරලා තිබෙනවා, හැම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි. ඒ විශේෂඥ කමිටු මඟින් අපට තවදුරටත් ඒ වැඩකටයුතු කර ගැනීමේ හැකියාව තිබෙනවා.

ඒ වාගේම මේ අපි යෝජනා කරන ප්‍රමුඛතා ලැයිස්තුවේ ඇතුළත් පර්යේෂණ සඳහා ප්‍රතිපාදන ලැබෙන්නේ, ජාතික විද්‍යා පදනමත්, ප්‍රධානකොටම ජාතික පර්යේෂණ සභාවත් මඟින්. එතකොට ඒ මඟින් ඒ පර්යේෂණවලට ප්‍රතිපාදන සපයනවා. ඒ සඳහා නොයෙකුත් criteria තිබෙනවා. සමහර ඒවාට private sector එකත් එක්ක එකතු වෙලා බිලියන ගණන් ප්‍රතිපාදන ලබා දෙනවා. ඒ වාගේම පාසල් ශිෂ්‍යයන්ටත්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ටත් ඒ මඟින් මුදල් ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ වාගේම ඒ ආයතන දෙක විතරක් නොවෙයි, තවත් ආයතන තිබෙනවා. ඒවායේත් පර්යේෂණ සිදු වෙනවා. ඒ හැම කෙනෙක්ම එකිනෙකට වෙනස් criteria තමයි evaluationවලදී භාවිත කරන්නේ. ඒ නිසා අපි දැනට අපේ අමාත්‍යාංශය හැටියට පොදු ඇගැයීමේ ක්‍රියාවලියක් සකස් කරලා තිබෙනවා. අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන සියලුම ආයතන සමඟත්, අනෙකුත් අමාත්‍යාංශ -විශේෂයෙන්ම කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේත්, වැවිලි අමාත්‍යාංශය යටතේත් පර්යේෂණ ආයතන ගොඩක් තිබෙනවා- යටතේ තිබෙන ආයතන සමඟත්, ඒ වාගේම විශ්වවිද්‍යාල සමඟත් ඒකාබද්ධ වෙලා මේ කටයුත්ත ජාතික ඇගැයීමේ ක්‍රියාවලියක් බවට පත් කරන්න අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම මේ කරුණ ඉටු කිරීමේදී අපට වැදගත් වෙනවා, තොරතුරු පද්ධතියක්. ඒ කියන්නේ ජාතික පර්යේෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියක්, MIS එකක්. අද ඒක නැහැ. ඉතින් ඒ නිසා අපි ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය එක්කත් කථා කරලා තිබෙනවා. ඒ වාගේම තවත් ආයතනත් එක්කත් කථා කරලා තිබෙනවා. ඉදිරියේදී අපි MIS පද්ධතියක් ඇති කරනවා. ඒ මඟින් අපට පුළුවන්, ඒ පර්යේෂණවල විනිවිදභාවය, කාර්යක්ෂමතාව බලන්න. මොකද, proposal එකක් දුන්නාම ඉක්මනට ඇගැයීමේ ක්‍රියාවලියට සම්බන්ධ කරන්න පුළුවන්. ඒ මත අපට පුළුවන්, සාක්ෂි මත පදනම් වූ තීරණ ගන්න, ඒවා කොහොමද ඉස්සරහට වෙන්නේ කියලා.

පර්යේෂණ කිරීමේදී වැදගත් වන තවත් දෙයක් තමයි ආචාර ධර්ම. සාමාන්‍යයෙන් වෛද්‍ය පීඨයේ පරීක්ෂණවලට ඒක බොහෝ බලපානවා. නමුත් අපේ රටේ අනෙකුත් ක්ෂේත්‍රවල තවම ඒක ප්‍රචලිත වෙලා නැහැ. උදාහරණයක් හැටියට කිව්වොත්, පුරාවිද්‍යාව පිළිබඳ පර්යේෂණයක් කරන්න ගත්තොත්, එතැනත් තිබෙනවා රැක ගත යුතු ආචාර ධර්ම පද්ධතියක්. ඉතින් ඒ නිසා අපි ආචාර ධර්ම පාලනය, ethical governance සඳහා අමාත්‍යාංශ මට්ටමෙන් කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුවෙන් ලබා ගන්නා තීරණ අනුව අපි කොහොමද ඒ පිළිගත් ආචාර ධර්ම පද්ධතීන්ට අනුකූලව පර්යේෂණ ඉස්සරහට කරගෙන යන්නේ කියන එක තීරණය කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කොච්චර පර්යේෂණ කළත් වැඩක් නැහැ, ඒක වාණිජකරණය කරන්නේ නැත්නම්. නමුත් වාණිජකරණය කිරීමම නොවෙයි අපේ අමාත්‍යාංශයේ කාර්යභාරය. මම ඒකත් කියන්න ඕනෑ. වාණිජකරණය කියන්නේ එක කාර්යයක් විතරයි. වාණිජකරණ කාර්යයට අපේ සමහර

[ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේනමහතා]

ආයතනත්, විශේෂයෙන්ම NIA එක, SLIC එක වැනි ආයතන සම්බන්ධයි. නමුත්, වාණිජකරණ කාර්යය අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනවලට විතරක් නොවෙයි කළ යුතු වන්නේ. අනෙකුත් අමාත්‍යාංශත් එය කළ යුතුව තිබෙනවා. ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය ආදි අමාත්‍යාංශ ගණනාවක්ම එය කළ යුතුව තිබෙනවා. නමුත්, ඒ හැම එකකම එකිනෙකට වෙනස් ක්‍රියාවලියක් තමයි තිබෙන්නේ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, මේ ඔක්කෝම එකතු වෙලා වාණිජකරණය කිරීමේ පොදු ප්‍රතිපත්තියක් සහ ඒකාකාරී වැඩ පිළිවෙළක් සකස් කරන්න. ඒ වෙනුවෙන් දැනටමත් අපි කමිටුවක් පත් කරලා, ඒ කමිටුව ඉදිරි කටයුතු කරගෙන යනවා. ඒ වාගේම, මේ කාරණයත් කියන්න ඕනෑ. විශ්වවිද්‍යාලවල University Business Linkages - UBLs - තිබෙනවා. ඒ වාගේ industries ගත්තොත්, ඒ industriesවල තිබෙනවා Industrial Business Linkages. අපි ඒවා සියල්ලත් එකිනෙකට සම්බන්ධ කරලා network එකක් හදලා පොදු ප්‍රතිපත්තියක් හැටියට, පොදු වැඩ පිළිවෙළක් හැටියට කරගෙන යන්න බලාපොරොත්තු වෙනවා.

මෙහිදී මම කියන්න ඕනෑ, ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය විතරක් නොවෙයි, ඉහත කී පරිදි ඒ සියලු ආයතන මේකට නායකත්වය දෙන බව. ඒ වාගේම තවත් දෙයක් කියන්න ඕනෑ. අපි අපේ අමාත්‍යාංශය යටතේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ඇතුළු අපේ රටේ සියලු විද්වතුන් පාහේ එකතු කරගෙන තිබෙනවා. දේශපාලන භේදයෙන් තොරව අපිත් එක්ක සියදහස් ගණනක් විද්වතුන් එකතු වෙලා ඉන්නවා. ඒ අය තමයි අපේ සම්පත. අපි ඒ අයත් එක්ක තමයි එකට වැඩ කරන්නේ. ඒ අය මට advice දෙන්නේත් නැහැ; මම ඒගොල්ලන්ට advice දෙන්නේත් නැහැ. අපි එක group එකක් හැටියට කටයුතු කරනවා. මට ඒ හොඳටම ඇති. මෙන්න මෙහෙම තමයි අපි සාමූහිකව වැඩ කරන්නේ. අපි කවුරුවත් සියල්ල දත් අය නොවෙයි. ඒ නිසා අපි සාමූහිකව තමයි අපේ අමාත්‍යාංශය යටතේ හැම තීරණයක්ම ගන්නේ.

ඊළඟට මම "විදාතා" වැඩසටහන ගැන කථා කරන්න කැමැතියි. ඔබතුමන්ලා හැමෝම "විදාතා" ගැන දන්නවා. අපේ රටේ Vidatha Centres 315ක් තිබෙනවා. ඒ Vidatha Centres 315න්, 73ක් "විදාතා" සම්පත් මධ්‍යස්ථාන හැටියට තිබෙනවා. අපි හැමෝම දන්නවා, අපේ "විදාතා" ව්‍යාපාරය අද active නැහැ කියලා. ඒ නිසා අපි "විදාතා" ව්‍යාපාරය වෙනුවෙන් උපාය මාර්ගික සැලැස්මක් සකස් කරලා, කැබිනට් මණ්ඩලයේ අනුමැතියත් ලබාගෙන ඉවරයි. දැන් අපි ඒක ක්‍රියාත්මක කරමින් පවතිනවා. අපේ උපාය මාර්ගික සැලැස්මේ තිබෙන්නේ අර සාම්ප්‍රදායික කර්මාන්ත විතරක් නොවෙයි. නවීන තාක්ෂණයත් එකතු කරපු "විදාතා" වැඩසටහනක් තමයි අප බලාපොරොත්තු වෙන්නේ. ඒ විතරක් නොවෙයි, "විදාතා" උපාය මාර්ගික සැලැස්ම තුළ තිබෙනවා, අප ඒක monitor කරන්නේ කොහොමද, පසුවිපරම් කරන්නේ කොහොමද කියලා. ඒ වාගේම, ඒ තුළ කාර්යසාධන දර්ශක -KPIs- තිබෙනවා. ඒවාට අනුව ඇගයීම් කරන්නේ කොහොමද, "විදාතා" වැඩසටහන කරන නිලධාරින්ගේ සම්මතයන් - norms - මොනවාද කියලාත් අපි බලන්න ඕනෑ. මොකද, අපි දන්නේ නැහැ, ඒගොල්ලන් කොච්චර දුරට වැඩ කරනවාද කියලා. එම නිසා ඒගොල්ලන් ඇගයීමක් කරන්න වෙනවා. අන්න එවැනි පසුබිමක් ඇති කළ යුතුව තිබෙනවා. ඒක නිසා තමයි අපේ ආණ්ඩුව "විදාතා" වෙනුවෙන් මෙවර අය වැයෙන් වැඩි මුදලක් වෙන් කර තිබෙන්නේ. අපි 2025 අය වැයේදී ඒ වෙනුවෙන් වෙන් කළේ රුපියල් මිලියන 902යි. අපි මෙවර අය වැයෙන් ඊට වඩා වැඩි මුදලක්, එනම් රුපියල් මිලියන 1,151ක් "විදාතා" වෙනුවෙන් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම, "විදාතා" වැඩසටහන අපි මේ අවුරුද්දේම ක්‍රියාත්මක කරනවා. මම කිව්වා, "විදාතා" සම්පත් මධ්‍යස්ථාන 73ක් තිබෙනවා කියලා. අපි ඒ සම්පත් මධ්‍යස්ථාන 73 mini-incubation centres හැටියට දියුණු කරනවා. මොකක්ද ඒකෙන් කරන්නේ? මෙච්චර කල් "විදාතා" මධ්‍යස්ථානවලින් කළේ යම් තාක්ෂණයක් පිළිබඳව කියා දීම විතරයි. තාක්ෂණයත් කියා දෙනවාට අමතරව දැන් අපි ඒ "විදාතා" මධ්‍යස්ථානවලට අවශ්‍ය උපකරණත් ලබා දෙනවා. විජලන යන්ත්‍ර වෙන්න පුළුවන්, packaging යන්ත්‍ර වෙන්න පුළුවන්, සුළු කර්මාන්තකරුවන්ට අවශ්‍ය කරන ඒ වාගේ දේවල්, අපේ රටේ ජාතික ආර්ථිකය නංවන්න අවශ්‍ය කරන දේවල් අපි ඒ "විදාතා" මධ්‍යස්ථාන හරහා අලුතින් ලබා දෙනවා. අපි මේ අවුරුද්දේම ඒ වැඩේ කරනවා. අපි දැනටමත් ප්‍රසම්පාදන කටයුතු කරමින් යනවා. අපි ඒ සඳහා රුපියල් මිලියන 75කට වැඩි මුදලක් මේ අවුරුද්දේම වියදම් කරනවා. අප මේ අවුරුද්දේ තාක්ෂණ පැවරුම වෙනුවෙන් වෙන් කර තිබුණේ රුපියල් මිලියන 3යි. 2026 අය වැය වෙනුවෙන් ඒ සඳහා රුපියල් මිලියන 37ක මුදලක් අපට වෙන් කර තිබෙනවා. ඒ වාගේම, නිෂ්පාදනයේ ගුණාත්මකභාවය වැඩි කරන්න මේ අවුරුද්දේ තිබුණේ රුපියල් මිලියන 6යි. ඒක ලබන වසර වෙනුවෙන් රුපියල් මිලියන 9.8ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, තාක්ෂණික සේවා සහ ආධාරක මධ්‍යස්ථාන, ඒ කියන්නේ incubation centres සඳහා අපට මේ අවුරුද්ද වෙනුවෙන් රුපියල් මිලියන 4යි තිබුණේ. නමුත්, අපට ලබන අවුරුද්ද වෙනුවෙන් රුපියල් මිලියන 142ක් වෙන් කර තිබෙනවා. ඒ අනුව ගත්තාම, මේක කුඩා කර්මාන්තකරුවන් ඉහළට නංවන වැඩ පිළිවෙළක්. එම වැඩ පිළිවෙළ සඳහා අපි කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේත්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේත් නිලධාරින්ගේ උපකාරය ලබා ගන්න බලාපොරොත්තු වෙනවා. මා ඉහතින් කිව්වේ, Vidatha level එකේ mini-incubation centres ගැනයි. ඊට අමතරව අපේ සැලැස්මක් තිබෙනවා, සියලු විශ්වවිද්‍යාල එක්ක සම්බන්ධ වෙලා ඊට වඩා ඉහළ තාක්ෂණයක් ඇති incubation centres ආරම්භ කරන්න. අපි මේ අවුරුද්දේම එවැනි මධ්‍යස්ථාන තුනක් ආරම්භ කරනවා. අපි දැනටමත් එම මධ්‍යස්ථාන තුන සැලසුම් කරලා ඉවරයි; මුදල් වෙන් කරලාත් ඉවරයි. එක මධ්‍යස්ථානයක්, වවුනියාව විශ්වවිද්‍යාලය සමඟත්, තවත් මධ්‍යස්ථානයක් මඩකලපුව Eastern University එක සමඟත්, ඊළඟ මධ්‍යස්ථානය රුහුණ විශ්වවිද්‍යාලය සමඟත් සම්බන්ධ වෙලා ආරම්භ කරනවා. එම මධ්‍යස්ථාන තුන මේ අවුරුද්ද ඇතුළත open කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ incubation centresවල පරිපාලනය කරනවා "විදාතා" සම්පත් මධ්‍යස්ථානය විතරක් නොව, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, කර්මාන්ත අංශයේ අය, IDB එකේ අය සහ private ආයතන. Incubation centre එකක් කියන්නේ, ආණ්ඩුවේ ආයතනයි, පෞද්ගලික ආයතනයි, විශ්වවිද්‍යාලයි එකට වැඩ කරන තැනක්. අපි ඒ වැඩ කටයුත්ත විශේෂයෙන්ම කෘෂිකර්ම අමාත්‍යාංශය, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශත් එක්ක එකතු වෙලා කරගෙන යනවා. අපට එම මධ්‍යස්ථානවලින් testings කරන්න පුළුවන්. අද testings කරන්න ගොඩක් වෙලාවට කොළඹටම එන්න වෙනවා. අවශ්‍ය කරන testings එම දිස්ත්‍රික්කය තුළදීම කර ගැනීමේ හැකියාව දැන් අපට තිබෙනවා. ඊට අමතරව පෞද්ගලික අංශයටත්, රාජ්‍ය අංශයටත්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ටත් එකම තැන research කිරීමේ, අලුත් දෙයක් develop කිරීමේ සහ නවෝත්පාදනයක් ඇති කිරීමේ හැකියාව එවැනි මධ්‍යස්ථානවල තිබෙනවා. ඒ විතරක් ද නොවෙයි. එම incubation centresවල startups ඇති කරන්නත් අපි යෝජනා කර තිබෙනවා. එය පොකුරු ක්‍රමයක්. අපි බලාපොරොත්තු වෙනවා කුමක් හෝ විශ්වවිද්‍යාලයකට හෝ faculty එකකට link කරලා හැම දිස්ත්‍රික්කයකටම ලොකු incubation centre එකක් ආරම්භ කරන්න. ඒ incubation centre එක අර කියපු විදාතා මධ්‍යස්ථාන හෙවත්, mini incubation centres එක්ක link

කරනවා. ඒ කියන්නේ, පොඩි සහ ලොකු මධ්‍යස්ථාන විධියට හැම දිස්ත්‍රික්කයකටම පොකුරක් එනවා. ඒ විධියටයි අප එය කරන්නේ. ඒක සම්බන්ධ වනවා පාසල් ශිෂ්‍යයන්ට, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට සහ private sector එකට. ඒ විධියට හැම තැනකටම සම්බන්ධ වුණු network එකක් තමයි ඒක.

අපි මේ අවුරුද්දේ රජයේ පාසල් පද්ධතිය තුළ යොවුන් නව නිපැයුම් සමාජ 100ක් ආරම්භ කළා. අපි එම සංඛ්‍යාව ලබන අවුරුද්දේ 1,000ක් දක්වා වැඩි කරනවා. ඒවා වැඩි කිරීමේදී අපි ඒ ඒ අධ්‍යාපන කලාප ගැන විමසා බලනවා. ඊට අමතරව, ඒවාට රොබෝ තාක්ෂණය, AI තාක්ෂණය පිළිබඳ online වැඩමුළු කිරීමටත් බලාපොරොත්තු වෙනවා. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම තමයි මේකට අදාළ කාර්යය විශේෂයෙන්ම කරන්නේ. නමුත් අපි දැන් කියා තිබෙනවා, ඉස්කෝලවලට වෙනම programme එකක් හදන්න කියලා. එතකොට නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විතරක් නොවෙයි, ජාතික විද්‍යා පදනමත් ඒකට සම්බන්ධයි; Kandyවල තිබෙන NIFS එකත් සම්බන්ධයි. ඊට සම්බන්ධ අපේ තවත් ආයතන තිබෙනවා. ඒ සියලු ආයතන එකතු වෙලා programme එකක් දැන් හදලා තිබෙනවා. අපි ඒ programme එක ගැන සහ එය ඉස්සරහට ගෙන යන්නේ කොහොමද කියන එක ගැන අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරමින් සිටිනවා.

ඊළඟට, විශ්වවිද්‍යාල මට්ටමෙනුත් තරුණ නවෝත්පාදන සංසද පිහිටුවන්න අපි බලාපොරොත්තු වෙනවා. මම ඉස්සෙල්ලාත් කිව්වා වාගේම ඒවාත් ජාලගත කරනවා. අපි "සහසක් නිමැවුම්" නමින් තරග පවත්වා තිබෙනවා; එමඟින් පාසල් ශිෂ්‍යයන් තෝරාගෙන ජාතික මට්ටමට ගෙන එනවා. ඒ වාගේම, අපි ජාතික හැකතන් තරගාවලිය මෙවරත් පැවැත්වූවා. එම තරගාවලිය ලබන අවුරුද්දේත් පවත්වන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපි ජාතික විද්‍යා සතියක් පැවැත්වූවා. අප එය පැවැත්වූයේ පෞද්ගලික අංශය, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ඇතුළු බොහෝ දෙනෙකුගේ එකතුවෙන්. ඒ සියලු දෙනාගේ එකතුවෙන් අපි ඒ කටයුත්ත කළා.

අපේ ගරු ජනාධිපතිතුමා අපට ගිය අවුරුද්දේ Budget එකෙන් ජාතික තත්ත්ව යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා වෙන් කළා, රුපියල් මිලියන 750ක්. අපි 'Strengthening National Quality Infrastructure' යටතේ projects 26ක් තෝරාගෙන තිබෙනවා. දැන් ඒවායෙහි ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙනවා. අපි ඒ රුපියල් මිලියන 750ම මේ අවුරුද්ද ඇතුළත වියදම් කරනවා. ඒකෙන් මොකක්ද වෙන්නේ? ඒකෙන් අපට පුළුවන් අපේ පරීක්ෂණාගාරවල තත්ත්වය උසස් කර ගන්න, ප්‍රමිතිය ඉහළ නංවා ගන්න. එම නිසා අපට පුළුවන් අපි අපනයනය - export - කරන භාණ්ඩවල තත්ත්වය හා ගුණාත්මකභාවය හරියාකාරව assess කරන්න. එය අපනයන වර්ධනයට සම්බන්ධ වන දෙයක්. ඒකත් එක්ක link වන එකක් තමයි, නියාමන බලපෑම් තක්සේරුව - Regulatory Impact Assessment. UN එකත් එක්ක එකතු වෙලා ඒ වැඩේත් අපි කළා. මේ අවුරුද්දේ රුපියල් මිලියන 750ක් වියදම් කළා. ලබන අවුරුද්දට අපේ Budget එකෙන් තවත් රුපියල් මිලියන 377ක් ඒ සඳහා වෙන් කර තිබෙනවා. මම හිතන විධියට හැමෝම දන්නවා ඇති, ජාතික මූලික අධ්‍යයන ආයතනය මඟින් අපි පොහොරක් හදාගත්තා, ජෛව පටල ජෛව පොහොර - biofilm biofertilizer. අපි ඒක ගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ 10වැනි දා වාණිජකරණය කළා. ඒක ලොකු දෙයක්, හොඳ example එකක් වාණිජකරණය කිරීමට. ඒක අපේ ආයතනයකින්ම සොයා ගත්ත පොහොරක්. ඒක අපි කළා. ඒ වාගේම අපි දන්නවා, ආතර් සී ක්ලාක් ආයතනය ගැන. ඒ ආයතනය මඟින් ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානයෙන් දියත් කළ "Dragonfly" නමැති නැනෝ චන්ද්‍රිකාව කක්ෂගත කළා. ඒකත් අපේ ඉංජිනේරුවන්ගේ වැඩක්. ඒ වාගේම ඒ ආයතනය මඟින් දුම්රිය එන්ජින් උප පද්ධති නවීකරණය කරනවා. අපි Sri Lanka Railways එක එක්ක වැඩ කරනවා. ඒ වාගේම, දැනටමත් වෛද්‍ය උපකරණ ප්‍රතිසංස්කරණය කර දීලා තිබෙනවා. ඒ වාගේම, වන අලි දුම්රියේ ගැටීම වළක්වන්න ඉදිරියේදී තාප කැමරා, ලේසර් සංවේදක වාගේ දේවල් යොදා ගැනීම පිළිබඳව අපි දැනටත් සාර්ථකව පර්යේෂණ කරමින් යනවා.

ඒ වාගේම, කාර්මික තාක්ෂණ ආයතනය ගත්තොත්, පරාමිතීන් 10,040ක් සඳහා ISO 17025 අපට ලැබී තිබෙනවා. ඊට අමතරව අපි ජාතික ඖෂධ නියාමන අධිකාරිය සමඟ අවබෝධතා ගිවිසුමකට ගියා. අපට වෙනම lab එකක් තිබෙනවා pharmaceuticals test කරන්න. නමුත්, කනගාටුවක මහත! NMRA එක ඒකට ඒ තරම් එකඟ නැහැ; අපිත් එක්ක එකට වැඩ කරන්න එකඟ නැහැ. අපි ඒගොල්ලන් එක්ක කථා කළා. නමුත්, අපට ඒකට අවශ්‍යයි ඊට වඩා දෙයක්. අපි ඒ ගැනත් බලනවා. ඒ වාගේම, අපේ ITI ආයතනයේ තිබෙනවා ගල් අඟුරු testing facilities. අපි ඒක නොරොච්චෝලේ තමයි හදන්න බලාපොරොත්තු වන්නේ. සාමාන්‍යයෙන් අපි අවුරුද්දකට මිලියන 36ක් වියදම් කරන්න ඕනෑ පිට රටට, fuel testingවලට. නමුත්, අපට ඒ මිලියන 36 ඉතිරි කරගන්න පුළුවන්, අපේ lab එක මෙහේ පටන් ගත්තොත්. දැන් අපි ඒ ගැන කථා කරගෙන යනවා. ලබන අවුරුද්දේ පළමු කාර්තුවේදී මේක වැඩි වර්ධනය කරලා, දෙවැනි කාර්තුවේදී මේ lab එක function කිරීමේ හැකියාවක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)
මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒ වාගේම ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් - NERDC මඟින් - ඉලෙක්ට්‍රික් ත්‍රිරෝද රථයක් හැදුවා. අපට තිබෙනවා පරණ petrol three-wheelers. ඒවා convertor එකක් මාර්ගයෙන් electricවලට පරිවර්තනය කළා. ඒකත් අපේ ආයතනය මඟින් කරපු දෙයක්. ඒ වාගේම, අපි බලාපොරොත්තු වෙනවා තව දෙයක්. ලබන අවුරුද්දේ Agri-Tech - agriculture technology - වෙනුවෙන් hub එකක් හදන්න. ඒ Agri-Tech hub එකට අපේ ධීවර අමාත්‍යාංශයත්, අපේ කෘෂිකර්ම අමාත්‍යාංශයත්, Plantation Ministry එකත් සම්බන්ධ කරගත යුතු වෙනවා. අපේ ගම්වල සිටින අයගේ, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ, පාසල් ශිෂ්‍යයන්ගේ නව නිපැයුම් තිබෙනවා. ඒවා ඔක්කොම සම්බන්ධීකරණය කර ඒවා වාණිජකරණය කිරීම දක්වා ගෙන යන්න අපි කටයුතු කරනවා. ඒ තුළින් අපට පුළුවන් වී, පොල්, රබර්, කුරුඳු, තල් වැනි හැම ක්ෂේත්‍රයක්ම සම්බන්ධීකරණය කරගෙන ඒ ඔක්කොම වාණිජකරණය දක්වා ගෙනයන්න.

ඊට අමතරව අපි යෝජනා කරලා තිබෙනවා medical technologyවලට medi-tech hub එකක්. අපේ රටේ තිබෙන හෙළ වෙදකම, ආයුර්වේද වෙදකම වාගේ ඒවායේ තිබෙන සාක්ෂි අරගෙන ඒකත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ තුළින් ආබාධ සහිත පුද්ගලයන් වෙනුවෙන් assistive devices හදන්න පුළුවන් උපකාරක වශයෙන්. ඒ වාගේම, nanomedicine, telemedicine, genomics, stem cells, nuclear medicine කරන්න බලාපොරොත්තු වෙනවා. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය අපිත් එක්ක ඉන්නවා. අපට ඒවාත් පාවිච්චි කරන්න පුළුවන් සෞඛ්‍යය, කෘෂි කර්මාන්තය, පරිසරය වෙනුවෙන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලබා දුන් අතිරේක මිනිත්තු දෙකක කාලයත් අවසානයි.

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)
මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න.

මේවාත් එක්ක රොබෝ තාක්ෂණයත්, AI තාක්ෂණයත් එකතු කර තමයි අපි ඉස්සරහට යන්න හදන්නේ. ඒ වාගේම, අපි බලාපොරොත්තු වෙනවා engineering technology ගැන, බලශක්තිය, ඛනිජ වැලි, solar cells, EV batteries ගැනත් කටයුතු කරන්න. ඒ නිසා අපි වියදම් කරන දේ තව විධියකින් ආයෝජනයක්. මේක අපේ අමාත්‍යාංශයට තනිවම කරන්න බැහැ. මේක හැම අමාත්‍යාංශයකටම සම්බන්ධ විය යුතු අමාත්‍යාංශයක්. අපි එහෙම සම්බන්ධ වෙලා තිබෙනවා දැනටත්. අපි හිතනවා, අපේ අනෙක් අමාත්‍යවරුන් සමඟ තවදුරටත් අපට ශක්තිමත්ව ඉස්සරහට යන්න පුළුවන් කියලා.

මම මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා අපේ අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු සියලු නිලධාරි මහත්ම මහත්මීන්ට. ඒ වාගේම අපේ ආයතන ප්‍රධානීන්ට. අපි අනෙකුත් අමාත්‍යාංශ සමඟ දැනටමත් සාකච්ඡා කරලා එක එක වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ සියලු අමාත්‍යාංශවල අමාත්‍යවරුන්ට, ලේකම්වරුන්ට, ඒ වාගේම අපිත් එක්ක සම්බන්ධ වුණු අනෙකුත් පර්යේෂණ ආයතනවල අධ්‍යක්ෂවරුන්ට, මගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය ඇතුළු සියලුදෙනාට ස්තුතිය පුද කරමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.27]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ඩිජිටල් ආර්ථිකය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරද්දී මම විශේෂයෙන් කියන්න ඕනෑ ඩිජිටල් පාර්ලිමේන්තුවකුත් හැදුවොත් හොඳයි කියලා. දැන් මගේ ඉස්සරහා තිබෙනවා පොත් ගොඩක්. මෙතැනත් පොඩ්ඩක් තිබෙනවා. විශාල පොත් තොගයක් මේ විධියට අපතේ යනවා. සමහර අය මේ එකක්වත් පෙරළලාවත් බලනවාද කියලා මට සැකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම 2013දී වයඹ පළාත් සභාවට තේරුණා. 2013දී වයඹ පළාත් සභාවේ හැන්සාඩ් වාර්තා ටික එව්වේ, e-mailsවලින්. Gazette notifications ටික එව්වේත් e-mailsවලින්. ඒ නිසා මේ පොත් මුද්‍රණය කිරීම විශාල අපරාධයක් කියන එක මම කියන්න කැමතියි. ඩිජිටල් ආර්ථිකයක් හදනවා නම් පාර්ලිමේන්තුවත් ඩිජිටල් කරමු කියන යෝජනාව කරමින් මම අද දවසේ විෂයට එන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම ධීවරයන් පිළිබඳව මම කථා කරන්න අවශ්‍යයි. මම ජීවත් වෙන්නේ විශාල ධීවරයන් පිරිසක් ජීවත් වෙන ධීවර කලාපයක. මම ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා ධීවරයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට රුපියල් මිලියන 100ක් වෙන් කිරීම පිළිබඳව. මම හිතන හැටියට, ජීවිත ආරක්ෂක උපකරණ සඳහා ඒ මුදල ලබා දීලා තිබෙනවා. ඒක හොඳයි. ඒ වාගේම ධීවරයන්ට චන්ද්‍රිකා තාක්ෂණය මත පදනම්ව මත්ස්‍ය ගහනය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කර ගැනීම සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කර තිබෙනවා. මේ රුපියල් මිලියන 100න් චන්ද්‍රිකා තාක්ෂණයට අදාළව කරන්නේ මොකක්ද කියලා ගරු ධීවර ඇමතිතුමා උත්තරයක් දෙයි, මේ රුපියල් මිලියන 100 ඇතුළත කරන්න පුළුවන් ප්‍රමාණයක් තිබෙනවා නම්. චන්ද්‍රිකා තාක්ෂණය අපට තිබෙනවාද? චන්ද්‍රිකා තාක්ෂණය කොහෙන් හෝ ගන්න වෙනවා. ලංකාවෙන් චන්ද්‍රිකාවක් යැව්වා. දැන් ඒක ගැන කථා කරලා ඉවරයි නේ. ඒක පැලවත්තට කඩාගෙන වැටුණා නේ. ඒ කෙසේ වෙතත්, අපට කොහේ හෝ රටකින් මේකට උදව් ගන්න සිද්ධ වෙනවා. මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ ඉන්දියාවේ අභ්‍යවකාශ පර්යේෂණ මධ්‍යස්ථානය - ISRO එක - ගැන. මම පෞද්ගලිකව එතැනට ගියා. එතැන ඒ අභ්‍යවකාශ වැඩසටහන්වලට අමතරව ධීවරයන් බේරා ගැනීම සඳහා, ඒ වාගේම ධීවරයන්ට මාළු තිබෙන ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් කරනවා. ඉන්දියාව පුරාම දැන් ක්‍රියාත්මක වෙන්නේ DAT-SG හා NavIC කියන එක. අපි ඒ සම්බන්ධයෙන් යම් අධ්‍යයනයක් කරන්නත් යෙදුණා. ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාත් දන්නවා, අපේ ධීවර කලාපයේ ධීවරයන් විශාල ප්‍රමාණයකගේ ජීවිත අහිමි වෙනවා. අපි විපක්ෂයේ මන්ත්‍රීවරු. අපට මේවා සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කරන්නත් බැහැ නේ. ඒ නිසා මම ඉන්දියානු මහ කොමසාරිස්තුමාගෙන් ඒ වෙනුවෙන්ම විශේෂ ඉල්ලීමක් කළා, ඒ පද්ධති දෙක ලංකාවට හඳුන්වා දෙන්න කියලා. හැබැයි, මට ඒක කරන්න බැහැ. ගරු ධීවර ඇමතිතුමාට ඒ සඳහා මැදිහත් වෙලා කටයුතු කරන්න හැකියාව තිබෙන බව මතක් කරන්න කැමතියි. ඒ වෙනුවෙන් වැඩ කරන්න කියලාත් විශේෂයෙන් මම ඉල්ලා සිටිනවා. මොකද, අනතුරට ලක් වුණාට පස්සේ චන්ද්‍රිකා තාක්ෂණය හරහා ඉන්න තැන, ඒ වාගේම ආපදාවේ ස්වභාවය යනාදී සියලු දේවල් ගැන ඉතා සුළු උපකරණයකින් දැනුවත් කරනවා පමණක් නොවෙයි, එතැනටත් පණිවුඩයක් යනවා මේ වෙනකොට උදව් සඳහා පැමිණෙමින් තිබෙනවා ද, නැද්ද කියලා. ඒ නිසා මේක ඉතාම වටිනවාය කියන එකත් මම කියන්නට කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට ලබා දුන් ලිපිය **සභාගත*** කරනවා.

ඒ ලිපිය කියවා බලා ඔබතුමන්ලා ඒ කටයුතු කරන්න. මේක ලබා ගෙන test run එකක් අපට කරන්න පුළුවන්. ඊට පස්සේ ජාතික වැඩසටහනක් විධියට කරන්න පුළුවන්. මේ VMS system එකත් මේ වන විට දිවයින වටා පිහිටි වරාය කාර්යාල වෙත අධීක්ෂණ පහසුකම් ලබා දීලා තිබෙනවා. මේ අවුරුද්දේ Progress Report එකේ තිබෙනවා, 2021 වර්ෂයේ සිට VMS system එක ක්‍රියාත්මක වෙනවා කියලා. කලින් කථා කරපු මන්ත්‍රීවරයෙක් කිව්වා, 76 අවුරුද්දක් නොකළ දේ අපට කරන්න වෙලා තිබෙනවා කියලා. මේවා කෙරිලා තිබෙන්නේ ඒ 76 අවුරුද්ද ඇතුළත තමයි. එහෙම කියලා එතුමා මෙතැනින් ගිහිල්ලා. පූසෝ, මීයෝ අල්ලනවා වාගේ කතන්දර නොකියා තාක්ෂණය සම්බන්ධයෙන් වැඩකටයුතු කළොත් හොඳයි. ජනාධිපතිතුමා කියපු ඒවා අල්ලාගෙන අපි දැන් ගහනවා නේ, ජනාධිපතිතුමාට. අපි කියන්න ඕනෑ, "ඔව්. එතුමා මේ තාක්ෂණය ගැන කිව්වා. කිව්වා වාගේම කරලා තිබෙනවා" කියලා. හැබැයි, රුපියල් මිලියන 100න් මොකක්ද කරන්න හදන චන්ද්‍රිකා තාක්ෂණය?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ISRO එකෙන් මම පෞද්ගලිකව ඇහුවා, ලංකාව මේ සම්බන්ධයෙන් උදව් ඉල්ලා තිබෙනවාද කියලා. කිසිම දවසක මේ සඳහා නිල වශයෙන් උදව් ඉල්ලා නැහැ කියන එක තමයි මට දැන ගන්න ලැබුණේ. මේ තාක්ෂණයෙන් ඉන්දියාවම ආවරණය කරනවා නම්, ලංකාව කියන්නේ පොඩි dot එකක් වාගේ තැනක් නේ. මේකෙන් ලංකාව ආවරණය කරන එක ඉතාම ලේසියි. VMSවලටත් උදව් කරලා තිබෙන්නේ ඕස්ට්‍රේලියාවෙන්. ඉතින් මේ සඳහා අපි ඉන්දියාවෙන් ආධාර අරගෙන මේ දේ කරමු කියලා මම කියන්න කැමැතියි.

ඒ වාගේම මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මාදැල් ධීවර කර්මාන්තයේ නිරත වෙලා ඉන්න අය අපෙන් ඉල්ලීමක් කර තිබෙනවා, වින්ච් උපකරණ භාවිතය සම්බන්ධයෙන්. මේ අවුරුද්ද අවසානයේ ඉඳලා වින්ච් උපකරණ භාවිතය නවත්වන්නට කටයුතු කරනවා කියලා කියනවා. දැනට මාදැල් තොටුපළවල් 900ක් විතර තිබෙනවා. විශාල පිරිසක් මේකෙන් ජීවත් වෙනවා. වෙන්නප්පුව, මීගමුව, පැලියගොඩ ආදී මේ සියලු තැන්වල මේ කටයුතු සිද්ධ වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට වෙලාව නැති නිසා ඉක්මනින්ම මේ කාරණයත් කියන්න ඕනෑ. 2025 නොවැම්බර් 04වැනි දා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලිපියක් යවලා පැහැදිලි කරනවා, "මාදැල් වට කිරීම සඳහා වින්ච් උපකරණ සවි කළ ට්‍රැක්ටර් යොදා ගැනීම තහනම් කිරීම පිළිබඳව සහ මෙම උපක්‍රමය වෙනුවට හඳුන්වා දෙන නවීන තාක්ෂණික විකල්ප ක්‍රම සම්බන්ධයෙන් ඔබගේ නිරීක්ෂණ ඇතුළත් වාර්තාවක් 2025.11.24 දින හෝ ඊට ප්‍රථම මා වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වමි" කියලා. ගරු ධීවර ඇමතිතුමනි, නිරීක්ෂණ ඇතුළත් වාර්තාවක් යවලා තිබෙනවාද? අද වනකොට 2025.11.24 දිනය පහු වෙලා තිබෙනවා. මේක යවලා තිබෙනවාද? මේ වාර්තාව යවලාද, තහනම් කිරීමට කටයුතු කරන්නේ කියන එකත් මම අහන්න කැමැතියි. එහෙම නැත්නම්, ගන්න ක්‍රියාමාර්ගය අපට පැහැදිලි කරන්න. මාදැල් ධීවර ප්‍රජාව විශේෂයෙන්ම ඉල්ලා සිටින්නේ, තාවකාලිකව අවස්ථාව ලබා දෙන්න, මේ සම්බන්ධයෙන් විකල්ප ගෙනෙනවා නම් ඒ සම්බන්ධයෙන් කාලයක් ලබා දීලා කටයුතු කරන්න කියන එකයි. ඒක නිසා ඔවුන් වෙනුවෙන් මම ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබා දුන් ලිපියක් - ගරු ඇමතිවරයා දන්නේ නැත්නම් එතුමාට දැන ගන්නත් - මම **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද හඬ පටයක් එළියට ඇවිල්ලා තිබෙනවා කියලා අපි දන්නවා. මම ඊයේ රූපවාහිනියේ සාකච්ඡාවක හිටියා. ඒ හඬ පටය එළියට ආපු අමාත්‍යවරයාගේ නියෝජ්‍ය අමාත්‍යවරයා ඒ සම්බන්ධයෙන් සේදීමක් සිද්ධ කළා. අද වනකල් අමාත්‍යවරයා මේ ගරු සභාවට ඇවිල්ලා නැහැ. හැබැයි, ලෝකය වටේට - යුරෝපයටයි, අරහෙටයි, මෙහෙටයි - කරුණු කාරණා කියමින් මේක හෝදන්නට කටයුතු කරනවා කියන එකත් මතක් කරන්න කැමැතියි. සුනිල් හඳුන්නෙත්ති ඇමතිවරයා අද වනකොට ඒ හාල් මෙට්‍රික් ටොන් 130,000ක් සම්බන්ධයෙන් ඒ විධියට කටයුතු කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලයිසන් එකක් නැත්නම් ඒක නීති විරෝධියි. ඒක ගැන කථා කරලා වැඩක් නැහැ. හඬ පටය කපලාද තිබෙන්නේ, join කරලා හදලා තිබෙනවාද කියලා වැඩක් නැහැ. ලයිසන් එකක් නැත්නම් ඒක නීති විරෝධියි කියන එක මතක් කරන්නට අවශ්‍යයි. දඩයක් හරි, එහෙම නැත්නම් රාජසන්තක කිරීමක් හරි කරන්න තිබෙද්දී මොන එකකටද අමාත්‍යවරයෙක් කථා කරලා කියන්නේ "ලයිසන් එක නැහැ, ඒක නම් මට බේර ගන්න පුළුවන්" කියලා? අමාත්‍යවරයෙක් එහෙම කියන්නේ මොකටද? තව අහනවා, "ලක්ෂ 84ක දඩයක් තිබෙනවා, ඒකට මොකද කරන්නේ?" කියලා මොකද කරන්නේ කියලා ඇහුවාම අපි මොකක් කියලාද හිතන්නේ? ලක්ෂ 50ක් විතර මට දෙන්න කියනවාද දන්නේත් නැහැ, ලක්ෂ 84 එපා කියලා. සම්පූර්ණ හඬ පටය තිබෙනවා නම් කරුණාකරලා ඒක එළියට දමන්න කියලා මම අභියෝග කරනවා. කෑලි කෑලි කියලා මේක මහ හරින්න එපා. මේකම තමයි වුණේ කන්ටේනර් 323ටත්. ඒ වාර්තාව අපි බොහොම අමාරුවෙන් හොයා ගෙන ඇවිල්ලා මේ ගරු සභාවට ඉදිරිපත් කළාම කිව්වා, ඕක නොවෙයි සම්පූර්ණ වාර්තාව කියලා. එහෙනම්, කෝ සම්පූර්ණ වාර්තාව? දැන් අද වනකල් ඒකත් නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් අපට උත්තරයක් දෙන්න. මොකද, මේ රටේ මිනිස්සු බලාගෙන ඉන්නවා. කන්ටේනර් 323 සම්බන්ධයෙන් පැන නැඟුණු ප්‍රශ්නය මේකෙන් තවත් වැඩි වෙනවා කියන එකත් මම කියන්නට කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි මා ළඟ තිබෙනවා, ඒ invoice එක. ඒ invoice එකේ importer කවුද? M/s. United Nations Human Rights Organization. දැන් මේකට ගිහිල්ලා බැලුවාම, "United Nations" කියන එක දැක්කාම "එක්සත් ජාතීන්ගේ" කියන එකක් තමයි අපට ඔළුවට එන්නේ. මේ, හොරට අටවා ගත්ත සංවිධාන, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේකේ ඉංග්‍රීසි ලියන්න දන්නේ නැහැ; "district" කියලා ලියන්න දන්නේ නැහැ, "announcer" කියලා ලියන්න දන්නේ නැහැ, "profitable" කියලා ලියන්න දන්නේ නැහැ. මේ ඔක්කොම බොරු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔය charity කියලා අටවා ගත්ත ඒවායෙන් තමයි හාල් ගෙනැල්ලා මෙහේ කඩ ටික පුරවන්නේ.

අද අපේ වී ගොවියා නිෂ්පාදනය කරන හාල්වලට නිසි මිලක් දෙන්නේ නැහැ. හැබැයි, මේ වාගේ ජල්තර වැඩ කරලා එහෙන් මෙහෙන් ගෙන්වන ටික,- *[බාධා කිරීමක්]* මොකටද හාල් ගෙනැල්ලා නිකම් බෙදනවා කියන්නේ? මොකද, දැන් නියඟයක් තිබෙනවාද? ගංවතුරක් තිබෙනවාද? මොකක්ද මේ කරන්නේ? රතු තරුව සහන සේවා ස්වේච්ඡා බලකායෙන් බෙදනවාද? ඒක හරි. ඊයේ පෙරේදා චෝදනාවක් එල්ල වුණා, කෙසෙල් ගෙඩියක්වත් මිනිස්සුන්ට බෙදලා නොවෙයි බලයට ආවේ කියලා. ඒක නිසා මේක එනවාද? තමන්ගේ දේශපාලනය පහළට යන නිසා පුම්බ ගන්න ඕනෑවට මේක කරනවාද? ඒ නිසා අමාත්‍යවරයා විධියට මේ ගරු සභාවට ඇවිල්ලා අපට මේකට උත්තරයක් දෙන්න කියලා ඉල්ලා සිටිනවා. හැංගි හැංගි ඉන්න එපා. ලෝකය පුරා ඉන්න යූටියුබ් නාළිකා කරන කට්ටියට මේක යවලා මේක හෝදන්න බැහැ. අපි දන්නේ නැහැ, මේකේ ආවේ මොනවාද කියලා. ඔය විධියට කීයක් කරලා තිබෙනවාද කියලාත් අපි දන්නේ නැහැ. කන්ටේනර් 323 ගැන අපි තවම දන්නේ නැහැ. ඒකේ, "ආවේ නැහැ, ආවේ නැහැ" කියලා කිව්වාට හරියන්නේ නැහැ. ඒ සම්බන්ධ වාර්තාවත් මේ වනවිට ඉදිරිපත් කරලා නැහැ කියලා මතක් කරන්නට කැමැතියි.

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. මේක අපට විශාල සැකයක් මතු කරන තැනක්. ඔය විධියටම කථා කරලා කන්ටේනර් 323 ගෙනාවා නම් අපට සැකයක් මතු වෙනවා, මේක කරලා තිබෙන්නේත් ඒකේ extension එකක් විධියටද කියලා. අද කියනවා, "සීනි ගෙනෙන්න ආපු කට්ටියක් හාල් ගැන කථා කළා, ඒක නිකම් බෙදන්න කථා කරනවා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කවුද මෙට්‍රික් ටොන් 13ක් ගෙනැල්ලා -කිලෝ 130,000ක් ගෙනැල්ලා - නිකම් බෙදන්න දෙන්නේ? එහෙම කියනවා නම් රජයේ අමාත්‍යවරයෙකුට මේක නිකම් බෙදන්න දෙනවා නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්. කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරලා ඒක නිවැරැදි කරන්න තිබෙනවා නම් නිවැරැදි කරන්න කියලා මතක් කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

[பி.ப. 3.38]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! திருகோணமலை மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பாராளுமன்ற உறுப்பினர் என்ற அடிப்படையில், இன்றைய தினம் நடைபெறுகின்ற கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு, அங்கு காணப்படுகின்ற மீன்பிடி சம்பந்தமான சில விடயங்களை இந்த இடத்தில் கௌரவ அமைச்சர் அவர்களுக்கு ஞாபகமூட்டலாமென நினைக்கின்றேன்.

திருகோணமலை பகுதியில் பயன்படுத்தப்படுகின்ற சுருக்குவலை சம்பந்தமாக மீன்பிடிக்குப் பொறுப்பான அமைச்சர் அவர்களுக்குப் போதிய தெளிவில்லை என்பதைக் கடந்த கால அவரது உரைகள்மூலம் என்னால் புரிந்துகொள்ளக்கூடியதாக இருந்தது. ஆகையால், முதலில் அது பற்றி கௌரவ அமைச்சர் அவர்களுக்குச் சற்று தெளிவு படுத்தலாமென நினைக்கின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, நாங்கள் சொல்கின்ற சுருக்குவலை என்பது, வட பகுதியில் இடம்பெறுகின்ற light coarse மீன்பிடியுடன் தொடர்புடைய வலையல்ல. மாறாக, கடற்றொழில் திணைக்களத்தால் அனுமதிப்பத்திரம் வழங்கப்பட்டுள்ள, சூரை மீன்களைப் பிடிப்பதற்காகப் பயன்படுத்தப்படுகின்ற சுருக்குவலையாகும். இதனை light coarse வலையென நினைத்து குழப்பமடைய வேண்டிய அவசியம் கிடையாது. வெளிநாட்டுக் கடற்பரப்பிலுள்ள சூரை மீன்கள் குறிப்பிட்ட காலங்களில் எமது திருகோணமலைக் கடற்பரப்புக்குள் வந்து, அங்கு குறிப்பிட்ட காலம் இருந்துவிட்டு, மீண்டும் வெளிநாட்டுக் கடற்பரப்புக்குச் செல்கின்றன. இவ்வாறு திருகோணமலைக் கடற்பரப்புக்குள் வருகின்ற மீன்களைச் சுருக்குவலைமூலம் பிடிப்பதற்கு எங்களுடைய மீனவர்கள் முயற்சிக்கும்பொழுது, அவர்கள் பல பிரச்சினைகளை எதிர்கொள்கின்றார்கள். நான் நினைக்கின்றேன், சுருக்குவலையைப் பயன்படுத்தி மீன்பிடிப்பது சம்பந்தமாக இந்தப் பாராளுமன்றத்தில்கூட பல தடவை பேசியிருக்கிறோம் என்று. எமது கடற்பரப்புக்குள் வருகின்ற இந்த மீன்களை எங்களுடைய மீனவர்கள் பிடிக்காவிட்டால், அவை வெளிநாட்டுக் கடற்பரப்புக்குள் சென்ற பின்னர், அங்குள்ள மீனவர்கள் அவற்றைப் பிடிக்கிறார்கள்.

திருகோணமலை மாவட்டத்தில் சட்டத்தை அமுல்படுத்தி, அங்குள்ள மீனவர்கள் சுருக்குவலையைப் பயன்படுத்தி மீன்களைப் பிடிக்கவிடாமல் பல்வேறு குழப்பங்களை ஏற்படுத்துகின்றனர். குறிப்பாக, கடற்படையினருடன் முரண்பாடு ஏற்படுகின்றது. இதுபோன்ற பல்வேறு இன்னல்களுக்கு அவர்கள் முகங்கொடுக்கவேண்டிய சூழல் ஏற்படுகின்றது. தற்போது நடைமுறையிலுள்ள சட்டத்தின் அடிப்படையில், திருகோணமலை மாவட்டத்தில் 1.5 அங்குலம் அளவுடைய கண்கொண்ட சுருக்குவலையைப் பயன்படுத்துவதற்கு அனுமதிப்பத்திரம் வழங்கப்பட்டு இருக்கிறது. எனினும், அந்த அனுமதிப்பத்திரத்திலுள்ள நிபந்தனைகள் திருகோணமலை மாவட்டத்துக்குப் பொருத்தமானதா என்பதை நாம் பார்க்க வேண்டும். ஏனெனில், கரையிலிருந்து 7 கடல் மைலுக்கு அப்பால் சென்றுதான் சுருக்குவலையைப் பயன்படுத்தி மீன்பிடிக்க வேண்டுமென்ற நிபந்தனை அதில் குறிப்பிடப்பட்டு இருக்கிறது.

குறிப்பாக, திருகோணமலை குடா பகுதியில் எந்தப் புள்ளியில் இருந்து 7 கடல் மைல் தூரம் அளவிடப்பட வேண்டும் என்ற தெளிவின்மை காணப்படுகின்றது. நான் நினைக்கின்றேன், அந்தத் திணைக்களத்தில் இருக்கின்ற அதிகாரிகளுக்குக்கூட இந்த விடயத்தில் போதிய அறிவு இல்லையென்று. உதாரணத்துக்கு, கிண்ணியாவில் இருந்து 7 கடல் மைல் என்றால், அது திருகோணமலையிலிருந்து 2 கடல் மைலாகக் காணப்படுகின்றது. எனவே, இது பெரியதொரு பிரச்சினையாகக் காணப்படுகின்றது. குடா பகுதிக்குள் தூரம் எவ்வாறு அளவிடப்பட வேண்டும் என்பதுகூட, கடற்றொழில் சம்பந்தமான சட்டத்தில் குறிப்பிடப்படவில்லை என்பதை நான் இந்த இடத்தில் சுட்டிக் காட்டுகின்றேன். இவ்வாறான நிலைமை இருக்கின்ற திருகோணமலை மாவட்டத்தில் வருடத்துக்கு 200க்கும் மேற்பட்ட வழக்குகள் 7 கடல் மைல் பிரச்சினை சம்பந்தமாகப் பதிவு செய்யப்படுகின்றன என்பதை நான் கௌரவ அமைச்சர் அவர்களுடைய கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். கண்ணுக்கு எட்டிய தூரத்தில் மீன்கள் இருக்கும்பொழுது, 7 கடல் மைலுக்கு அப்பால் சென்று மீன்களைப் பிடிக்கச் சொல்வது எந்த வகையில் நியாயமெனக் கேட்க விரும்புகின்றேன். கரையிலிருந்து 7 கடல் மைல் தூரம் தாண்டித்தான் சுருக்குவலையைப் பயன்படுத்த வேண்டுமெனில், அது எங்கிருந்து ஆரம்பமாகின்றது என்பதையும் அதிகாரிகள் சொல்ல வேண்டும். எனினும், அதிகாரிகளுக்கே அது தெரியாது என்பதுதான் கவலைக்குரிய விடயமாகக் காணப்படுகின்றது. எனவே, இந்த நிபந்தனையில் திருத்தங்களைக் கொண்டுவர வேண்டுமென நான் கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

திருகோணமலை மாவட்டத்தில் கடற்றொழில் திணைக்களத்தால் வருடாந்தம் எத்தனை வழக்குகள் தாக்கல் செய்யப்படுகின்றன என்ற விடயத்தைப் பார்ப்போம். நான் சொல்கின்ற இந்தப் பிரச்சினையை அடிப்படையாகக் கொண்டுதான் 80 சதவீதமான வழக்குகள் நீதிமன்றத்தில் தாக்கல் செய்யப்படுகின்றன என்பதை இந்த இடத்தில் சொல்லிக் கொள்கின்றேன். கௌரவ அமைச்சர் அவர்களுக்கு

இந்த விடயத்தை மேலும் தெளிவுபடுத்துவதற்கு ஓர் உதாரணத்தைச் சொல்கின்றேன். அதாவது, அனுமதிப்பத்திரம் ஏதும் இல்லாமல் மோட்டார் சைக்கிளைச் செலுத்துபவரைக் கைதுசெய்யாமல், helmet அணிந்தும் அதன் தாடைப் பட்டியைக் கொளுவாமல் செல்கின்றவருக்குத் தண்டனை வழங்குவது போன்றதொரு செயற்பாடாகத்தான் இது காணப்படுகின்றது. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இது சம்பந்தமாக உரிய நடவடிக்கைகளை முன்னெடுத்து, சிறந்ததொரு தீர்வை வழங்க வேண்டும்.

திருகோணமலை மாவட்டத்தில் இருக்கின்ற மீனவர்கள் பலர், சுருக்குவலையைப் பயன்படுத்தி மீன்பிடித் தொழிலை மேற்கொள்கின்றவர்களாக இருக்கின்றார்கள். குறிப்பாக, கிண்ணியா, மூதூர், தோப்பூர், வெருகல், வெள்ளைமணல், ஜமாலியா, இறக்கண்டி, குச்சவெளி, புடவைக்கட்டு, புல்மோட்டை போன்ற பகுதிகளில் வாழும் மீனவர்கள் இந்த வலைமூலமான மீன்பிடியையே நம்பியிருக்கிறார்கள். இந்த வலைமூலம் மீன்பிடி நடவடிக்கைகளை மேற்கொள்ள முடியாத நிலை இருக்குமாக இருந்தால், தயவுசெய்து வழங்கப்படுகின்ற அனுமதிப்பத்திரத்தை இரத்துச்செய்துவிட்டு, மீன்களைப் பிடிப்பதற்கான புதிய தொழில்நுட்பங்களை உள்ளடக்கிய பயிற்சிகளை அவர்களுக்குக் கொடுக்கக்கூடிய ஒரு செயற்றிட்டத்தையாவது முன்னெடுக்க வேண்டுமென நான் கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன். இந்த வருடம் வழங்கிய அனுமதிப்பத்திரத்தின் பிரதிகள் என்னிடம் இருக்கின்றன. இந்த அனுமதிப்பத்திரம் ஒவ்வொரு வருடமும் வழங்கப்படுகின்றது. அவ்வாறு வழங்கப்பட்டாலும், அவர்களால் நிம்மதியாக அங்கு மீன்பிடித் தொழிலைச் செய்ய முடியாதவொரு நிலைப்பாடு காணப்படுகின்றது என்பதை நான் கௌரவ அமைச்சர் அவர்களுடைய கவனத்துக்குக் கொண்டுவருகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் சனாதிபதியாக இருந்த காலத்தில், மீன்பிடிப் படகு உரிமையாளர்களுக்கு 2024ஆம் ஆண்டு ஒக்ரோபர் மாதம் முதல் 2025ஆம் ஆண்டு மார்ச் மாதம் வரையான ஆறு மாத காலத்துக்கு எரிபொருள் மானியம் வழங்குவதற்கு நிதி ஒதுக்கப்பட்டது. இந்த மானியம் திருகோணமலை மாவட்டத்தைச் சேர்ந்த மீன்பிடிப் படகு உரிமையாளர்களுக்கு ஓரிரு மாதங்கள் மாத்திரமே வழங்கப்பட்டு இருக்கிறது. மிகுதிக் கொடுப்பனவு கிடைக்கப்பெறாத நிலையிலே அந்தப் பிரதேசத்து மீனவர்கள் இருந்துகொண்டு இருக்கிறார்கள். எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்தில் கவனம் செலுத்தி, அவர்களுக்கான கொடுப்பனவை வழங்குவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். வங்கிக் கணக்கு இலக்கம் பிழையாக இருந்ததன் காரணமாக திருகோணமலையில் 250க்கும் மேற்பட்டவர்களுக்கு இன்னும் மண்ணெண்ணெய் மானியம் கிடைக்காதவொரு நிலை காணப்படுகின்றது. தற்போது அவர்கள் சரியான வங்கிக் கணக்கு இலக்கத்தை வழங்கி இருக்கிறார்கள். எனவே, அவர்களுடைய வங்கிக் கணக்குக்கு அந்தப் பணத்தை வைப்பிலிடுவதற்குரிய நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய திருகோணமலை மாவட்டத்தில் காணப்படுகின்ற புல்மோட்டைப் பிரதேசத்தில் கொக்கிளாய் களப்பில் இறால் மற்றும் நண்டு பிடிக்கின்ற - கட்டுவலையைப் பயன்படுத்தி தொழில் செய்கின்ற - மீனவர்கள் இருக்கின்றார்கள். அவர்களுக்கான அனுமதிப்பத்திரம் இதுவரை காலமும் வழங்கப்படவில்லை. இவர்கள் 50 வருடங்களுக்கும் மேலாக அந்தப் பிரதேசத்தில் அச்செயற்பாடுகளை முன்னெடுத்து வருகின்றார்கள். இவ்விடயம் பற்றி நான் சென்ற வரவு செலவுத்திட்ட விவாதத்திலும் கூறியிருந்தேன். எனவே, உரிய அதிகாரிகளை அல்லது திணைக்களங்களைச் சம்பந்தப்படுத்தி, இவர்களுக்கான அனுமதிப்பத்திரத்தை எவ்வாறு வழங்குவது என்பதைத் தீர்மானித்து, அவற்றை அவர்களுக்கு வழங்குவதற்கான நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இப்பொழுது திருகோணமலை மாவட்டத்தில் தொடர்ச்சியாகப் பெய்து வருகின்ற மழையாலும் அதனால் ஏற்பட்டுள்ள வெள்ளம் காரணமாகவும் பலர் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள். குறிப்பாக, விவசாயிகள், கால்நடை வளர்ப்பாளர்கள், மீனவர்கள் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். மீனவர்கள் கடலுக்குச் செல்ல முடியாத அளவுக்குப் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். அவர்களுக்கான நிவாரணம் வழங்கும் விடயத்திலும் கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், மீனவர்களுக்கான கொடுப்பனவு, அவர்களுக்கான வீட்டுத்திட்டம் மற்றும் கல்விச் செயற்பாடுகளை முன்னெடுப்பதற்காக அவர்களுடைய பிள்ளைகளுக்கான கொடுப்பனவு என்பன சம்பந்தமாகவும் கௌரவ அமைச்சர் அவர்கள் கவனத்திற்கொள்ள வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக்கொள்கின்றேன். ஏனெனில், இவை சென்ற காலங்களில் முன்னெடுக்கப்படவில்லை.

எங்களுடைய பிரதேசத்திலுள்ள மீனவர்கள் தொடர்ச்சியாக 12 மாதமும் மீன்பிடிப்பது கிடையாது. அந்தந்த seasonஇலே அவர்களுக்கான தொழில்வாய்ப்பு இருக்கின்ற காரணத்தால், அனர்த்தங்கள் ஏற்படும்போது அவர்களுடைய வாழ்வாதாரம் முற்றுமுழுதாகப் பாதிப்படைகின்ற ஒரு நிலையே எங்களுடைய பிரதேசத்தில் காணப்படுகின்றது. இதனைக் கருத்திற்கொண்டு அவர்களின் வாழ்வாதாரத்தை உறுதிப்படுத்தக்கூடிய வகையில், புதிய தொழில்நுட்பங்களை உட்புகுத்தி, மீன்பிடி நடவடிக்கைகளை மேற்கொள்வதற்குரிய நடவடிக்கைகளை முன்னெடுக்க வேண்டுமென நான் கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய பிரதேசத்திலுள்ள மீனவர்கள் பல்வேறு பிரச்சினைகளுக்கு முகங்கொடுக்கின்றார்கள். இது சம்பந்தமாக நாங்கள் மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலும் பேசி இருக்கின்றோம். அதன் மூலமாகவும் சில முடிவுகள் எட்டப்பட்டு இருக்கின்றன. அவ்வாறு எட்டப்பட்ட விடயங்கள் அமைச்சரின் கவனத்துக்கு வரும்பொழுது, அவற்றுக்குச் சாதகமான பதிலை அவர் வழங்குவாரென நாங்கள் எதிர்பார்க்கின்றோம் எனக் கூறி, சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறி, முடித்துக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.48]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව. මට ලැබී තිබෙන කාලය සීමිත නිසා ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්න මම හිතුවා. මොකද, ධීවර ජනතාවත් එක්ක හැමදාම එකට යා වෙලා ජීවත්ව වන කණ්ඩායමක් හැටියට අපි ඔවුන් ගැන කථා කළ යුතුයි.

ධීවර අමාත්‍යතුමාට මම විශේෂයෙන්ම මේ කාරණය මතක් කරනවා. ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුවට අමතක වෙලා තිබෙනවා, පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවරයෝ ඉන්නවාය කියන එක. 2025 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරපු අය වැයේත් එහෙම කරලා තිබෙනවා මම දැක්කා. 2026 අය වැය තුළිනුත් වැඩි බරක් දීලා තිබෙන්නේ අනෙක් පැතිවලට. හැබැයි, අපේ දිස්ත්‍රික්කයට එහෙම බරක් දීලා නැහැ. බරක් තියා අපේ ප්‍රදේශය ගැන සඳහනක්වත් මෙවර අය වැය තුළ දකින්න නැහැ. කරදිය සහ මිරිදිය ධීවර කර්මාන්තය මේ ප්‍රදේශයේ හොඳට කරගෙන යනවා. ඒ වාගේම පුත්තලම කියන්නේ, ධීවර කර්මාන්තයෙන් විදේශ විනිමය වැඩිපුර ලබා දෙන ප්‍රදේශයක්. හැබැයි, මේ ප්‍රදේශයේ ධීවර කර්මාන්තය වෙනුවෙන් මෙවර අය වැයෙන් කිසිම මුදලක් වෙන් කරලා නැහැ කියන එක විශේෂයෙන්ම මම මතක් කරනවා.

ඊළඟ කාරණාව මේකයි. විශේෂයෙන්ම සුළු පන්න ධීවර කර්මාන්තය කරන පොඩි බෝට්ටුවල යන අයට දැන් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා, ඒ අයගේ කර්මාන්තය කොහොමද කරන්නේ කියලා. සමහරු තමන්ගේ ජීවනෝපාය හැටියට ඒ කටයුත්ත කරනවා. සමහර අය ඒක කර්මාන්තයක් හැටියට කරනවා. හැබැයි, ඒ අයට පැහැදිලිවම ප්‍රශ්නයක් තිබෙනවා. බෝට්ටු, එන්ජින්, අමතර කොටස්, අලුත්වැඩියා කටයුතු, එන්ජින් එකට අවශ්‍ය වන තෙල් සහ අනෙකුත් අංගෝපාංග සහ දැල්වල මිලත් අද වනකොට ඉතා අධිකයි. හැබැයි, වතු ක්ෂේත්‍රයේ ඉන්න අයට රුපියල් 200ක දීමනාවක් ලබා දෙන වැඩසටහනක් අද වනකොට ක්‍රියාත්මක වෙනවා. ලොකු වතු තිබෙන, විශේෂයෙන්ම දැන් ආණ්ඩුවත් එක්ක සම්බන්ධ වෙලා තමුන්නාන්සේලාව ජයග්‍රහණය කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළට සම්බන්ධ වුණු, තමුන්නාන්සේලාට සල්ලි දුන්නු සමාගම්වලට තමයි ඒ chance එක දෙන්න හදන්නේ. හැබැයි, ධීවරයින්ට මොනවාද දෙන්න යන්නේ? ධීවර ජනතාවට කලින් සහනාධාරයක් ලබා දුන්නා. සහනාධාරයක් නොවෙයි, අඩු ගණනේ පනවා තිබෙන බදු - tax - ටිකවත් දැන් අඩු කරලා දෙන්න. එහෙම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න හිතලාවත් නැති එක ගැන විශේෂයෙන්ම අපි කනගාටු වෙනවා.

ඒ වාගේම ධීවරයින්ට සිදු වන ආපදා සම්බන්ධ වැඩසටහනකට දැන් මුදල් වෙන් කරලා තිබෙනවා. මහ බෝට්ටු සහ පොඩි බෝට්ටු කියන දෙවර්ගයම මුහුදේදී යම්කිසි ආපදාවකට ලක් වුණොත් ඒ බෝට්ටු නැවත ගොඩ බිමට ගෙනෙන වැඩසටහනක් අපි හදන්න ඕනෑ කියලා මම යෝජනාවක් කරනවා. ඒ විතරක් නොවෙයි, සමහර වෙලාවට කවුරු හරි ධීවරයෙක් ධීවර රැකියාවේ යන අතරමඟ රෝගී වුණොත් ඒ ධීවරයාට දින ගණනාවක් යනතුරු ගොඩ බිමට එන්න බැහැ. එම නිසා ඒ ධීවරයින් වෙනුවෙන් අපි වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. එදා අපි high-speed බෝට්ටු කිහිපයක් ambulance එකක් හා සමාන වෙන විදියට හදන්න හැදුවා. ඒක හදන්නේ ambulance එකක් විදියටම නොවෙයි. හැබැයි, ඒකේ තිබෙන පහසුකම් ටික ඇතුළත් කරලා, කවුරු හරි ඒකට පුරුදු කරලා, හැම ප්‍රදේශයක්ම ආවරණය වෙන විදියට ඒවා standby තියන්න පුළුවන්, යම් විදියකින් හෝ ඔවුන්ට රැකවරණයක් ලබා දෙන්න. ආපදාවක් වුණාම බෝට්ටුව නැවත ගොඩ බිමට ගෙනෙන්න, එහෙම නැත්නම් කවුරු හරි කෙනෙක් රෝගී වුණාම එතැනට ගිහිල්ලා බෙහෙතක් දීලා ඒ රෝගියාව බේරා ගන්න යම්කිසි වැඩ කොටසක් කරන්න අවශ්‍යයි. ගරු ඇමතිතුමනි, යම්කිසි මුදල් ප්‍රමාණයක් වෙන් කරලා ඒ වෙනුවෙන් අරමුදලක් - fund එකක් - හදන්න ඔබතුමාට පුළුවන්. යම්කිසි ආපදාවක් සිදුවෙලා බෝට්ටුවක් ගිලෙන්න යනකොට ඒ වෙලාවේදීම හෙලිකොප්ටරයක් hire කර ගන්න පුළුවන් වන විදියට, එහෙම නැත්නම් ආණ්ඩුවත් එක්ක, නැත්නම් ගුවන් හමුදාවත් එක්ක සම්බන්ධ කරලා අනතුරට පත් අය ඒ අවස්ථාවේදීම බේරා ගන්න පුළුවන් වන විදියේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න.

හලාවත ප්‍රදේශයේ ධීවරයෙක් මුහුදේදී අනතුරට පත්වෙලා තිබෙනවා. මාස ගණනක් ගත වුණත් මේ වනතුරු ඒ ධීවරයාව හොයා ගන්න ලැබුණේ නැහැ.

ඒ ධීවරයා මුහුදේ ගිලිලා ඉවරයි. හැබැයි, අපට දැනගන්න ලැබුණා, ඒ අවස්ථාවේදී එක ධීවරයෙක් බේරුණා කියලා. ඒ ධීවරයාගේ ප්‍රකාශයට අනුව දවසක විතර කාලයක් ඔවුන් මුහුදේ සටන් කරලා තිබෙනවා, නැවත ගොඩට එන්න. හැබැයි, අනික් ධීවරයාට ගැලවෙන්න බැරිව ගිලුණා කියලා තමයි ඔහු කියන්නේ. මේක අපි රටක් හැටියට හිතමතා කරපු වරදක්. ඒ නිසා මේ වෙනුවෙන් තමුන්නාන්සේ මැදිහත් වෙන්න කියලා විශේෂයෙන් මම ඉල්ලීමක් කරනවා.

ඊළඟට, චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා මාදැල් ධීවර කර්මාන්තයේ නිරත වෙලා ඉන්න අය සම්බන්ධයෙන් කරපු ඒ යෝජනාව පිළිබඳවත් මම කියන්න කැමතියි. මාදැල් ව්‍යාපාරය කරන කණ්ඩායමට අවස්ථාවක් ලබා දීම වෙනුවෙන් වාර්තාවක් දෙන්න කියලා ගරු ජනාධිපතිතුමා කියා තිබෙනවා. මොකද, එක වතාවටම මාදැල් වට කිරීම සඳහා වින්ච් උපකරණ සවි කළ ට්‍රැක්ටර් යොදා ගැනීම තහනම් කරන්නේ නැතුව ඔවුන්ට අවස්ථාවක් ලබා දීලා, ඒ වාර්තාව අනුව ඉදිරි කාලය තුළ යම්කිසි වැඩසටහනක් සකස් කරලා, ඒවා අයින් කර ගන්න කටයුතු කරන්න කියලා කියා තිබෙනවා. මම හිතන විදියට ඔබතුමන්ලා දෙසැම්බර් 31වැනි දා හෝ ජනවාරි මාසයේ මුල සම්පූර්ණයෙන්ම ඒ වින්ච් උපකරණ සවි කළ ට්‍රැක්ටර් යොදාගෙන කරන වැඩේ නතර කරන්න කියලා තිබෙනවා. හැබැයි, එහෙම ඒක නතර කරන්න යන්න එපා. ඒකෙන් විශාල කොටසක් යැපෙනවා. ඒක නිසා ඒ අයට යම්කිසි පිළිතුරක්, එහෙම නැත්නම් ක්‍රමවේදයක් සකස් කරලා දීලා ඒ කටයුත්ත කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ධීවරයින්ට විශ්‍රාම වැටුපක් දෙන්න යනවා. මම ඇමතිතුමාට කියනවා, මේ විශ්‍රාම වැටුපට ධීවරයෝ කැමති නැහැ කියලා. ඇයි, ඒ? දායකත්ව මුදල හැටියට ලබා දෙන මුදල තමයි අවසානයේ මාසයකට රුපියල් 10,000ක්, 20,000ක් විදියට ගෙවන්න හදන්නේ. එතකොට අවුරුදු 60ක් ගත වුණාට පස්සේ -අවුරුදු 40න්, අවුරුදු 50න්, අවුරුදු 25න්, අවුරුදු 18න් වෙන්න පුළුවන්- ඒ දායකත්ව මුදල හැටියට ලැබෙන ගණන එකතු කරලා බැලුවාම ධීවරයා දීපු සල්ලි ටිකම තමයි රුපියල් 10,000 ගණනේ ලැබෙන්නේ. අවුරුදු 25ක්, 30ක් වෙන කෙනෙකුට අවුරුදු 60ක් ගත වුණාට පසුව මාසයකට රුපියල් 10,000ක් හම්බ වෙලා මොකටද? 1994දී මේ වාගේම විශ්‍රාම වැටුපක් හදලා තිබෙනවා. නමුත්, ඒක ඊට පසුව ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ අනුව ධීවරයෙකුට මාසයකට හම්බ වෙන්නේ රුපියල් 1,250යි. ඒ රුපියල් 1,250න් මොකක්ද කරන්න පුළුවන්? එදා

හැදුවේ ඒ විධියට. එදා හදද්දී ඒ ගණන හරි. හැබැයි, දැන් මේක සම්පූර්ණයෙන් වෙනස් කරන්න ඕනෑ. නැත්නම් ධීවරයෝ එක්කෙනෙක්වත් මේ විශ්‍රාම වැටුපට දායකත්වය ලබා දෙන්නේ නැහැ කියන එක විශේෂයෙන් මම මතක් කරනවා.

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ මතක තියා ගන්න ඕනෑ, කළපු ආශ්‍රිතව කෙරෙන ධීවර කර්මාන්තය පිළිබඳවත්. ඒ ගැන කථා කරද්දී මම කියන්න කැමතියි, අපේ ප්‍රදේශයේ මේ කළපුව කියන එක ඉතාම වැදගත් ලෙස පිහිටලා තිබෙන බව. නමුත්, ඒ කළපුවෙන් ප්‍රයෝජන ගන්න අවශ්‍ය කරන වැඩසටහන ක්‍රියාත්මක කරන්න ඕනෑ කරන මුදල් වෙන් කර ගැනීමක් කරලා නැහැ. කළපු ආශ්‍රිතව සිදු කරන ධීවර කර්මාන්තය, මිරිදිය ධීවර කර්මාන්තය, ඉස්සන් කර්මාන්තය ආදී මේ සියලු කර්මාන්ත අපේ ප්‍රදේශයේ තිබෙනවා. ඒ වෙනුවෙන් වැඩසටහනක් සකස් කරන්න තිබුණා. නමුත්, මේ අය වැය තුළ ඒ වැඩසටහන ක්‍රියාත්මක වෙනවා අපි දකින්නේ නැහැ කියන එක විශේෂයෙන් ඔබතුමාට මම මතක් කරන්න ඕනෑ.

මොකද, එතැනදී පැහැදිලිව අපට දකින්න ලැබෙන්නේ ඔබතුමාගේ ප්‍රදේශයේ වරායවල් ටික හදන්න ඔබතුමා සල්ලි වෙන් කරගෙන තිබෙනවා සහ අනික් පැත්තෙන් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ ප්‍රදේශයේ, එහෙම නැත්නම් දකුණේ වැඩ ටිකට සල්ලි වෙන් කරගෙන තිබෙන බව පමණයි. එතකොට, අනික් ප්‍රදේශවල ඉන්නේ ධීවරයෝ නොවෙයිද? එහෙම හිතාගෙන තමයි විශේෂයෙන්ම ඔබතුමන්ලා මේ වැඩ කටයුත්ත කරන්නේ.

ඊළඟට, මාළු වෙළෙඳ පොළ සම්බන්ධයෙනුත් මම කියන්න ඕනෑ. විදේශ රටවල් එක්ක කරන ගනුදෙනුවලදී, විශේෂයෙන්ම මාළු export කරද්දී, ඒ වෙළෙඳ පොළ සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, බහුදින යාත්‍රා විශාල මුදලක් වියදම් කරලා දියඹට ගිහිල්ලා තමයි, මාළු ටික අල්ලාගෙන එන්නේ. එහෙම මාළු ටික අල්ලාගෙන ආවාට පස්සේ ඒ අයට හොඳ මිලක් ලැබුණේ නැත්නම් ඇත්තටම ඒගොල්ලන්ට පාඩුයි. එතකොට ඒ අයට ඉස්සරහට යන්න බැහැ. එම නිසා මම විශේෂයෙන් මතක් කරනවා, බහුදින යාත්‍රා විතරක් නොවෙයි, පුංචි බෝට්ටු ඇතුළු සියල්ලම සම්බන්ධයෙන් මීට වඩා ක්‍රමවත් සැලැස්මක් හදන්න කියලා. ගරු ධීවර ඇමතිතුමාගෙන් මම ඒ ඉල්ලීම කරනවා.

ඒ වාගේම විශේෂයෙන් මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. ඔබතුමන්ලා, ඔබතුමන්ලාගේ ගෙවල්වලට විතරක් බෙදා ගන්න ලැහැස්ති වෙන්න එපා. ඔබතුමන්ලාගේ ගම්වලට, ඔබතුමන්ලාගේ ප්‍රදේශවලට විතරක් බෙදා ගන්නත් ලැහැස්ති වෙන්න එපා. මොකද, දූපතක් හැටියට අපේ රට වටේටම මුහුද තිබෙන්නේ. එම නිසා ධීවර කර්මාන්තයේ යෙදෙන තැන් තමයි රට වටේටම තිබෙන්නේ. ඒ හැම ප්‍රදේශයකම සිටින ධීවරයින් බලා ගන්න වැඩසටහන්වලට, විශේෂයෙන්ම ඒ ප්‍රදේශවල යටිතල පහසුකම් සකස් කරන වැඩ පිළිවෙළට මුදල් වෙන් කරන්න කියලා මම විශේෂ ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා මිත්‍ර සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යතුමා හැමදාම මොනවා හරි කර ගන්නවා. ගරු ලාල් කාන්ත අමාත්‍යතුමනි, ඔබතුමාගේ යාළුවා ඔබතුමා ළඟ ඉන්නේ. ඇයි, එතුමාට එහෙම කරන්නේ? එතුමා ඔබතුමාට අල්ලපු ආසනයේ ඉන්නේ. එතුමා හැමදාම මොකක් හෝ හුටපටයක් කරගන්නවා. එක්කෝ, ඉංග්‍රීසි කථා කරන්න ගිහිල්ලා භාෂාව ගැන ප්‍රශ්නයක් ඇති කර ගන්නවා. දැන් හඬ පටයක් සම්බන්ධයෙන් තවත් හුටපටයක් ඇති කරගෙන තිබෙනවා. හඬපට, හුටපට ඔක්කෝම එකට එකතුවෙලා. අපරාදේ නේ, එතුමා එදා හොඳට හිටපු මන්ත්‍රීවරයෙක් වාගේම අද අමාත්‍යවරයෙක්. අපි හිතාගෙන හිටියේ එතුමා හොඳ වැඩ කොටසක් කරගෙන යයි කියලා. මම නම් හිතන්නේ ඔබතුමන්ලා සැලසුම් කරලා එක එක්කෙනාට ෂොට් එක දෙනවා කියලා. මම දන්නේ නැහැ, ඒ ඇයි කියලා. මොකක් හෝ පෞද්ගලික තරහක් තිබෙනවාද, නැත්නම් පක්ෂයේ එක එක තැන් ගන්න, එහෙමත් නැත්නම් මොනවා හරි බෙදා ගන්න බැරිව ගැටලුවක් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. විශේෂයෙන්ම එදා ඉඳලා එතුමා ළඟින් හිටපු ලාල් කාන්ත ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, ඔබතුමා අපේ හිතවත් ඒ ඇමතිතුමාව බේරා ගන්න වැඩසටහන කරන්න කියලා. එතුමාත් එක්ක එදා හිටපු විධියටම දැනුත් ඉන්න. නමුත්, එදා විධියට දැන් ඉන්නේ නැහැ. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය ඇතිවෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම සමාජ මාධ්‍ය සමඟ ඇතිවෙලා තිබෙන ප්‍රශ්නත් එක්ක අද මේ රටේ බරපතළ ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. මතක තියා ගන්න, ඕනෑම තැනක සිද්ධියක් වුණොත්, ඒ සිද්ධිය ඒ සැනින්ම එළියට එනවා. එම නිසා අනික් අමාත්‍යතුමන්ලාටත්, අනික් මන්ත්‍රීතුමන්ලාටත් කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඔබතුමන්ලා ආණ්ඩුවට එන්න පෙර කියපු කථා ටික තිබෙනවා නේ. හැබැයි, ඒ කථා අහගෙන මේ රටේ නටපු කණ්ඩායම අද ඔබතුමන්ලාගේ පස්සෙන් ඉන්නවා, ඔබතුමන්ලාට කොයි වෙලාවේද ගේම දෙන්නේ කියලා බලාගෙන. එම නිසා සූදානමින් ඉන්න. ඔබතුමන්ලාට වැරදුණු ගමන් ඒ අය එළියට එනවා. ඒක ඔබතුමන්ලාගේ විනාශයට මුල වෙනවා. එම නිසා ඔබතුමන්ලා ආරක්ෂා වෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA left the Chair, and THE HON. LAKSHMAN NIPUNA ARACHCHI took the Chair.*

[අ.භා. 4.00]

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අමාත්‍යාංශ තුනක වැය ශීර්ෂ සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ධීවර අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ සම්බන්ධයෙන් කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා.

මේ වෙනකොටත් අපි දැක්කා, විපක්ෂය විධියට පක්ෂ තුන හතරකම මන්ත්‍රීවරු ධීවර ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කරනවා. ධීවර කර්මාන්තය දැන් පවතින්නේ කොහොමද, මෙතැනින් එහාට යා යුත්තේ කොහොමද කියන කාරණාව සම්බන්ධයෙන් එතුමන්ලා අපට උපදෙස් පවා ලබා දුන්නා කියලා මම හිතනවා. ඔවුන්ගේ ඒ යෝජනා සහ උපදෙස්වලින් ගත යුතු දේවල් ලබා ගන්නත් අපි සූදානම්. හැබැයි, අපි කියන්න ඕනෑ, ඔබතුමන්ලා මේ

[ගරු අජිත් ගිහාන් මහතා]

සම්බන්ධයෙන් update වෙලා නැහැ කියන එක. මේ වෙනකොට අපේ ධීවර අමාත්‍යාංශය, ආයතන කිහිපයක් විධියට මේ ධීවර කර්මාන්තය මෙතැනින් ඉදිරියට අරගෙන යන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් විශාල වැඩ පිළිවෙළක ඉන්නේ.

ගරු ජනාධිපතිතුමා පසුගිය කාලයේ තාක්ෂණ පැත්ත ගැන කිව්වා. "ධීවර කර්මාන්තය අපි කොතැනටද ගෙනියන්නේ, තාක්ෂණය පාවිච්චි කරන්න ඕනෑ කොහොමද? ධීවර කර්මාන්තය දැන් වෙනත් තැනක තිබෙන්නේ. එහෙම නම් අපි ඒකට සූදානම්" කියාත් එතුමා කිව්වා.

ඔව්, අපි සූදානම්. අපි ඒ තැනට යමින් තිබෙන්නේ, ඔබතුමා දන්නේ නැද්ද දන්නේ නැහැ. මේ වනකොට ලෝකයේ බහුදින ක්ෂේත්‍රය ගත්තොත්, ඒ ක්ෂේත්‍රය වෙනස් වෙලා තිබෙනවා, යාත්‍රා වෙනස් කරන්න සිද්ධ වෙලා තිබෙනවා කියලා අපි දන්නවා. මොකද, පසුගිය කාලයේ විධියට නොවෙයි ධීවර කර්මාන්තයේ යෙදෙන්න වෙලා තිබෙන්නේ. ඒ සඳහා තාක්ෂණය ඕනෑ.

හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා විශේෂයෙන්ම කිව්වා, පුත්තලම ගැන. බහුදින ධීවරයා ඇත්තටම අසරණ වෙලා තිබෙනවා. එදා තිබුණු වියදමයි, අද තිබෙන වියදමයි ගත්තොත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට හේතුවක් තිබෙනවා. ඔය කථා කරපු හැම කෙනෙක්ම ඒ සම්බන්ධයෙන් වග කියන්න ඕනෑ; අද විපක්ෂයේ ඉන්න, වෙනදා ආණ්ඩු කරපු, ඇමතිකම් දරපු ඔය කණ්ඩායම වග කියන්න ඕනෑ. මේ රට ආර්ථික අර්බුදයකට ගෙන ගියේ කවුද? ආර්ථික ඝාතකයෝ බවට පත් වුණේ කවුද? මේ රට බංකොලොත් රටක් කියලා කියා ගත්තේ කවුද? තවමත් ඔබතුමන්ලාගේ නායකත්වය විධියට පිළි අරගෙන ඉන්න පුද්ගලයෝ. එකට ආණ්ඩු කරලා, වෙනස්ව ආණ්ඩු කරලා, නැවත ඒකාබද්ධ වෙලා, "අපි බංකොලොත් රාජ්‍යයක්" කියලා කියා ගත්තා. ඒ ආර්ථික අර්බුදයේ බර ධීවරයාට පටවලා තිබෙන්නේ.

එදා ඔබතුමන්ලාගෙන් අපි ආණ්ඩුව ගන්නකොට තිබුණු ඉන්ධන මිල කීයද? සහන දුන්නා. සහනාධාරත් දුන්නා. හැබැයි, ඒවා ගැන කථා කරන්නේ නැහැ. අපිද ධීවරයාට මේ බර පටවලා තිබෙන්නේ? ඔබතුමන්ලා බංකොලොත් කරපු රටේ ධීවරයා විතරක් බංකොලොත් නොවී ඉන්නේ නැහැ. ධීවරයාත් බංකොලොත් කළා, ධීවර කර්මාන්තයත් බංකොලොත් කළා. හැබැයි, අපි මේවා ගොඩ නගන්න සැලසුම් හදලා තිබෙනවා. ධීවර අමාත්‍යාංශය භාර අපේ ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, ඒ වාගේම අපේ ආයතන ඔක්කෝම මේ වෙනකොටත් ධීවර කර්මාන්තය ගොඩ ගන්න සැහෙන වෙහෙසක් දරනවා.

බහුදින ක්ෂේත්‍රය ගත්තොත් අපි දන්නවා, මේ රටේ,-

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මගේ නම කියපු නිසායි මේක කියන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මම මෙතැන කථා කළේ අපේ දිස්ත්‍රික්කයේ ධීවරයන්ට සහයෝගය ලබා දෙන විධිය ගැන. ඒකෙන් ප්‍රයෝජන ගන්නවා වෙනුවට තමුන්නාන්සේ වෙන දෙයක් කථා කරලා වැඩක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒකේ ගැටලුවක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. එතැන point of Order එකක් නැහැ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඒ ධීවරයින් එක්ක කථා කළාම ඒ අය කියනවා, මොනවාද වෙලා තිබෙන්නේ කියලා.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ඔබතුමන්ලා මේ සම්බන්ධව වග කියන්න ඕනෑ කාරණාව භාර ගන්නේ නැතිව කථා කරනවා. දිස්ත්‍රික්කයේ ධීවරයා සම්බන්ධව විතරක් නොවෙයි, සමස්ත රටේ බහුදින ධීවරයා සම්බන්ධව, සුළුපන්න ධීවරයා සම්බන්ධව අපට අදහසක් තිබෙනවා. අපි ඒ සඳහා වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. බහුදින යාත්‍රා ගත්තාම රටේ සමස්තය ගැන කථා කරන්නේ. ඒකට අදාළ තාක්ෂණය ගේන්න ඕනෑ. ඒ අයට සහන දෙන්න ඕනෑ. සහයෝගය දෙන්න අපි සූදානම්. දැන් fishing ground forecast එක ක්‍රියාත්මකයි. ඔබතුමන්ලා දන්නේ නැත්නම් අහගන්න. අපි ඒ ගැන දන්නවා. අපි මේ වෙද්දි ඩයලොග් ආයතනය සමඟ එකතු වෙලා "Sayuru" කියන App එක හරහා මේ තොරතුරු ලබා දෙනවා. පුද්ගලයින් ලක්ෂයක් එහි සාමාජිකයෝ වෙලා තිබෙනවා. හොයන්න, update වෙන්න. මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා මෙතැනට ඇවිල්ලා ගියාට වැඩක් නැහැ. ඒවා ගැන හොයන්න. තොරතුරු හොයලා බලන්න, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. NARA එක මෙයට මැදිහත් වෙලා තිබෙනවා, පරීක්ෂණ ආයතනයක් විධියට. ඔවුන් මැදිහත් වෙලා ඊට අවශ්‍ය තාක්ෂණික කටයුතු සිදු කරනවා. ඒක තමයි ජනාධිපතිතුමා කිව්වේ, අපි මේ සම්බන්ධයෙන් කටයුතු කරනවා කියලා. අපි ඇවිල්ලා තවම අවුරුද්දයි. විනාශ කරපු රටක, ධීවර කර්මාන්තය වළ දාපු රටක දැන් අපි ඒවා ගොඩ නගමින් ඉන්නේ. ඒ නිසා ඔබතුමා පුත්තලමේ ඉන්න මන්ත්‍රීවරයෙක් විධියට, ධීවරයන් සම්බන්ධව ඔච්චර කැක්කුමක් තිබෙනවා නම් මේ කර්මාන්තය ගැන තව ටිකක් ඉගෙන ගන්න ඕනෑ.

ඒ වාගේම බහුදින යාත්‍රා 5,700ක් තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ තමයි වැඩි ප්‍රමාණයක් නැංගුරම් දැම්මේ. අපේ කාලයේදී අපි ඒවා දියත් කරලා තිබෙනවා; අපි දැන් දියත් කරලා තිබෙන්නේ. අපි ඒ අයට ඉන්ධන සහනාධාර දුන්නා. ඉන්ධන මිල රුපියල් 30කින් අඩු කරලා තිබෙනවා. අපි පොඩි බෝට්ටුවලට ඉන්ධන මිල රුපියල් 20කින් අඩු කරලා තිබෙන්නේ. මිල අඩු කරලා දීපු ඒවා නැහැ කියන්න බැහැ. එම නිසා හොඳට හොයලා බලන්න. අපි සූදානම්, ධීවර කර්මාන්තය ගොඩ ගන්න. අපට ආයතන ගොඩක් තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා නේද? අපේ ධීවර දෙපාර්තමේන්තුව තිබෙනවා, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව තිබෙනවා, NARA එක, NAQDA එක තිබෙනවා. ඒ විතරක් නොවෙයි, තව තිබෙනවා North Sea Limited, Cey-Nor Foundation එක. මේ රටේ මේ ආයතන වළ පල්ලට දමලා තිබුණේ. North Sea Limited, Cey-Nor Foundation වාගේ ආයතන හොඳ, ප්‍රමිතියකින් යුතු දැල් නිෂ්පාදනය කරපු ආයතන. ඒවා බිඳ වැට්ටුවා. අපි දැන් Cey-Nor Foundation එක ශක්තිමත් කරලා හොඳම yarn ගෙනැල්ලා දැල් නිෂ්පාදනය කරනවා. ඔන්න, ධීවරයාට ප්‍රමිතියෙන් යුතු දැල් දෙන්න අපි සූදානම්, ආම්පන්න දෙන්න සූදානම්. මේ ආයතන බිඳ වැට්ටුවේ මෙන්න මේ කණ්ඩායම. North Sea Limited කියන්නේ, ෆයිබර් බෝට්ටු නිෂ්පාදනය හා සංචාරක ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් දේවල් නිෂ්පාදනය කරපු ආයතනයක්. එය බිඳ වැට්ටුවා. පාඩු ලබලා වළ පල්ලට ගිය ඒ ආයතන අපි දැන් නඟා සිටුවා තිබෙන්නේ. පාඩු අවම කරගෙන ලාභ ලබන තැනට මේ ආයතන ගෙනැල්ලා තිබෙනවා.

බහුදින ක්ෂේත්‍රය ගත්තොත්, වරාය හදලා දෙන්න අපි සූදානම්. පුත්තලම ගත්තොත්, වෙල්ලමංකර වරායේ තව ජැටි තුනක් හදන්න අපි ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඔබතුමන්ලා දන්නේ නැද්ද? වෙල්ලමංකරට යන්න. වරායේ තව ජැටි තුනක් හදන්න දාලා තිබෙනවා.

හලාවත මෝයේ ධීවරයන්ට ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, හලාවත මෝයේ ධීවරයාට සහන වැඩ පිළිවෙළක් හදන්න, අලුතින් feasibility study එකක් කරලා, බෝට්ටු ටික දියත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි ධීවර වරාය නීතිගත සංස්ථාව එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. ලබන මාසයේ අපි ඒ වරාය සම්බන්ධයෙන් සාකච්ඡාව පටන් ගන්නවා. කල්පිටිය බලන්න. ලබන අවුරුද්දේ කල්පිටිය වරාය හදන්න අපි ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ නිසා ධීවරයා ගැන කථා කළාට මුහුදට බැහැලා බලන්න, ඒ වරායට ගිහිල්ලා බලන්න. මෙතැන කථා කරන්න පුළුවන්, හැඟීමෙන් කථා කරන්න පුළුවන්, ධීවරයා ගැන අඬන්න පුළුවන්. හැබැයි, ධීවර කර්මාන්තය බිඳ වට්ටපු ඔබතුමන්ලා මේවාට වග කියන්නේ නැති බව අපි දන්නවා. අපි ඒ අය වෙනුවෙන් වග කියනවා. ඔබතුමන්ලා බිඳ වට්ටපු ධීවර කර්මාන්තය අපි ගොඩනඟනවා. ඒකට අපේ ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශයේ ලේකම්තුමා, DG, ඒ වාගේම මේ ආයතනවල සභාපතිවරු වගකීමෙන් වැඩ කරනවා, අපි මේක ගොඩ ගන්නේ කොහොමද කියලා.

ඒ වාගේම ඔබ දන්නවා, අපිට ගොඩක් ආයතන තිබෙන බව. දැන් මාදැල් ගැන කථා කළා. මම ගොඩක් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ, ඊට අදාළ සාකච්ඡා තිබෙනවා. අපි දැක්කා, පසුගිය කාලයේ light-coarse fishingවලට අවසර දෙන්න කියලා උද්ඝෝෂණය කළ ආකාරය. ඔබතුමන්ලා කියයි මේවාට අවසර දෙන්න කියලා. හැබැයි බෝට්ටුවේ තමයි කුඩු ගේන්නේ, අයිස් ගේන්නේ. ඒකත් ධීවරයා කරන්නේ. එහෙම අවසර දෙන්න බැහැ. මේ අවිධිමත් කරපු කර්මාන්තය විධිමත් කරලා, නියාමනය කරන වැඩ පිළිවෙළක් අපි ගේනවා. අපි ඒ මාදැල් හිමියෝ එක්ක සාකච්ඡාවට සූදානම්. හැබැයි, මේ කර්මාන්තයෙන් මුහුදට, සුළුපන්න ධීවරයාට, ඒ වාගේම පරිසරයට වෙන හානි තිබෙනවා. ඒවා සම්බන්ධව සාකච්ඡා කරන්න ඕනෑ. සාකච්ඡා කරලා සුදුසු පියවරක් ගන්න අපි සූදානම්. එහෙම නැතුව ඔබතුමන්ලා උද්ඝෝෂණය කළා කියලා, උද්ඝෝෂණය කෙරෙව්වා කියලා, නීතිය අනුව වැඩ කරනවා මිසක්, නීතියට විරුද්ධව වැඩ කරන්න අපි සූදානම් නැහැ. ඒක නිසා අපි කියනවා, ඔබතුමන්ලා ගේන්න ඕනෑ සාධනීය යෝජනා බව. ධීවරයා මොනවා හරි කියනවා කියලා, නීති විරෝධී පන්න ක්‍රම භාවිත කරන්න අවසර දෙන්න කියන එක සාධාරණ නැහැ. අපේ රටේ බෝට්ටු 60,000ක් විතර තිබෙනවා, සුළුපන්න ධීවරයින්ගේ ඒවා 37,000ක් තිබෙනවා. අනෙකුත් ඒවාත් එක්ක බෝට්ටු 60,000ක් තිබෙනවා. මේ ඔක්කොම මුහුදට ගිහිල්ලා තමයි ජීවත් වෙන්න ඕනෑ. එක්කෙනෙක් දෙන්නෙක් විතරක් මේක අත්පත් කරගෙන, මේක විනාශ කළොත් අනෙක් මිනිස්සුන්ට මොකක්ද වෙන්නේ? ලයිලා-සුරුක්කු තහනම් දැල් ගොඩක් තිබෙනවා, light-coarse තිබෙනවා. මේවා නියාමනය කරන වැඩසටහනක් ඕනෑ. ඒ නිසා අපි අලුතින් ධීවර පනතක් ගේන්න සූදානම් කළා. ඔබතුමන්ලා ඇදගෙන, ඇදගෙන ආපු සංශෝධන 7ක් සහිතව තිබුණු පනත වෙනුවට, අපි ඉදිරියේදී අලුත් පනතක් ගේනවා. ඒ ගෙනැල්ලා මේ ධීවර කර්මාන්තය විධිමත් කරනවා, නියාමනය කරනවා.

ඒ වාගේම තමයි, මිරිදිය ක්ෂේත්‍රයට, ඉස්සන් කර්මාන්තයට විශේෂ වැඩ පිළිවෙළක් අපි සැලසුම් කරලා තිබෙනවා. ඉස්සන් කර්මාන්තයට අදාළව exportersලා එකතු කරලා, farmersලා එකතු කරලා, hatcheries කරන අය එකතු කරලා, අපනයන ක්ෂේත්‍රය ශක්තිමත් කරලා, අපේ රටේ ඉස්සන් කර්මාන්තය දියුණු කරන්න හොඳ වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒ වාගේම, කරවල කර්මාන්තකරුවා, විසිතුරු මසුන් කර්මාන්තයේ යෙදෙන අය සම්බන්ධයෙනුත් එහෙමයි. ඒ වාගේම සැමන් ගත්තොත්, දැන් අපේ රටේ අපනයනය කරන තැනට ඇවිල්ලා තිබෙනවා. මෙතෙක් කල් ඔබතුමන්ලා ආනයනය කළා. අපි දැන් අපනයනය කරන තැනට සැමන් කර්මාන්තය ගෙනැල්ලා තිබෙනවා. අපි අපනයන ක්ෂේත්‍රය වැඩි කරලා තිබෙනවා.

මම දැක්කා, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා හෙන කෙබරයක් ඇද බාලා ගියා, අපි ආනයනය කරනවා කියලා. නාමල් රාජපක්ෂ, සාටක මන්ත්‍රීතුමා ආනයනය කරන හාල්මැස්සෝ කාලා තිබෙනවාද දන්නේ නැහැ. හාල්මැස්සෝ අපි නිෂ්පාදනය කරනවා වාගේම ගේනවා. ප්‍රතිඅපනයනය සඳහා අපි කරවල ගේනවා. හැබැයි, අද නිෂ්පාදනය වැඩි කරලා තිබෙන ප්‍රමාණය බලන්න. මේ අවුරුද්දට අපේ අපනයන ක්ෂේත්‍රය කොච්චර වැඩි වෙලාද? ඒවා ගැන කථා කළේ නැහැ, කවුරු හරි දීපු එකක් අරගෙන ඇවිල්ලා මෙතැන කෙබර ඇද බාලා ගියා. මේ ධීවර කර්මාන්තය ඔය හැඩයෙන් වෙනස් කරන්න බැහැ. අපිට ඒ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් තිබෙනවා, අවබෝධයක් තිබෙනවා. දැක්මක් තිබෙනවා. මේ බංකොලොත් කරපු රට අපි නැඟිට්ටවනවා, මේ පුනරුද යුගය තුළින් නැඟිට්ටවද්දී ධීවර කර්මාන්තයත් ඉතා වේගයෙන් නැඟිට්ටවනවා කියලා මම කියන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.10]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මම බැලුවා මොකක්ද මේ "update, update" කියන්නේ කියලා. අර බිංගිරියේ ගිහිල්ලා ගුටි නොකා ආපු එකද දන්නේ නැහැ update එක. කෙසේ වෙතත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ධීවර කර්මාන්තයේ තිබෙන වටිනාකම මොකක්ද? එක පැත්තකින්, අපේ රටේ අහිංසක මිනිස්සුන්ට පෝෂණය ලබා දෙනවා. අනෙක් පැත්තෙන්, ධීවර කර්මාන්තයෙන් ජීවත් වන දැවැන්ත පිරිසක් ඉන්නවා, ධීවර ජනතාවක් ඉන්නවා; ඒගොල්ලන්ගේ පවුල් පෝෂණය වෙනවා. ඒ අයගේ ආර්ථිකය බවට පත් වෙලා තිබෙන්නේ ධීවර කර්මාන්තයෙන් උපයන දේ.

හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ රටේ මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් බංකොලොත් රටක් ගැන කිව්වා. පිටරටට අපනයනය කරනවා කිව්වා. හත් දෙයියනේ! ලුණු ටිකත් මේ රටට ගෙනාපු කණ්ඩායම. මේ රටට පිටින් ලුණුත් ගෙන්නපු අය තමයි දැන් මේ ධීවර කර්මාන්තය ගැන කථා කරන්නේ. අවුරුදු 15ක් වෙනතුරු ලංකාවට පිටරටින් ලුණු ගෙනාවේ නැහැ.

අන්තිමට ලුණුත් පිටරටින් ගෙනාවා, බංකොලොත් බංකොලොත් කියලා කියන මේ රටේ ආර්ථිකය ගොඩ ගන්න කථා කරපු අය. අවුරුදු 75ක ශාපය ගැන කථා කළාට වැඩිම ශාපය මේ අවුරුද්දේයි. විශේෂයෙන් ධීවර ජනතාවගෙන් ගිහිල්ලා ඒ ගැන අහන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මම අභියෝග කරනවා, පාර්ලිමේන්තුවේ ඕනෑම මන්ත්‍රීවරයෙකුට, මා එක්ක ඕනෑම ධීවර වරායකට යමු, ගිහින් ධීවර ජනතාව හමු වෙමු

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

කියලා. මම ඒ අභියෝගය කරනවා මෙහි සිටින ඕනෑම කෙනෙකුට. එන්න අපිත් එක්ක යන්න, ධීවර ජනතාව මොකක්ද කියන්නේ කියලා අහන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව මේ රටේ අහිංසක ධීවරයන්ට වෙච්ච පොරොන්දු එකක්වත් ඉෂ්ට කරලා නැහැ. මීගමුවට ඇවිල්ලා මේගොල්ලන් ජනතාවට පොරොන්දු දෙමින් මොකක්ද කිව්වේ? මෙතුමන්ලා කිව්වා, එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුරේ වන්දි ටික හැම ධීවරයෙකුටම දෙනවා කියලා. මේ ආණ්ඩුව බලයට ආවාට පසුව මොන ධීවරයාටද, එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර සම්බන්ධයෙන් වන්දි ලබා දුන්නේ? මතක තියාගන්න, සත පහක්වත් දීලා නැහැ. ශත පහක් හරි වන්දි දීලා තිබෙන්නේ මීගමුව ආසනයේ මොන ධීවරයාටද කියලා ඕනෑම මන්ත්‍රීවරයෙක් නැඟිටලා කියන්න. මම මගේ වෙලාව එතුමාට දෙනවා. එහෙම දීලා නැහැ. පුත්තලම දිස්ත්‍රික්කය ගත්තොත්, වෙන්නප්පුව, මාරවිල කිසිම ධීවරයෙකුට එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ අනතුරට අදාළ වන්දි දීලා නැහැ. *[බාධා කිරීමක්]* අනේ මේ! ඔබතුමා අර ගුටි කාලා ආපු එක්කෙනා නේ බිංගිරියේ ගිහිල්ලා. කට වහගෙන ඉන්නකෝ. මේ රටේ අහිංසක ධීවරයාගේ ඡන්දය අරගෙන, අහිංසක ධීවරයා කබලෙන් ලිපට ඇද දමලා, අහිංසක ධීවරයාට යුක්තිය සාධාරණත්වය ඉෂ්ට කරපු නැති අය තමයි, මේ. එදා ෆෙස්ටස් පෙරේරා මැතිතුමන්ලා රුපියල් 1,275ක විශ්‍රාම වැටුපක් ධීවරයාට දුන්නා. ෆෙස්ටස් පෙරේරා මැතිතුමන්ලා කළ ඒ සේවයෙන් දශමයක්වත් කරලා තිබෙනවාද, මේ ආණ්ඩුව? දැන් අවුරුද්දක් වෙනවා. සමහර අයගෙන් ඇහුවොත් කියන්නේ, "අවුරුද්දෙන් අපට මේවා කරන්න බැහැ, අපි වෙච්ච පොරොන්දු අවුරුද්දෙන් ඉෂ්ට කරන්න බැහැ" කියලායි. ගරු අග්‍රාමාත්‍යතුමිය කියන්නේ, "අපි අවුරුද්දෙන් අධ්‍යාපනයට සියයට 6ක් දෙනවා කියලා පොරොන්දු වුණේ නැහැ" කියලායි. හැබැයි මෙතුමන්ලා කියන්නේ මොකක්ද? "අවුරුද්දෙන් අපි ඔක්කෝම කළා" කියලායි. කළා නම් තිබෙන්න එපායැ, කරපු දෙයක්. කරපු එකක්වත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අවුරුදු පහම ගියත් ඔච්චරයි. ඕක තමයි ඇත්ත.

එදා අපේ රටේ ධීවරයාට සේවාවක් කළේ කවුද? රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ සමයේ ෆෙස්ටස් පෙරේරා මැතිතුමන්ලා ධීවර ගම්මාන හදලා, ඒ ධීවර ගම්මානවල ධීවර ජනතාවගේ දරුවන්ට යන්න හොඳ පාසල් ටිකක් හදලා, ධීවර කාන්තාවන්ට ස්වයං රැකියා කරන්න අවකාශය, අවස්ථාව ලබා දීලා, ධීවරයා විශ්‍රාම ගන්න කොට විශ්‍රාම වැටුපක් හදලා මේ රටේ ධීවරයාට ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කළා; බෝට්ටු සහනාධාර දුන්නා; ඉන්ධන සහනාධාර දුන්නා; දැල් ආම්පන්න දුන්නා. දැන් මොකක්ද කරලා තිබෙන්නේ? මොනවත් දීලා නැහැ. ඒ නිසා බයිලා ගහන්න එපා, හරිද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීගමුව ආසනය ගන්න. එහි ධීවරයන්ගේ බහුදින යාත්‍රා තිබෙනවා; එහෙම නැත්නම් මහ බෝට්ටු 1,800ක් විතර තිබෙනවා. ඒවායෙන් 800ක් වාගේ ප්‍රමාණයක් තමයි ධීවර කර්මාන්තයේ නියැළෙන්නේ. ඇයි ඒ? තෙල් මිල වැඩියි. තෙල් මිල වැඩි නිසා ඒ අයට ඒක දරා ගන්න බැහැ. රුපියල් මිලියන 4ක විතර තෙල් ගහන්න ඕනෑ. එහෙම කරලා තමයි ඒ අයට ධීවර කර්මාන්තයේ නියැළෙන්න වෙන්නේ. බෝට්ටුවක් දියඹට ගියා කියලා හැම මොහොතේම මාළු ලැබෙන්නේ නැහැ. මාළු නැතුව ආවොත්, ලක්ෂ ගණනාවක පාඩුවක් ඒ ධීවර බෝට්ටුවේ අයිතිකාරයාට විඳින්න සිදු වෙනවා. ඒ නිසා අද බහුතරයක් ධීවර ජනතාව වෙනත් කර්මාන්ත තමයි කරන්නේ. ඒක තමයි ඇත්ත. කුලී රස්සා කරනවා, අපේ ධීවරයෝ. ඒක තමයි ඇත්ත. ධීවරයාගේ පැත්ත අරගෙන කථා කරන්න ඕනෑ ආණ්ඩුවක් වුණත් ධීවරයාගේ වේදනාව නොදන්නා වර්තමාන ආණ්ඩුව අද කියනවා, "අපි ඔක්කෝම කළා" කියලා. මොළයක් තිබෙනවා නම් තේරුම් ගන්න, අවම වශයෙන් ධීවර ජනතාවට කරන්න ඕනෑ දේවල්වත් කරලා නැහැ කියන එක.

යන්න, තෙප්පම් කර්මාන්තය කරන ධීවරයන් බලන්න. කළපු රස්සාව කරන ධීවරයන් දිහා බලන්න. මහ බෝට්ටු වාගේම කුඩා බෝට්ටුවල තත්ත්වය ගැනත් බලන්න. අද කුඩා බෝට්ටු ටික බැඳලා දාලායි තිබෙන්නේ. අපි විශේෂයෙන්ම මාදැල් කර්මාන්තය ගැන කථා කරන්නේ ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිනිසුන්ම තමයි එදා මාදැල් කර්මාන්තයේ දැල් ටික ඇද්දේ. ඊට පස්සේ වින්ච් එක හඳුන්වා දුන්නා. මේ ආණ්ඩුව වින්ච් එක අහෝසි කරනවා නම්, ඒ මිනිසුන්ට විකල්ප ක්‍රමවේදයක් හඳුන්වා දෙන්න. මේ සමස්ත ව්‍යාපාරයම කඩා වට්ටන්න එපා. ඔබතුමන්ලාට මාදැල් කර්මන්තය ප්‍රශ්නයක්ද? හැබැයි, තහනම් ආම්පන්නවලින් දියඹේ කොච්චරක් නම් මාළු අල්ලනවාද? ඒවා එකක්වත් තහනම් කරලා තිබෙනවාද? කී දෙනෙක් නම් එහෙම මාළු අල්ලනවාද? ඒ අයගෙන් කී දෙනෙක් උසාවි ගෙනැල්ලා තිබෙනවාද? පුළුවන් නම් ඒවා ගැන පාර්ලිමේන්තුවේ කියන්න. එහෙම ඒවා කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව බලයට ආවාට පසුව ධීවර ගම්මානයකට ඇවිල්ලා තිබෙනවාද? එන්න මීගමුවට; එන්න මුන්නක්කරේට; එන්න දූවට; එන්න කැපුම්ගොඩට; එන්න මේ හෙක්ටර් අප්පුහාමි මැතිතුමාගේ දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව ආසනයට.

ඇවිල්ලා බලන්න ඒ ප්‍රදේශවල පාසලකට, අඩුම වශයෙන් දරුවෙකුට පොත් ටිකක්වත් දීලා තිබෙනවාද කියලා. මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා අවුරුද්දක් වෙනවා. ධීවර ජනතාවගේ පවුල් නඟාසිටුවීම සඳහා ධීවර අම්මාට ව්‍යාපාරයක් කරන්න, ස්වයං රැකියාවක් කරන්න මහන මැෂිමක්වත් දීලා තිබෙනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර ජනතාව අද කම්කරු රැකියාවේයි නියැළෙන්නේ. ඒගොල්ලෝ මහ පාරේ යමින් රස්සා හොයනවා. ඒ ඇයි? දියඹේ රස්සා කරන්න බැරි නිසයි. එක පැත්තකින් එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර නිසා දැවැන්ත පාරිසරික විනාශයක් සිදු වුණා. අනෙක් පැත්තෙන්, දැවැන්ත මුදල් නාස්තියක් සිදු වෙනවා. අද බෝට්ටු මිල වැඩියි, දැල් ආම්පන්න මිල වැඩියි, තෙල් මිල වැඩියි, 2T මිල වැඩියි. අද ධීවර කර්මාන්තයේ නියැළෙන්න බැහැ. මෙතුමන්ලා ආවේ සැටලයිට් තාක්ෂණයෙන් මාළු අල්ලන්නයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙතුමන්ලා කියපු විධියට සැටලයිට් තාක්ෂණයෙන් මාළු ඇල්ලුවා නම් අපට මුළු ලෝකයටම මාළු දෙන්න පුළුවන්. අන්තිමේදී, ආපු සැටලයිට් එකක් නැහැ. චීචීගේ සැටලයිට් එකත් මේගොල්ලන්ගේ ඔඩොක්කුවට; පැලවත්ත කාර්යාලය උඩට කඩා වැටුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකයි වුණේ. මේ ආණ්ඩුවේ අය comedy පෙන්වමින්, jokes දමමින් ඉන්නවා. හැබැයි මේ රටේ අහිංසක ධීවරයා අද බඩගින්නේ. ඒකයි අපට තිබෙන වේදනාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර ජනතාව අද බඩගින්නේ ඉන්නේ. ඒ පවුල්වල දරුවන්ට කන්න දෙන්න බැරුව ධීවර තාත්තලා අද හදවතේ කොයි තරම් නම් වේදනාවකින් ඉන්නවාද කියලා බලන්න ධීවර ගම්මානවලට එන්න කියලා අපි ආයාචනා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ වනකොට කාලගුණය ඉතාම භයානක මට්ටමකට පැමිණෙමින් තිබෙනවා. ධීවර ජනතාවට මුහුදු යන්න එපා කියන අනතුරු ඇඟවීම් මේ වාගේ තත්ත්වයන්හිදී සිදු කරනවා. හැබැයි එහෙම වුණාම, අපේ රටේ ධීවර ජනතාව වෙනුවෙන් යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ, ඒ අයට තමන්ගේ දරුවන්ට එදිනෙදා කන්න දෙන්න ආර්ථිකය හදාගන්න හැකි වන පරිදි. මොකද, ඒගොල්ලන් ධීවරයන් හැටියට දියඹට ගියේ නැත්නම් ආදායමක් ලැබෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒගොල්ලන්ට ආදායමක් නොලැබුණොත්; විශේෂයෙන්ම කාලගුණ තත්ත්වයන්, වෙනත් පාරිසරික තත්ත්වයන් නිසා බෝට්ටු ගොඩබිම නතර කරලා තිබුණොත්, ඒගොල්ලන්ට තම දරුවන් ඇතුළු පවුලේ සාමාජිකයන්ට කන්න දෙන්න විධියක්

නැහැ. ඒ නිසා ආණ්ඩුව විසින් නිර්මාණය කරන්න ඕනෑ, ඒ මිනිසුන්ගේ පවුල් බලා ගැනීම සඳහා වන වැඩ පිළිවෙළක්. එහෙම යෝජනාවක් අපි ඉදිරිපත් කරනවා. ඒ විතරක් නොවෙයි, විශේෂයෙන්ම ධීවර ගම්මානවල ඉන්න දරුවන්ගේ අධ්‍යාපනය නඟා සිටුවන්න ඕනෑ. මේ වනකොට අපේ මුහුදුබඩ තීරයේ පාසල් පද්ධතිය සම්පූර්ණයෙන් ා හ

කඩාගෙන වැටිලායි තිබෙන්නේ. ඒවායේ අවශ්‍ය පහසුකම් නැහැ, ගුරුවරු නැහැ, කොම්පියුටර් නැහැ. අපේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට පින් සිද්ධ වෙන්න අපි මුන්නක්කරේ පාසලට කොම්පියුටර් ටික දුන්නා; කැපුම්ගොඩ පාසලට කොම්පියුටර් ටික දුන්නා. හැබැයි අනෙක් පාසල් ටිකටත් කොම්පියුටර් තාක්ෂණය ලබා දීලා, ගුරුවරුන් ලබා දීලා ඒ දරුවන්ටත් හොඳ අධ්‍යාපනයක් ලබා දීම සඳහා ආණ්ඩුව කටයුතු කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, අපි විශේෂයෙන්ම තවත් ඉල්ලීමක් කරනවා. Vessel Monitoring System - VMS - එක, transponder එක ඉස්සර ලොකු බෝට්ටුවලටයි -අඩි 58, අඩි 45 බෝට්ටුවලටයි- සවි කළේ. ඒවා දැන් පොඩි බෝට්ටුවලටත් සවි කරන්න යනවා කියලා කථාවක් පැතිරිලා ධීවර ජනතාව දැඩි බියට පත් වෙලා ඉන්නවා. ධීවර ජනතාවට ඇහුම්කන් දීලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියන ඉල්ලීම අපි කරනවා.

මීගමුව කළපුව කියන්නේ, අපට ඉතාම වැදගත් තැනක්. එය එක පැත්තකින් සංචාරක ක්ෂේත්‍රයට වැදගත්; අනෙක් පැත්තෙන්, ධීවර ක්ෂේත්‍රයට වැදගත්. ඒ නිසා ඒ කළපු සංවර්ධන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.20]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, headphone එක දාගත්තා නම් හොඳයි.

எங்களுடைய வடக்கு, கிழக்கு வாழ் மக்களுடைய வாழ்வாதாரம் மிகக் கூடுதலாகத் தங்கியிருப்பது, மீன்பிடி, விவசாயம், கால்நடைவளர்ப்பு ஆகிய மூன்று துறைகளில்தான். அந்த வகையில், இன்று நடைபெறுகின்ற கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள் அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு வாய்ப்புக் கிடைத்தமையிட்டு நான் உண்மையிலேயே மகிழ்ச்சி அடைகின்றேன்.

2025ஆம் ஆண்டின் ஆரம்பக் காலப்பகுதியில் தேசிய மக்கள் சக்தி அரசாங்கத்திடம் களுவன்கேணி, புன்னக்குடா பிதேசங்களை இணைக்கும் வகையில் பாலமொன்றை அமைத்துத்தருமாறு நான் கோரிக்கை ஒன்றை முன்வைத்தேன். ஏனெனில், அங்குள்ள மீனவர்கள் மாரி காலத்தில் மிகவும் கஷ்டப்படுகின்றார்கள். கிழக்கு மாகாண ஆளுநர் அவர்கள் அந்தப் பாலத்துக்குரிய நிதி ஒதுக்கீட்டைச் செய்து, அதை அமைத்துத் தருவதற்கான நடவடிக்கைகளை எடுத்து வருகின்றார். அரசாங்கம் செய்கின்ற நல்ல விஷயங்களை நாங்கள் பாராட்ட வேண்டும். அந்த வகையில், இந்த விடயத்துக்காக அரசாங்கத்துக்கு நன்றி சொல்ல விரும்புகின்றேன்.

கௌரவ பிரதி அமைச்சர் அவர்களிடம் உரைபெயர்ப்பைக் கேட்கக்கூடிய headphoneஐ காதில் அணிந்துகொள்ளச் சொன்னதற்குக் காரணம் இருக்கிறது. எங்களுடைய மாவட்டத்தில் மீன்பிடித்துறை சம்பந்தமாக நடைபெற்ற அபிவிருத்திக் குழுக் கூட்டத்துக்கு கௌரவ அமைச்சர் அவர்கள் வருகை தரவில்லை. அன்றையதினம் அவருக்கு வேறு சில முக்கிய அலுவல்கள் இருந்ததனால் அவரால் வருதைதர முடியவில்லை. பிரதி அமைச்சர் அவர்கள்தான் வருகைதந்து இருந்தார். அப்பொழுது, நாங்கள் அவரிடம் பல கோரிக்கைகளை முன்வைத்து இருந்தோம். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, துரதிருஷ்டவசமாக நீங்கள் கலந்துகொண்ட அந்தக் கூட்டத்தில் எடுக்கப்பட்ட எந்தவொரு தீர்மானமும் நடைமுறைக்கு வரவில்லை. இதற்குக் காரணம், உங்களுடைய அலட்சியப்போக்கா அல்லது நடைமுறைச் சிக்கலா என்று எங்களுக்குத் தெரியவில்லை. எனினும், இதற்கு நடைமுறைச் சிக்கல் காரணமாக இருக்க முடியாது. ஏனெனில், நாங்கள் கேட்டது, ஆறு முக்கிய இடங்களுக்கு beacon lightsதான். Beacon lights என்றால் என்ன என்பது கௌரவ பிரதி அமைச்சருக்குத் தெரியும்! *[இடையீடு]* දුන්නේ නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමා; දුන්නේ නැහැ.

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
මුදල් වෙන් කළා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, நீங்கள் நிதி ஒதுக்கியதாகச் சொல்கிறீர்கள். ஆனால், ஆறு மாதங்கள் கடந்தும் அந்த நிதி வரவும் இல்லை; beacon lights வரவும் இல்லை. நாங்கள் கேட்டது மீன்பிடித் துறைமுகம் அல்ல. நாங்கள் மீன்பிடித் துறைமுகமும் கேட்டிருந்தோம். அது வேறு! காயன்கேணி, பாலடித்தோனா, களுவன்கேணி, புன்னக்குடா, தளவாய் போன்ற இடங்களுக்கு beacon lightsஐக் கேட்டிருந்தபோதும், நீங்கள் அனுப்பியிருப்பது சிறிய solar lights. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, three-wheelerஐ நிறுத்துவதற்காக solar lightஐப் பொருத்தித் தருமாறு நாங்கள் கேட்கவில்லை. ஆழ்கடலில் இருந்து வரும் சிறிய படகுகளுக்கு -

**ගරු රත්න ගමගේ මහතා**
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
මුදල් වෙන් කළා. ඒක කරනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
நன்றி! அதைச் செய்து தருவதாக கௌரவ பிரதி அமைச்சர் அவர்கள் இந்தச் சபையில் வாக்குறுதி அளித்திருக்கிறார். நம்பிக்கைதான் வாழ்க்கை! அந்த அடிப்படையில், நீங்கள் இந்த விடயத்தைச் செய்து தருவீர்களென நாங்கள் நம்புகின்றோம்.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, மீன்பிடித் துறையில் கடல் வளங்களை நம்பி வாழுகின்ற மக்களும் இருக்கிறார்கள்; நன்னீர் மீன்பிடியை நம்பி வாழுகின்ற மக்களும் இருக்கிறார்கள். கடந்த காலத்தில் இருந்த அரசாங்கம் மீன்குஞ்சொன்றை ரூபாய் 4.50 வீதம் - Rs. 4.50 - வழங்கியது. இப்பொழுது இந்த அரசாங்கம் அதை 6.00 ரூபாயாக அதிகரித்திருக்கிறது. அரசாங்கம் ரூபாய் 6.50ஐ மானியமாக வழங்குவதாக ஒரு தீர்மானத்தை எடுத்திருக்கிறது. நான் சொல்வது சரிதானே! அதாவது, அரசாங்கம் ரூபாய் 6.50ஐ மானியமாக வழங்கும். மீன்குஞ்சின் விலையை ரூபாய் 4.50 இலிருந்து 6.00ஆக அதிகரித்தால், ஒரு மீன்குஞ்சுக்கு ரூபாய் 12.50 தேவை.

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, மட்டக்களப்பு மாவட்டத்தில் small tanks, medium tanks, large tanks என 50க்கும் அதிகமான குளங்கள் இருக்கின்றன. அங்கு இந்தக் குளங்களை நம்பி வாழுகின்ற குடும்பங்களின் எண்ணிக்கை 2,500 அளவில் இருக்கும். நீங்கள் முன்வைத்திருக்கின்ற இந்தத் திட்டத்தின் அடிப்படையில், மீன்குஞ்சுகளை விடுவதற்கென மட்டக்களப்பு மாவட்டத்துக்கு இந்த வருடம் 84 இலட்சம் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளதாக உங்களுடைய அறிக்கையில் குறிப்பிட்டு இருக்கிறீர்கள். எங்களுடைய பிரதேச அபிவிருத்திக் குழுவின் தலைவர் கந்தசாமி பிரபு அவர்களும் இந்த விடயம் சம்பந்தமாக ஒருசில விடயங்களைக் கடந்த கூட்டத்தின்போது, General Secretary of the National Fisheries Federation, Nelson Edirisinghe அவர்களிடம் கேட்டறிந்திருந்தார். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, இந்த மீன்குஞ்சுகளை வழங்குகின்ற விடயத்தில் உங்களுடைய அரசாங்கம் முன்வைத்திருக்கின்ற திட்டம் எவ்வாறென்றால், மீனவர் சங்கம் 40 இலட்சம் ரூபாய்க்கு மீன்குஞ்சுகளை வாங்கினால், அரசாங்கம் 44 இலட்சம் ரூபாய் மானியத்தை வழங்கும். இதில் இருக்கின்ற பிரச்சினை என்னவென்றால், மீனவர் சங்கங்களிடம் அந்தளவுக்கு நிதியில்லை என்பதுதான். இந்த நிலையில், மீனவர் சங்கங்களிடம் மொத்தமாக இருக்கின்ற நிதியின் அளவு 12 இலட்சம் ரூபாய்! அரசாங்கம் ரூபாய் 6.50 வீதம் தருகின்ற மானியத்தை வைத்து, 25 இலட்சம் ரூபாய் பெறுமதியான வேலைத்திட்டத்தைத்தான் செய்யலாம். சங்கங்களுடன் பேசி, அவர்கள் இன்னும் 3 இலட்சம் அல்லது 5 இலட்சம் ரூபாயை மேலதிகமாக இட்டாலும், 84 இலட்சம் ரூபாய் என்ற targetக்கு உங்களால் போக முடியாது.

கடந்த காலத்தில் இருந்த அரசாங்கம் ரூபாய் 4.50 வீதம் மீன்குஞ்சுகளை வழங்கிய அதேநேரம், 30,000-50,000 மீன்குஞ்சுகளை வாங்கும்போது, மானியமாக 15,000-20,000 மீன்குஞ்சுகளையும் மாவட்டத்துக்கு வழங்கியது. அதை இலவசமாக அங்குள்ள குளங்களில் விடுவார்கள். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, இந்த அரசாங்கத்தின்கீழ் கடற்றொழிலை நம்பி வாழுகின்றவர்களுக்கும் பிரச்சினைகள் இருக்கின்றன; நன்னீர் மீன்பிடியை நம்பி வாழுகின்ற மக்களுக்கும் பிரச்சினைகள் இருக்கின்றன. எனவே, நீங்கள் இந்த விடயம் தொடர்பில் கரிசனை எடுத்து, கடந்த காலத்தில் செய்ததைப்போல ரூபாய் 4.50 வீதம் மீன்குஞ்சுகளை வழங்கினால் okay. அப்படி இல்லாவிட்டால், மானிய அடிப்படையில் 20,000 அல்லது 30,000 மீன்குஞ்சுகளைக் கொடுத்தாலும் Okay. அதைவிடுத்து, "வளமான நாடு-அழகான வாழ்க்கை" என்றெல்லாம் எங்களுடைய பிரதேசத்துக்கு வந்து புருடாவிட வேண்டாம். வாழைச்சேனை பிரதேசத்தில் தனியார் ஒருவர் வேலி அடைத்ததனால் அங்கு மீனவர்களுடைய boatsஐ நிறுத்த முடியாத சூழல் ஏற்பட்டிருப்பது பற்றி நீங்கள் அங்கு வந்தபொழுது உங்களிடம் சொன்னோம். நீங்கள் இந்த விடயத்தை கரையோரப் பாதுகாப்புப் பிரிவுக்கும் இன்னும் சில இடங்களுக்கும் தெரிவிப்பதாகக் கூறினீர்கள்.

கௌரவ கந்தசாமி பிரபு அவர்கள் தற்பொழுது சபையில் இருக்கிறார். அவரும் இந்தப் பிரச்சினை சம்பந்தமாக கௌரவ பிரதி அமைச்சரிடம் சொல்லாம். முன்னாள் இராஜாங்க அமைச்சரான பிள்ளையானின் தம்பிதான் அங்கு வேலி அடைத்து வைத்திருக்கிறார். NPP அரசாங்கம் பிள்ளையானின் ஆதரவுடன் மட்டக்களப்பு மாவட்டத்தில் சில பிரதேச சபைகளைக் கைப்பற்றுவதற்கு இணக்கப்பாட்டை எட்டிய படியால், சில விடயங்களில் அவரைக் காப்பாற்றுகின்றதோ தெரியாது. நான் இதைக் கடந்த காலத்திலும் சொன்னேன். அவ்வாறு இருக்காதென நான் நம்புகின்றேன். எனவே, கௌரவ பிரதி அமைச்சர் அவர்கள் இந்த விடயத்தைக் கவனத்திலெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இறுதியாக ஒரு விடயத்தைச் சொல்லி முடிக்கிறேன். I am winding up. மீன்பிடித் தொழிலை நம்பியிருக்கின்ற எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தைச் சேர்ந்த ஆறுமுகம் லிங்கராசா என்ற 40ஆம் வட்டை மீனவர் அமைப்பின் தலைவரை தொல்பொருள் சின்னங்களுக்குப் பாதிப்பை ஏற்படுத்தியதாக அபாண்டமான குற்றச்சாட்டின்பேரில் நேற்றைய தினம் கைது செய்து இருக்கிறார்கள். தற்போது நாங்கள் அவரைப் பிணையில் எடுத்திருக்கிறோம். தயவுசெய்து, மீனவர்களுடைய வாழ்க்கையை அழிக்காதீர்கள்!

ගරු ඇමතිතුමාගේ අවධානයට මම මේ කාරණය යොමු කරනවා. වෙනත් ඇමතිවරුත් ඉන්නවා නම්, අහගන්න. Department of Fisheries and Aquatic Resourcesහි මඩකලපුවේ District Office එකෙන් පෙට්‍රල් ෂෙඩ් 3ක් හැදුවා, කළුවන්කර්නි, පාලමින්මඩු සහ ඕන්තාච්චිමඩම්වල. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් සිටි රැස්වීමකදී සාකච්ඡා වුණා, ඕන්තාච්චිමඩම්වල තිබෙන පෙට්‍රල් ෂෙඩ් එක -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම අවසන් කරනවා.

ගරු ඇමතිතුමාගේ අවධානයට මම මේ කාරණය යොමු කරන්නේ. ගරු ඇමතිතුමා මට ඉඩ ලබා දෙයි, ඒක කියන්න. ඕන්තාච්චිමඩම් පෙට්‍රල් ෂෙඩ් එක ප්‍රාදේශීය සභාවට දෙන්න කියලා අපි ඉල්ලුවා. මොකද, ඒ පෙට්‍රල් ෂෙඩ් එක වහලා තිබෙන්නේ. මැයි මාසයේ 12වැනි දා ඉඳලා කිසිම permission එකක් නැතුව පුද්ගලයෙක් කළුවන්කර්නි පෙට්‍රල් ෂෙඩ් එකේ kerosene oil ව්‍යාපාරය කරගෙන යනවා. ඒ සංගමයට සල්ලි දෙන්නේත් නැහැ. මොහු ඩග්ලස් දේවානන්දා හිටපු ඇමතිතුමාගේ පක්ෂයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ සංවිධායක. පසුගිය ආණ්ඩු කාලයේ චෝදනා කළේත්, මොහු බලය භාවිත කරලා දේශපාලනඥයන්ට පගා දෙනවා කියලායි. පාලමින්මඩු සහ කළුවන්කර්නි පෙට්‍රල් ෂෙඩ්වල agreement එක මැයි 12වැනි දායින් ඉවරයි. එතකොට ගරු ඇමතිතුමා, agreement එකක් නැතුව මාස 6කට වැඩි කාලයක් -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම අවසන් කරන්නම්. එහෙම agreement එකක් නැතුව මාස 6කට වැඩි කාලයක් ඒවා පවත්වාගෙන යන්නේ කොහොමද කියලා මම ඇමතිතුමාගෙන් අහනවා. මේ NPP රජය යටතේ වංචා හා දූෂණවලට ඉඩ තිබෙනවාද කියන එක තමයි මට අවසාන වශයෙන් අහන්න තිබෙන්නේ.
බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අබූබකර් අතම්බාවා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක් කාලයක් තිබෙනවා.

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
Sir, I rise to a point of Order.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම එතුමාගේ නම සඳහන් කළා. එතුමාට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කන්දසාමි ප්‍රභූ මන්ත්‍රීතුමා.

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
கௌரவ உறுப்பினர் அவர்கள் குறிப்பிட்டதுபோன்று, வாழைச்சேனைப் பிரதேசத்தில் இடம்பெற்ற குறித்த விடயம் தொடர்பில் அந்தப் பிரதேசத்தின் அபிவிருத்திக் குழுக் கூட்டத்தில் தீர்மானங்களை மேற்கொண்டு இருக்கிறோம். வெகுவிரைவில் அதற்குரிய நடவடிக்கைகள் -

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ஒரு வருடம் கடந்து விட்டது.

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
ஒரு வருடமாகவில்லை. நாங்கள் அதனை இனங்கண்டு குறிப்பிட்ட காலம்தான் ஆகின்றது. வெகுவிரைவில் அந்தப் பிரதேசத்தில் அதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்வோம். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අබූබකර් අතම්බාවා මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[பி.ப. 4.29]

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள் அமைச்சு, விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு, டிஜிட்டல் பொருளாதார அமைச்சு ஆகியவற்றின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதையிட்டு பெருமகிழ்ச்சி அடைகின்றேன்.

மீனவர்களுக்கு மிகப் பிரதானமான பிரச்சினையாக இருப்பது காலநிலை மாற்றம்தான். நான் பிரதிநிதித்துவப் படுத்துகின்ற கிழக்கு மாகாணத்தின் அம்பாறை மாவட்டமானது, இப்பொழுது வட-கிழக்கு பருவப்பெயர்ச்சி மழையால் பாதிக்கப்பட்டு இருக்கின்றது. கடந்த ஆண்டும் இவ்வாறான பாதிப்புகள் அந்தப் பிரதேசத்தில் ஏற்பட்டன. இதுபோன்றதொரு நாளில் அம்பாறை மாவட்டத்தின் காரைதீவு - மாவடிப்பள்ளி பிரதேசத்தில், நிந்தவூரிலிருந்து தங்களது வீடுகளுக்குச் சென்றுகொண்டு இருந்த 6 மத்ரஸா மாணவர்களும் அந்தப் பிரதேசத்தைச் சேர்ந்த 3 பேரும் வெள்ளநீரில் அடித்துச் செல்லப்பட்டு உயிரிழந்தார்கள். இந்தச் சந்தர்ப்பத்தில் அவர்களின் மறுமை வாழ்வுக்காகப் பிரார்த்திப்பதோடு, அவர்களுடைய குடும்பத்தினருக்கு எனது அனுதாபத்தையும் தெரிவித்துக் கொள்கின்றேன்.

இலங்கையின் தனித்துவமான பொருளாதார வலயம் கிட்டத்தட்ட 517,000 சதுர கிலோமீற்றரைக் கொண்டது. அதில் உள்நாட்டு நீர் மூலாதாரங்கள் 4,890 சதுர கிலோமீற்றர் ஆகும். இந்த நாட்டின் மொத்த சனத்தொகையில் 12.3 சதவீதத்தினர் இந்த நீர் வளத்தை அடிப்படையாகக்கொண்டு வாழ்கின்றமை குறிப்பிடத்தக்கது. இவர்கள் இந்த நாட்டு மக்களுக்கு அவசியமான புரதத் தேவையை மீன்கள்மூலம் வழங்கிக்கொண்டு இருக்கிறார்கள். அறுவடைக்குப் பின்ன ரான இழப்பைக் குறைப்பதற்கு, அதற்குரிய தொழில் நுட்பத்தைப் பயன்படுத்துவதில் நாங்கள் கவனம் செலுத்தி வருகின்றோம். பிடிக்கப்படுகின்ற மீன்களைப் பாதுகாப் பதற்கான ஏற்பாடுகள் தொடர்பாகவும் நுகர்வோருக்கு நியாயமான விலைக்கு மீன்களை வழங்குவது தொடர்பாகவும் எங்களுடைய மீனவர்கள் தங்களாலான சகல உதவிகளையும் செய்துகொண்டு இருக்கிறார்கள். கடந்த கால அரசாங்கம் இந்த மீனவர்களுக்கு எந்தவிதமான கவனிப்பையும் மேற்கொள்ள வில்லை. இருந்தாலும், தற்போதைய அரசாங்கம் அவர்களுக் காகப் பல்வேறுபட்ட உதவிகளைச் செய்து கொண்டு இருக்கின்றது என்பதை நாங்கள் யாரும் மறுப்பதற்கு இல்லை.

அந்த அடிப்படையில், 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் வாழைச்சேனை மீன்பிடித் துறைமுகத்தின் அபிவிருத்திக்காகப் பெருமளவு நிதி - கிட்டத்தட்ட 350 மில்லியன் ரூபாய் - ஒதுக்கப்பட்டு இருக்கிறது. இந்த வாழைச்சேனை துறைமுகத்துக்கு கடந்த காலத்தில் இருந்த ஆட்சியாளர்களாலும் அவர்களுடன் சேர்ந்து பயணித்தவர்களாலும் அந்தப் பிரதேசத்தில் இருக்கின்ற அரசியல்வாதிகளாலும் எந்தவித உதவியும் செய்யப்படவில்லை என்பது எங்களுக்குத் தெரியும். கிட்டத்தட்ட 35 வருடங்கள் இந்த வாழைச்சேனை துறைமுகம் கவனிப்பாரற்றுக் காணப்பட்டது. ஆனால், இன்று

[ගරු අබුබකර් අතම්බාවා මහතා]

எதிர்க்கட்சியில் இருக்கின்ற அந்தப் பிரதேசத்தைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் மேற்குறித்த 350 மில்லியன் ரூபாய்க்கு உரிமை கோருகிறார்கள். கடந்த சனாதிபதித் தேர்தலின்போது, இந்த நாட்டின் சனாதிபதியை மேடைகளில் பலவாறு பேசியவர்கள் இன்று இதற்கு உரிமை கோருகின்றார்கள் என்றால், இந்த விடயத்தைச் சற்று உன்னிப்பாகக் கவனிக்கவேண்டி இருக்கிறது. இவர்கள் அரசியல் இலாபம் தேடுகின்றார்களா? என்ற சந்தேகம் எழுகின்றது.

தற்போது வட - கிழக்குப் பருவப்பெயர்ச்சிக் காற்றின் மூலமாக அதிகளவு மழை பெறுகின்ற இடங்களாக எங்களுடைய வட, கிழக்குப் பிரதேசங்கள் காணப்படுகின்றன. ஒக்ரோபர் மாதம் தொடக்கம் சனவரி மாதம் வரை இதனால் பாதிப்பு ஏற்படுவது வழமையான ஒரு விடயமாகக் காணப்படுகின்றது. அந்த அடிப்படையில், எங்களது வட, கிழக்கில் இருக்கின்ற குறிப்பாக அம்பாறை மாவட்டத்தின் கரையோரப் பிரதேசத்தில் இருக்கின்ற நெல் வயல்கள் பாதிக்கப்பட்டு இருக்கின்றன. நீலாவணை, மருதமுனை, பாண்டிருப்பு, கல்முனை, சாய்ந்தமருது, காரைதீவு, நிந்தவூர், பாலமுனை, ஒலுவில், அக்கரைப்பற்று, அட்டாளைச்சேனை, திருக்கோவில், தம்பிலுவில், தம்பட்டை, பொத்துவில், சாகாமம், சம்மாந்துறை போன்ற பிரதேசங்களில் தற்போது பல்வேறு இழப்புகள் ஏற்பட்டிருப்பதாகச் சொல்லப்படுகின்றது.

குறிப்பாக, EHED projectமூலம் வழங்கப்பட்ட சாய்ந்தமருதில் அமைக்கப்பட்ட சுனாமி வீட்டுத்திட்டம் நீரில் மூழ்கிக் காணப்படுகின்றது. அங்கு வாழ்ந்த மக்கள் இப்பொழுது வேறு இடங்களில் குடியமர்த்தப்பட்டு இருக்கிறார்கள். அக்கரைப்பற்று போன்ற பிரதேசங்களிலும் இந்த வெள்ள அனர்த்தத்தால் மக்கள் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். அவர்களும் வேறு இடங்களுக்கு அகதிகளாகச் சென்றிருப்பதாக இன்று காலை மாவட்டச் செயலாளர் என்னுடன் பேசியபோது கூறினார். எனவே, அவர்களுக்கான வசதி வாய்ப்புகளைச் செய்து கொடுக்க வேண்டும். எங்களுடைய மக்களில் பெரும்பாலானவர்கள் விவசாயிகளாகவும் மீனவர்களாகவும் காணப்படுகின்றார்கள். மாவட்டச் செயலாளரும் பிரதேசத்தில் இருக்கின்ற சமூக அமைப்புகளும் அவர்களுக்கான உலர் உணவு வழங்குகின்ற செயற்பாடுகளில் ஈடுபட்டுக்கொண்டு இருப்பதை நாங்கள் பார்க்கின்றோம்.

கிழக்கு மாகாணத்தின் கடற்பரப்பில் கடந்த காலங்களில் இருந்த மிகப் பெரிய பிரச்சினைதான் மீன்கொள்ளை! அதனைக் கடற்கொள்ளை என்றும் சொல்வார்கள். 2012ஆம் ஆண்டு கிழக்கு மாகாணத்தில் இருக்கின்ற எங்களுடைய ஆழ்கடல் மீனவர்களின் மீன்களைக் கொள்ளையடித்தார்கள். எனினும், அப்பொழுதிருந்த அரசியல்வாதிகள் இதனை ஒருபோதும் கவனத்தில் எடுக்கவில்லை. நாங்கள் ஆட்சிக்கு வந்த பிற்பாடு, இது பற்றி மீன்பிடித்துறை அமைச்சரோடும் முப்படையினரோடும் பேசி, அந்த மீன்கொள்ளையை முற்றுமுழுதாக நிறுத்தியிருக்கிறோம். அதற்காக பாதுகாப்புப் பிரதி அமைச்சருக்கும் மீன்பிடித்துறை அமைச்சருக்கும் முப்படையினருக்கும் இந்தச் சந்தர்ப்பத்தில் எங்களுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம். நாங்கள் மட்டுமல்ல, எமது மீனவர்களும் அரசாங்கத்துக்கு நன்றி தெரிவிக்கிறார்கள் என்பதை இந்த உயரிய சபையில் தெரிவித்துக் கொள்கின்றேன்.

எங்களுடைய ஒலுவில் துறைமுகமானது, மீனவர்களால் மிகவும் நேசிக்கப்படுகின்ற ஒரு துறைமுகமாகும். அம்பாறை மாவட்டத்தின் கரையோரப் பிரதேசத்தில் இருக்கின்ற 500க்கும் மேற்பட்ட பலநாள் படகுகள் இந்தத் துறைமுகத்தை நம்பியிருக்கின்றன. இருந்தாலும், கடந்த காலங்களில் திட்டமிடப்படாமல் இந்தத் துறைமுகத்தை அமைத்ததனால் இன்று அந்தத் துறைமுகம் மூடப்பட்டு இருக்கின்றது. இன்று எமது அரசாங்கம் இந்தத் துறைமுகம் தொடர்பாக மிக நீண்ட பேச்சுவார்த்தைகளை நடத்திக்கொண்டு இருக்கின்றது. மாண்புமிகு சனாதிபதியோடும் சம்பந்தப்பட்ட அமைச்சர்களோடும் நாங்கள் பேசிக்கொண்டு இருக்கின்றோம். எதிர்காலத்தில் இந்த ஒலுவில் துறைமுகத்தை மீனவர்களின் பாவனைக்குக் கையளிப்பதற்கான ஏற்பாடுகளைச் செய்வதோடு, அதற்கான நிதி ஒதுக்கீடுகளையும் மேற்கொள்வோம்.

பொதுவாக நவம்பர், டிசம்பர் மாதங்களில் கடல் கொந்தளிப்பாகக் காணப்படுவதால் ஆழ்கடல் மீனவர்கள் மிக நீண்ட தூரம் சென்று - வாழைச்சேனை போன்ற பிரதேசங்களுக்கு - தங்களுடைய வள்ளங்களையும் பலநாள் படகுகளையும் பாதுகாக்க வேண்டியிருக்கின்றது. இதனால் அவர்கள் பெரும் நஷ்டத்தை எதிர்கொள்வதாக அறியக் கூடியதாக இருக்கின்றது. அம்பாறை மாவட்டத்தின் கல்முனைப் பிரதேசத்துக்கு radio communication system ஒன்று அவசியமாக இருக்கின்றது. ஏற்கனவே அங்கு அந்த system இருந்தது. அது பழுதடைந்து விட்டது. தற்பொழுது அதனைத் திருத்தி வேறோர் இடத்தில் பொருத்தி இருக்கின்றார்களா? என்ற கேள்வி எழுகின்றது. நாங்கள் தொடர்ச்சியாக அமைச்சரோடு பேசி, அந்த radio communication systemஐ மீண்டும் எங்களுடைய பிரதேசத்துக்குக் கொண்டுவருவதில் சித்தமாக இருக்கின்றோம்.

மீன்பிடித்துறையில் புதிய தொழில்நுட்பத்தை - digital தொழில்நுட்பத்தை - புகுத்துவதற்கான ஏற்பாடுகளை உரிய அமைச்சு மேற்கொண்டு வருகின்றது. குறிப்பாக, இறால் வளர்ப்பு, கடலட்டை வளர்ப்பு, கடற்பாசி வளர்ப்பு, அலங்கார மீன் வளர்ப்பு, அலங்காரத் தாவர உற்பத்தி போன்றவற்றில் இத்தொழில்நுட்பத்தைப் புகுத்துவதற்கான ஏற்பாடுகளை மேற்கொண்டு வருகின்றோம். மேலும், Floating cage fishing method போன்ற பல்வேறு திட்டங்களை எதிர்காலத்தில் அறிமுகப்படுத்துவதற்கும் அதற்கான நிதி ஒதுக்கீட்டைச் செய்வதற்கும் நாங்கள் சித்தமாக இருக்கின்றோம்.

கடந்த கால ஆட்சியாளர்கள் உவர்நீர் மீன் உற்பத்தி தொடர்பான விடயங்களை மேற்கொண்டார்கள். ஆனாலும், நன்னீர் மீன் உற்பத்தி தொடர்பாக எந்தவித நடவடிக்கையையும் அவர்கள் மேற்கொள்ளவில்லை. அவ்வாறில்லாமல், எதிர்காலத்தில் நன்னீர் நீர்நிலைகளைப் பயன்படுத்தி, இந்த நாட்டுக்குத் தேவையான மீன் உற்பத்தியை மேற்கொள்வதற்கும் நாங்கள் ச் சித்தமாக இருக்கின்றோமெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.37]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள் அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதையிட்டு சந்தோஷம் அடைகின்றேன்.

இந்த அமைச்சுக்கு மிகச் சிறப்பான முறையில் தலைமைதாங்கி, மீனவர்களின் பிரச்சினைகளை அடையாளங்கண்டு, அவற்றுக்குத் தீர்வு காண்பதற்கான வழிமுறைகளைச் செய்துகொண்டு இருக்கின்ற கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்களுக்கும், கௌரவ பிரதி அமைச்சர் ரத்ன கமகே அவர்களுக்கும், அமைச்சின் செயலாளர் உட்பட ஏனைய உத்தியோகத்தர்களுக்கும் எமது நன்றிகளையும் பாராட்டுக்களையும் தெரிவித்துக் கொள்கின்றோம்.

எனக்கு முன்பு பேசிய கௌரவ உறுப்பினர் அவர்கள், நாங்கள் கடந்த 35 வருட காலம் எதுவுமே செய்யாமல், ஏதோ தேங்காய் துருவிவிட்டு வெறுமனே பாராளுமன்றத்துக்கு வந்து, இப்பொழுது மக்களுடைய பிரச்சினைகளைப் பேசிக்கொண்டு இருப்பதாக கோமாவில் இருந்து மீண்டு வந்தவர்போல் பேசினார். நான் அவருக்கு ஒன்றைச் சொல்லிவைக்க விரும்புகின்றேன். வாழைச்சேனை Harbourஐக் கட்டி, அதற்குத் தேவையான எல்லா வசதிகளையும் 35 வருட காலமாகச் செய்திருக்கிறோம். அதற்கு இன்னுமொரு expansion தேவை. அதைத்தான் கௌரவ அமைச்சர் அவர்களிடத்தில் கடந்த ஒரு வருட காலமாகக் கோரி வருகின்றோம். 2025ஆம் ஆண்டுக்கான Budget Debateஇன்போதுகூட, நான் கௌரவ அமைச்சர் அவர்களிடத்தில் வாழைச்சேனை harbourக்கு expansion ஒன்றைக் கட்டித்தர வேண்டுமெனச் சொன்னேன்.

நான் இவ்விடயம் பற்றி பாராளுமன்றத்தில் 3 தடவை பேசி இருக்கிறேன். நான் இவ்விடயத்தை அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் எழுப்பியபோது, கௌரவ அமைச்சர் அவர்களும் அதன் பிரதி அமைச்சர் அவர்களும் அமைச்சின் செயலாளரும் 2026ஆம் ஆண்டுக்கான Budgetஇல் இதற்குத் தேவையான நிதி ஒதுக்கீட்டைச் செய்து தருவதாக உறுதிமொழி வழங்கினார்கள். அந்த அடிப்படையில், கௌரவ அமைச்சர் அவர்கள் சுமார் 350 மில்லியன் ரூபாயை Valaichenai Fisheries Harbourஇன் விஸ்தரிப்புக்காக ஒதுக்கீடு செய்திருக்கிறார். அதற்காக கௌரவ அமைச்சர் அவர்களுக்கும் பிரதி அமைச்சர் அவர்களுக்கும் அமைச்சின் உத்தியோகத்தர்களுக்கும் மட்டக்களப்பு மாவட்ட மக்கள் சார்பாக நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். வாழைச்சேனை துறைமுகமானது, மட்டக்களப்பு மாவட்ட மக்கள் மாத்திரமல்ல, பொத்துவில் உட்பட முழு அம்பாறை மாவட்ட மீனவர்களும் பாவிக்கின்ற ஒரு துறைமுகமாகும். அந்த அடிப்படையில், அந்த மீனவர்களின் சார்பில் மீண்டும் என்னுடைய நன்றிகளையும் பாராட்டுக்களையும் தெரிவித்துக் கொள்கின்றேன். வெறுமனே எதிர்க்கட்சியினர்மீது சேறுபூசிக்கொண்டு தங்களுடைய அரசியலைச் செய்யாமல், கடந்த காலங்களில் என்ன நடந்தது என்பதைப் புரிந்துகொண்டு பேசுங்கள்! எதுவுமே தெரியாமல் இங்கு வந்து விரும்பியதை எல்லாம் பேசலாம் என்று நினைக்காமல், உங்களுக்குத் தரப்படும் நேரத்தில் மக்களுடைய பிரச்சினைகளை முன்வையுங்கள்! அதற்கான ஒரு சபையாக இந்த உயர்ந்த சபையைப் பயன்படுத்துமாறு நான் அந்தப் பாராளுமன்ற உறுப்பினருக்கு அறிவுரை கூற விரும்புகின்றேன்.

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சு என்பது முக்கியமான ஓர் அமைச்சாகும். இந்த நாட்டில் இருக்கின்ற கிட்டத்தட்ட பத்து இலட்சம் பேர் நேரடியாகவும் மறைமுகமாகவும் இந்த அமைச்சோடு தொடர்புபட்டவர்களாக இருக்கிறார்கள். அதுமாத்திரமல்ல, இந்த அமைச்சானது மீன் ஏற்றுமதிமூலம் வருடாந்தம் கிட்டத்தட்ட 300 பில்லியன் ரூபாயை இந்த நாட்டுக்கு வருமானமாக ஈட்டிக் கொடுக்கின்றது. எனவே, இந்த அமைச்சின் பணிகள் மேலும் விஸ்தரிக்கப்பட வேண்டும். சிறிய மற்றும் பெரிய அளவில் மீன்பிடியில் ஈடுபடுகின்றவர்கள் பாதுகாப்பு உட்பட பல்வேறு பிரச்சினைகளுக்கு முகங்கொடுக்கின்றார்கள். எனக்கு முன்பு பேசிய கௌரவ உறுப்பினர்களும் இதே விடயங்களைச் சொன்னார்கள். அந்த மீனவர்களுடைய படகுகள் காணாமற்போதல் உட்பட பல்வேறு சம்பவங்கள் இடம்பெறுகின்றன. அதற்காக அவர்களுக்கு GPS, life jackets போன்றவற்றை அதிகமாக வழங்க வேண்டும்.

அடுத்து, ஆறுகளில் அல்லது சிறிய குளங்களில் மீன்பிடியில் ஈடுபடுகின்றவர்களுக்கு கடந்த காலங்களில் வள்ளங்கள், மீன்பிடி உபகரணங்கள் கொடுக்கப்பட்டன. இவ்வாறு நாடு முழுவதும் கொடுக்கப்பட்டது. இப்பொழுது அதிக விலை காரணமாகவும் பொருளாதாரச் சுமை காரணமாகவும் பெரும்பாலான மீனவர்களால் இப்பொருட்களை வாங்க முடியாமல் இருக்கிறது. எனவே, அவர்களுக்கு அவற்றைப் பெற்றுக்கொடுப்பதற்குரிய நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் எடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன். அதேபோன்று, மீனவர்களுடைய வாழ்க்கைத் தரத்தை உயர்த்துவதற்கும் நடவடிக்கை எடுக்க வேண்டும். குறிப்பாக, அவர்களுக்கான வீடமைப்பு, குடிநீர், கல்வி, சுகாதாரம் போன்ற அடிப்படை வசதிகளை வழங்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். ஏனெனில், அவர்களுடைய வாழ்க்கை இன்னும் மிக மோசமான நிலையிலே இருக்கின்றது. Multi-day boatsஐ வைத்திருப்பவர்கள்கூட, மிகுந்த கஷ்டத்தின் மத்தியிலேயே வாழ்கின்றார்கள். அதேபோன்று, ஆறு மற்றும் குளங்களில் மீன்களை வளர்க்கின்றவர்களுக்கு மீன் குஞ்சுகளை வழங்குவதற்கான நடவடிக்கைகளையும் எடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
නැහැ, I have been given eight minutes; මට විනාඩි 8ක කාලයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම විනාඩි 2යි කථා කරලා තිබෙන්නේ.

தற்பொழுது, இச்சபையில் பொத்துவில் பிரதேசத்தைச் சேர்ந்த கௌரவ வாசித் அவர்கள் இருக்கிறார். பொத்துவில் பிரதேச மீனவர்களின் நலன் கருதி ஒலுவிலில் ice-producing

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

factory ஒன்று உருவாக்கப்பட வேண்டும். அங்கு நிறையப் பேர் மீன்பிடித் தொழிலில் ஈடுபடுகின்றார்கள். எனினும், இதுவரை அங்கு ice-producing factory ஒன்று உருவாக்கப்படவில்லை. அங்கு ice-producing factory ஒன்று உருவாக்கப் படுவதன்மூலம் அந்தப் பிராந்தியத்திலுள்ள ஆயிரக்கணக்கான மீனவர்கள் நன்மை அடைவார்கள். அதுமாத்திரமன்றி, பொத்துவில் மீனவர்களின் நலன் கருதி மீன்பிடித் துறைமுகமொன்றும் அமைக்கப்பட வேண்டும். சின்ன உல்லை, கட்டுக்கலீல் பிரதேசங்களை மையப்படுத்தி மீன்பிடிக் கிராமம் ஒன்றை அமைக்கவும், அங்கு படகுகளைக் கட்டுவதற்கான ஒரு சிறிய anchorageஐ அமைப்பதற்கும் உரிய நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, பொத்துவில், அறுகம்பை, ஊரணி, கோமாரி, பானம களப்புகள் அளவீடு செய்யப்பட்டு, அவை gazette பண்ணப்பட்டு, அங்குள்ள மீனவர்களுடைய தேவைகள் ஒழுங்குபடுத்தப்பட்டு, அவர்களுக்கு நவீனரக மீன்பிடி உபகரணங்கள் வழங்கப்பட்டு, அவர்களுடைய வாழ்விலும் மறுமலர்ச்சி ஏற்படுத்தப்பட வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன். அதேபோன்று, மட்டக்களப்பு, மஞ்சந்தொடுவாய் கிராமத்திலுள்ள மீனவர்களுக்காக அங்கு இறங்குதுறை - jetty - ஒன்று அமைக்கப்பட வேண்டும். ஏனெனில், அவர்கள் boatsஐத் திருத்துவதற்கும், அவற்றைத் நிறுத்தி வைப்பதற்கும் மிகவும் கஷ்டப்படுகின்றார்கள். மேலும், ஓட்டமாவடி பிரதேச செயலாளர் பிரிவுக்கு உட்பட்ட மீராவோடையில் ஓர் அணைக்கட்டு கட்டப்பட்டு, அங்குள்ள மீனவர்கள் மீன் பிடிப்பதற்கு வசதியான ஒழுங்குகளும் செய்யப்பட வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

Finally, I wish to sincerely thank the Hon. Ministers of Science and Technology and Digital Economy.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
I will wind up within two minutes, Sir.

The Ministry of Digital Economy is one of the most important Ministries in shaping Sri Lanka's future. Sir, I wish to sincerely thank the Hon. Minister for the significant initiatives already taken to strengthen the digital ecosystem, upgrade ICT infrastructure and promote innovation across the country. These measures are essential to position Sri Lanka within the rapidly evolving global technological landscape.

Hon. Minister, in today's world, high-speed connectivity is not a privilege, but a necessity. While progress has been made, large gaps remain between urban and rural areas. In this context, I strongly urge the Hon. Minister to prioritize the Eastern Province. The Eastern Province still faces weak broadband coverage, poor fibre connectivity and limited access to advanced ICT facilities. Strengthening digital infrastructure in these areas would unlock new opportunities for thousands of students and young entrepreneurs.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
The Eastern Province has an enormous potential to become a regional technology hub. Therefore, I propose the following initiatives: the establishment of a National Science and Technology Innovation Centre in Batticaloa and a state-of-the-art centre focusing on robotics, artificial intelligence, biotechnology and renewable energy technologies. That will support research, attract investors and cerate high-value jobs.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන් නිසා කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Finally, with regard to startups and digital entrepreneurship support, the region needs a tech-startup incubation centre, training for youth on coding, AI and digital services and expansion of BPO and IT service centres in Batticaloa and Ampara. That would create employment for thousands of young people, especially women.

Thank you, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.46]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சின் குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதில் மகிழ்ச்சியடைகின்றேன்.

உண்மையிலே இவ்வுலகத்தைப் படைத்த இறைவன் இவ்வுலகினில் வாழும் ஒவ்வோர் உயிரினத்துக்கும் உரிய வாழ்வாதாரங்களை ஏற்படுத்திக் கொடுத்துள்ளான். இறைவனின் உயர்ந்த படைப்புகளில் ஒன்றான மனிதனுக்கும்

வாழ்வதற்கான வாழ்வாதாரங்களை வழங்காமலில்லை. ஒவ்வொரு மனிதனும் அவன் வாழ்வின் ஆதாரமாக இருக்கும் தொழில்கள்மூலம் வாழ்வாதாரத்தைப் பெற்றுக் கொள்கின்றான். அந்த வகையில், இந்த நாட்டில் வாழுகின்ற மீனவர்கள் மீன்பிடித் தொழிலினூடாக தமது வாழ்க்கைக்குத் தேவையான வாழ்வாதாரத்தை நன்னீரிலும் கடலிலும் தேடிப் பெற்றுக் கொள்கின்றனர். அவ்வாறான வாழ்வாதாரத் தேடலில் தமது உயிரையும் பணயம் வைத்து ஆழ்கடல் வரை பயணிக்கும் மீனவர்கள் பல்வேறு சவால்களை எதிர்நோக்கி வருகின்றனர்.

கிழக்கு மாகாணத்தில் மீன்பிடித் தொழிலை அடிப்படையாகக்கொண்டு 97,790 மீன்பிடியாளர்களும் வடக்கு மாகாணத்தில் முழுநேர மீன்பிடியாளர்கள் 41,667 பேரும் உள்ளனர். நமது நாட்டின் 63 சதவீதமான கடற்கரையைக் கொண்ட வடக்கு, கிழக்கு மாகாணங்களில், வடக்கு மாகாணத்தில் 40 சதவீதமான கடற்கரையும் கிழக்கு மாகாணத்தில் 23 சதவீதமான கடற்கரையும் காணப்படுகின்றது. வடக்கு, கிழக்கு மாகாணங்களில் மிகச் சிறந்த மீன் வளத்தைக் கொண்ட கடற்பரப்பைத் தன்னகத்தே கொண்டிருக்கின்ற இக்கடற்கரைகள் மீன்பிடி, மீன்வளர்ப்பு மற்றும் சுற்றுலா ஆகியவற்றுக்குப் பொருத்தமாக உள்ளன. இவ்விரு மாகாணங்களிலும் விவசாயத்துறையை அடுத்து மீன்பிடித்துறையே காணப்படுகின்றது.

நமது நாட்டின் மொத்த மீன் உற்பத்தியில் 22 சதவீதத்தை வடக்கு, கிழக்கு மாகாணங்கள் வழங்கி வருகின்றன. நவீனமயப்படுத்தப்பட்ட மீன்பிடி முறைகளைக்கொண்ட பலநாள் படகுகளைக்கொண்டு மீன்பிடியில் ஈடுபடும் 145 பெரிய படகுகள் வட மாகாணத்திலும், 971 பெரிய படகுகள் கிழக்கு மாகாணத்திலும் காணப்படுகின்றன. பலநாள் படகுகளை மீனவர்கள் பயன்படுத்தும்போது, அவர்களின் செயற்பாடுகளுக்கு உகந்ததான உட்கட்டமைப்பு வசதிகளைக்கொண்ட மீன்பிடித் துறைமுகங்கள் தேவைப்படுகின்றன.

அம்பாறை மாவட்டத்தில் சுமார் 300 ஆழ்கடல் இயந்திரப் படகுகள் உள்ளன. மேலும், 1,200 வெளி இயந்திரப் படகுகளும் உள்ளன. அம்பாறை மாவட்டத்தில் 23,000 மீனவக் குடும்பங்கள் மீன்பிடியை நம்பி வாழ்ந்து வருகின்றன. ஒலுவில் மீன்பிடித் துறைமுகம் செயற்படுத்தப்பட்டால், ஒரு மாதத்துக்கு 10 மில்லியன் ரூபாய் வருமானத்தைப் பெறலாம். வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்யப்படுகின்ற கொப்புறு, பெரும் தளப்பத்து, கெழவல்லா போன்ற பல இன மீன்கள் இந்த ஒலுவில் பிரதேச கடற்பரப்பில் உள்ளன. வெளிநாடுகளுக்கு மீன்களை ஏற்றுமதி செய்யும் செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டால், அம்பாறை மாவட்ட மீனவர்களின் வறுமை ஒழிக்கப்படுவதுடன், நாட்டின் தேசிய வருமானத்தை அதிகரிக்கக்கூடிய வாய்ப்புகளும் கிடைக்கும்.

கிழக்கு மாகாணத்தில் திருகோணமலை, வாழைச்சேனை மற்றும் ஒலுவிலில் மீன்பிடித் துறைமுகங்கள் அமைந்துள்ளன. பலநாள் படகுகளில் ஆழ்கடலுக்குச் சென்று, அங்கு பல நாட்கள் தங்கியிருந்து மீன்பிடியில் ஈடுபட முடியும் என்பதுடன், பாதுகாப்பாக மீன்களை எடுத்துவரும் குளிர் அறைகள், நீர்த் தொட்டிகள் என்பனவும் அதில் காணப்படுகின்றன. கிழக்கு மாகாணத்தில் பலநாள் மீன்பிடிப் படகுகள் பயன்படுத்தப்படுகின்றன. எனினும், அங்கு தேவையான மீன்பிடித் துறைமுகங்கள் இல்லாமையால் மீன்பிடித் தொழிற்றுறை வீழ்ச்சியடைந்த நிலையில் உள்ளது. எனவே, ஒலுவில் கடற்கரைப் பாதுகாப்புத் திட்டங்களை நிறைவுசெய்து, ஒலுவிலில் அமைக்கப்பட்டுள்ள மீன்பிடித் துறைமுகத்தை இயங்கவைத்து, தேசிய வருமானத்தையும் உள்ளூர் பொருளாதார அபிவிருத்தியையும் அதிகரிப்பதற்கான செயற்பாடுகளை மீன்பிடிக்குப் பொறுப்பான அமைச்சு மேற்கொள்ள வேண்டுமென நான் கேட்டுக் கொள்கின்றேன்.

ஒலுவில் பிரதேசத்தில் பாரியளவு வெளிநாட்டு நிதியில் நிர்மாணிக்கப்பட்டுள்ள ஒலுவில் மீன்பிடித் துறைமுகத்தைச் செயற்படுத்துவதற்கு முன்னர், ஒலுவில் கடற்கரைப் பாதுகாப்புத் திட்டங்களை நிறைவுசெய்து, ஒலுவில் மக்களும் ஒலுவில் பிரதேச மீனவர்களும் பாதிக்கப்படாத நிலையை ஏற்படுத்த வேண்டும். அதன் பின்னரே, அந்த மீன்பிடித் துறைமுகத்தைத் திறப்பதற்கான ஏற்பாடுகள் மேற்கொள்ளப்பட வேண்டும். ஒலுவில் மீன்பிடித் துறைமுகத்தை திறப்பதற்காகவும், ஒலுவில் கடற்கரையைப் பாதுகாப்பதற்கான திட்டங்களையும் ஒவ்வோர் அரசாங்கத்திலும் இருக்கின்ற மீன்பிடிக்குப் பொறுப்பான அமைச்சர் வந்து பார்வையிட்டுச் செல்வார். அந்த அடிப்படையில், இப்போதைய மீன்பிடித்துறை அமைச்சரும் அண்மையில் தனியாக வந்து ஒலுவில் மீன்பிடித் துறைமுகத்தைப் பார்வையிட்டுச் சென்றிருக்கிறார். ஆனால், எதுவும் நடைபெறுவதில்லை என மீனவர்களும் பொது மக்களும் கவலை தெரிவிக்கின்றனர். எனவே, ஒலுவில் கடற்கரைப் பாதுகாப்பு ஏற்பாடுகளை நிறைவு செய்துவிட்டு, ஒலுவில் மீன்பிடித் துறைமுகத்தைத் திறப்பதற்கான ஏற்பாடுகளை மீன்பிடிக்குப் பொறுப்பான அமைச்சு மேற்கொள்ள வேண்டும்.

2024ஆம் ஆண்டில் ஏற்பட்ட வெள்ளத்தால் அம்பாறை மாவட்டத்தின் பொத்துவில், அறுகம்பை, திருக்கோவில், அட்டாளைச்சேனை, ஒலுவில் பிரதேசங்களிலுள்ள மீனவர்களின் இயந்திரப் படகுகளும் மீன்பிடி உபகரணங்களும் சேதமடைந்தன. இதுவரையும் அம்மீனவர்களுக்கு எதுவித நஷ்டஈடும் வழங்கப்படாமல் இருக்கின்றது. கல்முனையிலுள்ள கடற்றொழில், நீரியல் வளத்துறை திணைக்களத்தின் மாவட்ட அலுவலகத்தின் உதவிப் பணிப்பாளரால் அம்பாறை மாவட்டச் செயலாளருக்கு அனுப்பப்பட்ட, வெள்ள அனர்த்தத்தால் ஏற்பட்ட சேத விபரங்கள் தொடர்பான பட்டியலை நான் சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்**.

இப்போது அம்பாறை மாவட்டம் இன்னுமொரு வெள்ள அனர்த்தத்தை எதிர்நோக்கிக்கொண்டு இருக்கின்றது. இன்று கிழக்கு மாகாணம் முழுவதும் வெள்ளத்தால் பாதிக்கப்பட்டு இருக்கின்றது. இப்போது அம்பாறை மாவட்டம் முழுதாக நீரில் மூழ்கியுள்ளது. அம்பாறை மாவட்டத்திலுள்ள எல்லா ஊர்களும் நீரில் மூழ்கிய நிலையில், இன்று இரவு என்னவாகும் என்ற நிலைமையே அங்கு காணப்படுகின்றது. எனவே, இந்த வெள்ளத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கான அவசர ஏற்பாடுகளை அரசாங்கம் செய்ய வேண்டும். கடந்த வெள்ளத்தின்போது பாதிக்கப்பட்ட மீனவர்களுக்கான நிவாரணத்தை கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சு இன்னும் கொடுக்காமல் இருக்கின்றது. மீனவர்கள் தொழிலுக்குப் போகமுடியாமல் மாதக் கணக்கில் கஷ்டப்படுகிறார்கள். எனவே, நீங்கள் அவர்களுக்கான நஷ்டஈடுகளை விரைவாக வழங்க வேண்டும்.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

கௌரவ பிரதி அமைச்சர் ரத்ன கமகே அவர்களை நான் பாராட்டுகின்றேன். ஏனெனில், அவர் எங்களுடைய அம்பாறை மாவட்டத்துக்கு வருகைதந்து, அங்குள்ள மீனவர்களை அழைத்துப் பேசினார். உண்மையிலே அவர் மிகுந்த அனுபவமிக்கவர். என்னைப்போல் அவரும் மாகாண சபையில் அமைச்சராக இருந்திருப்பாரென நான் நினைக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගංවතුර සම්බන්ධවත් කියන්න ඕනෑ. එම නිසා මට තව විනාඩියක් දෙන්න.

எங்களுடைய நாடு இக்கட்டான சூழ்நிலையில் இருக்கும்போது, ஓர் ஆபத்தை எதிர்கொள்ளும்போது, குறிப்பாக, வெள்ளம், சூறாவளியை எதிர்நோக்கும்போது, நாங்கள் ஆளும்கட்சி, எதிர்க்கட்சி என்று வெறுமனே அரசியல் பேசாமல், எல்லோரும் ஒன்றுபட்டுச் செயற்பட வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் அவர்கள் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. මට මිනිත්තු 7ක් තිබුණා. හැම දාම මගේ වෙලාව තමයි ඔබතුමන්ලා අඩු කරන්නේ. ඇයි එහෙම කරන්නේ? මම අම්පාර දිස්ත්‍රික්කයේ ඉඳලා ඇවිල්ලා ඉන්නේ. මම රණ්ඩු කරන්නේ නැහැ නේ. හොඳ වචනත් කථා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. இறுதியாக, அரசாங்கமானது எங்களுடைய மக்களுக்கு நல்ல விடயங்களைச் செய்ய வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කන්දසාමි ප්‍රභු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.53]

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சு, Ministry of Science and Technology, Ministry of Digital Economy ஆகியவற்றின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் மட்டக்களப்பிலுள்ள வாழைச்சேனை மீன்பிடித் துறைமுகத்தின் அபிவிருத்திக்காக நிதி ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கிறது. இந்த நிதி ஒதுக்கீடு தொடர்பாக பலரும் பல்வேறு விதமாக கருத்துக்களைத் தெரிவித்து, தங்களது பிழைப்புவாத அரசியலை முன்னெடுத்துக்கொண்டு இருப்பதை நாங்கள் இந்தச் சபையில் காணக்கூடியதாக இருக்கின்றது.

2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் கடற்றொழில் அமைச்சின் குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு வாழைச்சேனை படகுத்துறையின் விஸ்தரிப்புத் தொடர்பாக நான் பேசியிருந்தேன். அதுமாத்திரமன்றி, அந்தத் துறைமுகத்துக்குத் தேவையான pier lamps தொடர்பாகவும் பேசியிருந்தேன். மேலும், அங்குள்ள மீனவர்கள் எதிர்நோக்கும் பல்வேறு பிரச்சினைகளுக்குத் தீர்வுகளை வழங்குமாறும் அமைச்சரிடம் கோரிக்கை விடுத்திருந்தேன். அந்த அடிப்படையில், கௌரவ அமைச்சர் அவர்கள் மட்டக்களப்பு மாவட்டத்துக்கு விஜயமொன்றை மேற்கொண்டு, அந்தத் துறைமுகத்தை நேரடியாகச் சென்று பார்வையிட்டு, அங்குள்ள குறைபாடுகளை அறிந்து கொண்டார். 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் அக்குறைபாடுகளை நிவர்த்தி செய்வதற்காக நிதி ஒதுக்கீடு செய்து தருவதாக அவர் உறுதியளித்து இருந்தார். அந்த அடிப்படையிலே, 2026ஆம் ஆண்டுக்கான இந்த வரவு செலவுத்திட்டத்தில் அதற்கான நிதி ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது.

கடந்த 76 வருடங்களாக இந்த நாட்டை மாறி மாறி ஆட்சி செய்தவர்களாலும், அந்தக் காலப்பகுதியில் அமைச்சர்களாக இருந்தவர்களாலும், கிழக்கு மாகாணத்தின் ஆளுநராக இருந்தவர்களாலும் செய்ய முடியாமற்போன ஒரு காரியத்தை நாங்கள் இந்தக் குறுகிய காலத்துக்குள் செய்திருக்கிறோம். அதற்காக கௌரவ அமைச்சருக்கு இந்த நேரத்தில் நன்றி தெரிவித்துக் கொள்கின்றேன். இந்த விடயத்தில் எமது அம்பாறை மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் ஆதம்பாவா அவர்கள்கூட, தன்னுடைய கரிசனையைச் செலுத்தியிருந்தார். அந்தப் பிரதேச மீனவர்கள் மீன்பிடியில் ஈடுபடும்போது, இடம்பெறுகின்ற கடற்கொள்ளையைத் தடுத்து நிறுத்துவதில் அவர் முன்னின்று செயற்பட்டதுடன், அதற்குரிய சரியான நடவடிக்கைகளையும் மேற்கொண்டார். இப்பொழுது நாங்கள் அந்தக் கடற்கொள்ளைச் செயற்பாட்டைத் தடுத்து நிறுத்தியிருக்கிறோம். இந்த விடயம் தொடர்பாக நாங்கள் முன் ஆயத்த விடயங்களையும் செயற்படுத்திக்கொண்டு இருக்கின்றோம்.

மட்டக்களப்பு மாவட்ட மக்களின் வாழ்வாதாரம் மீன்பிடி, விவசாயம் போன்ற துறைகளிலே கூடுதலாகத் தங்கியிருக்கிறது. அங்கு மீன்பிடியில் முக்கிய பங்கை வகிப்பது வாழைச்சேனை மீன்பிடித் துறைமுகமாகும். அந்தத் துறைமுகத்தில் சிறிய படகுகள், ஆழ்கடல் மீன்பிடிப் படகுகள் எனப் பல்வேறு படகுகளை நிறுத்திவைப்பதற்கு இடவசதி போதாமை காரணமாக, அந்தத் துறைமுகத்தை விஸ்தரிப்பதற்காக நிதி ஒதுக்கீடு கிடைக்கப் பெற்றுள்ளதை நான் இந்த நேரத்தில் ஞாபகப்படுத்த விரும்புகின்றேன். மட்டக்களப்பு மாவட்டத்தைச் சேர்ந்தவர்களும் ஏனைய பிரதேசங்களைச் சேர்ந்தவர்களும் இந்தத் துறைமுகத்தைப் பயன்படுத்தி வருகின்றார்கள். அங்கு போதிய இடவசதி இல்லை என்பதை நாங்கள் அறிவோம்.

நான் இந்த நேரத்தில் கௌரவ அமைச்சர் அவர்களிடம் கோரிக்கை ஒன்றை முன்வைக்க விரும்புகின்றேன். அங்கு இன்னுமொரு துறைமுகத்தை அவசியத்தின் அடிப்படையில் உருவாக்கிக்கொள்ள வேண்டிய தேவை இருக்கின்றது.

உதாரணத்துக்கு, வாகரைப் பிரதேசத்தில் பால்சேனை என்னும் இடத்தில் மீன்பிடித் துறைமுகத்தை அமைத்துக் கொள்வதற்கான இடவசதி இருப்பதாக அந்தப் பிரதேச மக்கள் தொடர்ச்சியாக கோரிக்கைகளை முன்வைத்து வருகின்றார்கள். அந்தப் பிரதேசத்தில் ஆழ்கடல் மீன்பிடித் தொழிலில் ஈடுபடுபவர்கள் தங்களுடைய வாழ்க்கையை மிகுந்த கஷ்டத்துக்கு மத்தியிலேயே கொண்டுசெல்கின்றார்கள்.

வாகரைப் பிரதேசத்தில் மிகவும் குறைந்த வருமானத்தைப் பெறுபவர்களே அதிகமாக இருக்கிறார்கள். அதிலும் கூடுதலானவர்கள் மீனவர்களாக இருக்கிறார்கள். எனவே, அவர்களுக்கான வாழ்வாதார உதவிகளை வழங்க வேண்டும். அத்துடன், அவர்களுக்கு கடற்றொழிலில் ஈடுபடுவதற்கான உபகரணங்களையும் வழங்க வேண்டிய தேவை இருக்கிறது. நவம்பர், டிசம்பர் மாதங்களில் கடல் சீற்றம் அதிகமாகக் காணப்படுவதால், அங்கு அவர்களது படகுகளை நிறுத்துவதற்குப் போதிய இடவசதி இல்லாமையால், அவற்றை நிறுத்திவைக்க முடியாத நிலைமை ஏற்படும். அவர்கள் வாழைச்சேனை மீன்பிடித் துறைமுகத்துக்குச் செல்வதாக இருந்தால், கிட்டத்தட்ட 40 கிலோ மீற்றர் தூரம் பயணம் செய்ய வேண்டும். அவர்கள் அங்கு சென்று தங்களது படகுகளைத் தரித்து வைத்துவிட்டு, மீண்டும் தமது இருப்பிடத்துக்கு வரும்போது, சிலவேளை போக்குவரத்துப் பிரச்சினைகள் ஏற்படுகின்றன. அதுதவிர, அந்தப் படகுகள் சேதமடைவதற்கான சாத்தியக்கூறுகளும் இருக்கின்றன. எனவே, இந்த விடயங்களைக் கருத்திற்கொண்டு, வாகரைப் பிரதேசத்தில் முறையான சாத்தியக்கூறு ஆய்வுப் பணிகளை மேற்கொண்டு, அங்கு மீன்பிடித் துறைமுகமொன்றை உருவாக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

எமது பிரதேசத்தில் நன்னீர் மீன்பிடியில் ஈடுபடுகின்ற மீனவர்களும் இருக்கிறார்கள். அவர்கள் முதலை, யானை போன்ற விலங்குகளின் தாக்குதலுக்கு உள்ளாவதால் தங்களது உடைமைகளையும் உயிர்களையும் இழக்கின்ற நிலைமைகள்கூட ஏற்படுகின்றன. அரசாங்கம் என்ற ரீதியில், நாங்கள் அவர்களைப் பாதுகாப்பதற்கான நடவடிக்கைகளை மேற்கொள்வதற்கு எதிர்பார்க்கின்றோம். எங்களுடைய பிரதேசத்தில் மீன்பிடித்துறைக்கு முன்னுரிமை வழங்க வேண்டுமென்ற எதிர்பார்ப்போடுதான் நாங்கள் செயற்பட்டுக்கொண்டு இருக்கின்றோம். 2025ஆம் ஆண்டு காலப்பகுதியில் நன்னீர் மீன்பிடிக்குக் கூடுதலான நிதி வழங்கப்பட்டது. அதை அந்த மீனவர்கள் சரியாகப் பயன்படுத்திக் கொண்டார்கள் என்ற விடயத்தை நான் இங்கு தெரிவித்துக் கொள்கின்றேன். எங்களுடைய பிரதேசங்களில் மீன்குஞ்சுகளை உற்பத்தி செய்வதற்கான வளங்கள் இருக்கின்றன. அவற்றை உற்பத்தி செய்வதற்கென ஓர் இடத்தைத் தெரிவுசெய்து, அங்கு மீன்குஞ்சுகளை உற்பத்தி செய்து, எங்களுடைய பிரதேசத்தில் இருக்கின்ற மக்களுக்கு அவற்றை வழங்குவதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, இன்று எல்லாத் துறைகளும் digital மயப்படுத்தப்பட்டு வருகின்றன. எமது அரசாங்கமானது digital மயமாக்கல் கொள்கையோடு பயணித்துக்கொண்டு இருக்கின்றது. அதற்காக நாங்கள் புதிய Appsஐ உருவாக்கி இருக்கின்றோம். கௌரவ அமைச்சர் அவர்கள் GovPay App பற்றி மிகவும் தெளிவாகக் குறிப்பிட்டார். அந்த Appஇன் ஊடாக அரசாங்கத்துக்குச் செலுத்தவேண்டிய கட்டணங்களைச் செலுத்த முடியும். போக்குவரத்து விதிகளை மீறும்போது விதிக்கப்படுகின்ற தண்டப் பணத்தைக்கூட இந்த Appஇன் ஊடாகச் செலுத்த முடியும். இவ்வாறான பல விடயங்களை நாங்கள் digital மயப்படுத்துவதன் ஊடாக இலகுவாக மேற்கொள்ளலாம் என்ற விடயத்தை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, Ministry of Science and Technology ஊடாக மட்டக்களப்பு மாவட்டத்தில் மேற்கொள்ளப்படுகின்ற நவீனமயப்படுத்தல் செயற்பாடுகள்மூலம் நமது பொருளாதாரத்தைக் கட்டியெழுப்ப முடியும். நவீனமயப்படுத்தல், Digital Economy மற்றும் உலக பொருளாதார வளர்ச்சிக்கு முகம்கொடுக்கும் வகையில், எமது நாட்டின் இளைஞர், யுவதிகளுக்கு நவீன தொழில்நுட்பத்துடன் கூடிய தொழிற்பயிற்சிகளை வழங்க வேண்டும். மேலும், புதிய கண்டுபிடிப்பாளர்கள் மற்றும் ஆய்வாளர்களை உருவாக்குவதை நோக்காகக்கொண்டு, தற்போதைய நிலையில் பிரதேச செயலக ரீதியாக தற்காலிகமாக இயக்கப்பட்டுவரும் பல்துறைப் பயிற்சி நிலையங்களை மாவட்ட ரீதியில் செயற்படுத்த வேண்டும். எமது இளைஞர், யுவதிகளைப் புத்தாக்குநர்களாக உருவாக்குவதன் ஊடாக, நாட்டின் தேசிய அபிவிருத்தியில் இளைஞர்களின் பங்களிப்பை அதிகரிக்கச் செய்யலாம். சாதாரண தரம் மற்றும் உயர் தரம் போன்ற கல்வி நிலைகளை நிறைவுசெய்த பின்னர், தொழில்வாய்ப்புக்காகக் காத்திருக்கும் இளைஞர், யுவதிகளை இலக்காகக் கொண்டு, விதாதா வள நிலையங்களை உருவாக்கிச் செயற்படுவதற்கு நாங்கள் எதிர்பார்த்துள்ளோம். விதாதா வள நிலையங்கள் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள பிரதேச செயலகங்களில் உருவாக்கப்பட்டு இருந்தாலும், அவற்றுக்கென நிலையான கட்டிடங்கள் அமையப்பெறாமல் இருக்கின்றன. எனவே, அங்கு அவற்றுக்கான கட்டிடங்களை உருவாக்கிக் கொடுக்க வேண்டும். அதன்மூலம் புதிய தொழில் முயற்சியாளர்களையும் புதிய கண்டுபிடிப்பாளர்களையும் உருவாக்க முடியுமெனக் கூறிக் கொள்கின்றேன்.

இன்னுமொரு விடயத்தைக் கூறி, எனது உரையை முடித்துக் கொள்ளலாமென நினைக்கின்றேன். தமிழ்த் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்ற உறுப்பினராக இருந்த காலஞ்சென்ற தங்கேஸ்வரி அம்மா அவர்கள், தனது காலப்பகுதியில் புராதன இடங்கள் தொடர்பான ஆய்வுகளை மேற்கொண்டிருந்தார். அதனூடாக மட்டக்களப்பு மாவட்டத்தில் அவ்வாறான இடங்கள் இருப்பதை வெளிப்படுத்தியிருந்தார். அந்தப் புராதன இடங்களைப் பாதுகாக்கவேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது. அந்த இடங்களை அடையாளப்படுத்தி, அவற்றைப் பாதுகாப்பதனூடாக அங்கு சுற்றுலாத் துறையை அபிவிருத்தி செய்ய முடியுமெனக் கூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. LAKSHMAN NIPUNA ARACHCHI left the Chair, and THE HON. M.K.M. ASLAM took the Chair.*

[අ.භා. 5.03]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අමාත්‍යාංශ කිහිපයක, ආයතන ගණනාවක් පිළිබඳව සාකච්ඡා වනවා. මම ආරම්භය ගන්නම් ඔබතුමන්ලාගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයත් එක්ක. සභානායකතුමා - ප්‍රවාහන ඇමතිතුමා - සභාවේ ඉඳලා පොඩ්ඩක් එළියට ගියා. පුළුවන් නම් එතුමා ආයේ සභාවට ආවා නම් හොඳයි. මොකද, එතුමාටත් සම්බන්ධ කථාවක් මෙතැන තිබෙනවා.

2030 වෙනකොට තොරතුරු තාක්ෂණ ශ්‍රම බලකාය 200,000 දක්වා වැඩි කරන බව ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා. මම ආණ්ඩුවෙන් අහන්න කැමැතියි, දැනට 85,000ක් ඉන්න මේ ප්‍රමාණය 200,000 දක්වා ඉහළ නංවන්නට මේ වසරේදීවත් ආරම්භයක් ගත්තේ නැත්නම් -මොකද, අවුරුදු 4ක් වාගේ කාල සීමාවක් යනවා විශ්වවිද්‍යාලයකින් ළමයෙකු එළියට යන්න- ඒ කාල සීමාව තුළ අපට 2030 ඉලක්කයට යන්න බැරිව යනවා. ඔබ ආණ්ඩුවක් විධියට මේ අවුරුද්දේ ආසන්න වශයෙන් දහදොළොස් දාහක් ඇතුළු කර ගන්න පුළුවන් විශ්වවිද්‍යාල පද්ධතියක් මේ රටට අලුතින් හඳුන්වා දිය යුතුව තිබෙනවා, ඒ ඉලක්කයට යන්න නම්. එහෙම නම් ඒක සතුටුදායක ආරංචියක් වෙන්න ඕනෑ. විශේෂයෙන්ම ලංකාවේ විද්‍යා, ගණිත විෂය ධාරා හදාරණ ළමයින්ට අලුත් විශ්වවිද්‍යාල 4ක් ඉදි කරනවා කියලා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා. ඒක ආරම්භ කළොත් 2030දී ඒ ඉලක්කයට යන්න පුළුවන්. ඒ ගැන ආණ්ඩුවේ වර්තමාන අදහස දැනගන්න කැමැතියි.

ඩිජිටල්කරණයටත් සම්බන්ධ, කර්මාන්ත අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය හා බැඳුණු එක ව්‍යාපාරයක් තිබෙනවා අපේ දිස්ත්‍රික්කයේ. ඒ තමයි රතිඤ්ඤා කර්මාන්තය. රතිඤ්ඤා කර්මාන්තයට සම්බන්ධ ව්‍යාපාරය සම්පූර්ණයෙන් වෙඩි බෙහෙත් එක්ක යන්නේ. මේ කර්මාන්තයේ අයට ආරක්ෂාකාරී අන්දමට අලුත් රතිඤ්ඤා වර්ග, මල්වෙඩි වර්ග නිෂ්පාදනය කරන්න අවශ්‍ය තාක්ෂණය ආණ්ඩුව පැත්තෙන් ලබා දෙන්න කියලා ඉල්ලනවා. ඒ වාගේම වෙඩි බෙහෙත් කියලා කියන්නේ ඉතාම සංකීර්ණ උපාංගයක්, සංකීර්ණ ද්‍රව්‍යයක්. මේක භාවිතයෙන් රටේ ජාතික ආරක්ෂාවට බලපෑමක් කරන්න පුළුවන් නිසා, විශේෂයෙන්ම ඩිජිටල්කරණය හරහා යාවත්කාලීන කරන තොරතුරු ඔස්සේ වෙඩි බෙහෙත් පිළිබඳව අවධානය යොමු කරන්න කියන ඉල්ලීමත් මම කරනවා. මොකද හේතුව? මේ කාල සීමාව තුළ ආණ්ඩුව පැත්තෙන් ඒ ප්‍රතිපත්තිවල වෙනස්කම් කරන්න යන බවට ආරංචියක් යනවා. පසුගිය කාලයේ තිබුණේ අක්කර දෙකහමාරක් වාගේ ඉඩමක් තුළ පමණක් මේ කර්මාන්තශාලා ඉදි කරන්න පුළුවන් කියලා. පස්සේ ඒක පර්චස් 40ට ආවා. ආපහු සැරයක් ඒක අක්කර දෙකහමාරට ගන්න යන අදහසක් මම දැක්කා. ඒ හරහා ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් එන්න පුළුවන්. ඒ පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් වෙන්න. මොකද, කුඩා කණ්ඩායමකට වුණත් මේ කර්මාන්තයට ඇතුළු වෙන්න පුළුවන් ලොකු ඉඩමක් බදු අරගෙන. ඒ වාගේ ප්‍රතිපත්ති පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා.

ඊළඟ කාරණාව තමයි පර්යේෂණ. පර්යේෂණ පිළිබඳ ගොඩක් තොරතුරු තිබෙන අවස්ථාවක් මේක. රාජ්‍ය මැදිහත්වීම්වලින් සහ පෞද්ගලික මැදිහත්වීම් සහිතව පර්යේෂණ කරන අය නිලධාරි මැදිරියේ ඉන්නවා ඇති, ඒ ආයතනවලින් ඇවිත්. අපි අගය කරනවා, ගෞරව කරනවා. හේතුව, ඔබ විසින් කරන පර්යේෂණවල ප්‍රතිඵල තමයි කවදා හරි මේ රට ඉදිරියට ගෙන යන්නේ. එහෙම නැතිව දේශපාලනය කරන අපි නොවෙයි. බුද්ධිමත් මිනිස්සු තමන්ගේ මහන්සියෙන් සිදු කරන පර්යේෂණවල ප්‍රතිඵල තමයි කවදා හරි දවසක මේ රට ඉදිරියට ගෙන යන්නේ. හැබැයි මේ පර්යේෂණ සඳහා වුවමනා කරන භාණ්ඩ -පෞද්ගලිකව වෙන්න පුළුවන්, රාජ්‍ය ආයතන හරහා වෙන්න පුළුවන්- ගෙන්වන්න උත්සාහ කරන විට ඒකට උනන්දුවක් දක්වන අයට සහයෝගයක් විධියට නිවැරදි පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළාට පස්සේ ඒ පර්යේෂණවලට අවශ්‍ය ද්‍රව්‍ය සහ භාණ්ඩ සඳහා බදු සහන ලබා දෙන්න කියලා ඉල්ලනවා. මේ ආණ්ඩුව මේ අය වැය හරහා එවැනි යොමුවීමක් වෙලා තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි. හේතුව, තමන්ගේ නුවණ, දැනුම භාවිත කරලා මේ රට ගොඩ නඟන්න උනන්දුවක් දක්වන මිනිස්සුන්ට අපි ගරු කරන්නත් ඕනෑ, ඒ අයගේ සේවය මේ රටට ගන්නත් ඕනෑ. සියලු මුදල් සැපයීම්වලට අමතරව බදු සහන ලබාදීලා ඒ අයට ඒක පහසු කරලා දෙන්න කියලා මම ආණ්ඩුවෙන් ඉල්ලනවා.

ඊළඟ කාරණය තමයි, එප්පාවල පොස්පේට් නිධිය භාවිත කරලා ලංකාවට ඕනෑ කරන පොහොර නිෂ්පාදනය කරන්න මහාචාර්යවරයෙක් ආවා. පරන්තන්වල සල්ෆියුරික් අම්ලය නිෂ්පාදනය කිරීමේ වටිනාකම ගැන එදා ජනාධිපති අපේක්ෂක අනුර කුමාර දිසානායක මහත්මයා අපට පැහැදිලි කළා. හැබැයි, ඒ සල්ෆියුරික් නිෂ්පාදනාගාරය හා එප්පාවල පොස්පේට් නිධිය සම්බන්ධ කථාවේ අලුත් තත්ත්වය කුමක්ද කියලා පසුගිය කාලය තුළ දැක ගන්න ලැබුණේ නැහැ. පුළුවන් නම් ඒ පිළිබඳවත් කරුණු ඉදිරිපත් කරන්න කියා විද්‍යා හා තාක්ෂණ ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

ඊළඟ කාරණාව මේකයි. පුරවැසියන්ට විනිවිදභාවයෙන් යුත් කාර්යක්ෂම සේවා සැපයීමක් සඳහා රාජ්‍ය අංශය ඩිජිටල්කරණය කරන්න ඕනෑය කියලා ඔබ කියනවා, මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ. මම අහන්න කැමැතියි, අවම වශයෙන් වරාය සහ රේගුව තුළත් මෙය ක්‍රියාත්මක කරනවාද කියලා. ඇයි, මම ඒ ගැන හදිසියේ අහන්නේ? ඊයේ ඉඳලා ඇමති කෙනෙකුගේ recording එකක් අහන්න ලැබෙනවා. එතුමා වරාය හා සම්බන්ධ, රේගුව හා සම්බන්ධ නිදහස් කිරීම්වලට දායකත්වය සපයා තිබෙනවා. වරායට හෝ රේගුවට සම්බන්ධයක් නැති ඇමති කෙනෙකු භාල් වගයක් එළියට ගන්න දායකත්වය සපයනවා. එතැන සාකච්ඡාවක් සිද්ධ වෙනවා. මම ආණ්ඩුවෙන් අහනවා, ඒවාට සම්බන්ධතාවක් නොමැති ඇමති කෙනෙකු එහෙම සම්බන්ධ වීම හරහා පෙන්නුම් කරන්නේ අමුතු ළබැඳියාවක් නේද කියලා. පරණ පාරේම යන්න නේද මේ හදන්නේ කියලාත් මම ආණ්ඩුවෙන් අහන්න කැමැතියි.

මම ඊළඟට කියන කාරණාව තමයි අද දවසේ වැදගත්ම කාරණාව වන්නේ. මට කාලය පොඩ්ඩක් හෝ වැඩි කරගන්න අවශ්‍ය වුණොත්, එසේ කාලය ලබා දෙන්න කියලා මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම ඉස්සෙල්ලාම ඡායාරූපයක් පෙන්වන්න කැමැතියි. ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ගැන තමයි කථාව තිබෙන්නේ. ඔබතුමා Omobio (Pvt.) Limited එකේ CEO? හරි නේද? *[බාධා කිරීමක්]* Right, බොහොම හොඳයි. එහෙම නම් මේ මල් පැළ - ආණ්ඩුවේ ඔක්කෝම මේ කථාව අහගෙන ඉන්න. ලංකාවේ මිනිස්සුත් අහගන්න - මේ මල් පැළ ආණ්ඩුව; හොරකම් නොකරන ආණ්ඩුව. නමුත් දැන් අලුත් තත්ත්වයක් මේ නියෝජ්‍ය ඇමතිතුමා ඇති කර තිබෙනවා. එතුමා මෙතැන බලාගෙන ඉද්දී ඒ ගැන කියන්නත් දුකයි. නමුත් කරන්න දෙයක් නැහැ. විශේෂයෙන්ම ළබැඳියාවන් අතර ගැටුමක්, conflict of interest තත්ත්වයක් මේ ගනුදෙනුව හරහා සිද්ධ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යවරයා වන ගරු එරංග වීරරත්න මහතා සභාපතිත්වය දරන Omobio (Pvt.)

Limited සහ Eimsky Business Solutions (Pvt.) Limited කියන සමාගම් දෙක රජයේ ප්‍රධාන ව්‍යාපෘති දෙකක කොන්ත්‍රාත්තු දිනාගෙන තිබෙනවා. එතුමාට මේක ඇහෙනවා ඇති කියලා මම හිතනවා. රැව් පිළිරැව් දෙන ආරංචියක්! මේක පැහැදිලිවම හොරකමක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
විශේෂයෙන්ම කියන්න ඕනෑ, ප්‍රවාහනය digitalize කරන වැඩසටහනේ ප්‍රමුඛ පාර්ශ්වයක් වනවා, ඩිජිටල් අමාත්‍යාංශය. එහෙම තිබියදී ඩිජිටල් අමාත්‍යාංශයේ **නියෝජ්‍ය** අමාත්‍යවරයාට අයිති සමාගමක් මේ ව්‍යාපෘතිය දිනා ගැනීම කොයි තරම් විනිවිද පෙනෙන ගනුදෙනුවක්ද කියලා මම අහනවා.

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ඔබතුමාට උත්තර දෙන්න පුළුවන්, මේ කථාවෙන් පසුව. මොකද, මට වෙලාව මදි වෙනවා. මේ කථාවෙන් පසුව ඔබතුමා උත්තර දෙන්න. මම අහගෙන ඉන්නවා.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම කිව්වා. මට උත්තරයක් දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එරංග වීරරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මට මගේ කාලය දෙන්න.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
ඔය කියන සමාගමේ මම දැන් CEO නොවෙයි. නමුත්, එය මගේ shares තිබෙන සමාගමක්. ඔය කොන්ත්‍රාත්තුව දිනාගත්තු කාලය කවදාද කියලා ඔබ සොයා බලන්න. *[බාධා කිරීමක්]* මොකද, මේ සමාගම මේ industry එකේ වැඩ කරන සමාගමක්. එතකොට මේ සමාගම RDA එකේ, highway එකේ ඩිජිටල්කරණයක් කරලා තිබෙනවා. ඉතින්, ඒ කොන්ත්‍රාත්තුව ලබාගෙන තිබෙන්නේ, මම මේ තත්ත්වයට එන්න ගොඩාක් ඉස්සෙල්ලා; අවුරුදු 4කට වගේ ඉස්සෙල්ලා. අවුරුදු 4කට වගේ ඉස්සෙල්ලා ලබාගත්තු කොන්ත්‍රාත්තුවක් ගැන ඔබතුමා දැන් ඇවිල්ලා කියනවා නම්, "ඒක මගේ බලය පාවිච්චි කරලා ලබා ගත්තා" කියලා, ඒක තනිකරම මුසාවක්; නොමඟ යැවීමක්; බොරුවක්. ඕවා මෙතැනට ඇවිල්ලා කියන්න එපා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
බොහොම ස්තුතියි. මගේ කථාව තවදුරටත් මම කරනවා. හේතුව, මම මේ පිළිබඳව තොරතුරු ටිකක් සහිතව ඇවිල්ලා තිබෙන නිසා. ඔබතුමාට පුළුවන් ඔබතුමාගේ වෙලාවේදී අදහස් දක්වන්න. ඒ වාගේම, අවුරුදු 5කට කලියෙන් ඔබට software හොරකමක් පිළිබඳව CID එකේත් චෝදනාවක් තිබෙනවා නේද? හරි නේද? කලබල වෙන්න එපා; අනෙක් අය කලබල වෙන්න එපා. තොරතුරු තිබෙනවා අප ළඟ. ඒ නිසා නටන්න එපා, එහෙන් මෙහෙන් අත්පුඩි ගහමින්.

හරි, අපි කථාවට එමුකෝ, ආයෙත් සැරයක්. මේක පැහැදිලිවම හොරකමක්, **නියෝජ්‍ය** ඇමතිතුමා. ආයෙත් අහන්න දෙයක් නැහැ. හේතුව? නියෝජ්‍ය අමාත්‍යවරයා යටතේ තිබෙන අමාත්‍යාංශයක් සහ නියෝජ්‍ය අමාත්‍යවරයාට අයිති සමාගමක්. ඒ කියන්නේ මොකක්ද? මේ දෙකම එකම පුද්ගලයෙකු යටතේ තිබීම මේ ආණ්ඩුවේ ව්‍යාජ, දූෂණ විරෝධය පෙන්වන ලකුණක් කියලා මම කියනවා. ඊළඟ කාරණාව, **නියෝජ්‍ය** අමාත්‍යවරයාගේ සමාගමක් වන Eimsky Business Solutions (Pvt.) Limited එක මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා Smart Highway Tolling System එකට ප්‍රධාන සැපයුම්කරුවා වෙලා තිබෙනවා. මොකක්ද මේකෙන් අදහස් කෙරෙන්නේ? මුළු දක්ෂිණ අධිවේගී මාර්ගයේ හා පිටත වටරවුම් මාර්ගයේ ආදායම් කළමනාකරණය සඳහා අවශ්‍ය පසුබිම් පද්ධතිය - backend system එක - පාලනය කරන්නේ, නියෝජ්‍ය අමාත්‍යවරයාට අයිති සමාගමකයි.

ඊළඟ කාරණාව මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ප්‍රධාන ආර්ථික යටිතල පහසුකමක මුදල් එකතු කිරීමේ පද්ධතියේ පාලනය නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික සමාගමකට පැවරීම සාධාරණද කියලා මම අහන්න කැමතියි. ඒ වාගේම තමයි, මේ ජාතික ව්‍යාපෘතියේ පසුබිම් තාක්ෂණික සේවා සපයන්නේද මේ Eimsky Business Solutions (Pvt.) Limited එකේ Payment Connect සේවාව බවට තහවුරු වෙලා තිබෙනවා. ලැබිච්ච තොරතුරු ටිකත් එක්කයි අප මේ සම්බන්ධය ගෙන යන්නේ. ඒ වාගේම මේ ලිපිය හා සම්බන්ධ බරපතළ තත්ත්වයක් මේකේ පෙන්නුම් කරනවා. නියෝජ්‍ය අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින්ම **නියෝජ්‍ය** අමාත්‍යවරයාගේ සමාගම ක්‍රියාත්මක වන වෙළෙඳ පොළේ මිල හා කොන්දේසි නියාමනය කරනවා. එය එතුමාගේම සමාගමක්. එතුමා නියෝජ්‍ය ඇමති ධුරය දරනවා. ඒ අතරතුර රජය සමඟ ගනුදෙනු පවත්වනවා. මේක ඔබේ මන්ත්‍රී ධුරය අහෝසි වෙන්න තරම් හේතුවක් වනවා, සත්‍ය චෝදනාවක් නම්. සත්‍ය චෝදනාවක් නම්!

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කථාව දැන් තනිකරම මා ගැන නේ කියන්නේ. ඒක හන්දා මා හිතන්නේ මා උත්තර දෙන්න අවශ්‍යයි කියලායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තත්පර 30ක් ඔබතුමාට ගන්න පුළුවන්.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
බොහොම ස්තුතියි.

මම මේ වගකීම භාර ගත්තු දා සිට මේ සමාගමට මම පැහැදිලිවම කිව්වා, රජයේ අලුතින් එන කිසිම කොන්ත්‍රාත්තුවකට bid කරන්න බැහැ කියලා. මෙතුමා මේ කියන ඔක්කෝම මම මේ තත්ත්වයට පත් වෙන්න ඉස්සෙල්ලා කරපු projects. ඒ projects අනුව මේ රටේ ඩිජිටල්කරණයට, මම සම්බන්ධ වන සමාගම් සක්‍රියව දායක වෙලා තිබෙනවා. විදේශ විනිමය වියදම් කරලා අන්තර්ජාතික වශයෙන් software ගන්නේ නැතුව ඒවා ඒ සමාගම් හරහා මේ රටේ හදන තත්ත්වය අපි ඇති කරලා තිබෙනවා. ඒ හරහා අපි RDA එකට ඔය කියන software ලබා දීලා තිබෙනවා, මීට පෙර. ඒවා දැන් නඩත්තු කරගෙන යනවා. නඩත්තු කිරීම් කරනවා විනා අලුත් projectsවලට අපි ගිහිල්ලා නැහැ. මම පැහැදිලිවම කියා තිබෙනවා, මම මෙතැන ඉන්න කල් මේ සමාගම් දෙකටම අලුත් projectsවලට යන්න බැහැ කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අමතරව තත්පර 45ක් දීලා තිබෙනවා. ඔබතුමා කථා කරන්න.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
හරි. මගේ වෙලාව ගත්තාද මන්දා, එහෙම නම්.

මා කියමින් සිටි කාරණාව මෙකයි. ජාතික ප්‍රවාහන ගනුදෙනු දත්ත Eimsky Business Solutions (Pvt.) Limited කියන සමාගම ඇතුළු පසුබිම් සපයන්නන් වෙත යන්නේ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික සමාගමට සමස්ත ජාතික ගනුදෙනු දත්ත පාලනය කිරීමේ අවස්ථාව ලබා දෙමින්ය කියන එක පැහැදිලියි. එතුමා මේ මොහොතේදී ඒකේ ඉන්නවාද නැද්ද කියලා ඉදිරි කාලයේදී අපට හෙළි වෙයි. හැබැයි, එය එතුමා CEO ලෙස ඉන්න ආයතනයක්. මෙන්න, ඡායාරූප තිබෙනවා. ඒ සියලු දේවල් එක්ක ගත්තාම, අධිවේගී මාර්ග ගාස්තු, ජාතික බස් ගාස්තු යනු රටේ පුරවැසියන්ගේ මුදල්. එම මුදල් කළමනාකරණය කරන පද්ධතිවල පාලනය රජයේ ඉහළම තනතුරක් දරන පුද්ගලයෙකුගේ සමාගමට හිමි වීම රජයේ විනිවිදභාවය හා සාධාරණත්වය පිළිබඳව නැවත සිතන්නට අපට බල කරනවා. ඒ නිසා මම නැවත කියනවා, මේ Eimsky Business Solutions (Pvt.) Limited සහ Omobio (Pvt.) Limited කියන සමාගම්වල සියලු රාජ්‍ය කොන්ත්‍රාත්තු පිළිබඳව විශේෂ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් හරහා හෝ විගණකාධිපති පරීක්ෂණයක් කරන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
එහෙම කියද්දීම, විගණකාධිපති පත් කරලා නැහැ නේ. දූෂණයට එරෙහිව ආපු ආණ්ඩුව විගණකාධිපතිවරයා තවම පත් කරලාත් නැහැ. ඉතින් මේ කියන පරීක්ෂණය අනිවාර්යයෙන්ම තේරීම් කාරක සභාවක් හරහා කරන්න කියලා කියනවා. හේතුව, ඔබට පෙරත් මෙවැනි චෝදනා CID එක හරහා තිබෙනවා. ඒකත් මතක් කරමින් තමයි මේ කථාව අවසන් කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කළ යුතුයි.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු **නියෝජ්‍ය** අමාත්‍යතුමනි, ඔබතුමාගේ කාලය තුළ ඔබතුමාට උත්තර සපයන්න පුළුවන්. මේක අලුත් වැඩක්. රටේ මිනිසුන්ටත් කියනවා, මේක මරු වැඩක්! කියලා.

එහෙම නම්, බොහොම ස්තුතියි අවස්ථාව ලබා දුන්නාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ ஞானமுத்து ஸ்ரீநேசன் அவர்கள்! உங்களுக்கு 5 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளது.

[பி.ப. 5.16]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு மிகக் குறைந்தளவு நிமிடங்களே ஒதுக்கப்பட்டுள்ளதால் மிக வேகமாகப் பேசவேண்டி இருக்கின்றது. முதலில், கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் அவர்களுக்குச் சில விடயங்களைக் கூறிவைக்க விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் மட்டக்களப்புக்கு விஜயம் செய்திருந்தீர்கள். எனினும், உங்களைச் சந்திக்கக்கூடிய சந்தர்ப்பம் எங்களுக்குக் கிடைக்கவில்லை. இருந்தாலும், நீங்கள் கல்லடி பிரதேசத்துக்கு வந்திருக்கிறீர்கள். அங்கு ஓர் ஐஸ் தொழிற்சாலை செயலிழந்து காணப்படுகின்றது. அதனை மீள இயக்குவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமென உங்களை அன்பாகக் கேட்டுக் கொள்கின்றேன். அந்தத் தொழிற்சாலை இயங்காமல் வீணாக அழிந்துபோகின்ற நிலைமை காணப்படுகின்றது. மீனவர்களுக்கு ஐஸ் கட்டிகளை உற்பத்தி செய்யவேண்டிய தேவை இருக்கின்றபடியால், தயவுசெய்து அதை இயங்கச்செய்து, அவர்களுக்கு உதவுமாறு கேட்டுக் கொள்கின்றேன்.

கடந்த காலங்களில் அரசியல் ரீதியாக மீனவர்களுக்கு மீன்பிடி உபகரணங்கள் கொடுக்கப்பட்டபோதிலும், சில ஏழை மீனவர்களுக்கு அவை கிடைக்கவில்லை. அவர்கள் இது தொடர்பில் முறைப்பாடு செய்திருக்கிறார்கள். அரசியல் சார்பற்ற முறையில் அவர்களுக்கும் கட்டாயம் அந்த உபகரணங்களைக் கொடுக்க வேண்டும்.

தற்போது மழைக் காலமாக இருக்கின்றது. வெள்ளம் பெருக்கெடுத்து இருக்கின்றபடியால், மீன்பிடித் தொழில் பாதிக்கப்பட்டு இருக்கின்றது. குறிப்பாக, மீனவர்கள் தொழிலுக்குச் செல்ல முடியாத நிலைமை ஏற்பட்டு இருக்கிறது. அவர்கள் நிவாரணங்களை வேண்டி நிற்கின்றார்கள். எனவே, இந்த விடயத்தையும் கௌரவ அமைச்சர் அவர்கள் கவனத்திற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

மட்டக்களப்பிலுள்ள வாகரை, களுவன்கேணி, தளவாய், நாவலடி, கல்லடி, கிரான்குளம், புதுக்குடியிருப்பு, செட்டிபாளையம், களுதாவளை, கல்லாறு, பால்சேனை என்பன கரையோரப் பகுதிகளைக் கொண்டிருக்கின்ற பிரதேசங்களாகும். இந்தப் பிரதேசங்களில் இறங்குதுறைகள் இல்லை. இதனால் மீனவர்கள் பாதிக்கப்படுகின்றார்கள். எனவே, இவற்றில் ஓரிரு இடங்களிலாவது இறங்குதுறைகளை அமைக்குமாறு உங்களிடம் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, விஞ்ஞானம் மற்றும் தொழில்நுட்பம் பற்றி சொல்ல வேண்டும். விஞ்ஞானம் மற்றும் தொழில்நுட்பத்தைத் தமது கைகளில் வலுவாகப் பற்றிக்கொண்டு இருக்கின்ற நாடுகள்தான் இன்று அபிவிருத்தியடைந்த நாடுகளாக இருக்கின்றன. இனவாதத்தையும் மதவாதத்தையும், ஊழல், மோசடியையும் கைகளில் பற்றிக்கொண்டு இருக்கின்ற நாடுகளால் அபிவிருத்தியடைய முடியவில்லை. எனவேதான் நான் சொல்கின்றேன், பாடசாலைகள், பல்கலைக்கழகங்கள், தொழிற்சாலைகள், விவசாயப் பண்ணைகள் என சகல இடங்களிலும் விஞ்ஞானமும் தொழில்நுட்பமும் உட்புகுத்தப்பட வேண்டும் என்று. விஞ்ஞானத்தையும் தொழில்நுட்பத்தையும் கையாளாமல், அடிப்படைவாதத்தையும் ஊழல், மோசடியையும் நாங்கள் கையாண்டுகொண்டு இருந்தபடியால்தான் எமது நாடு குட்டிச்சுவராகியது.

வாழைச்சேனை காகித ஆலை இன்றும் மரபு ரீதியாகவே இயங்கிக்கொண்டு இருக்கின்றது. அதேபோன்றுதான் கரடியனாறு விவசாயப் பண்ணையும் இயங்கிக்கொண்டு இருக்கின்றது. இது ஆயிரக்கணக்கான மக்களுக்குத் தொழில்வாய்ப்பைக் கொடுத்த பண்ணையாகும். இவ்வாறிருக்கின்ற சகல தொழிற்சாலைகளையும் பண்ணைகளையும் நவீனமயப்படுத்தி, விஞ்ஞான, தொழில்நுட்பத்தைக் கையாள்வதன்மூலம் நிச்சயமாக அபிவிருத்தி செய்ய முடியும் என்பதோடு, நாட்டையும் அபிவிருத்தி செய்ய முடியும். பாடசாலை மட்டத்தில் மாணவர்கள் விஞ்ஞான, தொழில்நுட்பத்தைக் கையாண்டு, பயிற்சிகளைப் பெற்று, திறன்களை வளர்த்துக்கொள்வதால், அவர்கள் சுயதொழில் வாய்ப்புகளை மேற்கொள்வதற்கும் வாய்ப்பு இருக்கின்றது.

தற்பொழுது, இச்சபையில் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும், விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சரும், டிஜிட்டல் பொருளாதாரப் பிரதி அமைச்சரும் இருக்கிறார்கள். நான் உங்களிடம் கேட்கின்ற விடயம் என்னவென்றால், பாடசாலைகள், பல்கலைக்கழகங்கள், தொழிற்சாலைகள், பண்ணைகள் என சகல துறைகளிலும் விஞ்ஞான, தொழில்நுட்பத்தை உட்புகுத்துமாறுதான். இவ்வாறு செய்வதன் ஊடாகத்தான் இந்த நாட்டை அபிவிருத்தி செய்ய முடியும்; வளமான நாடாகக் கட்டியெழுப்ப முடியும். கடந்த காலங்களில் கையாளப்பட்ட அடிப்படைவாதம், ஊழல், மோசடிகள் எமது கைகளில் இருக்கும்வரை இந்த நாடு அபிவிருத்தி அடையாது. எனவே, சரியான பாதையில் செல்ல வேண்டுமென தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் அவர்களே, மட்டக்களப்பு மாவட்டம் கரையோர மாவட்டமாக இருக்கின்றபடியால், அங்கு மீனவர் தொடர்பான பிரச்சினைகளும் மீன்பிடி தொடர்பான பிரச்சினைகளும் நிறையவே இருக்கின்றன. இப்பொழுது, தாழமுக்க நிலைமையும் காணப்படுகின்றபடியால், அவர்கள் பல்வேறுபட்ட பிரச்சினைகளை எதிர்கொண்டு இருக்கிறார்கள். அதற்கான பரிகாரங்களை முறையாகச் செய்ய வேண்டுமென உங்களிடம் கேட்டுக் கொள்கின்றேன். நீங்கள் அடிக்கடி எங்களோடு தொடர்பு கொள்கின்றவர்; பிரச்சினைகள் தொடர்பாக எங்களுடன் நேருக்குநேர் கதைக்கின்றவர். இந்தப் பிரச்சினைகளையும் நீங்கள் கவனமாகக் கையாள வேண்டும். கௌரவ கந்தசாமி பிரபு அவர்களுக்கும் இந்த விடயம் தெரியும்! அவரும் இந்த விடயங்கள் பற்றி பேசியிருக்கிறார். எனவே, மீனவர்களின் பிரச்சினையை கட்சி பேதங்களுக்கு அப்பாற்பட்டு, முறையாகக் கையாண்டு சரியாகத் தீர்த்து வைக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

விஞ்ஞான, தொழில்நுட்பத்தை மிகத் துரிதமாக மக்கள் மத்தியில் கொண்டுசென்று, அவர்கள் தொழில்வாய்ப்புகளைப் பெறக்கூடிய நிலைமையை ஏற்படுத்த வேண்டும். இப்போது தொழில்வாய்ப்பில்லாமல் HNDE டிப்ளோமாதாரிகளும், சுதேச வைத்தியத்துறையில் பட்டம் பெற்றவர்கள் உட்பட ஏனைய பட்டதாரிகளும், பொறியியலாளர்களும் கஷ்டப்பட்டுக்கொண்டு இருக்கிறார்கள். இவர்கள் தொழில்வாய்ப்புகளைப் பெறுவதற்கு விஞ்ஞான, தொழில்நுட்பத்தை முறையாகப் பயன்படுத்த வேண்டும். இவர்களுக்குப் பயிற்சிகளைக் கொடுத்து, திறன்களை வளர்த்து, அவற்றை ஆற்றுகைசெய்வதற்கு வழிப்படுத்த வேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සෙල්ලා විපක්ෂයෙන් කථා කරපු මන්ත්‍රීතුමා නගපු චෝදනා ගැන මම පොඩි පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි. එතුමා කිව්වා, Omobio (Pvt.) Limited සහ Eimsky Business Solutions (Pvt.) Limited කියන සමාගම්වලින් RDA එකේ toll gate project එකක් කරනවා කියලා. මම මගේ බලය පාවිච්චි කරලා මේ toll gate project එකක් මගේ සමාගම්වලට දීලා තිබෙනවා කියලා අභූත

[ගරු එරංග වීරරත්න මහතා]

චෝදනාවක් කළා. මට මේ සමාගම් දෙකේ අයිතියක් තිබෙනවා. ඒ, Eimsky Business Solutions (Pvt.) Limited සහ Omobio (Pvt.) Limited කියන සමාගම් දෙක. මමත් IT ඉංජිනේරුවරයෙක්. මම මේ තත්ත්වයට එන්න ඉස්සෙල්ලා ව්‍යවසායකත්වයේ හිටියේ, මේ සමාගම්වල. ඒ හරහා අපි මේ රටේ විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ ඩිජිටල්කරණයට සැහෙන්න සම්බන්ධ වෙලා ඩිජිටල්කරණ වැඩසටහන් කරලා තිබෙනවා. ඒකෙන් කරපු එක project එකක් තමයි ඔය RDA toll gatesවලට කරපු project එක. මේ project එක කරලා තිබෙන්නේ, 2019දී. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2019ට පෙර - අප එන්න පෙර - මේ projects ක්‍රියාත්මක වුණේ Chinese සමාගම්වලින්. අපි තමයි ලංකාවේ මේ toll gate system එක හදලා RDA එකට දුන්නේ. ඒ හරහා ඇත්තටම අපට පුළුවන් වෙලා තිබෙනවා, විදේශ රටවලින් මේ systems ගන්නේ නැතුව, ලංකාවේම හදන්න. ඒකට අපි පෙරමුණ අරගෙන ඒ කාලයේ වැඩ කළා. මම ඒවා නැහැ කියන්නේ නැහැ. නමුත් ඒ කියපු system එක මම කියපු විධියට 2019දී තමයි අපි ලබාගෙන තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, කෙටියෙන් අවසන් කරමු.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒක දැනට නඩත්තු වෙගන යනවා. මොකද, මොකක් හරි ඒ වාගේ IT system එකක් කුමන හෝ සමාගමකින් කළාම, ඒ සමාගමෙන් එය නඩත්තු කරන්න අවශ්‍යයි. නමුත් මම පැහැදිලිව කියනවා, මෙතැනින් එහාට මම ඉන්න ඔය සමාගම් දෙක රජයේ projects ගන්න යන්නේ නැහැ කියලා. මම මේ තනතුරේ ඉන්න තාක් කල් සහ මට ඒ සමාගම්වල අයිතිය තිබෙනකම් රජයේ projects ගන්න යන්නේ නැහැ කියන ඒ ස්ථාවරයේ පැහැදිලිවම ඉන්නවා. ඒ වාගේම මම මේ තනතුරේ ඉන්න නිසා ඒ සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරි - CEO - කියන තනතුරින් අයින් වෙලා තමයි දැන් වැඩ කරන්නේ. දැන් මම මේ තනතුරේ විතරයි වැඩ කරන්නේ. මම ඒ සමාගම්වලින් ඈත් වෙලා වැඩ කරන අතර, ඒ සමාගම්වලට රජයේ projects ගන්න බැහැ කියන ස්ථාවරයේ ඉන්නවා. ඒක හින්දා මොකක් හරි ගැටලුවක් තිබෙනවා නම් ඒ විපක්ෂයේ මන්ත්‍රීතුමාට ඕනෑම දෙයක් හොයලා බලන්න පුළුවන්. ඒ ගැන හංගන්න කිසිම දේකුත් නැහැ. ඒ වාගේම මෙතැනට ඇවිල්ලා ඔය වාගේ වැරදි, අභූත චෝදනා නගලා රට නොමඟ යවන්න එපා කියන එකත් කියන්න කැමතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මම එක කරුණක් දැන ගන්න කැමැතියි, මේක අලුත් කරුණක් නිසා. ඔබතුමා නාමයෝජනා දෙන දවසේත් ඒ සමාගම්වල CEO; ඔබතුමා ජාතික ලැයිස්තුවෙන් පත් වෙන දවසේත් CEO. ඊට පසුව තමයි ඔබතුමා ඒ තනතුරුවලින් ඉවත් වුණේ; අධ්‍යක්ෂ තනතුරුවලින් ඉවත් වුණේ. අද වෙනකොට ඔබතුමාගේ පවුලේ කෙනෙකුට අධ්‍යක්ෂ ධුර පවරා තිබෙනවා. ඒ කථාව ඇත්තද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නියෝජ්‍ය ඇමතිතුමා, විනාඩියක කාලයක් අරගෙන පැහැදිලි කරන්න. විවාදයකට යන්න ඕනෑ නැහැ.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
මම මේ තනතුර භාර ගන්න දවසේ ඒ තනතුරුවලින් ඉවත් වුණා. CEO තනතුරෙන් ඉවත් වෙලා තිබෙන්නේ. පවුලේ කාටවත් භාර දීලා නැහැ. ඒ ආයතනයේ වැඩ කළ වෙනත් පුද්ගලයෙක් Acting CEO විධියට වැඩ කරනවා. එච්චරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය කථාව පටන් ගන්න.

[අ.භා. 5.25]

**ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ගනු ලබන අමාත්‍යාංශ ත්‍රිත්වය අතරින් මගේ අවධානය යොමු කරන්න කැමැතියි විශේෂයෙන්ම විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය කෙරෙහි. මේ වනතෙක් අපි ඉතාම සාරගර්භ විවාදයක් පවත්වාගෙන ගියා. නමුත් විපක්ෂය මතු කළ යම් යම් ප්‍රශ්නවලටත් පිළිතුරක් ලබා දෙමින්, මගේ කථාව පටන් ගන්න කැමැතියි.

විශේෂයෙන්ම මීන් පෙර කථා කළ විපක්ෂයේ මන්ත්‍රීතුමා විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය සම්බන්ධව සඳහන් කළා. ආණ්ඩුවක් විධියට ප්‍රතිපත්ති සම්පාදනය කරන්නට අපට විශාල වශයෙන් උදව් කළ විශාල පිරිසක් හිටියා. ඒ අය අතරින් මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි, මහාචාර්ය ගෝමික උඩුගමසූරිය මහතා ඇතුළු ඒ කණ්ඩායම. විද්‍යා ප්‍රතිපත්තියක් නොතිබිච්ච රටකට නිසි විද්‍යා ප්‍රතිපත්තියක් හඳුන්වා දෙමින්, එතැනින් එහාට පර්යේෂණ - research - and development කරන්නට අපට විශේෂ අවස්ථා ලබා දීලා තිබෙනවා. ඒ වාගේම එප්පාවල පොස්පේට් නිධිය සම්බන්ධව මේ වන විට තිබෙන update එක මොකක්ද, මේ වන විට තිබෙන තත්ත්වය මොකක්ද කියලා ප්‍රශ්නයක් මතු කළා. විපක්ෂයේ ඒ මන්ත්‍රීතුමාට සහ සියලුදෙනාට මම මතක් කරන්න කැමැතියි, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ අපට Cabinet approval ලැබී තිබෙන බව, ඒකට EoIs call කිරීම සඳහා. Investorsලා 14දෙනෙක් ඒ සඳහා ආයෝජනය කරන්න කැමැත්තෙන් ඉන්නවා. ඒ අනුව අපි ඉතා ඉක්මනින්ම ත්‍රිකුණාමලයේ ඒ plant එක establish කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම සල්ෆියුරික් plant එක ගැනත් විමසුවා. එහිත් දෙවැනි අදියරේ - phase II - කටයුතු කරගෙන යනවා. ඒ නිසා අපි විපක්ෂයට කියනවා, gossip විධියට කරුණු කියන්නේ නැතුව, විවාදයකට එන්න පෙර, කරුණු කියන්න පෙර, update වෙන්න, research කරන්න, එතකොට ඔබට හරි තොරතුරු හම්බ වෙයි කියලා.

මේ අමාත්‍යාංශය ගැන අපි සාකච්ඡා කළ යුත්තේ හුදෙකලා අමාත්‍යාංශයක් විධියට නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මේ අමාත්‍යාංශය අපේ රටේ තිබෙන සියලු ප්‍රශ්නවලට පිළිතුරු උත්පාදනය පුළුවන් අමාත්‍යාංශයක්. විශේෂයෙන්ම 2026 වසරේ අපේ ප්‍රධාන ඉලක්කයක් වන දිළිඳුකම පිටුදකිමින් ග්‍රාමීය ආර්ථිකය දියුණු කිරීමේදී මේ අමාත්‍යාංශයට කරන්නට හැකි බොහෝ දේ තිබෙනවා. Vidatha Action Plan එක සඳහාත් Cabinet approval එක ලැබී තිබෙනවා. ඒ අනුව Vidatha Resource Centres 73ක් සඳහා රුපියල් මිලියන 75කට ආසන්න මුදලක් වෙන් කරලා, ඒවා නවෝත්පාදන අංශ විධියට දියුණු කරන්නට අපි අවස්ථාව ලබා දීලා තිබෙනවා, "ගමට තාක්ෂණය" කියන සංකල්පය ඔස්සේ. ඒ හරහා කුඩා ව්‍යාපාර හිමියන්ට සහ ව්‍යවසායකයන්ට විශාල අවස්ථාවක් ලැබෙනවා. මොකද අපි දන්නවා, මීට පෙර විදාතා සම්පත් මධ්‍යස්ථානවල කෙරුණේ කොහෙන් හරි පරීක්ෂණ ටිකක් අරගෙන ඇවිල්ලා වැඩමුළුවක් විධියට ඒවා display කළ එක විතරක් බව. නමුත් ඒ නිලධාරින් සියලුදෙනාම එකතු කරගෙන දැන් අපට අවස්ථාව ලැබී තිබෙනවා, ව්‍යාපාරිකයන්ට Vidatha Resource Centres හරහා ඒ තාක්ෂණය ප්‍රගුණ කරන්නට, ඒවායේ ප්‍රතිලාභ ලබා ගන්නට අවස්ථාව හදලා දෙන්න. ඒ තුළින් කුඩා ව්‍යාපාර නඟාසිටුවන්න අපට අවස්ථාව ලැබෙනවා.

මම ගාල්ල දිස්ත්‍රික්කයයි නියෝජනය කරන්නේ. ඔබතුමන්ලා දන්නවා, කරන්දෙනිය කියන්නේ කුරුඳුවලට ඉමහත් ප්‍රසිද්ධියක් උසුලන ප්‍රදේශයක් බව. ඒ වාගේම අපි මෙවර අය වැයෙන් ශූන්‍ය අපද්‍රව්‍ය සංකල්පය යටතේ කාර්මික තාක්ෂණ ආයතනය යටතේ කරන්දෙනිය ප්‍රදේශයේ කුරුඳු සඳහා මධ්‍යම පිරිසැකසුම් මධ්‍යස්ථානයක් සකස් කිරීම සඳහා සැලසුම් දියත් කරලා තිබෙනවා. ඒ යටතේ value-added concept එක යටතේ අගය එකතු කිරීමේ නිෂ්පාදන ජාලයක් අත්පත් කර ගැනීමේ හැකියාවක් අපට තිබෙනවා. ඒ වාගේම කුරුඳු ආශ්‍රිතව තවත් බොහෝ කර්මාන්ත, එහෙම නැත්නම් by-products නිර්මාණය කිරීමේ හැකියාවක් අපට ඒ හරහා ලැබෙනවා.

ඊළඟට, STEM අධ්‍යාපනය සම්බන්ධව අපේ මැදිහත්වීම කොහොමද කියලා විපක්ෂ නායකතුමාත් ඇහුවා. ජාතික විද්‍යා පදනම යටතේ අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ පදනම වෙලා තිබෙන විදූහුරු සමාජයක් නිර්මාණය කිරීම සඳහා STEM අධ්‍යාපනය දියුණු කරන්නේ කොහොමද කියන එක සම්බන්ධවත් කථා කරනවා. ඒ නිසාම අපි 2025 වසරේදී පාසල් 100ක young inventors' clubs ඇති කරලා තිබෙනවා. Robotics, AI වාගේ තාක්ෂණය සම්බන්ධව අලුත් generation එකට අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අපි පාසල් 100ක් තෝරා ගත්තා. 2026 වසරේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණත් සමඟ තමන්ගේ ළැදියාව, තමන්ගේ කැමැත්තත් එක්ක පාසල් 1,000කට young inventors' clubs හඳුන්වා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, විශ්වවිද්‍යාල හා "විදාතා" සහයෝගීතාව යටතේ ව්‍යවසාය නවෝත්පාදන මධ්‍යස්ථාන තවදුරටත් නිර්මාණය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ යටතේ වවුනියාව, අග්නිදිග සහ රුහුණ විශ්වවිද්‍යාලවලට මෙන්න මේ කියන incubation centres විධියට, නිෂ්පාදන මධ්‍යස්ථාන විධියට අපට මේවා වැඩිදියුණු කිරීමේ හැකියාවක් තිබෙනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙකුත් අසා සිටියා, පෞද්ගලිකව මේ research and developmentවලට ළැදියාවක් තිබෙන අයට මොකක්ද වෙන්නේ කියලා. අපි කියන්න කැමැතියි, අන්න ඒ අයට තමයි මේ අවස්ථාව තිබෙන්නේ කියලා. ලංකාවෙන් එපිටට ගිය, research and developmentවලට කැමැත්තක් තිබෙන සියලුම විද්‍යාර්ථීන්ට, ඒ වාගේම විශේෂඥයන්ට අපි ආරාධනා කරනවා, ඔබේ දැනුම, ඔබේ අත්දැකීම්, ඔබේ සියලුම දේවල් මේ රට ගොඩ නඟන්න අපට ලබා දෙන්න කියලා. අපි අවස්ථාවක් හදමින් තිබෙනවා, research and development පහසුකම් විශ්වවිද්‍යාල මට්ටමින් centres විධියට ආරම්භ කරන්න. එතැනදී පෞද්ගලික අංශයටත් ඒවාට මැදිහත් වෙලා තමන්ගේ තිබෙන ගැටලුවලට පිළිතුරු ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. එම නිසා අපේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තියේ පදනම වෙන්නේ research into practice සහ lab into market කියන එකයි. විද්‍යා ප්‍රතිපත්තියක් කියලා කොහේ හෝ තිබෙන මොකක් හරි දෙයක් අපට ගැළපෙනවා ද, නොගැළපෙනවා ද කියලා බලනවාට වඩා, package එකක් විධියට මේ මොහොතේ අපේ අවසාන ඉලක්කය වන "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" වෙනුවෙන් අමාත්‍යාංශයක් විධියට අපට මැදිහත්වීම කරන්න පුළුවන් කොහොමද කියලායි අපි බලන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතන අතර සම්බන්ධීකරණයක් නැහැ කියලා විපක්ෂයේ මන්ත්‍රීවරයකු සඳහන් කළා. ඒ වෙනුවෙනුත් අපි අමාත්‍යාංශයක් විධියට සියලුම නිලධාරින් එකතු කරගෙන ප්‍රතිපත්තියක් හදලා තිබෙනවා. ඒ ප්‍රතිපත්තිය මත තමයි සියලුම මුදල් වෙන් කිරීම් සිද්ධ කරන්නේ. එම නිසා භෞතික ප්‍රගතිය වාගේම සංවර්ධනයට අපි අලුත් නිර්වචනයක් දෙන්න ඕනෑ. ප්‍රතිපත්තියක් සහිත සංවර්ධනයක් කියන නිර්වචනය අපි දෙන්න ඕනෑ. ඒ නිසා, මේ රටේ සියලුම ජනතාවට වාගේම දැනුම ලබා දෙන්න බලාපොරොත්තුවෙන් සිටින අපේ සියලුම expertsලාට අපි නැවත වතාවක් ආරාධනා කරනවා, අපි දැන් විද්‍යාවේ නව පුනරුදයක් ආරම්භ කර තිබෙනවා, ඒ නිසා ඔබේ දැනුම අපේ රටට දෙන්න කියලා. අපි කොච්චර මෙතැන කථා කළත්, විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් මිනිසුන් කල්පනා කරන්නේ, අපට ඒකෙන් ලැබෙන්නේ මොනවාද කියන එකයි. එහෙම නම්, සර්ව ආර්ථික ස්ථායීකරණය තුළින් අපි බලාපොරොත්තු වන්නේ එහි ප්‍රතිලාභ ගමේ සිටින ජනතාවට, බිමේ සිටින ජනතාවට, ව්‍යාපාර කරන්න කැමැත්තෙන් සිටින තරුණ ප්‍රජාවට ලබා දීමයි. එහි ප්‍රතිලාභ ඒ අයට ලැබෙන විධියට, ගමටම, බිමටම මේ ප්‍රතිලාභ අරගෙන යන විධියට රජය කරන සියලු වැඩ කටයුතු සඳහා අමාත්‍යාංශයක් විධියට අපි උපරිම දායකත්වය දෙනවා. මෙහිදී අපට උදව් කරන, අපට මහ පෙන්වීම් කරන සියලුම ආයතන ප්‍රධානීන්ට, රාජ්‍ය නිලධාරින්ට වාගේම expertsලාටත්, විශේෂඥ දැනුම සහිත කණ්ඩායම්වලටත් ස්තුතිය පුද කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මං නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ அமிர்தநாதன் அடைக்கலநாதன் அவர்கள்! உங்களுக்கு 9 நிமிடங்கள் உள்ளது.

[பி.ப. 5.33]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உண்மையிலேயே நான் உங்களைப் பாராட்டுகின்றேன். ஏனெனில், நீங்கள் தமிழ்ப் பெயர்களைச் சரியாக உச்சரிக்கிறீர்கள். இன்றைய தினம் நடைபெறுகின்ற கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்கு வாய்ப்பளித்தமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

[ගරු අමීර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

1980ஆம் ஆண்டு வடக்கு மாகாணம் நாட்டின் மிகப் பெரிய மீன் உற்பத்தி மையமாக இருந்தது. அது தேசிய மீன் உற்பத்தியில் 49 சதவீதத்தை வழங்கியிருந்தது. 1983ஆம் ஆண்டு மோதல் தீவிரமாவதற்கு முன்னர், வட மாகாணம் கடல்சார் மீன்பிடியில் சுமார் 40 சதவீதத்தை வழங்கியது. அந்தக் காலகட்டத்தில் வடக்கு, கிழக்கு மாகாணங்கள் இணைந்து, மொத்த மீன் உற்பத்தியில் 64 சதவீதத்தை வழங்கியது. எங்களுடைய வடக்கு, கிழக்கு மாகாணங்கள் மிகப் பெறுமதியான கடற்பரப்பைக் கூடுதலாகக் கொண்டுள்ளதோடு, எங்களுடைய மீனவர்களுக்கு வருமானத்தை ஈட்டிக்கொடுக்கின்ற கடற்றொழில்சார் மையமாகவும் விளங்குகின்றன. எனினும், அங்குள்ள மீனவர்கள் கடலில் பல கிலோமீற்றர் தூரம் சென்று, வெயிலையும் மழையையும் இயற்கை அனர்த்தங்களையும் தாங்கிகொண்டு மிகவும் கஷ்டப்பட்டு மீன் பிடிக்கின்றார்கள். எனினும், பணம் கொடுத்து அவர்களை மீன்பிடிக்க அனுப்புகின்ற தனியார் நிறுவனங்களும், முதலாளிமாரும் தங்களுக்குத்தான் அந்த மீன்களைக் கொடுக்க வேண்டுமெனச் சொல்வதனால், அவர்கள் பொருளாதார ரீதியாக உயர்வடைவது மிகக் குறைவாக இருக்கின்றது.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விடயத்தில் கவனம் செலுத்த வேண்டும். எங்களுடைய மீனவர்கள் பிடிக்கின்ற மீன்களை அரசாங்கம் கொள்வனவு செய்யும் வகையிலான ஒரு திட்டத்தை நீங்கள் கொண்டுவர வேண்டும். அதற்கு நீங்கள் முதலில் என்ன செய்ய வேண்டும் என்றால், அந்த முதலாளிமாருடைய கைகளிலிருந்து அந்த மீனவர்களை விடுவிக்க வேண்டும். வலைகள் என்றாலும் சரி, boats என்றாலும் சரி, motor-engine என்றாலும் சரி, எங்களுடைய மீனவர்கள் தங்களுடைய உடைமைகளை வங்கியில் ஈடுவைத்து, கடன்பெற்றே அவற்றை வாங்குகின்றார்கள். இவ்வாறு எங்களுடைய மீனவர்கள் மிகவும் கஷ்டப்பட்டுத் தொழில் செய்கின்றதொரு நிலைமையே காணப்படுகின்றது.

கௌரவ அமைச்சர் அவர்களே, மழை வெள்ளத்தால் வயல் நிலங்கள் பாதிக்கப்படால், அந்தப் பாதிப்பை மதிப்பீடு செய்து, அவற்றுக்கு நஷ்டஈடு வழங்குவது வழக்கம்! எனினும், எங்களுடைய மீனவச் சமூகத்துக்கு எவ்வாறு நஷ்டஈட்டைக் கொடுக்க முடியும்? அவர்கள் கடலில் பல இலட்சம் ரூபாய் பெறுமதியான வலைகளை வீசுகின்றபோது, அங்கு வருகின்ற இந்திய trawlers அவற்றை இழுத்துச் செல்கின்றன. மேலும், கடல் அலையின் வேகம் காரணமாகவும் அவை இழுத்துச் செல்லப்படுகின்றன. இவ்வாறு அவர்களுடைய முதலீடுகள் அழிவடைகின்றபோது, எப்படி உங்களால் அவர்களுக்கு நிவாரணத்தைக் கொடுக்க முடியுமெனக் கேட்கின்றேன். இன்று எங்களுடைய மீனவச் சமூகம் மிக மோசமானதொரு நிலையிலே இருக்கின்றது.

இயற்கை அனர்த்தம் சொல்லிவிட்டு வருவதில்லை. மன்னார், யாழ்ப்பாணம் உட்பட வடக்கிலுள்ள எங்களுடைய மீனவர்கள் ஆறு மாதம் தொழில் செய்தால், மிகுதி ஆறு மாதம் இயற்கை அனர்த்தத்தால் அவர்கள் பாதிக்கப்படுகின்றார்கள். அவர்களுக்கு என்ன நிவாரணம் இருக்கின்றதெனக் கேட்கின்றேன். கௌரவ அமைச்சர் அவர்கள், எங்களுடைய மக்களோடு கூடவே இருந்து செயற்படுகின்ற ஓர் அமைச்சர்! கடந்த காலங்களிலும் சரி, இப்பொழுதும் சரி, எங்களுடைய மக்களின் வாழ்வாதாரத்தை உயர்த்துவதற்கு குறிப்பாக, மீனவச் சமூகத்தின் வாழ்க்கையை மேம்படுத்துவதற்கு நாங்கள் என்ன திட்டங்களை வைத்திருக்கிறோம்?

காப்புறுதி என்றால், அதற்குரிய தவணைப் பணத்தை அவர்களே செலுத்த வேண்டுமெனச் சொல்லப்படுகின்றது. கடந்த அரசாங்க காலத்தில் 60:40 என்ற விகிதத்தில் அது இருந்தது. அதாவது, அரசாங்கம் 60 சதவீதத்தைச் செலுத்தினால், மிகுதி 40 சதவீதத்தை மீனவர்கள் செலுத்த வேண்டுமென்ற ஒரு திட்டமிருந்தது. இப்பொழுது அந்தப் பணத்தை மீனவர்களே முழுமையாகச் செலுத்த வேண்டுமெனச் சொன்னால், அவர்களால் எப்படிச் செலுத்த முடியும்? கௌரவ அமைச்சர் அவர்களே, அவர்கள் உழைப்பின்மூலம் பெறுகின்ற ஊதியத்தை வைத்துத்தானே அதனைச் செலுத்த வேண்டும். இன்று முதலாளிமார் எங்களுடைய மீனவர்களைத் தங்களுடைய கட்டுப்பாட்டுக்குள் வைத்துக்கொண்டு இருக்கின்ற சூழலில், எப்படி அவர்களால் காப்புறுதி செய்ய முடியுமெனக் கேட்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, விவசாயிகளுக்கு insurance வழங்கப்படுகின்றது; நஷ்டஈடு கொடுக்கப்படுகின்றது; நெல்லுக்கு விலை நிர்ணயம் செய்யப்படுகின்றது. காலம் தாழ்த்தியேனும் அரசாங்கம் நெல்லுக்கான விலையை நிர்ணயிக்கின்றது. எனினும், எங்களுடைய மீனவர்களின் மீன்களுக்கு விலை நிர்ணயம் இல்லை. எனவே, எங்களுடைய மீனவர்களிடமிருந்து அரசாங்கம் மீன்களைக் கொள்வனவு செய்ய வேண்டும். எங்களுடைய மீனவர்களிடம் போதியளவு குளிரூட்டிகள் இல்லை. இதனால் அவர்கள் பிடிக்கின்ற மீன்களை இரவிரவாக கொழும்புக்குக் கொண்டு வருகின்றார்கள். கொழும்பில் பல்லாயிரக்கணக்கான ரூபாய் இலாபம் பெறுவதற்கு வாய்ப்பு இருக்கிறது. எனினும், எங்களுடைய மீனவர்களால் கொண்டுசெல்லப்படுகின்ற மீன்களுக்கான விலை குறைவாகவே மதிப்பிடப்படுகின்றது.

நான் முதலில் சொன்னதுபோல, எங்களுடைய மீனவர்களின் மீன்களை அரசாங்கம் கொள்வனவு செய்வதற்குரிய நடவடிக்கைகளை மேற்கொண்டால்தான் அவர்களுடைய வாழ்க்கை மீட்சியடைவதற்கு வாய்ப்பு ஏற்படும். எனவே, அரசாங்கம் அதனைச் செய்ய வேண்டும். அவ்வாறு செய்தால்தான் எங்களுடைய மீனவர்களுடைய வாழ்க்கையை மேம்படுத்தலாமே ஒழிய, அவர்களைக் காப்பாற்றக்கூடிய எந்தவொரு திட்டமும் இல்லாமல் செயற்படுவதென்பது மிகவும் கஷ்டமான விடயமாகும். முதலாளிமார் எங்களுடைய மீனவக் கிராமங்களைத் தங்களுடைய கைகளில் வைத்திருக்கையில், எப்படி எங்களுடைய சாதாரண மீனவர் முன்னேற முடியுமெனக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் எங்களுடைய மீனவச் சமூகத்தின் கல்வி தொடர்பில் கவனம் செலுத்த வேண்டும். தான் வெய்யிலில் காய்ந்தாலும் பரவாயில்லை, மழையில் நனைந்தாலும் பரவாயில்லை, எந்தக் கஷ்டங்களை அனுபவித்தாலும் பரவாயில்லை, செத்தாலும் பரவாயில்லை என்ற தியாக மனப்பான்மையோடு தொழில் செய்கின்ற எங்களுடைய மீனவர்கள், தங்களுடைய பிள்ளைகளைக் கல்வியில் முன்னேற்ற வேண்டுமென நினைக்கின்றார்கள். நீங்கள் அவர்களுடைய ஆர்வத்தை இனங்கண்டு, மீனவச் சமூகம் சார்ந்த பிரதேசங்களிலுள்ள கல்விக்கூடங்களை மேம்படுத்த வேண்டும். அது nurseryஆக இருக்கலாம்; பாடசாலையாக இருக்கலாம். இதனைக் கல்வி அமைச்சர்தான் செய்ய வேண்டுமென நீங்கள் நினைத்துவிடக் கூடாது. உங்களுடைய காலத்திலாவது சாதாரண ஒரு மீனவன் செல்வந்தனாக மாறியிருக்கிறான் என்று சொல்லக்கூடிய அளவுக்கு, உங்களுடைய அமைச்சு இந்தச் செயற்பாட்டைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

நேரம் போதாமையால் இன்னுமொரு வேண்டுகோளை மாத்திரம் கௌரவ அமைச்சர் அவர்களிடம் விடுக்கின்றேன். பேசாலையில் சந்தைக் கட்டிடம் ஒன்று இல்லை. ஆனாலும், அங்கு உங்களுடைய Ministry of Fisheriesக்குச் சொந்தமான ice factory ஒன்று இருக்கின்றது. அதில் குறிப்பிட்டதோர் இடத்தைக் கொடுத்தால், அந்த இடத்தில் சந்தைக் கட்டிடத்தைக் கட்டுவதற்கான வாய்ப்பை உருவாக்க முடியும். எனவே, இதனை கௌரவ அமைச்சர் அவர்கள் கவனத்திலெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அன்றாடம் வெய்யிலிலும், தூக்கமின்றிக் கண்விழித்தும் தமது குடும்பத்தைக் காப்பதற்கு நினைக்கின்ற மீனவர் சமூகத்தின் வாழ்க்கைத் தரத்தை உயர்த்துவதற்கான திட்டங்களை நீங்கள் வகுக்க வேண்டுமென மீண்டும் கேட்டு, வாய்ப்பளித்தமைக்கு நன்றி கூறி, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.43]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම ස්තුතිවන්ත වනවා, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත බලගැන්වීමට අදාළ සංශෝධන මේ රජය විසින් ගෙන හැර දැක්වීම ගැන. එම පනත ක්‍රියාත්මක වීම තවමත් සම්පූර්ණයෙන් සිදු වෙලා නැහැ. එම පනත කෙටුම්පත් කරන්න මූලික වෙච්ච පුද්ගලයා හැටියට මට සතුටක් තිබෙනවා, කාලය ගත වුණත් මේ රටේ ආර්ථිකයට ඉතා වැදගත් වන data protection නීතිය ඉදිරියට ගෙන යෑම සඳහා ආණ්ඩුවේ කැපවීම ගැන. තවදුරටත් කඩිනමින් ආයෝජනය කරලා ඒ සඳහා අවශ්‍ය ශක්තිය ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

Cyber Security Bill එකත් කෙටුම්පත් වෙලා තිබෙනවා කියලා හැම දාම කියනවා. හැබැයි, එය තවම අපට පාර්ලිමේන්තුවේ විවාද කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. ක්ෂේත්‍රයේ ඉන්න හැමෝම කැමැතියි, cyber security සම්බන්ධයෙන් වූ නීතිය පාර්ලිමේන්තුවේ සම්මත වනවා දකින්න. එම පනත් කෙටුම්පත පිළිබඳව වාද විවාද ගොඩක් තිබුණා. මම විෂය භාර ඇමැතිවරයා හැටියට සිටි කාලයේ එම පනත් කෙටුම්පත සකස් කර සම්පූර්ණයෙන් අවසන් කළා. පසුව බලයට ආ ගෝඨාභය රාජපක්ෂ රජය එම පනත සම්පූර්ණයෙන් වෙනස් කළා. දැන් නැවත ඔබතුමන්ලාගේ රජය එම පනතට සංශෝධන ගෙනැවිත් තිබෙනවා. ඔබතුමන්ලාට එයට අයිතියක් තිබෙනවා. Cyber security හා සම්බන්ධව අලුත් නීතියක් මෙරටට ඉතාම අවශ්‍යයි. එම නිසා එය කඩිනමින් ගෙන ඒම අවශ්‍යයි. එම නිසා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට එය හැකි ඉක්මනින් ඇතුළු කරලා, සම්මත කර ගැනීමට කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

අපේ අමිල ප්‍රසාද් සිරිවර්ධන තරුණ මන්ත්‍රීතුමා අද දින වැදගත් කරුණක් හෙළි දැක්වුවා. ඒ ගැන මම එතුමාට ස්තුතිවන්ත වනවා. එතුමාගේ කථාවේදී මතු වෙච්ච කරුණුවලට අමතරව යම් කරුණු කිහිපයක් මම එතුමාගෙන් විමසා සිටියා. ඉන් පසුව මම ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිතුමාගෙන් විමසා සිටියා, ඒ සම්බන්ධව එතුමාගේ ස්ථාවරය මොකක්ද කියලා. ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, එතැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය මෙහෙමයි. අපේ රටේ නීතියට අනුව පාර්ලිමේන්තු මැතිවරණයට නාම යෝජනා භාර දෙන දවසට රජය සමඟ යම් ගිවිසුමක් තිබෙන කෙනෙක් ඒ සඳහා නුසුදුසු වනවා. ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති, ඩිලාන් පෙරේරා එරෙහිව රාජිත සේනාරත්න නඩුවේදී වෛද්‍ය රාජිත සේනාරත්න මහත්මයාට ජාතික ලැයිස්තුවෙන් ලැබුණු මන්ත්‍රීකම නැති වුණේ ඒ කාරණය මත බව. ගරු එරංග වීරරත්න නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා නාම යෝජනා භාර දෙන දවසේ එම සමාගමේ කොටස් හිමිව තිබුණු බව ඔබතුමා පිළිගන්න, අදටත් ඔබතුමාට කොටස් තිබෙන එම සමාගම සමඟ රජයේ ගිවිසුමක් තිබුණා. ඒ, ඔබතුමා කියන පරිදි. නීත්‍යනුකූලව නම් ඔබතුමා එම ගිවිසුමෙන් ඉවත් වෙලා නාම යෝජනා භාර දෙන්න ඕනෑ.

ගාල්ල ආසනයෙන් 1977දී පත් වුණු ඇල්බට් සිල්වා මන්ත්‍රීතුමාටත් ඒ ප්‍රශ්නයමයි ඇති වුණේ. ඒ වෙලාවේ Ceylon Petroleum Corporation එක සමඟ එතුමාට ගිවිසුමක් තිබුණා. ඒ මත එතුමාගේ මන්ත්‍රී ධුරය නැති වුණා. එම නිසා ගරු එරංග වීරරත්න නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා අද පාර්ලිමේන්තුවේ කියපු දේවල් මත ඔබතුමාට මන්ත්‍රී ධුරය දරන්න නීතිමය නොහැකියාවක් තිබෙනවා. මට ඒ ගැන සන්තෝෂයක් නැහැ. මම ඒ ගැන කනගාටු වනවා. මොකද, විෂය දන්නා කෙනෙක් ඔය තනතුරේ ඉන්න ඕනෑ. විෂය භාර ඇමතිවරයා වන ගරු ජනාධිපතිතුමාට වෙලාවක් නැහැ, ඕවා ගැන හොයන්න. ඔබතුමා නියෝජ්‍ය ඇමතිවරයා වුණාට ඇමතිවරයා වාගේ නේ ඉන්නේ. තාක්ෂණය දන්නා කෙනෙක්, ඉංජිනේරුවෙක් මේ තනතුරේ ඉන්න ඕනෑ. හැබැයි, ඔබතුමා දැනුවත්ව හෝ නොදැනුවත්ව අද ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ඔබතුමා නාම යෝජනා පත්‍රය අත්සන් කරන දවස වනකොට ඔබතුමා රජය සමඟ ගිවිසුමක හිටියා. එම නිසා ඔබතුමා නුසුදුසු වනවා, මන්ත්‍රීවරයෙක් වෙන්න. ඒක වෙන ප්‍රශ්නයක්. ඒක මට එච්චර අදාළ කාරණයක් නොවෙයි. නමුත් ඒක කියන්න ඕනෑ, මේ ප්‍රශ්නය මතු වුණු නිසා.

ඊළඟ කාරණය වෙන එකක්. එම සමාගමෙන් ඔබතුමා අස් වුණාද, කොහොමද අස් වුණේ, පවුලේ අයට තවමත් එම සමාගමේ කොටස් තිබෙනවාද, ඔබතුමාට තවමත් කොටස් තිබෙනවාද, එසේ තිබියදී දිගින් දිගට රජය සමඟ ගිවිසුම් සහ අනුගිවිසුම්වලට ඇතුළත් වුණාද, ඒක, a conflict of interest ද, ඒක අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ 17වන වගන්තියේ තිබෙන විධිවිධානවලට පටහැනිද කියන එක ගැන ගවේෂණය කරන එක ඊට උනන්දුවන අයට භාර දෙනවා. එකම විෂයක ඉන්න නිසා මම මේ ගැන නැවත කථා කරන්නේ නැහැ. හැබැයි, මේ ප්‍රශ්නය විසඳලා තියෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය මෙයයි. මෙම රජය බලයට පත් වුණාට පස්සේ ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය සඳහා towers හදන්න EDOTCO කියලා සමාගමක් සමඟ ගිවිසුමකට එළඹුණා. ලංකාවේ එතෙක් තිබුණේ එම ව්‍යාපාරයේ ඉන්න Mobitel, Dialog හා Hutch වාගේ සමාගම් වෙන වෙනම හෝ එකතුව එම towers පවත්වාගෙන යෑම. ඒ වාගේම ඒවායේ මිල ගැන, සේවා පවත්වාගෙන යෑම ගැන එකඟතා තිබුණා. එම කොන්ත්‍රාත්තුව අරගෙන තිබෙන EDOTCO කියන සමාගම මලයාසියානු ටෙලිකොම් සමාගමේ අයිතිය තිබෙන සමාගමක්.

මේ සම්බන්ධයෙන් මම මතු කරන්නේ මෙන්න මේ කාරණා. EDOTCO කියන මේ සමාගමට ලංකාව පුරාම විදුලි සංදේශ කුලුනු ඉදිකිරීමේ අවස්ථාව ලබා දුන්නේ ටෙන්ඩර් දාලා ද, අනෙක් තරගකරුවෝ කවුද, මේ වෙනුවෙන් තව කවුද ඉදිරිපත් වුණේ, කොහොමද මිල තීරණය කරන්නේ? මේ සම්බන්ධයෙන් පුවත් පත්වල පළවුණා, මෙවැනි සමාගමකට මේ කොන්ත්‍රාත්තුව දුන්නාම මිල අඩු වීමෙන් පාරිභෝගිකයාට වාසියක් වනවා කියලා. මට ඒ තර්කය තේරුම් ගන්න බැහැ. සමාගම් කිහිපයක් එනවා නම්, තරගකාරිත්වයක් ඇති වනවා නම්, ඒක විශ්වාස කරන්න පුළුවන්. ලංකාව පුරාම විදුලි සංදේශ කුලුනු ඉදිකරන බලය

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

EDOTCO සමාගමට දුන්නාම, කොහොමද මිල අඩු වන්නේ? ඔබතුමාට යුතුකමක් තිබෙනවා, ඒ ක්‍රමය පැහැදිලි කර දෙන්න. ඒ වාගේම මේ පිළිබඳව TRC එකේ මතය මොකක්ද? මේ පිළිබඳව TRC එක ඉදිරිපත් කර තිබෙන වාර්තා ලිඛිතව තිබෙනවා ද? මෙහිදී විවෘත ටෙන්ඩර් පටිපාටියකට නොගියේ ඇයි? එහෙම ගියා නම් ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීම කළ යුතු දෙයක්. එහෙම නැත්නම් මේ සඳහා තනි පුද්ගලයෙක් තෝරා ගත්තේ ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේ තිබෙන ලොකුම ප්‍රශ්නය වෙන එකක්.

ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, ඔබතුමාත් මේ ගැන ඇහුවාම ටිකක් පුදුම වේවි. මේ EDOTCO කියන සමාගම අයිති මව් සමාගම තමයි ලංකාවේ ඩයලොග් සමාගමේත් අයිතිකාරයා. ඩයලොග්, EDOTCO කියන්නේ එකම තාත්තාගේ දරුවෝ. ලංකාවේ වෙළෙඳ පොළේ ලොකුම පංගුවක් තිබෙන ඩයලොග් සමාගම හිමි මව් සමාගමට අයිති වෙනත් උප සමාගමක් මුළු ලංකාවේම towers හදන business එක භාර ගන්නවා. ඒක බැලූ බැල්මට පෙනෙන්නේ unsolicited කියලා. ඒක එහෙම නොවෙයි නම් අපට කියන්න. අපි දැක්කේ නැහැ, එහෙම විවෘත ටෙන්ඩර් කැඳවීමේ ක්‍රියාදාමයක් තිබුණා කියලා. මේකේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. අවසානයේ මොකද වෙන්නේ? පෞද්ගලික ඒකාධිකාරයක් ගොඩනැඟෙන්න පුළුවන්. විශේෂයෙන්ම ඩයලොග් සමාගමට,-

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමාගේ වෙලාවේදී උත්තර දෙන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මට සීමිත වෙලාවක් ඉතුරු වෙලා තිබෙන්නේ. ඔබතුමාට ගොඩක් වෙලාව තිබෙනවා. *[බාධා කිරීමක්]* නැහැ, දැන් උත්තර දෙන්න එපා. ඔබතුමාගේ වෙලාවේදී උත්තර දෙන්න. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඒක පසුව කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීමට අවසානයේ අවස්ථාව ලබා දෙන්නම්. *[බාධා කිරීමක්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හැබැයි, මට වෙලාව ඕනෑ. ප්‍රශ්නයක් නැහැ, ඔබතුමා උත්තර දෙන්නකෝ. EDOTCO ටෙන්ඩර් කළාද?

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය කියන කථාවේ තිබෙන වැරැද්ද මේකයි. මොකද, ඕක ලයිසන් එකක්. ලයිසන් එකක් කියන්නේ, ටෙන්ඩර් පටිපාටියකින් අරගෙන දෙන එකක් නොවෙයි. ඔය ලයිසන් එක දීලා තිබෙන්නේ පෞද්ගලික සමාගම්වලට කණු ස්ථාපිත කරන්න. දැනට සමාගම් දෙකක් ලයිසන් එක අරගෙන තිබෙනවා. තවත් සමාගමක් ලයිසන් එක ගන්න යනවා. මේක TRC එකෙන් දෙන ලයිසන් එකක් පමණයි. ඒක තවත් සමාගම්වලට ගන්න පුළුවන්. ඒ සමාගම්වලට විතරයි ටෙලිකොම් කණු හදන්න පුළුවන්, පෞද්ගලික විධියට.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, EDOTCO සමාගමට තිබෙන ප්‍රාග්ධනය, EDOTCO සමාගම ඩයලොග් සමාගම සමඟ තිබෙන අයිතියේ සම්බන්ධය, පාලනයේ සම්බන්ධය වාගේම අද මේ රටේ ඩිජිටල්කරණය පිළිබඳ වගකීම දරන ප්‍රධානියාට ඩයලොග් මව් සමාගමටත්, ඩයලොග් දේශීය සමාගමටත් තිබෙන සම්බන්ධය කියන මේ සියල්ල ගත්තාම ඉතාම බරපතළ, යථාර්ථවාදී අනතුරක් තිබෙනවා. ලංකාවේ විදුලි සන්දේශ towers ඉදිකිරීමේ බලය එක් තනි සමාගමකට, පෞද්ගලික ඒකාධිකාරිත්වයකට යන තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා පළමුවෙන්ම දෙවැනි සමාගම කවුද, තුන්වැනි සමාගම කවුද කියලා ඔබතුමා කියන්න.

ඊළඟ ප්‍රශ්නය තමයි, මේ සේවාවට ගෙවන මිල තීරණය කරන්නේ කොහොමද කියන එක. මොකක්ද ඒකේ formula එක? පරණ දූෂිත ක්‍රමය නැති කරනවා කියලා නේ, ඔබතුමන්ලා බලයට ආවේ. මේ පිළිබඳ unsolicited දේවල් කරන්නේ නැහැයි කියලා කිව්වා නේ. බලපත්‍රය කියන්නේ ව්‍යාපාරයක්; බලපත්‍රය කියන්නේ සල්ලි; බලපත්‍රයෙන් හම්බ කරගන්නවා. ඒ ව්‍යාපාරයේ අයිතිකරු, ඒ ව්‍යාපාරයේ කොටස්කරුවන්, ඒ ව්‍යාපාරයේ තනතුරු දරන අය හම්බ කරගන්නවා. ඒක ව්‍යාපාරයක්; නීත්‍යනුකූල ව්‍යාපාරයක්, හැබැයි නීත්‍යනුකූලව ගත්තොත්. ඒ නිසා EDOTCO එකට unsolicited ලෙස දුන්නා නම්, EDOTCO එකේ අයිතිය ඩයලොග් සමාගම හිමි ඒ මලයාසියානු ටෙලිකොම් සමාගමට හිමි නම්, ලංකාවේ වැඩිම පංගුව තිබෙන ඩයලොග් සමාගම ඒ හා සම්බන්ධ නම් මේකෙන් නිසැකවම අනතුරක් නිර්මාණය කරනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, monopoly එකක් හදන්න; private sector monopoly එකක් හදන්න. මේකට වෙන කාටවත් තරග කරන්න බැහැ. මේකෙන් වෙන්නේ මොබිටෙල් සමාගම සහ හච් සමාගම විසිවෙන එක. ඩයලොග් ගැන අපට තරහක් නැහැ. තාක්ෂණය අරගෙන එනවා නම් ඒ පිළිබඳව වෙළෙඳ පොළේ තරගකාරිත්වයක් තිබෙන්න ඕනෑ. මේ රටේ පෞද්ගලිකරණයේ සාර්ථකම උත්සාහය තමයි, මේ විදුලි සන්දේශ ක්ෂේත්‍රය. විදුලි සන්දේශ ක්ෂේත්‍රයේ සාර්ථකත්වය ඇතුළේ තරගකාරිත්වය තුළ අද ඩයලොග් සමාගම ටිකෙන් ටික, ටිකෙන් ටික පෞද්ගලික monopoly එකක් හදාගෙන එනවා. වෙළෙඳ පොළේ එහෙම monopoly එකක් හදන එකට අමතරව දැන් කණු හදන එකටත් monopoly එකක් හදන්න සූදානම් වෙනවා. දැන් ඔබතුමා පැහැදිලි කරන්න, කොහොමද මිල අඩු වෙන්නේ, මේකෙන් මොබිටෙල් සමාගමට ඇති වන බලපෑම මොකක්ද, මේකෙන් හච් සමාගමට ඇති වන බලපෑම මොකක්ද කියලා. තරගකරුවන්ගේ තරගකාරිත්වය තුළ විතරයි නියෝජ්‍ය ඇමතිතුමනි, මිනිස්සුන්ට සාධාරණයක් ඉෂ්ට වෙන්නේ.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
වෙලාව ගියාට කමක් නැහැ, උත්තරයක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට පැහැදිලි කරන්න අවස්ථාවක් ලබා දෙන්නම්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඔබතුමා විෂය භාර නියෝජ්‍ය ඇමති නේ. ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න. මගේ වෙලාව ගන්නේ මොකටද? වටගල නියෝජ්‍ය ඇමතිතුමා පුදුම උත්සාහයක් නේ ගන්නේ. *[බාධා කිරීමක්]*

මා මිත්‍ර සුනිල් වටගල මැතිතුමා උත්තර දෙනවා නම් මම කැමැතියි. මොකද, ඔබතුමා මගේ මිත්‍රයා වුණේ අද ඊයේ නොවෙයි නේ. ඔබතුමා උත්තරයක් දෙනකොට මට මිත්‍රත්වයෙන් උත්තරයක් දෙන්න පුළුවන්. නියෝජ්‍ය ඇමතිතුමා ගැනත් මට තවම සැලකිල්ලක් තිබෙනවා. මම මීට විනාඩි ගණනකට කලින් අර කථාව ඇහුවේ. මට තව අලුත් තොරතුරු ලැබුණොත් සමහර වෙලාවට අපේ ස්ථාවරය වෙනස් වෙන්න පුළුවන්. මේ දූෂණ නැති කරනවා, දූෂණ zero කරනවා කියලා නේ ඔබතුමන්ලා බලයට ආවේ. මතක තබා ගන්න, අපි ඇමතිකම් කරනකොට අපේ අමාත්‍යාංශ zero-corruption. මම විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය ඇමති වශයෙන් හිටපු කාලයේ එක නඩුවක් නැහැ; එක දූෂණයක් නැහැ; එක හොරකමක් නැහැ; එක චෝදනාවකුත් නැහැ. මේ වාගේ පාර්ලිමේන්තුවේ අපේ අමාත්‍යාංශය ගැන කථා කළේත් නැහැ.

අගය කිරීමක් පමණයි තිබුණේ. අදටත් සූර්යබල සංග්‍රාමය මේ රටේ ක්‍රියාත්මක වෙන්නේ අපේ හයියට, අපි හදපු ප්‍රතිපත්තිවල ශක්තියට. අද ඔබතුමන්ලා ටෙන්ඩර් දමන්නේ අපි ඒ ටෙන්ඩර් ක්‍රමය හඳුන්වා දීපු නිසා. ලාල් කාන්ත ඇමතිතුමනි, අපි 2016දී ටෙන්ඩර් ක්‍රමය අරගෙන එනකොට මේ රටේ හිටපු ප්‍රබල ව්‍යාපාරිකයෝ, ඒ හා සම්බන්ධ මූල්‍ය පාතාලය පෞද්ගලිකව අපිට එරෙහිව වැඩ කළා. අපි ඒවා වළක්වා ගෙන ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරපු නිසා අද ඔබතුමන්ලාගේ ආණ්ඩුවට solarවලට වාගේම windවලට ටෙන්ඩර් දමන්න පුළුවන්. එහෙමයි අපි වැඩ කරලා තිබෙන්නේ. ඔබතුමන්ලා ඊටත් වඩා සුද්දයි, ඊටත් වඩා නියමයි, ඊටත් වඩා මරු, අපිටත් වඩා ෂෝක්, ඔයගොල්ලන් තමයි නියම සුද්දෝ සුදු කියලා නේ ආවේ. එහෙම ඇවිල්ලා අද ඩයලොග් සමාගමේ මව් සමාගමට හිමි EDOTCO සමාගමට ලංකාව පුරාම towers ගහන්න ටෙන්ඩර් නැතුව ලයිසන් එක දෙන එක නේ වැඩේ. ටෙන්ඩර් නැතුව ලයිසන් එක දෙන එක අවුල් නේ. ඒකෙන් මිල අඩු වෙන්නේ කොහොමද? මම නම කියන්නේ නැහැ, මගේ මිත්‍රයාගේ. ලංකාවේ ඩිජිටල් විෂයභාර ප්‍රධානියා, ඔහුත් සමහ පින්තූරයක් ගහලා කියනවා, මේකෙන් මිනිස්සු ගෙවිය යුතු මිල අඩු වෙනවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! පාර්ලිමේන්තුව යළි රැස් වේ.

***ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.***
*அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.*
*Accordingly, Parliament resumed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

අද දින විවාදයේ කටයුතු අවසන් වනතෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

*කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී. -*
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் மேலும் ஆராயப்பட்டது.-*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered further in Committee. -*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව continue කරන්න. තවත් විනාඩි දෙකක කාලයක් පමණයි ඔබතුමාට තිබෙන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමාට අද එල්ල වෙලා තිබෙන චෝදනාව සත්‍ය නම් අපිට කියන්න තිබෙන්නේ මාර වැඩේ ලංකාවට වුණේ කියායි. මාර වැඩේ ලංකාවට වුණේ! ඒක පැත්තකට දමන්නකෝ. පුද්ගලයෙක් ගැන කථා කරන්නේ නැහැ. ඔබතුමා පැහැදිලි කරන්න, EDOTCO ව්‍යාපෘතියේ තිබෙන පදනම මොකක්ද, මේකෙදි නීත්‍යනුකූලභාවය, තරගකාරීත්වය ආරක්ෂා වෙන්නේ කොහොමද, මිල අඩු වෙන්නේ කොහොමද, පාරිභෝගිකයා ශක්තිමත් වෙන්නේ කොහොමද, මේ රටේ මිලියන ගණනක් වෙච්ච පාරිභෝගිකයාට අමතර බරක් වෙන පෞද්ගලික අංශයේ monopoly එකක් නිර්මාණය කරන ක්‍රියාදාමයකට අරගෙන එනවාද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය මේකයි. දැන් මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා කිව්වා, අපේ ඉන්න උපදේශකයෝ, විශේෂඥයෝ නොමිලේ වැඩ කරන්නේ, ඇමෙරිකාවේ තිබෙන තමන්ගේ රක්ෂා, මලයාසියාවේ තිබෙන රක්ෂා, එංගලන්තයේ තිබෙන රක්ෂා දාලා ඇවිල්ලා අපිට උපදේශන සේවා සපයනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම කියන එක හරි ලස්සනයි. එහෙම වැඩ කරන්න කැමති අයත් ඉන්නවා. දැන් නමක් කිව්වා, ගෝමික උඩුගමසූරිය මහාචාර්යතුමා කියලා. එතුමා දක්ෂයෙක්. අපිත් දන්නා කෙනෙක්, අපේ වයස්වල පසුවන. එතුමා ඇමෙරිකාවේ විශ්වවිද්‍යාලයක කථිකාචාර්යවරයෙක්. අපේ හසාරා ලියනගේ නීතිඥතුමිය -ගරු මන්ත්‍රීතුමිය- කිව්වා, එතුමා ජාතික විද්‍යා ප්‍රතිපත්තියක් හදලා තිබෙනවාය කියලා. එහෙම එකක් තිබුණේ නැහැ ලු, දැන් හදලා තිබෙනවා ලු කියලා එතුමිය කියනවා. මහාචාර්ය ගෝමික උඩුගමසූරිය හදපු ජාතික විද්‍යා ප්‍රතිපත්තිය පිළිබඳව ඔබතුමා දන්නවාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඒක දැකලා තිබෙනවාද? මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවාද? ලාල් කාන්ත ඇමතිතුමා ඒක දැකලා තිබෙනවාද? කොයි එකටත් කථා කරන අපේ සුනිල් වටගල මැතිතුමා දැකලා තිබෙනවාද, ගෝමික උඩුගමසූරිය හදපු ජාතික විද්‍යා ප්‍රතිපත්තිය?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

සියල්ල කියවලා තිබෙන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
සියල්ල කියවලා තිබෙනවාද? ඒ කියන්නේ, අපේ සුනිල් වටගල නීතිඥතුමා මේ පාර්ලිමේන්තුව දැකලා නැති ජාතික විද්‍යා ප්‍රතිපත්තිය කියවලා තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ලාල් කාන්ත ඇමතිතුමා කැබිනට් මණ්ඩලයේත් ඉන්නවා නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ලාල් කාන්ත ඇමතිතුමා කැබිනට් මණ්ඩලයේ ඉන්නවා. නමුත්, එතුමා ඒ ගැන දන්නේ නැහැ. එතුමා ඔළුව වනලා කියනවා, එහෙම එකක් නැහැ කියලා. මෙහෙමයි. ගෝමික උඩුගමසූරිය මැතිතුමා දන්න දේවල් තිබෙනවා; නොදන්න දේවල් තිබෙනවා; පුළුවන් දේවල් තිබෙනවා.

**ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය.

**ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. පැහැදිලිවම මම ඒ අවස්ථාවේදී ප්‍රකාශ කළේ, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් විද්‍යා ප්‍රතිපත්තිය සැකසීම සඳහා අපි විවිධ අයගේ අදහස් ලබා ගත්තා කියන එකයි; ඒ expertise ලබා ගත්තා කියන එකයි කිව්වේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එතුමියට මගේ වෙලාවෙන් දෙන්නේ ඇයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමියගේ නම කියැවුණා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපේ හසාරා ලියනගේ උගත් නීතිඥතුමිය -මන්ත්‍රීතුමිය- කිව්වා, ගෝමික උඩුගමසූරිය ඇවිල්ලා නොමිලේ මේ රටට වැඩ කරලා, ජාතික විද්‍යා ප්‍රතිපත්තියක් හැදුවා කියලා. ඉතින්, ඔය කියන්නේ මොකක්ද? ඔය කියන්නේ ජනාධිපතිවරණයට ඉදිරිපත් කරපු "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ගැනයි. ඒක අපිත් කියවලා තිබෙනවා. ජාතික විද්‍යා ප්‍රතිපත්තිය කියන්නේ මේ වාගේ ලේඛනයකට නොවෙයි. ජාතික විද්‍යා ප්‍රතිපත්තියක් හදන එක හොඳයි. එහෙම ජාතික විද්‍යා ප්‍රතිපත්තියක් හදනවා කියලා මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ සඳහන් කරලා තිබෙනවා. කෝ, හදපු එක? එහෙම එකක් නැහැ. ඒ නිසා ඔහොම රවටන්න එපා. නොකර ඉන්න එක වෙන කථාවක්. එහෙම කළා කියලා මේ පාර්ලිමේන්තුවේ උගත් මන්ත්‍රීතුමියක් කියනකොට මිනිස්සු හිතනවා, "හදලා ඇති. ගෝමික වැඩකාරයා. නිකම් වැඩ කරන්නේ. මාර ලස්සන එකක් හදලා තිබෙනවා" කියලා. එහෙම එකක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වස ලජ්ජාවයි, බොරුව ගොඩයි, වංචාවක් තිබෙනවා වාගෙයි පෙනෙන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එරංග වීරරත්න නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒ ගැන පැහැදිලි කරන්න ඔබතුමාට කෙටි කාලයක් ලබා දෙන්න පුළුවන්.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ ගරු මන්ත්‍රීතුමා කියපු කාරණාවල වැරදි කිහිපයක් තිබෙනවා. විදුලි සන්දේශ කිව්වාම දැන් තිබෙන්නේ operatorsලා විතරක් towers හදන කාලයක් නොවෙයි. ලෝකයේ අනෙකුත් රටවල් කරනවා වාගේම towers හදන companies වෙනම ඉන්නවා. Infrastructure development කියන එක වෙනම ලයිසන් එකක්. මොකද, infrastructure කියන එක share වෙන්න ඕනෑ. දැන් තිබෙන ලොකු ගැටලුවක් තමයි, ලොකු ටෙලිකොම් සමාගම් ඒ කට්ටියගේ තිබෙන ප්‍රාග්ධනය පාවිච්චි කරලා towers ගහලා මාර්කට් එකේ විශාල වාසියක් ලබා ගන්නවා, පොඩි සමාගම්වලට වඩා. ඒක නැති කරන්න තමයි, infrastructure sharing කියන concept එක ඇවිල්ලා තිබෙන්නේ. ඒ sharing සඳහා towers විතරක් හදන සමාගම් ලංකාවට ගෙන ඒම හරහා අපට පුළුවන්කම ලැබෙනවා, මේ ගහන tower එක අනෙක් හැම සමාගමකටම එක හා සමානව එකම වියදමට, එකම මිලට ගන්න පුළුවන් හැකියාව ඇති කරන්න. ඒකට තමයි infrastructure licence එකක් දෙන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
අහගන්න, අහගන්න.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
මේ, ලයිසන් එකක්. උදාහරණයක් විධියට මොකක් හරි දෙයක් හදනවා නම්, ඒකට ලයිසන් එකක් දෙනවා නම්, ඒක එක සමාගමකට විතරක්,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, කෙටියෙන් කියන්න.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

මේක එක සමාගමකට විතරක් දෙන ලයිසන් එකක් නොවෙයි. මේක ඒ සමාගමට අවශ්‍යතාවන් සම්පූර්ණ කර සමාගම් කිහිපයකට ගන්න පුළුවන්. දැනටමත් මම කියපු විධියට සමාගම් දෙකක් මේ ලයිසන් එක අරගෙන තිබෙනවා. ඒ, EDOTCO සහ TowerCo කියන සමාගම්. ලංකාවේ තිබෙන තව සමාගමක් application එකක් දාලා තිබෙනවා. ඔවුනුත් මේ ලයිසන් එක ගනීවි. තව ඉස්සරහට තව සමාගම් ඒක ගනීවි. එතකොට, infrastructure හදන සමාගම් එකකට වඩා වැඩි ප්‍රමාණයක් එනවා. දැනටමත් දෙකක් තිබෙනවා. මේ සමාගම්වලින් මෙහෙම towers හැදුවාට පස්සේ අපේ ටෙලිකොම් සමාගම්වලට ලොකු පොඩි භේදයකින් තොරව infrastructure ලබා ගන්න පුළුවන්. ඒකට අවශ්‍ය නීති රාමුව ලංකාවේ තිබෙනවා; infrastructure sharing සඳහා. ඒ හරහා හැම සමාගමකටම එකම විධියට infrastructure ලබා ගන්න හැකියාව ලැබීම තුළින් අපට හොඳ competitive market එකක් හැදෙනවා. ඒකෙන් අපේ ජනතාවට පුළුවන් වෙයි සහනදායී මිලට මේ ටෙලිකොම් සේවාවන් ලබා ගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. அடுத்து, கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்கள்! உங்களுக்கு 10 நிமிடங்கள் உண்டு.

**ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, I rise to a point of Order.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමිය point of Order එකක් ඉල්ලනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය.

**ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. ඇත්තටම ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ඇහුවා, විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තියක් කොහේද තිබෙන්නේ කියලා. ඒ නිසා මම ඒ සම්බන්ධව තොරතුරු කිහිපයක් එතුමාගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම ගත්තොත්, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විධියට අපි රජයේ ප්‍රතිපත්තියක් හදලා, stakeholdersලා 700කට වැඩි පිරිසක් - රාජ්‍ය විශ්වවිද්‍යාල ආචාර්යවරු, මහාචාර්යවරු - ගෙන්වලා ඒ සම්බන්ධව අදහස් අරගත්තා. ඒ වාගේම ඔබතුමා නොදන්නවා වුණාට මහජන අදහස්වලට අපි අගෝස්තු මාසයේදී ඒක open කරලාත් තිබෙන්නේ. එහෙම කරලා දැන් අපි මේක ඉදිරියේදී අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තුවට ගෙනෙනවා. එතකොට ඔබතුමාට බලා ගන්න පුළුවන් විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය මොකක්ද කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. கௌரவ அமைச்சர் அவர்களே! உங்களுடைய உரையை ஆரம்பிய்யுங்கள்

[අ.භා. 6.02]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි අද දින අපි ඉතාම වැදගත් අමාත්‍යාංශ 3ක් පිළිබඳව සාකච්ඡා කළා. එකක් තමයි, Ministry of Digital Economy. අනෙක් එක, Ministry of Fisheries, Aquatic and Ocean Resources. අනෙක් එක, Ministry of Science and Technology. මේ වැදගත් අමාත්‍යාංශ පිළිබඳව කථා කරනකොට මමත් උදේ ඉඳලා මේ ගරු සභාවේ ඉඳගෙන හිටියා. උදේ ඉඳලා මම හිතුවා, විරුද්ධ පක්ෂයේ අය මේ පිළිබඳ වැදගත් සාකච්ඡාවක් කරයි කියලා. අන්තිමට කිසිම වැදගත්කමක් නැති කථා ටිකක් තමයි කිව්වේ. අවසානයේ, අරහේ මෙහේ හොල්ලන්න පුළුවන්ද, එල්ලෙන්න පුළුවන්ද කියලා බලලා බැරිම තැන අපේ නියෝජ්‍ය ඇමති එරංගගේ ඇඟ උඩ එල්ලිලා අද ගොඩ යන තත්ත්වයක් තමයි ඒගොල්ලන්ට තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ගොඩ යනවා කියන්නේ වෙන මුකුත් නිසා නොවෙයි, ඔයගොල්ලන්ට මේක ඕනෑ වෙන්නේ, Facebook එක ඇතුළු සමාජ මාධ්‍යවල දමා ගන්න විතරයි නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පක්ෂයේ ඉන්න අයට විපක්ෂයේ අය කියන්නේ, බිස්නස් කරන්න බැහැ, කඩයක් කරන්න බැහැ, වෙන බිස්නස් එකක් කරන්නත් බැහැ කියලා. අපි කියන්නේ, බිස්නස් කළාට කමක් නැහැ කියලා. හැබැයි, තමුන්නාන්සේලා වාගේ අපි හොරකම් කරන්නේ නැහැ; හොර වැඩ කරන්නේ නැහැ; වංචා කරන්නේ නැහැ. වංචා සහගත ලෙස සල්ලි හම්බ කරන්නේ නැහැ කියන එක මම කියන්න ඕනෑ.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று காலையிலிருந்து இந்த விவாதத்தில் பலரும் பேசிய விடயங்களை நான் கேட்டுக் கொண்டிருந்தேன். விசேடமாக, இந்தச் சபையில் எதிர்க்கட்சித் தலைவர் - உங்களுடைய தலைவர் அவர்கள் - பெரியதொரு பெட்டியைத் தூக்கிக்கொண்டு வந்து பேச ஆரம்பித்தபொழுது நான் நினைத்தேன், அந்தப் பெரிய பெட்டியில் கொண்டுவந்திருக்கின்ற எதனையோ வைத்து அவர் ஏதோ பெரிய ஒரு விளையாட்டைக் காட்டப் போகின்றார் என்று. ஆனால், அதற்குள்ளே இருந்து வெளிவந்தது என்னவென்று பார்த்தால், சாரைப் பாம்பைத் தவிர வேறு எதுவுமேயில்லை என்பதுதான் உண்மை. ஏனென்றால், எந்தவிதமான அர்த்தமோ, பொருத்தமோ அவரது பேச்சில் காணப்படவில்லை. முஜிபுர் ரஹுமான் அவர்களே, அதை நீங்களாவது சொல்லிக் கொடுங்களப்பா! *[இடையீடு]* உண்மையிலேயே இன்று கடற்றொழில் அமைச்சுத் தொடர்பான விவாதத்தில் நீங்கள் ஏதேதோ எல்லாம் பேசுகின்றீர்கள். அவ்வாறு பார்க்கும்போது அவர் இதில் fail ஆகிவிட்டார். சரியா? அவர் பேசி முடித்தாச்சு, போயாச்சு!

அதுபோல், “2029ஆம் ஆண்டு நான்தான் சனாதிபதியாகப் போகின்றேன்” என்று கூறிக்கொண்டிருக்கின்ற, கடந்த 21ஆம் திகதி இதோ பாருங்கள்! என்று தன்னுடைய வீர விளையாட்டைக் காட்டிய உறுப்பினர் ஒருவர் தடதடவென

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

ஓடிவந்து என்ன பேசினார்? அவர் பேச ஆரம்பித்த நேரம் தொடக்கம், ஒரு கசாப்புக் கடைக்காரர் போன்று பிரயோசனமான எந்த விடயமும் இல்லாத, வெறுமனே இனவாதமான, வெறித்தனமான பேச்சையே பேசியிருந்தாரே தவிர, உண்மையில் மக்களுக்கான அல்லது மீன்பிடித் துறையின் வளர்ச்சி தொடர்பான எந்த விடயங்களும் அந்தப் பேச்சில் உள்ளடங்கியிருக்கவில்லை என்பதை நான் இந்த இடத்தில் சொல்கின்றேன். அதுமாத்திரமன்றி, தாங்கள்தான் இந்த நாட்டின் அடுத்த தலைவராக மாறப்போகின்றோம் என்று நினைத்துக்கொண்டும் கூறிக்கொண்டும் இந்தப் பாராளுமன்றுக்கு வருகைதந்து பேசுகின்ற அவர்களுக்கு நாங்கள் ஒன்றை மட்டும் கூறிவைக்க விரும்புகின்றோம். அதாவது, நீங்கள் இன்று நடந்துகொள்ளுகின்ற விதம், உங்களால் கட்டியெழுப்பப்படுகின்ற நிலைமைகள்மூலம் இந்த நாட்டு மக்கள் ஒருபோதும் ஆட்சி அதிகாரத்தை உங்களுக்குத் தரமாட்டார்கள் என்பதை மனதில் வைத்துக் கொள்ளுங்கள்!

அதுமாத்திரமல்ல, இன்னுமொன்றை நாங்கள் குறிப்பிட்டாக வேண்டும். இவர்களிடமிருந்து வருகின்ற வார்த்தைகளெல்லாம் வெறும் இனவாத வார்த்தைகள்! வெறும் இனவாத வார்த்தைகளை மாத்திரம் கக்குகின்றவர்களாக, இனவாதத்துடன் செயற்படுபவர்களாக இவர்கள் இருக்கிறார்கள். கௌரவ தயாசிறி அவர்களே, அது உங்களுக்கும் புரியும் என நினைக்கிறேன். முஜிபுர் ரஹுமான் அவர்களே, நாங்கள், நீங்கள் எல்லோரும் இன்று நேற்றல்ல, 1990ஆம் ஆண்டு காலத்திலிருந்து அரசியல் செய்கின்றோம். ஆனால், அன்றைக்கு இருந்த முஜிபுர் ரஹுமான் இன்றைக்கு எங்களுக்குக் கிடைக்கவில்லை! அன்றைக்கு நீங்கள் இருந்த நிலைமை வேறு! இன்றைக்கு இருக்கின்ற நிலைமைகள் வேறு! இருந்தபோதிலும்கூட, நாங்கள் அன்றும் இதே நிலைப்பாட்டில்தான் இருந்தோம்; இன்றும் அதே நிலைப்பாட்டில்தான் இருக்கின்றோம் என்பதை மறக்கக் கூடாது. அதேநேரம், கடந்த காலங்கள் முழுவதும் நாட்டை நாசமாக்கியவர்கள் இன்னமும் நாசமாக்குவதற்கு ஏதுவான நடவடிக்கைகளை எடுத்து வருகிறார்கள் என்பதையும் இந்த இடத்தில் நான் சொல்லிக்கொள்ள வேண்டும்.

அதேபோன்று இன்னுமொருவர் இருக்கின்றார், அவர் வேறு யாருமல்ல, விசேடமாக யாழ்ப்பாணத்தைப் பிரதிநிதித்துவப்படுத்தி இங்கு வந்திருக்கின்ற பாராளுமன்ற உறுப்பினர் ஒருவர். அவரின் பாட்டனும் அரசியல் செய்தார், அவருடைய அப்பனும் அரசியல் செய்தார், இவரும் இன்றைக்கு அரசியல் செய்கின்றார். ஆனால், அவருடைய அப்பனால் பாராளுமன்றப் பிரதிநிதித்துவத்தைப் பெறமுடியாமல் போய்விட்டது. கடந்த காலங்களில் உங்கள் எல்லோருக்குமே தெரியும், இவர்கள் எங்களுக்கு எதிராகப் பாரிய இனவாதத்தைக் கட்டவிழ்த்து விட்டவர்கள் என்பது. எங்களுக்கு நன்றாகத் தெரியும், கஜேந்திரகுமார் பொன்னம்பலம் என்பவர், அவருடைய பாட்டன், அவருடைய அப்பன் இவர்கள் அனைவரும் இனவாதிகள்! அந்த இனவாதிகள் இன்றைக்கு எங்களைப் பார்த்துச் சொல்லுகின்றார்கள், JVP கட்சியைச் சேர்ந்த நாங்கள் இனவாதிகளாம்! தொடர்ந்து இந்த நாட்டில் வாழுகின்ற தமிழ் மக்களுக்கு எதிராகச் செயற்பட்டவர்களாம்! கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்களுக்கு நான் கூறுகின்றேன், நாங்கள் ஒரு தடவை அல்ல, இரண்டு தடவை இந்த நாட்டில் ஆயுதம் ஏந்திப் போராடியவர்கள். அந்த இரண்டு தடவையும் 80,000க்கு அதிகமான எங்களுடைய தோழர், தோழிகள் மற்றும் தலைவர்கள் படுகொலை செய்யப்பட்டார்கள். அவ்வாறான சந்தர்ப்பங்களில்கூட, எந்த ஒரு தமிழ்க் குடிமகனுக்கோ எந்தவொரு முஸ்லிம் குடிமகனுக்கோ அவன் தமிழன் என்ற காரணத்தினாலோ அல்லது முஸ்லிம் என்ற காரணத்தினாலோ இனவாத அடிப்படையில் அவர்களது நிழலுக்குக்கூட தீங்கு விளைவிக்காத கட்சிதான் JVP என்பது.

அதன் காரணமாகத்தான் கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்களே, கடந்த பொதுத் தேர்தலில் இதற்கு முன்னர் 2 ஆசனங்களைக் கொண்டிருந்த உங்களுடைய கட்சியை ஓர் ஆசனத்துக்குப் புறந்தள்ளிவிட்டு, யாழ். மாவட்ட மக்கள் எங்கள் சார்பாக 3 பேரைத் தெரிவுசெய்திருக்கின்றார்கள்; வன்னியில் இருந்து இருவரைத் தெரிவு செய்திருக்கின்றார்கள். இவ்வாறு யாழ்ப்பாணம், வன்னி ஆகிய இரண்டு தேர்தல் மாவட்டங்களிலும் தேசிய மக்கள் சக்திக்கு ஆதரவளித்திருப்பதற்குக் காரணம் வேறு எதுவுமல்ல, எங்களுடைய கட்சியின் இனவாதமற்ற செயற்பாடு! இந்த நாட்டில் தமிழ், சிங்கள, முஸ்லிம் மக்களுக்கு நாம் மதிப்பளிக்கின்ற முறைமை! அவர்களைச் சமத்துவ ரீதியாகப் பார்க்கின்ற பண்பு! எங்களுடைய கட்சியினுடைய தலைவருடைய செயற்பாடு! இவற்றின் காரணமாகவே இன்றைக்கு இந்த நிலைமைகள் மாற்றமடைந்து இருக்கின்றன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இறுதியாக ஒரு விடயத்தைச் சொல்லிக்கொள்ள வேண்டும். இன்று காலையிலிருந்து எங்களுடைய அமைச்சுத் தொடர்பாக, சாதகமான கருத்துக்களைத் தெரிவித்த அனைவருக்கும் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம். அதுமாத்திரமல்ல, எதிர்வரும் காலங்களில் மீனவர் சமூகத்தைக் கட்டியெழுப்புவதற்கும், கடற்றொழிலைக் கட்டியெழுப்புவதற்கும் அவர்களால் முன்வைக்கப்பட்ட கருத்துக்களில் உள்ளடங்கிய வேலைத்திட்டங்களையும் கூடுதலான சக்தியோடு நாங்கள் செயற்படுத்துவோம் என்பதையும் இந்த இடத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றோம்.

அதேபோன்று, இன்று காலையிலிருந்து மாத்திரமல்ல, தொடர்ச்சியாகக் கடந்த ஒரு வாரமாகவே எங்களுடைய அமைச்சினுடைய செயற்பாடுகளுக்கும், இந்த விவாதத்தை முன்னெடுப்பதற்கான ஆதாரங்கள், கருத்துக்கள் அனைத்தையும் திரட்டி எங்களைத் திறம்பட வழிநடத்திய எங்களுடைய அமைச்சின் செயலாளர், ஏனைய பணிப்பாளர்கள், DG, பிரதி அமைச்சர் ரத்ன கமகே அவர்கள், பாராளுமன்ற உறுப்பினர்கள் மற்றும் தொடர்ச்சியாக எங்களுக்கு வழிகாட்டிக்கொண்டிருந்த அனைவருக்கும் நன்றியையும் வாழ்த்துகளையும் தெரிவித்துக் கொள்கின்றேன்.

அத்துடன், இன்றைய விவாதத்தில் digital பொருளாதார அமைச்சும், விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சும் உள்ளடங்கியிருக்கின்றது. அவற்றின் பணியாளர்கள், செயலாளர்கள் அனைவரும் இன்று காலையிலிருந்து இச்சபையில் நடந்த விவாதத்தைச் செவிமடுத்து, எங்களை வழிநடத்தினார்கள். அந்த வகையில், அந்த அமைச்சுக்களின் செயலாளர்களுக்கும் உத்தியோகத்தர்களுக்கும் எமது நன்றியையும் வாழ்த்துகளையும் தெரிவித்துக்கொண்டு, உங்களிடமிருந்து விடை பெறுகின்றேன். நன்றி!

## ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය
## கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள் அமைச்சு
## MINISTRY OF FISHERIES, AQUATIC AND OCEAN RESOURCES

| | | |
|---|---|---|
| மீண்டுவரும் | ரூபாய் | 4,100,000,000 |
| மூலதனம் | ரூபாய் | 6,500,000,000 |

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நிதி அமைச்சர் சார்பாக நான் ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 குழுநிலையில், கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள் அமைச்சுக்கான பின்வரும் திருத்தத்தை முன்வைக்கின்றேன்.

"34ஆம் பக்கத்திலுள்ள, 12ஆவது வரியை நீக்கிவிட்டு அதற்குப் பதிலாக பின்வருவன பதிலீடு செய்யப்படுதல் வேண்டும்:

'மூலதனம் 7,700,000,000' "

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
குழு இணக்கமா?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"මූලධන වියදම සඳහා රු. 7,700,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 7,700,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 7,700,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

"151 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 460,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

151 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 151, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 460,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 151, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 460,800,000 ,for Head 151, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 151, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

01වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 104,800,000

"151වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 104,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

151 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 104,800,000

"தலைப்பு 151, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 104,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 151, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 104,800,000

Question, "That the sum of Rs. 104,800,000, for Head 151, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 151, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

### 02 වන වැඩසටහන. - සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 2,381,500,000; මූලධන වියදම, රු. 6,209,800,000

**நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 2,381,500,000; மூலதனச் செலவு, ரூபாய் 6,209,800,000**

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 2,381,500,000; Capital Expenditure, Rs. 6,209,800,000

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 குழுநிலையில், தலைப்பு 151இன் நிகழ்ச்சித்திட்டம் 02க்கான திருத்தத்தை நான் முன்வைக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
குழு இணக்கமா?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

" 34ஆம் பக்கத்திலுள்ள, 16ஆவது வரியை நீக்கிவிட்டு அதற்குப் பதிலாக பின்வருவன பதிலீடு செய்யப்படுதல் வேண்டும்:

'நிகழ்ச்சித்திட்டம் 02
அபிவிருத்திச் செயற்பாடுகள் 2,381,500,000 7,209,800,000' "

[மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்]

(இந்தத் திருத்தத்தின் நோக்கம் யாதெனில், வரவு செலவுத்திட்ட முன்மொழிவு இல. 38ஐச் செயற்படுத்துவதற்கு செலவினத் தலைப்பு இல. 151 - கடற்றொழில், நீரியல் வளங்கள் மற்றும் கடல் வளங்கள் அமைச்சருக்காக ஒதுக்கீடு செய்யப்பட்ட மூலதன நிதி ஏற்பாட்டை ரூபாய் 1,000,000,000இனால் அதிகரித்தலாகும்.)

"151වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 2,381,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

151 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"151 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 7,209,800,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

151 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 151, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 2,381,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 151, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 151, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 7,209,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 151, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 2,381,500,000, for Head 151, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 151, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 7,209,800,000, for Head 151, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 151, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

**290 වන ශීර්ෂය.- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,257,700,000; මූලධන වියදම, රු. 185,400 000,

**தலைப்பு 290.- கடற்றொழில் மற்றும் நீரக வளமூலங்கள் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,257,700,000; மூலதனச் செலவு, ரூபாய் 185,400,000

HEAD 290.- DEPARTMENT OF FISHERIES AND AQUATIC RESOURCES

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,257,700,000 ;Capital Expenditure, Rs. 185,400 000,

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 குழுநிலையில், தலைப்பு 290இன் நிகழ்ச்சித்திட்டம் 01க்கான திருத்தத்தை நான் முன்வைக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

" 35ஆம் பக்கத்திலுள்ள, 2ஆவது வரியை நீக்கிவிட்டு அதற்குப் பதிலாக பின்வருவன பதிலீடு செய்யப்படுதல் வேண்டும்:

'நிகழ்ச்சித்திட்டம் 01

செயல்முறைச் செயற்பாடுகள் 1,257,700,000 385,400,000' "

[மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்]

(இந்தத் திருத்தத்தின் நோக்கம் யாதெனில், வரவு செலவுத்திட்ட முன்மொழிவு இல. 37 மற்றும் 56ஐச் செயற்படுத்துவதற்கு செலவினத் தலைப்பு இல. 290 - கடற்றொழில் மற்றும் நீரக வளமூலங்கள் திணைக்களத்துக்காக ஒதுக்கீடு செய்யப்பட்ட மூலதன நிதி ஏற்பாட்டை ரூபாய் 200,000,000இனால் அதிகரித்தலாகும்.)

"290 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,257,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

290 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"290 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 385,400,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

290 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 290, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 1,257,700,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 290, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 290, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 385,400,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 290, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 1,257,700,000, for Head 290, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 290, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 385,400,000, for Head 290, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 290, Programme 01, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

## විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය
## விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு
## MINISTRY OF SCIENCE AND TECHNOLOGY

| | |
|---|---|
| පුනරාවර්තන | රු. 3,000,000,000 |
| මූලධන | රු. 3,000,000,000 |

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"33 වන පිටුවේ, 5 හා 6 පේළි ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

| | | |
|---|---|---|
| 'පුනරාවර්තන | රු. | 3,170,000,000 |
| මූලධන | රු. | 3,600,000,000' " |

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"පුනරාවර්තන වියදම සඳහා රු. 3,170,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධන වියදම සඳහා රු. 3,600,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மீண்டுவரும் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 3,170,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மீண்டுவரும் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 3,600,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 3,170,000,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 3,600,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

"196 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 218,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

196 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 27,000,000

"196 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 27,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

196 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 196, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவரும் செலவுக்கான ரூபாய் 218,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 196, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 27,000,000

"தலைப்பு 196, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 27,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 196, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 218,000,000, for Head 196, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 196, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 27,000,000

Question, "That the sum of Rs. 27,000,000, for Head 196, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 196, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම රු. 2,782,000,000; මූලධන වියදම, රු. 2,973,000,000**

**நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 2,782,000,000; மூலதனச் செலவு, ரூபாய் 2,973,000,000**

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 2,782,000,000; Capital Expenditure, Rs. 2,973,000,000

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී 196 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"33 වන පිටුවේ, 10 පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'වැඩසටහන 02

සංවර්ධන වැඩසටහන රු. 2,952,000,000 රු. 3,573,000,000' "

[ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ 2025.10.18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට ආනුෂංගිකව, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව වෙත සහ ඊට අදාළ කටයුතු වෙනුවෙන් වෙන්කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන රු. 170,000,000ක් සහ මූලධන ප්‍රතිපාදන රු. 600,000,000ක් වැය ශීර්ෂ අංක 196 - විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යවරයා වෙත මාරු කිරීමයි.)

"196 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 2,952,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

196 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"196 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 3,573,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

196 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 196, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 2,952,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 196, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 196, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 3,573,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 196, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 2,952,000,000, for Head 196, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 196, Programme 02, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 3,573,000,000, for Head 196, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 196, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

## ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
## டிஜிட்டல் பொருளாதார அமைச்சு
## MINISTRY OF DIGITAL ECONOMY

| | | |
|---|---|---|
| පුනරාවර්තන | රු. | 5,900,000,000 |
| මූලධන | රු. | 10,100,000,000 |

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"30 වන පිටුවේ, 16 පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'පුනරාවර්තන රු. 6,400,000,000' "

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"පුනරාවර්තන වියදම සඳහා රු. 6,400,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 6,400,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 6,400,000,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

"186 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 241,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

186 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.25,000,000

"186 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 25,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

186 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 186, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 241,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 186, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 25,000,000

"தலைப்பு 186, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 25,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 186, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 241,500,000, for Head 186, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 186, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 25,000,000

Question, "That the sum of Rs. 25,000,000, for Head 186, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 186, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම රු. 3,312,500,000; මූලධන වියදම, රු. 8,128,500,000**

**நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 3,312,500,000; மூலதனச் செலவு, ரூபாய் 8,128,500,000**

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 3,312,500,000; Capital Expenditure, Rs. 8,128,500,000

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 186 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"31 වන පිටුවේ, 3 ජේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'වැඩසටහන 02

සංවර්ධන වැඩසටහන රු. 3,812,500,000 රු. 8,128,500,000' "

[ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ, අයවැය යෝජනා අංක 08 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින්, වැය ශීර්ෂ අංක 186 - ඩිජිටල් ආර්ථික අමාත්‍යවරයා සඳහා රු. 500,000,000කින් පුනරාවර්තන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

"186 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 3,812,500,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

186 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"186 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 8,128,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

186 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 186, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 3,812,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 186, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 186, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 8,128,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 186, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 3,812,500,000, for Head 186, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 186, Programme 02, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the sum of Rs. 8,128,500,000, for Head 186, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 186, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**227 වන ශීර්ෂය.- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන. - මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 2,346,000,000

"227 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 2,346,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

227 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන. - මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 1,946,500,000

"227 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,946,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

227 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 227.- ஆட்களைப் பதிவுசெய்யும் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 2,346,000,000

“தலைப்பு 227, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 2,346,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 227, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 1,946,500,000

“தலைப்பு 227, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 1,946,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 227, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 227.- DEPARTMENT OF REGISTRATION OF PERSONS

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 2,346,000,000

Question, "That the sum of Rs. 2,346,000,000, for Head 227, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 227, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 1,946,500,000

Question, "That the sum of Rs. 1,946,500,000, for Head 227, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 227, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)

ගරු සභාපතිතුමනි, "කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයි ද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය" යි ද මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අ.භා. 6.19ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනයෙන් ඉවත් විය.***
***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 නොවැම්බර් 27වන බ්‍රහස්පතින්දා.***

*பி.ப. 6.19 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*
*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 நவம்பர் 27, வியாழக்கிழமை.*

*At 6.19 p.m., the Hon. Presiding Member left the Chair to report Progress.*
*Committee report Progress; to sit again on Thursday, 27th November, 2025.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ශීර්ෂ අංක 151, 186, 196 සහ 290 සංශෝධන සහිතවද, ශීර්ෂ අංක 227 සංශෝධන රහිතවද කාරක සභාවේදී සම්මත වූ බව මෙම සභාවට දැනුම් දෙනු කැමැත්තෙමි.

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

## රජයේ ඉඩම් භුක්ති විඳින ජනතාවට සින්නක්කර ඔප්පු ලබා දීම
## அரசாங்கக் காணிகளில் இருப்பாட்சி கொண்டுள்ள மக்களுக்கு அறுதியுறுதி வழங்கல்
## GRANT OF FREEHOLD DEEDS TO OCCUPANTS OF STATE LANDS

[අ.භා. 6.20]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර සහ දීමනා පත්‍ර මත දැනට සංවර්ධනය කර රජයේ ඉඩම් භුක්ති විඳින ශ්‍රී ලාංකික පුරවැසියන්ට එම ඉඩම්වල "පරම අයිතිය" නොමැති වීම තුළ මතු වී ඇති සමාජ හා ආර්ථික ප්‍රශ්න සලකා, පෙර පැවැති රජය විසින් ක්‍රියාත්මක කරන ලද "උරුමය" නමැති සින්නක්කර ඔප්පු ලබා දීමේ වැඩසටහන වර්තමාන රජය බලයට පත් වීමෙන් පසු අත්හිටුවන ලද හෙයින්ද, කෙසේ වෙතත්, 2025.07.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව "හිමිකම" නමින් නව වැඩ පිළිවෙළක් යටතේ රජයේ ඉඩම් සඳහා සින්නක්කර ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළක් නව රජය විසින් යෝජනා කර ඇති හෙයින්ද, කෙසේ වෙතත්, 2025.10.14 දිනැතිව ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කර ඇති, 2025/02 දරන චක්‍රලේඛය, 2025.07.21 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද "සමාලෝචන කමිටු වාර්තාවේ" සඳහන් නිර්දේශවලට පටහැනිව සහ/හෝ එකී සමාලෝචන වාර්තාවේ සඳහන් නොකරන ලද කොන්දේසි ඇතුළත් කර නිකුත් කර ඇති හෙයින්ද, එම චක්‍රලේඛය නිකුත් කිරීම නීති විරෝධී සහ අසාධාරණ වන හෙයින්ද,

1. 2025.07.21 දිනැති කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලද "සමාලෝචන කමිටු වාර්තාවේ" සඳහන් නිර්දේශ අනුව පමණක් "හිමිකම" වැඩසටහන ක්‍රියාත්මක කරන ලෙසද;
2. කැබිනට් මණ්ඩල තීරණයට ගැළපෙන පරිදි ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ 2025.10.14 දිනැති 2025/02 දරන චක්‍රලේඛය සංශෝධනය කිරීමට පියවර ගන්නා ලෙසද;
3. රජයේ ඉඩම් භුක්ති විඳින ජනතාවට සින්නක්කර ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළ කඩිනමින් අවසන් කිරීම සඳහා "කාර්ය සාධන බලකායක්" පත් කරන ලෙසද;
4. දැනටමත් "උරුමය" වැඩසටහන යටතේ සකස් කර කටයුතු අවසන් කර ඇති හිටපු ජනාධිපතිවරයා විසින් අත්සන් කොට සකස් කර ඇති සින්නක්කර ඔප්පු 23,018ක ප්‍රමාණය වහාම ඉඩම් හිමියන් වෙත බෙදා දීමට පියවර ගන්නා ලෙසද,

මෙම සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පුරවැසියෝ රජයෙන් ලද බලපත්‍ර ප්‍රකාරව රටේ ඉඩම් භුක්ති විඳිනවා. ඒවා තමන්ගේ ඉඩම් විධියට සංවර්ධනය කළා. ගොඩ ඉඩමක් වෙන්න පුළුවන්, මඩ ඉඩමක් වෙන්න පුළුවන්, ඇතැම් ස්ථානවල වාණිජ ඉඩම් පවා එසේ භුක්ති විඳිනවා. එම ඉඩම්වල අයිතිය පොතේ හැටියට රජයට තිබුණත්, වටිනාකම් වැඩි කරලා, දියුණු කරලා, වගා කරලා, රටට වටිනාකමක් එකතු කරලා තිබෙන්නේ මේ රටේ පුරවැසියෝ. හැමදාම බලපත්‍ර මත ඉන්නකොට ඒ ඉඩම කොටස් කරන්න ගියාමත් ප්‍රශ්න ඇති වෙනවා. ඒවා විකුණාගන්න බැහැ. හදිසියේ මුදලක් ලබා ගන්න උකස් කරන්න බැහැ. රජයේ බැංකුවකටවත් උකස් කරන්න බැහැ. මොකද, එම ඉඩම් පරිභෝජනය පිළිබඳ බරපතළ සීමා තිබෙන නිසා. මේ ගැන වැරැදි මතයක් තිබුණා. ඒ තමයි, මේ ඉඩම්වලට සින්නක්කර ඔප්පු දුන්නොත් විකුණා ගනීවි කියන මතය. දැනුත් විකුණනවා, ගරු ඇමතිතුමනි. දැන් විකුණන්නේ බලපත්‍රය. ග්‍රාම නිලධාරිට පගාව දීලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරින්ට පගාව දීලා, සමහරවිට යාළුකමට, සමහරවිට මුදලට ඔක්කෝම අවශ්‍ය ලියවිලි හදාගන්නවා. නීති විරෝධී විධියට ඔප්පු හදාගන්නවා. හදලා, ඔප්පුව ලියාපදිංචි කළාම ඒ ඉතිහාසය සොයන්න කෙනෙක් නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, අදත් ඒවාට සම්බන්ධ වෙනවා. නීතිඥවරු සම්බන්ධ වෙනවා, ප්‍රාදේශීය ලේකම් සම්බන්ධ වෙනවා, ඉඩම් නිලධාරින් සම්බන්ධ වෙනවා, ග්‍රාම නිලධාරින් සම්බන්ධ වෙනවා. එතැනදී ඥාතීන් නොවන මිනිස්සුත් ඥාතීන් බවට පත් කරනවා. ඔවුන් ලේ ඥාතීන් කියලා සහතික දෙනවා. මේ ක්‍රියාදාමය තුළ අදටත් කෙනෙකුට බලපත්‍ර සහිත ඉඩමක් විකුණන්න හිතුණොත්, විකුණනවා. දැන් කථාවක් තිබෙනවානේ, බීලා, බීලා විකුණනවා කියලා. බීලා, බීලා ඒ ඉඩම් අත්හැරලා දමයි, සූදු කෙළියි, නැති කර ගනීවි කියලා කියනවා. එහෙම නැති කර ගන්න අය දැනටත් ඒවා නැති කරගෙන. එකම දේ තමයි, අද ඒවා වෙන්නේ අඩු මිලකට. බලපත්‍ර ඉඩමක් කිව්වාම ඒකේ වටිනාකමක් නැහැ. හැබැයි, ඒ ඉඩම්වලට සින්නක්කර අයිතිය දෙන්න ඕනෑ කියන අදහස පසුගිය රජය විසින්, රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා විසින් කිව්වා. ඇත්ත වශයෙන්ම 2015 ආණ්ඩුවත් ඒ කථාව කිව්වා. එහෙම කිව්වාට, අපට ඒක සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කරන්න බැරිවුණා. එවකට හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ අදහස වුණේ, සින්නක්කර ඔප්පු ලබා දීමෙන් ගොවියාට ඒ ඉඩම් අහිමි වෙනවා කියන එක. ඒක සත්‍ය දෙයක් නොවෙයි. අහිමි වෙනවා නම්, අහිමි වෙනවා. එහෙම නැත්නම් නැහැ. 2015-2019 කාලයේ හවුලට ආණ්ඩු කරපු නිසා අපට මේක හරියට කර ගන්න බැරි වුණා. වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති වුණාම -එතුමාට තනි බලයක් ලැබුණා, පාර්ලිමේන්තුවේ- ඒ වැඩේ පටන් ගත්තා. ඒක අපි අගය කරනවා. දේශපාලන වශයෙන් එතුමාත් එක්ක අදත් අපේ එකඟතාවක් නැහැ. නමුත්, ඒ වැඩේ පටන් ගැනීම අගය කරනවා. මේ රටේ මහ පොළොව අස්වද්දලා, පෝෂණය කරලා, වටිනාකම් වැඩිදියුණු කරපු ඒ මිනිස්සුන්ට, ගම්බද වගා ඉඩම් පමණක් නොවෙයි, නගරයේ තිබෙන කෘෂිකාර්මික හෝ වාණිජ ඉඩම් පවා අදාළ පරමාර්ථය වෙනුවෙන් ලබා දීමේ කිසිම ගැටලුවක් නැහැ. ඒකෙන් රජයට පාඩුවක් වෙන්නේත් නැහැ, රටට පාඩුවක් වෙන්නෙත් නැහැ. ඒකෙන් ඒ පවුල් ශක්තිමත් වෙනවා; ඒ මිනිස්සුන්ට වටිනාකමක් ලැබෙනවා.

අද අපේ රටේ මිනිස්සුන්ගේ වත්කම කියන්නේ, පදිංචි ගෙදර සහ ඉඩම. ඒක පර්චස් 6, 7, 10 විධියට වෙන්කරලා දීලා තමයි දරුවන්ට, ඊළඟ පරම්පරාවට වත්කම පවරන්නේ. උතුර, නැඟෙනහිර, උතුරු මැද, සබරගමුව යන පළාත්වල විතරක් නොවෙයි, අපි ජීවත් වෙන කොළඹ දිස්ත්‍රික්කයේ කළුතරත් රජයේ ඉඩම් අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ ඉඩම් අස්වද්දපු මිනිස්සුන්ට, පරම්පරා ගණනක් බලපත්‍ර මත නීත්‍යනුකූලව හිටපු අයට ඒ ඉඩම් ලබා දෙන්න ඕනෑ. අනීතිකව, රක්ෂිත ඉඩම් ලබා දෙන්න කියලා අපි කියන්නේ නැහැ. ඒ වාගේම ජනතාවට දීමට නොහැකි, රජයේ අරමුණු වෙනුවෙන් ඉතිරි කර ගන්න ඕනෑ ඉඩම් තිබෙනවා. මහජන ව්‍යාපෘති සඳහා, වාරිමාර්ග සඳහා ඉතිරි කරගත යුතු ඉඩම් තිබෙනවා. ඒවා ගැන අපි කථා කරන්නේ නැහැ. වන රක්ෂණයට අයිති ඉඩම් පවරා දෙන්න කියලා අපි කියන්නේ නැහැ. අපි මේ කථා කරන්නේ, අදටත් අස්වද්දලා තිබෙන, දැනටත් බලපත්‍ර නිකුත් කරලා තිබෙන ඉඩම් ගැන. මේ කටයුත්ත ආණ්ඩු පෙරළියත් එක්ක නතර වුණා. එදා, මේ ව්‍යාපෘතිය හැඳින්වූයේ "උරුමය" කියලා. අලුත් ජනවරමක් එක්ක ආපු ආණ්ඩුවට මේකට අලුත් නමක් දමන්න අයිතිය තිබෙනවා. ඒ දමපු, "හිමිකම" කියන නම හොඳයි. ඒක, ලස්සනයි කියලාත් කියමුකෝ. "හිමිකම" කියන නම යටතේ මේ ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යන්න ගත්ත තීරණය මම අගය කරනවා.

මට මතකයි, මේ රජය බලයට පත් වුණාට පස්සේ මම "දෙරණ" රූපවාහිනී නාළිකාව පවත්වපු වැඩසටහනකට ගියා. ඒ වෙලාවේ ගරු හේමචන්ද්‍ර පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය මාත් එක්ක

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

වාදයකට ආවා, මේක සුදුසු නැහැයි කියලා. ඒක, හුඟක් කලින් සිද්ධ වුණේ. දැන් කාලයක් ගතවෙලා නේ. කෙසේ නමුත් දැන් ඒ වාද විවාද අවසන් වෙලා, ඒවා ගැන තිබුණු අදහස් දැන් වෙනස් වෙන්නත් පුළුවන්. දැන් ඒ ගැන යම්කිසි වාර්තාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒක තමයි සමාලෝචන කමිටු වාර්තාව. ඒ සමාලෝචන කමිටු වාර්තාව තමයි කැබිනට් එක අනුමත කළේ 2025.07.21වැනි දා. ඉඩම් කොමසාරිස් ජනරාල්තුමා චක්‍රලේඛයක් ගැහුවා, 2025.10.14වැනිදා. මේ දෙක අතර පරස්පරයක් තිබෙනවා. මම ඔබතුමාට ඒක පෙන්වලා දෙන්න යන්නේ නැහැ. මොකද, ඔබතුමා දැනටමත් මේක සලකා බලලා ඇති. ඒ දෙක අතර පරස්පරයක් තිබෙනවා. ඉඩම් කොමසාරිස් ජනරාල්තුමා කැබිනට් මණ්ඩලයටත් වඩා ලොකුවෙලා. ඉඩම් කොමසාරිස් ජනරාල්තුමා ඒකට අලුත් කොන්දේසි එකතු කරලා තිබෙනවා. ඉඩම් කොමසාරිස් ජනරාල්තුමාට එහෙම අලුත් කොන්දේසි එකතු කරන්න බලයක් නැහැ. කැබිනට් මණ්ඩලයට තමයි විධායක බලය තිබෙන්නේ. ඒ පිළිබඳ සාක්ෂි විමසා බලලා, සමාලෝචන කමිටුව තීරණයක් අරගෙන, ඒ සමාලෝචන කමිටුව ලබාදෙන නිර්දේශ කැබිනට් මණ්ඩලය අනුමත කළාම, කොමසාරිස් ජනරාල්තුමාගේ චක්‍රලේඛය ඒකත් එක්ක සියයට සියයක්ම ගැළපෙන්න ඕනෑ; පොඩ්ඩක්වත් වෙනස් වෙන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවමත් ඉන්නවා, "රජයේ ඉඩම් දෙන්න එපා, සින්නක්කර දෙන්න එපා, උන් මේවා විකුණාගෙන කයි, විනාශ කර ගනියි" කියලා හිතන, ප්‍රසිද්ධියේත් ඒ ගැන කියන නිලධාරීන්. මම මේ යෝජනාව සභාවට ඉදිරිපත් කරලා, රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තුන් දෙනෙක් එක්ක කථා කළාම දෙන්නෙක් මේක හොඳයි කිව්වා. හැබැයි, එක්කෙනෙක් කිව්වා මේක කරන්න එපා කියලා. මම එතුමාත් එක්ක එකඟ වුණේ නැහැ. නමුත් මම අවශ්‍ය තොරතුරු ප්‍රමාණය ලබා ගත්තා. ඔබතුමාගේ අමාත්‍යාංශයේ ඉන්න ජ්‍යෙෂ්ඨ නිලධාරීන්. ඒ අය, අපිත් එක්ක විශ්වවිද්‍යාලයේ සමකාලයේ හිටපු අය. තවමත් එහෙම හිතන අය ඉන්නවා. මම දන්නේ නැහැ, දැන් ඉන්න ඉඩම් කොමසාරිස් ජනරාල්තුමා කොහොම හිතනවාද කියලා. මම එතුමාට කථා කළේ නැහැ. මට යුතුකමක් නැහැ, මෙහෙම යෝජනාවක් ඉදිරිපත් කරලා ඒ ගැන එතුමාගෙන් කරුණු අහන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ චක්‍රලේඛයේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මම යෝජනා 3ක් ඉදිරිපත් කරනවා. මගේ පළවැනි යෝජනාව මෙයයි. ඒ සමාලෝචන කමිටු වාර්තාව කැබිනට් මණ්ඩලය අනුමත කළා නේ. ගරු ඇමතිතුමනි, ඒක ඔබතුමාට තිබෙන බලය; ජනතාවගෙන් ලද බලය. ඒ මත පමණක් මේ හිමිකම ක්‍රියාත්මක කරන්න.

දෙවැනි යෝජනාව, ඊට ගැළපෙන පරිදි ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය සංශෝධනය කරන්න. ඒක ඔබතුමාට කරන්න පුළුවන්.

තුන්වැනි යෝජනාව මෙයයි. මේ වැඩේ පරක්කු වුණා නේ; සෑහෙන්න පරක්කු වුණා. මේක ඉක්මන් කරන්න විශේෂ කාර්ය බලකායක් - special task force එකක් - පත් කරන්න. මේ වැඩේ කළොත් ඔබතුමන්ලාට, රජයට යහපතක් වෙනවා. මිනිස්සුන්ට අයිතියක්, සින්නක්කර ඔප්පුවක අයිතියක් ලැබෙනකොට ඒ මිනිස්සුන්ගේ ඇස්වලින් සතුටු කඳුළු වැටෙනවා මම දැකලා තිබෙනවා. නගරයේ ජීවත්වෙන මම ඒවා දැකලා තිබෙන නිසායි මෙහෙම කථා කරන්නේ. මගේ බල ප්‍රදේශයට ලොකුවට මේ කාරණය අදාළ නැහැ. මගේ ඡන්ද පදනමටත් මේක අදාළ නැහැ. නමුත්, මම ඇස් දෙකෙන් දැකලා තිබෙනවා සින්නක්කර ඔප්පු ලබාගෙන සතුටු කඳුළු වගුරවන මිනිස්සු. ඒ මිනිස්සුන්ට ඒ හයිය දෙන්න ඕනෑ. ඒ මිනිස්සු මේ මහ පොළව අස්වද්දපු මිනිස්සු. මේ රට අද සහලින් ස්වයංපෝෂිත වෙලා තිබෙනවා. මේ රටේ කෘෂි කර්මාන්තය අද බොහෝ බෝගවලින් ස්වයංපෝෂිත වෙලා තිබෙනවා. අර්බුද තිබෙනවා. අපට ඒ ගැටලු විසඳාගන්න පුළුවන්. නමුත්, මේ තිබෙන තත්ත්වය තුළ මේ රට සංවර්ධනය කරන්න දායක වෙච්ච ගොවි ජනතාවටත්, ඒ වාගේම අර්ධ නාගරික ප්‍රදේශවල තිබෙන වාණිජ ඉඩම්වල සිටින අයටත් ඔවුන්ගේ ජීවිත ශක්තිමත් කර ගැනීමට කර්මාන්තයක් ඇති කර ගන්න, බැංකුවට උකස් තියලා ණයක් ගන්න අද හැකියාවක් නැහැ. එම නිසා, මේක ඔබතුමන්ලාට කරන්න පුළුවන් මහ පුණ්‍ය කර්මයක්. මේ කටයුත්ත ඉක්මනින් ඉවර කරන්න special task force එකක් පත් කරන්න, ඒ වැඩේටම. ඔබතුමාගේ සාමාන්‍ය නිලධාරි මණ්ඩලය මේක කරන්නේ නැහැ. ඒගොල්ලෝ කාර්යබහුල වැඩියි නේ. ඒගොල්ලන්ට ගොඩක් වැඩ තිබෙනවා. ඒ වාගේම එක එක් කෙනාගේ ඔළුවල තිබෙන ප්‍රශ්නත් එක්ක මේකට උදලු දානවා, බාල්දි පෙරළනවා. ඒගොල්ලන්ගේ සංවේදිකම අඩු වෙන්න පුළුවන්. හැබැයි, මේ වැඩේටම විශේෂ කාර්ය සාධක බලකායක් පත් කරලා අහවල් දවසට කලින් මේ ඔප්පු ටික දීලා අවසන් කරන්න. අපි දන්නවා, දැන් ඉඩම් හඳුනා ගෙන තිබෙන බව, ඉඩම් බොහෝමයක් - සියයට 90ක් වාගේ - මැනලා තිබෙන බව. ඒ වාගේම හරියටම දැන් ප්‍රාදේශීය ලේකම් වෙත බලපත්‍ර අරගෙන තිබෙනවා. එම නිසා මේක කරලා අවසන් කරන්න පුළුවන්. මේ, පසුගිය කාලය තුළ යම් දියුණුවක් ඇති වෙච්ච වැඩ පිළිවෙළක්. ඔබතුමාට මේ relay එකේ අවසාන පියවර තමයි යන්න තිබෙන්නේ.

අවසාන වශයෙන් තව කටයුත්තක් තිබෙනවා. ඒ තමයි, හිටපු ජනාධිපතිතුමාගේ අත්සනින් ඔප්පු 23,018ක් අත්සන් කරලා තිබෙනවා. අන්න ඒ ටිකත් දීලා දාන්න, ගරු ඇමතිතුමනි. ඔබතුමාට පින් සිද්ධ වෙනවා. ඒ ඔප්පු නැවත අච්චු ගහන එක, නැවත ජනාධිපතිතුමා අත්සන් කරන එක තේරුමක් නැහැ නේ. හිටපු ජනාධිපතිතුමා අත්සන් කරපු දවසේ Titles පාස් වෙලා තිබෙන්නේ. දැන් ඒ ඔප්පු 23,018 පිටපත් උත්සවශ්‍රීයෙන් හරි, උත්සවශ්‍රීය නැතිව හරි ඒ 23,018 දෙනාට දෙන්න. අනුර කුමාර ජනාධිපතිතුමාටයි, ඔබතුමාටයි තමයි පින. *[බාධා කිරීමක්]*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
කමිටු වාර්තාව තිබෙනවා, මෙතැන.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හොඳයි. බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා. ඒ ඔප්පු 23,018 ඒ අත්සනින්ම දෙන්න. පින, ගෞරවය, ඔබතුමන්ලාටයි. මම ඒ කාරණය මතක් කරනවා. ඔබතුමා ඒකට ධනාත්මක ප්‍රතිචාරයක් දක්වයි කියලා මම හිතනවා. ඔබතුමාගේ මුහුණුවරින්, ඔබතුමාගේ හැසිරීමෙන් මට පෙනෙනවා, හොඳ උත්තරයක් දෙන්න යන්නේ කියලා. මේ වැදගත් යෝජනාව ඉදිරිපත් කරන්න ලැබීම ගැන මමත් සතුටු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.31]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා අද දිනයේ ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ස්ථිර කරමින් ඒ පිළිබඳව කරුණු කීපයක් මතක් කරන්න මම කැමැතියි. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේ කමිටුවේ තිබෙන තත්ත්වය සහ ඉඩම් කොමසාරිස් ජනරාල් නිකුත් කරපු නිවේදනයේ, එහෙම නැත්නම් ගැසට් නිවේදනයේ, එහෙම නැත්නම් එතුමා දුන් චක්‍රලේඛයේ විශාල වෙනස්කම් රාශියක් තිබෙනවා. එකක් තමයි, එම චක්‍රලේඛයේ අංක දෙක යටතේ "හිමිකම නිදහස් ප්‍රදාන පත්‍ර සකස් කිරීම සඳහා අවසර පත්‍ර/ දීමනා පත්‍ර භාර නොගත යුතු අවස්ථා" කියලා තමයි දාලා තිබෙන්නේ. එහි බොහොම පැහැදිලිව, "ජීවිත භුක්තිය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍ර සහ දීමනා පත්‍ර මත නිදහස් ප්‍රදාන පත්‍ර ඉල්ලුම් කිරීම, ගොවි පන්තිය යටතේ වගාවට හෝ පදිංචියට හෝ වගාව හා පදිංචියට ලබා දී ඇති ඉඩම් වෙනත් අරමුණු සඳහා භාවිත කිරීම, මධ්‍යම පන්තික වැඩසටහන යටතේ බැහැර කර ඇති ඉඩම්, නිරවුල්ව ඉඩම භුක්ති නොවිඳීම, ඉඩම මැනුම් කටයුතු කර නොමැති වීම, මූල්‍ය ආයතනයකට හෝ බැංකුවකට ඉඩම උකස් කර තිබීම, අවසර පත්‍රයක් මත නිදහස් දීමනා පත්‍ර ඉල්ලුම් කරන විට අවසර පත්‍රය නිකුත් කර ඇත්තේ මඩ ඉඩමක් සඳහා නම් වසර තුනක්ද, ගොඩ ඉඩමක් සඳහා නම් වසරක්ද ගතව නොමැති වීම, බැහැර කර ඇති ඉඩම්වල නෛතික ගැටලු පැවතීම, නාගරික බල ප්‍රදේශයක් ලෙස ගැසට් කිරීමෙන් පසු ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අවසර පත්‍ර නිකුත් කර තිබීම, මෙම වැඩසටහන සඳහා කැබිනට් අනුමැතිය ලබා දෙන ලද 2025.07.21 දිනෙන් පසු අවසර පත්‍ර මඟින් සිදු කරන බැහැර කිරීම්" කියලා කරුණු ගණනාවක් දාලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත්, අපේ නාමල් මැතිතුමාත් ප්‍රායෝගිකව වැඩ කරන මිනිස්සු. මේ චක්‍රලේඛයේ ඇති කරුණුවලින් ඇත්තවශයෙන් දෙන්න තිබෙන ඔප්පු ප්‍රමාණය විශාල වශයෙන් අඩු වෙනවා. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය. කමිටු වාර්තාවේ තිබෙන තත්ත්වය එක්ක ගත්තාම මේක සම්පූර්ණයෙන් වෙනස්. කමිටු වාර්තාවේ මෙහෙම එකක් නැහැ. මම දන්නේ නැහැ, මේගොල්ලෝ මේක කොහොමද හැදුවේ කියලා. සමාලෝචන කමිටු වාර්තාවේ අවසාන වශයෙන් සඳහන් කරනවා, "ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද බලපත්‍ර හා දීමනා පත්‍ර සඳහා නිදහස් දීමනා පත්‍රයක් හෙවත් සින්නක්කර ඔප්පුවක් නිකුත් කිරීම සුදුසුයි" කියලා. ඒ වාගේම පහත සඳහන් ක්‍රමවේද අනුගමනය කරන්න කියලාත් එහි කියලා තිබෙනවා. විශේෂයෙන් නීතිපති විමසා ඉදිරි පියවර ගැනීම, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රය හෝ ප්‍රදාන පත්‍රය රජයට භාර දී "උරුමය" වැඩසටහන යටතේ නිදහස් ප්‍රදාන පත්‍රයක් ඉල්ලුම් කරන අවස්ථාවේදී අවසර පත්‍රකරුගේ හෝ ප්‍රදාන පත්‍රලාභියාගේ එකඟතාවට අමතරව කලත්‍රයා, අවිවාහක දූ දරුවන්, භුක්තිකරුවන් සහ ලේඛනගත පසු උරුමකරුවන්ගේ එකඟතාව ලබා ගැනීම කියලාත් එහි තිබෙනවා. මේ වාගේ කරුණු ගණනාවක් මේ වාර්තාවේ ඇතුළත් කර තිබෙනවා.

ඒ වාගේම, සකස් කර ඇති මැනුම් සිතියම්වලට අදාළව මායිම් ගැටලු හෝ අයිතිය පිළිබඳ ගැටලු නොමැති බවට අවසර පත්‍රකරු හෝ ප්‍රදාන පත්‍රකරු සහතික වන්නේ නම් නිදහස් ප්‍රදාන පත්‍ර නිකුත් කිරීමේ මූලික පියවර ආරම්භ කිරීම හා මායිම් ගැටලු හා අයිතිය පිළිබඳ ගැටලු පවතී නම් ප්‍රදාන පත්‍රයක් නිකුත් කිරීම සඳහා නිර්දේශ කිරීමට පෙර ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මිනින්දෝරු හෝ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවකුගේ අධීක්ෂණය යටතේ රේඛා චිත්‍රය ගන්න කියලාත් තිබෙනවා. මේ විධියට ගත්තාම, ඇත්තවශයෙන්ම ප්‍රශ්න ගණනාවක් මතු වෙනවා. මම හිතන විධියට, මේ වන විට රජයට භාර දීලා තිබෙනවා, අවසර පත්‍ර හා ප්‍රදාන පත්‍ර 142,691ක්. ඒ අතර ඉඩම් කොමසාරිස් ජනරාල්ට භාර දී ඇති ප්‍රමාණය 72,917ක්. මහවැලි අධිකාරියට භාර දී තිබූ ප්‍රමාණය 69,774ක්. භාර දුන් ප්‍රමාණයෙන් හදලා දුන් ප්‍රමාණය පිළිබඳවත් සංඛ්‍යාලේඛන ගණනාවක් තිබෙනවා. මම කියන්න කැමැතියි, මේ "උරුමය" කියලා පටන් ගත්ත වැඩසටහන තුළ සමහර කාරණා සම්බන්ධයෙන් ඒ කාලයේ විපක්ෂයේ සිටියදී අනුර දිසානායක මැතිතුමන්ලා, අපි යම් කිසි විධියකට ඒකට පොඩි ප්‍රශ්නයක් මතු කළ බව. ඇත්තටම අපි හිතුවා, මේවා විකුණයි කියලා. හැබැයි, මේ ගත්ත අය විකුණපු ප්‍රමාණය පිළිබඳව ඔබතුමා ළඟ ලැයිස්තු ටික ඇති. අද සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? මට මතකයි, උතුරු මැද පළාතේ තුන්දහස් ගණනක් හෝ භාර දහසක් දීලා තිබුණා. ඒකෙන් විකුණලා තිබුණේ අටයි. ඒ කියන්නේ 2022, 2023 ඉඳලා ගත්තාම අවුරුදු දෙක තුනක් ඇතුළත. මිනිස්සු මේවා විකුණන්නේ නැහැ. මිනිස්සුන්ට මේ ඉඩම් සම්බන්ධව ස්ථිර අයිතිවාසිකමක් ලබා ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ කාරණා එක්ක වෙන්න පුළුවන්, මේක අඩු කරන්න පුළුවන් කියන මතයක් ඔබතුමන්ලා තුළ ඇති වෙලා තිබෙන්නේ.

අපි හරියට කල්පනා කරලා බලමු. මේකේ නාමකරණය ඔබතුමන්ලා වෙනස් කරන්න, ඒකේ ප්‍රශ්නයක් නැහැ. "උරුමය" හෝ "හිමිකම" හෝ ඕනෑම එකක් කිව්වාට කමක් නැහැ. මිනිස්සුන්ට ඔප්පුවයි අවශ්‍ය වෙලා තිබෙන්නේ. මොකද, අවුරුදු ගණනාවක් තමන්ට ඔප්පුවක් නැතුව ජීවත් වුණු මිනිස්සු ප්‍රමාණයක් මේ රටේ ඉන්නවා; ලක්ෂ ගණනක් මිනිස්සු ඉන්නවා. ඒ නිසා, මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. අර ලබා දුන් වාර්තාවේ තිබෙන ඒවාට අමතරව, එහි නැති ඒවා මේ ඉඩම් කොමසාරිස් ජනරාල් ගෙනැල්ලා ගහපු චක්‍රලේඛයේ තිබෙනවා. කරුණාකරලා ඒක සමාලෝචනය කරන්න. මේ ඔප්පු ටික භාර දුන් මිනිස්සු දැන් බලාගෙන ඉන්නවා. ඔප්පුව නැතුව දැන් අවුරුදු දෙකක් වෙන්න එනවා. ඒ නිසා කරුණාකරලා ප්‍රායෝගිකව කල්පනා කරලා මේකට අවශ්‍ය කරන පියවර ගන්න කියන ඉල්ලීම කරනවා.

අද දවසේ මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව ගරු අජිත්.පී පෙරේරා මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව ඔබතුමා ප්‍රායෝගිකව දකින කාරණය ගැන අපිට පැහැදිලි කරන්න කියලා ඉල්ලමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරවින්ද සෙනරත් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.36]

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විපක්ෂය ඉදිරිපත් කරපු සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගැන කිව්වොත්, මේ රටේ ජනතාව මුහුණ දෙන, ජනතාවගේ සිහිනයක් වෙච්ච ඉඩමේ අයිතිය පිළිබඳ ගැටලුව නිරාකරණය කර ගැනීම සහ එහිදී ඇති වෙලා තිබෙන තත්ත්වයන් පිළිබඳව විමසලා තමයි, විපක්ෂය මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. අපේ රටේ දශක ගණනාවක සිට මේ ඔප්පු ලබා දීමේ ගැටලුව බරපතළ විධියට ජනතාව ඉදිරියේ තිබෙනවා. විවිධ අවස්ථාවල මැතිවරණ ඉලක්ක කරලා

[ගරු අරවින්ද සෙනරත් මහතා]

තමයි, පැවති ආණ්ඩු ඔප්පු ලබා දෙනවා කියලා පොරොන්දුව දුන්නේ. හැබැයි, අපේ රටට ඕනෑ කරන්නේ මැතිවරණයක් ඉලක්ක කරලා දෙන පොරොන්දු මත ඔප්පුව ලබා දීමේ වැඩ පිළිවෙළක් නොවෙයි. රටේ සංවර්ධනය සහ රටේ පුරවැසියන්ගේ අවශ්‍යතා ඉෂ්ට කරන ඉලක්ක සහගත වැඩ පිළිවෙළක් ඕනෑ.

2024 ජනාධිපතිවරණය ඉලක්ක කරලා, ලක්ෂ 20කට "උරුමය" ඔප්පු දෙන්න තමයි පැවති ආණ්ඩුව යෝජනා ඉදිරිපත් කළේ. හැබැයි, අපේ රටේ තිබෙන හැකියාව, දෙපාර්තමේන්තුවේ තිබෙන හැකියාවන් ගත්තාට පස්සේ ඒ පිළිබඳව අධ්‍යයනයකින් පසුවද ඒ යෝජනාව ගත්තේ කියන එක පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. අපිට ඕනෑ මැතිවරණ පොරොන්දුවක් ඉෂ්ට කරන්න නොවෙයි, අපිට ඕනෑ ජනතාවගේ ප්‍රශ්න විසඳන්න. ඒ නිසා දැනටම මේ සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරමින් තිබෙනවා. බලපත්‍රලාභීන් හඳුනා ගැනීම, ඒ බලපත්‍රය පවරා ගැනීම, ඒකට අදාළ නිදහස් හිමිකම ලබා දීම කියන මේ ක්‍රියාවලිය විධිමත් කරමින් තිබෙනවා. රටේ පුරවැසියාට ඉඩමේ අයිතිය තිබෙන්න ඕනෑ. ඒ සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් එක්ක අපේ ආණ්ඩුව කටයුතු කරමින් තිබෙනවා. ඒ නිසා පැවති ආණ්ඩුව මැතිවරණ පොරොන්දුවක් එක්ක ඡන්ද ඉලක්ක කරලා, ඔප්පුවෙන් ලක්ෂ 20යි, රාජ්‍ය සේවකයෝ ලක්ෂ 14යි කියලා ඡන්ද ගොඩවල් හදන්න ගෙනාපු ඒ අවිධිමත් වැඩ පිළිවෙළ වෙනුවට, ඉතා විධිමත් වැඩ පිළිවෙළක් අපි හඳුන්වා දීලා තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් කියන විධියටම ජනතාවගේ සිහිනය සැබෑ කරන්න ඕනෑ වැඩ පිළිවෙළ අපි හදලා තිබෙනවා.

මේ වනකොට ඉඩම් කොමසාරිස් හරහාත්, මහවැලිය හරහාත් ඔප්පු 49,402කට ආසන්න ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවාය කියලා තොරතුරු තිබෙනවා. ඒ වාගේම ඔබතුමන්ලා නැවත ඉල්ලා සිටි විධිමත්ව සකස් කරපු ඉතිරි ඔප්පු ටික ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ලබා දීමට ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ඒවා යොමු කර තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා ඉදිරිපත් කරපු ප්‍රශ්නයට පිළිතුරු ආණ්ඩුවක් විධියට අපි මේ වනකොටත් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ඇතුළේ තිබුණා, මේ සඳහා විවිධ නිර්ණායක හඳුන්වා දීලා මේ කටයුත්ත සීමා කරමින් තිබෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉඩම් සඳහා අපේ රටේ බලපත්‍ර දීලා තිබෙන්නේ විවිධ ක්‍රියාමාර්ග හරහායි. සමහර වෙලාවට පදිංචි වෙලා ඉන්න කෙනාට නැතුව කිලෝමීටර 25ක්, 30ක් දුර ඉන්න වෙනත් කෙනෙකුට එම බලපත්‍රය ලබා දීලා තිබෙනවා. එම නිසා බලපත්‍ර ලබා දීමේ යම් යම් ගැටලු තිබෙනවා, ඒවා නිරවුල් කරගන්න ඕනෑ. පුරවැසියන් නැවත වටයකින් අර්බුදයට ලක් කරන්න ආණ්ඩුවට අයිතියක් නැහැ. ඒ නිසා තමයි යම් යම් සීමා යොදා මේවා පිළිබඳව විධිමත් සොයා බැලීමකින් පසුව ඔප්පු ලබා දීම - හිමිකම ලබා දීම - සඳහා කටයුතු කරමින් ඉන්නේ.

සමහර දේශපාලනඥයන් හිතුමතේ ඉඩම් අත්පත් කරගෙන ඒවාට බලපත්‍ර හදාගෙන තිබෙනවා. ඒ විධියට වනජීවී භූමි ඇතුළේ, මහවැලියට අයත් භූමිය ඇතුළේ, වන සංරක්ෂණ භූමි ඇතුළේ, වාරිමාර්ග රක්ෂිතවල තිබෙන ඉඩම් සඳහා බලපත්‍ර හදා ගත් අවස්ථා ඕනෑ තරම් අපට හමු වෙමින් තිබෙනවා. ඒ නිසා යම් ඉඩමකට ඔප්පුවක් ලබා දෙනකොට ඒ සම්බන්ධව විධිමත් ක්‍රමවේදයකින් සොයා බැලීම කළ යුතු වනවා. ඒ නිසා තමයි ආණ්ඩුව වශයෙන් අපි මෙන්න මේ "හිමිකම" නම් වූ ඔප්පු ලබා දීමේදී ක්ෂේත්‍ර පරීක්ෂාවක් කරන්නේ. ක්ෂේත්‍ර පරීක්ෂාවක් කරලා ගැටලු හඳුනාගෙන, එම ගැටලු නිරාකරණය වූ ඉඩම් කැබලි සඳහා හිමිකම ලබා දීමට තමයි ආණ්ඩුව වශයෙන් අපි කටයුතු කරමින් ඉන්නේ.

ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන යෝජනාව ඇතුළේ සමහර විට අතීත අත්දැකීම් තිබෙනවා. ඒ වාගේ නිර්ණායක දැම්මාට පස්සේ මේ කටයුතුවල ප්‍රමාදවීම් සිදුවනවා තමයි. හැබැයි අපි ආණ්ඩුවක් විධියට මේ නිර්ණායක දැමුවාට, ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙමින් ඉන්නේ. ඒ වාගේම ආණ්ඩුව විසින් මේ යන්ත්‍රණය ශක්තිමත් කරමින්, වේගවත් කරමින් ඉන්නවා, මේ ඉඩම් ගැටලු නිරවුල් කරලා පුරවැසියන්ට අවශ්‍ය හිමිකම් ලබා දෙන්න. මේ නිර්ණායක දමා තිබෙන්නේත් රටක් ලෙස නැවත සිතා බැලිය යුතු මූලික කාරණා ඉලක්ක කරලායි. එහෙම නැතුව ආණ්ඩුවට අවශ්‍යතාවක් නැහැ, මේ ඔප්පු ලබා දීම ප්‍රමාද කරන්න. දැන් අපි මේ කටයුත්ත වේගවත් කරලා තිබෙනවා. අපට පුළුවන්කම ලැබේවි, 2026 අවුරුද්දේදී ලංකාවේ වැඩිම බලපත්‍ර ප්‍රමාණය ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ලබන අවුරුද්ද ඇතුළත "හිමිකම" ඔප්පු වැඩිම ප්‍රමාණයක් ලබා දෙන්නත් කටයුතු කරමින් සිටිනවා. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ජනතාවාදීයි. එතුමා මේ කාරණයට අදාළව ඉදිරිපත් කළ සමහර යෝජනා තිබෙනවා, සලකා බැලිය යුතු මට්ටමේ. ඒ පිළිබඳවත් අවධානය යොමු කරමින්, රටේ ජනතාවගේ ඔප්පු ලබා ගැනීමේ සිහිනය සැබෑ කරන්නත් අපේ ආණ්ඩුව මූලික පියවර තබමින් වේගවත්ව කටයුතු කරමින් සිටිනවාය කියන පණිවුඩය තමයි අපට දෙන්න තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට පිළිතුරු කථාව, කේ.ඩී. ලාල් කාන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.43]

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී තිබෙන කාලය ඉතාම සීමිත නිසා කෙටියෙන්ම කිව්වොත්, මේක ඉතාම වැදගත් සාකච්ඡාවක් සහ යෝජනාවක්. අපේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා මේ තුළින් යෝජනා 4ක් ඉදිරිපත් කරලා තිබෙනවා. මූලික වශයෙන් ගත්තොත්, මේ හතරටම එකඟයි. කිසිම ගැටලුවක් නැහැ. හිටපු ජනාධිපතිතුමා මඟින් ලබා දීපු ඔප්පුව "උරුමය" නේ. ඒකේ අන්තර්ගතයයි, දැන් අපි ලබා දීපු ඔප්පුවයි අතර වෙනසක් තිබෙනවා. සමාලෝචන වාර්තාව බැලුවා නම්, ඒ වෙනස පෙනෙනවා. මේ සිටින අපේ ගරු මන්ත්‍රීවරුන් දෙදෙනාම නීතිඥ මහත්වරුන්. මමත් කෝකටත් නීතිඥ මහත්මයෙක් ළඟින් තියා ගත්තා. වාර්තාව අනුව බැලුවොත්, කලින් එකට වඩා මේකේ යම් වෙනස්කම් ප්‍රමාණයක් තිබෙනවා කියලා ඉතා පැහැදිලියි. එක වෙනසක් තමයි, මීට කලින් ඔප්පුව ඉල්ලන්න තමන් ළඟ තිබෙන බලපත්‍ර ප්‍රාදේශීය ලේකම්තුමාට භාර දෙනකොට එම ඉඩමේ

පදිංචි අනෙක් අයගේ කැමැත්ත නොවිමසීම. මේ ඔප්පුව ඉල්ලුවේ තාත්තා කියලා අපි හිතමු. දුවක් ඉන්නවා නම්, පුතෙක් ඉන්නවා නම්, බිරිඳ ඉන්නවා නම්, පවුලේ අනෙක් අය ඉන්නවා නම් ඒ අයගෙනුත් මේ සඳහා කැමැත්ත විමසන්න ඕනෑ. මොකද, ලංකාවේ පවුල කියන ඒකකය තුළ සුරක්ෂිතභාවය තවම තිබෙනවා. සමහර වෙලාවට යුරෝපීය රටක නම් තනි පුද්ගලයකුටත් ආර්ථික ශක්තියක් - හැකියාවක් - තිබෙනවා. නමුත් තවම අපේ රටේ අය පවුල කියන ආර්ථික ඒකකය ඇතුළේ යැපෙන නිසා අපි තීරණයක් ගත්තා, මේ ඔප්පුව ලබා දීමේදී ඒ අයගේත් කැමැත්ත අවශ්‍යයි කියලා. ඒ හින්දා තමයි උරුමය ඔප්පු ලබා දීම නතර කළේ. ඒ වාගේම අර ලේඛන ටික අරගෙන උරුමය ඔප්පු ලබා දෙනකොට ඉඩම් ඉතාම කුඩා කැබලිවලට කැඩීමට ඉඩක් තිබෙනවා. ඒ නිසා අපි තීරණය කළා, ඒකත් නවත්වන්න ඕනෑ කියලා. මෙතැනදී අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියපු ප්‍රශ්නය එන්නේ නැහැ. මොකද, ඔප්පුව ගන්න කෙනා ඉඩම විකිණුවාට කමක් නැහැ. ඒකේ ප්‍රශ්නයක් නැහැ. ඔප්පුව ගත්ත ඔක්කෝම අය ඉඩම් විකිණුවත් කමක් නැහැ. ඉඩම් විකුණන්නත් උදවු වෙන විධියට තේ මේ ඔප්පුව දෙන්නේ. ඒක තේ මෙහි පදනම. එම නිසා ඒකේ කිසි වැරැද්දක් නැහැ. මගේ ඉඩම මම විකුණනවා. ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි ඒක අනවශ්‍ය විධියට කැබලි කරලා විකුණනවා නම් එතැන ගැටලුවක් තිබෙනවා. ඒ නිසා ඒකත් වෙනස් කරන්න අපට ඕනෑකමක් තිබුණා. ඔන්න ඔය දෙපැත්ත තමයි තිබුණේ. ඒකත් වෙනස් කරලා තමයි "හිමිකම" නමින් ඔප්පුව දෙන්න අපි තීරණය කළේ.

"උරුමය" ඔප්පුවට වඩා මෙහි අන්තර්ගතය සම්පූර්ණයෙන්ම වෙනස්. තිබෙන අණ පනත්වලට අනුව ඉඩම් කැබලි කිරීමට බාධා තිබෙනවා. දැන් ලේඛන ටික දීලා ඔප්පුව ඉල්ලද්දී පවුලේ අනෙක් අයගේ කැමැත්ත සහිත ලිපියකුත් අපි ගන්නවා. එතකොට මේකේ අන්තර්ගතය වෙනස්. අපි හිතනවා, ඒක වඩාත් යුක්තිසහගතයි, සාධාරණයි කියලා. නමුත් අපේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා මෙතැනදී මූලික ප්‍රශ්නයක් මතු කරලා තිබුණා, චක්‍රලේඛය නිකුත් කරද්දී කැබිනට් තීරණයට වෙනස්ව එය ඉදිරිපත් කරලා තිබෙනවා කියලා. ඒක මම හොයලා බලන්නම්, සලකා බලන්නම්. ඒ සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් නැහැ. අනිවාර්යයෙන්ම ඇමති මණ්ඩල තීරණයට අනුව තමයි චක්‍රලේඛය නිකුත් වෙන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමනි, නමුත් මම ඉඩම් කොමසාරිස් ජනරාල්තුමාගෙන් මේ ගැන විමසීමක් කළා, ඔබතුමා මේ ප්‍රශ්නය ඉදිරිපත් කළාට පස්සේ. එතුමා ඉදිරිපත් කළ කාරණය මෙයයි. සමාලෝචන කමිටු වාර්තාවේ 8(2)ට -වාර්තාව දැන් තිබෙනවා නම් පොඩ්ඩක් බලන්න- අනුව එතුමා කියනවා, මේක සමාලෝචන වාර්තාව ඉක්මවා ගිහිල්ලා නැහැ කියලා. කමිටු නිර්දේශයේ 8(2)හි සඳහන්ව තිබෙනවා, "ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර" කියලා. ඒ කියන්නේ, ඒ අනුව නිකුත් කරන ලද අවසර පත්‍ර. මේ වැඩසටහන සම්මත කරන්නේ 2025.07.21වැනි දා. එතැනදී සලකා බලා තිබෙනවා, "ඒ වෙනකොට නිකුත් කරන ලද" කියන පදනම. එතකොට 2025.07.21න් පස්සේ නිකුත් කරන අවසර පත්‍රවලට මේ හිමිකම ඔප්පුව ලබා දීම අදාළ වන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ කාරණය මතු කරලා තිබුණා, කැබිනට් තීන්දුව උල්ලංඝනය කරලා ඒ නීතිය ආලා තිබෙනවා කියලා. ඉඩම් කොමසාරිස්තුමා මතු කළේ "නිකුත් කරන ලද" කියන පදනම මත ඒ වෙනකොට -මේක සම්මත කරනකොට- නිකුත් කරලා තිබුණු ඒවාට තමයි මේ හිමිකම ඔප්පුව ලබා දීම අදාළ වන්නේ කියන කාරණය. ඇත්තටම ඒකෙන් අදහස් කරන්නේ කාලයක් තිස්සේ ඉඩම් ඔප්පු නොදී හිටපු අයට මේ ඔප්පුව ඉක්මනට දීලා ඉවර කරන්න ඕනෑය කියන එකත්, 2025.07.21න් පස්සේ අවසර පත්‍ර ලබා දෙන අයට ඒ සඳහා තව ටිකක් කල් ගියාට කමක් නැහැ කියන එකත්. ආයෙත් කැබිනට් මණ්ඩල තීරණයක් අරගෙන අපට ඒක වෙනස් කිරීමට අවශ්‍ය නම් එහෙම කළාට කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් අපට පිළිගන්න වන යුක්තිසහගත තත්ත්වය තමයි, කාලයක් තිස්සේ මේ ඔප්පු ලබා නොදී හිටියා කියන එක.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන එක ඇත්ත. සියයට 80ක් විතර තවම තිබෙන්නේ රජයේ ඉඩම්. මේවාට ඔප්පු ලබා දීලා නැහැ. මේවායේ ඔප්පු ලබා දෙන්න ඕනෑ. අපි ඉන්නේ ඒවා දෙන්න ඕනෑ කියන පදනමේ. මූලික වශයෙන් මේ ඔප්පු වර්ග දෙක සමාන නැහැ. එක්තරා ඉරිදා පත්තරයකත් දාලා තිබෙනවා මම දැක්කා, "රනිල්ගේ 'උරුමය'ට අනුර 'හිමිකම' කියලා දාගෙන" කියලා. ඒක වැරදියි. ඒක වගකිව යුතු වටිනා පත්තරයක්; ඉරිදා එන්නේ. ඒ පත්තරය බලන්නේ ටික දෙනායි. නමුත් ඒ පත්තරය බලන්නේ ටිකක් කියවන, මධ්‍යම පාන්තික ඉහළ පිරිසක්. නමුත්, ඒ පත්තරේ පළ වෙලා තිබෙන තොරතුර සම්පූර්ණයෙන් වැරදියි.

ඊළඟට, මේ යෝජනා ටිකට පක්ෂයි කියලා මම කිව්වා. චක්‍රලේඛයේත් වැරැද්දක් තිබෙනවා නම් අනිවාර්යයෙන්ම ඒක අපි නිවැරදි කරනවා. ඒ නිසා කිසි ප්‍රශ්නයක් නැහැ. අපි බලයට එනකොටත් රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා දීපු ඉඩම් ප්‍රමාණයක් තිබුණා. එතකොට ඒක ප්‍රශ්නයක් නැහැ නේ. අත්සන් කරපු ප්‍රමාණයක් තිබෙනවා. කමිටු වාර්තාවේත් තිබෙනවා, ඒ අත්සන් කරපු ප්‍රමාණයත් ලබා දෙන්න කියලා. ඒ නිසා කිසි ප්‍රශ්නයක් නැහැ, එතුමා අත්සන් කර තිබුණු දේවල් ටිකත් අපි ලබා දෙනවා. දැනටම ඒවා නිකුත් කරනවා. ඒ කියන්නේ, 2025.07.21 දිනෙන් පසුව ඒවා නිකුත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මකයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ඇමතිතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් තිබෙන ප්‍රධානම ගැටලුවක් වෙන්නේ මේ වැඩේට වෙනම special unit එකක් නැති වීමයි. Task force එකක් හදනවා කියන එක ටිකක් වැඩිපුර වැඩක්. නමුත් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, special task force එකක් හදන්න කියලා. ඔබතුමා ප්‍රතිපත්තිමය වශයෙන් ඒකට එකඟ වන එකට ස්තුතියි. එතකොට අපට අවුරුද්දකින්, දෙකකින් මේ මුළු කටයුත්තම ඉවර කරගන්න පුළුවන්. ඒ ගැන විශේෂ අවධානයක් ඔබතුමා යොමු කරන්න. මොකද, සාමාන්‍ය නිලධාරින්ට වෙනත් වැඩ තිබෙනවා. ඒගොල්ලන් අභියාචනා අහන්න, දුක්ගැනවිලි අහන්න පැටලුණොත් මේ කටයුත්ත කෙරෙන්නේ නැහැ.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ඔබතුමාගේ කථාවෙනුත් ඒ ටික highlight කළා. ඒක තවත් highlight කළ එකත් හොඳයි. මේ සම්බන්ධයෙන් කාර්යසාධක බලකායක් පත් කරන්න ඕනෑ කියන යෝජනාව සමහර නිලධාරි මහත්වරුන් විසිනුත් සිදු කළා. විපක්ෂයේ අය වාගේම ආණ්ඩු

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

පක්ෂයේ අයත් මට කිව්වා, එහෙම එකක් ක්‍රියාත්මක කරලා මේ කටයුතු වේගවත් කරන්න කියලා. ඒක ඉතාම වටිනා යෝජනාවක්. ඒ නිසා ඒකේ ප්‍රශ්නයක් නැහැ.

මම කිව්වා නේ, හිටපු ජනාධිපතිතුමා අත්සන් කර තිබෙන ටිකත් දෙනවා කියලා. ඒකත් ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේ වෙනකොට භාර අරගෙන එතුමා අත්සන් නොකළ ප්‍රමාණයක් තිබෙනවා. ඒ ජනතාවට තමයි දැන් මෙහි ලොකුම ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. ඒ ටික මම කිව්ව අනෙක් පදිංචිකරුවන්ගෙනුත් ලියුමක් සහ එකඟතාව අරගෙන වේගයෙන් ලබා දෙනවා. ඒ ටික මාස 6ක් ඇතුළත ඉවර කරන්න අපි වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. මම හිතන විධියට, දැන් ඒකට අවශ්‍ය මූලික උත්තරය ලැබුණා. එම නිසා ඒ ගැන කියන්න ආපසු කාලය ගන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මම අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙනවා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු අදහස් ටිකත් අනිවාර්යයෙන්ම අපි සැලකිල්ලට ගන්නවා. චක්‍රලේඛයේ අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනි දෙයක් තිබෙනවා නම් ඒක අනිවාර්යයෙන්ම වෙනස් කරනවා. මොකද, ඒක වෙනස් කළ යුතුයි. නමුත් එතුමා කිව්වේ නිකුත් කරන ලද දීමනා පත්‍ර කියන පදනම මත තමයි චක්‍රලේඛය සකස් කළේ කියායි. ඒ ගැන අපි සොයා බලන්නම්. ඒ නිසා මේ යෝජනාව සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, දැන් ඉඩම් කොමසාරිස්වරුන් පළාත්වලට ගිහිල්ලා නේ. මේ සම්බන්ධයෙන් සමහර කට්ටිය confuse වෙලා තිබෙනවා කියන එකයි මම මේ කිව්වේ. ඒ නිසා අපි දෙදෙනාගේම මතය වුණේ ඒ ගැන අවධානය යොමු කරන්න කියන එකයි.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

දයාසිරි මන්ත්‍රීතුමාට තවත් මොනවා හරි කියන්න තිබෙනවා නම් ඒ ගැනත් කිව්වාට කමක් නැහැ. එහෙම ප්‍රශ්නයක් නැහැ. මේක හොඳ යෝජනාවක්. මේක බොහොම සද්භාවයෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනාවක් කියලා අපි පිළිගන්නවා. අපි මේ යෝජනාව ක්‍රියාත්මක කරනවා. ඔබතුමන්ලාගේ යෝජනාත් අපි සැලකිල්ලට ගන්නවා. බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 6.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.52ට, 2025 නොවැම්බර් 13වන දින සභා සම්මතිය අනුව, 2025 නොවැම්බර් 27වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.00 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.52க்கு, பாராளுமன்றம் அதனது 2025 நவம்பர் 13ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 நவம்பர் 27, வியாழக்கிழமை மு.ப. 9.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 6.30 p.m., THE HON.PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.52 p.m. until 9.00 a.m. on Thursday, 27th November,2025, pursuant to the Resolution of Parliament of 13th November,2025.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
# WRITTEN ANSWERS TO QUESTIONS

## අලුතින් ලියාපදිංචි කරන ලද වාහන සඳහා අංක තහඩු නිකුත් කිරීම: ප්‍රමාදය
## புதிதாக பதிவு செய்யப்பட்ட வாகனங்களுக்கான இலக்கத்தகடுகள் வழங்கல்: தாமதம்
## ISSUANCE OF NUMBER PLATES FOR NEWLY REGISTERED VEHICLES: DELAY

1628/2025

**1. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වාහන අලුතින් ලියාපදිංචි කිරීමේදී, රජය විසින් නිකුත් කරන අංක තහඩු ලබා දීමේ ප්‍රමාදයක් පවතින්නේද;
(ii) එසේ නම්, එම ප්‍රමාදයට හේතු කවරේද;
(iii) 2025.10.01 දින වනවිට, රජය විසින් අංක තහඩු නිකුත් කිරීම ප්‍රමාද වී ඇති රථ වාහන සංඛ්‍යාව කොපමණද;
(iv) එම ප්‍රමාදය වැළැක්වීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வாகனங்களைப் புதிதாகப் பதிவுசெய்கையில், அரசாங்கத்தால் இலக்கத்தகடுகள் வழங்கப்படுவதில் தாமதம் நிலவுகின்றதா என்பதையும்;
(ii) ஆமெனில், மேற்படி தாமதத்துக்கான காரணங்கள் யாவை என்பதையும்;
(iii) 2025.10.01ஆம் திகதியாகும்போது, அரசாங்கத்தால் இலக்கத்தகடு வழங்கப்படுவதில் தாமதம் ஏற்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;
(iv) மேற்படி தாமதத்தை தடுப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -
(i) whether there is a delay in issuing number plates by the Government when registering new vehicles;
(ii) if so, the reasons for the delay referred to above;
(iii) the number of vehicles for which the issuance of number plates by the Government has been delayed, as of 01.10.2025; and
(iv) the steps that will be taken to prevent the delay referred to above?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

(අ) (i) ප්‍රමාදයක් පවතී.

(ii) අංක අමප/24/0935/608/044 හා 2024.06.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව වාහන අංක තහඩු ලබා ගැනීම රජයේ කර්මාන්තශාලාව මඟින් සිදු කර ගැනීමට ඇති හැකියාව සලකා බැලීමටත්, එවැනි හැකියාවක් නොමැති නම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම යටතේ වාහන අංක තහඩු ලබා දීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට හැකි වන අයුරින් ප්‍රථමකොට තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් වාහන අංක තහඩු සැපයීමට සුදුසු ආයතනයක් තෝරා ගැනීමට කටයුතු කරන ලදී.

වාහන අලුතින් ලියාපදිංචි කිරීමේදී වාහන අංක තහඩු සැපයීමට අදාළව නව සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවීම 2024.12.30 දින පුවත් පත් දැන්වීම් මඟින් සිදු කරන ලදී. පළමුවර ලංසු කිසිවක් ඉදිරිපත් නොවීම හේතුවෙන් නැවත 2025.03.25 දින පුවත් පත් දැන්වීම් පළ කරන ලද අතර 2025.04.28 දින ලංසු විවෘත කිරීම සිදු කරන ලදී.

තෝරා ගන්නා ලද ලංසුකරු වෙත ප්‍රසම්පාදන පිරිනැමීම සඳහා ලංසු ප්‍රදානය කිරීමේ අභිලාෂය (Intension to Award) යොමු කරනු ලැබීමෙන් පසු ප්‍රතික්ෂේප වූ ලංසුකරුවන් දෙපාර්ශ්වයක් විසින් අභියාචනා ඉදිරිපත් කිරීම හේතුවෙන් එම අභියාචනා, ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය වෙත යොමු කරන ලදී. ඒ හේතුවෙන් මෙම ප්‍රසම්පාදනය ප්‍රමාදයට ලක් වී ඇත.

(iii) 291,435කි.

(iv) මේ වනවිට අභියාචනා කමිටුව මඟින් ලබා දී ඇති තීරණය අනුව කටයුතු කරමින් පවතින අතර, 2025.12.15 දින වනවිට වාහන අංක තහඩු මුද්‍රණය කර සැපයීම සඳහා වන ප්‍රසම්පාදනයේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අපේක්ෂා කෙරේ.

(ආ) අදාළ නොවේ.

(அ) (i) தாமதம் நிலவுகின்றது.

(ii) அංක අමප/24/0935/608/044 மற்றும் 2024.06.04ஆம் திகதிய அமைச்சரவைத் தீர்மானத்தின் பிரகாரம், வாகன இலக்கத் தகடுகளை அரச தொழிற்சாலையிலிருந்து பெறுவதற்கான சாத்தியப்பாடு தொடர்பாக ஆராய்ந்து பார்ப்பதற்கும், அத்தகைய சாத்தியப்பாடு இல்லையெனில், வழங்குநர்களைப் பதிவுசெய்தலின்கீழ் வாகன இலக்கத் தகடுகளை வழங்கும் வழிமுறையைச் செயற்படுத்துவதற்கும் இயலுமானவாறு முதன்மையாகக்கொண்ட போட்டித் தன்மை பெறுகை செயன்முறையைப் பின்பற்றி வாகன இலக்கத் தகடுகளை வழங்குவதற்குப் பொருத்தமான நிறுவனத்தைத் தேர்ந்தெடுப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட்டது.

வாகனங்களைப் புதிதாகப் பதிவுசெய்யும்போது வாகன இலக்கத் தகடுகளை வழங்குவதற்காகப் புதிய வழங்குநர் ஒருவரைத் தெரிவு செய்வதற்கான பெறுகைக்கான விலை மனுக்கோரல் 2024.12.30ஆம் திகதி செய்தித்தாள் விளம்பரங்கள்மூலம் மேற் கொள்ளப்பட்டன. முதல் தடவையில் விலை மனுக்கள் எதுவும் சமர்ப்பிக்கப்படாத காரணத்தால், 2025.03.25ஆம் திகதி மீண்டும் செய்தித்தாள் விளம்பரங்கள் வெளியிடப் பட்டதோடு, 2025.04.28ஆம் திகதி விலை மனுக்கள் திறக்கப்பட்டன.

தேர்ந்தெடுக்கப்பட்ட விலைமனுதாரருக்குப் பெறுகையை அளிப்பதற்கான விலைமனுவை அளிப்பதற்கான எண்ணம் (Intension to Award) அனுப்பப்பட்ட பின்னர், நிராகரிக்கப்பட்ட விலைமனுதாரர்கள் இரண்டு தரப்பினரால் தாக்கல்செய்யப்பட்ட மேன்முறையீடுகள் காரணமாக, அந்த மேன்முறையீடுகள் பெறுகை மேன்முறையீட்டுச் சபைக்கு அனுப்பப்பட்டன. இதன் காரணமாக, இந்தப் பெறுகை தாமதமடைந்துள்ளது.

(iii) 291,435

(iv) தற்போது, மேன்முறையீட்டுக் குழுவால் வழங்கப்பட்டுள்ள தீர்மானத்தின் பிரகாரம் அலுவல்கள் மேற்கொள்ளப்பட்டு வருவதோடு, 2025.12.15ஆம் திகதியாகும்போது வாகன இலக்கத் தகடுகளை அச்சிட்டு வழங்குவதற்கான பெறுகை ஒப்பந்தத்தை வழங்குவதற்கும் எதிர்பார்க்கப்படுகின்றது.

(ஆ) ஏற்புடையதல்ல.

(a) (i) There is a delay.

(ii) Action was taken to consider the possibility of obtaining vehicle number plates from the Government Factory in terms of the Cabinet Decision No. අමප/24/0935/608/044 dated 04.06.2024, and in the absence of such feasibility, to select an institution suitable for supplying number plates by initially following the competitive bidding process, thereby implementing the methodology to obtain number plates through registration of suppliers.

For the procurement intended to select a new supplier for issuing vehicle number plates at the time of new vehicle registration, bids were invited through newspaper advertisements on 30.12.2024. As no bids were received at the first calling, newspaper advertisements were published again on 25.03.2025, and the bid opening was conducted on 28.04.2025.

Following the issuance of the Intention to Award for granting the procurement to the selected bidder, two unsuccessful bidders submitted appeals. Consequently, these appeals were referred to the Procurement Appeal Board. Accordingly, this procurement has been subjected to delays.

[ගරු බිමල් රත්නායක මහතා]

(iii) 291,435.

(iv) At present, action is being taken in accordance with the decision taken by the Procurement Appeal Board, and it is expected to award the contract for the procurement to print and supply the vehicle number plates by 15.12.2025.

(b) Not relevant.

## කොළඹ ජාතික කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩ: ආරක්ෂාව
## கொழும்பு தேசிய நூதனசாலையிலுள்ள அரும்பொருட்கள்: பாதுகாப்பு
## ARTEFACTS IN COLOMBO NATIONAL MUSEUM: SECURITY

1629/2025

**2. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ ජාතික කෞතුකාගාරයේ ඇති කෞතුක භාණ්ඩ ආරක්ෂා කර ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් තිබිය යුතු බවත්;

(ii) ජාතික කෞතුකාගාරයේ ඇති සුවිශේෂ වටිනාකම් ඇති කෞතුක භාණ්ඩවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා විශේෂ පියවර ගත යුතු බවත්;

එතුමා පිළිගන්නේද;

(ආ) කොළඹ ජාතික කෞතුකාගාරයේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම වෙනුවෙන්,

(i) 2025 වසරේදී වැය කර ඇති මුදල කොපමණද;

(ii) 2026 වසරේදී වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு தேசிய நூதனசாலையிலுள்ள அரும்பொருட்களைப் பாதுகாப்பதற்காக சரியான முறையியலொன்று இருக்க வேண்டும் என்பதையும்;

(ii) தேசிய நூதனசாலையிலுள்ள மிகவும் பெறுமதிமிக்க அரும்பொருட்களின் பாதுகாப்பை உறுதி செய்வதற்காக விசேட நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) கொழும்பு தேசிய நூதனசாலையின் பாதுகாப்பை மேம்படுத்துவதற்காக,

(i) 2025ஆம் ஆண்டில் செலவு செய்யப்பட்டுள்ள நிதி எவ்வளவு என்பதையும்;

(ii) 2026ஆம் ஆண்டில் செலவு செய்வதற்கு எதிர்பார்க்கப்படும் நிதி எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he admit that -

(i) a proper procedure should be established to safeguard the artefacts housed in the Colombo National Museum; and

(ii) special measures should be taken to ensure the security of artefacts of exceptional value kept in the National Museum?

(b) Will he inform this House the amount of money -

(i) spent in 2025 for enhancing the security of the Colombo National Museum; and

(ii) expected to be spent in 2026 for enhancing its security?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

(අ) (i) කෞතුක භාණ්ඩ ආරක්ෂා කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් පවතී.

(ii) කෞතුක භාණ්ඩවල ආරක්ෂාව සඳහා පහත පියවර ගෙන තිබේ.

- පැය 24 පුරාම ක්‍රියාත්මක වන CCTV කැමරා පද්ධතියක් සියලුම ප්‍රදර්ශන මැදිරි ආවරණය වන පරිදි ස්ථාපිත කර තිබීම හා එම දර්ශන නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම.
- කොළඹ ජාතික කෞතුකාගාරය ආවරණය වන පරිදි ගිනි ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කර තිබීම හා නඩත්තු කිරීම.
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සඳහා දෙපාර්තමේන්තුගත මුර සේවයක් පවත්වා ගෙන යාම.
- කුරුඳුවත්ත පොලීසියට අනුබද්ධ පොලිස් මුරපොළක් හා පොලිස් නිලධාරින් අඛණ්ඩව කෞතුකාගාර ගොඩනැඟිල්ල හා ප්‍රධාන පිවිසුම ගේට්ටු අසල රාජකාරියේ නිරත වීම.
- දුමක් ඇති අවස්ථාවක එය හඳුනා ගැනීමට අවශ්‍ය සංවේදී උපකරණ, අනතුරු ඇඟවීමේ සංවේදී උපකරණ සෑම ප්‍රදර්ශන මැදිරියක්ම හා සුවිශේෂී වටිනාකම් සහිත කෞතුක භාණ්ඩ තැන්පත් කර ඇති අල්මාරි සවිකර තිබීම.
- කෞතුකාගාර ගොඩනැඟිල්ල සඳහා අකුණු සන්නායක සවිකර තිබීම හා නඩත්තු කිරීම.

(ආ) (i)

- කෞතුකාගාර ආරක්ෂක සේවය සඳහා වැටුප් හා වේතන වෙනුවෙන් වැය කළ මුදල රුපියල් මිලියන 48කි.
- පෞරාණික ස්මාරක තාප්පය අලුත්වැඩියා කිරීම හා ස්මාරක තාප්පයට පිටතින් ඇති දැල් වැට අලුත්වැඩියා කිරීම සඳහා වැය කළ මුදල රුපියල් මිලියන 12.5කි.
- පිටුපස මුර කුටිය අලුත්වැඩියා කිරීම සඳහා වැය කළ මුදල රුපියල් මිලියන 1.6කි.

• CCTV කැමරා පද්ධතිය නඩත්තු කිරීම සඳහා වැය කළ මුදල රුපියල් මිලියන 11කි.

• පුස්තකාල ගොඩනැඟිල්ල සඳහා ගිනි ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා වැය කළ මුදල රුපියල් මිලියන 22කි.

• අකුණු සන්නායක යාවත්කාලීනව පවත්වාගෙන යාමට වැය කරන ලද මුදල රුපියල් 150,000කි.

(ii) • කෞතුකාගාර ආරක්ෂක සේවය පවත්වාගෙන යාම සඳහා වැටුප් හා දීමනා සඳහා රුපියල් මිලියන 50කි.

• පෞරාණික තාප්පයේ ඉතිරි කොටස අලුත්වැඩියා කිරීම සඳහා රුපියල් මිලියන 18කි.

• CCTV පද්ධතිය, අකුණු සන්නායක, අනතුරු ඇඟවීමේ සංඥා පද්ධති අලුත්වැඩියාව සහ නඩත්තුව සඳහා රුපියල් මිලියන 13කි.

(ඇ) අදාළ නොවේ.

(அ) (i) அரும்பொருட்களைப் பாதுகாப்பதற்கு முறையான முறையியல் உள்ளது.

(ii) அரும்பொருட்களைப் பாதுகாப்பதற்கு பின்வரும் நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளன:

• 24 மணி நேரமும் இயங்கிவரும் CCTV 'கெமரா'க் கட்டமைப்பு சகல கண்காட்சிக் கூடங்களையும் உள்ளடக்கியதாகத் தாபிக்கப்பட்டுள்ளமை மற்றும் மேற்படி காட்சிகள் தொடர்ச்சியாக கண்காணிப்புச் செய்யப்படுதல்.

• கொழும்பு தேசிய நூதனசாலையை உள்ளடக்கியதாக தீப் பாதுகாப்புக் கட்டமைப்பை பொருத்தியுள்ளமை மற்றும் பராமரிப்புச் செய்தல்.

• தேசிய நூதனசாலைகள் திணைக்களத்துக்கு திணைக்களம்சார் காவலாளிச் சேவையைப் பேணிவருதல்.

• கருவாத்தோட்டம் பொலிஸின் இணைந்த பொலிஸ் சோதனைச்சாவடி மற்றும் பொலிஸ் அலுவலர்கள் தொடர்ச்சியாக நூதனசாலைக் கட்டிடம் மற்றும் பிரதான நுழைவாயிலுக்கு அருகே கடமையில் ஈடுபடுதல்.

• புகை ஏற்படும் சந்தர்ப்பத்தில் அதனை இனங்காணத் தேவையான உணர்வுபூர்வமான உபகரணங்கள், விபத்தை எச்சரிக்கும் உணர்வுபூர்வமான உபகரணங்களை சகல கண்காட்சிக் கூடங்களிலும் விசேட பெறுமதிமிக்க நூதனப் பொருட்கள் வைக்கப்பட்டுள்ள அலுமாரிகளிலும் பொருத்தப்பட்டுள்ளமை.

• நூதனசாலைக் கட்டிடத்துக்கு மின்னல் தாக்குதல் தடைகள் பொருத்தப்பட்டுள்ளமை மற்றும் பராமரிப்புச் செய்யப்படல்.

(ஆ) (i) • நூதனசாலையின் பாதுகாப்புச் சேவையைப் பேணிவருவதற்காக சம்பளம் மற்றும் வேதனத்துக்காகச் செலவிடப்பட்ட தொகை 48 மில்லியன் ரூபாய் ஆகும்.

• பண்டைய நினைவுச்சின்ன மதிலை புதுப்பித்தல் மற்றும் நினைவுச்சின்ன மதிலுக்கு வெளியே உள்ள வேலியைப் புதுப்பிக்கச் செலவிடப்பட்ட தொகை 12.5 மில்லியன் ரூபாய் ஆகும்.

• பின்பக்க காவலாளியின் கூடத்தைப் புதுப்பிக்கச் செலவிடப்பட்ட தொகை 1.6 மில்லியன் ரூபாய் ஆகும்.

• CCTV 'கெமரா' கட்டமைப்பைப் பராமரிப்புச் செய்வதற்காகச் செலவிடப்பட்ட தொகை 11 மில்லியன் ரூபாய் ஆகும்.

• நூலகக் கட்டிடத்துக்கு தீப் பாதுகாப்புக் கட்டமைப்பைப் பொருத்தவென செலவிடப்பட்ட தொகை 22 மில்லியன் ரூபாய் ஆகும்.

• மின்னல் தாக்குதல் தடுப்பை இற்றைப்படுத்தி பேணிவருவதற்காகச் செலவிடப்பட்ட தொகை 150,000 ரூபாய் ஆகும்.

(ii) • நூதனசாலையின் பாதுகாப்புச் சேவையைப் பேணிவருவதற்காக சம்பளம் மற்றும் கொடுப்பனவுகளுக்காக 50 மில்லியன் ரூபாய்.

• பண்டைய சுவரின் எஞ்சிய பகுதியைப் புதுப்பிப்பதற்காக 18 மில்லியன் ரூபாய்.

• CCTV முறைமை, மின்னல் தாக்குதல் தடுப்பு, விபத்துக்களை எச்சரித்தல் சமிஞ்சைக் கட்டமைப்பைப் புதுப்பித்தல் மற்றும் பராமரிப்புக்காக 13 மில்லியன் ரூபாய்.

(இ) ஏற்புடையதன்று.

(a) (i) A proper methodology is available to protect artefacts.

(ii) The following measures have been taken to protect the artefacts:

• A 24-hour CCTV camera system has been installed to cover all exhibition galleries and the footage is constantly monitored.

• A fire protection system has been installed and is being maintained covering the Colombo National Museum.

• Maintaining a departmental watchman service for the Department of National Museums.

• A police outpost affiliated with the Cinnamon Gardens Police Station has been established and police officers are continuously on duty near the museum building and main entrance gates.

• Smoke detectors and smoke alarms are installed in every exhibition gallery and near cabinets containing valuable artefacts.

• Installation and maintenance of lightning conductors for the museum building.

(b) (i) • The amount spent on salaries and wages for the museum security service is Rs. 48 million.

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

• The amount spent on renovating the ancient monument wall and the mesh fence outside the monument wall is Rs. 12.5 million.

• The cost for renovating the rear guardroom was Rs. 1.6 million.

• The amount spent on maintaining the CCTV camera system is Rs. 11 million.

• The cost of installing a fire protection system for the library building was Rs. 22 million.

• The amount spent to maintain the lightning conductors up to date is Rs. 150,000.00,

(ii) • Rs. 50 million for salaries and wages to maintain the museum security service.

• Rs. 18 million for renovating the remaining part of the ancient wall.

• Rs. 13 million is required for the repairs and maintenance of CCTV system, lightning conductors and alarm signalling system.

(c) Not applicable.

## දුම්බර හරිත සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය: විස්තර
## தும்பர பசுமை வலுவூட்டல் கருத்திட்டம்: விபரம்
## DUMBARA GREEN EMPOWERMENT PROJECT: DETAILS

1654/2025

**3. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අමාත්‍යාංශය යටතේ, 'හරිත දුම්බර නකල්ස් ව්‍යාපෘතිය' සහ 'දුම්බර හරිත සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය' යනුවෙන් ව්‍යාපෘති දෙකක් තිබේද;

(ii) නකල්ස් කඳු වැටිය ආශ්‍රිත ජලාධාරය හා ගංගා ද්‍රෝණි සංරක්ෂණය සඳහා 'හරිත දේශගුණික අරමුදල' (GCF) සහ 'සොබාදහම සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමය' (IUCN) මඟින් මුදල් ආධාර ලැබී තිබේද;

(iii) එසේ නම්, ආධාර මුදල සහ ආධාර ලබා දුන් ව්‍යාපෘති කවරේද;

(iv) ඉහත ආයතන මඟින් ලබා දුන් මුදල් ආධාර, සීමාසහිත මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පෞද්ගලික) සමාගම වෙත ලබා දී තිබේද;

(v) එසේ නම්, එම මුදල් ප්‍රමාණය හා ලබා දුන් දිනය කවරේද;

(vi) එම මුදල වැය කර සිදු කරනු ලැබූ කාර්යයන් කවරේද;

(vii) එම කාර්යයන්වල වත්මන් ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත සමාගමට අමතරව, (අ) (i) හි සඳහන් ව්‍යාපෘති මඟින් මේ දක්වා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම මුදල් වැය කරනු ලැබූ කාර්යයන් සහ ඒවායේ වත්මන් ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அமைச்சின்கீழ் 'பசுமை தும்பர நக்கிள்ஸ் கருத்திட்டம்' மற்றும் 'தும்பர பசுமை வலுவூட்டல் கருத்திட்டம்' என இரண்டு கருத்திட்டங்கள் உள்ளனவா என்பதையும்;

(ii) நக்கிள்ஸ் மலைத் தொடரைச் சுற்றியுள்ள நீர்நிலைகள் மற்றும் வடிநிலங்களைப் பாதுகாப்பதற்காக பசுமைக் காலநிலை நிதியம் (GCF) மற்றும் சர்வதேச இயற்கைப் பாதுகாப்பு ஒன்றியம் (IUCN) ஆகியவற்றின் மூலமாக நிதியுதவிகள் கிடைக்கப்பெற்றுள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், அந்நிதியுதவிகள் மற்றும் உதவிகள் வழங்கப்பட்ட கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(iv) மேற்கூறப்பட்ட நிறுவனங்கள் ஊடாக வழங்கப்பட்ட நிதியுதவிகள், வரையறுக்கப்பட்ட மகாவலி கன்சல்டன்சி பியூரோ (தனியார்) நிறுவனத்துக்கு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், மேற்படி நிதியின் அளவு மற்றும் வழங்கப்பட்ட திகதி யாது என்பதையும்;

(vi) மேற்படி நிதியைச் செலவுசெய்து மேற்கொண்ட பணிகள் யாவை என்பதையும்;

(vii) மேற்படி பணிகளின் தற்போதைய முன்னேற்றம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி நிறுவனத்துக்கு மேலதிகமாக, (அ)(i) இல் குறிப்பிடப்பட்டுள்ள கருத்திட்டங்களால் இதுவரை செலவிடப்பட்டுள்ள நிதி எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி நிதி செலவிடப்பட்ட பணிகளும் அவற்றின் தற்போதைய முன்னேற்றமும் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House-

(i) whether there are two projects under the Ministry as the "Green Dumbara Knuckles Project" and the "Dumbara Green Empowerment Project";

(ii) whether any financial assistance has been received from the Green Climate Fund (GCF) and the International Union for Conservation of Nature (IUCN) for the conservation of the watershed and river basins in the Knuckles Range;

(iii) if so, the amount of the assistance and the projects for which the assistance was provided;

(iv) whether the financial assistance provided by the above institutions has been provided to Mahaweli Consultancy Bureau (Private) Limited;

(v) if so, the amount of that assistance and the date on which it was provided;

(vi) the activities carried out with the said money; and

(vii) the current progress of the said activities?

(b) Will he also inform this House -

(i) in addition to the above company, the amount of money spent so far by the projects mentioned in (a)(i); and

(ii) the activities for which the said money was spent and their current progress, separately?

(c) If not, why?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

(අ) (i) නැත. දුම්බර හරිත සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය යනුවෙන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය ආරම්භයේදී GCF නකල්ස් ව්‍යාපෘතිය යනුවෙන්ද හඳුන්වා ඇත.

(ii) හරිත දේශගුණික අරමුදලෙන් (GCF) පමණක් අරමුදල් ලැබී ඇත. සොබාදහම සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමය (IUCN) ප්‍රතීතනය ලත් ආයතනය (Accredited Agency) ලෙස කටයුතු කරයි. එනම්, දුම්බර හරිත සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය හා හරිත දේශගුණික අරමුදල (GCF) වෙනුවෙන් දුම්බර හරිත සවිබලගැන්වීම් ව්‍යාපෘතිය අධීක්ෂණය කරයි.

(iii) ගිවිසුම්ගත අරමුදල - ඇමරිකානු ඩොලර් 29,275,000

දැනට ලැබී ඇති අරමුදල - ඇමරිකානු ඩොලර් 2,921,356

දේශගුණයට ඔරොත්තු දෙන තිරසාර ඉඩම් කළමනාකරණය

තිරසර ඉඩම් කළමනාකරණය සඳහා අරමුදල් සම්පාදනය

ආයතනික ධාරිතා ශක්තිමත් කිරීම

ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා

- විද්‍යාත්මක හා තාක්ෂණික සහාය වීම
- කළමනාකරණ උපදේශනය
- ඉංජිනේරු සහ ඉංජිනේරු නොවන උපදේශන හා උපකාරක සේවා
- පර්යේෂණ සහ පුහුණුව
- නව සංකල්ප සංවර්ධනය කිරීමට සහාය වීම
- සමීක්ෂණ හා අධ්‍යයනය සඳහා සහාය
- ප්‍රතිපත්ති සංවර්ධනයට සහාය වීම
- තොරතුරු හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම සහ පරිසර පද්ධති සේවා සඳහා ගෙවීම්.
- විගණනයට සහාය වීම
- සෘජු මැදිහත්වීමෙන් පරිසර පද්ධති සේවා සඳහා අතරමැදි ආයතනයක් පිහිටුවීමට සහාය වීම.

(iv) ඔව්. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හවුල්කාර ආයතනයක් වන සීමාසහිත මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පෞද්ගලික) සමාගම - MCB වෙත අරමුදල් ලබා දී ඇත.

(v) 2024/2025 වසරවල ලබා දී ඇත. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වලට අදාළ ඉංජිනේරුමය කටයුතු සිදු කිරීම, ව්‍යාපෘතිය වෙනුවෙන් උපදේශක සේවය ලබා දීම සඳහා ගෙවීම් කිරීමට හා ව්‍යාපෘතියේ තාක්ෂණික හා විද්වත් කාර්ය මණ්ඩලවල ගෙවීම් යන කාරණා සඳහා.

ලබා දුන් අරමුදල් ප්‍රමාණයන් හා දින වකවානු **ඇමුණුම 01*** මඟින් දක්වා ඇත.

(vi) ඉංජිනේරුමය කාර්යය

සේවක බඳවා ගැනීම්

විශේෂඥ සහාය ලබා ගැනීම

තාවකාලික සහාය කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම් කිරීමට

(vii)

| MCB වෙත නිදහස් කර ඇති මුදල (රුපියල්) | MCB ආයතනය වියදම් කර ඇති මුදල (රුපියල්) | ඉතිරිය (රුපියල්) |
|---|---|---|
| 172,000,000.00 | 148,018,308.00 | 23,981,692.00 |

**ඇමුණුම 02*** මඟින් විස්තර දක්වා ඇත.

(ආ) (i)

| මුළු වියදම (රුපියල්) | MCB වෙත නිදහස් කර ඇති මුදල (රුපියල්) | MCB ආයතනයට අමතරව වියදම් කර ඇති මුදල (රුපියල්) |
|---|---|---|
| 620,822,920.00 | 172,000,000.00 | 448,642,920.00 |

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

(ii) සාරාංශය

| කාර්යය | 2023 වර්ෂයේ වියදම (රුපියල්) | 2024/25 වර්ෂවල වියදම (රුපියල්) | එකතුව (රුපියල්) |
|---|---|---|---|
| සංරචක 1 දේශගුණයට ඔරොත්තු දෙන තිරසාර ඉඩම් කළමනාකරණය | 8,890,845 | 276,404,544 | 285,295,389 |
| සංරචක 2 තිරසාර ඉඩම් කළමනාකරණය සඳහා අරමුදල් සම්පාදනය | 7,363,841 | 37,740,537 | 45,104,378 |
| සංරචක 3 ආයතනික ධාරිතා ශක්තිමත් කිරීම | 7,363,841 | 24,472,470 | 31,836,311 |
| සංරචක 4 ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 2,843,555 | 83,563,287 | 86,406,842 |
| එකතුව | 26,462,082 | 422,180,838 | 448,642,920 |

(ඇ) අදාළ නොවේ.

(அ) (i) இல்லை. 'தும்பர பசுமை வலுவூட்டல் கருத்திட்டம்' எனும் பெயரில் கருத்திட்டமொன்று செயற்பட்டவண்ணம் உள்ளது. இக்கருத்திட்டம் ஆரம்பத்தில் 'GCF நக்கிள்ஸ் கருத்திட்டம்' என அழைக்கப்பட்டது.

(ii) பசுமைக் காலநிலை நிதியத்திடமிருந்து (GCF) மாத்திரம் நிதியங்கள் கிடைத்துள்ளன. இயற்கைப் பாதுகாப்புத் தொடர்பான சர்வதேச ஒன்றியம் (IUCN) அங்கீகரிக்கப்பட்ட நிறுவனமாகச் செயற்பட்டவண்ணம் உள்ளது. (Accredited Agency) அதாவது, தும்பர பசுமை வலுவூட்டல் கருத்திட்டம் மற்றும் பசுமை காலநிலை நிதியம் (GCF) சார்பாகத் தும்பர பசுமை வலுவூட்டல் கருத்திட்டம் மேற்பார்வையிடுகின்றது.

(iii) ஒப்பந்தம் செய்யப்பட்ட நிதித் தொகை 29,275,000 அமெரிக்க டொலர்கள்.

இதுவரை பெறப்பட்ட நிதி 2,921,356 அமெரிக்க டொலர்கள்.

காலநிலை மாற்றத்தைத் தாங்கும் நிலையான காணி முகாமைத்துவம்,

நிலையான காணி முகாமைத்துவம் தொடர்பான நிதித் திரட்டல்,

நிறுவனத் திறனை வலுவூட்டுதல்.

இவற்றைச் செயற்படுத்தும் முகமாக,

- அறிவியல் மற்றும் தொழில்நுட்ப சார் உதவியை வழங்குதல்
- முகாமைத்துவ மதியுரை
- பொறியியல் மற்றும் பொறியியல் சார்பற்ற மதியுரை மற்றும் துணைச் சேவைகள்
- ஆராய்ச்சி மற்றும் பயிற்சி
- புதிய அணுகு முறைகளை விருத்தி செய்வதற்கு உதவி வழங்குதல்
- கணக்கெடுப்பு மற்றும் ஆய்வுகளுக்கு உதவி வழங்குதல்
- கொள்கை உருவாக்கத்துக்கு ஆதரவு வழங்குதல்
- தகவல் பரிமாற்றத்தை எளிதாக்குதல் மற்றும் சுற்றுச்சுழல் அமைப்புச் சேவைகளுக்கான கொடுப்பனவுகளை ஏற்பாடு செய்தல்
- கணக்காய்வுக்கு உதவி வழங்குதல்
- நேரடித் தலையீட்டின் ஊடாகச் சுற்றுச்சூழல் சேவைகள் சார்ந்த இடைநிலை நிறுவனக் கட்டமைப்பை நிலைநாட்டுவதற்கு ஆதரவு வழங்குதல்

(iv) ஆம். கருத்திட்டத்தைச் செயற்படுத்தும் கூட்டு நிறுவனமான வரையறுக்கப்பட்ட மகாவலி கன்சல்டன்சி பியுரோ (தனியார்) நிறுவனம் - MCBக்கு நிதியங்கள் கையளிக்கப்பட்டுள்ளன.

(v) 2024/2025 ஆண்டுகளில் நிதி ஒதுக்கீடு செய்யப்பட்டு வழங்கப்பட்டுள்ளது. கருத்திட்டத்தின் செயற்பாடுகளுடன் தொடர்புடைய பொறியியல் சார்ந்த பணிகளை முன்னெடுப்பதற்காகவும், கருத்திட்டத்தின் தேவைக்கேற்ற ஆலோசனை சார்ந்த சேவைகளைப் பெற்றுக் கொள்ளும் முகமாக மேற்கொள்ளப்பட்ட கொடுப்பனவுகளுக்காகவும் கருத்திட்டத்தின் தொழில்நுட்பம் மற்றும் நிபுணத்துவம் வாய்ந்த பணியாளர்களுக்கான ஊதியம் செலுத்துவதற்காகவும் இந்நிதி பயன்படுத்தப் பட்டது.

**இணைப்பு 01*** (வழங்கப்பட்ட நிதித் தொகை மற்றும் கால வரையறைகள்)

(vi) பொறியியல் பணிகள்
பணியாளர் நியமனங்கள்
நிபுணர் உதவிகளைப் பெறுதல்
தற்காலிக உதவிப் பணியாளர்களுக்கான ஊதியங்களைச் செலுத்துதல்

(vii)

| MCB நிறுவனத்துக்கு விடுவிக்கப்பட்ட தொகை (ரூபாய்) | MCB நிறுவனம் செலவிட்ட தொகை (ரூபாய்) | மீதமுள்ள தொகை (ரூபாய்) |
|---|---|---|
| 172,000,000.00 | 148,018,308.00 | 23,981,692.00 |

**இணைப்பு 02***இன்மூலம் பரிக்கப்பட்டுள்ளது.

(ஆ) (i)

| மொத்தச் செலவு (ரூபாய்) | MCB நிறுவனத்துக்கு விடுவிக்கப்பட்ட தொகை (ரூபாய்) | MCB நிறுவனத்துக்கு மேலதிகமாகச் செலவிடப்பட்ட தொகை (ரூபாய்) |
|---|---|---|
| 620,822,920.00 | 172,000,000.00 | 448,642,920.00 |

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(ii) சுருக்கம்

| பணி | 2023ஆம் ஆண்டின் செலவு (ரூபாய்) | 2024/25ஆண்டுகளில் செலவு (ரூபாய்) | மொத்தம் (ரூபாய்) |
|---|---|---|---|
| உள்ளடக்கம் 1 காலநிலைக்கு முகங்கொடுக்கின்ற நிலையான காணி முகாமைத்துவம் | 8,890,845 | 276,404,544 | 285,295,389 |
| உள்ளடக்கம் 2 நிலையான காணி முகாமைத்துவம் தொடர்பான நிதித் திரட்டல் | 7,363,841 | 37,740,537 | 45,104,378 |
| உள்ளடக்கம் 3 நிறுவன திறன் வலுப்படுத்தல் | 7,363,841 | 24,472,470 | 31,836,311 |
| உள்ளடக்கம் 4 கருத்திட்ட முகாமைத்துவ அலகு | 2,843,555 | 83,563,287 | 86,406,842 |
| மொத்தம் | 26,462,082 | 422,180,838 | 448,642,920 |

(இ) ஏற்புடையதன்று.

(a) (i) No. A project titled "Dumbara Green Empowerment Project" is currently being implemented. At the initial stage, this project was also known as the GCF Knuckles Project.

(ii) Funding has been received exclusively from the Green Climate Fund (GCF). The International Union for Conservation of Nature (IUCN) functions as the accredited agency. It oversees the implementation of the Dumbara Green Empowerment Project on behalf of both the project and the Green Climate Fund (GCF).

(iii) Agreed amount - US Dollars 29,275,000
Funds received to date - US Dollars 2,921,356

Sustainable land-use practices resilient to climate impacts

Mobilization of funds for sustainable land management

Strengthening institutional capacity

For the implementation of these measures,

- Scientific and technical support
- Management consultancy
- Provision of engineering and non-engineering consultancy and support services
- Research and training
- Support for development of innovative concepts
- Support for review and study
- Support for policy development
- Facilitation of information exchange and payments for ecosystem services
- Support for auditing
- Facilitating the establishment of an intermediary agency for the direct management of ecosystem services

(iv) Yes. Funding has been disbursed to MCB, the partner agency tasked with implementing the project.

(v) Provided in years 2024/2025. To facilitate engineering works associated with project activities, remuneration of consultants engaged on behalf of the project and payments to the project's technical staff and experts.

Fund allocations and their disbursement schedules are given in Annex 01*.

(vi) Engineering activities

Staff recruitments

To obtain support of experts

For making payments to the temporary subordinate staff

(vii)

| Amount released to MCB (Rs.) | Amount spent by MCB (Rs.) | Balance (Rs.) |
|---|---|---|
| 172,000,000.00 | 148,018,308.00 | 23,981,692.00 |

Activities done with the money given to MCB are given in Annex 02*.

(b) (i)

| Total Expenditure (Rs.) | Amount released to MCB (Rs.) | Additional expenses (Rs.) |
|---|---|---|
| 620,822,920.00 | 172,000,000.00 | 448,642,920.00 |

(ii) Summary

| Activities | Expenditure in 2023 (Rs.) | Expenditure in 2024/25 (Rs.) | Total (Rs.) |
|---|---|---|---|
| Component I Climate-resilient sustainable land management | 8,890,845 | 276,404,544 | 285,295,389 |
| Component 2 Funding for the sustainable land management | 7,363,841 | 37,740,537 | 45,104,378 |
| Component 3 Strengthening I nstitutional capacity | 7,363,841 | 24,472,470 | 31,836,311 |
| Component 4 Project Management Unit | 2,843,555 | 83,563,287 | 86,406,842 |
| **Total** | **26,462,082** | **422,180,838** | **448,642,920** |

(c) Not applicable.

---

* පුස්තකාලයේ තබා ඇත.
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.